

අල්
ජිහාද්
කයිදා
ඉස්ලාම් මූලධර්මවාදයේ
අතීතය - වර්තමානය - අනාගතය
පාඨලී චම්පික රණවක

# අල් ජිහාද් - අල් කයිදා

(ඉස්ලාම් මූලධර්මවාදයේ අතීතය, වර්තමානය හා අනාගතය)

පාඨලී චම්පික රණවක

# අල් ජිහාද් - අල් කයිදා

(ඉස්ලාම් මූලධර්මවාදයේ අතීතය, වර්තමානය හා අනාගතය)

පාඨලී චම්පික රණවක

අල් ජිහාද් - අල් කයිදා

(ඉස්ලාම් මූලධර්මවාදයේ අතීතය, වර්තමානය හා අනාගතය)

වෙබ් අඩවිය - www.champikaranawaka.com

පළමු මුද්‍රණය - 2003 පෙබරවාරි
දෙවන මුද්‍රණය - 2013 මාර්තු

© කර්තෘ සතු යි.

ISBN 955 - 9144 - 28 - 6

පරිගණක පිටු සැකසුම - ජී. එම්. එම්. ප්‍රභාත්

පිට කවරය - ජයනාත් බෝදාහන්දි

මුද්‍රණය - කේ.එස්.යූ. ග්‍රැෆික් (පුද්.) සමාගම
අංක 510, රාජගිරිය පාර,
රාජගිරිය.

කර්තෘගේ වෙනත් කෘති

- කොටි විනිවිදීම
- සිහළ අභියෝගය
- නැගෙනහිර සිංහල උරුමය
- අපේ මග
- සංවර්ධනයේ තුන්වන යාමය
- සාපේක්ෂා
- පටිසෝතගාමිව තිස්වසක්
- හරිත අරුණ
- සිංහ සේනාංකයේ ප්‍රහාරය
- ඒහි පස්සිකෝ

# පටුන


පෙරවදන - හලාල්-හරාම් හා අපි 07-16

පළමු පරිච්ඡේදය - ඉස්ලාමීය ඉතිහාසය විමසීමක් 17-58

i. අට්ටාගේ චාරිකාව

ii. මහම්මත් නම් දිවැසිවරයා

iii. ජිහාදය ඇරඹේ

දෙවැනි පරිච්ඡේදය - ඉස්ලාම් මූලධර්මවාදය හා රාජ්‍යය 59-116

i. සවුදි අරාබිය vii. ඇල්ජීරියාව

ii. ඉරානය viii. මොරොක්කෝව

iii. ඇෆ්ගනිස්තානය ix. සිරියාව

iv. ඊජිප්තුව x. ජෝර්දානය

v. ලිබියාව xi. ලෙබනනය

vi. ඉරාකය xii. ගල්ෆ් රටවල්

තුන්වැනි පරිච්ඡේදය - සියොන්වාදය
මොසෙස්ගේ සිට මෝෂේ දක්වා 117-133

i. ඊශ්‍රායලය හා පලස්තීනය

හතරවැනි පරිච්ඡේදය - ඉස්ලාම් මූලධර්මවාදය හා ආසියාව 134-158

i. මැලේසියාව

ii. ඉන්දුනීසියාව

iii. පකිස්තානය

පස්වන පරිච්ඡේදය - ඊයේ පහසුම දිනය විය 159-212

i. ඊයේ පහසුම දිනය විය

ii. ජෙරනිමෝ සොයා යෑම

iii. අල්කයිදා සංවිධාන රටාව

iv. අල්කයිදා ජාලය
ඇල්ජීරියාව, යේමනය, ලිබියාව, සවුදිය, ඉරානය, ඉරාකය ඇප්‍රිකාව, ආසියාව, මධ්‍ය ආසියාව, චීනය, ගිනිකොන ආසියාව, ඉන්දියාව හා පකිස්තානය

v. අල්කයිදා හා එල්.ටී.ටී.ඊ

**හයවන පරිච්ඡේදය** - ලංකාවේ මුසුල්මානුවෝ 213-240

i. මූලධර්මවාදය පිවිසීම

**හත්වන පරිච්ඡේදය** - කුරුස යුද්ධය 241-268

i. ඕජ්ස් දෙයි - දේවකාරිය

ii. අප්‍රිකාව දැවෙයි

iii. පෝලන්තයේ රතු බලය බිඳලීම

iv. කෝෂිකාව බිහිකිරීම

v. නැගෙනහිර ටිමෝරය

vi. එ. ජනපදයේ ක්‍රිස්තියානි මූලධර්මවාදය

vii. කිතුනු නිකායික බෙදීම්

බැප්ටිස්ට්වරු, මෙතෝදිස්ත, පෙන්තකොස්ත,

වෙනත් මූලධර්මවාදීන්, ආසියාවේ ක්‍රිස්තියානි මූලධර්මවාදය,

කිතුනු - කුරුස යුද්ධය

viii. අපේ අනාගතය

- **සංඛ්‍යා ලේඛන** 269-270
- **ආශ්‍රිත ග්‍රන්ථ** 271-271

# හලාල් - හරාම් හා අපි

මා විසින් කරන ලද අල් ජිහාද්- අල්කයිදා කෘතිය නැවත මුද්‍රණය සඳහා ජාතික හෙළ උරුමය ක්‍රියාකිරීම ගැන එහි සංවිධායකයන්ට ස්තූති වෙමි. මේ කෘතිය කිරීමට මා පෙළඹුණේ සිදුවීම් දෙකක් නිසා ය. එකක් නම් නිව්යෝර්ක් වෙළෙඳ මධ්‍යස්ථාන (2001.09.11) ප්‍රහාරයත් සමඟ කලඑළි බැසි අල්කයිදාව ගැනත්, එක්සත් ජනපදයේ ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය සංග්‍රාමය ගැනත් ජාතිය දැනුවත් කිරීම ය. දෙවැන්න ඔලුවිල් සම්මුතිය නමින් වෙන ම මුස්ලිම් රාජ්‍යයක් පිහිටුවීමට (2003) අන්තවාදී මුස්ලිම් කණ්ඩායම් උත්සහ දැරීමත් අපගේ ඉතිහාසය විකෘති කරමින් ශ්‍රී ලංකාවේ මුස්ලිම් උරුමය නමින් පොත් පෙළක් එළිදැක්වීමත් ය. වසර දහයකට පෙර මවිසින් ඉස්ලාම් මූලධර්මවාදය පිළිබඳව පළකළ අනාවැකි දැන් යථාර්ථයක් බවට පෙරළෙමින් ඇත.

කෘතියේ දෙවැනි මුද්‍රණයක් අවශ්‍ය වූයේ හලාල් සම්බන්ධයෙන් 2013 වසරේ ඇති වූ ආන්දෝලනය නිසා ය. සමස්ත ලංකා ජම්යතුල්ලා උලේමා සංවිධානය විසින් වසර 2006 සිට ක්‍රමානුකූලව මුළු රටේ ම භාණ්ඩ නිපදවීම හා අලෙවිය හලාල් සහතිකයට යටත් කිරීමත්, එමඟින් රටේ නිෂ්පාදන ක්‍රියාදාමය ඉස්ලාමීකරණය කිරීමත් නිසා මේ ගැටළු ව පැනනැඟිණි.

ජම්යතුල්ලා උලේමා සංවිධානය තමන් ඉස්ලාමීය ආගමික වියතුන් (Theologian) ගේ සංවිධානයක් ලෙස හඳුන්වාගනී. එය 1924 පිහිටවූ බව ද ප්‍රකාශ කරයි. හලාල් සහතික 1990 සිට නිකුත් කළ බව ද පවසයි. ඉන්දියාවේ හෝ ආසියාවේ කිසිඳු රටක උලේමා සංවිධානයක් පිහිටුවීමට පෙර එය පිහිටවූ බව ද හලාල් සහතික දුන් බව ද අවධාරණය කරයි.

නමුත් සත්‍යය නම් උලේමාවරු මද්රාශාවල සේවය කළ ද ආයතනයක් ලෙස එක්වූයේ බ්‍රිතාන්‍ය කාලයේ පැවති නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රශ්න නිසා බව ය. මුස්ලිම්වරු දෙමළ කතාකරන ගොඩට නොඇමිය හැකි බව මුල දී (1889) අවධාරනය කෙරිණි. ඊළඟට උගත් ඡන්ද දායකයන්, (1910) ප්‍රාදේශීය ඡන්ද කොට්ඨාස ක්‍රමය (1921) ආදිය පිහිටුවීමේ දී ඔවුන් සිය නියෝජනය සහතික කරගැනීමට උත්සහ කළහ. ඔවුන් ආයතන ගත

වූයේ සර්වජන ඡන්ද අයිතිය පිළිබඳ කතිකාව නිසා ය. (1926)

උලේමාවරුන් ප්‍රථම මහජන කතිකාව වූයේ (1926) ඩොනමෝර් කොමිසම ඉදිරියේ සාක්ෂි දෙමින් කාන්තාවන්ට ඡන්ද අයිතිය හා මන්ත්‍රී අයිතිය ලැබීම වැළැක්වීමට උත්සහ දැරීම ය.

මුස්ලිම් ජනගහනයෙන් අඩකට ඒ අයිතිය ලැබුණේ අපේ හාමුදුරුවරු සර්වජන ඡන්ද අයිතියට පක්ෂවීම නිසා ය. එමෙන් ම නිදහස් අධ්‍යාපනය පිළිබඳ කතිකාවේ දී (1943) ඇතැම් මුස්ලිම් නායකයින් සිටියේ කාන්තාව අධ්‍යාපනය ලැබිය යුතු නැත යන ස්ථාවරයේ ය. මුස්ලිම් ජනගහනයෙන් අඩක් වූ කාන්තාවන්ට අධ්‍යාපන අයිතිය ලැබුණේ ද අපේ හාමුදුරුවන්ගේ ඉදිරිපත් වීම නිසා ය.

කොටින් ම නිදහසෙන් පසු (1948) ලංකාවේ මුස්ලිම් ජනගහනය සිව් ගුණයකට වඩා ඉහළට වර්ධනය වූවෙත් රටපුරා පල්ලි 3000 ක් පමණ ආගමික පාසල් 3000 ක් පමණ ඉදිකර ගැනීමට හැකිවූවෙත් සිංහල - බෞද්ධයින්ගේ හෝ සහනශීලීත්වය නිසා ය. එමෙන් ම කොටි ත්‍රස්තවාදය විසින් මුස්ලිම් ජනයා ඝාතනය කරනා විට, සිය ගම්බිම්වලින් පලවා හරිනා විට, මුස්ලිම් අන්තවාදී නායකයින් කොටි සංවිධානය සමග ගිවිසුම් ගසනාවිට ඔවුන් රැකගත්තේ සිංහල සමාජය මිස උලේමාවරු නොවේ. මුස්ලිම්වරුන්ගේ ඉඩම් අයිතිය දිනාදීම සඳහා සිංහල දරුවන් 26000 ක් දිවිදුන් බව සියල්ලන් මතක තබාගත යුතු ය. එසේ නැතුව පෘතුගීසීන්ගේ සමයේ සිට රට තුළ මුස්ලිම් ජනතාවගේ ජීවිත රැකගන්නට සිංහල සමාජය කළ පරිත්‍යාග අමතක කර දඹුල්ලේ යාඥා මඩුවකට බලයෙන් ගියාය යන්න නැගුණු එක් මීලේච්ඡ චෝදනාවකි. මුස්ලිම් හලාල් ආහාර ගැනීම දැනුවත් සිංහල සමාජය ප්‍රතික්ෂේප කළාය යන කරුණ මත සිංහල බෞද්ධයන්ට එරෙහි ව වෛරී ප්‍රකාශ කිරීම අවි ගැනීමට තර්ජනය කිරීම තරම් අකෘතඥ ක්‍රියාවලියක් තවත් නැත.

සමස්ත ලංකා ජමියතුල්ලා උලේමා සංවිධානය තමනට වසර 87 ක් වයස බව කීව ද රට තුළ නීත්‍යානුකූලව ස්ථාපිත කර ඇත්තේ වසර 2000 අගෝස්තු 08 දා ය. ඒ 1994 දී පත් වූ චන්ද්‍රිකාගේ පොදු පෙරමුණු ආණ්ඩුව මගින් ගෙනා පනතක් මගිනි. එයින් ඉස්ලාම් දර්ශනය (ඩීන් අල් ඉස්ලාම්) ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම ඔවුනට පවරා දී ඇත. පසුව වසර

2006 දෙසැම්බර් 13 දරන ගැසට් පත්‍රයකින් හලාල් සහතික දීමේ නෛතික බලය පාරිභෝගික අධිකාරිය විසින් ජම්යතුල්ලා උලේමාට ලබා දී තිබේ. වසර 2005 ජනාධිපතිවරණයේ දී අගමැති මහින්ද රාජපක්ෂ පරාජය කිරීම සඳහා උපරිම ලෙස කැපවූ මුස්ලිම් කොංග්‍රසය හා සාතිශය බහුතර මුස්ලිම් ඡන්ද දායකයින්ට එක්සත් ජනතා නිදහස් සන්ධානය ''කෘතවේදී'' වී ඇත්තේ එසේ ය. පාරිභෝගික අධිකාරියට ප්‍රමිතීන් නිකුත් කිරීමට බලයක් නැති අතර, එක් ආයතනයක ඒකාධිකාරයක් හෝ වෙළෙඳ බාධක සන්නාම සඳහා ඇතිකිරීමට ද නොහැක. වසර 2007 සැප්තැම්බර් 08 දරන ගැසට් නිවේදනයෙන් පළමු නිවේදනය අවලංගු කර ඇත්තේ ඒ නිසා ය. ඉන්පසු මේ පිළිබඳ ගැසට් නිවේදන දෙකක් පිට වී ඇති අතර, කිසිඳු අයුරකින් හලාල් සහතික සඳහා ජම්යතුල්ලා උලේමා සංවිධානයට නීත්‍යානුකූලභාවයක් දී නැත.

ලෝකයේ වානිජ හලාල් සහතික නිකුත් කරනා එක ම උලේමා සංවිධානය සමස්ත ලංකා ජම්යතුල්ලා උලේමා සංවිධානය වන අතර, ඉස්ලාමයට අනුව මුදල් ලාභ ලැබෙන ව්‍යාපාරවල නියැලීම ආගමික වියතුන්ට තහනම් හෙවත් ''හරාම්'' ක්‍රියාවලියකි. හලාල් සහතික දීමෙන් හා ඒ සඳහා බල කිරීමෙන් (කියන්න කුරානය 173,174, 256) උලේමාවරු කර ඇත්තේ හරාම් පාපයකි.

හලාල් සහතිකය නැතුව වසර 400 ක පමණ කාලයක් මේ රටේ මුස්ලිම් ජනාවාස පැවැතියේ ය. පෘතුගීසීන් විසින් සමූල ඝාතනයට නියම වූ විට කන්ද උඩරට බලා ගිය 4000 ක් වූ ඉන්දියාවෙන් පැමිණි මුස්ලිම්වරුන් සෙනරත් රජුගෙන් හලාල් ආහාර ඉල්ලුවේ නැත. 1990 දී යාපනයෙන්, මන්නාරමෙන් කොටි ත්‍රස්තවාදීන් විසින් පලවා හරින ලද දස දහස් ගණන් මුස්ලිම් ජනයා සිංහලයින් වාසය කරනා පුත්තලම, අනුරාධපුරය ආදී ප්‍රදේශවලට පැමිණිවිට ඔවුන් හලාල් ඉල්ලුවේ නැත. වසර 2004 සුනාමිය අවස්ථාවේ දී අනාථ වූ මුස්ලිම් ජනයා හලාල් ඉල්ලුවේ නැත. ප්‍රභාකරන් විසින් වසර 2006 දී මූතූර්, කින්නියාවලින් පලවා හරින ලද දහස් ගණන් මුස්ලිම් ජනයා කන්තලේට පැමිණිවිට ඔවුන් හලාල් ඉල්ලුවේ නැත. සෑම වෙසක්, පොසොන් දිනවලට බෞද්ධයින් දෙන දන්සැල්වලින් කෑමට පැමිණි, සිංහල අවුරුදු දා හිතවත් නිවෙස්වලින් ආහාර ලබාගත් මුස්ලිම්වරු හලාල් ඉල්ලුවේ නැත.

ජමියතුල්ලා උලේමාවරු හා ඔවුන් පිටුපස සිටිනා විදේශීය ආගමික මූලධර්මවාදීන් හිටිඅඩියේ වසර 2012 දී හලාල් සහතිකය සියලු ව්‍යාපාර සඳහා ව්‍යාප්ත කළේ යම් දේශපාලන අරමුණක් ද සමඟ ය.

1990 දී ප්‍රේමදාස මහතා ජාතික හා ජාත්‍යන්තර ලෙස කොටු වූ විට හිජාබ් ඇඳුම අනිවාර්ය කරන්නට මුස්ලිම් මූලධර්මවාදීන් සමත් විය. ශරීරයට, කාලගුණයට සූර්ය විකිරණයට නොගැළපෙන මේ ආගමික වස්ත්‍රය නිසා මුස්ලිම් කාන්තාවන් සෙසු සමාජයෙන් කොන්වීම එයින් වේගවත් විය. 1994 දී දුර්වල චන්ද්‍රිකාගේ ආණ්ඩුව අල්ලාගෙන වරාය හරහා මුස්ලිම් පාතාල ව්‍යාපාරික බලයක් ගොඩනගා ගැනීමට ද ජමියතුල්ලා උලේමා සඳහා නීතිමය පදනමක් දමා ගැනීමට ද ඔවුහු සමත් වූහ. වසර 2001-04 කාලයේ දුර්වල රනිල් අල්ලාගෙන මූල්‍ය වෙළෙඳපොළ පාලනයට (VAT වංචාවට හසුවූ කුතජඩීන් එ.ජා.ප. කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙක් විය.) විදේශීය මූලධර්මවාදී ගුරුවරු ගෙන ඒමට ද ඔවුනට හැකියාව ලැබිණි. තමන් විසින් 2005දී හා 2010 දී පරාජය කිරීමට උත්සහ දැරූ, විශේෂයෙන් අපේ හමුදා නැගෙනහිර ජය ලබා මුස්ලිම් ජනතාවට නිදහස ලබා දුන් විට 2007 දී කොටි සංවිධානය සමඟ එක් වී එකී ආණ්ඩුව පෙරළීමට වැඩකළ ඉස්ලාම් මූලධර්මවාදී බලවේග අද ජිනීවා මානව හිමිකම් සමුළුවට මුවා වී කිරීමට යන්නේ ද රටේ ආර්ථිකය ඉස්ලාමීකරණය කිරීම වේගවත් කිරීම ය.

එක් අතකින් ඔවුන් හලාල් සහතිකය හරහා නිෂ්පාදන ක්‍රියාදාමය ඉස්ලාමීකරණය කරමින් ඇත. අනෙක් අතින් සුදුකරපටි අපරාධකරුවන් නිසා අර්බුදයට ගිය අපේ මූල්‍ය ක්ෂේත්‍රයේ විදේශ සංචිත හිඟය පියවීමට අරාබි මුදල් යොදා ගැනීමේ ක්‍රියාවලියක් ද ආරම්භ කර තිබේ. අරාබිය හා අග්නිදිග ආසියානු මුස්ලිම් ප්‍රදේශ යා කරන ගෝලීය කේන්ද්‍රය බවට ලංකාව පත්කර ගැනීම මොවුනගේ ඉලක්කය යි. හෙට නොදකින අද වේල හා කොමිස් මුදල ගැන පමණක් තකන සියල්ලෝ සේවය කරමින් සිටින්නේ ගෝලීය ඉස්ලාමීය ව්‍යාපාරයේ මේ ක්‍රියාදාමයට යි.

හලාල් යනු හුදු මස් මාංශ සැකසීම සඳහා ඉස්ලාමීය විධික්‍රම යොදාගැනීම නොවේ. හලාල් සහතික නිකුත් කිරීම සඳහා ජමියතුල්ලා උලේමා සංවිධානය විසින් නිකුත් කර ඇති නිලමය ප්‍රමිති ක්‍රියාදාමය (Standard operating procedure) බලත්දී පෙනීයන්නේ හලාල් යනු හුදු

මස්මාංශ සඳහා නොව සියළු භාණ්ඩ හා සේවා සඳහා යෙදෙවන්නක් බවයි. දැනටමත් (2012 අවසානයේ දී) භාණ්ඩවර්ග 4500 ක් හලාල් සහතික ලබාගෙන තිබිණි. ඒවා අතර තීන්ත, බුරුසු, කුළුබඩු, ලුණු, කිරිපිටි පමණක් නොව වතුර ද ඇතුළත්ව තිබිණි. එමෙන් ම එයට අනුව ඉදිරි කාලයේ දී රථවාහන, විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ , නිවාස, කාර්යාල හා වාස්තු නිර්මාණ ආදිය ද 'හලාල්' වනු ඇත. මන්ද හලාල් යනු ජීවන ක්‍රමයක් නිසා ය. උලේමාවරු ආඩම්බරයෙන් කීවේ සිය කාන්තාවන් ද හලාල් බව ය.

හලාල් සහතිකය ලබාගන්නා ආයතනය පළමුව සිය නිෂ්පාදන රහස් වට්ටෝරුව උලේමාවරුන්ට ලබාදිය යුතුය. එමඟින් නිෂ්පාදන රහස් උලේමාවරුන්ට ලැබේ. (එකී රහස් යොදාගෙන බිස්කට්, තීන්ත වැනි නිෂ්පාදන දැනටමත් ආරම්භ කර ඇති බව වාර්තා වේ.) දෙවනුව ඔවුන් සියළු අමුද්‍රව්‍ය, අතුරු ද්‍රව්‍ය ආදිය හලාල් විය යුතු බව අවධාරනය කරයි. ඊළඟට නිෂ්පාදනාගාරය, ඇසුරුම්, ප්‍රවාහනය, කල්තබාගැනීම, ගබඩාකරණය, විකිණීම මේ සියල්ල හලාල් විය යුතු බවට බල කරයි.

කොටින්ම අමුද්‍රව්‍යවල සිට අවසාන භාණ්ඩය දක්වා සියළු නිෂ්පාදන ක්‍රියාදාමය ඉස්ලාම් ෂරියා නීතියට අනුව හලාල් විය යුතුය. එමෙන් ම හලාල් නොවන ද්‍රව්‍ය එකම පරිශ්‍රයක තැනීම තහනම් ය. හලාල් හා හලාල් නොවන නිෂ්පාදන ක්‍රියාදාමයන් මිශ්‍ර නොවන ලෙස (සේවකයින් ද ඇතුළුව) වෙන් කළ යුතුය.ඉතින් මිශ්‍රවීමක් සිදුවුවහොත් එය පාපයක් ලෙස සලකා ආගමික ලෙස පවිත්‍ර කළ යුතු ය.

මෙය පැහැදිලි ලෙස නිෂ්පාදන ක්‍රියාදාමය - සමාජය ඉස්ලාම් හා ඉස්ලාම් නොවන ලෙස බෙදීමකි. ජම්යතුල්ලා උලේමාවරු සමාජයීය බෙදුම්වාදයක් වන්නේ ද පරාජය කළ යුතු ආගමික උම්මන්තකවාදයක් වන්නේ ද එහෙයිනි. එහි ඇති මුස්ලිම් අනන්‍යතාවයක් නැත. එයින් කරන්නේ අන්‍ය අනන්‍යතාවයක් ඉස්ලාම්කරණය කිරීමයි. දකුණු අප්‍රිකාවේ සුදු වර්ගවාදයත්, එ. ජනපදයේ සුදු වර්ගවාදයත් වෙනම වර්ගවාදී ආර්ථිකයක් හා සමාජයක් බිහිකලේ ද මේ ලෙස ය.

ඕනෑම ජාතියක ආගමික අනන්‍යතාවයක් සාපේක්ෂ වන අතර එය අන්‍යයින්ගේ අනන්‍යතාවයට බලපායි නම් එය ආක්‍රමණයක් මිස නිදහස් අනන්‍යතා ප්‍රදර්ශනයක් නොවේ. හලාල් යනු බලහත්කාරයෙන් ආගමට හරවා

ගැනීමේ ක්‍රියාවලියකි. සමාජ බෙදුම්වාදයකි.

දෙවනුව නූතන නිෂ්පාදන ක්‍රියාදාමයන් අතිශයින් සංකීර්ණය. ඉස්ලාමයට අනුව තහනම් ඌරන්, වරල් විරහිත මත්ස්‍යයින්, සර්පයින්, බල්ලන්, වවුලන් වැනි පක්ෂිවර්ග, මල සතුන් ආදිය රසායනික ක්‍රියාදාමයන්ට යටත් වූ විට අන්ජීව ක්‍රියාවලියෙන් වෙන් කිරීම පහසු නොවේ. ලොව පුරා ඇති තෙල්, ගල් අඟුරු, ගෑස් ආදී පොසිල ඉන්ධන හෙවත් හයිඩ්‍රොකාබන යනු අතීතයේ ඌරන්, සර්පයින් වැනි ඉස්ලාමයට අනුව හරාම් සතුන් ද විය හැක. මිනිසුන් ද විය හැක. එසේ නම් තෙල් ඇතුළු කිසිදු හයිඩ්‍රොකාබනයක් පරිහරණය ලංකාවේ උලේමාවරුනට අනුව නම් හරාම් විය යුතු ය. ආගමික ලේබනයකට අනුව නිෂ්පාදනය වෙන් කිරීමට දරන මේ තැත උමතුවක් වන්නේ ඒ නිසා ය.

අනෙක් අතින් සමාජකරණය වූ, ගෝලීයකරණය වූ වෙළඳපල සමාජයක නිෂ්පාදන ක්‍රියාවලිය ආගමික ලෙස බෙදීම කළ හැක්කක් නොවේ. එසේ කිරීමට හැක්කේ පරිභෝජනයේ දී පුද්ගලිකව ප්‍රතික්ෂේප කිරීමෙන් හා තමනට උචිත ලෙස තමන් නිපදවා ගැනීමෙන් පමණකි. උදා. මලස රුධිරය, මල සතුන් ආහාරයට ගැනීම යුදෙව්වන් හා කිතුනුවන්ට ද තහනම් වුව ද වර්තමානයේ ශීතකළ මල සතුන් සියල්ලෝ බුදිති.

ප්‍රාථමික යුගයක (ක්‍රි.ව. 570-630) පදනම් වූ නීතිරීති නූතනයට වලංගු ලෙස වෙනස් කර නොගෙන උලේමාවරු කරන්නේ රටත් ලෝකයත් ඉදිරියේ වියතුන් වීම නොව විහිළුවට ලක්වීමය.

වඩා වැදගත් වන්නේ බෞද්ධයින්, හින්දූන් හා කිතුනුවන් ද සිය ආගම්වලට අනුරූපීව නිෂ්පාදනය සකස් කර ගැනීමට ගියහොත් කුමක්වේ ද යන්න ය. මුළු රටමත්, ලෝකයමත් අවුල් ජාලයක් වනු ඇත්තේය. ඉස්ලාම් ආගමට පමණක් නොව යුදෙව්වනට ද, බෞද්ධයින්ට ද, කිතුනුවන්ට ද තමන්ට ආවේනික ආහාර රටා, ඇඳුම් පැළඳුම් හා වාසස්ථාන රටා ඇත. එහෙත් ඒවා ප්‍රාථමික ලෝකයේ මෙන් නූතන ලෝකයේ ක්‍රියාත්මක කරලීම නොහැකි නිසා ඒ ආගම් බොහොමයක් ප්‍රායෝගික වී තිබේ. යුදෙව්වන් පමණක් "කෝෂර්" නමින් ආගමික ආහාර ක්‍රියාදාමයක් ගෙන යයි.

ගුවන් විදුලිය, රූපවාහිනිය, මෝටර් රථය වැනි දේ මුස්ලිම්

සමාජයට එක්වීමේදී ද, මෙවැනිම ප්‍රශ්න ඇතිවිය. බුද්ධිමත් මුස්ලිම් - වියතුන් නව කියවීම් කුරානයට හා ෂරියා නීතියට ලබා දී එකී දුෂ්කරතා පියමං කළහ. ලංකාවේ ද සිදුවිය යුත්තේ එයයි. නැතිනම් මේ හලාල් හරාම් විවාදය කෙළවර වන්නේ ගුවන් විදුලිය, රූපවාහිනිය, සිනමාව, අන්තර්ජාලය, බාබර්වරු, කාන්තා අධ්‍යාපනය තහනම් ඇෆ්ගනිස්තාන සමාජයට ලංකාව ඇද වැටීමෙනි.

ෂරියා නීතිය ක්‍රියාත්මක කළ කිසිදු මුස්ලිම් රටක් නූතන ලෝකයේ නව දේ තනන ජාතියක් වූයේ නැත. ජමියතුල්ලා උලේමා උත්සහ කරන්නේ ද කදිමට නවීකරණය වන මුස්ලිම් සමාජය ආපසු හරවා ක්‍රමික මරණයට ලක්කිරීමට ය. එයට සමස්ත ශ්‍රී ලාංකික සමාජයම ගොදුරු කර ගැනීම ය.

මුස්ලිම් සමාජය කෙරේ අන් අයගේ බිය පලවී ඇත්තේ හලාල් නිසා නොවේ. මුස්ලිම් අය හලාල් මිස අන් දේ නොගනී කියා ලංකාවේ නිෂ්පාදකයා මුලින් ම පීඩනයට ලක්කළේ උලේමාවරුන් ය. ඇත්තටම විධිමත් ලෙස සිය ප්‍රමිතියට අනුව (SOP) එය සිදුවනවාදැයි නොසොයා අසාධාරණ ගාස්තු අය කළේ (බොහෝ ව්‍යාපාරිකයන් මේ චෝදනාව කැබිනට් අනුකමිටුව ඉදිරියේ 28.02.13 දින නැගූහ.) උලේමාවරුය. එතැනදී උලේමාවරු හරි ලෙස හලාල් නිර්මාණය නොකර මුස්ලිම් ජනයා ද රවටා ඇත.

අනෙක් අතින් ඇඳුම් පැළඳුම්, සීඝ්‍රයෙන් ඉදිවන පල්ලි, මද්රාෂා පාසල්, අරාබි විශ්ව විද්‍යාල, නගර ආක්‍රමණය (1981 දී 19% ක් වූ කොළඹ නගරයේ මුස්ලිම් ජනගහණය 2012 දී 40% ක් වී ඇත.) හා සීඝ්‍ර ජනගහන වර්ධනය සියළු ජනකොටස් සලිත කර ඇත.

වාර්තාවන ආකාරයට වර්ෂ 1624 දී රටතුළ පුරවැසිකම ඉල්ලා සිටි මුස්ලිම්වරුන් ගණන 4000 කි. සිංහල කාන්තාවන් විවාහ කර ගැනීම ස්වභාවික වර්ධනය හා සංක්‍රමණ නිසා බ්‍රිතාන්‍යය යුගය අවසන් වන විට වර්ෂ 1953 දී එය 510,723 ක් හෙවත් 128 ගුණයකින් වසර 329 කදී වැඩි වී තිබේ. නිදහසින් පසු මුස්ලිම් සංක්‍රමණ අඩුවිය. මාලදිවයිනෙන් 20,000 ක පමණ සංක්‍රමණයක් වසර 1990 සිට සිදු වී තිබේ. කෙසේ වෙතත් වසර 2012 දී ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ජනගහණය 1,967,722 ක් හෙවත් වසර 59

කට සිව් ගුණයකින් වර්ධනය වී ඇත. එමෙන් ම 57,713 ක් ඉස්ලාම් අදහන සිංහල, දෙමළ පිරිසක් ද (මුස්ලිම් හෝ මැලේ නොවූ ) රටේ ජීවත් වන බව ද සිහිකළ යුතුය.

වසර 1981 දී 1.7 ක් වූ ලංකාවේ ජනගහන වර්ධන වේගය, අද 0.7% ක් දක්වා අඩු වී තිබේ. සාමාන්‍යයෙන් රටක සංස්කෘතිය රැකගැනීමට එක පවුලක සිටිය යුතු අවම දරුවන් ගණන 2.11 ක් ලෙස සැලකේ. ලංකාවේ මේ ප්‍රතිශතය ඇත්තේ වසරකට 2% කට වැඩි වේගයෙන් වර්ධනය වන මුස්ලිම් ජනතාව අතර පමණි.

2012 දී ලංකාවේ සිංහල ජනගහනය 15,173,820 ක් වන අතර, ඔවුන්ගේ වර්ධන වේගය 0.5% ක් තරම් සුළු අගයකි. ඔවුනට සිය ජනගහනය දෙගුණ කරගැනීමට වසර 140 ක් වැය වේ. මුස්ලිම්වරු 1950-2010 දක්වා අඛණ්ඩව සෑම වසර 30කට ම සිය ජනගහනය දෙගුණයක් කරගෙන ඇත.

ඒ අනුව 1951 දී ලක්ෂ 05කට ආසන්න මුස්ලිම් ජනයා 1981 වනවිට ලක්ෂ 10ටද, 2011 වනවිට ලක්ෂ 20ට ද, ළඟාවී ඇත. 2041 දී ඔවුන් ලක්ෂ 40ට ද, 2071 දී ලක්ෂ 80ට ද 2101 දී ලක්ෂ 160ට ද ඔවුන් ළඟා වනු ඇත. වසර 2102-41 අතර කාලයේ දී මුස්ලිම්වරු මේ සීඝ්‍රතාවයෙන් ගියහොත් රටේ බහුතරයවීමට නියමිත ය. (අල් ජිහාද් කෘතිය මුලින් ලියද්දී ජනගහනය පිළිබඳ තොරතුරු අසම්පූර්ණ වූ අතර ඒ නිසාම පුරෝකතනයන් වෙනස් කළ යුතුවේ.)

කොටින් ම අප මේ ගෙවමින් සිටින්නේ සිංහල ජාතියේ අවසන් සියවසය. අපේ දරුවනට ඉතුරුවනු ඇත්තේ එකමත් එක කාලෙක සිංහල ජාතිය පැවතුනාය යන්න කීම පමණකි. එමෙන් ම අපේ බෞද්ධ වාස්තු නිර්මාණ සියල්ලට ද අද පකිස්තානයේ හා ඇෆ්ගනිස්තානයේ, ඉන්දුනීසියාවේ ඇති වී ඇති ඉරණම අත්වනු ඇත.

ලොවපුරා ඉස්ලාමයේ ආක්‍රමණික බලයට නතුව ඇත්තේ බෞද්ධ රටවල් පමණක් බවත්, යුදෙව් හා ක්‍රිස්තියානි රටවල් එයට එරෙහිව සටන්කර තම අනන්‍යතාවය රැකගෙන ඇති බවත්, අප සියළු දෙනා තේරුම්ගත යුතුය.

විශ්වවිද්‍යාල සමයේ දී සමාජවාදී ක්‍රියාවලියේ ආශ්වාදය නිසා ඉරානය, ඊජිප්තුව වැනි රටවල ඉස්ලාමීය විප්ලවීය ව්‍යාපාර බටහිර ධනවාදී වාණිජ සංස්කෘතියට එරෙහිව නැගී සිටිනා බලයක් ලෙස මගේ ගෞරවයට හේතුවිය. ඉරානය සම්බන්ධයෙන් මගේ ගෞරවය විශේෂිත සජීවීව පවතිමින් පවතින්නේ ඔවුන් එ. ජනපදයට යටනොවී සිටිනට දරනා උත්සාහය නිසා ය. නමුත් ඊශ්‍රායලය පෙන්නා දී ඇත්තේ සවුදි අරාබිය, ඊජිප්තුව වැනි යෝධ අරාබි රටවල චපලත්වය යි. පලස්තීන අයිතිය පිළිබඳව මහ හඬ නගමින් ඊශ්‍රායලයට තෙල්, ගෑස් සපයමින් එක්සත් ජනපදයට තම සහෝදර මුස්ලිම්වරුන් ඝාතනයට ඉඩදෙන්නේ ද අරාබි රටවල් ය.

ජමියතුල්ලා උලේමා කියනා තරම් අරාබි ලෝකය ඉස්ලාම් නොඅදහන අතර ජාත්‍යන්තර සහෝදරත්වයක් ද නැත. සිය රාජ්‍යත්වය රැකගැනීම සඳහා සවුදි රජපවුල වහාබි අන්තවාදයට මුදල් සපයන බව සිංගප්පූරුවේ හිටපු අගමැති ලී ක්වාන් යූ චෝදනා කළේය. (HARD TRUTHS)

අරාබි රටවල චපලත්වය මට වැටහුණේ මෝමේ දයාන්ගේ ජීවිත කතාව කියවීමෙන් පසුව ය. වසර 2000 දී මාවනැල්ලේ ඇති වූ සිංහල - මුස්ලිම් ගැටුමේ දී මුස්ලිම්වරු මර්ධනය කිරීමට සිංහල පොලිසියට නොහැකි බවත්, ඒයට වෙනම මුස්ලිම් පොලිසියක් අවශ්‍යබවත් හකීම් මහතා පාර්ලිමේන්තුවේ දී ආණ්ඩුවෙන් ඉවත් වෙමින් පැවසීමෙන් හා ඔහුට එරෙහිව කතාකළ එස්.බී. දිසානායක පසුව ඔහු හා එක්ව පෙරමුණු ආණ්ඩුව බිඳ දැමීමෙන් මට මේ චපලත්වය තවත් සහතික විය. වසර 2007 දී ත්‍රස්තවාදයට එරෙහිව මුස්ලිම් ජනයා මුදාගැනීම සඳහා සටන් කළ හමුදාව හා ආණ්ඩුව පරාජය කිරීමට මුස්ලිම් නායකයින් පාර්ලිමේන්තුව තුළ ක්‍රියාකිරීමෙන් පසු මට මොවුනගේ දේශපාලනය පිළිකුල් විය. යුද්ධය ජයගැනීමෙන් පසු මුස්ලිම්වරු ලබාගත් නිදහස ගැන ඔවුනගේ දියුණුව ගැන මට මහත් ආඩම්බරයක් ද ඇති විය. නමුත් 2012 නැගෙනහිර පළාත් සභා ඡන්දයේ දී හකීම් මහතා "සිවුරු ත්‍රස්තවාදයක්" ගැන හන්දෙඩවීමත් (ඔහු පසුව මේ ගැන සමාවගත් බව ද ප්‍රකාශ කළ යුතු ය.) හලාල් සිද්ධියත් සමඟ ලංකාවේ මුස්ලිම්වරුනගේ දේශපාලනය දෙමළ ජාතිවාදී දේශපාලනය මෙන් ම සිංහලයා නෝන්ජලයන්, ඔවුනගේ දේශපාලනය කල්ලිවලට ගත

හැක, ඔවුන් බිය කළ හැකි ආදී ලෙස හැසිරෙන බව මට පෙනී ගියේ ය.

මේ ඉස්ලාමීය සමාජ බෙදුම්වාදය ප්‍රභාකරන්ගේ දෙමළ රාජ්‍ය බෙදුම්වාදය තරම්ම හෝ එයටත් වඩා භයානක බව දැන් අපි තේරුම්ගත යුතුය. එක්සත් ජනපදයේ ආක්‍රමණය ඉදිරියේ තලේබාන් හා අල්කයිදා සටන් කළ ආකාරයත්, ලිබියාව, ඊජිප්තුව, ටියුනීසියාව, සිරියාවේ ඒකාධිකාරයෙන් පන්නා දැමීමට ඉස්ලාම් මූලධර්මවාදීන් අවිගෙන සටන් කළ ආකාරය ගැන අපේ ගෞරවයක් ඇති නමුදු ඔවුන් අනුගමනය කරනා ත්‍රස්තවාදය හා මූලධර්මවාදය බටහිරටත් වඩා සාහසික මුග්ධත්වයක් බව ද අපි තේරුම් ගත යුතු වෙමු.

මුස්ලිම් මූලධර්මවාදයේ මේ ක්‍රියාවලියට බිය වී ඇත්තේ අප පමණක් නොවේ. මුස්ලිම් මධ්‍යස්ථ සමාජය ද මෙයට බිය වී ඇත. ඉන්දියාව, චීනය, ජපානය හා යුරෝපය සිය බහුවර්ගවාදී, බහු ආගම්වාදී ප්‍රතිපත්ති ප්‍රායෝගිකව අත්හරිමින් සිටින්නේ ඉස්ලාම් මූලධර්මවාදයට මුහුණ දෙන්නට ය. අපද එයට මුහුණ දිය යුතු ය. විශේෂයෙන් අපේ තරුණ පරපුර මේ පිළිබඳව දැනුමින් සන්නද්ධ විය යුතු ය. එමඟින් අහිංසක මුස්ලිම් බහුතරයෙන් අන්තවාදී සුළුතරය හඳුනාගැනීමට ඔවුනට හැකිවිය යුතු ය. මේ ඒ සඳහා ය.

පළමු පරිච්ඡේදය

# ඉස්ලාමයේ ඉතිහාසය විමසීමක්

## අට්ටාගේ චාරිකාව

''..... සොයුර ඔබේ හදවත පිරිසිදු කර ගන්න. ජීවිතය නැමති දෙය අමතක කරන්න. විනෝදයෙන් ගෙවුණු කාලය සත්‍යය වෙනුවෙන් වූ කාලය එළැඹ ඇත. දෙවියන් වහන්සේ ඔබව පාපයෙන් ගළවාගනු ඇත. එමෙන්ම උන්වහන්සේ ඔබට අවසාන හා උසස්තම දායාදය ඊළඟ මොහොතේ ලබා දෙනු ඇත.....''

...... ඔබගේ ඇඳුම්, බෑගය, පිහි, උපකරණ, හැඳුනුම්පත ගමන් බලපත්‍ර හා අනෙකුත් ලියැවිලි නැවත පරීක්ෂා කරන්න. ඔබේ සියළු අවි පිටත්වීමට පෙර යළිත් පරීක්ෂා කරන්න. මිය යාමට නියමිත වූවන් වෙනුවෙන් ඔබේ 'තියුණු සැත' ළඟින්ම තබා ගන්න.

''..... ගුවන් යානයට ඇතුළු වූ වහාම යාඥාව අරඹන්න. සිතන්න. මෙය දෙවියන් වෙනුවෙන් වූ සටනක් බව. ගුවන් යානය පිටත්වීම ඇරඹූ වහාම ඔබ දෙවියන් සොයා ගමන ඇරඹූ බව බව තේරුම් ගන්න. දේව ආශිර්වාදය ලත් මෙවන් චාරිකාවක් තවත් මිහිපිට නැත.

''..... ඉතින් විශ්වාසය තවත් තර කර ගන්න. ප්‍රීතිජනක සිතුවිලිවලට තව තවත් ඉඩ දෙන්න. ඔබ මේ චාරිකාව යන්නේ දේව ආදරය සොයා

ගෙනය. අද තමා දෙවියන්ගේ දිනය. ඉන්පසු ඔබට පාරාදීසයේ කන්‍යාවියන් අතර පාවිය හැකියි.

''.... ජීවිතය නැමති දෙය යළි යළිත් අමතක කරන්න. විනෝදයෙන් ගෙවුණු කාලය හමාර වී සත්‍යය වෙනුවෙන් වූ කාලය එළැඹ ඇත. යදින්න. නැවත නැවතත් යදින්න. ඉලක්කය කරා යන අවසන් මොහොතේ යදමින්ම මෙය සිතට ගන්න.

තවත් දෙවිවරු නැත. ඉන්නේ අල්ලා පමණි.
තවත් ගැලවුම්කරුවකු නැත. ඉන්නේ මහමත්තුමා පමණි.

-අවසාන රාත්‍රිය- මොහොමඩ් අට්ටාගේ ගමන් බෑගයෙනි.

ඇමරිකානු ගුවන් සේවයට අයත් ෆ්ලයිට්11, බොයින් 767 වර්ගයේ ගුවන්යානය බොස්ටන් නගරයේ ලෝහන් ගුවන්තොටුපලින් හරියටම උදේ 7.59 ට ගුවන් ගත විය. එහි මගින් 81 දෙනෙක් ද කාර්ය මණ්ඩලයේ 11 දෙනෙක් ද වූහ. මිනිත්තු කිහිපයක් තුළ යානය ඉහළ අහසේ තමන්ට අවැසි උස කරා ආවේය. එවිට යානයේ රූපවාහිනි තිර මත Dr. Dolittle 2 තිරගත වන්නට විය. උදේ ආහාරය රැගෙන මගින් වෙත රූබර ගුවන් සේවිකාවන් ගමන් අරඹා තිබිණි.

උදේ 8.13 වෙත් ම පහළ සිට යානය හසුරුවන මධ්‍යස්ථානයට වැටහී ගියේ නියමුවා සිය විධානයන්ට සැලකිලිමත් නොවන බව ය. නියමු කුටියේ යමක් සිදුවෙමින් තිබිණි. මොහොමඩ් අට්ටා මිය යෑමට නියමිත වුවන් වෙනුවෙන් සිය තියුණු සැත (Box Cutter Knife) එළියට ඇද තිබිණි. ඔහු සමග සහාම් අල් සුබාමි, වාලිද් අල්ෂෙරි, වෙයිල් අල්ෂෙරි, අබ්දුල්ලා අල්මොරි සිටියහ. දැන් යානය අඩි 35,000 ක් ඉහළ අහසේ ය. පොළොව මත සිටින ගුවන්යානා හසුරුවන්නා දුටුවේ ගුවන්යානය සංකේතවත් කරන ලකුණ රේඩාර් තිරය මතින් සෘජුව දකුණට හැරෙන බව ය. ඔවුන් සිතුවේ යානයේ යානයේ විදුලිබල ඇණහිටීමක් කියා ය. මිනිත්තු කිහිපයකට පසු පළමු පන්තියේ සිටි ගුවන් සේවිකාවන් දෙදෙනෙක් පාලක මැදිරියට ඇමතුම් දෙකක් දුන්හ. ඇපැහැදිලි වේදානාත්මක ඒ හඬවල් තියුණු සැතකින් ගෙල කපා දැමීමට පෙර ඇසෙන හංස ගීතයන් ද?

ඊළඟ මිනිත්තුවේදී යානය පිටුපස සිටි ගුවන් සේවිකාවක් හා සම්බන්ධ වීමට පාලක මැදිරියට හැකිවිය. ඇය නමින් මැඩ්ලින් ඈමි ස්වීනි වූවා ය.

''..... ඈමී, ඔබට මාව ඇහෙනවාද ? ඈමී ඔබලා කොහේද ඉන්නේ?''

''මට ඔබව ඇසෙනවා, මට පෙනෙනවා ජලය, ගොඩනැගිලි. අනේ මගේ දෙවියනේ, දෙවියනේ.....''

ඈමී කිවූ ජලය හඩ්සන් ගඟ ය. ගොඩනැගිලි ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයයි. වේලාව උදෑසන 8.45 යි. ජෙට් යානා ඉන්ධන ගැලුම් 20,000 ක් සමඟ පැයට සැතපුම් 500 ක වේගයෙන් ෆ්ලයිට් 11 බොයින් 767 යානය ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ උතුරු කුළුනට කඩා වැදුණේය. ගිනි ජාලාවකින් එය වෙළී යන්නට විය.

අඳුරු දුම් රොටු ඉහළ අහසට නගිද්දී ගොඩනැගිල්ල තැනූ කොන්ක්‍රීට් සවිමත් කළ වානේ උණු වී යන තරම් දරුණු ගිණි බෝලයක් ගොඩනැගිල්ල තුළ ඇති වී තිබිණි. බිය ජනක කෑ ගැසීම් මැදින් ගොඩනැගිල්ල දැවෙන්නට පටන් ගනී. සියල්ලෝ ආධාර ඉල්ලා කෑගසන්නට පටන් ගත්තෝය.

හරියට ම උදේ 9.05 ට පහළ සිටියෙක් ඉහළ අහසේ දුම්රොටු අතරින් එන තව යානයක් දැක්කේය ඒ ෆ්ලයිට් 175 බොයින් 767 යානයයි. එය පදවාගෙන එන්නේ 23 හැවිරිදි මාවන් අල්ෂෙහි ය. ඔහු සමඟ මෝහල්ඩ් අල්ෂෙහි, හම්සා අල්ගමාඩි, පායස් අහමද්, අහමද් අල්ගමාඩි සමඟ මගීන් 65 දෙනෙක් සිටියෝය. දක්ෂ ලෙස යානය ගුවනේ කැරකවූ මාවන් එය ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ දකුණු කුළුනේ හරි මැදට ගෙන ගියේය. ඔහුට තම අවසන් උපදෙස් මතක් විය.

''..... දෙවියන්ගේ අවසරය මත ඔබලා ක්ෂණයකින් ස්වර්ගයේ දේව කන්‍යාවියන් අතර ය. මුවගට සිනාවක් නගා ගන්න. මියෙන තරුණයිනි ඔබලා දැන් සදාකාලික ය.....''

මාවන් අල්ෂෙහිගේ මුවග මියෙන මොහොතේ සිනාහවක් තිබුණි දැයි කිසිවෙකු දනී දැයි නොදනිමු. එහෙත් නිසැකව ම තවත් බොහෝ කලක් මොහොමඩ් අට්ටා හා මාවන් අල්ෂෙහි ගැන ලෝකය කතා කරනවා ඇත්තේ ය.

එදින උදේ 10.30 වනවිට ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය අළු දූලි ගොඩක් වී අවසන්ය. එහෙත් ලෝක ඉතිහාසයේ වූ දරුණුතම ත්‍රස්ත ප්‍රහාරය එය විය.

එදින උදේ 9.39 ට ෆ්ලයිට් 77 මෙලෙස ම පෙන්ටගන් ගොඩනැගිල්ලට කඩා වැදිණි. එය ඩලාස් ගුවන්තොටින් ලොස්ඇන්ජලීස් කරා යොමු වූව කි. බොයින් 757 වර්ගයේ ඒ මගී යානයේ ද මගීන් 64 දෙනෙක් සිටියහ. ඔවුනතර සිටි කාලිද් අල්මිදාර්, මජිද් මොහිද්, නවාක් අල්හම්සි, සලීම් අල්හම්සි හා හානි හැනිජුවර් මරාගෙන මැරෙන අල්කයිදා කල්ලියට අයත් වූහ.

නෙවාක් ගුවන් තොටින් ගුවන්ගත වූ බොයින් 757 වර්ගයේ ෆ්ලයිට් 93 ට සිය ඉලක්කය වැරදී ගියේය. ඒ යානයට ගොඩ වී සිටි සයිද් ජරාශි, අහමද් අල්නාමි, අහමද් අල්ගශිස්නාමි, සයිඩ් අල්ගම්ඩි ආදීන් සමග යානයේ මගින් ගැටීම නිසා එය පෙන්සිල්වේනියාවේ ෆ්‍රෑන්ක්විල් කැලයට කඩා වැදිණි. බෝහෝ විට ඉලක්කය ධවල මන්දිරය එය හැකි ව තිබිණි.

එක්සත් ජනපදයේ සුපිරි ආර්ථික බලයේ මරමස්ථානය වූ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයත්, ඔවුන්ගේ සුපිරි යුද ශක්තියේ මරමස්ථානය වූ පෙන්ටගනයත්, ඔවුන්ගේ දේශපාලන බල පරාක්‍රමයේ මූලස්ථානය වූ ධවල මන්දිරයත් එකවර ඉලක්ක කර පහර දීමට සිතයි නම් ඔහු එක්සත් ජනපදය බිම්බත් කිරීම සිය ජීවිත පරමාර්ථය ලෙස සිතන්නෙකු විය යුතු ය.

ඔහු අන් කිසිවකු නොව ඔසාමා බින්ලාදන් ය.

1999 දෙසැම්බර් 31 දා බටහිර කිතුනු ලෝකයට නව සහස්‍රය එළැඹීමේ රාත්‍රිය උදා විය. එහෙත් බටහිර ම උපන් ආචාර්ය ආතර් සී ක්ලාර්ක් වැන්නන් කීවේ නියම සහස්‍රකය ඇරඹෙන්නේ 2000 දෙසැම්බර් 31 දා රාත්‍රියේ බව ය. එයට ඔහු කදිම හේතුවක් ඉදිරිපත් කළේය. එනම් මීට වසර 2000 කට පෙර යුරෝපය ශූන්‍ය හෙවත් බිංදුව නොදැන සිටි නිසා ඔවුන් ක්‍රිස්තියානි සියවස ගණන් කිරීම බිංදුවේ සිට නොව එකේ සිට කළ බව ය. මෙය ඇත්තකි. යුරෝපය යනු වසර 2000 කට කලින් කඩුවේ බලයෙන් සයිරස්ලා, ඇලෙක්සැන්ඩර්ලා සීසර්ලා තැනුවත් බිංදුවවත් නොදැන සිටි ශිෂ්ටාචාරයකි.



මොහොමඩ් අට්ටා



මාවන් අල් ෂෙෂි



ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය

නමුත් දේශපාලන ඉතිහාසය පැත්තෙන් නව සියවස හා සහස්‍රය ඇරඹෙන්නේ 2001 සැප්තැම්බර් 11 දා සිට බව ඇතැමුන්ගේ මතයයි. මන්ද එදා නූතන කුරුස යුද්ධය යළිත් සංකේතාත්මක ව ආරම්භ වූ නිසා ය.

මෙයට දහස් වසරකට පෙර ද කිතුනුවන් සිය දෙවියන් හා දිවැසිවරයා වෙනුවෙන් සහස්‍රය සැමරීමට ඉදිරිපත් වූහ. එදා ඔවුන් මුස්ලිම්වරුන්ගෙන් තම ශුද්ධ නගරය වූ ජෙරුසෙලම බේරා ගැනීම සඳහා කුරුස යුද්ධයකට එළැඹුණෝ ය. ඉතිහාසයේ අභාව වාචකයා පෙන්වා දෙන්නේ ක්‍රිස්තියානු මූලධර්මවාදියකු වන ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් ද යළිත් කුරුස යුද්ධය ප්‍රකාශකර ඇති බව ය. එය ත්‍රස්තවාදයට එරෙහි සටනක් ලෙස අර්ථ දැක්වුව ද නිසැකව ම එය ඉස්ලාම් ව්‍යාප්තවාදයට එරෙහි සටහනක් ද තව දුරටත් ක්‍රිස්තියානි මූලධර්මවාදය ව්‍යාප්ත කිරීමේ සටනක් ද බව බව පෙනේ.

9/11 සිදුවීම ඇමරිකා එක්සත් ජනපදය සසල කළේ ය. එය කිහිප ආකාරයකින් ම එක්සත් ජනපදයටත් ලෝකයටත් දැනිණ.

පළමුවෙන් ම එතරම් සරල ලෙස එතරම් විනාශකාරි ප්‍රහාරයක් වසර කිහිපයක සැලසුමකින් පසු දියත් කිරීමට හැකියාව ලැබීමෙන් එක්සත් ජනපදයේ සුපිරි යුද ශක්තිය කිරීමට හැකියාව ලැබීමෙන් එක්සත් ජනපදයේ සුපිරි යුද ශක්තිය හා එහි අති නවීන තාක්ෂණය භාවිතා කරන ඔත්තු සේවා අංශ (CIA yd FBI) වල ශක්තිය තියුණු සරදමට ලක් කළේය. මෙය කෙතරම් ආකාරයට ඔවුනට දැනිණි ද යත් තමන්ගේ ඔත්තු සේවා හා හමුදා මූලස්ථානයට (පෙන්ටගනය) එල්ල වූ ප්‍රහාරය පිළිබඳ ඔවුන් ප්‍රචාරයක් දුන්නේම නැත. ඒ වෙනුවට සිවිල් ජනයා වැඩියෙන් මියගිය ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ප්‍රහාරයට ම ප්‍රචාරයක් ලබාදිනි. එපමණක් නොවේ. පසු ව එළි වූ ආකාරයට සිංගප්පූරු හා මලයාසියා ඔත්තු සේවා 9/11 ප්‍රහාරයට සහභාගි වූවන් පිළිබඳ ව තොරතුරු ලබාදී තිබියදීත් එය වැළැක්වීම නොහැකි වීම පිළිබඳ ව ඔවුනට චෝදනා නැගිණි. ඔවුන්ට තව දුරටත් චෝදනා නැගුනේ දුරදිග නොබලා කලකට ඉහත ඔවුන් විසින් ම පුහුණු කරනු ලැබූ මිනිසුන් දැන් ඔවුන්ට එරෙහිව දක්ෂ ලෙස සටන් කරන බවට ය. එමෙන්ම පසුගිය දශකය පුරාම එක්සත් ජනපද ඔත්තු සේවා අංශ සිය රටේ ආරක්ෂාවට වඩා වෙහෙසී ඇත්තේ ලෝකයේ වෙළෙඳ ගනුදෙනුවලදී තම රටට හා එහි සමාගම්වලට වාසි ලබා ගැනීමට බව හෙළි වී ඇත. කෙසේ හෝ පැරණි සෝවියට් න්‍යෂ්ටික ප්‍රහාර පිළිබඳ බියක් තිබූ අවස්ථාවේ පොළොව යට සිට මෙහෙයවන'බිම්ගෙයි ආණ්ඩුව' එක්සත් ජනපද උප ජනාධිපති යටතේ

මෙහෙයවීමට පවා ඔවුනට සිදුවිය. පොළොව යට බංකරවල සිට සමාන්තර බිම්ගෙයි ආණ්ඩුවක් අද ද එක්සත් ජනපදයේ ක්‍රියාත්මක වේ. බිම් ගෙවල්, ගල්වැටි හා ගුහාවල සැඟවී සිටින්නේ ඔසාමා බින්ලාදන් පමණක් නොවේ. එක්සත් ජනපද උප ජනාධිපති ඩික් චෙනී ද අද එවැනි ''බිම්ගෙයි සිරකරුවෙකි''.

එක්සත් ජනපදය වඩාත්ම බියට පත් කළ හේතුව නම් ඔවුන් ජීවිතවලින් ගෙවූ වන්දියයි. මුළු එක්සත් ජනපදයට ම ප්‍රථම වතාවට ජීවිත බිය දැනිණි.

ප්‍රහාරයට ප්‍රථම ඔසාමා බින්ලාදන් අඩු ම තරමින් ලක්ෂ දෙක හමාරක් එක්සත් ජනපදිකයන්ට මෙයින් සෘජුවම හානි සිදුවෙතැයි සිතුවේය. ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය නිසි ලෙස පිරී තිබුණා නම් අඩු තරමින් 40,000 ක් පමණ මිය යෑමට ඉඩ තිබිණි. මුලින් එක්සත් ජනපද බලධාරීන්ට කීවේ 17,000 ක් පමණ මියගිය බව ය. එයින් ඔවුන්ගේ සමාජයට ඇති වූ ප්‍රකම්පනය නිසා එය පසුව 7000 දක්වා අඩු කෙරිණි. වසරකට පසු මියගිය ප්‍රමාණය දෙදහස් ගණනක් කරා පල්ලම් බැස ඇත. මෙලෙස සිදු වූ ජීවිත හානි ඇත්තට ම අඩු ද නැත්නම් එය ආරක්ෂක උපක්‍රමයක් හා මානසික මෙහෙයුමක් සඳහා අඩු කළේ ද යන්න පැහැදිලි නැතත් එයින් ඔසාමාගේ ඉලක්කය සම්පූර්ණ විය. එනම් එක්සත් ජනපද ජනාධිතිගේ සිටම වැසියන්ට මරණ බිය දැන්වීමය. ගුවන් යානාවල ගමන් යෑමට, උස ගොඩනැගිලිවල සේවය කිරීමට, ජනාකීර්ණ වේලාවන්වලදී නගර මාධ්‍යයට යෑමට තවමත් ඔවුහු බිය වෙති. ලෝකය පුරාම එක්සත් ජනපද තානාපති කාර්යාල වල තිබූ දිගු වීසා පෝලිම් දැන් නැත. කාට පහර දුන්න ද තමන්ට පහර එල්ල නොවන බවට වූ විශ්වාසයත්, අනතුරු නැති, සුවපහසු මෙලොව දෙව්ලොවක් ලෙස වූ දැක්මත් දැන් බිඳ වැටී බියෙන් මුසපත් වූ ජාතියක් බිහි විය. එක්සත් ජනපදයේ මානසික රෝගවලින් 47% ක් 9/11 ප්‍රහාරයේ තැතිගැන්ම නිසා ඇති වූ බව ප්‍රහාරයෙන් වසරකට පසුව සොයා ගැනිණි.

එමෙන් ම එක්සත් ජනපදය තුළ සැඟව සිටි ඇන්ග්ලෝ සැක්සන් ජාතිවාදය ඉහළට ම නැංගේ ය. ඊනියා බහුවාර්ගික බහු ආගමික කතා ඉවතලිනි. එක ම දේව මෙහෙයකට සහභාගි වූ ජෝර්ජ් බුෂ් හා පවුලත්, බිල් ක්ලින්ටන් හා පවුලත් ඇමරිකානු සතුරන්ට එරෙහිව සටන් කිරීමට ගිවිස ගත්තේය. පක්ෂ දේශපාලනයේ බෙදීම්වලට සීමා පවතින බව ඔවුන් ලොවටම ආදර්ශයක් දෙමින් පෙන්වා දුන්නෝය. ජාතියක් අනතුරට පත් වූ විට සිය ජාතිකත්වය අවදිකර ගත යුතු බව ලාංකිකයන්ට ද එයින් ආදර්ශයක් ලෙස ගත හැක.

ඒ හා සමගාමී දැඩි ජාතික හා ආගමික අන්තවාදයන් මතු ව ආවේ ය. අරාබීහු, විශේෂයෙන් සවුදි ජාතිකයෝ (9/11) ප්‍රහාරයට සම්බන්ධ වූ 19 දෙනාගෙන් 15 දෙනෙක් ම සවුදියට සම්බන්ධය) ප්‍රහාරයට ලක් වූහ. පළමු සතිය තුළ පමණක් අරාබි විරෝධී ප්‍රහාර 250 ක් එල්ල විය. කිහිප දෙනෙක් ම ඝාතනය කරන ලදහ. ක්‍රිස්තියානු මූලධර්මවාදීහු ද වඩාත් රණකාමී වූහ. මේ හා සමගාමී ගෝලීයකරණය තුළ ජාතික ආගමික හැඟීම් අවශ්‍ය නැතැයි කී අය පසුපසට විසි වී ගියෝය. අට්ටාගේ චාරිකාවෙන් ලොකුම විනාශය සිදුවූයේ එක්සත් ජනපද ආර්ථිකයට ය. එය ලෝකයේ ලොකුම ආර්ථිකය. ආසන්නයෙන් ගත් කළ වසර 2000 දී ලෝක ආර්ථිකය වාර්ෂිකව ඩොලර් ට්‍රිලියන 40 ක් විය. එක්සත් ජනපදයේ වාර්ෂික නිෂ්පාදිතය ඩොලර් ට්‍රිලියන 10 ක් හෙවත් එයින් 25% ක් විය. ජෝර්ජ් බුෂ් බලයට එනවිට එක්සත් ජනපද ආර්ථිකය සිටියේ ද පල්වෙමිනි. ලෝක ආර්ථික මධ්‍යස්ථානයට හා පෙන්ටගනයට එල්ල වූ ප්‍රහාරය නිසා ඇති වූ සෘජු හා වක්‍ර ආර්ථික බලපෑම ඩොලර් ට්‍රිලියන 2 ක් හෙවත් එක්සත් ජනපද ආර්ථිකයෙන් 20 %ක් බව කියවේ. (කොටි ත්‍රස්තවාදීන් කටුනායක ගුවන්තොටුපළට එල්ල කළ ප්‍රහාරයෙන් සිදු වූ පාඩුව ඩොලර් බිලියනයක් පමණ වන අතර එය ලංකා ආර්ථිකයේ වාර්ෂික නිෂ්පාදිතයෙන් 8%ක් පමණ විය. එක්සත් ජනපද ප්‍රහාරය එමෙන් දෙදහස් ගුණයක් විශාල හානි ගෙන ආවකි.)

ප්‍රහාරයෙන්ම වැඩියෙන්ම බැට කෑවේ එක්සත් ජනපද කොටස් වෙළෙඳපලයි. එහි වත්කම ඩොලර් ට්‍රිලියන 4 කට වඩා මඳක් වැඩි ය. (2001) ජාත්‍යන්තර නිව්ස්වීක් සඟරාවට අනුව පළමු සතිය තුළ පමණක් එහි සිදු වූ පාඩුව ඩොලර් ට්‍රිලියන 1.38 කි. ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නිසා පමණක් සිදු වූ සෘජු පාඩුව බිලියන 20 කි. එහි ව්‍යාපාර කටයුතු නතර වීම නිසා තවත් බිලියන 4 ක පාඩුවක් වූ බව ගණන් බලා තිබේ. මෙයින් සිදු වූ තවත් ආර්ථික හානියක් නම් දින ගණනාවක් එක්සත් ජනපදයේ බොහෝ නිෂ්පාදන මිනිසුන් වැඩට නොපැමිණීම නිසා නතරවීම ය. ඒ තුළින් අහිමි වූ ධනය බිලියන 150 ක් පමණ වෙතැයි ගණන් බලා ඇත. එමෙන් ම තවත් බිලියන 140 ක් ඇද වැටුණු ආර්ථිකය ප්‍රකෘති කරවීමට යෙදවීමට සිදුවිය. ගුවන්සේවාවලට සිදු වූ පාඩුව බිලියන 5 ක් වන අතර ඒ නිසා පමණක් රැකියා 1,44,540 ක් නැතිවිය. මේ අතර සවුදිය ප්‍රමුඛ අරාබීන්ට සිදු වූ ජාතිවාද ප්‍රහාර හා හිරිහැර නිසා ඔවුන් එක්සත් ජනපදයේ ආයෝජනය කර තිබූ ඩොලර් බිලියන 200 ක් පමණ එරටින් පිටතට ගෙන ගියෝය. කොටින්ම ඇතැම් ස්විස් බැංකු තමන්ට මුදල් එපා යැයි කියන තරමට ඩොලරය ඇද වැටී ස්විස් ෆ්‍රෑන්ක් නැංගේ ය. ප්‍රහාර නිසා එක්සත් ජනපද ආර්ථිකයේ වර්ධන වේගය 0.5-1.0 % අතර

ප්‍රමාණයකින් බිඳ වැටුණු අතර ඇෆ්ගන් ප්‍රතිප්‍රහාරයට හා පොදු ආරක්ෂාව සඳහා වූ වියදම් ඩොලර් බිලියන 350 දක්වා ඉහළ ගියේ ය.

(ප්‍රහාරයෙන් මාස 15 ක් තුළ එක්සත් ජනපද කොටස් වෙළෙඳ පොල තුළ අහිමි වූ ධනය ට්‍රිලියන 3.6 ක් පමණ විශාලය.)

1981-89 කාලය තුළ එක්සත් ජනපද සී.අයි.ඒ. (C.I.A.) විසින් ඔසාමාගේ අල්කයිදා-මුජෙහිඩින්වරුන් නඩත්තු කිරීම සඳහා ඩොලර් බිලියන 3 ක් පාකිස්තානු ඔත්තු සේවා හරහා ලබා දී ඇත. එදා ඉස්ලාමීය මූලධර්මවාදය සඳහා කළ ආයෝජනය පන්සිය ගුණයකටත් වඩා 'ලාභයක්' එක්සත් ජනපදය විඳ ගත්තේය. එක්සත් ජනපද ඔත්තු සේවා ආදියේ බුද්ධිය හා භූරත්වය මෙයින් ප්‍රශ්න කෙරී ඇත.

ආර්ථිකය හැරුණු කොට සමාජයීය ලෙස ද එක්සත් ජනපදය තියුණු ලෙස ප්‍රශ්න කෙරිණි. කළු-දුඹුරු මිනිසුන්ට වෛර කරන සංක්‍රමණික විරෝධීහු, ආගමික අන්තවාදීහු එක්සත් ජනපදයේත් යුරෝපයේත් දේශපාලන බලය ඉන් පසු පැවැත් වූ මැතිවරණවලින් අල්ලා ගත්තෝ ය. මෙය බටහිර ලෝකයේ නව නාසි රැල්ල ලෙස හඳුනා ගැනිණ.

එක්සත් ජනපදයේ මුස්ලිම්වරුන් මිලියන 2 ක් පමණ ඇතැයි තක්සේරු කර ඇත. පුරවැසිකම ලැබූ අරාබීන් 1,62,692 (2002) ප්‍රහාරය එල්ල වූ නිව්යෝක් නගරයේ පමණක් සිටියහ. ලොස් ඇන්ජලීස් නගරයේ 2,83,355 ක් සිටියෝය. පළමු සතිය තුළ පමණක් මරණයට පත් කිරීම්, බරපතල පහරදීම් දේපොල වැනසීම 250 ක් වාර්තා විය. 1994-2001 කාලය තුළ එවැනි හිරිහැර 400 ක් පමණ සිදුවිය. රටපුරා පිහිටා ඇති මුස්ලිම් පල්ලි 1209 ක් අභ්‍යන්තර ඔත්තු සේවයේ (FBI) හි නිරීක්ෂණවලට යටත් වී ඇත. පල්ලිවල කරනා ප්‍රකාශයන් කලින් අනුමැතියට යටත්කර ගත යුතු යැයි නීතියක් පනවා ඇත. ප්‍රහාරයෙන් පසු එක්සත් ජනපදය හා යුරෝපීය රටවල් පැන වූ ත්‍රස්ත විරෝධී නීතිවලින් ඒ රටවල් යුද බලකොටු තත්ත්වයට පත්විය. ඒ මගින් මුස්ලිම්ට පමණක් නොව සුදු නොවන සංක්‍රමිකයින් ද දරුණු පීඩනයකට ලක් කෙරිණි. මෙතෙක් කලක් සඟවා ගෙන ක්‍රියාත්මක වූ බටහිර ලෝකයේ ජාතිවාදය හා ආගමිකවාදය එළියේම ක්‍රියාත්මක වන්නට විය.

සුපුරුදු පරිදි මොහොමඩ් අට්ටාගේ ප්‍රහාරයේ පීඩනයේ ප්‍රතිඵලයක් ලෙස විස්තර කෙරෙමින් ඇත. එය නොදියුණු මුස්ලිම් රටවල තරුණයින්ගේ ආර්ථික ප්‍රශ්නයක් බවට පහත හෙළා ඇත. නමුත් අට්ටාගේ

ජීවිත කථාව පෙන්වා දෙන්නේ සියල්ල ආර්ථිකයට උණනය කරන ලිබරල්වාදී-මාක්ස්වාදී චින්තන දහරාවන්ගේ නොදියුණු කම ය. බටහිර තාක්ෂණික වෙළෙඳ සංස්කෘතිය තුළම ජාතික හා ආගමික මහත් ද නිහිවන බවට අට්ටා හොඳ ම නිදසුනකි.

මොහොමඩ් අට්ටා උපන්නේ ඊජිප්තුවේ කාහිර් අල් ෂෙයික් නම් නගරයේ නයිල් ඩෙල්ටාවේ ය. ඔහුගේ පියා එල් අමීර් ය. එල් අමීර් සිය පුතාට ආදරයට කීවේ 'බොල්බොල්' කියා ය. බොල්බොල් යනු ඊජිප්තුවේ සැරිසරණ පියාඹන ගමන් ගී ගයන කුඩා කුරුල්ලෙකි. ඒ කුඩා කුරුල්ලා 'බොල්බොල්' පැයට සැතපුම් පන්සියයක වේගයෙන් ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට කඩාවදී යයි එල් අමීර් සිතන්නට නැත. කයිරෝවේ 9/11 සිදුවීමෙන් පසු ව පැවැත් වූ ප්‍රවෘත්ති සාකච්ඡාවක දී එල් අමීර් කීවේ තමන්ගේ ''බොල්බොල්'' නිව්යෝර්ක් ප්‍රහාරයට සම්බන්ධ නැති බව ය. එමෙන් ම ඊශ්‍රායලය හා එක්සත් ජනපදය ත්‍රස්තවාදයේ හිස්ටිම බවත් ඔහු කීවේය. පුතාගේ ම තාත්තා!

අට්ටාට සොයුරියන් දෙදෙනෙක් සිටියහ. එක් අයෙක් ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියකි. අනෙකා වෛද්‍යවරියකි. ඔහු වාස්තු විද්‍යාව පිළිබඳ පිළිබඳ ඉංජිනේරුවෙකි. ආර්ථික වශයෙන් ගත් කළ ජීවන ප්‍රශ්න නැති, තාක්ෂණික සමාජ කොටසට අයත් අයෙකි.

අට්ටාට ඊජිප්තුවේ දී තිබුණු එකම ප්‍රශ්නය එහි විශ්ව විද්‍යාලවල ගුරුන් දේශපාලනය මත මිස කුසලතාවය මත සිසුන්ගේ හැකියාවන්ට තැන නොදීම ය. ඔහු කිසි ම ඉස්ලාමීය සංවිධානයකට සම්බන්ධ වී සිටි බවක් ඔහුගේ ඊජිප්තු ජීවිතයේ නැත. 1992 දී ඔහු ජර්මනියේ හැම්බර්ග බලා යන්නේ නාගරික සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගැනීමේ පරමාර්ථයෙනි. එහෙත් එහිදි ඔහුගේ ජීවිත පරමාර්ථ ද තීරණාත්මක ව වෙනස් වේ.

1995 දී අට්ටා මාස කිහිපයක් හැම්බර්ග් නගරයෙන් අතුරුදහන් ව සිටියේ ය. ඒ ඔහුගේ පළමු සටන් පුහුණුවයි. එහෙත් ආපසු පැමිණෙන ඔහු සිය හිතවතුනට කියන්නේ තමන් මක්කම වන්දනාවේ ගිය බව ය. අට්ටාගේ හැම්බර්ග් නිවහන වටේ සිටියවුන් දැක ඇත්තේ බොහෝ දිනවල සමූහ වශයෙන් ඔවුන් එක් වී කුරානය හැදෑරූ බවය. සමූහ අරාබි ආගමික ගායනා ද ඇසී ඇත.

1997-98 කාලයේදී අට්ටා වසරක් පමණ අතුරුදහන් වී සිටියේ ය. ඔහු සිය හිතවතුන්ට කීවේ තමන් ඊජිප්තුවේ සිය පවුල සමඟ සිටි බවයි. එහෙත් ඇත්තෙන් ම ඔහු සිටියේ ඇෆ්ගනිස්ථානයේ සිය අල්කයිදා පවුල සමඟයි.

වර්ෂ 2000 ජුනි 3 දා අට්ටා ෆ්ලෝරිඩාවට යයි. අට්ටා සමඟ ඒ ගමනට අල්ෂෙහි ද සහභාගි වෙයි. ඔවුන් එහි තිබෙන හෆ්මාන් ගුවන් පුහුණු ආයතනට බැඳී ගුවන්යානා පුහුණුව ලබති. ඩොලර් 80,000 ක් සඳහා ඔවුනට දෙසැම්බර් 21 වන දා ගුවන් නියමු බලපත්‍රය ලැබේ. ඉන් පසුව ද ඔවුන් විටින් විට මුදල් ගෙවමින් බොයින් වර්ගයේ ජෙට්යානා පැදවීමට ද පුහුණුව ලබති.

2001 ජුනි 29 දා අට්ටා ලාස් වේගාස්වල දි අල්ෂෙහි සමඟ සලීම් අල්හස්මි හා හානි හාන්ජුවර් හමුවෙයි. එතැනදී එවුන් සිවු දෙන අටකන් කුමන්ත්‍රණයක් කරති. කුමන ගුවන්තොටවලින් කුමන ගුවන්යානා කුමන වේලාවන් හිදි පැහැර ගත යුතු ද යන්න එහිදි තීරණය වේ. ඒ සඳහා පෙරහුරු ගමන් ඊළඟට ඇරඹේ.

2001 ජුලි 09 දා අට්ටා ස්පාඤ්ඤයට යයි. දින දහයක් එහි ගත කරන ඔහු සැතපුම් 1250 ක් සිය කුලී රියෙන් ගිය බව වාර්තා වී තිබේ. ක්‍රිස්තියානින් විසින් මුස්ලිම්වරුන් සහමුලින්ම අතු ගෑ දැමූ කුරුස වෛරයේ ස්පාඤ්ඤ බිමේ දි ඔවුන්ට අල්කයිදා අවසන් නිවේදනය ලැබේ.

සැප්තැම්බර් 01 වනදා ඔහුට විදුලි මාර්ගයෙන් මුදල් සවුදියේ සිට හා යේමනයේ සිට ලැබේ. ඒ අවසාන වියදම් සඳහාය. සැප්තැම්බර් 07 වන දා අට්ටා හා අල්ෂෙහි හොලි බාඩ් හි ඔයිස්ටර් බාර් එකට ගොස් කා බී විනෝද වෙති. ඩොලර් 47 බිල වෙනුවට ඩොලර් 50 ක් ම දී ආපසු එති. කාබී විනෝද වූ යුගය එදා රාත්‍රියෙන් අවසන් වේ. ඔවුන් මුලින් සැලසුම් කළේ 09/09 දා එක්සත් ජනපදයට මරණය ගෙන දීමට ය. දහවල් කාලය ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය පිරී ගිය විට ප්‍රහාරය දියත් කිරීම අරමුණ විය. කෙසේ වෙතත් දිනයත් වේලාවත් ඔවුන් පමණක් දන්නා හේතුවක් නිසා වෙනස් කෙරිණි.

09/11 උදෑසන හිරු නැගෙත් ම අට්ටා 'සත්‍යයේ දිනය' ඇරඹුවේ ය. අරාබි බසින් ලියවුණ සිය අන්තිම රාත්‍රියේ වැකි කියවමින් ම ඔවුහු කුලියට මෝටර් රියකින් ගුවන් තොටුපළ කරා ආවෝ ය. එතැනදී ඔවුන්

අත ඉතුරුව තිබූ මුදල් විදුලි මාර්ගයෙන් ඩුබායි හි අල්කයිදා කමිටුවකට යවන ලදී. සියල්ල ඉතා අරපිරිමැස්මෙන් කළ බවට එයත් සාක්ෂියකි. මුළු ප්‍රහාරයට ම එහි සැලසුම් මුල් අදියරේ සිට ම වියදම් වී ඇත්තේ ඩොලර් ලක්ෂ 05 ක මුදලකි. එයින් සාතිශය බහුතරය වැය වූයේ අට දෙනෙකුට ගුවන් යානා නියමු පුහුණුව ලබා ගැනීම සඳහා ය.

තම මෝටර් රථය ගුවන් තොටුපලේ රථ ගාලේ අතැර දැමූ ඔවුහු සිය අවසන් චාරිකාව ඇරඹුවෝ ය. ඊළඟ මිනිත්තු කිහිපයේ දී ඔවුන් විසින් ලෝකය ම හෙල්ලුම් කවා තිබිණි.

මොහොමඩ් අට්ටාට ආර්ථික ප්‍රශ්න නොතිබිණි. ඔහු හා ඔහු සමඟ ගිය පිරිස බටහිර තාක්ෂණය මැනවින් හදාරා සිටියෝ වූහ. එමෙන් ම ඔවුහු සිය අරමුණ සඳහා බටහිර තාක්ෂණය යොදා ගත්හ. ඔවුහු නූගතුන් නොවූහ.

නමුත් ඔවුන්ට විශ්වාසයක් විය. එය ඔවුන් ප්‍රශ්න කළේ නැත. එනම්,

එක ම මැවුම්කාරයා අල්ලා බවත්
එක ම ගැළවුම්කරු මහමත්තුමා බවත් ය.

ලා ඉලහා ඉල් අල්ලාහ්
මුහමුද්දා රාසුල්ලා

## මහමත් නම් දිවැසිවරයා

මහම්මත්තුමා භාවිත වර්ෂ 570 අප්‍රේල් 22 දා මොලොව එළිය දුටු බව විශ්වාස කෙරේ. ඔහුගේ පියා වූයේ අබ්දුල්ලා ය. මව අමීනා බින්ට් වහබ් වූවා ය. ඔවුන් මක්කම (Meca) නම් ප්‍රචලිත වෙළෙඳ නගරයේ Qajdrhsla (Quraish) ගෝත්‍රයට අයත් වෙළෙන්දන් වූහ.

මක්කම ඒ වන විටත් අරාබියේ වෙළෙඳ මධ්‍යස්ථානයකි. පන්දහසක් පමණ ජනයා එහි ගැවසුණහ. එය වෙළෙඳ මධ්‍යස්ථානයක් මෙන් ම ආගමික මධ්‍යස්ථානයක් ද විය. කබා පූජ්‍යස්ථානය ඒ දිනවල ද පැවතියේ ය. එහි කාලවර්ණ පාෂාණයකට දූරාදීතයේ සිටම වැඳුම් පිදුම් සිදු විය. මෙයට අමතර ව විවිධ දෙවිදේවතාවුන්ගේ පිළිම වන්දනාව ද සිදු විය. වෙළෙඳ නගරයක් නිසා අරාබිය අවට හා ඈත පෙරදිග ඉන්දියාව හා චීනය සමඟ සබඳතා තිබිණි. මේ නිසා ඒ වන විටත් අරාබියේ පැවති සරතුෂ්ත, යුදෙව් හා කිතුනු ආගම් මෙන් ම පෙරදිග ඉහළ තලයක තිබුණු බුදු දහම ආදියේ බලපෑම ද තිබෙන්නට ඇත. එක් මතයකට අනුව චීනයේ සිට වත්මන් ඇෆ්ගනිස්ථානය (අවකන් දේශය) හරහා තිබූ සේද මාවතේ සියළු ම ප්‍රදේශ බුදු දහමට අනුකූල ව ජීවත් වී ඇත. පසුගිය කාලයේ තලේබාන් මූලධර්මවාදය විනාශ කළ බාමියන් බුදු පිළිම මෙන් ම වත්මන් ඉරානයේ හා ඉරාකයේ ද බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ ව සටහන් තිබීමෙන් මක්කම හා ඒ අවට ප්‍රදේශයේ ද අඩු තරමින් බෞද්ධ ඇදහිලි ක්‍රම පවතින්නට ඇති බව පැහැදිලි ය.

මහමත්තුමාට පෙර රතු මුහුද අවට ප්‍රදේශයේ සංවිධිත ආගමක් ලෙස පැතිර තිබුණේ සරතුෂ්ත දහමයි. 'සෝරෝස්ට්‍රා' නම් පර්සියානු (වත්මන් ඉරාන) ජාතිකයෙකු මේ දහමට මූලික් විය. පර්සියාවේ කඳුකර ප්‍රදේශවල හා කොකේසියානු ප්‍රදේශවල මුල්බැස ගත් ඉපැරණි ආර්ය ගෝත්‍රවල දැක්ම බොහෝ දුරට හැඩ ගැසුණේ සරතුෂ්ත දහමෙනි. ලෝක මැවුම්කාර පීතෘ දෙවියකු පිළිබඳ අදහස මෙන් ම ද්වන්ධවාදය ද එහි පදනමක් විය. ඇතැම් විට ඉන්දීය දර්ශනවල බලපෑම ද තිබෙන්නට ඇත. දෙවියන් හා සාතන්, පිරිමියා හා ගැහැනිය ආලෝකය හා අඳුර, මිනිසා හා පරිසරය, තෝරාගත් ජනතාව හා සෙස්සන් ලෙස ලෝකය බෙදීමත් එකින් එකක් අනෙකා අබිබැවීමත් ඔහුගේ ආගමේ සාරය විය. මේ කලාපයේ මුල්ම ව්‍යාප්තිවාදීන් බවට පර්සියානුවන් පත්වන්නෙත් හක්කමානුසීය රාජ යුගය වනවිට ඔවුන් බොහෝ ප්‍රදේශ තම මහා රාජධානියට යටත් කරන්නේත් සරතුෂ්ත දහමින් ලද මානසික හා කායික බලය නිසා විය හැක.

හක්කමානුෂීය රජු ඩේරියස්, ගෞතම බුදුරජාණන් වහන්සේ සමකාලිනයකු වන අතර, 'ශක්‍ර රජු' ලෙස බෞද්ධ ඉතිහාසයේ සඳහන් වන්නේ ඔහු යැයි මතයක් පවතී. ඒ කෙසේ වෙතත් ඩේරියස්වරුන් යටතේ පර්සියාව ලොව පුරා ප්‍රචලිත කළ සංකේත හා අදහස් ඉන්දියාවේ පමණක් නොව ලංකාවේ සිංහල ශිෂ්ටාචාරය තුළ ද ප්‍රචලිත ය.

මේ ප්‍රදේශයේ ඊළඟ ප්‍රබල යුදෙව් දහමයි. ලෝකය මැවූ සර්වබලධාරී දෙවියකු ඇති බවත්, එතුමන්ට යටත් ව ජනතාව ජීවත් විය යුතු බවත් යුදෙව් දහමේ හරයයි. එකී දහමේ ප්‍රධාන තේමාවක් වන්නේ දෙවියන් විසින් තෝරාගත් ජනතාවක් (ඊශ්‍රායල්) ඇති බවත්, විටින් විට දේව පණිවිඩය රැගෙන වක්තෘවරුන් හෙවත් ගැලවුම්කරුවන් මෙලොවට එන බවත් ය. බයිබලයේ පළමු ගිවිසුම යන කොටස යුදෙව් ආගමට ද පොදු ය. එය ඉස්ලාමය ද යම් පමණකට පිළිගනී.

වැඩිදුර හැදෑරීමක් නොකර තිබුණ ද වත්මන් ඊජිප්තුව හා ඉතියෝපියාව පදනම් කරගෙන කළු ජාතික ශිෂ්ටාචාරයක් තිබිණි. මාර්ටින් බර්නෙල් සිය 'කළු ඇතීනා' කෘතියේ ඉතා තර්කාන්විත ව හා කරුණු සහිත ව පෙන්නා දී ඇත්තේ ඊජිප්තුවේ පාරාවෝ ශිෂ්ටාචාරයට කළු මිනිසුන්ගේ තිබූ බලපෑමයි. අන් ජනයා මෙන් නොව ඔවුන්ගේ ඇදහිලිවල පදනම වුණේ පීතෘ නොව මාතෘ දෙවිවරු ය. එමෙන් ම ඔවුහු පරිසරය ද එයට ජීවය දෙන සූර්යයා ද ඇදහූහ. පිරිමියාගේ ශක්තිය ද පදනම් කරගත්,, පරිසරය හා තවත් අන් ජනයා යටත් කරන සුළු දැක්මට වඩා එහි තිබුණේ සියල්ල සමඟ සාමයයි. සහනශීලිත්වයයි. තෝරාගත් විශේෂිත ජනයා එහි නොසිටියහ. ගැලවුම්කරුවෝ ද නොවූහ. සියල්ලෝ සියල්ලන්ට වගකිව යුතු වූහ.

මේ ප්‍රදේශයේ මතු වූ අනෙක් බලවත් දහම වුණේ ක්‍රිස්තියානිය ය. ජේසුස් ක්‍රිස්තුස් එහි ප්‍රකාශකයා විය. ජේසුතුමා යුදෙව්වෙකු විය. යුදා ආගමේ තිබූ ඇතැම් ආක්‍රමණික කරුණුවලට එරෙහි ව හෙතෙම කරුණාව පිළිබඳ ව සටන්කාමී මතයක් ඉදිරිපත් කළේ ය. ඇසට ඇසක් උදුරා ගැනීමේ මුල් ගිවිසුමේ මතය තිබියදී ම ''දකුණු කම්මුලට ගසන්නන්ට වම් කම්මුල හරවන්නැයි'' කීවේ ය. බයිබලයේ නව ගිවිසුම නමින් හැඳින්වූයේ එයයි. ජේසුතුමාගේ මේ කරුණාව හෝ ප්‍රේමය පිළිබඳව සංකල්පය පිළිබඳව මත දෙකක් ඇත. එකක් නම් ඒවා පැරණි ඊජිප්තු ඇදහිලිවලින් ග්‍රීක වහලුන් හරහා ක්‍රිස්තියානියට මුල් යුගයේ දී ජේදුරු නිසා එක් වූ බව ය. දෙවැනි මතය නම් ජේසුතුමාට උතුරු ඉන්දීය ප්‍රදේශවල විශේෂයෙන්

තිබ්බතයේ (ටිබෙට්) බෞද්ධ ලාමාවරුන්ගෙන් සේද මාවත හරහා මේ පණිවිඩය ලැබුණු බව ය.

කෙසේ වෙතත් මහමත් තුමා උපත් ලබන්නේ මෙවැනි සංකීර්ණ ආගමික ඇදහිලි පැතිර ගිය යුගයන්ට පසුව ය. පර්සියාවේ ඩේරියස් ද ග්‍රීකයේ ඇලෙක්සැන්ඩර් ද, රෝමයේ ජූලියස් සීසර් ද බිහි වී සියවස් ගණනකට පසුව ය.

රතු මුහුද අවට මැද පෙරදිග කලාපය අපූරු ජනාවාසයකි. බයිබලයේ මතය අනුව ලොව මුල් ම මිනිසා වූ නෝවාට පුතුන් තිදෙනෙක් වූහ. හැම් නිසා කාල හෙමටික්වරු ද, සෙම් නිසා දුඹුරු සෙමටික් වරු ද ජැප් නිසා සුදු ජැපටික් වරු ද ඇති වූ බව වංශ කතාවයි.

නෝවා සිටියා ද නැද්ද යන්නට වඩා කළු, දුඹුරු, සුදු යන වර්ණ තුනටම අයත් වාර්ගික ශිෂ්ටාචාරයක් මැදපෙරදිග එකට මුසු වූ බවක් පෙනේ. පසුව මෙයට මොංගෝලියානු කහ ශිෂ්ටාචාරයන් ද එක් වීමෙන් වාර්ගික සංකලනයක් ඇතිවිය.

මහමත්තුමා උපත ලබන්නේ බේඩුයින් නමින් හැඳින් වූ කූඩාරම් ගසමින් තැනින් තැනට ගිය සංචාරක අරාබි ගෝත්‍ර අතර ය. අරාබීන් නොමැඩි ආර්ය ගෝත්‍රයක් ලෙස විශ්වාස කෙරේ.

අරාබි බසින් ඉස්ලාම් යනු කැපවීම, සාමය වැනි හැඟීම් දනවන වදනකි. මුස්ලිම් යන්නෙහි තේරුම ලෙස ගැනුනේ දෙවිඳුන්ට කැප වූ යන්නයි.

මහමත්තුමා මෙලොව එළිය දැකීමට පෙර පියාණන් වූ අබ්දුල්ලා මියගිය බව විශ්වාස කෙරේ. කුඩා කළ එතුමා හැදී වැඩුණේ තම සීයා වූ (පියාගේ පියා) අබ්දුල්ලා මුතාලිබ් යටතේ ය. මුතාලිබ් මිය ගිය විට අබු තාලිබ් නම් මාමා යටතේ හැදී වැඩිණි.

ඔහු සිය මාමා වූ තාලිම් සමඟ වෙළෙඳාම සඳහා සිරියාව ඇතුළු විවිධ ප්‍රදේශවලට ගියේ ය. පසු ව ඔහු කදීජා, නම් වූ වැන්දඹු ධනවත් වෙළෙඳ කාන්තාව ලඟ සේවයට ගියේ ය. ඉක්මණින් ම ඔහු ඇයගේ ව්‍යාපාර කටයුතු මෙහෙයවන්නට විය. එයින් ගොඩනැගුණු විශ්වාසය සමඟ මහමත් කදීජා සමඟ විවාහ විය. කදීජා ඔහුට වඩා වැඩිමහළු වුවත් වසර

විසි හයක් කදීජාගේ මරණය තෙක් මහමත්තුමාගේ එක ම බිරිඳ වූයේ ඇය ය.

සාමාන්‍ය පවුලක උපත ලැබූ මහමත්තුමාට කදීජා හා වූ විවාහය නිසා වෙළෙඳ සමාජයේ ප්‍රභූත්වයට පත් වීමට හැකි විය. මෙය ඔහුට සමාජ නායකත්වය සඳහා ඒ දිනවල කදිම පිටුවහලක් විය.

වයස හතළිහ පමණ වනවිට ඔහු බොහෝවිට නිශ්ශබ්ද අධ්‍යාත්මික ජීවිතයකට එකලාව ම ගමන් කළේ ය. ඒ දිනවල මක්කාවේ විශ්වාසය වූයේ කබා දේවස්ථානය ඒබ්‍රහම් විසින් මැවුම්කාර දේව වන්දනාව සඳහා ගොඩ නැගුවක් බව ය.

නමුත් එහි විවිධ දෙවි දේවතාවුන් විශේෂයෙන් දෙවියන්ගේ දියණිවරුන් ය යි කිවූ දේවතාවියන්ගේ පිළිම ගණනාවක් වන්දනා මාන කෙරිණි. මහමත්තුමා මෙහි යන්නට එන්නට ඇත.

දිනක් ඔහු හිරා කඳු මුදුනේ තනි ව සිටින විට යමෙකු (ගේබ්‍රියෙල් දර්ශනය වී මෙසේ කියනු ඇසිණි.

"මහමත් ! නුඹ අල්ලාගේ පණිවිඩකරුවා ය!

ඉස්ලාම් විශ්වාසය අනුව ප්‍රථම දිව්‍ය පණිවිඩය රාමදාන් රාත්‍රියේ ලැබිණි. (ඉස්ලාමීය දින දසුන අනුව 9 වැනි මාසය) ඉන් පසු මෙවැනි පණිවිඩ රැසක් ඔහුට ඊළඟ විසි අවුරුද්ද පුරා ම ලැබිණි.

දෙවියන් වෙතින් සෘජුව ම මහමත්තුමා වෙත ලැබුණා යැයි විශ්වාස කරන මේ වදන් ඔහුගේ අනුගාමිකයන් විසින් ලේඛනගත කරන ලදී. ඒවා පසුව කුරානය (Quran) නමින් වූ ලේඛනයක් විය. මෙය පරිච්ඡේද 114 ක් ගීතාවලි (සූරා) 6616 කින් සමන්විත ප්‍රකාශනයක් විය. කුරාන් යන්නේ අරාබි තේරුම කියවීම ය. එනම් දේව කියවීම ය.

මෙයට අමතරව ඒ ඒ අවස්ථාවලදී මහමත්තුමා ද යම් යම් ප්‍රශ්න පිළිබඳව සිය අදහස හා තීරණ දැනුම් දී ඇත. ඒවා සුන්න හෙවත් හාදිත් ලෙස හැඳින්වේ.

භාවිත වර්ෂ 613 දී මහම්මත් එසේත් නැත්නම් මුහමද් ඉබන් අබ්දුල්ලා, තම බිරිඳ හා කිට්ටුවන්ත ඥාතීන්ගෙන් සමන්විත කුඩා කණ්ඩායමකට දේශනා කිරීම ඇරඹුවේ ය. ඔහුගේ පළමු අනුගාමිකයා වූයේ කදීජාය. දෙවැන්න ඔහුගේ ඥති අලී ය. (අලී මහමත් හා කදීජා හදාවඩාගත් අයෙකි.) තුන්වැන්නා ඔහුගේ සේවක සායිද් ය. හතරවැන්නා ඔහුගේ මිතුරෙකු වූ අබුබකර් ය. (580-634) ඔහුගේ මුල් දෙසුම් ඉතා සරල විය.

''සියළු පිළිරූ, සංකේත ඇදහීම අත්හැරිය යුතු ය. පූර්ණ ලෙස සියල්ල දත්, සර්වබලධාරී අල්ලාට යටත් විය යුතු ය.''

ඔහුගේ මේ ඒක දේවවාදය කබාවෙහි එවකට පැවැති බහු දේවවාදයට හා දෙවි දේවතාවියන්ගේ පිළිරූ වන්දනාවට එරෙහිව ගියේ ය. ගොවිතැන හෝ වෙනත් නිෂ්පාදනයක් නොවූ බැවින් මක්කමේ වෙළෙඳ ප්‍රජාව යැපුණේ කබාව කරා ආ වන්දනා කරුවන් නිසා ය. මේ නිසා ඉක්මණින් ම මහමත්තුමා මක්කමේ වෙළෙඳ ප්‍රජාවේ කෝපයට හේතුවක් විය. විශේෂයෙන්ම මහමත් උපන් ක්වරයිෂ් ගෝත්‍රය ඔහුට හා අනුගාමිකයන්ට එරෙහිව නැගී සිටියහ. ඔවුන් මරණයට පත් නොවී බේරුණේ කදීජාගේ ධනවත්කම හා මහමත්තුමා තම ඇතැම් අනුගාමිකයන්ට වෙනත් රටවලට යන ලෙස උපදෙස් දී ඇත. (ක්‍රිස්තියානි ඇබිසීනියාව වැනි)

එල්ල වූ පීඩනය හමුවේ මහමත්තුමා මක්කම අතහැර එයට සැතපුම් 200 ක් ඊසාන දිගින් පිහිටි යාත්රිබ් හෙවත් අරාබි බසින් මදීන බලා සිය හිතවත් ම අනුගාමිකයන් හා පිටත්ව යයි. මහමත් විරෝධීන් ඔවුන් පසුපස හඹා එති. බියට පත් අබුබකර්ට මහමත් මෙසේ කියයි.

''බිය නොවන්න. අල්ලා අප සමඟයි''

මහමත්තුමා ආගමික නඩය මදීනා හෙවත් දිවැසිවරයාගේ නගරය කරා ගිය 'ආගමික ගමන' හිජ්රා නමින් හැඳින්වේ. මදීනාවේ පළමු වසර භාවිත වර්ෂ 622 විය. එය මුස්ලිම් දින දසුනේ පළමු වසරයි. (ජුනි 20-0622)

මදීනාව යුදෙව් බලය පැතිර තිබූ නගරයකි. එහෙත් එහි විසූ කස්රාජ් නමින් හැඳින් වූ ගෝත්‍රික කණ්ඩායම ඉස්ලාමය වැළඳ ගත්හ. එකී ගෝත්‍රයට හරස්ව සිටියේ 'ඖස්' නම් ගෝත්‍රයයි. මහමත්තුමා කළ පළමු

දෙයක් නම් මේ ගෝත්‍ර දෙක ම සමඟි කිරීම ය. ඉන්පසු ගෝත්‍රික මහා සභාවක දී ඉස්ලාමයට හා මහමත්තුමාට රැකවරණය දීමට මදීනා ජන කණ්ඩායම් තීරණය කළහ.

ඉස්ලාමයේ බල ව්‍යාප්තිව ඇත්තට ම ඇරඹෙන්නේ මදීනාවෙනි. මහමත්තුමා මදීනාවේදී කරුණු දෙකක් ඉටු කළේ ය.

පළමුව එතුමා වෙන් වෙන් දෙවිවරුන් හා සංකේත පුදමින් සිටි ගෝත්‍රික ජනයා (යුදෙව් නොවන) එක් දෙවියෙකු යටතට (අල්ලා) ගත්තේ ය. ''අල්ලා ඉදිරියේ තෙපි සියල්ලෝ සමානයෝ ය.'' ඒ සමගම එකී ගෝත්‍රික කණ්ඩායම්වලට අවශ්‍ය මානසික සහනය, විශ්වාසය හා බලාපොරොත්තුව ලැබිණි. ''අල්ලා තෙපිව ආරක්ෂා කරන සේක'' ඉනික්බිති ඔවුන් සියළු දෙනාගේ ම ගෝත්‍රික බැඳීම වෙනුවට එයට ඉහළින් ඇති 'දේවබැම්මක්' ගොඩනගනු ලැබී ය.

දෙවනුව ඔහු එකී ගෝත්‍රික කණ්ඩායම්වල එදිනෙදා ජීවිතය විධිමත් කළේ ය. කුරානයේ මදීනා කොටසේ ඇති දේව කියවීම් අනුව මෙය ඉතාමත් පැහැදිලි ය. ගෘහ ජීවිතය පිළිවෙලක් කරගන්නා අයුරු හා වෙළෙඳ හා සමාජ ජීවිතය සඳහා නීති ඉදිරිපත් කිරීම එයින් සිදුවී ඇත. කෙටින් ම මහමත්තුමා බෙදී සිටි මදීනාව එක ම සමාජ සංවිධානයකට පොදු පාලනයනක්, පොදු නීතියක් යටතේ ගත්තේ ය.

මෙතැනදී පැන නැගුණු වදනක් නම් 'උම්ම' යන්න ය. ඉස්ලාමය අදහන ජන කණ්ඩායම උම්මා නමින් හැඳින්වේ. උම්මාවේ ආරක්ෂාව පිළිබඳව ද මහමත්තුමා උනන්දු වී ඇත. ඒ සඳහා එකට එක කිරීම යොදා ගෙන ඇත. ''ඇසට ඇසක්, දතට දතක්, තුවාලයට තුවාලයක් හා ජීවිතයට ජීවිතයක් .... '' ලෙස ය.

මදීනාවේ දී මහමත්තුමා ගෘහ ජීවිතය විධිමත් කළේ ය. පිරිමියා ගැහැණියට වඩා උසස් (2-228) ලෙස සැලකූ මහමත්තුමා එනමුත් කාන්තාවට ද දේපොල අයිතිය විවාහය හා දික්කසාදයේ දී සම අයිතිය ඇති බව ප්‍රකාශ කළේ ය. පිරිමියෙකුට උපරිම ලෙස කාන්තාවක් සිව් දෙනෙකු විවාහ කරගත හැක.(මහමත්තුමාද එසේ කළේය.) එහෙත් ඔවුනට සම ව සැලකීමට නොහැකි නම් එක් බිරියක් පමණක් තබාගත යුතුවේ. විවාහක කාන්තාවක් කාම මිථ්‍යාචාරයේ යෙදී සිටිය බවට සිව් දෙනෙකුගේ සාක්ෂි තිබුණොත් නිවාස අඩස්සිය හෝ මරණය නියම වේ.

සමාජමය නීති ද ඉදිරිපත් කරන ලදී. මත්ද්‍රව්‍ය භාවිතය, ගණිකා වෘත්තිය සූදුව සපුරා තහනම් විය. වංචාව, ව්‍යාජය, කපටිකම, දූෂණය හා ප්‍රචණ්ඩ හැසිරීම් ද තහනම් කර ඇත. සොරකමට දඬුවම අත් පා කපා දැමීම ය.

මදීනාවේ දී මහමත්තුමා ඉස්ලාම් රාජ්‍ය සංකල්පය (දාර් අල් ඉස්ලාම්) ඉදිරිපත් කළේ ය. මේ සඳහා ඔහු ව්‍යවස්ථාවක් ද ඉදිරිපත් කළේ ය. (මදීනා ශුද්ධ ව්‍යවස්ථාව)

එහි දී උම්මාව තමන්ගේ ආරක්ෂාව පිළිබඳ ව රුධිරයෙන් වගකිව යුතු ය. අපරාධවලට එරෙහිව පවුල, ගෝත්‍රය නොසලකා ක්‍රියා කළ යුතු ය. අවශ්‍ය විටක උම්මාවේ රැකවරණය සඳහා යුද්ධය හෝ සාමය රැක ගැනීමට ඉදිරිපත් විය යුතු ය. සාමාජිකයන් අතර අරගල විසඳීමට මහමත්තුමාට හෝ දේව නීතියට බාර කළ යුතු ය......''

මේ සියල්ල මගින් මදීනාව මහමත්තුමා වසර කිහිපයක් තුළ (622-630) සිය ආගමික යුද දේශපාලන බලය යටතට ගත්තේ ය. ප්‍රථම ඉස්ලාමීය රාජ්‍යය පිහිටුවී ය. එයට එරෙහිව පැවති සටන් කිපයක් ජය ගත්තේ ය.

ඉස්ලාමයේ ඉතාම වැදගත් අංගයක් නම් සිය දහම අල්ලා නොඅදහන අය ව්‍යාප්ත කිරීම ය. මහමත්තුමා මදීනාවෙන් නතර නොවී ය. භාවිත වර්ෂ 630 දී ඔහු හා ඔහුගේ ඉස්ලාමීය හමුදා මක්කමට පහර දුන්හෝය. පරාජය කරනු ලැබූ ක්වරයිෂ්වරු බලයෙන්ම ඉස්ලාමයට හරවනු ලැබූ හ.

කබා දේවස්ථානයට ගිය මහමත් හා අනුගාමිකයෝ එහි තිබූ විවිධ පෙති පිළිම 360 ක් විනාශ කළෝ ය. අන්තිමේ දී කාලවර්ණ පාෂාණයට සිය යශ්ටිය තැබූ මහමත්තුමා මහ හඬින් මොර දුන්නේ ය.

''අල්ලා හු අක්බාර්'' - (අල්ලා දෙවිඳුන් ශ්‍රේෂ්ඨයි)
එතැන් සිට එය ඉස්ලාමයේ රණ ගීය විය.


## ජිහාදය ඇරඹේ !

ඉස්ලාම් රාජ්‍යයේ ආගමික නායකයා හා පාලකයා කලිපාත් නමි හැඳින්වේ. බද්ර්, උහුද් (ක්වරයිෂ්වරුන්ට එරෙහි ව), ක්හෙයිබ (යුදෙව්වන්ට එරෙහි ව) ආදි සටන්වලින් පසු මහමත්තුමා මදීනාව ව්‍යාප් කළේ ය. නමුත් ඔහුගේ ඉලක්කය වුණේ මක්කමයි. මුලදී ඔහු ක්වරයිෂ්වරු සමඟ එකඟතාවයෙන් (අල් හුදයිබියා) කබා වන්දනාවට සූදානම් විය. පසු ව ඔහු යුද්ධයෙන් ක්වාරයිෂ්වරු ජය ගත්තේය. මේ සියල්ල විසින් පෙනුණේ ඉස්ලාමයේ පැවැත්ම සඳහා එහි නායකයා හුදු ධර්මය දේශනා කරන්නෙකු පමණක් නොව හොඳ යුද සෙනෙවියෙකු ද විය යුතු බව ය. අශ්වයන් පුහුණුව හා උන් පිට නැගී සටනට ද, ඔටුවන් පුහුණුව ද මහමත්තුමා ප්‍රගුණ කළේ ය. සන්නිවේදනය, අවි බලය හා හමුදාවල ගමනේ වේගය යුද ජයග්‍රහණ සඳහා අත්‍යාවශ්‍ය බව ඔහුට වැටහිණ. මේ සියල්ල ඔහු ලේඛන ගත කළේ ය.

මහමත්තුමා සිය ඉස්ලාම් රාජ්‍යය මක්කමෙහි ස්ථාපිත කළ අවධිය කලිපාත් ළදරු යුගය වශයෙන් සලකනු ලැබේ. මක්කම සිටියදී ජයග්‍රාහී මහමත්තුමාට අරාබියෙන් ද, උතුරු අප්‍රිකාවෙන් ද විවිධ ගෝත්‍ර පැමිණ ඉස්ලාමය සඳහා ආරාධනා කළේ ය. ඔහු ඒ සියළු දෙනා සිය ආගමට එකතුකර ගත්තේ ය.

රෝම අධිරාජ්‍යයෙන් පීඩනය යටතේ ජේසුතුමා රාජ්‍යය හා ආගම වෙන් කළේ ය. ''දෙවියන්ගේ දේ දෙවියන්ටත්, සීසර්ගේ දේ සීසර්ටත් දෙන්න'' යන්න ජේසු තුමාගේ ප්‍රසිද්ධ බයිබල් ප්‍රකාශයකි. රෝම අධිරාජ්‍ය වූ කොන්ස්ටන්ටයින් (ක්‍රි.ව. 400) විසින් සෙසු ඇදහීම් විනාශකර ක්‍රිස්තියානිය යුරෝපයේ රාජ්‍ය ආගම කරද්දීත්, අධිරාජ්‍යට අමතර ව, පාප් නමින් ආගමික නායකත්වයක් බිහි කරද්දීත් මේ ගැටළුව තිබිණි. රාජ්‍යය හා ආගම් අතර තිබුනු සබැඳියාව යටින් දිවෙනා එකක් වන අතර මතුපිටින් එය වෙන් වී පවතී.

බුදු දහමේ ද මුල පටන් මේ ගැටළුව තිබිණි. රාජ්‍ය පාලනය පිළිබඳ අනුශාසනා මිස බුදුරජාණන් වහන්සේ හෝ මහා සංඝයා වෙනත් රාජ් කටයුතු සඳහා මැදිහත් නොවිණි. මෙය අනුරපුර යුගයේ දී ලංකාවේ දී රජු-සංඝයා හා ජනතාව අතර වූ සම්මුතියක් විය. බෞද්ධ රාජ්‍යය ලෞකික අරුතින් දුර්වල වීමට, රාජ්‍යය හා ආගම අතර තිබුණු සබඳියාව හා එය දිගට ගෙන යන ආකාරය ගැන තිබූ නොපැහැදිලිකම ද බල පෑවේය.



අල්කබා දේවස්ථානය



අල්මදීනා දේවස්ථානය

යුදෙව් දහම තුළ ද මෙය මෙතරම් පැහැදිලි නැත. රාබි ඉගැන්වීම් සහිත යුදෙව් ආගම මතු වූයේ හීබෲ රාජ්‍යයේ අවසානයත් සමඟ ය. මෝසෙස් ආගමික යුද, දේශපාලනික නායකයා වුවත් වත්මන් ඊශ්‍රායලයේ පවා රාජ්‍යත්වය ආගමික නායකයින්ට වෙනස් ව පවත්වා ගනී.

අන් ආගම්වල තිබූ මේ සංකීර්ණතාවය ඉස්ලාම් දහමේ නොවී ය. පාලකයාත්, ආගමික නායකයාත්, ලෞකික ජීවිතයත් ආගමික ජීවිතයත් එකක් ම විය. ආගමට කැප වූ මිනිසුන් (උලේමාව) සිටියත් බෞද්ධ, හින්දු හෝ ක්‍රිස්ත්‍රියානි ආගමේ මෙන් වෙන් වූ පැවිදි පන්තියක් එහි නැත.

මක්කමේ දි රෝගාතුර වූ මහමත්තුමා තමන්ගෙන් පසු ඉස්ලාමයට ඇති තර්ජනය දුටුවේය. මේ නිසා ම ඔහු වැඩි වැඩියෙන් සාමූහික වීම හා නිරන්තර පුහුණුවීම් තුළින් උම්මාව ඉස්ලාමය තුළට කාවැද්දවීමට උත්සාය ගත්තේ ය.

මේ සඳහා මහමත්තුමා ඉස්ලාමිකයන් වීමට පංච මූලධර්ම හෙවත් 'පන් පදනම්' ඉදිරිපත් කළේ ය.

| | | | |
|---|---|---|---|
| i. | ෂහාදා | - | සියල්ලට මූලික පණතයි |
| ii. | සලාත් | - | යාඥාවයි |
| iii | සකාට් | - | දානයයි |
| iv | සවම් | - | උපවාසයයි (රාමදාන්) |
| v. | හජ් | - | වන්දනාවයි. |

ඉස්ලාමිකයෙකු වීමට නම් සාක්ෂිකරුවන් ඉදිරියේ හොඳා හෙවත් මූලික පනත මැතිරීම අනිවාර්ය ය. එනම් ''ලා ඉලාහා ඉල් අල්ලා - මුහමද්දා රාසුල්ලා - හෙවත් අල්ලා හැර අන් දෙවියකු නැත - මහමත් එකම දිවැසිවරයා ය.'' එය කොපමණ වාර ගණනක් මතුරන්නේ ද යන්න පුද්ගලයාට අයත් කරුණකි.

සලාත් යනු යාඥාවයි. පුද්ගලයින් ලෙසත් පොදුවේත් දිනකට පස් වරක් (හෝ තුන්වරක්) මක්කම දෙසට හැරී මෙය සිදු කළ යුතු ය. සිකුරාදා හා ආගමික වශයෙන් වැදගත් දිනවල කරන සාමූහික යාඥාව මගින් ඉස්ලාමීය උම්මාව තුළ සාමූහිකත්වය ප්‍රසිද්ධියේ ශක්තිමත් කරයි. සිට ගැනීම, නැමීම, දණ ගැසීම වැනි යාඥා ඉරියව් සරඹ කණ්ඩායමක හෝ හමුදා අනුබණ්ඩයක හෝ ක්‍රියාවක් මෙන් සාමූහික විනය ඇති කරයි. ප්‍රසිද්ධ

සාමූහික යාඥා සඳහා සහභාගි වන්නේ පිරිමින් පමණි. පල්ලියේ දී ඔවුන්ගේ ධනය, බලය, සමාජ වතගොත කවරක් වුවත් ඔවුන් සමානයින් කරන බව විශ්වාස කෙරේ. ඇතැම් මූලධර්මවාදී රටවල් හා සංවිධාන සිකුරාදා සලත් හමුවත් සිය දේශපාලන සංවිධානගත කිරීමට ද යහමින් යොදා ගනිති.

සකාට් යනු අවශ්‍යයෙන් ම කළ යුතු දානයයි. මෙය තමන්ගේ සතියක ආදායමෙන් 1/40 ක් හෙවත් 2.5 % කි. දුප්පතුනට හා අවශ්‍ය අයට දානය කිරීම වහලුන් හා ණය කරුවන් නිදහස් කිරීම ආදිය මෙයට ඇතුළත්ය. සාමාන්‍යයෙන් වන්නේ මෙය උම්මාවට අයත් පල්ලියට ලබා දීම ය. එය උම්මාව විසින් උචිත පරිදි බෙදා දෙනු ඇත.

මෙයට අමතර ව තමන් විසින් යටත් කරගන්නා ප්‍රදේශවලින් ලැබෙන වස්තුවෙන් 1/5 ක් ද උම්මාවට ලබාදිය යුතුයැයි නියෝගයක් ඇත. මෙයට කාන්තාවන් හා දරුවන් ද, වහලුන් ද වෙනත් නිශ්චල හා චංචල දේපොල ද ඇතුළත් ය. මෙය කුම් (Khums) ලෙස හඳුන්වයි.

සවම් යනු උපවාසයයි. ඉස්ලාමීය දින දසුනට අනුව (චන්ද්‍ර මාස) 9 වැනි මස රාමදාන් කාලයයි. එකී කාලයේ දී හිරු උදාවේ සිට බැස යන තෙක් ආහාර පාන ගැනීම හා ලිංගික කටයුතු තහනම් වේ. මෙයින් කෑමට, බීමට, කාමයට ඇති තණ්හාව පාලනය කිරීම හා ආත්ම විනය ඇති කිරීම අදහස් කර ඇත.

හජ් යන්නෙන් අදහස් කරන්නේ වන්දනාවයි. එනම් මක්කමේ අල්කබා දේවස්ථානය කරා වන්දනාවේ යෑම ය. එයට හැකියාව ඇති සියල්ලෝ එයට සහභාගි විය යුතු යැයි නියමයක් ඇත. දු අල් හිජ්රා හෙවත් චන්ද්‍රමාසයෙන් අවසාන මාසය මේ සඳහා යොමු වී ඇත. මක්කමේ කබා පූජ්‍ය ස්ථානය පැදකුණු කරමින් රවුමට ගමන් ඇරඹෙන මේ වන්දනාව එයට සැතපුම් දහයක් එහා තිබෙන මීනා නිදි සතෙකු (එළුවකු) බිලි දීමෙන් අවසන් වේ. මේ පූජාව සඳහා හිස බූ ගෑම හා සුදු පිරුවටයකින් සිවුරක් මෙන් හැඳ ගැනීම චාරිත්‍රයයි.

නාවික වර්ෂ 632 දී මක්කම කළ අවසන් වන්දනාවේදී මහමත්තුමා මෙම නියමය කළේ ය. දැනට මිලියන දෙකක් හෝ තුනක් මේ සඳහා සවුදි අරාබියේ මක්කම පූජ්‍යස්ථානයට වාර්ෂිකව පැමිණෙති.

මේ පංච මූලධර්මවලට අමතර ව තවත් නොයෙක් මූලධර්ම ඇතැයි විවාදයක් ඇත. උදාහරණයක් ලෙස මහමත්තුමා මක්කමෙන් මදීනාවට (හිජ්රා) ගිය ගමන දක්වන ඇතැමුන් මුස්ලිමුන්ගේ වගකීමක් වන්නේ එක තැන නොසිට දෙවියන් නොඅදහන (කපීර්) ප්‍රදේශවලට ව්‍යාප්ත වෙමින් සිය ආගම පැතිරවීමත්, නව ජනපද ඇති කිරීමත් බව කියති. මෙය ඉස්ලාමය බිහි වූ දා සිට ම සිදු වූව කි. පසුගිය දශක දෙක තුළ ලංකාවේ ඉස්ලාමයේ ව්‍යාප්තිය ගැන සලකා බැලීමේ දී එය ඉතා සැලසුම් සහගත ලෙස සිදුකරන බව පෙනේ. ලෝකයේ ද එය එසේ ය. (භාවිත වර්ෂ 1900 දී ලෝක ජනගහනයෙන් 12.5 %ක් පමණක් ඉස්ලාමය ඇදහූ අතර වර්ෂ 2000 දී එය 19.2 %ක් දක්වා ඉහළ ගොස් ඇත.

ප්‍රදේශ වශයෙන් ගත් කළ 1900 දී ලෝකයේ ප්‍රදේශවලින් (භූමිභාගය) 6.8 ක් පාලනය කළ ඉස්ලාමය 2000 දී 22 % ක් පමණ පාලනය කරන බව හෙළි වී ඇත.) මේ අනුව ඉස්ලාම් ව්‍යාප්තවාදය එහි ආගමික නිසඟ ගුණයකි.

තවත් අය පෙන්වා දෙන ඉස්ලාම් මූලධර්මයක් නම් ජිහාද් ය. ඇතැමුන් මෙය ඉස්ලාමයේ අත්‍යවශ්‍ය මූලධර්මයක් බව මහමත්තුමා කළ සටන් ද කුරානය උපුටා දක්වමින් කියති. කුරානය මෙසේ කියයි.

''අල්ලාගේ නාමයෙන් නුඹට එරෙහි ව සිටින්නන්ට එරෙහි ව යුද වදිනු. නමුත් පීඩාකාරී නොවෙනු. අල්ලා පීඩාකාරීන්ට ප්‍රේම නොකරයි.''

''.......ඔවුන් (සතුරන්) දුටු තැන මරා දමනු. ඔබ පළවා හැරි තැන්වලින් ඔබ ද ඔවුන් පලවා හරින්න. පිළිම වන්දනාව සියල්ලට වඩා විනාශකාරී ය. ශුද්ධස්ථානවල දී පහර නොදෙන්න. එතැන දී පවා පහර දුන්නොත් පෙරළා පහර දී යටත් කරන්න. අල්ලාගේ සමාව හා කරුණාව ඔබට ලැබෙයි.....''

''........ පෙති පිළිම වන්දනාව ඔවුන් අතු ගෑවෙන තෙක් සටන්කර විනාශ කරන්න. අල්ලාගේ දහම ශ්‍රේෂ්ඨත්වයට පත් කරන්න.......'' (2-190-193 - ශුද්ධ කුරානය)

මේ අනුව අල්ලා නොහඳුනන, නොඅදහන, පෙති පිළිම වන්දනා කරන්නන්ට එරෙහි ව ක්‍රියා කිරීම කුරානයේ දේව වාක්‍යයකි. මෙය ඇතැම් විට මක්කමේ ඒ යුගයේ තිබූ තත්ත්වය මත ප්‍රකාශ කරන ලද්දක් විය

හැක. නමුත් ඉස්ලාම් ව්‍යාප්තවාදයේ (හිජ්රා) හා ශුද්ධ යුද්ධයේ (ජිහාද්) පදනමක් බවට මූලධර්මවාදීන් මෙයට නව කියවීමක් ලබා දී ඇත.

ජිහාද් යන වදනට කුරානය තුළ විවිධ තේරුම් ඇතැයි විද්වතුන්ගේ මතයයි. (කියවන්න අමීර් අලි - (Jihad Explainedicl.org)

ඒ අනුව එය,

මැවුම්කරුට ස්තූතිය, සැලකීම හා ප්‍රේමට පලකිරීම, සමාජයේ හා දෙමාපිය පීඩනයෙන් ගැලවීම, ආගමික අවශ්‍යතා සඳහා වීර්යයෙන් කටයුතු කිරීම, විවිධ දුෂ්කරතා මත තම අරමුණේ ම හිරව සිටීම, දූෂිත පාලකයින් ඉවත් කිරීම, ඉස්ලාමය පැතිරවීමට ඇති බාධා මැඩලීම, මුලින් පහරදීම මගින් ඇතිවන්නට යන අර්බුද ජය ගැනීම ආදි විවිධ අවස්ථාවල මෙය යෙදී ඇත. ඒ නිසා ජිහාද් යනු විවිධ සංදර්භ යටතේ ඉස්ලාමයේ ආරක්ෂාව හා ව්‍යාප්තිය සඳහා ඕනෑ ම ආකාරයකින් (යුද්ධයෙන් ද) ක්‍රියා කිරීම බව පැහැදිලිය.

ජිහාද් සඳහා රීති කිහිපයක් ද ඇත.

1. එය කරන්නේ අල්ලා වෙනුවෙනි. බලය, ධනය, කීර්තිය උදෙසා නොවේ.
2. එය අධ්‍යාත්මික නායකත්වයට කීකරු ව සිදු කළ යුතු ය.
3. යටත් කරගත් දෙය ඉස්ලාමීය නීතියට පිටතින් සොරා නොගත යුතු ය.
4. ආරක්ෂාව පිළිබඳ වූ පොරොන්දු ඇත්නම් ඒවා ගරු කළ යුතුය.
5. ප්‍රහාරයක් මැද අත් නොහැර ක්‍රියා කළ යුතු ය.
6. දූෂණයෙන් වැළකිය යුතු ය.

ජිහාදයට සමාන අදහසක් කිතුනු සම්ප්‍රදායක් ද ඇත. එනම් සාධාරණය යුද්ධයයි. (Just war) මෙය මුලින් ඇක්වයිනාස් තුමා ද පසුව පාප්තුමා ද අනුමත කරන ලද්දකි.

මෙය ඉස්ලාමය දහමක් හා රාජ්‍ය පාලනයක් ලෙස ස්ථාපිත කිරීමට මහමත්තුමා සමත් විය. භාවිත වර්ෂ 632 දි හජ් වන්දනාවෙන් පසු මහමත්තුමා සිරියාවට පහරදීමට සේනා සංවිධානය කරන්නට විය. ඒ අතර යළිත් බරපතළ ලෙස රෝගාතුර වී වර්ෂ ජුනි 08 දා මිය ගිය බව විශ්වාස කෙරේ. ඔහුට බිරියන් සිව් දෙනෙකු සිටිය ද එකදු පිරිමි දරුවෙකු හෝ

නොසිටියේ ය. මේ නිසා ඉස්ලාමය රාජ්‍යයේ අනුප්‍රාප්තිකයා පිළිබඳ ගැටළුවක් ඇතිවිය.

අරාබියේ එවකට පැවති ගෝත්‍රික චාරිත්‍ර අනුව ගෝත්‍ර නායකයා මිය ගිය විට අනුප්‍රාප්තිකයා වන්නේ පවුලේ හෝ ගෝත්‍රයේ එයට සුදුසු පුද්ගලයා ය. මේ සඳහා ගෝත්‍රයේ වැඩිහිටියන් රැස් වී (වරිග සභාව) ඒ පිළිබඳ ව තීන්දුවක් ගැනිණි.

වාර්තා අනුව මහමත්තුමා රෝගාතුර වීමත් සමඟ ඊළඟ නායකත්වය සඳහා තරඟයක් ඇතිවිය. ඒ සඳහා තරඟ කෙරුණේ ඔහුගේ පවුලේ ම අය ය.

එක් අයෙක් වූයේ අබු බකර් ය. (580-634) ඔහු මහමත්තුමාට වඩා දස වසකින් බාල මුත් ඔහුගේ කිට්ටුවන්ත ම මිතුරා විය. කදීජා හා පවුලේ අය හැරුණු විට මහමත්ගේ ඉස්ලාමය වැළඳගත් පළමු පිටස්තරයා විය. මදීනා බලා ගිය ගමනේ දි අන්තිමට ම මක්කම හැර ගියේ මහමත්තුමා සමඟ අබු බකර් ය. ඔහු දිගට ම මහමත් සමඟ සටනේ දී, විපතේ දී හා ජයග්‍රහණයේ දි සිටියේ ය. එය කොතරම් දුර දිග ගියේ ද යත් අබු බකර්ගේ දියණිය 'අයිෂා' මහමත්තුමාගේ ලාබාලතම බිරිඳ විය. සිය දිවියේ අවසන් කාලයේ දි ඔහු ඇයට බෙහෙවින් ලැදි වූ බව ද කියනු ලැබේ. මහමත්තුමා රෝගාතුර වූ අවස්ථාවේ පොදු යාඥාවන් (හජ්) මෙහෙ වූයේ ද අබු බකර් ය.

අනෙක් තැනැත්තා වූයේ අලි ඉබන් අබු තාලිබ් (600-661) ය. ඔහු මහමත්තුමාගේ ඥාති සොහොයුරෙකි. එමෙන්ම මුලින් ම ඉස්ලාමය වැළඳගත් අයෙකි. මහමත්තුමාගේ දියණියක වූ පාතිමා විවාහ කරගෙන සිටියේ ද අලී ය. මහමත්තුමාගේ සිරුර නැහැවීම පවා සිදු කළේ අලී ය. මහමත්තුමාගේ මරණයෙන් ඔහු බෙහෙවින් ශෝකයට පත් වී වැලපෙන්නට විය.

ඒ අතර මදීනාවේ රැස් වූ අන්සර් (උදව්කරුවෝ) නම් කණ්ඩායමක් සකිෆාහි රැස් වී මීළඟ නායකයා ගැන සාකච්ඡා කරන්නට වූහ. මෙයට මහමත්තුමාගේ බිරිඳක් වූ හෆ්සාගේ පියා වූ උමර් ඉබන් ක්වාටබ් හා අයිෂාගේ පියා වූ අබු බකර් ද සහභාගි විය. මෙහිදී මහමත්තුමාගේ ගෝත්‍රය වූ ක්වරයිෂ් දුන් මදීනාවේ අන්සාර්වරයෙකු නායකයා වෙත් ද යන්න ගැන විවාද ඇති විය. අන්තිමේදී අබු බකර් නායකයා ලෙස තෝරා පත්කර ගන්නා ලදී.

ඔහුට කාලිෆ් පදවිය ලැබිණි. පළමු කාලිෆාවරයා අබූ බකර් ය. කලිෆාත් වී දෙවසරක් ඇතුළත අබූ බකර් මිය ගියේ ය. මිය යාමට ප්‍රථම ඔහු මුහම්මද්තුමාගේ බිරිඳක වූ හෆ්සා ගේ පියා වූ උමර් ඉබ්න් කත්තාබ් මීළඟ කාලිෆාත් ලෙස නම් කළේ ය.

මෙමගින් ෆාතිමාගේ ස්වාමියා වූ අලිගේ බලාපොරොත්තු කඩ විය. ඔහු ප්‍රසිද්ධ ජීවිතයෙන් ඉවත් වී ආගමික නැඹුරුව තවත් වැඩි කර ගත්තේ ය.

නියම ලෙසට ඉස්ලාමීය ව්‍යාප්ත කිරීම ආරම්භයේ උමර් ය. ඔහු යුද ශිල්පයේ දක්ෂයෙක් විය. උතුරු අප්‍රිකාව අල්ලා ගැනීම සඳහා ඔහු "ජිහාද්" දියත් කළේ ය.

වර්ෂ 636 දී උමර් සිරියාව අල්ලා ගත්තේ ය. ඊළඟ වර්ෂයේ ඔහු පර්සියාව අල්ලා ගත්තේ සසානිද්වරු (වර්ෂ 226-637) පරාජය කරමිනි. ඉන්පසු උමර් ඊජිප්තුව ද (වර්ෂ 641) අල්ලා ගත්තේ ය.

ප්‍රදේශ යටත් කළ පසු ඒ ප්‍රදේශවල සම්පත් බෙදා ගැනීම, අයබදු අය කිරීම, නිතර සමුදායට සෙබළුන්ට වැනි මුදලින් වැටුප් ගෙවීම, විජය අරාබ ජාතික සමුදායක් ඉස්ලාමීය මතයට අනුව ගැනීම ආදිය කළේ උමර් ය.

උමර් ප්‍රධාන විනිසුරු ද වූයෙන් ඉරාන වහලෙකු වූ ෆිරුස් ඔහු දුන් තීන්දුවකින් කෝපයට පත් වී උමර් කාලිෆ්වරයා ඝාතනය කළේ ය. (වර්ෂ 644 නොවැ.)

උමර් මරණ මංචකයේ දී මීළඟ කාලිෆ් පදවිය සඳහා හයදෙනෙකු නම් කළේ ය. ඒ අතර අලි ද මුහම්මද්තුමාගේ ලොකු දියණිවරුන් වූ රුකයියා හා කුල්තුම් විවාහ කරගෙන සිටි උත්මාන් ද විය.

1. කුරානයට හා මුහම්මද් ක්‍රියා කළ ආකාරයට - සුන්නාවට අනුව ක්‍රියා කිරීම. (මෙය සම්ප්‍රදායික සුන්නි නිකායේ විශ්වාසයයි)

2. කලින් සිටි කාලිෆ්වරුන්ගේ ක්‍රියා විවේචනය නොකිරීම.

අලි දෙවන කොන්දේසිය ප්‍රතික්ෂේප කළේ ය. මන්ද ඔහු උමර් විවේචනය කර සිටි නිසා ය. ඔහුට කාලිෆ් පදවිය නොලැබුණි.

මීළඟ කාලිප් පදවිය උත්මන්ට පිරිනැමීහි. උමාර් කාලිප් විසින් තමන් හමුදා බලයෙන් යටත් කර ගත් ප්‍රදේශවල අරාබීන්ට ජනපද පිහිටුවීම තහනම් කර තිබුණි. උත්මාන් එකී තහනම ඉවත් කළේ ය. මෙය කොල්ලයක් බවට පත්විය. උත්මාන් අයත් වුණේ සිරියාවේ උමායාද් නම් ගෝත්‍රයට ය. ඔවුන් ඔහුගේ කාලිප් පදවිය යොදා ගනිමින් නව නිලධාරී බලයක් බවට පත්විය.

මේ නිසා හමුදාවන් අතර අසහනය වැඩිණි. වැසියන් අතර ද එය පැතිර ගියේ ය. ඊජිප්තුවේ කැරැල්ලක් ඇතිවිය. අන්තිමේ දී මෙය උත්මන් කාලිප් ඝාතනය දක්වා දුර දිග ගියේ ය. (වර්ෂ 656) ඉන්පසු ජනතාවම එක් වී සිය නායකයා ලෙස අධ්‍යාත්මික ජීවිතයක් ගෙවූ අලී පත්කර ගත් හ. මේ තුළින් දහම ගැන උගත් ජන කණ්ඩායමක් - උලේමා - විසින් නායකයින් පත් කිරීම හා නීතිය විවරණය කිරීම ගැන නව සම්ප්‍රදායක් ඇතිවිය.

එහෙත් මහමත් තුමාගේ බිරිඳක් වූ අයිෂා හා උමායද් නායකයෙකු හා මහමත්තුමාගේ මස්සිනා වූ සිරියාවේ ඉබන් සුපියන්, අලීගේ නායකත්වය පිළි නොගත්හ. උත්මන් කාලිප් ගේ ඝාතකයින්ට දඬුවම් දෙන ලෙස ඔවුන් කැරලිකාර ලෙස ඉල්ලා සිටින ලදී. උත්මාන්ගේ ඝාතකයින් කියා සිටියේ උත්මාන් ඉස්ලාමීය නීති කඩ කර ඇති හෙයින් ඔහු ඝාතනය කිරීම හා බලයෙන් ඉවත් කිරීම ජිහාදයට එකඟ බව ය. මෙතැනින් ජිහාදයට නව අරුතක් ලැබිණි. එනම් ඉස්ලාමයට පිටින් යන නායකයින් තුරන් කිරීම ආගමට එකඟ කිරීම ය. (මේ තර්කය ඊජිප්තු ජනාධිපති අන්වර් සදාත් ඝාතනයේ දී ද මූලධර්මවාදීන් යොදා ගත්හ.)

අලී සටනින් අයිෂාව පරාජය කළේ ය. එහෙත් උමයාද් නායක මුවයියා දිගට ම අලීගේ පදවිය පිළිනොගත්තේ ය. සිපිහිහි දී ඇති වූ සටනින් අලී ජයගත්ත ද මුවයියාගේ මතය වෙනස් නොවිය.

මෙතැනදී ඉස්ලාමයේ මූලික බෙදීම ඇතිවේ. අලීගේ හමුදා වෙතින් ඉවත්ව ගිය කහරජීස්වරුන් කීවේ ඕනෑ ම ප්‍රතිපත්ති ගරුක මුස්ලිම්වරයෙකු කාලිප් පදවිය සඳහා සුදුසු බව ය. ෂියාත් අලී හෙවත් අලීගේ අනුගාමිකයන් කීවේ මහමත්තුමාගේ දියණිය විවාහ කරගෙන ඔහුගේ ඥාති පුත්‍රයා ලෙස සිටි අලීට කාලිප් පදවිය සුදුසු බව යි. මේ සඳහා සභාවක් කැඳවිණි. එහිදී මුවයියා කාලිප් පදවිය සඳහා යෝජනා විය. මෙයට ෂියාත් අලී කණ්ඩායම එරෙහි විය. මෙයින් ෂියා හ සුන්නි නිකාය භේදය ඇරඹිණි. කහරජීස්

කණ්ඩායමට අයත් ඉබන් මුජලාම් විසින් අලි ඝාතනය කිරීමත් සමඟ (661 මාර්තු) ගැටුම තාවකාලිකව සමනය විය. ඒ මුවයියා කාලිප් වීමෙනි. ඉන්පසු උමායාද් කලිපාතය වර්ෂ 750 දක්වා ඉස්ලාම් ලෝකය පාලනය කළේ ය.

කෙසේ වෙතත් ෂියාවරු අලිගේ පුත් සහන් කාලිප් කළහ. නමුත් වැඩි බලය තිබුණේ උමායද් මුවයියාට ය. මුවයියා සිය පුත් යාසිද් ඊළඟ කාලිප් ලෙස නම් කිරීමෙන් රාජ පරම්පරා වාදයක් ආවේ ය. හසන් වස ශරීර ගත වීමෙන් මිය ගියේ ය. මුවයියාගේ පසු යාසිද් කාලිප් වූ අතර රාජවංශයට විරෙහි ව මහමත්ගේ පරපුරෙන් එන හුසේන් නැගී සිටියේ ය. යාසිද්ගේ වංචාවනට හසු වී කොටු වී සිටියදී පවා හුසේන් ප්‍රතිපත්ති අත්නොහැර සටන්කර මිය ගියේ ය. එමගින් එමගින් ඔහු ෂියාවරුන්ගේ වීරයෙකු විය. එතැනින් ඉමාම් (මහමත්ගෙන් පැවත එන) සංකල්පය ෂියාවරුන්ට ඇති විය.

සුන්නිහු මූලික සංකල්ප තුනක් ගරු කරති.

1. ඒක දේවත්වය - එකම සර්වබලධාරි දෙවියෙකු පිළිබඳ විශ්වාසයයි.
2. දිවැසිවරයා - දෙවියන් හා මිනිසුන් අතර සම්බන්ධය ඇති කරගන්නා. මෙහිදී ඔවුන් කිතුනුවන්ගේ වෙන් වෙති. එනම් දිවැසිවරයා සර්ව බලධාරි දෙවියන්ගේ හුදු දූතයා පමණක් බව ය. කිතුනුවෝ ජේසුතුමා පීතෘ දෙවියන්ගේ පුත්‍රයා ලෙස දේවත්වයක් ලබාදී ඇත. එවැනි තත්ත්වයක් මුස්ලිම්වරු පිළි නොගනිති.
3. මළවුන්ගේ නැගිටීම - අවසාන විනිශ්චය දෙන දින ජීවත් ව සිටි කාලයේදී තමන් කළ කී ක්‍රියාවන් පිළිබඳව දේව විනිශ්චයක් ලැබෙන බව. මෙය වඩා දුර්වල අයුරකින් කිතුනුවන්ගේ ද පවතී. එය හින්දු හෝ බෞද්ධ කර්මවාදයටඳ වඩා වෙනස්ය.

සුන්නින් මහම්මත් හා මුල් කාලිප්වරු සතර දෙනා ගෞරවයෙන් සලකන අතර, ෂියාවරු ඉහත ප්‍රතිපත්ති සමඟ ද සිටිති. ඔවුන් පිළිගන්නේ මහමත්තුමා හා අලි පමණක් නිවැරදි ඉස්ලාමීය ප්‍රතිපත්ති රැකි බවයි. දොළොස් ෂියාවරු එකළොස්වැනි ඉමාම්ගේ පුතුනුවන් ලෙස ඊළඟ

දිවැසිවරයා උපත ලබන බව ද විශ්වාස කරති.

සුන්නි සම්ප්‍රදාය ආරම්භයේදී පෙනී සිටියේ දී පෙනී ගියේ ඔවුන් පවුල හා ලේ නෑකම නොව ප්‍රතිපත්ති හා සම්ප්‍රදාය (සුන්න) රකින බව ය. නමුත් උමායාද්වරුන් සමඟ එය රාජවංශයක් දක්වා දියුණු වී ගියේ ය. කෙසේ වෙතත් බලය විසින් එය ප්‍රධාන ඉස්ලාමීය දහරාව කරනු ලැබී ය. සවුදි අරාබිය පදනම් කරගෙන සුන්නිවරු පවතිති.

ෂියාවරු මුල දී අලිගේ ලේ නෑකම ගැන හා ඉමාම් පදවිය පිළිබඳ ව අවධාරණය කළත් පසු ව අලි, හුසේන් වැන්නවුන්ගේ චරිත පෙන්වා දුන්නේ ඔවුන්ගේ ධර්මයට හා එහි සුත්‍රපාඨ ආදියට ඇති මහත් බැඳීම ය. බලයට වඩා ප්‍රතිපත්තියට ඇති කැපවීම ය. දැඩි මූලධර්මවාදීන් බොහොමයක් ෂියා නිකායට සම්බන්ධ වූවෝ වෙති. ඉරානය මෙහි පදනම් රාජ්‍යය වෙති. ඉරාකය, පාකිස්ථානය වැනි රටවල් පුරා ෂියා, සුන්නි ගැටුම විසිරී ඇත. මුස්ලිම්වරු අතර ෂියාවරු12% -15% ක් පමණ වෙතැයි විශ්වාස කෙරේ.

සුන්නි ෂියා ගැටුම එතැනින් නතර වූයේ නැත. උමායද් යටතේ එක ම ඉස්ලාමීය ජනයා රජවරුන් - ප්‍රභූවරුන් - දුගියන් ලෙස බෙදීමත් හමුදා පීඩනයක් දැනෙන්නට විය. විශේෂයෙන්ම අති ලෞකික ජීවිත ගත කිරීමට ප්‍රභූවරු යොමු වූහ. මෙවර කැරැල්ල ගැසුවේ අබු ඊබ්‍රාහිම් නම් හිටපු වහලෙකි. ඔහු මහමත්තුමාගේ මාමා වූ අබ්බාස් ගෙන් පැවත එන්නෙකි. ඔහු ෂියාවරු ඇතුළු උමායද් කලිපාතය ගැන කලකිරුණු සියළු දෙනා එක්කර කැරැල්ලක් ගැසුවේ ය. මෙය ජය ගැණිනි. එය එක්තරා ආකාරයකට ෂියාවරුන්ගේ නැවත ජයග්‍රහණයක් ලෙස ඇතැමුන් සලකන අතර බොහෝ දෙනා සලකන්නේ එය මූලධර්මවාදයේ පළමු ජය බව ය. අබ්බාසිද් කලිපාතය (750-1250) වසර පන්සියයක් සිය පාලනය ගෙන ගියේ ය. එයට පසු ව ෂියාවාදි ජපාර් සාදික් අභියෝග කලේ ය. එය සාර්ථක නොවුණ ද ෂියාවරුන් ද විවිධ පුද්ගල විශ්වාසයන් මත සයිදිස් (පංචම), ඉස්මයිලිස් (සත්), ඉමාමිස් (දොළොස්) ලෙස බෙදී ගියහ.

ප්‍රථම වරට අබ්බාසිද් බලය බිඳුණේ ටියුනිසියාවේදී ය. බාර්බර්වරු හා ඉස්මයිලිවරු එයට මුල් වූහ. ඔවුන් මහමත්ගේ දියණිය අනුව යමින් පාතිමාද් කලිපාතය වර්ෂ 969 දි පිහිටු වූහ. ඊජිප්තුව ඔවුන් අතට පත් වී අල් ක්වයිරා (කයිරෝ) අග නගරය පදනම් දේවාධාර්මික ක්‍රියාවලියක් මුදා හළහ. එනමුත් අබ්බාසිද්වරු සහමුලින් පරාජය වූයේ නැත.

මේ අතර ඉස්ලාමයේ ව්‍යාප්තිය ප්‍රදේශ දෙකක සිදුවිය. එකක් නම් යුරෝපයයි. ඉස්ලාමයට හරවනු ලැබූ බාර්බර් වහලෙකු වූ ටාරික් මොරොක්කෝවට උඩින් ඇති ජෙබල් අල් ටාරික් හෙවත් ජිබ්‍රෝල්ටාව හරහා වර්ෂ 711 දී ස්පාඤ්ඤයට කඩා වැදුණේ ය. ස්පාඤ්ඤයේ පාලනය ගෙන ගිය විසිගොතික් රජු වූ රොඩ්රික් පැරදවීමට ටාරික් සමත්විය. වර්ෂ 714 වනවිට වත්මන් මුළු ස්පාඤ්ඤයම හා පෘතුගාලය ම අයත් ප්‍රදේශය තිබුණේ ටාරික්ගේ ඉස්ලාම් හමුදා යටතේ ය. මෙය ඉතා වැදගත් වන්නේ වර්ෂ 676 දී උමායාද් කාලිපාතය යුරෝපීය කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම සඳහා කළ දැවැන්ත සටන කිතුනුවන් ආපසු හැර වූ නිසා ය. උපක්‍රමික ලෙස කොන්ස්තන්තිනෝපලය ඉතා වැදගත් වන්නේ යුරෝපයේ සිට පෙරදිගට ඇති එක ම ගොඩබිම් මාර්ගය මධ්‍යධරණී මුහුද හරහා ඒ නගරය ඔස්සේ වැටී ඇති හෙයිනි. එය නිසැකව ම යුරෝපයේ දොරටුව විය. එය විවෘත කර ගැනීමට නොහැකි වූ විට ටාරික් ජිබ්‍රෝල්ටා දොරටුව විවෘත කර ගත්තේ ය.

ඊළඟට ටාරික් ප්‍රමුඛ ඉස්ලාමීය හමුදා ඉතාලියටත් පීරනීස් කඳුවැටිය හරහා ගොස් දකුණු ප්‍රංශයටත් ඇතුළු වූහ. දරුණු සටන්වලින් පසු චාල්ස් මාර්ටෙල්ගේ කතෝලික හමුදා පොයිටියර්ස්හිදී මුස්ලිම්වරුන් පරාජය (වර්ෂ 732) නොකළා නම් නිසැකවම යුරෝපය ඉස්ලාම් ව්‍යාප්තවාදයට හසු වනු ඇත.

කෙසේ වෙතත් ස්පාඤ්ඤයේ ඉස්ලාමය පතුරුවනු ලැබී ය. ඉස්ලාමයට යෑම ප්‍රතික්ෂේප කළ කිතුනුවන් 'මොසරුබස්' වරුන් ලෙස හැඳින්විණි. ඔවුන් හා යුදෙව්වන් හිරිහැරයකින් තොර ව ජීවත් වූහ. එකල ස්පාඤ්ඤයේ අගනගරය වූ ඉස්ලාම් කෝර්ඩොබා නගරය යුරෝපයේ තිබූ නවීනතම නගරය විය.

ඊළඟ ඉස්ලාමීය පෙරමුණු ඇති ඉන්දියාවේ ය. බින් කාසිම් මොහොමද් වර්ෂ 711 දී මුහුදින් විත් සින්ද් පෙදෙසට ගොඩ බසියි. එහිදී ඔහුට හමු වන්නේ කණිෂ්ක රජු විසින් වත්මන් කාශ්මීරය පදනම් කරගෙන ව්‍යාප්ත කළ බෞද්ධ රාජ්‍යය ය. බින් කාසිම් ඉත්මන් ඉරානය දක්වා ව්‍යාප්ත කළ බෞද්ධ රාජ්‍යය ය. බින් කාසිම් මොහොමඩ් කාශ්මීර බෞද්ධ රාජ්‍යයට පහර දෙයි. ලොව විශාලතම විශ්ව විද්‍යාලය වූ නාලන්දාව ගිනි තබා භික්ෂූන් වහන්සේ පහන්දහසක් ඝාතනය කරයි. වාර්තාවන අන්දමට බින් කාසිම් මොහොමඩ් අවි දරා නාලන්දාවට ඇතුළු වන්නේ භික්ෂූන් දන් වළඳන විට ය. කිසිදු ප්‍රතික්‍රියාවකින් තොර ව ඔවුන් ඝාතනයට කොට නාලන්දාව ගිනි තැබීමට ඔහුට හැකිවිය. පිළිම

වන්දනාව විනාශ කිරීම මහමත්තුමාගේ මූලික ජිහාද් ප්‍රතිපත්තිය විය. දෙවියන් පිළිගන්නා කිතුනු හා යුදෙව් සමාජවලට කුරානයේ යම් සහන දී තිබුණ ද (උදාහරණයක් ලෙස ඉස්ලාමීන්ට ඔවුන් හා විවාහ විය හැක) දෙවියන් හෝ ආත්ම සාරයක් විනාශ නොකළ බොදුනුවන් සහමුලින් ම පෙනුණේ යක්ෂයින් ලෙස ය. බෞද්ධයින් ද සිය රාජ්‍යය අවි බලය මත සංවිධානය කර නොතිබිණි. මේ නිසා ඉතා පහසුවෙන් වයඹ දිග බෞද්ධ රාජ්‍යය බිඳ වැටිණි. බෞද්ධ රාජ්‍යයේ නටඹුන් මත ගොඩනැගුණු ඉස්ලාම් රාජ්‍යය වර්ෂ 828 දක්වා සින්ද් ප්‍රදේශයේ පැවතිණි.

මේ අතර ෂරියාත් නීති පද්ධතිය ගැන ද යමක් කිව යුතු ය. විවිධ පුද්ගලයන් විවිධ අවස්ථාවල දී මහමත්තුමාගේ ප්‍රකාශ (හාදිත්) හා ක්‍රියා සඳහා විවිධ අර්ථ කථන දුන්හ. විශේෂයෙන් ඉස්ලාමීය නීතිය වූ ෂරිහාත් සඳහා මේ වෙනස් කියවීම ඇතිවිය. මූලික වශයෙන් කියවීම් හතරක් හා ඒ බැඳුණු නීති පද්ධති හතරක් සුන්නි නිකාය තුළ ඇත.

1. හනාෆි - අබු හනීපා අල් නුමාන් (699-767) නම් ඉරාන වෙළෙන්දා නිසා හානිෆි නීති කියවීම ඇතිවිය. නාගරික වෙළෙඳාම අවශ්‍ය ආකාරයට ඉස්ලාමීය නීතිය නවීකරණය හා කියවීම ඔහු කළේ ය.

2. මලිකි - මලික් අබන් අනාස් (714-796) නම් නීති වේදියා නිසා ඇති විය. ඔහු ග්‍රාමීය ජනතාවට උචිත ලෙස ඉස්ලාමීය නීතිය කියවූයේ ය. සකස් කළේ ය.

3. ශාෂි - ඉබන් අද්රිස් අල් ශාෆි (820) නිසා ඇති විය. අනාගතයට අවශ්‍ය ලෙස ඉස්ලාමීය නීතිය යම් විධි ක්‍රමයකට යටත් කර ඒ අනුව ප්‍රශ්න විසඳීමට උත්සාහ කළේ ය. ඊජිප්තුවේ ද මලයාවේ ද ජනප්‍රිය විය.

4. හනිබාලි - අහමද් ඉබන් හන්බාලි (780-855) නිසා හනිබාලි කියවීම ඇතිවේ. බයිද් රාජ්‍ය කාලය තුළ මියාවරු මේ හතර ම එක් කර තනි නීතියක් පැනවීමට කටයුතු කළේ ය.

ඉස්ලාමයේ ව්‍යාප්තියට තීරක ප්‍රහාරට එල්ල වූයේ කිතුනුවන්ගෙනි. පළමුවැනි සහස්‍රය එළඹෙත් ම ජේසුස් උපත ලැබූ ශුද්ධ නගරය වූ

ජෙරුසෙලම නැවත අත්පත් කර ගැනීමට බෙදී තිබූ කිතුනුවන් එක්කර ගැනීමට පාප්තුමා උත්සාහ කළේ ය. ඔහුගේ ඇත්ත ඉලක්කය වූයේ විශේෂයෙන් ස්පාඤ්ඤයේ හා පොදුවේ යුරෝපයෙන් ඉස්ලාමය අතුගා දැමීම ය. මක්කම හා මදීන නගරවලට දෙවැනි කොට ඉස්ලාම්වරුන් ද ජෙරුසෙලම සිය තුන්වැනි ශුද්ධ නගරය ලෙස සැලකුවෝ ය. පළමු කුරුස යුද්ධය අවසන් වූයේ වර්ෂ 1099 දී ජෙරුසෙලම ක්‍රිස්තියානි හමුදා අතට පත්වීමෙනි. මෙයින් සසලවන මුස්ලිම් ලෝකය වඩා වඩා පාතිමාද්වරුන් යටතේ රණකාමී වෙමින් මූලධර්මවාදයට යති. අවසානයේ දී යුද්ධයේ ජයග්‍රහණය මත වඩා ශ්‍රේෂ්ඨ කුමන ආගමදැ යි තීරණය වීමට නියමිත වූ නිසා මෙය වඩාත් තීව්‍ර විය. මෙලෙස වසර සියයක් පමණ දිගට ඇදී ගිය කුරුස යුද්ධය සන්දිස්ථානයකට එන්නේ සල්ලා අල් දින් ආවුබ් හෙවත් සලාදින් නිසා ය.

මුළු ඉස්ලාම් රණකාමයේ ම වැදගත් ම පුද්ගලයා සලාදින් ය. ඔහු මූලික අධිපති ඉස්ලාම් සමාජයකට අයත් අයෙක් නොවී ය. කුර්දි ජාතිකයෙක් විය. (ප්‍රංශ ඉතිහාසය වෙනස් කළ ඇලෙක්සැන්ඩර් ක්‍රීට ජාතිකයකු වීම ද, ජර්මන් ඉතිහාසය වෙනස් කළ හිට්ලර් බැවේරියානුවෙකු වීම ද, රුසියානු ඉතිහාසය වෙනස් කළ ස්ටාලින් ඉස්ලාමීය මහා සංස්කෘතියට පිටතින් ආ අයෙක් විය. මේ නිසා ඔහු විප්ලවකාරී ලෙස වෙනස් කළේ ය.) වර්ෂ 1171 දී ඔහු සෙල්ජුක් හමුදාවේ නිලධාරියෙකු ලෙස ෂියා පාතිමාද්වරුන්ට එරෙහිව සටන් කළේ ය. ඉන්පසු ඔහු වර්ෂ 1187 දී ජෙරුසෙලම යුරෝපීය ආක්‍රමණයෙන් මුදා ගත්තේ ය.. යුරෝපයේ මේ පරාජය ඓතිහාසික විය. මෙයින් සුන්නිවාදය තව දුරටත් ස්ථාවර විය.

ඉස්ලාමය ක්‍රිස්තියානිය අතර ගැටුම් පසුගිය සහස්‍රය පුරාම විටින් විට පැණ නැගිණි. කාල්මාක්ස් සිය කොමියුනිස්ට් ප්‍රකාශනයේ වරක් ලීවේ ලිඛිත ඉතිහාසය වනාහි පන්ති සටන්වල, ඉතිහාසයයි කියා ය. එහෙත් ඉතාම රළු ලෙස කියන්නේ නම් පසුගිය සහස්‍රයේ ලෝක දේශපාලනයේ මූලික ගැටුම් ඉස්ලාමය හා ක්‍රිස්තියානිය අතර සටන ය. ඒ අතර ඒ දෙකේම විවිධ නිකායන් අතර තිබූ පරසතුරු සටන් ය. කුරුස යුද්ධය තාවකාලිකව නතර වන්නේ මොංගෝලියානු ආක්‍රමණ නිසා ය. වර්ෂ 1270 වන විට කෙසේ වෙතත් කුරුස යුද්ධ යුරෝපයට මෙන් ම මැද පෙරදිගට ද බල පෑවේ ය.

මෙහි බලපෑම සිදුවන්නේ ඉන්දියාව හා චීනය නිසා ය. සිය රෝම ඉලක්කම්වලින් යුරෝපයට ගණිත මිණිත ක්‍රියා කළ හැකි වූයේ දසදහස

දක්වා පමණි. ශුන්‍යය හෝ ඍණ සංඛ්‍යා ඔවුහු නොදැන සිටියහ. එහෙත් ඉන්දියාව තුළ සංඛ්‍යා විද්‍යාව අංක ගණිතයෙන් නොනැවතී වීජ ගණිතය දක්වා වර්ධනය වී තිබිණි. අරාබි වෙළෙන්දන් ඉන්දීය ඉලක්කම් යොදා ගෙන ඉන්දු - අරාබි ඉලක්කම් ක්‍රමය ගොඩනැගීම ගණිතයේ (යුරෝපීය) විප්ලවයක් විය. එමෙන්ම සංඛ්‍යා එකතුව, අඩු කිරීම, ගුණනය හා බෙදීම නව ක්‍රම ඇති වීම ද එයට පාදක විය. මෙයට අමතර ව මූලික භෞතික සංකල්ප ගැන අවබෝධයක් ද අරාබීහු ඉන්දීය සංකල්පවලින් ලබාගත්හ. දැනුම පිළිබඳ කුරාණය කියවීමක් ලැබිණි. ඒ අනුව,

පළමුව ආගමික මෙන්ම භෞතික දැනුම දෙවියන් හා ඔහුගේ දේව සැලැස්ම දැන ගැනීමකි. (ලොවේ සියළු දේ සිදුවන නිශ්චිත සැලැස්මක් සැඟවී ඇත.) දෙවනුව දැනුම ඉස්ලාමීය උම්මාවේ ස්ථාවරත්වය හා ශ්‍රේෂ්ඨත්වයට හේතු වේ. (එනම් දැනුම් බලයක් විය යුතුය).

ඉල්ම් (IIM) දැනුම පිළිබඳ ව කුරානය ද මහමත්තුමාගේ හාදිත් ද ඉන්පසු බිහි වූ ඉස්ලාමීය බුද්ධිමතුන් ද විවිධ විවරණ ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් වර්ෂ 750-1350 අතර කාලයේ නූතන බටහිර විද්‍යාවේ තාක්ෂණය පමණක් නොව වෙළෙඳ ධනවාදයේ ද, වෙළෙඳ සංස්කෘතියේ ද පදනම මැද පෙරදිග ඉස්ලාමීය ශිෂ්ටාචාරයෙන් ලැබිණි. එය ඔවුන්ට ඉන්දියාවෙන් හා චීනයෙන් ගලා ආවේ ය. මහමත්තුමා මෙසේ කියා ඇත.

''දැනුම ලබා ගැනීම සෑම මුස්ලිම්වරයෙකුගේ ම වගකීමකි. චීනයට ගොස් හෝ දැනුම සොයා ගන්න.....''

''වඩාත් ම වටිනා මිනිස්සු වන්නේ වඩාත් ම දැනුම ඇත්තවුන් ය.....''

''විශ්ව දැනුම විශ්වාසවන්තයින්ට අහිමි වූ දේපොළකි. එය දෙවියන් නොඅදහන හෝ බහු දේවවාදීන් (කාෆිර්වරු) හෝ ළඟට ගොස් ලබාගත යුතු ය. මන්ද එය ඔවුන්ට වඩා ඔබට ලැබිය යුත්තක් වන නිසා ය.''

''ඕනෑ කෙනෙකුගෙන් දැනුම ගන්න. කවුරුන් කියනවාද යන්නට වඩා කුමක් කියනවාද යන්න වැදගත් ය.''

''වැදගත් ම දැනුම වනාහි අවශ්‍යතාවයන් (Benefit) ලබා දෙන දෙන දැනුම ය.''

මෙය මලයාවේ හා ඉන්දුනීසියාවේ ද තොරණි. 13 වන සියවසේ සිට මලක්කාවේ හා ජාවා දූපත්වලට අරාබි වෙළෙඳුන් පැමිණියහ. ඒ වනවිට හොඳ ම නාවික බලය තිබුණේ ඔවුන් සතුව ය. ලංකාවේ වෙළෙඳාම ප්‍රවර්ධනය කළ මහා පරාක්‍රමබාහු රජතුමා සමග ජාවා ඔවුන් ගනුදෙනු කළ බව කියැවේ. මේ වනවිට මලයාව, සුමාත්‍රා හා ජාවා යන සියළු දිවයින් හා ප්‍රදේශ බෞද්ධ රාජධානි ලෙස පැවතිණි. ඉන්දුනීසියාවේ බොරෝ බුදූර් බෞද්ධ මධ්‍යස්ථානය නිර්මාණය කරන්නට ගියේ ලංකාවේ එකී කුඩා ප්‍රමාණයේ නිර්මාණයක් (යාපහුවේ කඳුරුගොඩ) කළ ශිල්පියාමයයි විශ්වාස කෙරේ. ජාවකයින් කිහිප විටක් ලංකාවට ද කඩා පැන්න. කෙසේ වෙතත් අරාබි වෙළෙන්දෝ ගෝත්‍රික නායකයින්, ප්‍රාන්ත පාලකයින් හා රජවරුන් ද, කුමාරවරුන් ද සමග වෙළෙඳ සබඳතා පවත්වමින් ඔවුන් බඳු භාර්යාවලින් වශී කළහ. ඇතැමුන්ට මේ නව වෙළෙඳ-කාම සංස්කෘතියට එක්වීමට ඔවුන්ගේ සාම්ප්‍රදායික ආගම (බුද්ධාගම) බාධාවක් විය. උදාහරණයක් ලෙස මලයාවේ රජුට (වර්ෂ 1400) බිරියන් කිහිප දෙනෙකු පාවාගෙන සම්භෝග විඳීමට බුද්ධාගම බාධාවක් ලෙස පෙනී ගියෙන් ඔහු ඉස්ලාමයට ගියේ ය. අරාබි වෙළෙන්දෝ රාජත්වය යොදාගෙන මලයාව ඉස්ලාමීකරණය කළහ. පුද්ගල අදහස් මත මිස බලය මත බෞද්ධ රාජ්‍යය ස්ථාපිත වී නොතිබූ නිසා මලායාව මෙන් ම ඉන්දුනීසියාව ද පහසුවෙන් ඉස්ලාම් ව්‍යාප්තවාදයට ගොදුරු විය. රාජත්වය අල්ලා ගැනීමෙන් පසු ඉස්ලාමය පවත්වා ගන්නට බලහත්කාරය යෙදවිණි.

ඉන්දුනීසියාවේ ඉස්ලාමය මුලින් වෙරළ තීරයට සීමා විය. (ඔවුනට තවමත් සන්ත්‍රිවරු කියා භාවිතා කෙරේ.) ගෝත්‍ර අතරට ගියේ උතුරු අප්‍රිකාවේ සිදු කළ ලෙස මය. එනම් ගෝත්‍රික නායකයින් බඳු භාර්යාවලින් වසඟ කිරීමෙන් හා පසු ව එනම් දෙවියෙකු යටතට ගැනීමෙනි. අද ද ඔවුන් අවන්ගන් වරුන් ලෙස හැඳින්වේ. මෙලෙස ඉස්ලාමය පැතිර ගියේ වෙළෙඳාම හා වෙළෙඳුන් සමග ය. ක්‍රිස්තියානි මිෂනාරීන් මෙන් ආගම 'වෙනම' දේශනා කිරීමට කිසිවකු සිටියේ නැත. මේ නිසා ඔවුන් ගිණිකොන ආසියාවේ බෞද්ධ රාජ්‍යයන් පහසුවෙන් පෙරළා දමන ලදී.

මොංගෝලියාවට ලෝක ඉතිහාසයේ පරිච්ඡේදයක් එක් කළේ ජෙන්ගිස් ඛාන් ය. ඔහු මොංගෝලියාවේ සිට වයඹ දිග චීනයේත් මධ්‍ය ආසියාවේත් මැදිපෙරදිගත්, දකුණු යුරෝපය දක්වාත් සිය යුද බලය ව්‍යාප්ත කළේ ය. කළු, සුදු, දුඹුරු, කහ වර්ගයන් ද ආර්ය-අනාර්ය භාෂාවන් කතා කළ විවිධ ජන වර්ගයන් ද, ඉස්ලාම්, යුදෙව්, කිතුනු, බෞද්ධ සරතුෂ්ත්‍ර හා තවත් විවිධ ගෝත්‍රික ආගම් අදහන ආගමික කණ්ඩායම් ද කුඩා රාජ්‍යයන්

ද රාජවංශ හා අධිරාජ්‍යයන් ද ජින්ජිස්ඛාන්ගේ යුද ප්‍රහාරයෙන් ඇද වැටිණි. ඔහුගේ යුද ජයග්‍රහණ පසුපස තිබුණේ එක දෙයකි. එනම් වේගයයි.

සෙබලාගේ කායික වේගය, මානසික වේගය, ඔහු සටනේදී (අශ්වයන් පිට නැඟී) දක්වන ජංගමශීලිත්වය, ඒ ඒ සේනාංක අතර, නායකයා හා සෙබළු අතර සන්නිවේදන වේගය, ආහාර වෙනත් සැපයුම් ලබා ගැනීමේ වේගය මේ ආදී සියල්ලෙන් ම ඔහු මැද පෙරදිග හා යුරෝපය සසල කළේ ය. ඔහුගේ හදිසි මරණයෙන් පසු ඔහුගේ විවිධ සෙනෙවිවරු ඒ ඒ ප්‍රදේශවල තව දුරටත් ඔහුගේ සටන ගෙන ගියහ.

හුලුගු ඛාන් එවැන්නකි. ඔහු වර්ෂ 1258 දී අබ්බාසිද් කාලිපාතය සහමුලින්ම පැරදවී ය. මේ අතර ක්‍රිස්තියානි ප්‍රතික්‍රියාවද ඇරඹී තිබිණි. මොංගෝලි ප්‍රහාර හා ක්‍රිස්තියානි ප්‍රහාර යන පෙරමුණු දෙක ම නිසා ඉස්ලාමය යුරෝපයේ ව්‍යාප්ත වීම නතර විය. එය එතැනින් නතර නොවී අල්මාහාද් බිඳ වැටී ස්පාඤ්ඤයේ බොහෝ ප්‍රදේශවලින් ද ඉවත් වන්නට වෙයි. (1212-69)

මොංගෝලියානු ප්‍රහාරය නිසා පළමු වතාවට ඉස්ලාමයේ ව්‍යාප්තවාදය තීරක ලෙස නතර කළේ ය. එය කුරුස යුද්ධවලින් ක්‍රිස්තියානින්ට හා මුළු යුරෝපයමටත් - ඒකාබද්ධ වී කළ නොහැක්කක් විය. එය එතැනින් නතර නොවී ඉස්ලාමයට අයත් ව පැවති ප්‍රදේශ අහිමි කළේ ය. බලවත් පදනම් රාජ්‍යයක් ඉස්ලාමයට අහිමි විය. මේ නිසා ඉස්ලාමයට 'ජිහාද්' පිළිබඳ කුකුසක් ඇතිවිය. ප්‍රතිඵලය වූයේ සුපිසම් ය.

සුජ් යන්නෙන් අදහස් කළේ වුල් ය. සුපි ගුරුවරු සරල වුල් ඇඳුම් ඇඳ සිටිය හ. එය එපමණක් නොව වුල් මෙන් සෞම්‍ය විය. සුපිසම් කදිම ආධ්‍යාත්මවාදයකි. එය ඉතා සරලව මෙසේ ඉදිරිපත් කළ ''අල්ලා අවසාන යථාර්ථය හා සත්‍යයයි. එය පුද්ගලයන්ට අත්විඳිය හැකි යථාර්ථයකි. ඒ සඳහා දිව්‍යත්වය පිළිබඳ සිතීම, එයම සිතීම, භාවනාව හා වීර්යයෙන් උත්සාහ කිරීම අවශ්‍ය ය. සමාජ - දේශපාලන ක්‍රියාවලට මුස්ලිමුන්ගේ මැදිහත්වීම නිසා ඔවුනට සිය ජීවිතයේ දී අල්ලා දැක ගැනීමට අපහසු වේ. මේ නිසා ඒ ඒ ප්‍රදේශවලින් තනි තනිව සිය ජීවිතය අල්ලාට කැප කර ඔහු සොයා යෑම සඳහා භාවනායෝගී ජීවිතයකට එළැඹිය යුතු ය.''

සුපිවාදයේ ප්‍රමුඛයන් ලෙස හසන් අල් බස්රි, අල් ගසාලි හා මන්සූර් අල් හලාජ් හඳුනාගත හැක. ඉන්දියානු අධ්‍යාත්මවාදවලින් හා බෞද්ධ

භාවනා ක්‍රමවලින් ඔවුන්ට බලපෑමක් ඇති වූ බව පෙනේ.

මේ නිසා ම සුපිවාදය පැතිරී යන්නේ ඉන්දියාවේ ය. ගසානි ගි මහමුද් කයිබර් දුර්ගය තරණය කර පන්ජාබය අල්ලයි. ඉන්පසු ක්වටබ් අල්දින් අයිබක් (ඔහු තුර්කි-ඇෆ්ගන් ජාතිකයෙක්) දිල්ලිය අල්ලාගනී. වර්ෂ 1206 සිට දිල්ලි සුල්තාන් යුගය උතුරු ඉන්දියාවේ ඇරඹේ.

මේ අතර මොංගෝලියානු යුද නායකයින් ඉස්ලාමය වැළඳ ගනී. මේ හා සමඟ මධ්‍ය ආසියාවේ සිට මොංගෝලියාව දක්වා ඉස්ලාමය ව්‍යාප්ත වේ. (1205) මුස්ලිම් මොංගෝලිවරු පර්සියාවේ (ඛාන්වරු) ෂියා ඉස්ලාමය ස්ථාපිත කරති. (1285-1370) තවත් මොංගෝලි නායකයින් ඉන්දියාවට පැමිණ ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍යය පිහිටුවති.

ඉන්දියානු හින්දු-බෞද්ධ දර්ශනයන්ගේ බලපෑමට ඉස්ලාමය හසුවේ. මුහායි අල්දින් ඇරාබි විසින් අල්ලා හා විශ්වය එකක් කියයි. අල්ලා යනු නිරපේක්ෂ ඔබ්බේ ඇති දෙයක නොව සියල්ලම ය. මෙහි පැතිරී ගිය දේවත්වයක් පිළිබඳව ඉන්දියානු 'බ්‍රහ්මන' සංකල්පයට ඉතා කිට්ටුය. පැතිරී ගිය දේව සංකල්පය ස්පානෝසාද (බටහිර දර්ශනයේ දී) එය ඉන්දියාවෙන් බව නොකියා ම ණයට ගත්තේ ය. මුහායි එතනින් නතර නොවේ. ඔහු අපි දකින, අපට දැනෙන දේ පැහැදිලි කරන්නට විය. ඒ අනුව ඒවා හුදු පෙනීම හා දැනීම් පමණ ය. මෙය හින්දු මායා සංකල්පය සමඟත් ථෙරවාදී යථාව සමඟත් සමගාමී වූ මතයකි. මෙලෙස මැවුම්කාර තනි දෙවියෙක් සිටිය යන පදනම මත ම සිටගෙන ඉස්ලාමය දාර්ශනික වශයෙන් මුහුකුරා යෑමක් ඇතිවිය.

මෙහිදී ඉතාම වැදගත් මෙහෙයක් කළ මෝගල් අධිරාජයා අක්බාර් ය (1556-1605). සුපිවාදය, හින්දු හා බෞද්ධ ධර්මයන් එක්කර නව ඉස්ලාමයක් ඇති කිරීමට ඔහු උත්සාහ දැරුවේ ය. ඔහු ඉස්ලාම් ෂරියා නීතිය පවා ලිහිල් කළේ ය. මේ අනුව ඉස්ලාමය නොඅදහමින් ම කාන්තාවන්ට මුස්ලිමුන් හා විවාහ වීමට හැකිවිය. ඉන්දියාවේ පැවති කුල ප්‍රශ්නය නිසා බ්‍රාහ්මණ නොවන කුලවල ජනයා සිටියේ අසමානතාව පිළිබඳ කලකිරීමෙනි. හින්දු-ඉස්ලාම්-බෞද්ධ නවසහවාදය යටතේ ඔවුන් බොහොමයක් ද මෝගල් යුගයේ දී ඉස්ලාමයට ආහ. (නමුත් අද දක්වා මුස්ලිමුන් තුළ ද ඉන්දියාවේ කුල සීමාවෙන් පවතී. ඒවා ඔවුන්ගේ නම්වල සැඟ වී ඇත. 1581 දී අක්බාර් දිව්‍ය විශ්වාසය (Din Illahi) නම් තමන්ගේ ම වූ ඉස්ලාම් නිකායක් බිහි කළේ ය.

අක්බාර්ට එරෙහිව ඉස්ලාම් මූලධර්මවාදය ක්‍රියාත්මක විය. ඔහුගේ මේ නව අදහස් නිසා කුරානයේ හා හාදිත්හි මූලික විශ්වාසයන් කඩවන බව කියමින් ෂෙයික් නක්ෂබන්දි විරෝධතාවයක් ගෙන එයි. නමුත් අක්බාර්ගේ මහා බලය නිසා එය කරළියට ගෙන ඒමට හැකි වන්නේ ඔහු නැති විට ය. (1695 පසු)

මෙයට නායකත්වය දෙන්නේ අහමද් සිර්හින්දි (1564-1624) විසිනි. ඔහු කීවේ සමගිය හා සාමය සඳහා ඉස්ලාමය හින්දුන්ට බිලිදිය නොහැකි බවයි. ඉතා පැහැදිලි ඒක දේවවාද ඉස්ලාමය, විසිරුණු බහුදේවවාද හින්දු ආගම මැවුම්කරුවන් හා සාරයක් නැතැයි කියන බුද්ධාගම සමඟ හෝ එක් කළ නොහැකි බව සිර්හින්දි කීවේය.

සාමාන්‍යයෙන් හින්දුන් කළේ අන් ආගම් පැමිණි විට ඒවා තමා තුළට උකහා ගැනීමයි. බුදුරජාණන් වහන්සේ විෂ්ණුගේ දසවැනි අවතාරය කිරීමෙන් හා නිර්වාණය යනු පුද්ගලික ආත්මයන්ගෙන් වෙන්වී විශ්ව ආත්ම සමඟ එක්වීම බව විස්තර කරමින් හින්දු පූජකයෝ හා දාර්ශනිකයෝ දක්ෂ ලෙස බුදු දහම උකහා ගත්හ. ඉස්ලාමය ද එයට ගොදුරු වෙමින් තිබිණි. සිර්හින්දි එය තීරක ලෙස නැවත මුසු නොවන ලෙස වෙන් කළේ ය. මහා භාරතය හින්දු හා ඉස්ලාම් ලෙස බෙදුවේ මවුන්ට්බැටන් නොව දාර්ශනිකව අහමද් සිර්හින්දි ය.

ඊළඟට ඉස්ලාම් ලෝකයේ වැදගත් මධ්‍යස්ථානයක් ලෙස නැග එන්නේ තුර්කියයි. තුර්කියට ඒ නම ලැබුණේ ස්පාඤ්ඤයට කඩා වැදුණු ටාරික් නිසා බවට ද මතයක් ඇත. කෙසේ වෙතත් බොහෝ කාලයක් තුර්කියට මැද පෙරදිගට හා ඈත පෙරදිගට යුරෝපය විවෘත කළ දොරටුව විය. රෝම අධිරාජ්‍යයේ ක්‍රිස්තියානිය පිළිබඳ ප්‍රශ්න ඇති කරගත් කොන්ස්තන්තිනෝපලය පදනම් කරගත් බයිසන්ටියම් අධිරාජ්‍යය වෙන ම ග්‍රීක ඔර්තෝඩොක්ස් පල්ලිය බිහි කරයි. එය ස්ලාව්වරුන් විසින් නැගෙනහිර යුරෝපයේත් රුසියාවේත් ව්‍යාප්ත කෙරේ. තුර්කියේ ඉතාම සටන්කාමී ගෝත්‍ර කිහිපයක් විය. මෙවැනි සටන්කාමී එකතුවකි තිබූ අනෙක් රට ජර්මනියයි. තුර්කියේ බිහි වූ ඔස්මනාලි නම් මෙවැනි යුද ගෝත්‍රයක නායකයා වූ ඔස්මන් (1259-1326) විසින් තුර්කිය පදනම් කරගෙන ඔටෝමාන් අධිරාජ්‍යයේ පදනම් දැම්මේ ය. ඔහු හනාෆි නිකායට අයත් සුන්නි මුස්ලිම්වරයෙක් විය. ඉන්පසු ටිමූර් යටතේ මුස්ලිම් වෙනත් රටවල් සමඟ ගැටුම් ඇතිවිය. ඉතාම වැදගත් සිද්ධියක් වුණේ මොහොමඩ් II විසින් 1453 දී කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම ය. ඉන්පසු බයිසැන්ටියම් අධිරාජ්‍යය ඔහුට හිමි විය.

කොන්ස්තන්තිනෝපලය ඉස්ලාම් බලයට යටවීම (එය මොහොමඩ් විසින් ඉස්තාම්බුල් ලෙස නම් කෙරිණි) යුරෝපා ඉතිහාසයේ ඉතාම තීරක අවස්ථාව විය. එය පළමුවෙන්ම සිදු වූයේ කොන්ස්තන්තිනෝපලය පදනම් කරගත් ග්‍රීක ඕර්තෝඩොක්ස් ක්‍රිස්තියානි නිකාය සිය මධ්‍යස්ථානය ලෙස ස්ලාව් අග නගරය වූයේ මොස්කව් බලා යෑම ය. එමගින් ඉස්ලාම් විරෝධි කිතුනු මධ්‍යස්ථානයක් රුසියාවේ ඇතිවිය. අනෙක් අතින් රෝමය පදනම් කරගත් රෝමානු කතෝලිකයන්ගේ ගැටළුව වුණේ ඔවුනට තව දුරටත් මැද පෙරදිග හා ආසියාව තහනම් වීමය. කුරුස යුද්ධයෙන් පසු ආසියානු ආහාර, කුළුබඩු, රෙදිපිළි, තාක්ෂණය හා දැනුම ක්‍රමයෙන් යුරෝපයට ආවේ බයිසැන්ටියම් දොරකඩෙහි. දැන් එය වසා දැමිනි. මේ හා සමඟ ඉස්ලාමය යුරෝපයෙන් වැනසීමේ රෝමානු කතෝලික කුරුස යුද්ධය ස්පාඤ්ඤයෙන් ඇරඹිණි. දස දහස් ගණනක් ඝාතනය කරනු ලැබීය. අවසානයේ ස්පාඤ්ඤය හා පෘතුගාලය දැඩි ඉස්ලාම් වෛරයක් සමඟ ම යළිත් රෝමානු කතෝලික විය. එය එතැනින් නොනැවතී බලහත්කාරයෙන් ඉස්ලාමයෙන් කතෝලික දහමට ජනයා හරවයි. මෙය ග්‍රෙනඩාව දක්වා ම ව්‍යාප්ත කෙරේ. (1402) පෙරදිගට ගොඩබිම් මාර්ගය වසා දැමීම නිසා කොළොම්බස් මුහුදට බසින්නේ ආසියාවට ඉන්දියාවට යෑම සඳහා මුහුදු මාර්ගයක් සොයා ගැනීම සඳහා ය. යුරෝපයේ ව්‍යාප්ත වාදය එතැනින් ඇරඹේ. ඉස්ලාම් ව්‍යාප්තවාදයට පිළිතුරක් ලෙස ක්‍රිස්තියානි ව්‍යාප්තවාදය ඉදිරියට එයි. ජිහාද් වෙනුවට ශුද්ධ යුද්ධය ආදේශ විය. ඇමරිකාවේ, අප්‍රිකාවේ හා ආසියාවේ ප්‍රදේශවලට වෛරයෙන් පිරිගිය පෘතුගීසි හා ස්පාඤ්ඤ ආක්‍රමණිකයෝ කඩා වදිති.

ඔටෝමාන්වරුන්ගෙන් ඉස්ලාම් ව්‍යාප්තාවාදය නතර නොවේ. සේලිම් යටතේ ඔවුහු, කලිපාත් පදවිය මම්ලුක්වරුන්ගෙන් උදුරා ගනිති. ඔවුනගේ බලවත් රජු වූ සුලේමාන් (1494-1556) යටතේ ඔවුහු නැගෙනහිර යුරෝපයට කඩා වදිති. 1521 දී ඔවුහු බෙල්ග්‍රේඩය අල්ලා ගනිති. (ඒ සමඟ ම සියවස් 5 ක් දික්ගැසුණු බොස්නියා-සර්බියා ඉස්ලාම්- කිතුනු ගැටුමට මුල පාදයි) 1529 දී ඔවුහු වියානාව වට කරති.

මේ අතර ඉන්දියානු සාගරයේ මුස්ලිමුන් වැනසීම පෘතුගීසි භාර ගනිති. මුලින් ඉන්දියාවට (ගෝවට) යන ඔවුහු පසු ව මලයාවට (1551) පහර දෙති.

ඔටෝමන්වරුන් හා හබ්ස්බර්ග්වරුන් අතර දීර්ඝ යුද්ධය (1593-1605) ඔටෝමාන් අධිරාජ්‍යයට සැලකිය යුතු හානියක් කරයි. 1683 දී

ඔටෝමන්වරු මුළු වැර යොදා වියානාව අල්ලා ගැනීමට තැත් කරති. මේ යුගයේ යුරෝපය වේගයෙන් යටත් විජිතවලින් ලත් ධනයෙන් හා දැනුමෙන් නවීකරණය වෙයි. රෝමානු කතෝලික බලය අභියෝග කෙරී ප්‍රොතෙස්තන්ත හා රෙපරමාදු නව ක්‍රිස්තියානි නිකායන් ඇතිවේ. 1683 දී ඔටෝමන්වරුන්ගේ වියානා පරාජය සැලකිය යුත්තේ නූතනවාදය ක්‍රිස්තියානිය මුල්කරගෙන බිහිවීමට තීරණය කිරීමක් ලෙස ය. එතැන් සිට ඔටෝමාන් අධිරාජ්‍යයත්, ඉස්ලාම් බලයත් විසිරෙන්නට පටන් ගනී. විද්‍යාත්මක චින්තනය, කාර්මික විප්ලවය, ක්‍රිස්තියානි පුනර්ජීවනය, නවීන ජාතීන් බිහිවීම යන කරුණු මුල්කරගෙන, ආසියාවේ, අප්‍රිකාවේ හා ඇමරිකාවේ ඓතිහාසික ජාතීන්ගේ සම්පත්, පරිසරය, දැනුම හා සංස්කෘතිය සූරා ගැනීමේ දැවැන්ත ප්‍රයත්නය මත යුරෝපය කේන්ද්‍ර කරගත් නූතනවාදය ඇරඹේ. මුලින් රුසියානු සාර්වරු නැගෙනහිර යුරෝපීය මුස්ලිම් ටාටර්වරු (පෝලන්තයේ සිට කැස්පියන් මුහුද දක්වා) සටන් සන්ධානවලට එලැඹිණි. පසුව ඒ සන්ධාන පවා බිඳ වැටිණි.

නූතනවාදයේ බලපෑම ඔටෝමන් සේලිම් II (1789-1807) රජු වටහා ගනී. ඔහු සිය හමුදා නවීකරණයට නැග එන ප්‍රංශයේ උපකාර පතයි. ඔහුට එරෙහි ව ඉස්ලාම් මූලධර්මවාදී හු නැගී සිටිති. එයට මූලිකත්වය ගන්නේ උගත් උලේමාවරු සහ 1259 සිට ම ඔටෝමන් අධිරාජ්‍යයේ රුධිරය වූ හමුදාවේ මූලධාර්මික ජනසාරියාන් බල ඇණියයි. 1789 දී නැපෝලියන් පහසුවෙන් ඔටෝමන්වරුන්ගෙන් ඊජිප්තුව අල්ලා ගනී. මොහොමඩ් II සමයේ ග්‍රීකයේ නිදහස් කැරැල්ලක් ඇති වූ අතර (1821) එය මර්දනය කිරීමට ජනසරියන් කරගත් මොහොමඩ් උලේම හා ජනසරියන් මූලධර්මවාදීන් නොතකා සිය හමුදා නවීකරණයට ඉදිරිපත් විය. එහෙත් ඔහු පමා වැඩි විය. කොන්ස්තන්තිනෝපලය අහිමි වූ දා සිට වෛරයෙන් සිටි ග්‍රීක ඕර්තෝඩොක්ස් ක්‍රිස්තියානිය සිය අලුත් නායකයා හා අධිරාජ්‍යයා වූ රුසියාවේ සාර් සමඟ ඔටෝමන් අධිරාජ්‍යයට පහර දෙයි. 1829 දී රුසියාවේ කොසේසස් ප්‍රදේශ සහමුලින් අල්ලා ගනී. පසු ව බල්ගේරියා, සර්බියා ආදී ප්‍රදේශවල ද කැරලි ඇති වේ.

තම පසුබෑම්වලට හේතුව ඉස්ලාමයෙන් දුරස්වීම ලෙස සලකන මූලධර්මවාදීන් ඔටෝමනය තුළ මූලධර්මවාදය හා 'ෂරියාත්' ස්ථාපිත කිරීම සඳහා යළිත් උත්සාහ දරති. 1859 දී අබ්දුල් අසීස් ඉවත්කර මිදාත් පාෂා පත් කෙරේ. එහෙත් බිඳ වැටීම එයින් වේගවත් වේ. 1877 දී සිය ඓතිහාසික පළිය ගනිමින් ඕර්තෝඩොක්ස් ක්‍රිස්තියානිහු ඉස්තාන්බුල් අල්ලා ගෙන එය නැවත කොන්ස්තාන්තිනෝපලය කරති. 1878 දී සැන් ස්ටැපනෝ ගිවිසුමෙන් සයිප්‍රසය බ්‍රිතාන්‍යයටත්, ටියුනිසියාව ප්‍රංශයටත් යයි.

ඉන්පසු අබ්දුල් හමීඩ් II විසින් (1878 දීම) අවසාන මූලධාර්මික උත්සාහය දරයි. ව්‍යවස්ථාව අත්හිටුවා පාර්ලිමේන්තුව විසිරුවන ඔහු තම යුද ආඥාදායකත්වයක් මතින් ඔටෝමන් කාලිපාතය ඉදිරියට ගෙන යාමට උත්සාහ කරයි. ඔහුට ඒ න්‍යායාචාර්ය ලෙස සහාය දෙන්නේ ජමල් අල්දීන් ඇෆ්ගනි ය.

ඇෆ්ගනි අපූර්ව චරිතයකි. ඔහු ගුරුවරයෙකි, දාර්ශනිකයෙකි, පුවත්පත් කලාවේදියෙ කි. ඉහළ ම ඝනයේ ප්‍රකාශකයෙකි. ඔහුට මුළු ඉස්ලාම් ලෝකයේ ම සංචාරයෙන් ලද අත්දැකීම් තිබිණි. ඉන්දියාවේ සිපායි නැගිටීම් වන විට ඔහු ඉන්දියාවේ ය. තවත් විටක ඔහු ඇෆ්ගනිස්ථානයේ ය. නැත්නම් ඉරානයේ හෝ ඊජිප්තුවේ ය. ඊජිප්තුවේ දී ඔහු ඔරාබි පාෂා සමඟ එක් වී බ්‍රිතාන්‍යයේ බලයට අභියෝග කරයි. ඇෆ්ගනි අල්ලා ඉන්දියාවට පිටුවහල් කෙරේ. එවිට කල්කටාවේ සිය සටන පටන් ගනී. (ඔරාබි භාෂා 1881-82 ඊජිප්තු සටනට නායකත්වය දෙයි. ඔහු අල්ලා ලංකාවට පිටුවහල් කෙරේ. (ලංකාවේ නූතන ඉස්ලාම් මූලධර්මවාදයේ පියා ඔහු ය). ඇෆ්ගනි පසුව ඉරානයේ ෂා රජු සමඟ එක් ව මූලධර්මවාදී විප්ලවයට සැරසේ. ෂා පසු ව ඔහු පිටුවහල් කරයි. සුන්නි-ෂියා හෝ වෙනත් නිකායික බේදයකින් තොර ව මුස්ලිම්වරු එක ම ජාත්‍යන්තර සංවිධානයක් බවට පත් විය යුතු යැයි ඇෆ්ගනි විශ්වාස කළේ ය. ඔහුගේ අදහස ක්‍රියාත්මක කරන්නේ ඉන් වසර සියයකට පසු ඔසාමා බින්ලාදන් විසිනි. ඇෆ්ගනි ළඟට වැදගත් පුද්ගලයා මහමුද් අබ්දු ය. ඔහු ඊජිප්තුව බටහිර තාක්ෂණය සමඟ මුසු කිරීමට උත්සාහ කළේ ය.

ඔටෝමන් කාලිපාතය තමන්ගේ ම ආරක්ෂාව තකා 1914 දී නව යුරෝපීය බලවතා වූ ප්‍රොතෙස්තන්ත ජර්මනිය සමඟ එක් වී රෝමානු කතෝලික ප්‍රංශයට පහර දීමට යයි. පළමු ලෝක සංග්‍රාමයෙන් තුර්කි-ජර්මනි අක්ෂය පරාජය වේ. තුර්කිය තුළ අනාගමික ප්‍රවනතා මතු වේ. රුසියානු බෝල්ෂෙවික් විප්ලවය අනුව යමින් මුස්තාපා කෙමල් අටාටුක් (1881-1938) තුර්කිය අනාගමික කරයි. 1924 දී ඔහු ඔටෝමන් කාලිපාතය විසුරුව හරී. තුර්කිය යුරෝපයට පසුපසින් නූතනවාදය සොයාගෙන කෙමල් අටාටුක් සමඟ ගමන් ගනී. වර්ෂ 1350 න් පසු යුරෝපට පිබිදෙද්දී ඔටෝමන් කාලිපාතය තුළ දිගට ම සුන්නි මූලධර්මවාදය හා නූතනවාදය අතර ගැටුම් තිබිණි. විටින් විට ජය පැරදුම් ලබමින් සිටි නූතනවාදය කෙමල් යටතේ බොහෝ කලකට පවතින ලෙස ජයග්‍රාහී විය.

### දෙවැනි පරිච්ඡේදය

## ඉස්ලාම් මූලධර්මවාදය හා රාජ්‍යය

**සවුදි අරාබිය :**

මක්කම ඉස්ලාම් භක්තිකයන්ගේ අති පූජනීය නගරයයි. ශුද්ධ වූ "කුෂ්ණ" පාෂාණයත් අල්කබා දේවස්ථානයත් ඇත්තේ එහිය. මහමත්තුමා මදිනාවේ සිට අවුත් මහ සටන් කළේ මේ නගරය තම අතට ගන්නට ය. එතැන් පටන් මෙකා හෙවත් මක්කම ඉස්ලාමයේ ප්‍රධාන පූජනීය මධ්‍යස්ථානය විය. මහමත්තුමා මියයෑමට පෙර අල්කබාවට ගිය අතර වාර්ෂික ව හජ්ජි වන්දනාවේ යෙදෙන ලෙස ලොව පුරා ඉස්ලාම් භක්තිකයන්ගෙන් ඉල්ලා සිටියේ ය. එතැන් පටන් දහස් ගණනින් ඇරඹී දශ ලක්ෂ ගණන් බැතිමත්තු එහි ආහ.

මෙකා හෙවත් මක්කම සවුදි ආරාබියාවේ පිහිටා ඇත. ආගමික අතින් වැදගත් මේ නගරයේ ලෞකික දේ ද සිදු වේ. එනම් මුස්ලිම් ජනයා ව්‍යාපාර කරමින් ද, දූ දරුවන් රකිමින් ද, ඔවුන් පාසල් යවමින් හා තව නොයෙක් ගෘහ ජීවිතයේ දෛනික දේ ඉටු කරමින් ද එහි වාසය කරති. කාන්තාවන් සඳහා වූ අංක 31 අතරමැදි පාසල පිහිටා තිබුණේද මෙකා ශුද්ධ නගරයේ ය.

2002 වසරේ ජූලි මාසයේ දිනෙක සුපුරුදු පරිදි ගේට්ටු තදින් පවන ලද තට්ටු හතරකින් යුතු ඒ පාසලේ සිසුවියෝ 750 ක් ඉගෙනීම


කරමින් සිටියහ. එක් පන්ති නායිකාවකට දැනුණේ යොවුන් සිසුවියන් අතර කිසිවෙකු සිගරැට්ටුවක් උරමින් සිටින බව ය. අල්ලාහ්!! කුරානයට අනුව කිසි ම දැරියකට දුම්වැටි ඉරීම තහනම් ය. ඈරත් පාසල් යන දැරියකට පන්ති නායිකාව දුමට ඇබ්බැහි වූ බාලිකාව අල්ලා ගැනීමට යන අතර දුම් උරමින් සිටි දැරිය සිය දුම්වැටිය සීරුවෙන් පසෙකට විසි කළාය. දුම් සුවඳ මිස දැන් සිගරැට් උරන්නෙකු නැත.

ගත වූයේ මිනිත්තු විස්සකි. ගින්නක්! ගින්නක්! හඬ සතර අතින් නැගිණි. විසිරී තිබූ කොළ කැබලි පතපොත බිමට ඇතිරූ පැදුරු ආදිය දවාගෙන ගින්න පැතිරී ගියේ ය. මහල් හතරකින් යුතු ගොඩනැගිල්ලේ උඩ තට්ටු දෙක ම මොහොතකින් දුමෙන් පිරී ගියේ ය.


අවුරුදු 12 - 16 ත් අතර බාලිකාවෝ තැති ගැන්වී ගොඩනැගිල්ලට තිබූ එක ම පඩිපෙළ දිගේ දුම් රොටු මැදින් පහළ මාලයට දිව එන්නට වූහ. අනේ! එක ම දොර ඉබි යතුරු දමා වසා තිබිණි. එවිට ඔවුහු ගොඩනැගිල්ලේ ජනේල කරා දිව ගියහ. කිසිවෙකුට එළියට හෝ ඇතුළට යා නොහැකි ලෙස ඒ සියලු කවුළු ද සිර මැදිරියක් මෙන් අගුළු දමා තිබිණි. ඉස්ලාමීය නීතිය අනුව ඒ එසේ ය. ඒ අතර විදුලිය ඇණ හිටිනි. ගින්නෙන් දැවෙමින්, දුමෙන් සිර වී අන්තිමේදී අඳුරේ ම සිසුවියෝ මිය යන්නට වූහ.

දැරිවියන්ගේ විලාපය ඇසුණු කවුරුන් හෝ විසින් ගින නිවන හමුදාවත්, පොලිසියත් කැඳවා තිබිණි. ඒ කිසිවකු හෝ මිය යන්නට පෙර ය. නමුත් ඉස්ලාමීය ෂරියා නීතිය සවුදි අරාබිය තුළ ක්‍රියාත්මක කරන මුත්තාවා ආගමික පොලිසිය එයට හරස් විය. ඔවුකන් කීවේ කුරානය අනුව කිසි ම ආගන්තුක පිරිමියෙකුට බාලිකා විද්‍යාලයට ඇතුළු විය නොහැකි බව ය. ගිනි නිවන භටයින් හා පොලිසිය බාලිකාවන් විලාප දෙමින් කෑ ගසද්දී ඉස්ලාමයේ නාමයෙන් බලා සිටියෝ ය. බියට පත් බාලිකාවන් බොහොමයකට ඔවුන්ගේ මුහුණ හා හිස වසනා පර්දාව අමතක වී තිබිණි. මුත්තාවා කස රැගෙන ගොස් ගින්නෙන් දැවෙන බාලිකාවන්ට පර්දා පැළඳ ගන්නැයි අණ කරන්නනට විය.

අන්තිමේදී එහි සිටි ඇතැම් පොලිස් නිලධාරීන්ගේ ද දරු කැක්කුම මතුව ආවේ ය. මුත්තාවා ආගමික පොලිසියේ ඉස්ලාමීය නීති බිඳ දැමූ ඔවුහු විදුහලේ එක ම ප්‍රධාන දොරටුවේ ගේට්ටු කඩා දැමූහ. නමුත් ඔවුන් බොහෝ පමා වී තිබිණි. බාලිකාවන් 15 දෙනෙක් සදහට ම යළි නොඑන්නට



01. ඇෆ්ගනිස්ථානය
02. ඉරානය
03. ඉරාකය
04. කුවේටය
05. සිරියාව
06. ලෙබනනය
07. ජෝර්දානය
08. ඊශ්‍රායලය
09. සවුදි අරාබිය
10. ගල්ෆ් රටවල් හා ඕමානය
11. යේමනය
12. සෝමාලියාව
13. ඉතියෝපියාව
14. සුඩානය
15. ඊජිප්තුව
16. ලිබියාව
17. ටියුනීසියාව
18. ඇල්ජීරියාව
19. මොරොක්කෝව



ෆාද් රජු හා ජෝර්ජ් බුෂ්

දැවී හළු වී තිබිණි. තවත් පනස් දෙනෙක් පමණ තුවාල සහිතව සිටියෝ ය.

මේ බියකරු ඝාතනය ගැන සවුදියේ මාධ්‍ය නිහඬ විය. නමුත් අල් නදාවා පුවත්පත එසේ නොවී ය. මියගිය දැරිවියකගේ පියා මක්කමේ රජ කුමරුට කරන ආයාචනයක් ද එහි විය. සවුදියේ පාද් රජුගෙන් පසු ඔටුන්න හිමි අබ්දුල්ලා කුමරු ද සිද්ධිය පිළිබඳ ව දැනගත්තේ ය. නමුත් කිසිවක් සිදුවන බවක් පෙනෙන්නට නැත. මන්ද මිය ගිය කිසිවෙකු හෝ සවුදි රජ පවුලේ තිස් දහසකට ආසන්න ඍජු හෝ වක්‍ර රජ කුමර කුමරියන් නොවන නිසා ය. අඩු තරමින් ඔවුන් කිසිවෙකුත් සිය මාලිගාවල සිට රොල්ස්රොයිස් වලින් පාසැල් යන්නෝ ද නොවෙති. සවුදිය සම්පත් වලින් පිරී ගිය රටක් ලෙස සැලකුවත් එහි ඒක පුද්ගල ආදායම ලංකාවේ මෙන් තුන් ගුණයක් වුවත් ඒ මහා තෙල් ධනය භුක්ති විඳින්නේ අතලොස්සකි. බහුතරයකට උරුම දාසකමත් අසරණ කමත් පමණි. සවුදියේ බොහෝ ප්‍රදේශවල දුගීන්ට පිරිසිදු ජලය, රැකියා ආදිය බොහෝ හිඟ ය.

අල් නදාවා පුවත්පතට බාලිකා විද්‍යාල අංක 31 සිදු වූ ඛේදවාචකය ගැන කවි පන්තියක් ලියමින් අබ්දුල් මොසෙන් මුසාලම් කීවේ ''මුත්තාවා වරුනි, (කුරානයට අනුව වැවෙන්නට ඉඩ හැර ඇති) ඔබේ දිගු රැවුළු දැන් තෙත් ව ඇත.....'' කියා ය.

මුසාලම්ට ඉතා ඉක්මණින් ම මුත්තාවා ආගමික පොලිසියෙන් පිළිතුරක් ලැබිණි. ඉස්ලාමයට අපහාස කළැයි ඔහු අත්අඩංගුවට ගෙන දඟගෙට යවනු ලැබී ය.!

වර්තමානයේ සවුදිය සියළු මුස්ලිම් රටවලින් ධනවත් ම රට ය. 1999 දී එහි ඒක පුද්ගල ආදායම ඩොලර් 10815 ක් විය. (PPP අගය) 1990 - 99 කාලය තුළ ඒක පුද්ගල ආදායමේ වර්ධනය ඍණ 1.1 කි. 1999 දී සවුදියේ ජනගහණය මිලියන 19.6 ක් වූ අතර, 2015 දී එය මිලියන 31.7 ක් වනු ඇතැ යි විශ්වාස කෙරේ. එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන දර්ශකය (HDI) අනුව ධනවත් සවුදි අරාබියට හිමි ව ඇත්තේ 68 වැනි ස්ථානය යි.! එහි ආර්ථික වර්ධන වේගය ද, නිෂ්පාදායිත්වය ද කඩා වැටෙමින් ඇත.

සවුදිය අද රජ පවුලක් විසින් පාලනය කළ ද එය දීර්ඝ අතීතයක් සහිත ඓතිහාසික රාජ්‍යයක් නොවේ. සවුදි අරාබිය නිල වශයෙන් පිහිටවනු ලැබුයේ වර්ෂ 1932 දී ය. නමුත් ඒ සඳහා වූ දීර්ඝ ඉතිහාසයක් නම් ඇත.

සවුදිය සියළු මුස්ලිම් රටවලින් ධනවත් ම රට වනවා මෙන් ම එය ඉස්ලාමයේ ප්‍රධාන ශුද්ධ නගර දෙකවන මක්කම හා මදීනා නගර දෙක ද සහිත රාජ්‍යය යි. ඒ නිසා පොදුවේ ලෝක මුස්ලිම්වරුන්ගේ ශුද්ධ නගර එහි පිහිටා ඇත. එයට අමතරව එය සුන්නි මුස්ලිමුන්ගේ ද ප්‍රධාන රට බවට ක්‍රමයෙන් පත්වෙමින් ඇත.

මුස්ලිම් ලෝකය කවදත් පෙරට ගියේ නායක හා පදනම් රාජ්‍යයක් සමඟිනි. අන්තිමේ දී එය තුර්කිය විය. නමුත් 1924 දී කෙමල් අටාටුක් විසින් ඔටෝමන් කලිපාතය විසුරුවා හැරීමත් සමඟ මුස්ලිම් ලෝකය නායකත්ව අර්බුදයකට මැදි විය.

මේ වකවානුවේ මක්කම හා මදීනා ශුද්ධ නගර දෙක ඇතුළත් ප්‍රදේශ පාලනය කළේ හෂීම් රජ පෙළපතින් ආ ෂරීෆ් හුසේන් අලි සල් හෂීම් විසිනි. ඔහු කාලිෆ් පදවියට මැන බලමින් සිටියේ ය. මේ කලාපයේ බලවතා ලෙස 19 වැනි සියවසේ මැද භාගයේ සිට පෙරට එන බ්‍රිතාන්‍යය පළමුවැනි ලෝක සංග්‍රාමයේ දී සල් හෂීම් රජු ඉත්තෙකු ලෙස යොදා ගති. ඒ තමන්ට එරෙහි ජර්මනිය සමඟ සන්ධානගත සිටි ඔටෝමාන් තුර්කියට එරෙහිව ය. ඔහුට හිජාසයේ ද (මක්කම හා මදීනා ඇතුළත් ව) ඔහුගේ පුතුනට වත්මන් ඉරාක ප්‍රදේශවල හා ට්‍රාන්ස් ජෝර්දානයේ ද රජවීමට බ්‍රිතාන්‍යය උපකාර කළේ ය.

මෙයට එරෙහි වන්නන් අතර අබ්දුල් අසීස් ඉබන් අබ්දුල් රහමන් අල් සවුද් (1879 - 53) හෙවත් අබ්දුල් අසීස් වෙයි. ඔහු හිජාස් අවට ප්‍රදේශ හා වත්මන් කුවේටයට අදාල ප්‍රදේශවල පාලනය ගෙනගිය ''රජු'' වෙයි.

අබ්දුල් අසීස් අයත්වන්නේ සාවුද් පෙළපතට ය. ඔවුහු 1819 දී ඔටෝමාන්වරුන් විසින් පරාජය කර ඈඳාගන්නා ලදහ. සවුද් පෙළපත ඇරඹෙන්නේ මොහොමඩ් ඉබන් සවුද් නම් යුද අධිපතියා සමඟ ය. (1710 දී උපත ලැබී ය.) මෙයට සමකාලීන ව විසුවෙක් නම් මොහොමඩ් ඉබන් අබ්දුල් වහාබිය. (1703 - 87). කුරානය මැනවින් හදාළ ඔහු එයට නව කියවීමක් දෙමින් වහාබිවාදය ගෙන ආවේ ය. මක්කම අවට විසූ ජනයා මේ වන විට නැවතත් පිළිම වන්දනාවට හා සොහොන් වන්දනාවට හුරු වී සිටියහ. ඇතැම් සොහොන් පැරැණි ඉස්ලාම් වරුවන්ගේ ය. අනෙක් අතට ඔවුහු ගෝත්‍රික බෙදීම් වලින් බොහෝ දුරට බෙදී සිටියහ. ගෝත්‍රික හැඟීම් වෙනුවට වහබි ඉස්ලාමය ඉදිරියේ සමානතාව දේශනා කළේ ය. ඔහු තව දුරටත් ප්‍රචණ්ඩ ලෙස පිළිම වන්දනාවට එරෙහි විය. එහිදී ඔහුට දැවැන්ත

විරෝධයක් (1744 දී) එල්ල විය. ආරක්‍ෂාව පතා උයයිනා පිට ඔහු යන්නේ දිරියාවේ යුද අධිපතියෙකු වූ ඉබන් සවුද් අසලට ය. ඉබන් සවුද් තම මතයට දිනාගන්නා වහාබ් ඔහු සමඟ එක් වී ඉස්ලාම් මූලධර්මවාදය වෙනුවෙන් ජිහාද් දියත් කළේ ය. 1803 දී ඔවුන්ට මක්කම හා මදීනා ශුද්ධ නගර ප්‍රදේශ අල්ලා ගැනීමට හැකිවිය. 1805 දී ඔවුන් එහි වහාබ්වාදී රාජ්‍යයක් පිහිටු වූහ. 1819 දී ඔටෝමාන්වරුන් විසින් ඔවුන් පරාජය කරන තෙක් ඔවුහු එය රැකගත්හ. සවුද්වරු දිගට ම ප්‍රදේශාධිපතීන් ලෙස වැජඹෙති. ඉස්ලාම් සහෝදරත්වය (ඉක්වාන්) වහාබ්වාදයේ ප්‍රතිඵලයකි.

සවුද් පෙළපතේ අබ්දුල් අසීස් රණකාමියෙකි. ඔහු ක්වේට් ප්‍රදේශවලින් හිස්මී රියාද් නගරය අල්ලා ගනී. ඉන් පසු නජ් හා හාසා ප්‍රදේශ ද යටත්කර ගනී. (1913) අබ්දුල් අසීස් තව දුරටත් වහාබ්වාදියෙකි. මේ නිසා ගෝත්‍රික සමානාත්මතාවය ඔහු තදින් ක්‍රියාත්මක කරයි. යටත් කරගත් ප්‍රදේශවලින් අයබදු ගැනීම ද නතර කරයි. මෙයින් යටත් ප්‍රදේශවල ජනප්‍රියත්වයට පත්වේ.

වහාබ්ගේ උයයිනා සිට දිරියා දක්වා වූ ගමන මක්කමේ සිට මදීනා දක්වා මහමත්තුමා ගිය ගමනට සමාන ලෙස වහාබ්වාදීහු දකිති. එමෙන් ම සියල්ලන් සමානයින් කරන ඉක්වාන් සහෝදරත්වය ද ජනප්‍රිය වේ.

අබ්දුල් අසීස් ඉක්වාන් සමූහ ජනපද (හිජාර්) පිහිටුවයි. ඒවා සාමාන්‍යයෙන් මූලධර්මවාදීන් 2000 ක් පමණ පල්ලියක් වටා සමූහ ගොවිතැන හා වෙළඳමට එක් වීමෙන් ගොඩ නැගේ. ඉක්වාන්වරු ජිහාද් කරමින් නව ප්‍රදේශ අල්ලා ගනිමින්, නව ජනපද පිහිටුවමින් අරාබි අර්ධද්වීපයේ ව්‍යාප්ත වන්නට පටන් ගත්හ. අල්ලා ගත් දේපොළ වලින් 4/5 ක් ඔවුන් සන්තක වූ අතර, 1/5 ක් අබ්දුල් අසීස්ගේ මධ්‍යම රජයට දිය යුතු විය. (ෂරියා අනුව) 1920-22 අතර කාලය තුළ ක්‍රමයෙන් තම සංවිධාන ශක්තිය තර කරගන්නා අසීස් අසීර් ප්‍රාන්තය ද, හයිල් ප්‍රදේශය ද අල්ලාගෙන තමන් ''සුල්තාන්'' බව ප්‍රකාශ කරයි. ඔහු හිජාස් ප්‍රදේශය ද අල්ලා ගනී. එමඟින් මක්කම වන්දනාවේ එන අයගෙන් ආදායම උපයයි.

මක්කම අල්ලා ගැනීමේ අරමුණ ඇතියව අසීස් උලේමාව කැඳවයි. වහාබ් වරුන්ට මක්කම පාලනය ලැබිය යුතු බව එය ලවා ප්‍රකාශ කරවයි. 1924 ඔක්. අසීස් මක්කම අල්ලා ගනී. පසු ව මදීනාව ද යටත් කරගෙන 1926 දී ''රජු'' ලෙස අභිෂේක ලබයි. ෂරීෆ් හුසේන් පලා යයි.

මේ වන විට ඉක්වාන් ජනපද 222 ක් තුළ 1,50,000 කට අධික පිරිස් පදිංචි වී ඇත. ඔවුන් හා අසීස් අතර ප්‍රශ්න මතුවේ. ඒ ආදායම් නිසා ය. මුලදී ගෝත්‍රවලින් කොල්ලකාගත් දෙය බෙදාගත් නිසා ආදායම් ප්‍රශ්න පැන නොනැගිණි. එහෙත් ක්‍රමයෙන් අල්ලාගැනීමට ප්‍රදේශ අර්ධද්වීපයේ ගෝත්‍රවලින් විවාහයක් කරගත්තේ ය. ඔහුට බිරියන් 17 දෙනෙකු ද පුතුන් 54 දෙනෙකු ද, දියණියන් 215 ක් ලෙස දරුවන් 269 ක් විය. ඔහු ගෝත්‍රවලින් අයබදු ද නොගත් නිසා වන්දනා නඩවල ආදායමෙන් පමණක් යැපිය නොහැකි විය. මේ නිසා අසීස් දුම්කොළ බද්ද පනවයි. දුම්කොළ මත්ද්‍රව්‍යයක් නිසා එය වහාබි ඉස්ලාමයට එරෙහි බව ඉක්වාන් නායකයින් දෙදෙනෙකු වූ පයිසාල් දාවිෂ් හා ඉවෙන් හියුමයිද් 1926 දී කැරැලිකාරී ලෙස කියති. ඔවුන් තව දුරටත් කියන්නේ මුස්ලිමුන්ට බලයෙන් සුන්නි වහාබිවාදය උගන්වන ලෙසත් ය.

1927 දී මෙයට ප්‍රතිචාරයක් ලෙස අබ්දුල් අසීස් උලේමාවක් කැඳවා ෂියාවරුන්ට බලෙන් සුන්නි වහාබිවාදය ඉගෙන්වීමට කැමැත්ත ගනී. ඉක්වාන්වරු කලකිරවමින් අයබදු ගැන තීරණය අසීස්ට වාසිදායක ලෙස ලැබේ.

මේ වන විට ප්‍රදේශයේ යුද බලවතා බ්‍රිතාන්‍යය ය. රට තුළ ගැටුම් තීව්‍ර වන බව දක්වා ඔහු බ්‍රිතාන්‍යයේ සහාය පතයි. ඔහු නජ් ප්‍රදේශයේ රජු ලෙස බ්‍රිතාන්‍යය පිළිගනී. ඒ අතර අසීස් ඔවුන්ගේ ආරක්ෂාව යටතට පත් වේ. එතැනින් ලබාගත් ශක්තිය මත අසීස් තමා බලයට ගෙනා ඉක්වාන් මූලධර්මවාදය තහනම් කරයි. 1929 දී ඉක්වාන්වරු හා අසීස් අතර සටන් ඇති වේ. අසීස්ට නවීන බ්‍රිතාන්‍යය අවි ලැබේ. ඉක්වාන් නායකයින් (8000 ක් පමණ) ඝාතනය කර අසීස් ඔවුන් පරදවයි. මූලධර්මවාදයේ ගිණි අළු යට සැඟවේ.

1932 දී අබ්දුල් අසීස් සිය පාලන ප්‍රදේශ සියල්ල එක්කර එයට සවුදි අරාබිය ලෙස නම් තබා එහි රජ වෙයි. සවුදි අරාබිය ඇරැඹෙන්නේ එලෙස ය. පාරම්පරික රාජ්‍යයත්වයට මූලධර්මවාදයෙන් එන අභියෝගයට ඔහු දිගට ම මුහුණ දෙයි.

1938 දී දීර්ඝ ගවේෂණයකින් පසු කැලිෆෝනියානු සමාගමක් සවුදියේ ගසාහි තෙල් සොයා ගනිති. එයින් පසු සවුදියට ඇමරිකන් සමාගම් හා තෙල් ගලා එයි. අබ්දුල් අසීස් ඇමැති මණ්ඩලයක් හරහා රට පාලනය කරයි. 1953 දී ඔහු මිය යයි.

ඉන්පසු සවුද් ඉබන් අබ්දුල් අසීස් රජ වේ. 1960 දී නව මූලධාර්මික ව්‍යවස්ථාවක් ඔහු ගෙන එයි. එමඟින් ඉස්ලාමය රාජ්‍යයේ එක ම ආගම වෙයි. වෙනත් කිසි ම ආගමකට පන්සල් පල්ලි හෝ දේවාල පවත්වා ගැනීම තහනම් කරයි. ඇදහීම ද තහනම් වේ. ව්‍යවස්ථාදායක සභාවක් තනන අතර එයින් 1/3 ක් රජු නම් කරයි. ඉතිරි 2/3 පිරිමින්ගේ පමණක් ඡන්දයෙන් පත් කෙරේ.

ව්‍යවස්ථාදායකය තුළ ආගමික උලේමාවරු බලවත් වෙති. එබා මූලධාර්මික පයිසාල් කුමරු බලයට ගෙන ඒමට ඔවුන්ට අවශ්‍ය වේ. එවකට සවුදියේ ව්‍යාපාරික ප්‍රජාව මෙහෙයවන මොහොමඩ් බින්ලාදන් ද එයට එක් වේ. 1964 දී උලේමාවරු සවුද් වෙනුවට පයිසාල් රජ කරවති. මෙය මූලධාර්මවාදය ලත් මහත් ම ජයක් වෙයි.

මේ වන විට ඊජිප්තුවේ රාජවංශය අවසන් වී විප්ලවකාරී බාත්වාදය නසර් ස්ථාපිත කර තිබිණි. මේ නිසා සවුදියේ ද රජ පවුල විවේචනය වේ. මාලිගා තුළ දොරවල් වසාගෙන මත්පැන් බොමින්, නිරුවත් රංගන නරඹමින් රජ දරුවන් පිස්සු කෙළින බවට කට කතා පැතිරේ. උලේමාව ද රජ පවුලට එරෙහි ව නැඟී සිටිති. එවිට පයිසාල් කුමාරියන්ට පර්දාව අනිවාර්යය කරයි. කුමාරවරුන්ට යාඥාව අනිවාර්ය කරයි. මෙහි විශේෂත්වය වන්නේ මුත්තාවීන් නම් ආගමික පොලිසියක් ඇති කිරීම ය. ඔවුහු යාඥා අවස්ථාවල විවෘතකර ඇති කඩවලට පහර දෙති. වැඩිමනක් නොව ජපන් බෝනික්කන් පිළිම වන්දනාවයැයි කියා කුඩු කරති !

පයිසාල් කළ එක් වැදගත් නියමයක් වන්නේ කාන්තාවන්ට අධ්‍යාපනය ලබාදීමයි. ඉස්ලාමීය නීතියෙන් එය කලින් තහනම් කර තිබිණි. (සවුදියේ වැඩිහිටි කාන්තා සාක්ෂරතාව 68% ක් වී ඇත්තේ මේ නිසා ය. පකිස්ථානයේ එය 30% කි.)

1973 අරාබි - ඊශ්‍රායල් යුද්ධයේ දී පයිසාල් ඊශ්‍රායලයට උපකාර කළ රටවලට තෙල් සම්බාධක පනවයි. මෙයින් රට තුළ කරුණු දෙකක් සිදු වේ. එකක් තෙල් මිල තුන් ගුණයකින් වැඩිවීමෙන් ඩොලර් රටට ගලා ඒම ය. අනෙක් අරාබීන් අතර පයිසාල් වීරයෙකු වීම ය.

පයිසාල්ගේ මේ ක්‍රියාව නිසා ලෝක ආර්ථිකය අඩපණ වේ. ලංකාව ද එහි අහිතකර ප්‍රතිඵල භුක්ති විඳී. ලොව පුරා විප්ලවකාරී අසහනයක් පැතිර යයි.

එ. ජනපදය මෙයට උපක්‍රමයක් යොදයි. සම්බාධක පැනවීමට හැක්කේ කෙළින් ම එක් රටකින් (සවුදිය) තවත් රටකට (එ. ජනපදය) තෙල් විකිණීම නිසා ය. මේ නිසා සමාගම් හරහා තෙල් විකිණීම හා මිලදී ගැනීම එ. ජනපදය ආරම්භ කරයි. එමඟින් සවුදිය ප්‍රමුඛ ඔපෙක් (OPEC තෙල් නිපදවන රටවල්) රටවලට කළ හැක්කේ ලෝක වෙළඳ පොළට යවන තෙල් පාලනය කිරීම පමණි. එමඟින් විශේෂ රටකට නොව පොදුවේ ලෝක ආර්ථිකයට බලපෑමක් වෙයි.

1975 න් පසු සවුදියට තෙල් සල්ලි පෙට්‍රෝ ඩොලර් ගලා එයි. පයිසාල් 1970 - 75 පළමු පස් අවුරුදු සැලැස්මට බිලියන 8 ක් ද, 1975 - 80 දෙවැන්නට බිලියන 142 ක් ද යොදවයි. විදේශීය තාක්ෂණවේදීන් හා කම්කරුවන්ගෙන් සවුදිය පිරී යයි.

1975 වන විට සවුදි රජ පවුල 4000කින් පමණ සමන්විත විය. ඔවුන් සෘජු ව අබ්දුල් අසීස්ගේ දරුවන් 269 හා ඔහුගේ සොයුරියන්ගේ දරුවන් ය. මොවුහු සවුදියේ ප්‍රධාන ඇමති ධූරවලත්, හමුදා සේවාවවේ ප්‍රධාන නිලධාරීන් ලෙසත්, ඔත්තු සේවාවේත්, ව්‍යාපාරික ක්ෂේත්‍රයේත් රැඳී සිටිති. ඇත්තෙන් ම සවුදියේ පාලකයින් රජ කුමාරයින් පමණ ය.

රජ කුමාරවරුන් අතර රජකමට ගැටුම් ද ඇති විය. 1962 දී හලාල් කුමරු කුමන්ත්‍රණයක් කර ඊජිප්තුවට පලා යයි. 1965 අගෝස්තු කාලිද් ඉබන් මුසයිද් සවුදි රූපවාහිනිය ඉස්ලාමයට එරෙහි බව කියා එය වැනසීමට සන්නද්ධ කණ්ඩායමක් මෙහෙයවයි. ඔහු මරාදමනු ලැබේ. ඔහුගේ බාල සොයුරු පයිසල් ඉවන් මුසායිද් 1975 මාර්තු 26 ලේ වල පලිය ගනී. පයිසාල් ඝාතනය කෙරේ.

ඉන් පසු කාලිද් රජ වේ. ඔටුන්න හිමි කුමරු ලෙස පාද්ව නම් කරයි. එතැනින් ප්‍රවනතා දෙකක් මතුවේ. කාලිද් රජු හා අබ්දුල්ලා කුමරු ආර්ථික වර්ධන වේගය අඩු කර සංස්කෘතික පිබිදීමක් ද සිදු කළ යුතුය යි කියති. කාද් කුමරු වේගත් ආර්ථික වර්ධනයක් ඉල්ලයි. ඔහු එ. ජනපදයට සිතැති අයෙකි.

එ. ජනපදයේ භාණ්ඩාගාර බිල්පත් තොග ගණනින් ගනිමින් පාද් කුමරු ඩොලරය ඉහළ යවයි. එ. ජනපද හමුදා සවුදියට එති. (30,000 ක් පමණ) සවුදියේ සිසුහුද එ. ජනපදයට බටහිර අධ්‍යාපනය පිණිස යති. (1977 දී 15,000 ක්.) රට බටහිරකරණය වීම ගැන උද්ඝෝෂණ පැන නගී.

රාජ වංශයට එරෙහි උද්ඝෝෂණ තීව්‍ර වන්නේ ඉරානයේ සිදුවන මූලධර්මවාදී විප්ලවයත් සමඟ ය.

ඉස්ලාමයේ 15 වැනි සියවස ඇරැඹෙන 1979 නොවැම්බර් 20 දා මක්කමෙහි අල්කබා දේවස්ථානයේ ''විප්ලවයක්'' ඇති වේ. තමන් ඉක්වාන් (මුස්ලිම් සහෝදරත්වය යැයි කියා ගත් අවිගත් 400 කින් යුතු කණ්ඩායමක් ජුහයිමාන් ඉබන් සායිප් අලි උලයිබාගේ නායකත්වයෙන් දේවස්ථානයේ ද්වාර 40 වසා කැරැල්ලක් ගසති.

ජුහයිමාන් යනු 1929 දී සවුද් රාජ වාංශික අබ්දුල් අසීස් සමඟ සටන්කර මිය ගිය ඉක්වාන් මූලධර්මවාදියෙකුගේ මුනුබුරු ය. ජුහයිමාන් පසු ව විවෘත ව රජ පවුල විවේචනාව කළ උලේමා සාමාජිකයෙකු වූ අසීස් ඉබන් බස්ගේ අනුගාමිකයෙකි. ඔහුගේ ඉලක්කය වුණේ ශත සංවත්සරයට එන කාලිද් රජු අල්කබා දේවස්ථානය තුළ ම මරාදමා ඉස්ලාමීය රාජ්‍යයක් ප්‍රකාශයට පත් කිරීම ය. රජු පැමිණියේ නැත. නමුත් කැරැල්ල ක්‍රියාත්මක විය. පූජස්ථානය තුළ සිර වූ වන්දනාකරුවන් අමතා ජුහයිමාන් දේශනයක් කර සවුද් රාජ වංශය පෙරළා දමන ලෙස සැබෑ ඉස්ලාමිවරුන්ගෙන් ඉල්ලා සිටියේය.

උලේමාව ජුහයිමාන් මර්ධනය කිරීමට කාලිද්ට අවසර දුන්නේ ය. ඉස්ලාමීය විප්ලවය ඉල්ලූ ජුහයිමාවිට දේවස්ථානය තුළ වෙඩි ප්‍රහාර ලැබිණි. එකී ප්‍රහාරය මෙහෙය වූයේ කතෝලික ප්‍රංශ විශේෂ බලකාය විසින් විම විශේෂයකි. පකිස්ථානය ද හමුදා ආධාර දුන්නේ ය. ඉක්වාන්වරු ඝාතනය කරනු ලැබූහ. මෙයින් ඇති වූ බලපෑම අති මහත් ය. මෙයින් මූලධර්මවාදී කල්ලි (ජමන් අල් දාවා වැනි) තවදුරටත් ශක්තිමත් විය.

1982 මාර්තු මස සිට පාද් රජු (අද දක්වා) රජ වේ. ඔහු දැඩි බටහිරට ලැදි අයෙක් ලෙස ප්‍රචලිත ය.

කුමේනිගේ බලපෑම ද සවුදියට එල්ල වේ. ආගමික නිදහස ඉල්ලා ලක්ෂ 4 ෂියාවරු පෙළපාලි යති. 99 දෙනෙකු මරා දමා 6000 ක් සිරභාරයට ගෙන එය මර්දනය කෙරෙයි. සවුදිය තුළ සුන්නි දහම හැර අන් සියළු ඇදහීම් තහනම් ය. ආගමික නිදහස ඉල්ලන්නන්ට දඬුවම මරණය යි. මුළු ලොවේ ම ඉස්ලාම් ව්‍යාප්තියට හා මූලධර්මවාදයට අරමුදල් සපයන්නා බවට සවුදි ආරාබිය පත් වේ.


## ඉරානය

ඊජිප්තුව හැරුණු විට දීර්ඝතම ඉතිහාසයක් හා ශිෂ්ටාචාරයක් සහිත මුස්ලිම් රට ඉරානය යි. මෙය ආර්යයන්ගේ නිජබිම ලෙස සැලකේ. ඉන්දියාවටත්, රුසියාවටත්, යුරෝපයටත් ආර්යයන් සංක්‍රමණය වූයේ මෙහි සිට බවට ද විශ්වාස කෙරේ. සරතුෂ්ත දහම පිබිදී ගියේ ද, ඩේරියස්ගේ පර්සියානු අධිරාජ්‍යය බිහිවුණේ ද එහි ය. මේ සියළු අරුතින් ඉරානය නූතන ලෝකයේ ශිෂ්ටාචාරයට විශාලතම ආක්‍රමණික බලපෑම කළ ජන කණ්ඩායමේ නිජබිම ය. සිංහලයින් ද සිතන්නේ ඔවුන් ආර්ය පරපුරෙන් පැවත එන්නන් බව ය. සිංහබාහු - සිංහ සීවලී වැනි කතාපුවතක් පර්සියාවේ ලෙන්වල කොටා ඇත. නිසැකව ම සිංහල භාෂාවට හා සංස්කෘතියට සෘජු ආර්ය බලපෑමක් ඇත.

කෙසේ වෙතත් අද ඉරානයේ ආගම ඉස්ලාම් ය. එය සුළුතර ෂියා නිකායේ පදනම් රාජ්‍යය යි. 1999 දී ඉරානයේ ජනගහණය මිලියන 69.2 ක් විය. 2015 දී එය මිලියන 87.1 ක් ලෙස වනු ඇතැයි විශ්වාස කෙරේ. එහි ඒක පුද්ගල ආදායම ඩොලර් 5531 කි. (PPP) එය පසුගිය 1990 - 99 කාලය තුළ 1.9% ක වේගයෙන් වැඩි විය. මානව සංවර්ධන දර්ශකය (HDI) අනුව එයට හිමිවී තිබෙන්නේ ලොවේ 90 වැනි ස්ථානය යි. අරාබි නොවුණු මුස්ලිමුන්ගේ හද බිම ද ඉරානය යි.

ඉස්ලාමයේ සුළුතරය වුවත් ෂියාවරු ඉස්ලාමයේ රැඩිකල් අධ්‍යාත්මික මුහුණුවර තැනීමේ දී මෙන් ම එය පවත්වා ගැනීමේදී ද බලවත් මෙහෙයක් කළහ. උම්මායාද් පරාජය කිරීම සඳහා ෂියාවරු මහත් මෙහෙයක් කළහ. අන්තිමේ දී අබ්බාසිද් වරුන්ට අභියෝග කරන්නේ ද ෂියාවරුන් ය. (ඉස්මයිල් වරු) පසුව ෂියා පාතිමාද්වරු කයිරෝවේ කලිපාතයක් ද පිහිටවූහ. එය බිඳ දමන්නේ සලාදීන් ය.

මොංගෝලියානු ප්‍රහාරවලින් අඩපණ වූ ඉස්ලාමීය ජනතාව පුනරුත්ථාපනය සඳහා අලාමා ජමල් යුසුප් ඉල් හිලි (1250-1325) ක්‍රියාත්මක වේ. ඔහු ෂියා බුද්ධිමතෙකු ලෙස සැලකේ. ඉරානය තිමූර් ලන්ග් (1336-1405) අධිරාජ්‍යයට ඈඳා ගනියි. සුන්නිවාදියෙකු වූ ෂාරුඅක් මිය යෑමෙන් පසු අධිරාජ්‍යය විසිරී යයි. (1447) ඉන්පසු සුන්නි සෆාවිද්වරු ඉරානය පාලනය කරති. ඔවුන්ගේ බලවත් ම රජ වූ ෂා ඉස්මයිල් කාබුල් සිට බැග්ඩෑගය දක්වා පාලනය ගෙන ගියේ ය. පසුව සෆාවිද් වැන්ට සුන්නි ඔටෝමානයෙන් යුද දේශපාලන අභියෝග එයි. එයට උපක්‍රමයක් ලෙස



අයතුල්ලා කුමේනි



අයතුල්ලා කුමේනි විප්ලවයෙන් පසු

බහුතර ඉරානුවන්ගේ සිත් ගැනීමට ෂියා දොළොස්වාදය හඳුන්වා දෙයි. ෂා අබ්බාස්ගේ කාලයේ මෙය ඉහළ ම තලයේ වැජඹුණේ ය.(1587-1629)

ඔටෝමාන්වරු 1638 දී ඉරානය සෆාවිද්වරුන්ගෙන් අල්ලා ගනී. ඉන්පසු ක්වජාර්ස්වරු ඉරානය පාලනය කරති. මේ කාලයේ දී ආගම හා රාජ්‍යය දුරස් වෙයි. උලේමාවරුන්ගේ කාර්යය අධ්‍යයනය, කුරානය තෝරාදීම වැනි බුද්ධිමය උපදෙස් සේවාවන්ට සීමා වේ. මෙය පසුව ෂියා සම්ප්‍රදායක් වේ.

රුසියාවේ සාර් හා බ්‍රිතාන්‍යය ඉරානයට බැල්ම හෙළයි. 1891 දී ඉරාන පාලනයට එරෙහිව ජනයා කැරලි ගසති. මෙයට එක් හේතුවක් වුණේ ඉස්ලාමීය නොවන දුම්කොළ බදු බ්‍රිතාන්‍යයට ගෙවීම යි. ඉන්පසු උලේමාව ක්‍රියාත්මක වේ. ඉස්ලාම් ව්‍යවස්ථාවක් අවශ්‍යය බවට හඬ නැඟේ. පාලක ඉමාම් කෙනෙකු නැතිවිට ව්‍යවස්ථාවක් අවශ්‍ය බව කියැවේ. මෙයට එක් හේතුවක් වන්නේ අන් රටවලට වඩා ඉරානයේ උගතුන් සිටීමය. විවිධ මත භේද මත ලිඛිත ව්‍යවස්ථාවක් 1906 දී එළිදකී. එය ඇත්තෙන් ම මූලධර්මවාදයේ ජයග්‍රාහී විප්ලවයක් වෙයි.

ව්‍යවස්ථාවේ පළමු වගන්තිය අනුව ජපාරි දොළොස් ෂියාවාදය එක ම රාජ්‍ය ආගම වෙයි. රජු, ඇමති හෝ විනිසුරෙකු විය හැක්කේ ද ඒ නිකායට අයත් අයට පමණකි. රජු හා රජය විසින් ආගම රැකගත යුතු බව ද කියැවිණි.

(39.) පරමාධිපත්‍යය දෙවියන් විසින් ජනතාවටත් එතැනින් රජුටත් පවරන ලදී. පාර්ලිමේන්තුවක් පිහිටු වේ. එහි සම්මත වන කිසි පනතක් උත්තරීතර උලේමා සභාව (20 දෙනයි මුජතාහිද්) විසින් ඉස්ලාමයට පටහැනි යැයි කීවොත් අනුමත නොවේ. එයට නිෂේධ බලය ඇත.

මෙය රජ පවුලට හිතකර නොවී ය. 1909 දී මොහොමද් අලි ෂා 1909 - 7 ව්‍යවස්ථාවට එරෙහිව නැඟී සිටියේ ය. උලේමාව ඔහු පරාජය කර බලයෙන් නෙරපා ඔහුගේ 12 හැවිරිදි පුතා අහමද් ෂා රජ කළේය. උපේමාව නියම රාජ්‍යයත්වය ඉසුලූහ.

පළමු ලෝක යුද්ධයේ දී ඔටෝමාන් තුර්කිය, රුසියාව, බ්‍රිතාන්‍යය යන රටවල් ඉරානය ආක්‍රමණය කරයි. රුසියාවේ ඇති වූ බෝල්ෂෙවික් විප්ලවය ඉරානයට තදින් දැනිණ.

කොසැක් බ්‍රිගේඩියර් කර්නල් රේසාඛාන් කුමන්ත්‍රණයකින් ආරක්ෂක ඇමති වේ. 1921 පෙබරවාරියේ රේසාඛාන් ඔහුට එරෙහි බලවේග පරාජය කරයි. ඔහු අගමැති වේ. 1925 දෙසැම්බරයේ ඔහු ක්වාජර් රජු අහමද් ෂා ඉවත්කර තමා ම රජකරවා ගනී. ඉනික්බිති ඔහු සියළු දෙනාට ම පැරණි ඉරාන නම් ගැනීම අනිවාර්ය කරයි. තෙමේ පැරණි පලාවි නම් පෙලපත් නාමය ගෙන රේසා පලාවි ෂා ලෙස ඉරානයේ රජ වේ.

1928 දී ඔහු උලේමාව හා මූලධර්මවාදය කෝපයට පත්කරයි. ඒ පිරිමින්ට බටහිර ඇඳුම නියම කිරීමෙනි. 1934 දී ඔහු කාන්තාවන්ට පොදු ස්ථාන විවෘත කරයි. 1935 දී ඔහු පර්දාව ඉවතට දමයි. ''කුරානය කියන්නේ ''කතුන් බිම බලාගෙන ගමනේ යෙදිය යුතු බවයි. සිය ස්වාමියා හැර අන් අයගෙන් සිය මුහුණ හා අඟපසඟ ප්‍රදර්ශනයෙන් වැළකිය යුතු බවයි...'' මෙයින් උලේමාව කෝපයට පත්විය. ඔවුන්ගේ කෝපය නිම්හිම් නැතිවුණේ ෂා පිරිමින්ට යුරෝපීය තොප්පිය පැළඳීම නියම කළ විට ය.!

පාර්ලිමේන්තුවේ (මජ්ලිස්) 1926 දී 40% ක් උලේමාවරු සිටියහ. 1938 දී එහි කිසිවෙක් සිටයේ නැත. රජ වේගයෙන් ඉරානය බටහිරකරණය කළේ ය. මෙයට එරෙහි වුණේ සුළු වෙළෙන්දන්, වෙළෙන්දන්, ගම්බද ගොවීන් හා කඳුකර ගෝත්‍රිකයන් පමණි.

රේසා ෂාට තවත් විරුද්ධත්වයක් එන්නේ ආර්ය පදනම මත ඔහු ජර්මනියට සහාය දෙතැයි යන බ්‍රිතාන්‍යය හා රුසියානු බිය නිසා ය. ඔවුන් එක් වී රේසා ෂා පහකොට ඔහුගේ පුත් මොහොමද් 1941 බලයට ගෙන එයි. පීඩාවට පත් ව සිටි උලේමාව ද මූලධර්මවාදය ද එයට සතුටු වේ.

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු උලේමාව මුස්ලිම් තොප්පිය හා පර්දාව ගෙන ඒමට උද්ඝෝෂණය කරති. පර්දාව නොපළඳින කාන්තාවන්ට ප්‍රහාර එල්ල වේ. මෙයට අයතොල්ලා බෙහාබානි නායකත්වය දෙයි. 1946 සිට එය ක්‍රියාත්මක වේ.

ලොවු පුරා යටත් විජිත ජාතීන්ගේ නැගටීම සමඟ ඉරානය ද පිබිදේ. අයතොල්ලා ක්වාසිම් කෂානි මුජෙහිදීන් ඉස්ලාම් (1948) පිහිටුවයි. එහි අරමුණ ෂරියා සහිත ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීම ය. 1949 පෙබරවාරි 04 දා පුවත්පත් ඡායාරූප ශිල්පියෙකු ලෙස වෙස්වලාගත් මූලධර්මවාදී ඝාතකයෙක් ෂා ඝාතනයට තැත් කරයි. ෂා රජ මූලධර්මවාදය මර්දනය කරයි.

එහෙත් ඉරානයේ නැගෙන උද්ඝෝෂණය තෙල් සම්පත වෙත හැරෙයි. තෙල් සම්පත් බ්‍රිතාන්‍යයෙන් (Anglo-Iranian Oil Company -AIOC) ජනසතු කරන ලෙස බල කිරීමට කෂානි මුල් වේ. කුරානයේ එන "මුස්ලිම්වරුන් නොතකන්නා මුස්ලිම්වරයෙකු නොවේ", යන සටන් පාඨය යටතේ එය ඉදිරිපත් වේ. අනාගමික (මාක්ස්වාදී - ප්‍රජාතන්ත්‍රවාදී) බලවේග ද මෙයට එක් වෙති. මෙයින් නැගෙන රැල්ල කෙළවර වන්නේ බටහිර විරෝධියෙකු වන මුසාදික් ඉරානයේ අගමැති වීමෙනි. 1951 මැයි 1 දා තෙල් සමාගම් ජනසතු වේ.

සයිද් නවාබ් සෆාවි 1945 දී ෆේඩයින් (Fedayian) ව්‍යාපාරය බිහි කරයි. එය මුලින්ම ආගමික මෙන් ම අනාගමික ඉල්ලීම් ද කැටිකරගත් සන්නද්ධ සටන්කාමී සංවිධානයක් වේ. එය දුම්කොළ, මත්පැන්, මත්ද්‍රව්‍ය, සිනමාව හා බටහිර ඇඳුම් හා චාරිත්‍ර තහනම් කිරීමට බල කරයි. ඉඩම් ජනසතුවක් හා ප්‍රතිසංස්කරණයක් ද, විදේශික දේපොළ ජනසතුවක් ද ඉල්ලයි. සමාජවාදයේ රළ වේගය මත සිඳිමින් සමාජ සාධාරණත්වය ද ඉල්ලයි. පුද්ගල ඝාතන අරඹයි. අධිකරණ ඇමති පවා ඝාතනය කෙරේ.පසු ව ෆේඩයින් ව්‍යාපාරය වැඩි වැඩියෙන් වාමාංශික ප්‍රවනතාවයක් බවට පත්වේ.

එක්සත් ජනපදය ඉරානයට සෘජු ව මැදිහත් වේ. මුලින් ඉරානයට සම්බාධක පනවන ඔවුහු පසුව CIA මගින් සෘජු කුමන්ත්‍රණයක් කර මුසාදික් රජය පෙරළා දමති. මෙයට සහාය දුන් බවට අයතුල්ලා බෙහාබහාන්ට චෝදනා නැගේ. 1954 සිට තෙල් සම්පත යළි එ. ජනපදයට හා බටහිරට යයි. ෆේඩයින්වරු CIA අගමැති හුසේන් ඝාතනයට තැත් කරයි. ෂා රජු ඔවුන් මර්දනය කරයි. පසුව අගමැතිකමට එ. ජනපද ජනාධිපති කෙනෙඩිගේ මිතුරෙකු වන අලි අමීන් පත්වේ. (1961)

උලේමාව බෙදේ. සම්ප්‍රදායික බලවේග ෂා රජු සමඟ සිටිති. රැඩිකල් බලවේග ෂා රජුට හා වැඩියෙන් බටහිරට එරෙහි ව සිටිති. මධ්‍යස්ථ පිරිසක්ද ඇතිවේ.

පුද්ගලික දේපොළ හිමිකර ගැනීමට කුරානයට ඉඩ දී ඇති නිසා ජනතාව ජනසතුව ගැන වාද විවාද ඇතිවේ. මෙය මේ යුගයේ ඉස්ලාමයේ පැන නැගුණු තීරක ප්‍රශ්නයකි. මෙයට පිළිතුරක් දෙන දාර්ශනික ක්වාටබ් කියන්නේ ඉස්ලාම් සමාජය ධනවාදී හෝ කොමියුනිස්වාදී නොවන බව ය. එයින් දේපොළවල පුද්ගලික අයිතිය පිළිගන්නා අතර පුද්ගලයින්ගේ දානය ද (සකාට්) මුස්ලිම් ජන සමාජයට අයත් පිටස්තරයින්ගේ අයිතියේ පවතින

දේපොළ ද අයිති කර ගැනීමට හැකි බව කියැවේ. හොජාටොලිස්ලාම් රූහුල්ලා කුමේනි මතු වන්නේ මෙතැනිනි.

ෂා රජු බලපෑම් ඉදිරියේ ධවල ප්‍රකාශය නමින් ප්‍රතිසංස්කරණ පැකේජයක් ඉදිරිපත් කරයි. එමගින් ඉඩම් ප්‍රතිසංස්කරණයටත්, රජය සතු කර්මාන්ත පුද්ගලීකරණයත්, කාන්තාවන්ට ඡන්දයත්, කර්මාන්තශාලාවල ලාභාංශ කම්කරුවන්ට බෙදීමත්, නූගත්කම ඉවත් කිරීමත් ආදිය ඇතුළත් වේ. මෙයට ජනමතයේ දී 99.9% ක සහාය ලැබේ.

කුමේනි මෙයට ද විරෝධය පායි. ප්‍රතිසංස්කරණවල පදනම ඉස්ලාම් විරෝධය යැයි ඔහු කියයි. ඔහු එය ''කළු විරෝධය'' ලෙස ප්‍රකාශ කරයි. එතැනින් නොනවතින ඔහු ෂා රජු ''යුදෙව්වෙකු''ලෙස ප්‍රකාශ කරයි. මෙයින් කුමේනි එක රැයින් ෂා විරෝධීන් අතර වීරයෙකු වේ. කෝපයට පත් ෂා රජු කුමේනි අත්අඩංගුවට ගනී. දහස් ගණන් ජනයා වීදිවලට බසිති. ෂා ඔවුන්ට වෙඩි තබයි. 10,000 ක් පමණ මිය යති. ෂාට එරෙහි ව මූලධර්මවාදීහු 'ජිහාද්' ප්‍රකාශ කරති. පසු ව කුමේනි තුර්කියට පිටුවහල් කෙරේ.

කුමේනි කීවේ ''පුනර්ජීවන ව්‍යාපාරයක් ජනතාව අවදි කළ යුතු ය. පීඩනයට එරෙහිව ඔවුන් පෙළ ගැස්විය යුතු ය. ඔවුන් පසු නොබසින බලයක් කළ යුතු ය'' ලෙස ය. ඉරානයේ මූලධර්මවාදීන් ද, පොදුවේ ෂා විරෝධීන් ද ඉල්ලා සිටි එඩිතර නායකයා ඔවුන්ට ලැබේ. ජ්‍යෙෂ්ඨ උලේමාවරු කොතෙකුත් සිටිය ද කුමේනිගේ කුරාන දැනුම ද, ෂරියා නීති දැනුම ද, ආගමික ජීවිතය ද නිසා ෂියා මුස්ලිමුන් ඔහු 'ඉමාම්' තත්ත්වයට පත් කරති. ෂාගේ පීඩනය දැඩි වන්නට වන්නට ඉරාන ජනයා 'ඇතුළට' හැරෙති. ඔවුන් පුදුමාකාර ලෙස ඇතුළට හැරෙති. ආගමික වෙති. බටහිර කරණයෙන් ඈත් වෙති.

ජිමී කාටර් එක්සත් ජනපදයේ ජනාධිපති වීමත් සමග මානව හිමිකම් කඩන පාලකයින්ට අනතුරු අඟවයි. කලබල වන ෂා දේශපාලන සිරකරුවන් නිදහස් කරයි. එයින් සිදු වන්නේ වක්කඩ කැඩුවා සේ ෂා විරෝධී විප්ලවය ඇරඹීම ය. කුමේනි ප්‍රංශයේ සිට එය මෙහෙයවයි.

1977 දී ශිෂ්‍ය පෙලපාලිවලින් විප්ලවය ඇරඹේ. සිකුරාදා දිනවල ද හජ්ජි කාලයේ ද කුමේනිගේ පටිගත කරන ලද කතා දේවස්ථානවල රැව් පිළිරැව් දේ. කම්කරුවෝ සටනට මහා වැඩ වර්ජන ගෙන එති. ඉස්ලාම් මුජෙහිඩීන්වරුන් ද වාමාංශික ජේඩයින්වරුන් ද සන්නද්ධ ප්‍රහාර එල්ල

කරති. ආගමික නායකයෙකුගේ අවමඟුල් උළෙලකට සහභාගි වූ ජනකායකට වෙඩි තැබීමත් සමඟ අරගලය ප්‍රචණ්ඩ වේ. සියල්ල හමුදාව අතට පත්වේ. කුමේනි මෙහිදී උපක්‍රමයක් අනුගමනය කරයි. මුලදී ම ඔහු කෘතීන් දෙකක් ලියා අනාගත ඉරානය ඉස්ලාමීය නීතිය යටතේ පාලනය වීම ද ඉස්ලාමීය සමාජ ක්‍රමය පිළිබඳව ද අදහස් පළකර පිළිබඳව ද අදහස් පළකර තිබිණි. එහෙත් ඔහු ප්‍රජාතන්ත්‍රවාදය කාන්තා අයිතිය, ගොවි ප්‍රතිසංස්කරණ උලේමාවරුන්ගේ කාර්යභාරය වැනි මතභේදකාරී කරුණු මඟහැර සියල්ල ෂා විරෝධයට උණනය කරයි. ඒ ඔහු හමුදාවෙහි ඇතුළට කතා කරයි. ජනතාවට වෙඩි තබන්නා කුරානයට ද වෙඩි තබන්නෙකු බව ප්‍රකාශ කරයි.

1978 සැප්තැම්බර් මුල දී ටෙහරානයේ සිකුරාදා දේව මෙහෙයන්ගෙන් පසු පැවැත් වූ ජන පෙළපාලිවලට දසලක්ෂ ගණන් සහභාගි වෙති. එයට වෙඩි තැබීමෙන් 4000 ක් පමණ මිය යති. එවිට අරගලය උච්ඡස්ථානයකට පත් වේ.

1979 ජනවාරි 16 දා ෂා රටින් පලා යයි. ෂාපූර් භක්තියාර් ආණ්ඩුව පෙබරවාරි 11 දා ඇද වැටේ. කුමේනි සිය රටට යයි. ඉස්ලාමීය ජන රජයක් වීම සඳහා ඔහු ජනමතයක් කැඳවයි. 98.2% එයට පක්ෂව ඡන්දය දෙති. 1979 අප්‍රේල් 1 දා කුමේනි කියන්නේ දෙවියන්ගේ රාජ්‍යයේ පළමු දිනය ඇරඹුණු බව ය.

ඉරානයේ ෂා විරෝධි අරගලය පැවතුණු කාලයේ කුමේනි අත් පොත් දෙකක් ලිව් ය. එකක් Hukumat-e-Imlami සහ Vilayat-e-Faqih ලෙසයි. මේ මගින් ඔහු ඉරානයට ලෞකික නායකයකු වන රජෙකු නොව අවශ්‍ය වන්නේ නීතිය, සමාජය, යුද්ධය ආදි සියල්ල පිළිබඳව ම තීන්දු ගතහැකි අධ්‍යාත්මික උත්රීතර නායකත්වයක් (ෆාකි) බව පෙන්නා දුන්නේ ය. එහෙත් ෂා විරෝධි අරගලයට එක් වූ ඇතැමුනට අවශය වුණේ අනාගමික පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයක් (ලිබරල්) ඇති කර ගැනීම ය. ඇතමුනට නිර්ධන පන්ති ආඥාදායකත්වයක් (මාක්ස්වාදි) අවශ්‍ය විය. අරාබි, තුර්කි, බලුකිස්, තුර්ක්මානු ආදි ජනවර්ගවලට ෆෙඩරල් ව්‍යවස්ථාවක් අවශ්‍ය ව තිබිණ.

වැඩිකල් නොගොස් ජනයා අදහස්වලින් අවුල් කිරීමට බටහිර බලවතුන් ද, සවුදිය වැනි රාජවංශයන් ද සෝවියට් දේශය ද ක්‍රියාකරනු ඇතැයි බියපත් වූ කුමේනි වේගයෙන් ක්‍රියා කළේ ය. අප්‍රේල් මස ව්‍යවස්ථා කෙටුම්පතක් ආ අතර අගෝස්තුවේ දි ව්‍යවස්ථාව හා නීතිය පිළිබඳ කටයුතු කිරීමට වියත් ව්‍යවස්ථාදායක සභාවක් (73 දෙනෙකු) මැතිවරණයකින් පත් කෙරිණි. කුමේනිගේ ඉස්ලාමයීය ජනරජයට පක්ෂව (IRP) එහි තුනෙන් දෙකක බලය හිමිවිය. ඒ හා සමඟ ම නව ව්‍යවස්ථාව එළි දැක්විණි.

නව ව්‍යවස්ථාවට අනුව දොළොස් ෂියා (ජෆාරි) ආගම රාජ්‍ය ආගම විය. මුළු රටට ම උත්තරීතර නායකත්වයක් ලැබිණි. (ෆාකී) එම වදනේ අරුතින් ම ව්‍යවස්ථාදායක හා විධායක දෙකෙහි ම ප්‍රධානියා විය. ජනාධිපති ඡන්දයෙන් පත් කරන අතර ඔහු ෂියා පිරිමියෙකු විය යුතු බව අවධාරණය කෙරිණි. අගමැති ද ෂියා පිරිමියෙකු වේ. පාර්ලිමේන්තුවක් පවතින අතර (270) ජනාධිපති එය හරහා විධායකය හා නීතිය ක්‍රියාත්මක කරයි. ෂරියා නීතිය අනුව අධිකරණ පද්ධතියක් බිහිවිය. ප්‍රකාශනයේ නිදහස හා පක්ෂ දේශපාලනයට ඉඩ ලැබුණු නමුත් ඒ කිසිවක් ඉස්ලාමීය නීතියට හෝ සම්ප්‍රදායට පටහැනි නොවිය යුතු බව අවධාරණය විය. (24 වැනි වගන්තිය)

ව්‍යවස්ථාව සම්මත කළ කුමේනි කළ ප්‍රථම දෙය ඉරානයේ උත්තරීතර නායකයා බවට පත් වීම ය. ඊළඟට ඔහු ජෙඩයින් ඊ වැනි මාක්ස්වාදි සංවිධාන තහනම් කළේ ය.

මේ අතර එ. ජනපදය ප්‍රතිවිප්ලවය සඳහා සූදානම් විය. ඔවුනට හිතවාදිව සිටි හමුදා නිලධාරීන් හා ව්‍යාපාරිකයක් සියළු දෙනාම පාහේ එක්කෝ මරාදමා නැතිනම් රට හැර ගොස් තිබිණි. ඉරානය ආක්‍රමණය කිරීමට එ. ජනපදය සැරසෙන බවට ප්‍රචාර පළවිය. 1979 නොවැම්බර් 4 දා ටෙහෙරාන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ එ. ජනපද තානාපති කාර්යාලයට ගොස් එහි නිලධාරීන් 54 ක් (CIA මෙහෙයුම්කරුවන් ද ඇතුළුව) ප්‍රාණ ඇපයට ගත්හ. දශ ලක්ෂයක් සිසුහු කළු ඇඳගෙන පාරවල්වලට පැමිණ බෝම්බ දමන ලෙස එ. ජනපදයට අභියෝග කළෝ ය. ප්‍රාණ ඇපකරු සිද්ධිය කෙළවර වුණේ ඔවුන් නිදහස් වීමෙන් පමණක් නොවේ. එ. ජනපදයේ දේපොළ ජනසතුවීමෙන් හෝ එරටට ආපසු ගෙන යාමෙනි. එ. ජනපදය වියට්නාමයේ දි හා නිකරගුවාවේදි ලත් පරාජයෙන් පසු නින්දිතම ම පරාජයක් ඉරානයේ දි මෙසේ අත්පත් කර ගත්තේ ය.

1980 සැප්තැම්බර් 22 දා ඉරාකයේ - සදාම් හුසේන් - ඉරානය ආක්‍රමණ කළේ ය. ඉරාකය මේ සඳහා පෙළඹ වූ හේතු ගණනක් විය.

1. ඉරානයේ අයතුල්ලා විසින් ඉරාකයේ අනාගමික බාත්වාදය පරාජය කිරීම සඳහා ගෙන ගිය විවෘත අරගලය - ඉරාකයේ බහුතරය ෂියා මුස්ලිමුන් ය (57%)

2. ඉරාන පාලනය දුර්වල වී ඇතැයි හුසේන් සිතීම, කුර්දිස්ථානයේ ප්‍රාන්තයේ ඇති වූ ගැටීම, ඉරාක පාලක (IRP) පක්ෂය හා ජනාධිපති බානිසද්ර් අතර ගැටුම, මාක්ස්වාදීන්ගේ ගරිල්ලා ප්‍රහාර හා ලිබරල්වාදීන්ට එල්ල වූ හිරිහැර ආදිය.

3. එ. ජනපදයට ඉරානය සෘජුව ආක්‍රමණය කළ නොහැකි නිසා ඔවුනට පහර දෙන ලෙස සදාම්ට වක්‍ර ආකාරයෙන් ප්‍රකාශ කිරීම, බ්‍රිතාන්‍ය විසින් ඔහුට රසායනික අවි සපයන ලදී.

මුලදී සදාම්ගේ ජනරජ හමුදා ජය ලබමින් ඉරානයේ ප්‍රදේශ අල්ලා ගන්නා ලදී. නමුත් බොහෝ පමා වී ඉරාන මූලධර්මවාදී ප්‍රතික්‍රියාව ද ඇතිවිය. ඉරාකය වෙනත් රටවල දීද තම හිතවත් පක්ෂ හරහා ඉරාන දේපළවලට පහර දුන්නේ ය. ලංකාවේදී ද ඉරාන නැවක් එලෙස ගිනි තබන ලදී. මෙයට ජවිපෙ සැක කෙරිණි. (1981)

බානි සදර් හා ජනරජ පක්ෂය (IRP) අතර ගැටුම් උත්සන්න වූ විට කුමේනි බානි සදර් නෙරපයි. පසුව IRP ප්‍රධාන ලේකම් බවට කුමේනි පත් වේ. මූලධර්මවාදීන් තවදුරටත් ශක්තිමත් වේ. මේ අතර 1980 සැප්තැම්බරයේ දි කුමේනි හා උත්තරීතර සභාව රොකට් ප්‍රහාරවලින් ඝාතනය කිරීමේ උත්සාහයක් (අහමද් අබසායි) දැරෙයි. මුජාහිදීන් හා ජේඩයින් ඊ කාග් වැනි මාක්ස්වාදී ගරිල්ලන් ද එයට උත්සාහ කරති. (1982) තුඩේ පක්ෂය ද කුමේනි තහනම් කරයි. (1983) මේ හා සමඟ ම කුමේනි ප්‍රතිසංස්කරණ වේගවත් කරයි.

1980 දි ජූනිවලදී මාක්ස්වාදය, ලිබරල්වාදය වැනි බටහිර දර්ශනයන් ඉගැන් වූ සියළු විශ්ව විද්‍යාල වසා දමා ගුරුවරුන් ගෙදර යවන ලදහ.

මත්ද්‍රව්‍ය ගෙන එන්නන්ට මරණ දණ්ඩනය නියම කරන ලදී. (1980 මැයි -ජූලි අතර 200 ක් අත පය කපා ඝාතනය කරන ලදහ.)

1983 දී පොලී නැති ඉස්ලාමීය බැංකු පිහිටුවන ලදී. පොලී විරහිත ව මෙකී බැංකු වත්මන් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන්නේ අපූරු ආකාරයකට ය. මෙය පසුව සුන්නි රටවල ද ක්‍රියාත්මක විය. ඔවුහු ෂරියාත් නීතියට එකඟ ව ක්‍රම කිහිපයකය මුදල් තැන්පත් කරන හා බැංකුවෙන් ණයට ගන්නා පාරිභෝගිකයා හා ක්‍රියා කරයි. ආයෝජන මෙසේ ය.

1. මුදා බාරා - ආයෝජකයාට මුදල් ලබා දෙයි. ඔහු එය යොදවන්නේ බැංකුව සමඟ හවුල් ව්‍යාපාරයක් ලෙස ය. ලාභය හා පාඩුව බෙදා ගනී.
2. ක්‍රිඩ් අල් හස්නාහ් දුගියන් සඳහා පොලී විරහිත ණය ලබාදේ.
3. මුෂරාකා ණය ගන්නා බැංකුවේ කොටස්කරුවකු වේ.
4. මුරබාහා බැංකුව ම ගැනීම්-විකිණීම් කරමින් තැන්පත් මුදල් ආයෝජනය කරයි.
5. ඉජාරා කල්බදු ක්‍රමයට දේපොළ මිලදී ගෙන පාරිභෝගිකයාට කුලියට ලබාදේ.

තැන්පතු මෙසේ ය.

1. ජංගම පොලී නැත. ඕනෑම වේලාවක ආපසු ගත හැක.
2. මුදබාරා I අයිතිකරුගේ මුදල් බැංකුව ආයෝජනය කරයි. ලාභ පාඩු විඳ ගත යුතු ය. (වරක් හමාස් ව්‍යාපාරය අල් ටක්වා බැංකුව සමඟ කළ මෙවැනි තැන්පතුවකින් බරපතල පාඩුවක් විඳ ගත්තේ ය.)
3. මුදරාබා II බැංකුව හා තැන්පත්කරු දෙදෙනා ම එක්වී හවුලේ ආයෝජනය කරති. ලාභ අලාභ බෙදා ගනී.

වත්මන් බටහිර බැංකු ක්‍රමයේ දී ආයෝජක - තැන්පත්කරු හා බැංකු අතර පවතින්නේ යාන්ත්‍රික සම්බන්ධයකි. ප්‍රාග්ධන වෙළෙඳ පොල සඳහා එය අවශ්‍ය බව බටහිර ආර්ථික විද්වත්හු නිතර කියති. මේ සඳහා බැංකුවේ කාර්යය ද යාන්ත්‍රික ය. නමුත් ඉස්ලාමීය බැංකු, තැන්පත්කරුවන්

හා ආයෝජනය සමඟ සාමූහික ලෙස බැඳී තිබේ. බැංකුව ම මුදල් හා වෙළෙඳ පොළේ ඇත. විශේෂයෙන් දුගී රටවලට අවශ්‍ය එවැනි සාමූහික බැංකු ක්‍රමයකි.

අයතුල්ලා මොන්ටසාරි ලෝකය පුරා ෂියා ඉස්ලාමීය ව්‍යාපාරවලට පුහුණුව හා ආධාර ලබාදේ. ලෙබනනයේ හිස්බුල්ලා හා අල්ලාගේ පක්ෂය, ඉරාකයේ හා කුවේටයේ අල්දාවා, බහරේන් (එහි 60 %ක් ෂියාවරුන්, නමුත් පාලනය සුන්නි) ඉස්ලාමීය විමුක්ති පෙරමුණ, සවුදියේ ඉස්ලාමීය විප්ලවීය සංවාධිනය හා ඇෆ්ගනිස්ථානයේ මුජාහිදින් කල්ලි එයට ඇතුළත් විය. මේ මෑතදී (CIA) එ. ජනපද ඔත්තු සේවා ප්‍රධානියෙකු ප්‍රකාශ කළේ ලොව පුරා එ. ජනපදිකයන් හා එයට හිතවාදී ව සිටියවුන් අඩුම තරමින් 4000 කගේ මරණවලට සෘජු ව ඉරාන ඔත්තු සේවාවලින් යැපෙන මූලධර්මවාදීන් වගකිව යුතු බව ය. සෝවියට් දේශය බිඳ වැටෙද්දී න්‍යෂ්ටික විද්‍යාඥයන් වැඩිම පිරිසක් පලාගිය රටවල් නම් ඉන්දියාව, චීනය, පකිස්ථානය හා ඉරානයයි. හිටපු සෝවියට් විද්‍යාඥයන් ඉන්දියාවට හා පාකිස්ථානයට මහා පරිමාණයෙන් න්‍යෂ්ටික තාක්ෂණය ලබාදුන් ලෙසට ම ඉරානයට ද ලබා දී ඇති බවට සැකයක් ඇත.

මෙලෙස විප්ලවයේ පළමු වසර 10 ඇතුළත ඉරාකයෙන් එල්ල වූ යුද ප්‍රහාරය ද, සවුදියෙන් එල්ල වූ තෙල් නිපදවීම පිළිබඳ සම්බාධක ද, එ. ජනපදයේ හා යුරෝපීය බලපෑම් ද, සෝවියට් බලපෑම ද මැඩගෙන ඉදිරියට යන්නට කුමේනි සමත් විය.

නමුත් උගතුන් හා චින්තකයින් බහුල වූ ඉරානය මූලධර්මවාදයට ගැටගසාගෙන යෑම ඉතා අසීරු විය. විශේෂයෙන් එහි ආර්ථික වර්ධනයට හා නිෂ්පාදායිතාවයට මූලධර්මවාදය 1990 ගණන්වලදී බලපාන ලදී. කුමේනිගේ මිය යාමෙන් පසු පර්සියානු නිදහස් ව්‍යාපාරයක් ඇරඹේ. දෙවරක් ම ඉරාන ජනාධිපති වූ රෆ්සන් ජානි හා මධ්‍යස්තමතධාරීහු පෙරට එති. තවමත් උත්තරීතර අයතුල්ලා පදවිය පැවතුණත් ඉරානයේ මහජන මතය දැඩි මූලධර්මවාදයට එරෙහිව පවතින බව රහසක් නොවේ. 2001 වසර පුරා ම ශිෂ්‍ය කැරලිවලින් ඉරානය දෙදරුම් කෑවේ ය. මෙවර එය නැගිටින්නේ මූලධර්මවාදයට එරෙහිව ය. කෙසේ වෙතත් සෑම අරුතින් ම ඉරාන විප්ලවය ලෝකය වෙනස් කළේ ය. ඉස්ලාමීය මූලධර්මවාදය ලොව පුරා පැතිර යන්නට, ෂරියා නීතිය ලොවපුරා පතුරවන්නට (සුන්නි-ෂියා රටවල් දෙකොටසේ ම) ඉරානය මූලික විය. 1986 දී එවකට අධිකරණ ඇමති නිශ්ශංක විජේරත්නට ඉරාන බලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ

ලංකාවේ මුස්ලිම්වරුන්ට ද ෂරියා නීතිය යොදවන ලෙසයි. එතැන් සිට ඉස්ලාමීය තොප්පිය, පර්දාව අනිවාර්ය වේ. ලංකාවේ ද මූලධර්මවාදී මුස්ලිම් පක්ෂ බිහිවේ. ප්‍රේමදාස යුගයේ දී ඊශ්‍රායලය පිට මං කර ඉරානයේ යුද උපකාර ලබා ගැනීමේ උත්සාහයක් තිබිණි. ලංකාවේ මූලධර්මවාදී කල්ලිවලට මූල්‍යමය හා යුද උපකාර කරන රටක් ලෙස ඉරානය හඳුනා ගෙන ඇත.

## ඇෆ්ගනිස්ථානය

''ඔවුන් අර්ධ මිනිසුන් (Sub Humans) ඔවුනට රසායනික ප්‍රහාර දුන්නාට කම් නැත '' මෙය ප්‍රකාශ කළේ බ්‍රිතාන්‍යයේ යුද ඇමති (1917) වූ වින්සන්ට් චර්චිල් ය. ඒ ඇෆ්ගන්වරු ගැන ය. ඇෆ්ගනිස්ථානය තරම් පසුගිය දශක දෙකේ දී කතාබහට තුඩුදුන් තවත් රටක් නැති තරම් ය. එක් කලෙක ඔවුන් (1979-89) ශුද්ධ යුද්ධය ලෝකයේ එවකට සුපිරි බලවතෙකු වූ සෝවියට් දේශයට එරෙහි ව ගෙන ගියෝ ය. ඉන්පසු ඔවුන් එක ම සුපිරි බලවතා වූ එක්සත් ජනපදය සමඟ දැන් යුද වැදී ඇත. මේ සුපිරි රටවල් දෙකට ම භූගෝලීය වශයෙන් ද, ගෝත්‍රික වශයෙන් ද බෙදී විසිරී සිටින ඇෆ්ගනිස්ථානය පරාජය කිරීමට නොහැකි විය.

ඉරානය (ෂියා), පකිස්ථානය (සුන්නි), චීනය (ෂින්ජියාන් පළාත) හා මධ්‍යම ආසියාව (උස්බෙක් - තජික්) ආදිය අතර මේ දුෂ්කර කඳුකර රාජ්‍ය පවතී.

මෙහි ජනගහනය ගත්කළ විශාලතම කණ්ඩායම (Pasthun) පස්තූන්වරුන් ය (38%). තජික්වරු (25%) කි. හසාර (19%) කි. උස්බෙක්වරු 6 % කි. ඇෆ්ගනිස්තාන ප්‍රදේශ ඉස්ලාමීය බවට පත් වන්නේ වර්ෂ 750 දී අබ්බාසිද් යුගයේ බව විශ්වාස කෙරේ. ඊට ප්‍රථම එය බෞද්ධ අවකන් දේශය නමින් ප්‍රචලිත ව තිබිණි. විශේෂයෙන් පස්තූන්වරු මහායාන බෞද්ධයෝ වූහ. කණිෂ්ක රජ දවස මේ බෞද්ධ රාජධානිය උස්බෙක්-තජික් හා ඉරාන ප්‍රදේශවල ව්‍යාප්ත ව තිබිණි. රුවන්වැලි සෑයේ කොත පැළඳවීමේ උත්සවයට වසර දෙදහසකට පෙර ද මේ ප්‍රදේශවලින් රහතුන් වැඩ සිටි බව මහාවංශය කියයි. මේ නිසා බින් කාසිම් මොහොමද් (වර්ෂ 711) හා අබ්බාසිද් යුගය අතර මේ ප්‍රදේශවල බෞද්ධාගම විනාශ වූ බව පෙනේ. අබ්බාසිද්වරුන්ගේ බලය පිරිහෙත් ම ගෝරි රාජවංශය පැමිණ ඉරානයේ සිට වත්මන් පකිස්ථානය දක්වා ම ඇෆ්ගන් රාජධානිය පුළුල් කරන ලදී. ජින්ජින් ඛාන් ටිමූර් ලාන්ග්ගේ ඥාතියකු වන සහීර් දින් මොහොමද්

බාබාර් කාබුල් නගරයේ සිට ඇෆ්ගන් ප්‍රදේශ පාලනය කරන්නට විය. මෝගල් අධිරාජ්‍යය ඉන්දියාවේ පිහිටුවීමට (1525) මූලික වන්නේ ද බාබාර් ය. ඉරානයේ සපාවිද් වංශය (නදීර් ෂා) 1729 දී කන්දහාර් ප්‍රදේශය අල්ලාගත් නමුත් පසු ව ඝාතනයට ලක් විය. පසුව හාමද් අබ්දාලි කන්දහාර්වල සිට ඇෆ්ගන් ප්‍රදේශ පාලනය කළේ ය. 1776 දී යළිත් කාබුල් දක්වා අග නගරය මාරු කරන ලදී.

සාර් රුසියාව කිහිපවිටක් ඇෆ්ගනිස්ථානයට පහර දුන් නමුත් ඒ සෑම විටම ඔවුන් එය අතහැර ගියහ. බ්‍රිතාන්‍යය ද දෙවරක් (1839-42) හා (1878-80) ඒ සඳහා උත්සාහ කළේ ය. 1880 දී ඔවුන් කාබුල් අල්ලාගත් නමුත් පසුව එය අතහැර දැම්මෝ ය. ඇෆ්ගනිස්ථානය යටත් කිරීම නොව සැම විටම ප්‍රශ්නය තිබුණේ එය පවත්වා ගැනීමේදී ය. බ්‍රිතාන්‍යයෙන් 1817-18 උඩරට කැරළිවලදී ද සිංහලේ උඩරට රාජධානියෙන් ඉවත්වීමට සිතාගෙන සිටියත් පසු සංඝ සංස්ථාව තුළත් සිටි ද්‍රෝහින්ගේ කුමන්ත්‍රණ නිසා බ්‍රිතාන්‍යයන්ට කඳුකරය අල්ලා ගැනීමට හැකිවිය. නැත්නම් කාබුල් මෙන් මහනුවර ද අත්හැර දැම්මට නියමිත ව තිබිණි.

පසුව අබ්දුල් රහමන් කාබුල් අල්ලා ගනී. ඔහු පස්තුන්, තර්කෝමාන් හා උස්බෙක් ගෝත්‍ර යටත් කිරීමට සටන් කරයි. ඔහු සුන්නිවාදය යටතේ එකී ග්‍රෝත්‍ර එක් කරයි. ෂියා (ඉරානීය) දහමට යටත් වූ හසාරා ග්‍රෝත්‍රය කඳුකරයේ කැරැල්ලක් ඇති කරයි. මේ නිසි ඇෆ්ගනිස්ථානයේ හසාරා ඇතුළු නිත්‍ය 20% ක ෂියා ජපාරි නිකායක් ඇතිවේ. රහමන් කාබුල් වල ඉතිරිව සිටි බෞද්ධයින් හා කිතුනු සුළුතරය බලයෙන්ම ඉස්ලාමයට හරවයි. මේ නිසා සුන්නි බහුතරය 80 % ක් දක්වා වැඩිවේ. මෝගල් බලපෑම නිසා සුපිවාදය ද පවතී.

කෙසේ වෙතත් කුරානය හා මහමත්තුමාගේ හාදිත්වලට අමරතව ඒ ඒ ග්‍රෝත්‍රවල නීති හා සිරිත් විරිත් ද ඇෆ්ගන් ඉස්ලාමයට මුසු වී ඇත. උදාහරණයක් වශයෙන් පස්තුන් ගෝත්‍රයේ පස්තුන්වාලි නම් නීති සංග්‍රහයට අනුව ''ලෙයට ලෙයින් පලිගන්න. නමුත් තමන් වෙත රැකවරණය පිණිස ආ අයෙක් වෙත් නම් ඔහු රැකගන්න. අවශ්‍ය වුවහොත් ඔහුගේ ජීවිතය වෙනුවෙන් දිවි දී සටන් කරන්න...'' ලෙස ප්‍රකාශ වී ඇත. පස්තුන් ගෝත්‍රිකයෙකු වූ තලිබාන් නායක මුල්ලා මොහොමඩ් උමාර් ඒ. ජනපදය විසින් ඔසාමා ඉල්ලූ අවස්ථාවේ සිය ගෝත්‍රික ජිර්ගා සභාවට කරුණු දැක්වූයේ එහෙයිනි.

අබ්දුල් රහමන් ගෝත්‍රික ජනයාගේ වැඩිහිටි නායකයින් එක් කර ලෝයා ජිර්ගා (Loya Jirga) නමින් ගෝත්‍රික සභාවක් ඇති කළේ ය. එයින් ඇෆ්ගන් රාජ්‍යය ශක්තිමත් විය. ඉන් පසු රහමාන් අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කළේ ය. එයට ආගමින උලේමාවරු එරෙහි වුවත් ඔහු ඉතා සාර්ථක ලෙස එය මැඩලුවේ ය. මෙලෙස නූතන ඇෆ්ගන් ජාතිය ඉස්ලාමීය පදනම් මත ගොඩනැගූ පළමුවැන්නා වූයේ අබ්දුල් රහමන් ය.

රහමන්ගෙන් පසු හබිබුල්ලා ආවේ ය. (1901-19) ඉරානයේ ව්‍යවස්ථා විප්ලවය ද ඉන්දියාවේ හා චීනයේ ජාතික විමුක්ති අරගල ද ඔහුට බලපෑවේ ය. වරක් ඉන්දියානු මුස්ලිම්වරු ඔහු රාජ්‍යත්වයට පත්කර ඉන්දියාවේ මුස්ලිම් රාජ්‍යයක් බිහි කිරීමට ද උත්සාහ කළේ ය. (1911) ඔහු පළමු ලෝක සංග්‍රාමයේ දී ඔටෝමන් තුර්කිය ආරක්ෂා කිරීමට ගොස් බ්‍රිතාන්‍ය ප්‍රහාරවලට මුහුණු පෑවේ ය. 1919 දී ඔහු එයින් ම ඝාතනය විය.

ඉන්පසු ආවේ අමනුල්ලා ය. (1919-29) ඔහු ධෛර්ය සම්පන්න ව බ්‍රිතාන්‍යයන් සමඟ සටන් කළේ ය. රාජතාන්ත්‍රික අතින් වඩාත් උපායශීලි වූ ඔහු බොල්ෂෙවික් රුසියාව කෙමල්ගේ අනාගමික තුර්කිය (1921) හා අන්තිමේ දී බ්‍රිතාන්‍යය සමගත් ගිවිසුම්වලට ගියේ ය.

1923 දී ඉස්ලාමය දෙසට නැඹුරු වූ ඔහු ඉරාන ව්‍යවස්ථාවට අනුව යමින් සුන්නි දහම රාජ්‍ය ආගම කරගත් නව ව්‍යවස්ථාවක් ඇති කළේ ය. මෙය ඇතැම් ගෝත්‍ර නොඉවසුයෙන් කැරලි ඇතිවිය. මුල් වතාවට ඔහු රුසියානු නියමුවන් යොදා කැරලිකරුවන්ට ගුවන් ප්‍රහාර එල්ල කළේ ය. (1924) එතැන් පටන් ඔහු මූලධර්මවාදයට අභියෝග කරන්නට විය.

1927 ඔක්තෝම්බරයේ සිට 1928 ජුලි දක්වා දීර්ඝ විදේශ චාරිකාවක නියැළී සිටිය දී අමනුල්ලාගේ බිරිඳ සෝර්යා පර්දාව නොමැති ව සිටින දර්ශන කාබුල් පුවත්පත් වල පළ විය. මෙයට එරෙහි ව කැරළිකාර ස්වභාවයක් නැගිණි.

ප්‍රතිප්‍රහාරයක් එල්ල කළ අමනුල්ලා සර්වජන ඡන්දයෙන් නියෝජිතයන් පත් කිරීමට ද කාන්තාවන්ට අධ්‍යාපනය ලබා දීමට ද, අත්‍යවශ්‍ය යුද පුහුණුව ද සහිත ප්‍රතිසංස්කරණ යෝජනා කළේ ය. ගෝත්‍රික ආගමික නායකයින් සිටි ලෝහා ජිර්ගා එය ප්‍රතික්ෂේප කළේ ය. එවිට ඔහු ඒවා නීතිගත කරන්නට උත්සාහ කළේ ය. ඒ කාන්තාවන්ට පර්දාව තහනම් වී පිරිමින්ට යුරෝපීය තොප්පිය හා ඇඳුම ද යෝජනා වී තිබිණි. එවිට

තීරණාත්මක ව කැරලි ඇතිවිය. කැරලි මර්දනයට යැවුණු හමුදා ද පෙරළා කැරලි ගැසීය. 1929 දී තජික් ජාතික 'බාචා ඊ සාකෝ' අමනුල්ලාට එරෙහි කැරැල්ලට නායකත්වය දී කාබුල් අල්ලා ගනී. ෂරියා නීතිය ගෙනවිත් රාජ්‍යත්වය අහෝසි කරයි.

1929 දී ඔක්තෝබරයේ දී මොහොමඩ් නදීර් ඔහු පෙරළා දමා පැමිණි යළිත් රාජ්‍යත්වය පිහිටුවයි. නියම ලෙස ෂරියාව හා ඉස්ලාමය ව්‍යවස්ථාවක් ඔහු ගෙන එයි. ඒ අනුව ඉස්ලාම් සුන්නි හනාෆි දහම රාජ්‍ය ආගම වේ. රජු එයට අයත් විය යුතු ය. ඉස්ලාම් නොවන කිසි ම ඇමතිවරයෙකු සිටිය නොහැක. උසාවිවල නීතිය හනාෆි ෂරියා නීතිය වේ. 1931 දී ප්‍රථම ඉස්ලාමීය පාර්ලිමේන්තුව ද ඇති කෙරිණි. 1933 දෙසැම්බරයේ දී නදීර් ෂා ඝාතනය කෙරේ. ඔහුගේ 19 හැවිරිදි පුතා වූ ෂාහිර් ෂා රට පාලනයට නම් කෙරිණි. නියම පාලනය අගමැති පදවිය දැරූ ඔහුගේ මාමා වූ හසීම් ඛාන් ඉසිලී ය.

1932 දී බිහි වූ කාබුල් විශ්ව විද්‍යාලය නිසා ඇෆ්ගනිස්ථානයේ උගත් තාක්ෂණික පන්තියක් ඇති වේ. සෝවියට් බලපෑම නිසා මාක්ස්වාදය ද පැතිරී යයි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ඉන්දියාව නිදහස ලැබීම ද, පාකිස්ථානය බිහිවීම ද ඇෆ්ගන් දේශපාලනයට බලපායි. තමන්ගේ දේශ සීමාව තුළ පාකිස්ථානයක් බිහිවීම ගැන ෂහීර් ෂා රජුට සතුටක් ඇති නොවේ.

පාකිස්තාන් හිතිකාව ඊළඟට එයි. පාකිස්ථාන් විරෝධියෙකු වූ ඩාවුඩ්ඛාන් ඇෆ්ගන් අගමැති පදවිය අල්ලා ගනී. 1954 දී පාකිස්ථානය එ. ජනපදය සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම නිසා බියට පත්වන ඩාවුඩ්ඛාන් සෝවියට දේශය දෙසට හැරේ. එතැන් පටන් හමුදා උපකරණ නවීකරණයටත් හමුදා උපදේශකයින් සඳහාත් සෝවියට් දේශය එයි. මෙමගින් හමුදාව තුළ සෝවියට් හිතවාදී මත වාද දරන්නන් බහුල වේ.


1957 දී කාබුල් ගුවන්විදුලිය කාන්තා නිවේදිකාවන් හඳුන්වා දෙයි. දැඩි විරෝධතා ඇතිවේ. පසුව ඩාවුද් ඛාන් පර්දාව ඉවත් කරයි. විරෝධතා දැඩි වේ. ඩාවුඩ් ඛාන් මූලධර්මවාදීන් අත්අඩංගුවට ගනී. එහි ඉල්ලාම් නායකයන් 50 දෙනෙක් ද වෙති. අමනුල්ලාට මෙන් ඔහුට මෙවර බලය අහිමි නොවේ. ඒ නවීන ඇෆ්ගන් හමුදාව ඔහු සමඟ සිටි නිසා ය.

1961 දී පස්තුන් ප්‍රදේශවල දේශසීමා මුල්කරගෙන පාකිස්ථානය සමඟ ප්‍රශ්න ඇතිවේ. පාකිස්ථානය ඇෆ්ගනිස්ථානයට ගොඩබිමින් ඇති මාර්ග වසයි. ආර්ථික සම්බාධක නිසා රට අරාජික වේ. ඩාවුඩ් ඛාන් ඉල්ලා අස්වේ. (1963) සාහිර් රජු නව ව්‍යවස්ථාවක් ගෙන ඒ. එයින් මුල්වරට ඡන්දයෙන් පත් කරන පාර්ලිමේන්තුවක් යෝජනා වේ. මේ වනවිට මාක්ස්වාදය හා ලිබරල්වාදය ඉස්ලාමය සමඟ කරට කර ගැටෙමින් දේශපාලන බලයට පොර කති. මෙහි විශේෂිත අවස්ථාව වන්නේ 1965 දී බිහිවුණු මාක්ස්වාදි ජනතා ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂය (PDP) බිහි වී කෙටි කලකින්ම එහි අර්බුද ඇතිවී පාර්චම් හා කාල්කි ලෙසට දෙකට බෙදෙයි. කල්කිවරු සන්නද්ධ විප්ලවය පිළිබඳ ව සිහින දකිති.

මාක්ස්වාදි සංවිධාන විවෘතව ම දෙවියන් නැතැයි කියා ඉදිරියට එත්ම ඉස්ලාමීය ප්‍රතික්‍රියාව ඇරඹේ. මෙය ඇති වන්නේ කාබුල් විශ්ව විද්‍යාලයේ ය. ඔවුන්ගේ උත්සාහය නිසා මූලධර්මවාදියෙකු වන බෝර්හාන් රබානි ජනාධිපති පදවියට පත්වේ. ශිෂ්‍ය අසහනය රැකියා හිඟය ආදිය තිබුවේ. සිසුන් තුළත් හමුදාව තුළත් මාක්ස්වාදි හා මූලධර්මවාදි බෙදීම් ඇති වී ගැටුම් ඇතිවේ.

1972 දී ඇතිවන වන සාගතය නිසා ලක්ෂයක් ඇෆ්ගන්වරු මිය යති. රජුට එරෙහිව සියළු බලවේග පෙළ ගැසෙමින් එති. සහිර් ෂා රජු ඉතාලියේ විනෝදයෙන් කල් ගෙවද්දි සාගතයෙන් වියැලුණු ඇෆ්ගනිස්ථානයේ බලය යළිත් ඩාවුඩ් ඛාන් පැහැර ගනී. (1973) ඩාවුඩ් ඛාන් ඉස්ලාමය ගැන කතා කරමින් ම ඉඩම් ප්‍රතිසංස්කරණයක් ගෙන එයි. මෙය ඉඩම් හිමි මුල්ලාවරුන් අසහනයට පත් කරයි. පාර්චම් ව්‍යාපාරය (බබ්රා කර්මාල්) ඩාවුඩ් ඛාන්ට සහාය දෙයි. රට සාගතයෙන් වෙළී තිබියදි කාබුල් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සභාවේ සභාපති බවට දැඩි මූලධර්මවාදියකු වන ඉංජිනේරු ශිෂ්‍ය ගුල්බිසින් හෙක්මතියාර් පත්වේ. ඉන්පසු ඉස්ලාමීය සටන්කාමීත්වයක් බිහිවිය. ඉක්මණින්ම ක්‍රියාකරන ඩාවුඩ් ඛාන් හෙක්මතියාර් හා ඔහුලේ ඉස්ලාමීය කල්ලි මර්දනය කරයි. ඔහු පාකිස්ථානයට පලායයි. ඩාවුඩ් ඛාන් මාක්ස්වාදයෙන් ගලවා ගැනීම සඳහා කෙටි කලක් උත්සාහ කරන ජනාධිපති රබානි ද පාකිස්ථානයට පලා යයි.

පාකිස්ථානයේ දි රබානි ඉක්වාන් මුස්ලිම් සහෝරත්වය ගොඩ නංවා, හමුදාව විනිවිද ගොස් කුමන්ත්‍රණයකින් බලය ලබා ගැනීමේ දීර්ඝ ගමනක් ගැන කතා කරයි. ඔහුට උලේමා හා ලෝයා ජිර්ගා අන්තවාදි නායකයින්ගේ සහාය ලැබේ. හෙක්මතියාර්ට අවශ්‍ය ඉක්මන් සන්නද්ධ නැගිටීමකි. මෙයට



බාමියන් පිළිම විනාශය



තලිබාන් පාලනයෙන් නිදහස්වීමේ ප්‍රීතිය

පාකිස්තානු අගමැති භූතෝ හා ඔත්තු සේවා (ISI) උදව් කරති. 1975 දී අසාර්ථක නැගිටීමක් කිරීමට ගොස් මර්දනය කැඳවා ගනී. පසුව සියළු මූලධර්මවාදීන් ආධාර ඇතිව පෙෂාවර්හි කඳවුරු බැඳ ගනිති.

රබානි තම පක්ෂය වූ ජමාති ඊ ඉස්ලාමි හෙවත් ඉස්ලාමීය සංගමය ගොඩ නගයි. මෙය ඉන්දියාවේ පහළ වූ ඉස්ලාමයට නවීන කියවීමක් ලබාදුන් මවුද්දුදි විසින් 1941 දී ගොඩනැගූ ඉස්ලාමය සංගමය අනුව ගොඩනැගුවකි. හෙක්මතියාර් කැරලිකාර හිස්බි ඊ ඉස්ලාමි තනයි. දෙදෙනා අතර වයස අදහස්,උපක්‍රම අතර විරසකය 19763 සිට කිසි දා නොසිදෙන ලෙස ඉදිරියට යයි. මෙය පසුව ඇෆ්ගන් ඉරනමට තිර ලෙස බලපායි. 1977 ජනවාරියේ දී ඩාවුඩ් ඛාන් විධායක ජනාධිපති ධූරයක් ඇති කරයි. එය රාජ්‍යත්වය වෙනුවට ගොඩ නැගේ. මේ අනුව පාර්චම් හා කාල්කි කණ්ඩායම් දෙක ම එක් වී යළිත් පී.ඩී.පී. පක්ෂය ගොඩ නගති. මෙයින් මාක්ස්වාදීහු ප්‍රමෝදයට පත්වෙති. දෙසැම්බරයේදී මූලධර්මවාදීහු ඩාවුඩ් ඛාන් ඝාතනයට තැත් කරති. අසාර්ථක වේ. ප්‍රතිඵලය මර්දනය. මූලධර්මවාදීන් මර්දනයෙන් පසු ඩාවුඩ් ඛාන් මාක්ස්වාදීන් වෙතට හැරේ. ජනප්‍රිය වෘත්තීය සමිති නායකයකු වූ මීර් අක්බාර්ගේ ඝාතනයත් සමඟ PDP ය ඩාවුම් ඛාන් එරෙහිව නැගී සිටිති. ඩාවුඩ් ඛාන් ඔවුන්ව මර්දනය කරයි. ඔවුහු රහසිගත දේශපාලනයට යති. විශේෂයෙන් කාල්කි නායක තාරකි හා අමීන් රහසිගත ලෙස ඇෆ්ගන් හමුදාවේ සිටි සෝවියට් හිතවාදී සෙබළු හා නිලධාරීන් සංවිධානය කරයි. මෙයට කාබුල් විශ්ව විද්‍යාලයේ වාමාංශික සිසුන්ගේ ද සහාය ලැබේ. 1978 දී වාමාංශික හමුදා නිලධාරීහු ඩාවුඩ් ඛාන් මරා දමති. කම්කරු හා ශිෂ්‍ය වර්ජන රැල්ලත් සමඟ රතු විප්ලවය කාබුල් හි සිදුවේ. එයට සෝවියට් සහාය පළවේ.

පී.ඩී.පී. ය බලය අල්ලා ගත් විට එහි රැඩිකල් කණ්ඩායම් ඉක්මන් වෙනස්කම් යෝජනා කරති. මෙයට තාරකී හා හෆිසුල්ලා ඇතුළත් ය. ඉස්ලාමීය බලවේග සමඟ එක්ව ක්‍රමයෙන් වෙනස්කම් කළයුතු යැයි කර්මාල් යෝජනා කරයි. පී.ඩී.පී. ය ජනතාව අතර විශේෂයෙන් ග්‍රාමීය හා කඳුකර ගෝත්‍ර අතර පැතිර නොගොස් තිබූ නිසා ඔවුහු ද උපක්‍රමයක් ලෙස තමන් ඉස්ලාම් යැයි කියති. ජිහාද් සඳහා නව අරුතක් දෙමින් එය ඉඩම් ප්‍රතිසංස්කරණයට යොදවයි. 1978 දී ඉඩම් සීමා කිරීමේ පනත ගෙන එයි. එමගින් අක්කර 30කට වඩා කිසිවෙකුට ඉඩම් අයිතිය කිසිවෙකුට ඉඩම් අයිතිය තබාගත නොහැකි වේ.

ඇෆ්ගනිස්ථානයේ ගොවීන්ගෙන් 40% කට ඉඩම් නැත. තවත් 40% කට අක්කර 1.5-6 අතර ඉඩම් ඇත. ජනගහණයෙන් 2.2 % කට අක්කර 30 ට හෝ එයට වැඩි වූ අක්කර මිලියන 3ක් තිබිණි. පී.ඩී.පී. අක්කර ලක්ෂ 5 ක් ඉඩම් නැති ගොවීන් ලක්ෂයක් අතර බෙදා දුන්නේ ය. එමෙන් ම ඒවායේ උගස්කර හා ණයකර අහෝසි කළේ ය. මෙයින් ගම්වල විසූ ඉඩම් හිමි මුල්ලා ආගමික නායකයන් කිපේ. පුද්ගලික දේපොළ අහෝසිය මෙන් ම අන්සතු දේපොල ගැනීම ද කුරානයට අනුව අල්ලා හට එරෙහි වීමක් බව මූලධර්මවාදිහු කියති. ජාතික කොඩියේ කොළ පාට ඉවත් කිරීම 'රතු' ආණ්ඩුවේ ඉස්ලාම් විරෝධි ක්‍රියාවක් ලෙස හැඳින්වේ. 1978 අගදී සෝවියට් දේශය සමඟ ගිවිසුමක් ඇති වූ විට රතු කොළ ගැටුම් උත්සන්න වේ. ක්‍රමයෙන් පී.ඩී.පී ය තුළ කාල්කි රැඩිකල් කණ්ඩායම බලවත් වෙති. 1979 දී ඔවුහු ඉස්ලාම් මූලධර්මවාදීන් මර්දනය අරඹති. මාක්ස් ගේ ආර්ථික විද්‍යාවට අනුව සිතන ඔවුන් දේපොළ ලැබීමෙන් පසු කම්කරුවන් හා ගොවියන් අතර විප්ලවීය පන්ති විඥානය ඇතිවේ යැයි සිතති. නමුත් ගොවීන් තමන්ට ලැබුණු ඉඩම් ද අතහැර මුල්ලාවරුන් සමග අල්ලා වෙනුවෙන් සටනට එක් වෙති. කඳුකර ප්‍රදේශ ක්‍රමයෙන් මූලධර්මවාදයට යටවේ. නගරවල කැරලි දරුණු ලෙස මර්දනය කෙරේ. මෙහිදී දැඩි පුද්ගලයෙකු වූ අමීන් මතුවේ. කර්මාල් පවා සෝවියට් දේශයට පලා යයි. සෝවියට් මැදිහත් වීමෙන් අමීන් තම පාලනය ලිහිල් කරයි. එවිට ඉරානයේ වූවාක් මෙන් මූලධර්මවාදය එළි පිට සටනට එයි. හිස්බි ඊ ඉස්ලාම් ප්‍රහාර පාකිස්ථාන හමුදාවල සහායෙන් හෙක්මතියාර් දියත් කරයි. තත්ත්වය පාලනය කිරීමට 1979 දී සෝවියට් හමුදා එති. අමීන් ඝාතනය කෙරේ. කර්මාල් ජනාධිපති වේ.

කර්මාල් සෝවියට් හමුදා බලය යොදා ගනිමින් ඉඩම්, අධ්‍යාපනය හා නීතිය යන ක්ෂේත්‍රවල ප්‍රතිසංස්කරණය කරයි. ඔහු ඉස්ලාමය ද අදහයි. නමුත් සෝවියට් ''කෆීර්'' හමුදා සිටීම ගැන මූලධර්මවාදයේ කෝපය නැගේ.

වියට්නාමයේදී තමන්ට වූ යුද පරාජයට එකට එක කිරීමක් ලෙස ඇෆ්ගන් මූලධර්මවාදයට උපකාර කිරීමට එ. ජනපද ජනාධිපති කාටර් තීරණය කරයි. එය පසුව රේගන්ගේ රාජ්‍ය ප්‍රතිපත්තිය වේ. ඉරානයේ මූලධර්මවාදයට එරෙහිව සටන් කරන C.I.A. ඇෆ්ගනිස්ථානයේ මූලධර්මවාදය සමග එක් ව සටන් කරයි.

සුන්නි මුස්ලිම් කණ්ඩායම් හයක් එක් වී මුජෙහිදීන් සන්ධානය බිහිවේ. ඒවා නම් හිස්බි ඊ ඉස්ලාම් - හෙක්මතියාර්, ජමාත් ඊ ඉස්ලාම් - රබානි, හිස්බි ඊ ඉස්ලාම් (කැඩීගිය) යුනුස් කාලිස්, ජාතික ඉස්ලාමීය පෙරමුණ

(මුජාද්දි), ඉස්ලාමීය විප්ලවීය පෙරමුණ (නබි මහමුද්) වෙති. මොවුනට සවුදි අරාබිය අරමුදලින් ද, එ. ජනපදය නව අවිවලින් ද, පාකිස්ථානය නවීන අවි පුහුණුවෙන් ද උපකාර කරති.

මෙයට අමතරව තවත් මුජෙහිදින් කල්ලි 4 ක් ෂියා ඉරානයේ ආධාරයෙන් ක්‍රියාත්මක වේ. මෙහි අහමද් ෂා මසුද්ගේ උතුරු දිග සන්ධානය නමින් පසු ව ප්‍රචලිත වූ කණ්ඩායම ද වෙයි.

1985 දි ගොර්බචෙව් බලයට ඒමත් සමඟ සෝවියට් දේශයේ ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් කරා වැඩේ. මුජෙහිදීන් ප්‍රහාර වේගවත් වේ. එ. ජනපදය සැපයූ ස්ටින්ජර් මිසයිලවලින් ජාරි සටනේදි සෝවියට් ගුවන් යානා 261 ක් එක් දිනක දි විනාශ වෙයි. සෝවියට් දේශයට ඇෆ්ගනිස්ථානය හැරයයි. (1979). කර්මාල් රජය බිඳ වැටේ. මුජෙහිදින්වරු නව ඉස්ලාමීය විප්ලවීය ආණ්ඩුවක තනති. පොදු සතුරා ඉවත් වූ වහා ම මුජෙහිදීන් වරු අතර නායකත්ව ගැටළු පැන නඟී. රබානි, හෙක්මතියාර්, ජලානි ආදීහු විටින්විට ජනාධිපතිවරු වෙති. පාකිස්ථානය තත්ත්වය පාලනය කළ නොහැකි වේ. එ. ජනපදය ඉවත බලා ගනී. අන්තිමේදි පාකිස්ථානය තලේබාන්වරු යොදවා විශේෂ මෙහෙයුමක් කරයි. මසුද්ගේ උතුරු දිග සන්ධානය හැර සෙසු සියළු මුජෙහිදින් කල්ලි 1996 දි තලේබාන්වරුන් විසින් පාකිස්තානු හමුදා හා බින්ලාදන් ප්‍රමුඛ සවුදි අරමුදල්වලින් විනාශ කර කාබුල් ඇතුළු ප්‍රදේශ බහුතරයක බලය තහවුරු කර ගනී.

තලේබාන්වරු මෑත කාලීන ඉස්ලාම් ඉතිහාසයේ තුච්ඡතම ඉස්ලාම් මූලධර්මවාදය අරඹති. කාන්තාවන් සිරුරු වසා නිවෙස්වල සිර කරති. ඔවුන්ට රැකියා තහනම් කෙරේ. බාබර් සාප්පුවල සිට රූපවාහිනයි හා චිත්‍රපට සියල්ල ඉස්ලාමීය නොවන නිසා තහනම් කෙරේ. මත්ද්‍රව්‍ය තහනම් කරන ඔවුහු සිය ආදායම් ජාලය සඳහා හෙරොයින් විකුණති. (ලංකාවට හෙරොයින් ලැබෙන් ප්‍රධාන ජාලය -ඇෆ්ගන් - පාකිස්ථාන් - කල්පිටිය ජාලයයි. හෙරොයින් ජාවාරමේ යෙදෙන මුල් පෙලේ ව්‍යාපාරිකයන් 21 දෙනාගෙන් 17 දෙනෙකුම 'ලාංකික මුස්ලිම් ජාතිකයෝ වෙති.) බුදු පිළිම වනසති. තවත් පිළිම ජපානයට විකුණා කෝටි ගණන් උපයති. තලේබාන් රජය පිළිගත්තේ ඔවුන් මෙහෙය වූ පාකිස්ථානය, සවුදි අරාබිය හා UAF ආණ්ඩුව පමණි. එ. ජනපදය මුලදි තලේබාන්වරු ගැන වචනයක්වත් කීවේ නැත. එයට හේතුව පාකිස්ථානයේ හිටපු එ. ජනපද තානාපති රොබට් ඔක්ලේගේ මූලිකත්වයෙන් UNOCAL නම් තෙල් සමාගම බිලියන ගණනක් යටකර මධ්‍යම ආසියාවේ සිට ඇෆ්ගනිස්ථානය හා පාකිස්ථානය හරහා

ඛනිජ තෙල් නලයක් ඉන්දියන් සාගරයට ගෙන ඒමට සැලසුම් කළ නිසා ය. මේ නිසා CIA තලේබාන්වරුන්ට උපකාර කළ බව කියැවේ. එක්සත් ජනපදයට තරු පෙණුනේ 2001 සැප්තැම්බර් 11 ප්‍රහාරවලින් දහස් ගණන් ඇමරිකානුවන් මියගිය විට ය. එමිල් සෝලා නිවැරදිව පෙන්වා දුන් පරිදි

''අපි (එ. ජනපදය) ෂා (ඉරානයේ) හදා වඩා ගත්තෙමු. කොන්ත්‍රාවරු හරහා කුමේනිට අවි දුන්නෙමු. කුමේනිට පහර දීමට සදාම්ට ශක්තිවය වූයෙමු. පලස්තීනය සමතලා කරන්නට ඊශ්‍රායලයට ඉඩ දුන්නෙමු. සෝවියට්වරුන්ට පහර දීමට ඇෆ්ගන් මුජෙහිදීන් යුද්ධය මෙහෙය වූයෙමු. තලේබානය ඉරානයට පහර දෙන තෙක් ඔසාමාට ඉඩ දී සිටියෙමු. එසේ කළ අපි දැන් අපෙන් ම මෙසේ අසමු. මේ සියල්ල මුස්ලිම් මූලධර්මවාදීන් මෙතරම් බලවත් වූයේ ඇයි?''

## ඊජිප්තුව

ඊජිප්තුව හෙවත් මිසරය ගැන මතක් කළ වහා ම ඇතැමුනට මතකයට එන්නේ වසර දහස් ගණනක් පැරණි පිරමීඩයන් ය. නැත්නම් වසර දහස් ගණනන් නොදිරා පැපිරස් පටවලින් වෙළා ඇති පාරාවෝ රජ දරුවන්ගේ මළ මිනී හෙවත් මමී ය. තවත් ඇතැමුන්ට ඊජිප්තුව යනු ලොව පැරණි ම කළු මිනිසුන්ගේ ශිෂ්ටාචාරයයි. නිරන්තර ගං වතුරින් බැට කන සැතපුම් හාර දහසක් දිල නයිල් නදියේ සාරවත් ඩෙල්ටාවයි. එත් නැත්නම් පැරණිතම දේවතාවියක් වන හොට්නොට් හෙවත් කෘෂ්ණ ඇතීනායි.

රෝම අධිරාජ්‍යය එහි උච්චස්ථානයට මෙයට වසර දෙදහසකට ගෙන ආ ජුලියස් සීසර් ඊජිප්තුව ගියේ ග්‍රීක දේව කතාවල එන ඇතීනා හමුවීමට නොවේ. නමුත් ඔහුට එහිදි රන්වන් පැහැයෙන් පලසකින් මතු වූ ක්ලියෝපැට්රා හමු විය. ඇය සීසර්ගේ සියලොල නතු කර ගත්තා පමණක් නොව මාර්ක් ඇන්තනිගේ හදවත විනිවිද ගියා ය. බිලාලයන්ගේ රැජින අද දක්වාමත් යුරෝපයේ ලාලිනිය යි.

ඊජිප්තුව රටක් ලෙස ප්‍රංශය හා ස්පාඤ්ඤය එක් කළ තරම් විශාල භූමි භාගයක් සහිත රටකි. නමුත් එහි ජීවත් වන්නේ මිලියන 66.7 ක් පමණ ය. (1999) . 2015 දී මෙය මිලියන 84.4 ක් වෙතැයි විශ්වාස කෙරේ. ඊජිප්තුව දළ ජාතික ආදායම ඩොලර් 3420 කි. (ppp) එය පසුගිය කාලයේ (1990-99) අතර 2.4 % ක වේගයෙන් වර්ධනය විය. නයිල් ඩෙල්ටාවේ

ගොවිතැන, සංචාරක ව්‍යාපාරය හා කුඩා තෙල් නිධි එහි ආදායම් ය. මානව දර්ශකයට අනුව එයට හිමිව ඇත්තේ 105 වන තැන ය.

අරාබීන්ගේ හදවත ලෙස ඊජිප්තුව බොහෝ කළක් තිබිණි. සුන්නි ඉස්ලාමයේ මෙන් ම ෂියා ඉස්ලාම්වාදයේ ද මූල නගරයක් ලෙස කයිරෝව වැජඹුණේ ය. නැපෝලියන් එය යටත් කර ගත් දා සිට එය යුරෝපීය බලවතුන්ගේ කෙළිබිමක් විය. අන්තිමේදි එය බ්‍රිතාන්‍යට යටත් විය. එහෙත් විමුක්ති සටන දිගටම ගියේ ය.

පළමු ලෝක සංග්‍රාමයෙන් පසු ඊජිප්තු නිදහස් සටන වේගවත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස 1922 දී අර්ධ නිදහසක් ලැබේ. අරාබි ලෝකයේ එවැනි නිදහසක් ලද මුල්ම රට ඊජිප්තුව යි. මේ නිසා ඉස්ලාම් මූලධර්මවාදයේ පදනම බවට ඊජිප්තුව පත්වේ.

1923 මැතිවරණයේ දී ජාතිකවාදී වාෆ්ද් පක්ෂය ලිබරල් ව්‍යවස්ථාවාදීන් පරදවයි. 1928 දී මුස්ලිම් සහෝදරත්වය බිහිවේ. එය ඉස්ලාම් මූලධර්මවාදයේ බිජුවට ඊජිප්තුව පුරා විසුරුවයි.

ජර්මන් නාසිවාදය බිහිකළ විශිෂ්ටතම සෙනෙවියා වූ රොමෙල් ඊජිප්තුව බැල්ම හෙළන බව බොහෝ කලින් දැනගත් බ්‍රිතාන්‍යය,ඊජිප්තුව සමඟ ආරක්ෂක ගිවිසුමකට යයි. එයට එරෙහි ව මුස්ලිම් සහෝදරත්වය කැරලි ගසයි.

මුස්ලිම් සහෝදරත්වය ඉස්ලාමය පරිපූර්ණ දහමක් බවත් ලෝකයේ ඕනෑම තැනක ඕනෑ ම කාලයකට උචිත බවත් විශ්වාස කරති. එමෙන් ම එය පරිනාමය වන බව පිළිගනිති. ඊජිප්තුව ඉස්ලාමයේ මූල රාජ්‍යය ගොඩනැගීම එහි අරමුණයි. මුළු අරාබි ලෝකයට ම බිහි වූ ප්‍රධානතම ඉස්ලාම් (සුන්නි) න්‍යායාචාර්යවරුන් අද දක්වා බිහිවී ඇත්තේ ඊජිප්තුවේ මේ මුස්ලිම් සහෝදරත්වයෙනි. මොහොමඩ් ක්වාට්බ් උදාහරණයකි.

1942 දී රොමෙල් ලිබියාවේ සිට ඊජිප්තුව කරා එයි. ෆාරුක් රජු බ්‍රිතාන්‍යය විරෝධී අයෙක් අගමැති කිරීමට යයි. බ්‍රිතාන්‍යය යුද ටැංකි රජ මාළිගය වට කොට ෆාරුක් නිවාස අඩස්සියේ තබයි. ඔවුන්ගේ ඉල්ලීම රජුට මරණය නැත්නම් වාෆ්ද් පක්ෂයේ නහාස් පාෂා අගමැති කරන ලෙස යන දෙකකින් එකක් තෝරා ගැනීම ය. නහාස් අගමැති වේ. රොමෙල්ගේ අන්තිම සටන කයිරෝවේ දී බ්‍රිතාන්‍යය ජය ගනී. මේ සටනට ලංකාවේ සිංහල සෙබළු ද සහභාගි වූහ.

1948 දී බ්‍රිතාන්‍යය පලස්තීනයෙන් ඉවත්වීමත්, පලස්තීනය දෙකඩ වී යුදෙව් ඊශ්‍රායලයක් බිහිවීමත් සමඟ ඊජිප්තුවට ද අරාබි-ඊශ්‍රායල් පළමු යුද්ධයට යයි. මුස්ලිම් සහෝදරත්වය ද ස්වෙච්ඡාවෙන් එයට එක්වෙති. ඒ වන විට ඔවුන්ට ඊජිප්තුවේ ලක්ෂ 5 ක සමාජිකයන් සිටියහ. යුද්ධය ඊශ්‍රායලය ජය ගැනීමත් සමඟ පරාජයේ වගකීම ඊජිප්තුව පාලකයින්ට පැටවීමට මුස්ලිම් සහෝදරත්වය ක්‍රියා කරයි. අගමැති මහමුද් පශ්මි පාෂා ඔවුන් තහනම් කර ඉස්ලාම් මූලධර්මවාදය මර්දනය කරයි. (1948-9). පසුව මුස්ලිම් සහෝදරත්වය කුමන්ත්‍රණය කර අගමැති පාෂා ඝාතනය කරයි. මුස්ලිම් සහෝදරත්වයේ නායකයාව ද ඊජිප්තු රහස් පොලිසිය විසින් ඝාතනය කෙරේ. (1949- බනානා ඝාතනය) යුද නීතිය පනවා මූලධර්මවාදය තළින් මර්දනය කෙරේ.

ඊජිප්තු හමුදා තුළ සිටි ඉස්ලාමීය ජාතිකවාදින් දෙදෙනෙකු වන බ්‍රිගේඩියර් මොහොමඩ් නෙග්යුබ් හා කර්නල් ගමල් අබ්දුල් නසර් එක්වී 1952 ජුලි 23 දා කුමන්ත්‍රණයකින් ඊජිප්තුවේ රාජ වංශය පෙරළා දමයි. ඔවුහු විප්ලවකාරී අණදෙන සංගමයට බලය පවරා ගනිති. (RCC) එහි සාමාජිකයන්ගෙන් අන්වර් සදාත් ඇතුළු සිව් දෙනෙක් මුස්ලිම් සහෝදරත්වයේ සමාජිකයන් හා හිතවතුන් ය. ආර්.සි.සි. ය සහෝදරත්වයට ඇමතිකම් පවාදීමට සැරසෙති. නෙග්යුබ් සිය පාලනය පටන් ගන්නේ ද බනානගේ සොහොනට මල් පිදීමෙනි. මේ නිසා එක් අතකට හමුදා කුමන්ත්‍රණය මූලධර්මවාදයේ ජයක් ලෙස සැලකිය හැක. තමන් පාලනය කළ රාජ වංශයක් පෙරළා දැමීමට නිර්භය වූ පළමු අරාබින් ඊජිප්තුවේ සිටියහ.

නෙග්යුබ් සිටිය ද සැබෑ ලෙස බලය හසුරුවන්නේ නසර් ය. 1953 දී ඊජිප්තුවේ ඉඩම් ප්‍රතිසංස්කරණ එළි දකී.

නූතනවාදී සංකල්ප වන ධනවාදය, කොමියුනිස්ට්වාදය, පුද්ගලික දේපොළ අයිතිය පන්ති ප්‍රශ්නය වැනි දේ ගැන ඉස්ලාමයේ අදහස මෙතැනදී ප්‍රශ්න කෙරේ. නූතන ඉස්ලාම් මූලධර්මවාදී චින්තකයන් අතරින් ඉදිරියෙන් සිටි මොහොමද් ක්වාටබ් මේ ප්‍රශ්නවලට මුස්ලිම් සහෝදරත්වයේ විග්‍රහයන් ලබාදේ. කුරාණය මෙසේ කියයි.

''දෙවියන් වහන්සේ තමන් සතු දේ ඇතැමුන්ට වඩාත් හොඳින් ලබා දී ඇති අතර ඇතැමුනට ලබා දී නැත''(xvi-71)

"දෙවියන් වහන්සේ ඇතැමුන් අන් අයට ඉහළින් තබා ඇත" (xliii.
32)

මේ වගන්ති නිරතුරුව ම රාජ වංශයක් හා ප්‍රභූවාදයක් (හෙ ධනපති පන්තියක්) පිහිටුවීම ගැන ඉස්ලාමය විශ්වාස කළ බවට ඇතැමුන් ගෙන හැර දක්වති. නමුත් ක්වාටබ් වැනි අය තර්ක කළේ පළමු කාලිෆ් ලෙස අබුබකර් තෝරා ගනිද්දී මෙන් ම දැනුම, කැපවීම, හැකියාව ඇත්තැන් සමාජ නායකත්වයට පත්වීම මිස මේ තයින් පරම්පරාගත රාජ වංශ යෝජනා නොවී ඇති බවයි. අබුබකර්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් වූයේ "දෙවියන්ට මා කීකරු වන තෙක් මට කීකරු වන්න. මා දෙවියන්ට කීකරු නැත්නම් මාගේ අණ ඔබ පිළිපැදිය යුතු නැත"..... ලෙස ය. එහෙත් මැදිහත්ව බලන විට පෙනී යන්නේ ක්‍රිස්තියානි මූලධර්මවාදී ස්කැන්ඩිනේවියානු රටවල් හා මුස්ලිම් මූලධර්මවාදී රටවල් යන දෙකම සිය රජු හා එසේ නොවන පාලක පන්ති සමාජයේ නිර්මාණයකට වඩා දේව නිර්මාණයක් ලෙස සැලකූ බව ය.

දෙවියන් විසින් විවිධාකාරයෙන් යුතු ව මිනිසුන් මැවූ නිසා පුද්ගලික දේපොළ අයිතිය ස්වභාවික දෙයක් මිස සමාජ නිර්මාණයක් නොවන බව ක්වාටබ් වැන්නවුන් විසින් පැහැදිලි කරන ලදී. පුද්ගලික දේපළ අයිතියට උපතින් පසු ද මිනිසුන්ට අයිතිය ඇති බව පැහැදිලි කරන ලදී. මහමත්තුමා මෙසේ කියයි. "ඉස්ලාමීය රාජ්‍යය වෙනුවෙන් වැඩ කරන්නෙක් වෙයි ද ඔහුට බිරියන් නැති ද ඔහු බිරියක් ගත යුතු ය. ඔහුට නිවසක් නැති ද එය ගත යුතු වේ. ඔහුට සේවකයෙකු නැති ද ගත යුතු වේ. ඔහුට ඔටුවන්, ගවයින් නැති ද ගත යුතු වේ".... ආදී ලෙස ය. අනෙක් අතින් ධනවාදයේ මෙන් ධනය ගොඩ ගසා ගැනීමට ද ඉස්ලාමයට එකඟ නැති බව පෙන්නා දිනි." කුරානය මෙසේ කියයි. "ධනය බෙදා ගන්නා විට නෑසියන් හා දුගියන් සිටී නම් ඒවා ඔවුන්ටත් දෙන්න. ඔවුන්ටත් කරුණාබර වෙන්න. (iv-8)

"දානය අත්‍යවශ්‍ය වන්නේ ධනවතුන් අතර ධන සබඳතා ඇතිවීම වැළැක්වීමට ය...." 'ස්කාට්' නමින් ධනයෙන් 1/40 ක් පරිත්‍යාග කිරීමට ඉස්ලාමය යෝජනා කළේත් පොලියට දී ධනය මැවීම තහනම් කළේත් අධික ධනවතුන් මැවීම නතර කිරීමට බැව් පැහැදිලි කෙරිණි. එහෙත් දුගියන් හා පොහොසතුන් අතර ඉතා ම නරක වෙනසක් ඇති රටවල් වන්නේ ද ඉස්ලාමීය රටවල් ය.

කෙසේ වෙතත් ඊජිප්තුව තුළ මෙලෙස දෙවියන් මැවූ ස්වභාවික දේ, දෙවියන් ලබාදුන් දේ ජනසතු කළ හැකි ද යන්න මත ඇති වූ සංවාද ඉන්පසු ඉරානය, සවුදිය, ඇෆ්ගනිස්ථානය ආදි රටවලට ද පැතිර ගියේ ය.

ඉඩම් ප්‍රතිසංස්කරණයට මුස්ලිම් සහෝදරත්වට එරෙහි වූයේ එය දේව දානයට එරෙහි වූවක් ය. ස්වභාවයට එරෙහි වූවක් ය යන පදනමෙනි. නසර් හා ඔහුගේ වාමාංශික හිත මිතුරු අලි සබ්රි මුස්ලිම් සහෝදරත්වයට එරෙහිව යයි. නසර් ඊජිප්තුවේ බලයට එන අතර ඔහු ඝාතනයට සහෝදරත්වය උත්සාහ කරයි. එය අසාර්ථක වේ. එතැන් පටන් ඉස්ලාම් මූලධර්මවාදය හා නසර්ගේ බාත් සමාජවාදි ජාතිකවාදය අතර නොනිම් අරගලයක් ඇතිවේ.

ගමල් අබ්දුල් නසර් දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසු අරාබිය බිහිකළ විශිෂ්ඨතම, අරාබි ලෝකයට වඩාත් ම බලපෑමක් කළ තැනැත්තා ය. ඔහු බටහිර නූතනවාදි ව්‍යාපෘති දෙකක් වූ එක්සත් ජනපද ධනවාදයට හා සෝවියට් කොමියුනිස්ට් වාදයට හෝ යට වුණේ නැත. ඒ දෙකෙන්ම අනුගාමිකයන් දිනා ගන්නා අතර මූලධර්මවාදයට එකඟ වූයේ නැත. ඔහුට අවශ්‍ය වූයේ අරාබි ජාතික වාදයට උචිත ලෙස නූතනවාදය ඊජිප්තුවට ගෙන ඒමට ය. නොබැඳි ව්‍යාපාරයේ බල කණු බවට ටිටෝ, නේරු හා බණ්ඩාරනායක සමඟ ඔහු එක් වුණේ අහම්බෙන් නොවේ.

නසාර් අරාබි ලෝකයේ වීරයා වන්නේ 1956 දි සූවස් ඇළ ජනසතු කිරීමෙනි. යුරෝපය මෙය දුටුවේ කොන්ස්තන්තිනෝපලය 1453 දි මුස්ලිම්වරුන් අත්පත් කර ගත්තාට සමාන සිදුවීමක් ලෙස ය. තෙල් සම්පත හා වෙළෙඳාම උච්චස්ථානයක තිබුණු නිසා නසාර්වාදය අරාබිය ගිලගන්නා බව ඔවුන්ට වැටහිණි. බ්‍රිතාන්‍යය හා ප්‍රංශය සූවස් ඇළේ අයිතිය තමන්ට ඇති බව පවසා ඊජිප්තුවට එරෙහිව යුද වදින්නට සූදානම් විය. බෙන් ගුරියන් හා මොෂේ දයාන්ගේ කපටි ඊශ්‍රායලය විදුලි වේගයෙන් සිනායි ප්‍රදේශ ඊජිප්තුවෙන් අල්ලා ගෙන සූවස් ඇල අල්ලා ගන්නා ලදී. බ්‍රිතාන්‍යය හා ප්‍රංශ හමුදා ඔවුන්ට උපකාර කළේ ය. ඊශ්‍රායලයේ ඉදිරි ගමන නතර කරන්නේ සෝවියට් දේශය විසිනි. අන්තිමේදි ඊජිප්තුවට සූවස් ඇල ලැබුණත් සිනායි නැවත ලැබෙන්නේ නැත.

කෙසේ වෙතත් මෙයින් පසු නසාර් අරාබි ලෝකයේ පමණක් නොව මුළු දුගී ලෝකයේ ම වීරයෙක් බවට පත්විය. ඉන්පසු සෝවියට් දේශය වෙතට ළං වෙන නසාර් ඊශ්‍රායලයට අභියෝග කිරීමට සිතා සිය හමුදාව

නවීකරණය කරයි. මොෂේ දයාන් ඔහුට හදිසි ප්‍රහාරයක් (1967- දින හයේ යුද්ධය) එල්ල කරන්නේ සෝවියට් යුද්ධ උපකරණවල බලය ප්‍රශ්න කරමිනි. නසාර් පරදියි.

නසාර්ට එරෙහිව මූලධර්මවාදය නැගී සිටින අතර ඔහු ඔවුන් අනුකම්පා විරහිත ව මර්දනය කරයි. සයිද් ක්වාටබ් ඇතුළු 365 දෙනෙක් මරා දමයි.

නසාර් දෙපසින් වාමාංශික අලිසබ්රි හා දක්ෂිනාංශික සසරියා මොහිදීන් වූහ. එහෙත් නසාර් තමන්ගෙන් පසු ඉදිරියට ගත්තේ ඉස්ලාම් මූලධර්මවාදයට නැඹුරු අන්වර් සදාත් ය. (1970) අන්වර් සදාත්ට එරෙහි ව වාමාංශික බලවේග අලි සබ්රි යටතේ නැගී සිටී. සදාත් ඔවුන් මර්දනය කරයි. 1972 දී සදාත් සෝවියට් යුද්ධ උපදේශකයන් ආපසු යවයි. බොහෝ දෙනා සිතන්නේ ඊජිප්තුවේ යුද්ධ ශක්තිය එයින් හීන වී ඇතැයි කියා ය. නමුත් 1973 ඊජිප්තු ඊශ්‍රායල් (යුම් කුෆුර්) යුද්ධයේ දී ප්‍රථම වරට අරාබිහු යුද්ධ ජයග්‍රහණ ලබති. සදාත් එ. ජනපදයේ බලපෑම මත ඊශ්‍රායලය සමග ගිවිසුමකට (කෑම්ප් ඩේවිඩ්) යයි. එමගින් ඔහු ඊශ්‍රායල් රාජ්‍යය පිළිගනී. මූලධර්මවාදීහු සදාත් ඝාතනය කරති. ඒ සඳහා මුල් වූ අයෙක් වන වෛද්‍ය අල් ස්වාහිරි පසු ව ඔසාමා බින්ලාදන්ගේ දෙවැනියා වෙයි. අල්කයිදා තුළ ඊජිප්තු කණ්ඩායම ලොකු ම හා බලවත් ම මූලධර්මවාදීන් බවට පත්වෙති.

සදාත්ගෙන් පසු හොස්නි මුබාරක් බලයට එයි. ඔහු මුස්ලිම් මූලධර්මවාදයේ හා අල් කයිදාවේ වෛරයට ලක් වූ අයෙකි. ඔහු ඝාතනය කිරීම සඳහා අල් කයිදාව උත්සාහ කළේ ය. පසුව අරාබි වසන්තය විසින් මුබාරක් පලවා හැර මුස්ලිම් සහෝදරත්වයේ මොර්සි (2012) ඊජිප්තුවේ ජනාධිපති කළේ ය.

කෙසේ හෝ ගමල් අබ්දුල් නසර් යුදමය ලෙස ඊශ්‍රායලයට මුහුණ දිය හැකි බලවේගයක් ලෙස නූතන ඊජිප්තුව ගොඩ නැගුවේ ය.

## ලිබියාව

ලන්ඩනයේ පුවත් පතක සේවය කරන මාරි කොල්වින්ට එරෙහි ව ලන්ඩනයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙක් වරක් එංගලන්ත පුවත්පත් මණ්ඩලයේ නඩුවක් දැම්මෝ ය. ඒ මාරි කොල්වින් දෙමළ නාසිවාදී කොටි ත්‍රස්තවාදයට වුවමනා ලෙස තොරතුරු විකෘති කරන බව කියමිනි. එයින් ඔහු ජය

ගත්තෝය. එහෙත් මාරි කොල්වින් එංගලන්තයේ ප්‍රචලිත වුණේ කොටි බල ප්‍රදේශයක දී ඇයට ශ්‍රී ලංකා හමුදා විසින් වෙඩි තැබීම නිසා ය. තමන්ගේ හම සුදුවීම නිසා රටක නීතිය නොතකා ඕනෑම දෙයක් සුදු නොවන රටවල කළ හැකි යැයි සිතන බටහිර මාධ්‍යවේදීන්ට මාරි කොල්වින්ගේ තුවාල කැළල හොඳ පාඩමකි.

මාරි කොල්වින් ලිබියාවට ද සම්බන්ධ ය. ඒ ලිබියාවේ ඉතිහාසය වෙනස් වීම ඇය විසින් වැළැක් වූ නිසා ය.

ශ්‍රී ලාංකිකයන්ට නම් ලිබියාව යනු කර්නල් මුවම්මර් අල් ගඩාෆි ය. 1976 නොබැඳි සමුළුවට ලංකාවට පැමිණි රාජ්‍ය නායකයින් අතුරින් වැඩි ම ප්‍රසිද්ධිය ලැබුණේ ඔහුට ය. ඒ ඔහුගේ කඩවසම් පෙනුම නිසා පමණක් නොවේ. ලිබියානු ඔත්තු සේවා කලින් ම මාධ්‍ය මිලදී ගෙන තිබුණු නිසාවෙනි. කෙසේ වෙතත් ගඩාෆි තමන් වෙනුවෙන් ලංකාවේ මුස්ලිමුන් පැවැත් වූ උත්සවයක දී එදා කියා ඇත්තේ තමන්ගේ මුණුබුරා ලංකාවට එනවිට ලංකාව ඉස්ලාම් රටක් කිරීමට සියල්ලන් අධිෂ්ඨාන කරගත යුතු බවයි.

ඉතින් මාරි කොල්වින් හා ලිබියාව අතර සම්බන්ධය කුමක් ද? නිසැකව ම එය ගඩාෆි ගැනය. 1980 ගණන්වල තරුණ මාරි කොල්වින් නිරන්තරයෙන් ලිබියාවට ආවා ය. ගියා ය. ඇය ඇමක් කරගෙන ගඩාෆි පිළිබඳ රහසිගත තොරතුරු ලබා ගැනීම බටහිර ඔත්තු සේවාවල අරමුණ විය. නමුත් සිදුවූයේ අනෙකකි. ඇය දෙපැත්තේ ම ඔත්තුකාරියක් බවට ගඩාෆිගේ යහනේ දී පත් වූවා ය. වරක් එක්සත් ජනපදය හරි ඉලක්කයට එල්ල කරන ගුවන් ප්‍රහාරයක් මගින් ගඩාෆි ඝාතනයට සැලසුමක් තැනීය. (1986 අප්‍රේල්) එවිට මාරි කොල්වින් සිටියේ ට්‍රිපොලිවල ය. එක්සත් ජනපද තානාපති කාර්යාලය ඇමෙරිකානුවන්ට (ප්‍රහාරය දිනයේ) උපදෙස් දුන්නේ ආරක්ෂිතව හෝටල්වලට යන ලෙස ය. මාරි කොල්වින්ට ද පණිවිඩය ලැබිණි. ඇය වහා ම ඒ තොරතුරු ගඩාෆිට දැනුම් දුන්නා ය. ඒ නිදි යහනේ වන්දියට අමතර ව ඇයට ලැබුණු තවත් ප්‍රතිපාදන නිසා විය හැකි ය. ගඩාෆි ප්‍රහාරයෙන් බේරුණේ අනු නවයෙනි. එයින් ඔහුගේ දරුවෙක් මිය ගියේ ය. එක්සත් ජනපදයේ සියළු සැලසුම් සුපිරි ගණිකාවක් විසින් විනාශ කරන ලදී.

ගඩාෆි ලෝකය පුරා ත්‍රස්තවාදීන්ට උපකාර කරන බවට චෝදනා ඇත. ඒ අතර පිලිපිනයේ මොරෝ විමුක්ති පෙරමුණේ සිටි අයි.ආර්.ඒ.

දක්වා සංවිධාන වෙයි. වරක් ජාත්‍යන්තර සමුළුවක දී ගඩාපිට පිලිපීනයේ හිටපු ඒකාධිපති මාකෝස් හා ඉමෙල්ඩා හමුවිය. තමන්ට කොමියුනිස්ට්වරුන්ගෙන් තරමට ම මොරෝ ගරිල්ලන්ගෙන් ද කරදර ඇතිබව මාකෝස් යුවල ගඩාපිට කීවෝ ය. ගඩාපි ඔවුන්ට තම රටට ආරාධනා කළේ ය. එහි ගියේ ඉමෙල්ඩා පමණි. එය ද රහසිගතව ය. කලක් යනවිට CIA දැන ගත්තේ ගඩාපි විසින් මොරෝ ගරිල්ලන්ට ලබාදෙන මුදල් සලාකය වහා ම ක්‍රියාත්මක වන පරිදි කපා දමා ඇති බව ය. මේ ගැන හා ඉමෙල්ඩාගේ රහසිගත ට්‍රිපොලි චාරිකාව අතර සම්බන්ධයක් ඇතැයි සිතූ CIA ඒ ගැන ඉමෙල්ඩාගෙන් ප්‍රශ්න කළෝ ය. ඉමෙල්ඩාගේ පිළිතුර ක්ෂණික විය. ''කෙල්ලන්ගේ දඟ වැඩ ගැන මිගොල්ලන්ට මොකක්ද ඇති කැක්කුම?'' ඉමෙල්ඩාගේ හැඩ වැඩ හා දඟ වැඩ ගඩාපි නිහඬ කළේ ය. මුස්ලිම් සහෝදරත්වයක මහිම!

ලිබියාව සෙසු අරාබි රටවල් මෙන් ම ජනගහණයෙන් ඉතා අඩු (මිලියන 5.2 - 1999) නමුත් කාන්තාරයෙන් ඉහළ වර්ග ප්‍රමාණයක් ඇති රටකි. මධ්‍යධරණී යුරෝපයට මුහුණලා ඇති ලොකු ම වෙරළ හිමි වන්නේ ඔවුන්ට ය. ජනයා පදිංචිව ඇත්තේ වෙරළ තීරයේ හා ට්‍රිපොලි අවට ය. තෙල් සම්පත නිසා ලිබියාව ධනයක් රටකි. එහි ඒක පුද්ගල ආදායම ඩොලර් 7570 කි. (ppp) මානව සංවර්ධන දර්ශකයේ ඔවුන් සිටින්නේ 59 වන තැන ය.

සෙසු අරාබි ලෝකය මෙන් ම ලිබියාව ද පාලනය කෙරුණේ රාජ වංශ මගිනි. එහි සිටින්නේ සුන්නි මුස්ලිම් ජනයා බහුතරයකි. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු තම මහළු රජු වූ ඉද්රිස් ගැන ලිබියානු හමුදා නිලධාරින් හා රාජ්‍ය නිලධාරින් සිටියේ ඉතා කලකිරීමෙනි. විශේෂයෙන් අසල්වැසි ඊජිප්තුවේ නසාර්වාදය නිසා බටහිර විරෝධී හැඟීම් ඔවුනතර ගහනව පැවතිණි. එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය බිය වී සිටියේ නසාර් වර්ගයේ බටහිර විරෝධී ශක්තිමත් නායකයකු ලිබියාවේ බලය කොයි වේලේ හෝ පැහැර ගනී කියා ය. කුමන්ත්‍රණ කතා විටින් විට පැතිරී ගියේ ය. එහෙත් කිසිවක් සිදු නොවුණි. මහළු රජු ඉද්රිස් රජු තුර්කියට වෛද්‍ය ප්‍රතිකාර සඳහා ගියවිට 1969 සැප්තැම්බර් 1 දා කිසිවෙක් හෝ නොසිතූ පරිදි හිතුවක්කාර හමුදා නිලධාරියෙකු වූ මුවම්මර් ගඩාපි කුමන්ත්‍රණයකින් ලිබියාවේ බලය අල්ලා ගත්තේ ය. බටහිර රටවල් සිතුවේ ඔහු බ්‍රිතාන්‍ය හමුදා ඇකඩමිවල පුහුණුව ලබා ඇති නිසාත් හොඳට ම තරුණ නිසාත් තමන්ට ඔහු හදා ගැනීමට හැකි බව ය. CIA පවා ගඩාපිගේ කුමන්ත්‍රණය දැන සිටි අතර එය ගඩාපි හරහාම සිදුවීමට ඉඩ හැරියේ එය අනතුරු



ගඩාෆි හා නසර්

දායක නොවන බව සිතමිනි. මෙය 1980 ගණන්වල මුලදී ප්‍රභාකරන් නොදරුවා තමන්ට ඕන ලෙස හසුරුවා ගත හැකි යැයි ඉන්දියාවේ R.A.W. ඔත්තු සේවාවේ කොෞටිල්‍යලා සිතූ සිතුවිල්ල වැනි ම එකක් විය.

කලක් කිසිවකුගේ අවධානයට යොමු නොවුණු ලිබියාව 1969 වන විට තෙල් අපනයනයෙන් සවුදිය මට්ටම ට පැමිණ තිබුණේ ය. ගඩාෆි සිර්ටේ නම් ගමේ පවුලක උපත ලැබූ සාමාන්‍ය පෙළපතක අයෙන් විය. ඔහුගේ කුමන්ත්‍රණයට සහභාගි වූ සියල්ලන්ගේ පසුබිම ද එවැන්නකි.

ගඩාෆි තෙල් සම්පත ජනසතු කළවිට බටහිර රටවල් කලබල විය. ඊළඟට ඔහු නසාර් දෙසට හැරී ලිබියාව ඊජිප්තුවට එක් කර ෆෙඩරල් රජයක් බාත්වාදය යටතේ තනමු යි කී විට එ. ජනපදය බියට පත් විය. තමන් ඉඩ දුන්නේ එසේ මෙසේ බටහිර විරෝධියෙකුට නොවන බව ඔවුන්ගේ මොළවලට වැටහෙන විට ගඩාෆි බොහෝ දුර ගොස් අවසන් ය.

ඔහු බ්‍රිතාන්‍යට පහර දීම සඳහා IRA කතෝලික ගරිල්ලන්ට අවි සැපයීය. ලෝකය පුරා ඉස්ලාම් මූලධර්මවාදයටත්, යැංකි අධිරාජ්‍යවාදයටත් එරෙහිව සටන් පාඨ කියූවන්ටත් ඔහු නොමසුරු ව ආධාර කළේ ය. මියුනික් ඔලිම්පික් උළෙලේ ක්‍රීඩකයන් පැහැර ගැනීමට ගොස් මැරුම් කෑ අරාබින් පස්දෙනා වීරයන් ලෙස සැලකීය. පලස්තීන විමුක්ති සංවිධානයට නොමසුරුව උපකාර කළේ ය. උගන්ඩාවේ බටහිර විරෝධි ඉඩි අමින්ට ඔහුගේ අප්‍රිකානුවාදය පෙරට ගෙන යෑමට හමුදා සහායට යැවී ය. ඉඩි අමින් ගැන බටහිර මාධ්‍ය පවත්වාගෙන යන ඇතැම් බොරු (ඔහු මිනීමස් කන්නෙකි ආදි) නිවැරදි කිරීමට ගඩාෆි ඉදිරිපත් විය. මාක්ස්වාදි ජාතිකවාදි විවිධ බටහිර විරෝධීන්ට උපකාර කළත් ඔහු හදවතින් ම ඉස්ලාමීය මූලධර්මවාදියකු විය.

1973 දී ඔහු මාඕ අනුව යමින් සංස්කෘතික විප්ලවයක් දියත් කළේ ය. එහිදී ඔහුගේ ඉල්ක්කය වුනේ මහජන කමිටුවලට රට පාලනය භාර කිරීම ය. ඔහුගේ හරිත ග්‍රන්ථය I හා II තුළ තම ඉස්ලාමීය ප්‍රජාතන්ත්‍රවාදය පෙන්වා දුන්නේ ය. රටේ සියළු දෙනාට ම සන්නද්ධ සටන් පුහුණු කළේ ය. හැකියා පූර්ණ බොහෝ දෙනා ඔහුට හිතවත් නම් රටේ පාලනයට සම්බන්ධ කර ගත්තේ ය.

බටහිර රටවල් චෝදනා කරන ආකාරයට ගඩාෆි ඒකාධිපතියෙකි. එය ඇත්ත ය. ඔහු මහජන සභා හරහා ජනතාව වෙස්මිනිස්ටර් නොවන

ක්‍රමයකට පාලනයට සම්බන්ධ කර ගෙන ඇත. සමාජ විෂමතා ඔහු හැකිතාක් දුරට අවම කළේ ය. දුගීකම බොහෝ දුරට පාලනය කර ඇත. අරාබි ලෝකයේ වඩාත් ම සමාජ සාධාරණය ඇති රට බවට ගඩාෆි ලිබියාව පත් කර ඇත.

එමෙන්ම ඔහුගේ උමතු මූලධර්මවාදයත්, පටු බටහිර විරෝධයත් විසින් ඔහු ලෝක දේශපාලනයට කර ඇති හානිය ද සෙසු පටු නැත. ලංකාවේ ඇතැම් මුස්ලිම් මූලධර්මවාදීන්ටත්, ඇමරිකාවට එරෙහිව ව්‍යාජ සටන් පාඨ මුමුණන්ටත් ඔහු විසින් මූල්‍ය ආධාර සපයන බව රහසක් නොවේ. 1986 ට්‍රිපොලි ප්‍රහාරයෙන් තම දියණිය මියගිය විට සැලකිය යුතු ලෙස එ. ජනපදයට හීලෑ වූ ගඩාෆි එ. ජනපද, බ්‍රිතාන්‍ය හා ප්‍රංශ ඔත්තු සේවා සමඟ එක්ව ඔසාමා බින්ලාදන්ට එරෙහිව ද ක්‍රියා කරයි. මූලධර්මවාදය මෙන්ම ජාම බේරා ගැනීමේ උපක්‍රමය ද ඔහු සදාම් හුසේන් ට වඩා හොඳින් දැන සිටින බව එයින් ම පෙනී ගියේ ය.

කෙසේ වෙතත් ලිබියාවේ ගෝත්‍රික බලපෑම පාලනය කරන්නට ගඩාෆි සමත් නොවී ය. පැරණි රාජ්‍යයේ අගනුවර වූ බෙන්ගාසියේ ඔහුට විරුද්ධව අරාබි වසන්තය ඇතිවිණි. ඉන්පසු එය සිවිල් යුද්ධයක් වී ගඩාෆි මහමඟ මැරුම් කෑවේ ප්‍රංශ ඔත්තු සේවා කැරලිකරුවන්ට දුන් තොරතුරු නිසා ය.

## ඉරාකය

ඉරාකය අපූරු රටකි. සෙසු අරාබි රටවලට නැති ස්වාභාවික සම්පත් යම් පමණකට හෝ ඉරාකය සතුය. ඉරාකයේ ජන සංයුතිය ද අපූරු එකකි. එහි බහුතර ජනයා ෂියා ඉස්ලාමය අදහති (57%). එහෙත් රටේ පාලනය ඉතිහාසය පුරාම ගෙන ගොස් ඇත්තේ බැග්ඩෑඩය අවට ජීවත් වන සුන්නි මුස්ලිමුන් ය (20%). මෙයට අමතරව ඇසිරියන් ක්‍රිස්තියානින් ද කුර්දිවරු ද සිටිති. මේ තරම් බලවත් ලෙස අන්‍ය ආගමික හා ජනවර්ග තිබුණ ද ඔටෝමන්වරු බෑග්ඩෑඩයේ ප්‍රභූ බලය බවට සුන්නින් පත් කළ අතර එය අද දක්වා ම පවතී.

ඉරාකයේ පාලනය ද බොහෝ දුරට අරාබි රජ පවුල අතර පැවතිණි. පසු ව ඉරාකය ශක්තිය ගත්තේ නසාර්ගෙනි. 1958 ජූලි 14 දා ජනරජ විප්ලවයක් සිදුවිය. ප්‍රජාතන්ත්‍රවාදය හා නවීකරණය එකවිට සිදු කිරීමට ගිය අබ්දුල් කරීම්ගේ පාලනයට බොහෝ බාධා ඇතිවිය. ජනගහනයේ ඇති

බෙදීම් නිසා ඉරාකයේ මූලධර්මවාදය තිබුණේ කවදත් දුර්වල තැනක ය. මේ නිසා බාත් ජාතිකවාදය නැග ආවේ ය. බාත් විසින් අබ්දුල් කරීම් පෙරළා දමන ලදී. ඉන්පසු හමුදා කුමන්ත්‍රණ, ප්‍රතිකුමන්ත්‍රණ ඇතිවිය. 1965 දී බලයට පැමිණි ආචාර්ය රහමන් අල්බාස් සිය අගමැති පදවිය යොදා ගනිමින් ඉරාකයට ප්‍රජාතන්ත්‍රවාදයත්, නවීකරණයත් ගෙන ඒමට උත්සාහ කළේ ය. ඔහුට විසඳීමට තිබුණු ලොකු ම ගැටළුව කුර්දි ගැටළුව ය.

කුර්දිවරු ඉන්දු-යුරෝපීය බසක් කතා කරන පර්සියානු ආර්යයන්ට නෑකම් කියන පෞරාණික ජනතාවකි. ඔවුන් තුර්කිය, ඉරානයේ හා ඉරාකයේ විසිරී සිටිති. අරාබි සුන්නින්ගේ මහා යුද වීරයා වූ සලාදින් පවා කුර්දියෙකි. පළමු ලෝක මහා සංග්‍රාමයෙන් ඔටෝමන් අධිරාජ්‍ය බිඳ වැටීමෙන් පසු සිව්රිස් ගිවිසුමෙන් කුර්දින්ට වෙන ම ස්වාධීන රාජ්‍යයක් කුර්දිස්ථානය නමින් ලබාදීමට එකඟතාවයක් ඇතිවිය. පසුව 1923 දී එය ඉවත් කර ගන්නා ලදී. පසුව ඇතැම් කුර්දි පළාත් ඉරාකයට ලබා දීමට ඒ. ජාතීන්ගේ සංගමය ක්‍රියා කිරීම නිසා ඉරාකයේ කුර්දි බෙදුම්වාදය ඇතිවිය. ඉරාකයේ ජනතාවගෙන් 10% ක් හෝ එයට වැඩි පිරිසක් කුර්දින් හෝ ඔවුනගේ ලේ මුසු වූවන් ලෙස විශ්වාස කෙරේ. තුර්කියේ ඉරාකය දක්වා කුර්දින් විසින් බෙදුම්වාදී ව්‍යාපාරයක් 1958 දී බිහි කරන ලදී. පසු ව අබ්දුල්ලා ඔකලාන් (PKK) යටතේ සන්නද්ධ අරගලයක් බවට පත්විය. ඔකලාන් තුර්කිය පදනම් කරගත් ප්‍රදේශවල අරගලය තවමත් ජීවමාන ය. (ඔකලාන් CIA උපකාරයෙන් තුර්කි බලධාරීන් විසින් අල්ලා ගන්නා ලදී)

කුර්දි කැරැල්ල බලවත් වන විට හමුදාව නොසන්සුන් විය. හමුදාවේ බහුතරයක් බාත්වාදීන් සිටිය හ. අගමැති අල්බාස් අත් අඩංගුවට ගත් ඔවුහු ජෙනරාල් අල් බකීර්ගේ බාත්වාදය 1968 දී ගෙන ආහ. පසුපස සිටියේ සදාම් ය.

සදාම් හුසේන් නියම ඉරාක පාලකයා වන්නේ 1979 දීය. එහෙත් ඔහු තිරයෙන් පිටුපස සිටි බලධාරියා විය. ඔහු ඉරාකයේ යුදෙව් ප්‍රශ්නය අනුකම්පා විරහිතව විසඳුවේ ය. 1948 දී ඉරාකයේ යුදෙව්වන් 1,30,000 ක් සිටි අතර ඊශ්‍රායලය බිහි වූ විට ඇතැමුන් එහි ගිය මුත් නිල්ල සහිත ඉරාකයේ බොහෝ දෙනා රැඳී සිටියහ. සදාම් ඔවුන් පහසුවෙන් රටින් පිට මං කළේ ය.

අල් බකීර් හා සදාම් හුසේන් 1970 දී කුර්දි නායකයා මුස්තාපා අල් බසානි සමඟ ගිවිසුමක් මගින් කුරුදින්ට ප්‍රාන්ත පාලනයක් ඇති කිරීමට

ඒකගතාවයක් ඇති කර ගත්ත ද දෙපිරිස අතර සමගිය ඇති නොවී ය. මෙයට එක් හේතුවක් වුණේ කුර්දි ප්‍රදේශවල පැවති තෙල් සම්පතය. කුර්දි ජාතික ව්‍යාපාරය නිර්දය ලෙස මර්දනය කළ ද ගරිල්ලා යුද්ධය දිගට ම පවතී.

1972 දී සහමුලින් ම තෙල් සම්පත ජනසතු කරන ලදී. ඉරාකය සාපේක්ෂව අරාබියේ නූගත් රටක් විය. විදේශ විශේෂඥයන් තෙල් ජනසතුවෙන් රට හැර යාම නිසා ඉරාකය අසරණ විය. ඔවුන් සෝවියට් විශේෂඥතාව පතන්නේ එවිට ය.

1979 දී සදාම් පූර්ණ බලවතා වූ විට කළ මූලික දෙයක් නම් ඉරානයේ කුමේනි සමඟ යුද වැදීමය. ඔහුට මූලික වශයෙන් ම එ. ජනපදයේද, සෝවියට් දේශයෙන් ද බර අවි ලැබිණි. 1990 වන විට අරාබියේ මිසයිල සහිත ලොකු ම යුද යන්ත්‍රය තිබුණේ ඔහුට ය.

ඉරානය සමඟ අසාර්ථක සටනකින් පසු ව සදාම් කුවේටය දෙසට හැරෙයි. සවුදි අරාබිය හැරුණු විට ලොකු ම තෙල් නිධි ඇත්තේ කුවේටයේ ය. කුවේටය බොහෝ කල් සිට ඉරාකයට අයිතිවාසිකම් කීවේ ය. එය ඇතැම් කාලවලදී බැග්ඩෑඩයෙන් ද තවත් විටෙක රියාද්වලින් ද තවත් විටෙක ස්වාධීනව ද පාලනය වී ඇත. සදාම්ගේ යුද යන්ත්‍රය විනාශ කිරීම සඳහා කුවේට උගුල ඔහුට එ. ජනපදය විසින් ඇටවූවක් ලෙස සැලකේ. 1990 අගෝස්තුවේ ඔහු කුවේටය ඈඳා ගත් අතර එ. ජනපද ප්‍රහාරවලින් පසු සිය හමුදා 90% කින් විනාශ කරගෙන පසු බැස්සේ ය. එ. ජනපදයේ උපායකට හසු වූ කුර්දින් ද නිදහස් සටන උත්සන්න කළ අතර රසායනික අවි පවා යොදා ගනිමින් සදාම් කුර්දින් නිර්දය ලෙස මර්දනය කළේ ය. ඉන් පසු එ. ජනපද සම්බාධක සමඟ ඉරාකය අතිශයින් දුර්වල තත්වයකට පත්විය.

ගඩාෆි මෙන් ම සදාම් ද බටහිර විරෝධීන්ට මුදල් හා සන්නද්ධ ආධාර ලබා දෙන්නෙකි. ලංකාවේ ද මුස්ලිම් හා එසේ නොවන පක්ෂවලට ද ඔහු උපකාර කර ඇත. එහෙත් උපායශීලි නොවුණු සදාම් වටිනා ඉරාකය විනාශ කර ගත්තේ ය. ඇතැම් විට ඔහු වැඩි කල් නොගොස් තමන්ව ද විනාශ කරගනු ඇත.

එ. ජනපද ආක්‍රමණය ඉදිරියේ සදාම්ගේ ආණ්ඩුව බිඳ වැටිණි. පසුව ඔහුව එල්ලා මරණ ලදී. සුන්නිවරුන් සතුව තිබූ ඉරාක බලය ෂියාවරු

අතට ගිය අතර ඉරාකය සුන්නි, ෂියා හා කුර්දි ලෙස බෙදීමේ අනතුරක් ඇතිවී ඇත. ජනාධිපති බැරැක් ඔබාමා යටතේ නාමිකව (2012) එ. ජනපද හමුදා ආපසු ගැනීමෙන් පසු ඉරාකය තව දුරටත් අරාජික වෙමින් ඇත.

## ඇල්ජීරියාව:

වෘකයා බලා සිටියේ ඔහු එන තෙක් ය. මෙතෙක් වේලා කිහිලිකරුවක් ව තිබූ දෙය කැබලි කිහිපයකට ගැලවිණි. ඉන්පසු එය නැවත සකස් කෙරිණි. දැන් එය පරිපූර්ණ ස්නයිපර් තුවක්කුවකි. ජනේලයෙන් ඔහු 'නිදහස් වීදිය' දෙස බැලුවේ ය. ඔහු ඇවිත් ! ඒ අන් කිසිවෙකු නොව එවකට ප්‍රංශ ජනාධිපති වූ චාල්ස් ඩිගෝල් ය. ඩිගෝල් පැරණි ඇල්ජීරියානු යුද්ධයේ රණවිරුවකු පදක්කමක් පැළඳවීමට සූදානම් විය. වෘකයා ඒ මොහොතේ ඉහළ මාලයේ සිට ඉලක්කය ගත්තේ ය. ඔහු මාස ගණනක් දුක් වින්දේ මෙයට ය. මේ මොහොත එක තෙක් ය. නිවැරදිව හිසට - අන් තැනක නොවේ - හිසට, කුඩා මීසයිලයක් බඳු වැදෙන තැන පුපුරා යන විශේෂ උණ්ඩ යැවිය යුතු ය. වෘකයා කොකා ගස්සන නිමේෂයේ දී ඩිගෝල් පැරණි ඇල්ජීරියානු රණවිරුවා සිප ගැනීම සඳහා පහතට නැමුණේ ය. වෘකයාගේ ඉලක්කය වැරදුණේ ය, ඊළඟ මොහොතේ ප්‍රංශ රහස් පොලිස් නිලධාරින් එතැනට කඩා වැදුණේය. ප්‍රංශය වැනි බලවත් රටක ජනාධිපතිවරුයා ඝාතනය කිරීම සඳහා තමා තනියෙන් සැලසුම් කර තනියෙන් ක්‍රියා කර, නූලෙන් එය වැරදි ගිය කුලී මිනීමරුවෙකුගේ අවසානය එලෙස නිමා විය. (ප්‍රෙඩ්රික් පෝසයිත්ගේ - වෘකයාගේ දිනය - කෘතියෙනි)

චාල්ස් ඩිගෝල් ප්‍රංශය පසුගිය සියවසේ (20 වැනි) බිහිකළ වඩාත් ම ජනප්‍රිය මෙන් ම බලවත් ම පුද්ගලයා විය. හිට්ලර්ගේ ප්‍රහාර ඉදිරියේ ජෙනරාල්වරුන් ඇද වැටෙද්දි තවත් දිනක් සටන් කිරීම සඳහා ඩිගෝල් එංගලන්තයට පැන ගියේ ය. මිත්‍ර හමුදා සමඟ ඔහු ආපසු ආවේ ප්‍රංශයේ ගැලවුම්කරු ලෙස ය. හමුදාවේ ඔහුට සම කළ හැකි කීර්තියක් තවත් කිසිවෙකුට නොවී ය.

නමුත් වරක් නොව කිහිපවරක් ම ඔහු ඝාතනය කරන්නට තැත් කෙරිණි. ප්‍රංශ රහස් ඔත්තු සේවාවන්ට හා පොලිසියට සිය ජනාධිපතිගේ ජීවිතව රැක ගැනීමට තිබුණේ අන් කාගේවත් නොව මනා ව පුහුණුව ලැබූ ප්‍රංශ හමුදාවේ ම හිටපු සෙබලුන් හා නිලධාරීන්ගෙනි. කලක් සිය යුද වීරයා වූ ඩිගෝල්ට ඔවුන්ගෙන් නැගී තිබුණේ දේශ ද්‍රෝහී චෝදනාවන් ය! එනම් ඇල්ජීරියාවට නිදහස් ලැබීමේ චෝදනාවයි.

නායකත්වයට ගත්තේ ය.

බවුමදීන් බටහිර විරෝධියෙක් විය. නසාර් මෙන් ම ඉස්ලාමයට වඩා ජාතික වාදයට නැඹුරු වූවෙක් විය. ඔහුගේ වාමාංශික අදහස් නිසා ගඩාපි මෙන් ම ඔහු ද ඇදී ගියේ සෝවියට් කඳවුර වෙතට ය.

ඔහු තමන්ගේ ම සමාජවාදී ක්‍රමයකට ඇල්ජීරියාව හුරු කළේ ය. බටහිරට ඉතා යාව තිබුණු තම රට ඔහු නිර්භීත ලෙස බටහිරට යට නොවූ ආර්ථික බලයක් කළේ ය. එතනදී ඔහුට රට තුළ තිබූ ස්වභාවික ගෑස් හා තෙල් සම්පත ද උපකාරී විය. වෙස්ට්මිනිස්ටර් ක්‍රමය වෙනුවට මහජන නියෝජිත සභා ක්‍රමයක් සඳහා 1974 දී ඡන්ද විමසීම් කළේ ය. ඇත්තෙන් ම පසුව ගඩාපි බොහෝ දුරට අනුගමනය කළේ බවුමදීන්ගේ සමාජ - ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති ය. බවුමදීන් යටතේ ප්‍රංශ බස කතා කරමින් ප්‍රංශ කොලනියක් වී තිබුණු ඇල්ජීරියාව නියම අරාබි ඇල්ජීරියාවක් බවට පත් විය.

ඇල්ජීරියානු විප්ලවය පිළිබඳ ව මනා විග්‍රහයක් ප්‍රාන්ට්ස් ෆැනොන් විසින් සිය ''මිහිතලයේ අසරණයෝ'' යන කෘතියෙන් සිදු කර ඇත. ධනවාදී හෝ මාක්ස්වාදී නොවී ගැමි ගොවියන්ට ජාතික විප්ලවයක් කළ හැකි බව ඔහු එයින් පෙන්නා දුන්නේ ය. විශිෂ්ඨ ගණයේ ලේඛකයෙකු හා දාර්ශනිකයෙකු වූ ඇල්බෙයා කැමු ද ඇල්ජීරියානු විප්ලවයෙන් කැළැඹුණු සිත ඇත්තෙක් විය.

ඇල්ජීරියාව මෙලෙස ජාතිකවාදී හමුදා පාලනයකට හුරු විය. ක්‍රමයෙන් 80 දශකයේ දී මූලධර්මවාදය පැතිරී ගියේ ය. ඇල්ජීරියාව සුන්නි මුස්ලිම් රටක් වුවත් ඉරාන විප්ලවයේ බලපෑම එයට හේතු විය. ඇෆ්ගන් මුජෙහිදීන් ව්‍යාපාරයට ද ඇල්ජීරියානුවන් සහභාගී වූ අතර, එයින් පසු මූලධර්මවාදය පිම්මක් පැන්නේ ය. 1990 ගණන්වන විට ෂරියා නීතිය යටතේ ඇල්ජීරියාව පාලනය විය යුතු යැයි කියාගත් ඉස්ලාම් මූලධර්මවාදීන් (FIS) මැතිවරණ වලින් ද ජය ලබමින් සිටියහ. (1993) කලක් තමන්ට සතුරු පිලක සිටි ඇල්ජීරියානු හමුදා නායකයන් හා එක් වූ බටහිර ලෝකය මැතිවරණ අවලංගු කර හමුදා පාලනය ශක්තිමත් කළේ ය. ඇතැම් ඉස්ලාමීය රටවල ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා වෙහෙසෙන බටහිර ලෝකය ඇල්ජීරියාවේ හමුදා පාලනය ශක්තිමත් කළේ ය. ඉන් පසු මිහිපිට ඇතිවූ ම්ලේච්ඡතම කැරැල්ලක් ඇල්ජීරියාවේ ඇති විය. හමුදා පාලනය ද ඉස්ලාමීය කැරලිකරුවන් ද අති අමානුෂික ඝාතන

එහි කර තිබේ.

1993 දී මැතිවරණ අත්හිටවීමත් සමඟ බිහිවූ GIA (Armed Islamic Group of Algeria) ගරිල්ලා ව්‍යාපාරය මෙයින් ප්‍රමුඛ ස්ථානයක් ගනී. කාමේරිසීන් කේබෙන්න් හා අබ්ඩෙල්හාක් ලයාදා විසින් ආරම්භයේදී එයට නායකත්වය දෙන ලදී. මෙයට අමතර ව FIS (Islamic Salvation Front) හා GSPC (Groupe Salalafish pourla Predigatemctle Combut) ආදී කණ්ඩායම් රැසක් ද එහි ඇත.

## මොරොක්කෝව

මොරොක්කෝ නාවික හමුදාව සිය රට අසල පවතින ජන ශූන්‍ය ගල් පර්වත වලින් ගහණ දූපතක් නව සිය වස එළඹෙත් දී අල්ලා ගත්තේ ය. වහා ම ස්පාඤ්ඤ යුද හමුදා එහි යැවිණි. දෙරට අතර යුද්ධයක් ඇතිවීමට ගොස් අනූ නවයෙන් බේරුණේ යුරෝපා සංගමයේ මැදිහත් වීමෙන් මොරොක්කෝ හමුදා ආපසු යෑම නිසා ය.

යුරෝපය මුස්ලිම්වරුන් හඳුනා ගත්තේ මොරොක්කෝව නිසා ය. තාරික් ස්පාඤ්ඤයට ගොඩ බටුයේ එහි සිට ය. මේ නිසා කතෝලික ප්‍රජාව තුළත්, යුරෝපය තුළත් ඉස්ලාම් භක්තිකයන් ඇතැම් විට මුවර්, මෝරෝ ආදී නම්වලින් හැඳින් වේ. ඒ ඔවුන්ගේ පළමු හමුවීම මොරොක්කෝවෙන් සිදු වූ නිසා ය. (මරක්කල නාමය ද මෙයින් බිඳුනක් විය හැකි ය.)

මොරොක්කෝවේ ජනගහණය මිලියන 29.3 කි. (1999) 2015 දී එය මිලියන 37.7 ක් වෙතැයි විශ්වාස කෙරේ. එහි ඒක පුද්ගල ආදායම ඩොලර් 3419 කි. (PPP) එයට මානව සංවර්ධන දර්ශකය තුළින් ලැබී ඇත්තේ ලොව 112 වැනි ස්ථානය යි.

මොරොක්කෝවේ අලාවයිට් රජ පවුල මහමත්තුමාගේ බෑණාවරුන් දක්වා දිව යන්නකි. මේ නිසා ම මොරොක්කෝව තුළ ඉස්ලාමීය බැමි ශක්තිමත් ය.

තමන්ට එකට එක කිරීමක් ලෙස ස්පාඤ්ඤයත් පසු ව ප්‍රංශයත් මොරොක්කෝව යටත් කර ගත්තේ ය. කෙසේ වෙතත් ඔවුහු බටහිරකරණයට හසු නොවී සිය ඉපැරණි සංස්කෘතිය රැකගන්නට සමත් වූහ. 1957 දී ප්‍රංශයෙන් නිදහස ලබා රජ කෙනෙකුගේ පාලනයක් එහි ඇති

කෙරිණි.

රජ පදවියට එරෙහිව වාමාංශික ජාතිකවාදී රැල්ල 1960 ගණන්වල මොරොක්කෝවේ ද පැතිරිණි. මෙහිදී බෙන් බාර්කාගේ UNFP වාමාංශික ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඒ සඳහා දැඩි උත්සාහයක් ගත්තේ ය. මෙයට අමතරව ඉස්ටිකල්ලි පක්ෂය ද විය. 1965 පැවැත් වූ මැතිවරණයේ දී UNFP ජයගන්නා බව පෙනුණ විට ඔවුහු රාජද්‍රෝහී චෝදනා යටතේ අත්අඩංගුවට ගන්නා ලදහ. ඉන් පසු ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කෙරිණි.

1970 දී රජය පෙරළා දැමීම සඳහා හමුදා කුමන්ත්‍රණයක් ද විය. වරක් ගුවන් හමුදා භට පිරිසක් රජු ගමන් කළ ගුවන් යානයට වෙඩි තබා බස්සවන ලදී. (1973) ඉන්පසු ද විවිධ ගැටුම් ඇති විය. නමුත් ස්පාඤ්ඤයේ හා යුරෝපයේ බලපෑම නිසා රාජ්‍යත්වය රැකුණි.

මොරොක්කෝව ඉස්ලාමයේ නායකත්ව රටක් නොවේ. එය ද සුපුරුදු පරිදි 1950-60 ගණන්වල ජාතිකවාදයේ හා වාමාංශික වාදයේ රළ වේගයට හසුවිය. පසුව ඊශ්‍රායලයේ යුද ජයග්‍රහණ හා ඉරාන ඉස්ලාමීය විප්ලවය නිසා 1980-90 ගණන්වල මූලධර්මවාදයට හසු විය. එය දැන් මූලධර්මවාදය යුරෝපයට පටවන තොටුපළක් වී තිබේ.

## සිරියාව

මහමත්තුමාගේ ජීවිතයේ අවසාන වසරේදී එතුමා සූදානම් වූයේ සිරියාව අල්ලා ගැනීම සඳහා වූ සංග්‍රාමයට ය. සිරියාව ඒ දිනවල මැදපෙරදිග වැදගත් වෙළඳ රාජ්‍යයක් විය. හදිසියේ අසනීප වූ මහමත්තුමා මිය යෑම නිසා එතුමාට සිය ජීවිත කාලයේ දී සිරියාව ඉස්ලාම්කරණය කිරීමට නොහැකි විය. නමුත් ඔහුගේ අනුගාමිකයෝ එය තම දිවැසිවරයා වෙනුවෙන් ඉටු කළහ.

සිරියාවේ ජනගහණය මිලියන 145.8 කි. (1999) 2015 දී එය මිලියන 23.2 ක් වනු ඇතැයි විශ්වාස කෙරේ. එහි ඒක පුද්ගල දළ ජාතික ආදායම ඩොලර් 4454 කි. මානව සංවර්ධන දර්ශකයේ ලොවේ රටවල් අතර එයට හිමිව ඇත්තේ 97 වැනි ස්ථානය යි.

සිරියා භූමිය දුරාතීතයේ සිට ම විවිධ බලවත් ශිෂ්ටාචාරවල අරගලයට පදනම් වූවක් විය. මුලින් ම පර්සියන් අධිරාජ්‍යය එහි ආවේ ය.

ඉන් පසු හිටයිට්වරු ද, බැබිලෝනියන්වරු ද එහි ආවෝ ය. ඉන් පසු ග්‍රීක අධිරාජ්‍යය ද, රෝම අධිරාජ්‍යය ද එහි ආහ. පළමු ලෝක මහා සංග්‍රාමයෙන් පසු ප්‍රංශය හා බ්‍රිතාන්‍යය එය බෙදා ගැනීම සඳහා කුමන්ත්‍රණ කළහ. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු සෝවියට් දේශයත් ඇමෙරිකා එක්සත් ජනපදයත් ඒ සඳහා පොර කෑහ.

ඔටෝමාන් අධිරාජ්‍යයට යටත් ව පැවති කාලයේ දී සිරියාව තුළ බලවත් අරාබි ජාතිකවාදයක් ඇති විය. ෆයිසාල් යටතේ කෙටි කලකට නිදහස් රාජධානියක් ද බිහි විය. අන්තිමේ දී 1945 දී සිරියාව නිදහස ලැබුවේ ය. සිරියාවේ ප්‍රධාන වශයෙන් අරාබිහු වාසය කරති. එහි බහුතරය සුන්නි ය. සුළුතරය ෂියා මුස්ලිමුන් ය. ඩ්‍රූස්, අලවයිට් ආදී ජනවර්ග ද වෙසෙති.

බ්‍රිතාන්‍යයන් සිරියාවට නිදහස දුන්නේ වෙස්ට්මිනිස්ටර් ප්‍රජාතන්ත්‍රවාදය සමඟය. එහෙත් සිරියානු ජාතිකවාදීන් බටහිරට බිය වූවන් නොවූහ. 1949 දී කර්නල් හුස්නි සෙයිම් හමුදා කුමන්ත්‍රණයක් කළේ ය. නමුත් බ්‍රිතාන්‍යයින් එය ව්‍යර්ථ කළහ. ඉන්පසු කුමන්ත්‍රණ, ප්‍රතිකුමන්ත්‍රණ රැසක් ඇති විය.

නසර්ගේ බාත්වාදය ඉන්පසු පැතිරී යයි. එහි හරය වුණේ ඉස්ලාමය සමඟ අරාබි ජාතිකවාදය යි. බාත්වාදය පැතිරී යාමත් සමඟ බටහිර විරෝධය ද පැතිර ගියේ ය. නසර් යටතේ ඊජිප්තුව - ඉරාකය සමඟ තනි ෆෙඩරල් රටක් වීමට සිරියානු පාලකයෝ ද තීරණය කළහ. (1963) නමුත් බාත්වරුන් බලයෙන් ඉවත් කිරීමත් සමඟ අරාබි එක්සත් රාජධානිය විසිරී යයි.

සිරියාවේ ඉස්ලාම් මූලධර්මවාදය හිස ඔසවන්නේ ෂියා සුළුතරය තුළිනි. ඔවුහු මහමත්තුමාගේ බෑණා වූ අලිතුමා දිව්‍යසිවරයෙකු ලෙස ම සලකති. ඔවුහු අධ්‍යාත්මික බලකායක් වෙති. මෙයට පටහැනි ව සුන්නි බහුතරය දැඩි සටන්කාමී ස්වරූපයක් ගනිති. අරාබි සුන්නින්ගේ බලපෑම නිසා බොහෝ කලක් අලවයිට්වරු සිටියේ සුළු මෙන් ම පහත් ජනවර්ගයක් ලෙස ය. නමුත් ඔවුහු බටහිර අධ්‍යාපනය නිසා තාක්ෂණ පන්තිය තුළ බලවත් වෙති. ඔවුහු හමුදාවේ නිලධාරීන් තුළ ද ක්‍රමයෙන් බලවත් වෙති. එහි ප්‍රතිඵලය වන්නේ සලාද් ජෙදිද් නම් අලවයිට් කර්නල්වරයෙක් බාත් පක්ෂයේ ද හමුදාවේ ද නායකත්වය අල්ලා ගැනීමයි. සෝවියට් යුද ආධාර නිසා සිරියාව බලවත් යුද බලයක් බවට පත්වේ. නමුත් 1967 දී ඇති වූ අරාබි - ඊශ්‍රායල් යුද්ධයේ දී සිරියාවට අන්ත පරාජයක් අත් විය. ගෝලාන් කඳුකරය

ද, කියුනිත්‍රා නගරය ද ඊශ්‍රායලය අල්ලා ගනී. මේ පරාජය තවත් තීව්‍ර වන්නේ ජෝර්දානයේ පලස්තීන නැගිටීමට උපකාර කිරීමට සිරියානු යුද ටැංකි යැවීමෙනි. ජෝර්දානයේ දී ඔවුහු තවත් පරාජය වෙති. (1970) මේ හා සමඟ ම සිරියානු දේශපාලනය අවුල් වේ. ප්‍රතිඵලය වන්නේ මෙතෙක් පසු පස සිටි ජෙනරාල් අසාද් සිරියාවේ බලය අල්ලා ගැනීම ය.

1973 දී අසාද් තනනා පළමු ව්‍යවස්ථාවෙහි රාජ්‍ය නායකයා මුස්ලිම් විය යුතු බව අවධාරණය කෙරේ. නමුත් ඉස්ලාමයට රාජ්‍ය ආගමික තත්ත්වය ලබා දීමට ඔහු මැලිවේ. 1973 ඊශ්‍රායල් යුද්ධය නිසා ඇති වූ බරපතල හානිවලින් ද සිරියාව ඉදිරියට යයි.

කෙසේ හෝ අසාද් යටතේ සිරියාව යුදමය ලෙස ද, ආර්ථික හා දේශපාලනික ලෙස ද ස්ථාවර වේ. විශේෂයෙන් එහි සුන්දර වෙරළ හා සංචාරක ව්‍යාපාරය ඔහු යටතේ වර්ධනය වේ. ඉස්ලාම් මූලධර්මවාදයට බලවත්වීමට අසාද් ඉඩ නොදේ. අසාද්ගේ මරණින් පසු ඔහුගේ පුත් ජනාධිපති ධූරයට පත්වේ.

බෂාර් අල් අසාද් බලයෙන් පහ කරලීම සඳහා රට තුළ කැරැල්ලක් (2011 සිට) ඇති වී එයට ඉරානය, රුසියාව, එ. ජනපදය, යුරෝපය ද සම්බන්ධ වී ඇත.

## ජෝර්දානය

ට්‍රාන්ද් ජෝර්දානය බ්‍රිතාන්‍යයන් විසින් 1921 දී ජෝර්දාන් ගඟේ නැගෙනහිර ඉවුරේ බිහි කරනු ලැබුවේ තම හිතවතෙකු වූ හෂමයිට් අමීර් අබ්දුල්ලා රජ කිරීම වෙනුවෙනි. 1948-9 අරාබි - ඊශ්‍රායල් පළමු යුද්ධයේ දී කපටි ලෙස ක්‍රියාත්මක වූ අබ්දුල්ලා අරාබි හමුදාවල උපකාරයෙන් පලස්තීනයට අයත් ජෝර්දාන් ගඟේ බටහිර ඉවුර ද අල්ලාගෙන ජෝර්දාන් රාජධානිය පිහිටුවිය. ඊශ්‍රායලය නිසා තල්ලු වී ගිය පලස්තීනුවන් ද බටහිර ඉවුරට සංකේන්ද්‍රනය වීම නිසා නව ජෝර්දානයේ පලස්තීන අනාථ ප්‍රශ්නයක් ද ඇති විය.

1951 දී අබ්දුල්ලා රජු පලස්තීන අන්තවාදියෙකු විසින් ඝාතනය කෙරේණි. ඉන් පසු එවකට 17 හැවිරිදි වියේ සිටි බ්‍රිතාන්‍යයේ උගත් හුසේන් කුමරු රජු බවට පත් විය. මුලදී පෙනෙන්නට තිබුණේ හුසේන් බ්‍රිතාන්‍යයේ සුරතලෙකු බවයි. නමුත් ඔහු ක්‍රමයෙන් බ්‍රිතාන්‍යය ආරක්ෂක දැලෙන් මිදෙන්නට විය. පසුව ඔහු ගුලාබ් පාෂා නම් බ්‍රිතාන්‍යය ජාතික හමුදා ප්‍රධානියා

සාර්ථකව ඉවත් කළේ ය. එහෙත් බ්‍රිතාන්‍යයේ වෙස්ට්මිනිස්ටර් ක්‍රමයෙන් ගැලවීමට ඔහුට තවත් කලක් ගත විය. 1957 දී වාමාංශික හිතවාදී හමුදා නිලධාරීන් පිරිසක් කළ හමුදා කුමන්ත්‍රණයකින් හුසේන් රජු ගැලවිණි. මේ ගැන සෝවියට් දේශයට චෝදනා නැගිණි. ඔහු බටහිර හිතවාදියෙකු වීමට යන බව පෙනිණි. ඊළඟ මොහොතේ ඔහු හමුදාවේ බෙදුයිවී කොටස්වල සහාය මත පදනම්ව වෙස්ට්මිනිස්ටර් ක්‍රමය අහෝසි කළේය. එයින් ඔහු බටහිරට ද කනේ පහරක් දුන්නේ ය.

හුසේන් රජු නිතර ම උත්සහ කළේ සෝවියට් දේශයටත්, බටහිර රටවලටත් තමන් ඔවුන් සමඟ සිටින බව පෙන්වීමට ය. ඔහු පලස්තීනය ගැන කතා කළ ද, කිසිවිටෙක සිය රටේ සන්නද්ධ කඳවුරු පිහිටුවීමට පලස්තීන විමුක්ති සංවිධානයට (PLO හෝ PLA) ඉඩ නොදුන්නේ ය. නමුත් 1967 යුද්ධයේ දී ඔහු නසාර් හා අරාබි හමුදා සමඟ එක්විය. එහිදී ඔහුට මුළු බටහිර ඉවුර ම අහිමි විය. ලක්ෂ ගණන් පලස්තීන අනාථයින් නැගෙනහිර ඉවුරට එනම් ජෝර්දානයට පලා ආහ. මේ නිසා ජෝර්දානයේ ප්‍රධාන ප්‍රශ්නය බවට පලස්තීන අනාථ ප්‍රශ්නය පෙරළින. මේ නිසා ම ක්‍රමයෙන් ජෝර්දානය ද ඉස්ලාම් මූලධර්මවාදයේ තෝතැන්නක් විය. එහි තිඹිරි ගෙය වුණේ පලස්තීන අනාථ කඳවුරු ය.

එ. ජනපද සාම සැලැස්ම යටතේ 1993 දී බටහිර ඉවුරේ කොටස් පලස්තීන නිදහස් රාජ්‍යයට අයත් වූ ලෙස සැලකුව ද, ඊශ්‍රායල් හමුදා ඉන් පසු අවස්ථා කිහිපයක දී ඒ ප්‍රදේශවල හමුදා ආක්‍රමණ කරන ලදී. අද දක්වා ඒ ගැන තීරණයක් නැත.

## ලෙබනනය

කලක් යුරෝපීය ලේඛකයින් බොහොමයක් ලංකාව සම කළේ ලෙබනනයට ය. ලෙබනනයේ මෙන් ජනවාර්ගික හා ආගමික කෝලහාල වලින් ද, වෙඩි හඬින් ද, පිරී ගිය රටක් ලෙස ලංකාව හඳුන්වනු ලැබී ය. වරක් ලෙබනනයේ කිතුනු පවුලක දරුවෙකු මුස්ලිම් කල්ලියක් විසින් කප්පම් සඳහා පැහැර ගත්හ. පසුව කුමන හෝ හේතුවක් නිසා දරුවා මරා දැමිණි. එවිට මූලධර්මවාදීන් කීවේ ඇසට ඇසක්, දතට දතක්, ලෙයට ලෙය හා ජීවිතයට ජීවිතයක් යන කුරාන පාඨය අනුව පලස්තීනයේ යුදෙව් අපරාධවලට කිතුනු ප්‍රජාව ද දායක වී ඇති නිසා ඒ තරුණ කිතුනුවාගේ ඝාතනය යුක්ති යුක්ත බව ය. එහෙත්, ඔහු ගේ පියාට එය එසේ නොවී ය. මැරෝනයිට් කතෝලිකයෙකු වූ ඔහුට ද බයිබලයේ මුල් ගිවිසුමේ කියා ඇත්තේ ඇසට ඇසක් දතට දතක් ලෙසය. තම පුතාගේ ලේවල පළිය

ගැනීමට පියා තීරණය කළේ ය. එක් උදයක සිය ස්වයංක්‍රීය රයිෆලය උණ්ඩ වලින් පුරවාගත් ඔහු මුස්ලිම්වරුන් වාසය කරන ජනාකීර්ණ වීදියකට ගියේ ය. ඔහුගේ ඉලක්කය වුණේ උදෑසන පාසල් යන මුස්ලිම් දරුවන් ය. බොහෝ පමා වී ඔහුගේ තුවක්කුව සිඳුණු විට ඔහු පොලිසියට යටත් විය. නමුත් ඒ වන විට සිය ගණනක් ලෙයට ලෙයින් වන්දි ගෙවා තිබිණි. (එක ද සිංහලයෙකු හෝ තමනට 1984 න් පසු එල්ල වූ සමූහ ඝාතන 229කදී මෙලෙස ලෙයට ලෙයින් පළිගැනීමට ක්‍රියා කර නැත. ලංකාව ලෙබනනය නොවේ.)

ලෙබනනය බොහෝ අරාබි රටවල් මෙන් ම ඓතිහාසික ජාතියක නිර්මාණයක් නොවේ. එය ප්‍රංශ අධිරාජ්‍යවාදයේ නිර්මාණයකි. පැරණි සන්ජවුක් ප්‍රදේශය විශාල කිරීමෙන් ප්‍රංශය එය බිහි කළේ මැද පෙරදිග ඔවුන්ගේ සුපිරි වෙළඳසැල කරගැනීමේ අරමුණිනි. මේ නිසා ම ලෙබනනයේ ජන සංයුතිය තමන්ට හිතකර ලෙස පවත්වා ගැනීමට ප්‍රංශය ක්‍රියා කළේය. ජනගහණයෙන් 30% ක් මැරෝනයිට් කතෝලිකයන් ය. ග්‍රීක කතෝලිකයන්, ග්‍රීක ඕර්තෝඩොක්ස් කිතුනුවන්, ආර්මේනියානු කතෝලිකයන්, ප්‍රොතෙස්තන්ත ආදී විවිධ කිතුනු නිකායන්ට අයත් ජන කණ්ඩායම් විශාලතම ජනවර්ගය වෙති. ඔවුන් ආර්ථික හා සමාජයීය අතින් ද ශක්තිමත් තත්ත්වයකට ගෙන ඒමට ප්‍රංශය කටයුතු කළේය. සුන්නි හා ෂියා මුස්ලිම්වරු ද හරි හරියට සිටිති. ඔවුනතර පවතින සදාකාලික බෙදීම නිසා ඉස්ලාමයට ලෙබනනයේ ඇත්තේ දෙවෙනි තැනය. ලෙබනනය අරාබියේ ඇති එක ම කිතුනු රාජ්‍යය ලෙස සැලකීමේ වරදක් නැත. (ස්ථාවර කිතුනු ජනතාවක් සිටිනා අනෙක් රට ඊජිප්තුව යි.) එහි පළමු සියවසේදී ම ශාන්ත මැතිව් විසින් ක්‍රිස්තියානිකරණය කළ ජන කණ්ඩායමක් වාසය කරති. ඔවුහු ඉස්ලාමීය ව්‍යාප්තවාදය උච්චස්ථානයේ තිබෙනවිට පවා තම අනන්‍යතාවය රැකගත්තෝ ය.)

මුල් කාලයේ දී ලෙබනනයේ පරිපාලනය සිදු වන්නේ ද ආගමික අනුපාතය මත ය. පාර්ලිමේන්තුව සකස් වී තිබුණේ ද ඒ අනුව ය. ජනාධිපතිධුරය අනිවාර්යයෙන් ම මැරෝනයිට් කතෝලිකයන්ට ලැබේ. අගමැතිකම වරින්වර සුන්නි හා ෂියා මුස්ලිම්වරුන්ට ලැබේ. සෙසු කිතුනු නිකායන්ට ද ඇමති ධුර ඇත. ඊශ්‍රායලයේ මෙන් ආගමික අධිපතිත්වයක් නැතත් ආර්ථිකයේ දී හා දේශපාලනයේ දී ප්‍රමුඛත්වය කිතුනුවන්ට හිමි වී ඇත.

මැරෝනයිට් කතෝලිකයන්ගේ ආරම්භය ජෝන් මාරොන් නිසා (350-433) ඇති වේ. ඔහු රෝම අධිරාජයෙකු වූ හෙරක්ලියස් වෙතින් වෙන ම කිතු පුනර්උපත පිළිබඳ මතයක් ඉදිරිපත් කළේය. ඔවුන් තමන්ගේ ම වූ බිෂොප් පදවි පවත්වා ගන්නා අතර, පාප්තුමා යටතේ ද වෙසෙති. මෙවැනි ස්වාධීනත්වයක් චීන කතෝලික සභාවට ද ඇත.

කෙසේ වෙතත් ලෙබනනයේ කිතුනු රාජ්‍යය දුර්වල එකකි. මේ නිසා මුස්ලිම්වරු නිරන්තරයෙන් ම තමන්ට ද ජනාධිපති ධූරය අවශ්‍ය බව කියති. නසාර්වාදී සුළඟ නිසා 1958 දී ක්‍රිස්තියානි විරෝධී මුස්ලිම් කැරැල්ලක් ද ඇති විය. ජනාධිපති චාමුන් බලය බෙදා හදා ගැනීම කල් යැවුවේ ය. 1967 යුද්ධයෙන් අරාබීන් හා පලස්තීනුවන් ලත් අන්ත පරාජය නිසා වඩාත් ම අවුලට ගියේ ලෙබනනය ය. දහස් ගණන් පලස්තීනුවන් අනාථයින් ලෙස ලෙබනනයට කඩා වැදුනු අතර, 1968 දී ඇති වූ පලස්තීන නැඟිටීම හා ත්‍රස්තවාදී ප්‍රහාරවල පදනම් බිම බවට ලෙබනනය පත් විය. 1968 දී චාමුන් ඝාතනයට ද තැත් දැරිනි.

පලස්තීන ත්‍රස්ත ප්‍රහාර නිසා කෝපයට පත්වන හුසේන් රජු ජෝර්දානයේ සිට වැට පැන ලෙබනනයට ඇතුළු වී එහි වූ පලස්තීන ත්‍රස්ත කඳවුරුවලට පහර දුන්නේ ය. (1970-71) මෙයට සිරියාව ද මැදිහත් වීමෙන් රටේ සිවිල් යුද්ධයක් ඇති වේ. 1973 ඊශ්‍රායල් යුද ප්‍රහාර නිසා තත්ත්වය තවත් බරපතල වේ. 1975 දී ක්‍රිස්තියානි ත්‍රස්ත ව්‍යාපාරයක් බිහිවේ. එයට ප්‍රංශය හා බටහිර රටවල් උපකාර කරති. පසුව 1976 දී සිරියානු හමුදා මැදිහත් වී ලෙබනනයේ ක්‍රිස්තියානි ආධිපත්‍යය බලයෙන් බිඳ දමයි. මුස්ලිම් ජනාධිපති කෙනෙකු පත් කෙරේ. (සුලේමාන්) ඉන් පසු ලෙබනනයේ අයිතිය වෙනුවෙන් බටහිර රටවල්, ඊශ්‍රායලය, සිරියාව හා පලස්තීනුවෝ යුද වදිති. එය එක ම ආගමික සටනක් වේ.

අන්තිමේදී එක්සත් ජනපද හමුදා ලෙබනනයට යැවේ. ෂියා හිස්බුල්ලා හා සුන්නි හමාස් ත්‍රස්ත කල්ලි බිහි වේ. අල්කයිදා ද ලෙබනනයට යයි. හිස්බුල්ලාවරුන්ගේ මරාගෙන මැරෙන ප්‍රහාරවලට ඉරානයේ සහය ලැබේ. දීර්ඝ විනාශයන්ගෙන් පසු එ. ජනපදය පසුබැස ලෙබනනයෙන් ඉවත් ටවී. ලෙබනනය පලස්තීන ත්‍රස්ත කල්ලි හා කිතුනුවන් අතර බෙදී යයි.

ඓතිහාසික හෝ පසුව ඇති වූ සිදුවීම්වලින් ලෙබනනය ලංකාවට සමාන නැතත් ලංකාවේ අනාගතය බොහෝ දුරට ලෙබනනයේ මෙන් වීමට ඉඩ තිබේ.

ලෙබනනය ඊශ්‍රායලය විසින් ආක්‍රමණය කිරීමත් හිස්බුල්ලාවරු එයට දැඩි ප්‍රතිප්‍රහාර දීමත් සමඟ පලස්තීන කලාපයේ යුද්ධ තුලිතතාවය සඳහා හිස්බුල්ලා හෙවත් දෙවියන්ගේ පක්ෂය නැමති ෂියා සංවිධානය අතිශය වැදගත් වී ඇත.

## ගල්ෆ් රටවල් (කුවේට්, බහරේන්, ක්වාටර් හා එ.අ.එ.(UAE)

කුමාරිකාව හා නාවිකයා (Princess and Mariner) නැමැති චිත්‍රපටය එ. ජනපදයේ බොහෝ ජනප්‍රිය වූවකි. එහි කතාව මෙසේ ය. බහරේනයේ සේවය සඳහා එ. ජනපදයේ නාවික සෙබලෙකු යයි. දිනක් ඔහුගේ දුරකතනයට ඒ රටේ රාජ කුමාරියක් කතා කරයි. ඇය සිය නිවසේ සාංකාව දරා ගත නොහැකිව දුරකතන මඟින් ඔහේ මිතුරු මිතුරියන් අමතන්නියකි. ඒ දුරකතන ඇමතුමෙන් පසු ඔවුහු සුපිරි වෙළඳසැල් වලදී හමුවෙති. ඔවුනතර ඇතිවන ආදරය කෙතරම් ද යත් එ. ජනපද නාවිකයා සිය සාම සාධක මෙහෙය අවසන් නර සිය රට යද්දී සිය අරාබි කුමාරිකාව ද වෙස්ගන්වාගෙන සිය රට ගෙන යයි. බහරේනයෙන් ලැබුණු පණිවිඩයක් සමඟ ඔවුහු එ. ජනපද ගුවන් තොටුපලේ දී අත්අඩංගුවට ගැනෙති. කුමරිය නැවත සිය රජ මාලිගයට යෑම ප්‍රතික්ෂේප කරයි. එවිට ඇය කුඩා සිර මැදිරියකට දමන අතරේ එ. ජනපද නිලධාරියා මෙසේ කියය.

''... ඔබේ මාළිගයේ සම්පත් ගැන සිතන කොට ඔබ කොහොමද මේ සිර කූඩුවක ඉන්නේ. තවමත් ඔබ පමා නැහැ. දැන්වත් තීරණය කරන්න. බහරේනයේ මාලිගය ද නැත්නම් මේ සිර කූඩුව ද?..''

පිළිතුර ඉතා කෙටි එකකි.

''. එහෙත්, මම හිටියේ මීට අන්ත නැතක තමා..''

එම චිත්‍රපට කථාව සත්‍ය සිද්ධියක් පදනම් කරගෙන සිදුකළ නිර්මාණයකි. එයට සමාන සිද්ධියක් ලංකාවේ තරුණයකුට ද සිදු විය. ඔහු හා සමඟ ලංකාවට පලා ආ රජ කුමරියක් නැවත බලයෙන් ඔවුන්ගේ පියාට අයත් ජෙට් යානයකින් රැගෙන යනු ලැබීය.

ගල්ෆ් කලාපයට රටවල් හතරක් ඇත. ඒ කුවේට්, බහරේන්, ක්වාටර් හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය යි. මේවා එකක්වත් ඓතිහාසික රාජ්‍ය නොවේ. බ්‍රිතාන්‍යය ප්‍රමුඛ යුරෝපීයයන් විසින් තමන්ගේ තෙල් හා

වෙළඳ මධ්‍යස්ථාන ලෙස ගොඩ නැංවූ රටවල් ය. මේ රටවල් බටහිරකරණයට ගොදුරු වූ රටවල් ය.ඇතැම් ඒවා ඉරාකයේ, ඉරානයේ හා පැරණි අරාබියේ කොටස් ලෙස පැවතිණ. සුවස් ඇල හරහා නාවික ගමනාගමනය ඇරඹීමත්, පසුව ඇති වූ තෙල් වෙළඳාමත් නිසා බ්‍රිතාන්‍යයත්, ප්‍රංශයත් මේ ප්‍රදේශවල බලය තහවුරු කරගති. 1798 දී ඔවුන් මස්කට් සමඟ ගිවිසුමකට ආහ. ඉන්පසු මුහුදේ ආධිපත්‍යය පවත්වා ගත්තෝ ය. ඔවුන්ට 1930 න් පසුව තෙල් සම්පත පිළිබඳ බව වැටුණි.

කුවේට් ප්‍රාන්තය 1896-1915 කාලය තුළ ෂෙයික් මුබාරක් විසින් පාලනය කරන ලදී. ඔහුට බ්‍රිතාන්‍යය ආරක්ෂක දැලක් තිබිණ. (1899 ගිවිසුම) ඔටෝමන් බලපෑම ද නොතිබුණා නොවේ. පළමු ලෝක සංග්‍රාමයෙන් පසු තුර්කි ඔටෝමානය බිඳවැටීමත් සමඟ කුවේටය බ්‍රිතාන්‍යයේ අනුහසින් වෙන ම රාජ්‍යයක් ලෙස සංවිධානය වේ. ඒ අනුව බ්‍රිතාන්‍ය මැදිහත් වී සවුදි අරාබි ප්‍රදේශ හා ඉරාකය දෙසින් දේශ සීමා තීරණය කරයි. මෙය ඇතැම් ඉරාක පාලකයින් තවමත් සලකන්නේ රට බෙදීමක් ලෙසයි.

1938 දී බ්‍රිතාන්‍යය - ඇමෙරිකානු කුවේට් තෙල් සමාගම එහි තෙල් සොයා ගනී. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු බලයට එන ෂෙයික් අබ්දුල්ලා කුවේටය ඉස්ලාමය මත ම බටහිරකරණය කරයි. විශේෂයෙන් අධ්‍යාපනය බටහිරකරණයට හසුවන අතර, කාන්තාවන් ඉස්ලාම්කරණයට යොමු කෙරේ. රාජ්‍ය බලය සාබා රජ පවුල මත තබා ගනී. පසුව සාබා රජ පවුල 1899 බ්‍රිතාන්‍යය - කුවේට් ගිවිසුම ඉවත් කර 1961 දී කුවේටය නිදහස් ස්වාධීන රාජ්‍යයක් බවට පත්කරති. එවිට ඉරාකයේ කාසිම් කුවේටයට අයිතිය කියයි. ඉවත්ව ගිය බ්‍රිතාන්‍යය හමුදා යළි එයි. ඉන්පසු එක්සත් අරාබි ලීගයේ හමුදාවක් කුවේටයේ රඳවනු ලැබේ.

කුවේටය අයත්වන්නේ ලෝකයේ ධනවත් යැයි සැලකෙන රටවල් අතරට ය. මේ ගණයට වැටෙන අනෙක් රටවල් වන්නේ ද ගල්ෆ් රටවල්ය. මුස්ලිම් ලෝකයෙන් ම ඒ තත්ත්වය ලැබී ඇත්තේ ඔවුන්ට හා බෲනායි රටට පමණි.

කුවේටයේ ජනගහණය ලක්ෂ 18 කි. (1999). මෙය 2015 දී ලක්ෂ 28ක් වනු ඇතැයි පැවසේ. එහි ඒක පුද්ගල ආදායම (1999) ඩොලර් 17289 ක් විය. (PPP) නමුත්, එය 1990-99 කාලයේ ඍණ 1.5% ක පසු බෑස්මක් පෙන්වා ඇත. මානව සංවර්ධන දර්ශකය අනුව එයට ලොවේ 43 වැනි ස්ථානය හිමිව ඇත.

සාබා රජ පවුලට ද නසාර්වාදයේ සුළඟ දැනේ. ඒ නිසා ඔවුහු ව්‍යවස්ථාවක් තනා ව්‍යවස්ථාදායක සභාවකට ඡන්දය විමසති. 1967 පැවැති ප්‍රථම මැතිවරණයේ දී ඡන්ද අයිතිය ලැබුණේ පිරිමින්ට පමණ ය. රාජ්‍යත්වයට එරෙහිවත්, ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කරන ලෙසත්, කාන්තාවන්ට ඡන්ද අයිතිය දෙන ලෙසත් උද්ඝෝෂණ පැන නැඟිණි.

1967 අරාබි- ඊශ්‍රායල් යුද්ධයෙන් පසු කුවේටයේ ධනය යුදවන්දි ලෙස පරාජිත අරාබි රටවලට යැවිණි. කුවේටය සතුව තවමත් සවුදියට පමණක් දෙවැනි තෙල් සම්පත් පවතී.

එක්සත් ජනපදය විසින් අටවනු ලැබූ යුද උගුලකට හසු වූ සදාම් හුසේන් 1990 අගෝස්තුවේ දී ඉරාක වැට පැන කුවේටය ආක්‍රමණය කළේය. ඉරානයට පහරදීම සඳහා තමන් විසින් සන්නද්ධ කළ සදාම්ගේ තටු කැපීමේ උපායක නියැලුණු එ. ජනපදය සදාම්ට පහර දෙයි. (එහෙත් 1991 ගල්ෆ් යුද්ධය සඳහා වැය වුණු ඩොලර් බිලියන 61න් 90%ක්ම සවුදිය, කුවේටය හා දැන් ගල්ෆ් රටවල් ගෙවා දමා ඇත.)

එහෙත් සදාම් නැති නොකරන්නේ මෝඩ සවුදි රජපවුල හා කුවේටය තවදුරටත් බිය කරමින් ඔහුට සිටින්නට ඉඩහරින්නට ය. එමගින් එ. ජනපදයට ගල්ෆ් කලාපයේ සිටීමට හොඳ හේතුවක් ද, ඔවුන්ගේ යුද වියදම් අරාබි තෙල් සල්ලිවලින් ගෙවා ගැනීමේ ආර්ථික උපායක්ද එක විට ඉටු වේ. බුෂ් (කණිෂ්ඨ) එන තෙක්ම, එ. ජනපදයේ උපාය වූයේ එයයි.

සවුදියෙන් එපිටට වූ කුඩා දිවයින් රැසකගෙන් බහරේන් රට සමන්විත වේ. එහි ඇති වැදගත් ම ගුණය නම් එයට ඇති තරම් ස්වභාවික ජලය තිබීම යි. මේ නිසා ම එහි වසර දහස් ගණනක සිට ජනාවාස පවතී.

බහරේනයේ ජනගහනය ලක්ෂ 6කි. (1999) 2015 දී එය ලක්ෂ 8ක් වනු ඇතැයි සිතනු ලැබේ. එහි ඒක පුද්ගල ආදායම ඩොලර් 13688 කි.(ppp) මානව සංවර්ධන දර්ශකයේ එය ලොවේ 40 වන තැන සිටී.

1934 දී බ්‍රිතාන්‍යය - ඇමරිකන් තෙල් සමාගමත් බහරේනයේ තෙල් සොයා ගනී. එය එවැනි මුල් ම සොයාගැනීමයි. මේ නිසා බහරේනය බ්‍රිතාන්‍යය යටතේ ම පවත්වා ගනී. නමුත් ඉරානය විසින් විටින් විට එයට අයිතිය කියයි. රජ පවුලක් බහරේනයේ නිල පාලකයා ලෙස බ්‍රිතාන්‍යය පවත්වා ගනී. අධ්‍යාපනය, ප්‍රවාහනය ආදී ක්ෂේත්‍රවල බ්‍රිතාන්‍යය නවීකරණයක් කරයි.

නමුත් නොවැළැක්විය හැකි ලෙස අරාබි ජාතිකවාදයට එයත් හසුවේ. බහරේනයේ ගැටුම වන්නේ එහි ජනයා බහුතරය අරාබි නොවන ෂියා දහම අදහන නමුත් රජ පවුල අරාබි සුන්නින්නට අයත්ව තිබීම ය. 1956 සුවස් අර්බුදයට ද එය හසුවේ. 1970 දී එක්සත් ජාතීන් බහරේනය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගනී. 1971 සිට බ්‍රිතාන්‍යය හමුදා ඉවත් වේ. නමුත් පසුව ඒ වෙනුවට එක්සත් ජනපද හමුදා එයි. ඉරාන විප්ලවලයත් සමඟ බහරේනයට ද එහි සුළඟ එයි. කුමේනිවාදී ෂියා නැගිටීමකට එය ගොදුරු වුවද බටහිර ලෝකයේ උපකාර නිසා එය පාලනය වේ.

ක්වාටර් කලක් වහාබිවාදයේ පදනම් භූමියක් විය. 1950 ගණන්වල බ්‍රිතාන්‍යය මැදිහත්වීමෙන් එහි තෙල් සම්පත සොයා ගැණිනි. එහි ද ජනගහණය ලක්ෂ 6 කි. (1999) ඒක පුද්ගල ආදායම ඩොලර් 18789 කි. (ppp-1999) රජ පවුලක් විසින් පාලනය විය. 1972 ඇති වූ කුමන්ත්‍රණයකින් පසු රජු වූ ෂෙයික් කලීෆා යටතේ ක්වාටර් වේගයෙන් බටහිරකරණයට ගොදුරු විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයට කුඩා රටවල් 7ක් අයත් වේ. අබුඩාබි, ඩුබායි, සාජා, අජ්මාන්, ෆුජ්යිරා, ආස් අල්කමියා, උම්මි අල් කුබනි ආදිය ඒවා ය.

1955 දී බ්‍රිතාන්‍යයන් විසින් සවුදි අරාබියේ සේනාංක මේ ප්‍රදේශවලින් ඉවත්කර තමන්ගේ පරිවාර රාජ්‍යයක් ඇති කරනු ලැබීය. 1960 දී මේ ප්‍රදේශවලින් ද තෙල් සම්පත ලැබිණි. අබුඩාබියේ විෂු ෂෙයික් ශාක්බාට් පිළිබඳ කතාව මේ ප්‍රදේශවල පාලකයින් හා ජනතාව පිළිබඳ විස්තරයක් අපට සපයයි.

තෙල් සොයාගැනීමට පෙර අබුඩාබියේ පාලකයා වූයේ ෂෙයික් ශාක්බාට් ය. තෙල් සොයා ගැනීමත් සමඟ ඔහුට කෝටි ගණන් මුදල් ලැබෙන්නට විය. ඔහු ඒ මුදල් පරිස්සම් කිරීම සඳහා බ්‍රිතාන්‍යය බැංකුවකට භාර දෙයි. තම මුදල්වල අගය ඉහළින් සැලකූ ශාක්බාට් සුපුරුදු ලෙස අසල කඩයකට සිය සේවකයා යවා රොටී ගෙනවිත් ආහාරයට ගත් බව කියැවේ. කොටින් ම ඔහු බ්‍රිතාන්‍යයට යනවිට පවා සියළු ආහාර සිය ගුවන් යානයේ ම ගෙන ගියේ ය. වරක් රාත්‍රියේ සිය මුදල් තැන්පත් කර ඇති බ්‍රිතාන්‍යය බැංකුවට ගිය ඔහු තමාට වහාම තම මුදල් සල්ලි ලෙසම ගබඩා කර ඇති ආකාරය දැකගත යුතුයැයි කියා සිටියේය. කල්පනාකාරී නොවූ බැංකු කළමනාකරු කියා ඇත්තේ ශාක්බාට්ගේ මුදල් ආයෝජනය කර

ඇති බවත්, නමුත් ඔහුට අවශ්‍ය නම් හෙට උදයේ සල්ලි ගත හැකි බවත් ය. කෝපයට පත් ශාක්බාට් බැංකුවට ගිනි තැබීමට සැරසුණු බව කියැවේ.

පැරණි ඉස්ලාමීය වත් පිළිවෙත් අනුව ජීවත් වූ ශාක්බාට් වැනි රජ කුමාරවරුන්ට තෙල් සල්ලිවල බලය තවමත් වැටහී නැතුවාට සැක නැත.

1966 දී අබුඩාබියේ පාලකයා වූ ෂෙයික් සායිද් බ්‍රිතාන්‍යය හා එක් වී ඉක්මනින් ම රට බටහිරකරණය කළේය. 1971 දී එක්සත් අරාබි එමීර් රාජ්‍යය බිහි කිරීමට ද පුරෝගාමී විය. බ්‍රිතාන්‍යය හමුදා ඉවත් වූ විට ඉරානය (ෂාරජ්) සිය හමුදා යවා කුඩා දූපත් දෙකක් (තම්බ් හා අබුමුසා) අත්පත් කරගත්තේය.

අරාබියේ සිංගප්පූරුව බවට අබුඩාබිය හා ඩුබායි පත් විය. නවීන වෙළඳ නගරයක් බවට ද නාවික හා ගුවන් මධ්‍යස්ථානයක් බවට ද ඒවා පත්විය. ඇතැම් ඉස්ලාම් මූලධර්මවාදීන් කියන්නේ අරාබි මුස්ලිම් ලෝකයත් - ගිනිකොණ දිග ආසියා මලයා - ඉන්දුනීසියා මුස්ලිම් ලෝකයත් යා කෙරෙන මුස්ලිම් වෙළඳ මධ්‍යස්ථානයක් බවට ඔලුවිල් හා නැගෙනහිර පළාතේ නසරිස්තානය පත් කළ යුතු බවයි. ඒ සඳහා සුදුසු ම ස්ථානය මාලදිවයින නොව ඔලුවිල් බව කියැවේ. අෂ්රෆ් විසින් ඔලුවිල් හි වරායක් හා විශ්ව විද්‍යාලයක් තැනුවේ තවත් අබුඩාබි - ඩුබායි නගරයක් තෙල් සල්ලිවලින් දීඝවාපියේ ඉදිකිරීමට ද?

තුන්වැනි පරිච්ඡේදය

# සියොන් වාදය
# මොසෙස්ගේ සිට මෝෂේ දක්වා

## ඊශ්‍රායලය හා පලස්තීනය:

ඩී. දිනය : ජුනි 05 1967, එච්. පැය 07.45

''..... උදෑසන 7.30 වෙත්ම මම ගුවන් හමුදාවේ අණ දෙන මූලස්ථානයේ සිටියෙමි. සියළු දෙනාම සිටියේ දැඩි ආතතියකිනි. එක ම ඇසක්වත් යුද සැලැස්ම සහිත මේසයෙන් පිටට නොගියේ ය. එක් කණක් හෝ රේඩියෝ පණිවිඩවලින් ඉවතට නොගැණිනි. එකින් එක ප්‍රහාරක යානා හිමිදිරි අහස තුළින් ඊජිප්තු සතුරු රේඩාර්වලට හසුනොවන තරම් පහළින් සිනායි කතර හරහා පියාඹන්නට විය. මගේ හදවත ලොකු බරකින් නිදහස් වූවා සේ දැනුණේ එකම යානාවක් හෝ හඳුනා ගැනීමෙන් තොර ව ඊජිප්තු සීමවාන්ට පැමිණි බවට ගුවන් විදුලි පණිවිඩ ලැබීමත් සමඟ ය. දෙවියන්ට ස්තූති වේවා! ඊළඟට මම අණ දුන්නෙමි. ''නෂෝනිම් පහරදෙනු, ජය ! (නෂොන් යනු යුදෙව්වන් සිය රටින් විප්‍රවාස කරනා විට රතු මුහුදට මුලින්ම බට නායකයා ය. සෙසු ඊශ්‍රායල් දරුවෝ ඔහු අනුගමනය කළහ.) ඒ හා සමඟම මම රබින් අමතා යුද ටැංකි හා ප්‍රහාරක බල ඇණි පෙරට යවන ලෙස අණ දුන්නෙමි.

පැයක් අතැළත නියමුවෝ අප අමතන්නට වූහ. සිය ගණනක් සතුරු යානා ගුවන්තොටවලදී ම විනාශ වී ඇත. ගුවන් මිසයිල පද්ධති

එහෙම පිටින් ම වගේ අඩපණ කර ඇත. ඔව් අපි සතුරන්ගේ (අරාබි) වීරයා වූ ගමල් අබ්දුල් නසාර්ගේ ගුවන් බලය පැයක් ඇතුළත වනසා අවසන් ය. අපි සැලසුම් කළ ලෙස ම ඊජිප්තු නියමුවන් උදයේ යාඥාවලි නියැළීමෙන් පසු සේවය සඳහා වාර්තා කර තිබුණේ නැත. ඉදිරි දින කීපය තුළ ඊශ්‍රායලය සිතියමෙන් අතුගා දමන බැව් කියූ නසාර් පවා සුව නින්දේ ය. ආමේන් !

අපි ඊජිප්තු ගුවන් තොටුපළවලට රැළි දෙකකින් ප්‍රහාර එල්ල කළෙමු. පළමු ප්‍රහාරක රැල්ලට (7.45) අපේ ගුවන්යානා 183 ක් එක් විය. උදේ 8.55 වන විට ඔවුන් ඊජිප්තුවේ හමුදා මධ්‍යස්ථාන 11කට පහර දී තිබිණි. 197 ක් සතුරු යානා විනාශ කෙරිණි. එයින් 189ක් ම විනාශ කෙරුණේ ගුවන් තොටුපළවලදීම ය. රේඩාර් මධ්‍යස්ථාන 16 ක් ද විනාශ කෙරිණි. දෙවැනි ප්‍රහාරක රැල්ල වඩා පහසු විය. උදේ 9.43 වන විට සතුරු රේඩාර් ගැන බියක් නොවීය. සහමුලින් විනාශ වූ ගුවන් මූලස්ථාන මඟහැර උදෑසන අවධි වෙමින් තිබෙන මධ්‍යස්ථාන අපේ ඉලක්කයන් විය. අපේ යානා 164 ක් එයට සහභාගි විය. ඔවුහු ගුවන් මධ්‍යස්ථාන 14 කට පහර දී ගුවන් යානා 107ක් විනාශ කළෝය. පැය දෙකක සටනකින් සිය ගුවන් යානා 419 න් ඊජිප්තුවට ඉතුරු වූයේ 115 ක් පමණි. ඔවුනට ද කළ හැකි කිසිවක් ඉතිරි වී තිබුණේ නැත. අපි සටනේ පළමු පියවර ජයගෙන තිබිණි. ඊශ්‍රායලය යටත් කිරීමට මුස්ලිමුන්ට යළි හැකිවන්නේ නැත....''

''.....මලේ බාල ම පුතා අසාප් එදින මට කතා කළේ ය. ඔහු සිනායි ඉදිරි පෙරමුණේ මෝටාර් ප්‍රහාරකයෙකු ලෙස කටයුතු කළේ ය. ආරක්ෂක ඇමති වූ මගේ සුව දුක් විමසූ ඔහු ඔවුන් ඊජිප්තු බල ඇණි කඩාගෙන ඉදිරියට යන බව කීවේ ය. ඔහු සිනාවෙමින් කීවේ ඔහුගේ නිලධාරීන් ගැන ය. එක් අයෙක් අන්ත දක්ෂිණාංශික පක්ෂයක ක්‍රියාධරයෙකි. ඔහුගේ මතය වන්නේ අපි වැඩි වැඩියෙන් අරාබි ප්‍රදේශ අල්ලා ගත් තරමට ඊශ්‍රායලයේ ආරක්ෂා සැලසෙන බව ය. ඔහුගේ දෙවැනියා වූ නිලධාරියාගේ අදහස් වාමාංශිකය. ඔහු කියන්නේ අපි බිම් අල්ලාගත යුත්තේ ඒවා පසු ව ලබා දී ස්ථිර සාමයක් ඊශ්‍රායලයට ලබා ගැනීම සඳහා බව ය. ඔවුන් දෙදෙනා ම සිනායි කතරේ ඊජිප්තු කොමාන්ඩෝ බල ඇණිවල පහරදීම් මෙහෙයවති. වම-දකුණ දෙක ම රට වෙනුවෙන් යුද බිමේ ය. ආරක්ෂක ඇමතිත් ඔහුගේ දරුවනුත් වෙනසකින් තොරව ජාතිය වෙනුවෙන් සටන් වදිති. මෝසෙස්ගේ යුදෙව් ජනතාව දෙවියන් තෝරාගත් පිරිසකි. ඔවුන් පරදින්නේ නැත.

මෝෂේ දයාන් - මගේ කතාව)

පසුගිය සියවසේ දෙවන භාගයේ පලස්තීන - ඊශ්‍රායල් ගැටුම තරම්

කතාබහට ලක් වූ ගැටුමක් තවත් නොවීය. එයට හේතුව වූයේ තෙල් නිධිවලනි" පිරී ගිය මැදපෙරදිග ඇති වූ යුදෙව් රාජ්‍යයක් එයට පෙරළා මුස්ලිම්වරුන් දැක් වූ සතුරු භාවයත් ය. මුස්ලිම්වරුන් කියන්නේ අරාබීන් සතුව තිබූ පලස්තීනය නම් ඓතිහාසික රට යුදෙව්වන් උදුරාගත් බව ය. එයට එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදය උපකාර කළ බව ය. ඒ නිසා පලස්තීනුවෝ තම අරගලය තමන්ගේ රට ආක්‍රමණිකයාගෙන් මුදා ගැනීමේ ජාතික විමුක්ති අරගලයක් ලෙස සිතති. ඊශ්‍රායලුන් කියන්නේ ලෝකයේ ඉපැරණි ම රාජධානිය තම රට වූ ඊශ්‍රායලය බව ය. එය විවිධ අධිරාජ්‍යවාදීන් විසින් විනාශ කළ මුත් 19 වන සියවසේ අග භාගයේ පහළ වූ සියෝන්වාදී ව්‍යාපාරය විසින් තම ඓතිහාසික දේශය රටක් නොමැති ව රටවල් 86 ක අතරමං වී සිටි යුදෙව්වන්ට ලබා දුන් බව ය. අරාබි මුස්ලිම්වරුන් කැරැල්ල අසාධාරණයක් බව ඔවුහු කියති.

යුදෙව් ආගම ඉතා ම පැරණි ආගමකි. ලෝකය මැවූ තනි දෙවියෙකු පිළිබඳවත් ඒ දෙවියා තෝරාගත් ජනතාව (ඊශ්‍රායල්) පිළිබඳවත් විශ්වාසය එහි පදනම යි. බයිබලයේ මුල් ගිවිසුමේ යුදෙව් ආගමේ පදනම යි.

වර්ෂ 1800 දී ලොව පුරා රටවල් (වත්මන් අරුතින් 86ක) ගණනාවක යුදෙව්වෝ වාසය කළහ. ඔවුන් බොහෝ දෙනා දහස් වර්ෂ කීපයක සිට මැදපෙරදිගින් සංක්‍රමණය වූවන් ය. එහිදී ඔවුන්ගේ මුළු ජනගහණය මිලියන 3.28 ක් විය. මෙයින් සාතිශය බහුතරය යුරෝපයේ හා රුසියාවේ (83.2%) වාසය කළහ. මැදපෙරදිග (9.1%) හා අප්‍රිකාව (7.3%) අනෙක් ප්‍රධාන වාස භූමි විය. යුදෙව්වන් අයත්වූයේ සෙමටික් වර්ගයට යි.

1993 දී ලොව පුරා යුදෙව් ජනගහණය මිලියන 17.8 ක් විය. මෙයින් සාතිශය බහුතරය වාසය කළේ එ. ජනපදය ප්‍රමුඛ උතුරු ඇමෙරිකාවේ ය. (48.2%) ඊළඟට වැඩි ම පිරිසක් නව ඊශ්‍රායලයේ (22.9%) වාසය කළහ. යුරෝපයේ (19.9%) එහා මැදපෙරදිග(6.4%) ද යුදෙව්වෝ වාසය කරති. මේ අනුව යුදෙව්වන්ගෙන් 3/4කටත් වැඩි ප්‍රමාණයක් වාසය කරන්නේ ඊශ්‍රායලයෙන් පිටත වුවත් ලොව පුරා යුදෙව්වන් සිය මුල රට ලෙස දකින්නේ ඊශ්‍රායලය යි.

හීබෲ බසින් වූ යුදෙව් බයිබලයට එකඟතාවයක් ඇති වුණේ ක්‍රි.පූ. 100 දී ජර්මේනියාවේ දී ඇති වූ යුදෙව් ආගමික සමුළුවකිනි. එයට පෙර විවිධ ලිඛිත හා පරම්පරාගත ආකාරයට අඩු තරමින් වසර දහසකට එපිට සිට යුදෙව් ආගම පැවැති බව විශ්වාස කෙරේ.

යුදෙව්වන්ගේ මූලික ආගමික මධ්‍යස්ථානය තිබුණේ වත්මන් ඊශ්‍රායල් භූමිය තුළම ය. එහි හීබෲ බව කතා කළ ඓතිහාසික රාජ්‍යයක් පැවතිණ. ක්‍රි.පූ. 586 දී බැබිලෝනියානුවරු එය ආක්‍රමණය කර යුදෙව් පල්ලිය විනාශ කළෝ ය. නමුත් ආපසු පැමිණෙන යුදෙව්වෝ එය නැවත ඉදි කරති. (ක්‍රි.පූ. 538-515) ඉන් පසු යුදෙව්වන්ය පර්සියානු ආක්‍රමණ එල්ල වේ. ප්‍රධාන වශයෙන් ම සරතුෂ්ත ආගමේ බලපෑම ඇති වේ. ඇතැම් විට බුද්ධාගමේ බලපෑම ද ඇති වන්නට ඇත. නිරපේක්ෂ දෙවියෙකු හා මැවුම්කාරයෙකු පිළිබඳ අදහස යුදෙව්වෝ රැකගනිති. මිනිස් අත්දැකීමට හසු නොවන නිරපේක්ෂ සංකල්පවල පදනම යුදෙව් ආගමික දර්ශනයෙන් ලැබිණි. ඉන්පසු ග්‍රීක බලපෑම ද ඇති වේ. හීබෲ බයිබලය ග්‍රීකයට ද නැගේ.

ක්‍රි.පූ. 67 දී රෝමය යුදෙව් භූමි- පලස්තීනය- අල්ලා ගනී. යුදෙව්වන් එයට එරෙහිව අසාර්ථක ව නැගී සිටි මුත් කැරැල්ල දරුණු ලෙස මර්ධනය කෙරේ. රෝමවරු යුදෙව් පල්ලිය වනසති. යුදෙව්වෝ රටින් පලායති. පරාජිත යුදෙව් මනස තුළ ජේසුස් ක්‍රිස්තුස් මතුවන්නේ. ක්‍රිස්තුන්ගේ නව දහමට එරෙහිව යුදෙව්වෝ නැගි සිටිති. යළි යළිත් යුදෙව්වන් කැරළි ගසන අතර, ක්‍රි.ව. 131-135 අතර ජෙරුසෙලමෙන් යුදෙව්වෝ සහමුලින් පිට මං කෙරෙති.

ක්‍රි.ව. 323 දී කොන්ස්ටන්ටයින් යටතේ ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත්වේ. ඒ හා සමඟ ම වෙනත් ඇදහිලි 400කට අධික ප්‍රමාණයක් විනාශ කෙරේ. ජෙරුසලම ක්‍රිස්තියානි ශුද්ධ නගරයක් බවට පත් කෙරේ.

මහමත්තුමාගේ බලපෑම ඊළඟට එයි. ප්‍රථම මුස්ලිම් ආක්‍රමණය වර්ෂ 638 දී සිදුවේ. දරුණු ගැටුම්වලින් පසු යුදෙව්වෝ මුස්ලිම්වරුන් සමඟ ගිවිසුමකට එති. (ඔමාර් සමඟ වර්ෂ 800) ඉන්පසු යුදෙව්වන් විප්‍රවාසව එකලාව ජනවර්ගයක් ලෙස පලස්තීනයේත් සිරියාව ඇතුළු මැදපෙරදිගත් වාසය කරති. බොහෝ පිරිස් නැගෙනහිර කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයට යති. යුදෙව්වන් විප්‍රවාස වේ. හීබෲ බස ක්‍රමයෙන් මිය යයි.

ඉන්පසු පලස්තීනයේ ගැටුම ඇතිවන්නේ ක්‍රිස්තියානි හා ඉස්ලාම් මූලධර්මවාද අතරය. ජෙරුසලම අයත්කර ගැනීම ප්‍රංශයේ ක්ලෙමන්ට් කිතුනු සම්මේලනයේ දී ද එකඟ වූ ප්‍රධාන කුරුස යුද්ධ අරමුණ වේ. මුලින් ජෙරුසලම ක්‍රිස්තියානි හමුදා අතට පත් වුවද පසුව මුස්ලිම් හමුදා එය යළිත් අල්ලා ගනිති. ඉන් පසු ක්‍රිස්තියානි ප්‍රතික්‍රියාව ඇති වේ.

ස්පාඤ්ඤයේ ඇති වූ ඉස්ලාම් විරෝධී සටන් කෙලවර වන්නේ කතෝලික හමුදා ජයග්‍රහණවලින් ය. ඉන්පසු යුදෙව්වෝ ද බලයෙන් කිතුනු ආගමට ගැනෙති. එසේ නොකළ වුන් ඝාතනය කෙරෙති. (මෙය වර්ෂ 1391 දී මැරෑනාස් වලින් ඇරඹේ.)

එතැන් පටන් යුදෙව්වන් යුරෝපය තුළ පීඩිතයින් පිරිසක් වෙති. නමුත් ඔවුනගේ සංක්‍රමණික ගුණය නිසා ඔවුහු හොඳ වෙළෙන්දෝ වෙති. එමෙන් ම නිරපේක්ෂ දැනුම පිළිබඳ ආගමික හික්මීම නිසා යුරෝපීය විද්‍යාවන්ගේ ද ප්‍රවීනයෝ වෙති.

අරාබි හා ආසියානු බලපෑම නිසා යුරෝපය ධනය පදනම් කරගත් ධනවාදී සමාජයක් බිහිකරලීමේදී ද, අරාබි ආසියානු දර්ශනය හා දැනුම යුරෝපීය විද්‍යාත්මක පද්ධතියකට ගැනීමේදී ද යුදෙව්වෝ පුරෝගාමී මෙහෙයක් කළෝ ය. මෙය පෙරළා මධ්‍යකාලීන ක්‍රිස්තියානියට ද බලපෑමක් කළේ ය. මේ නිසා යුරෝපයේ නූතනවාදී විප්ලවය සිදුවුණේ යුදෙව් ලෝක දැක්ම හා සංස්කෘතිය මත ය. නමුත් ක්‍රමයෙන් යුරෝපීය ජනවර්ග ලෝකය සූරාකෑමත් සමඟ නවීන ජාතීන් (ප්‍රංශ, ඉංග්‍රීසි, ජර්මන්, ඉතාලි, ස්පාඤ්ඤ ආදී) බිහිවිය. ඔවුන් ආපසු හැරී බලද්දී වැටහී ගියේ තමන්ගේ වෙළඳාම හා විද්‍යාව යුදෙව්වන් පාලනය කරන බවය. මෙය විසිවැනි සියවසේ මැද භාගයේ ග්‍රාම්‍ය ආකාරයකින් ක්‍රියාවට නැගගූයේ හිට්ලර් ය. එහිදී හිට්ලර් කීවේ ''රටක් ජාතියක් නැති යුදෙව්වන් නිසා ශ්‍රේෂ්ඨ ආර්ය ජන කණ්ඩායම් සාප්පුකාර වෙළෙන්දන් හා මුදල් පොළියට දෙන්නන් වීම ද ජාතිය වෙනුවට ජාත්‍යන්තරවාදය ගොඩනැගීම ද, සංස්කෘතීන් තුළ විවිධ විද්‍යාවන් ගොඩනැගෙනු වෙනුවට එක විශ්වීය විද්‍යාවක් ගැන අදහස ඉපදීම ද සිදුවූ බව ය....'' හිට්ලර් පුද්ගල නිදහස අසීමිත ව සැලකූ ලිබරල් ධනවාදයේ ද, ලෝකය ම තනි සමාජයක් කිරීමට ගිය මාක්ස්වාදී කොමියුනිස්ට් වාදයේ ද සතුරෙකු වන්නේ ඒ පදනමෙනි. මේ අනුව යුදෙව් - ක්‍රිස්තියානි පදනම මත ගොඩ නැගුණු නූතනවාදී යුරෝපය තුළ ම ආර්ය වාදය හොල්මං කරන්නටත් එය ම යුදෙව්වන් පීඩනයට ලක්කරන්නටත් විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස නූතන යුදෙව්වාදය ඇති කිරීමට පදනම් වූ වැදගත් චරිත දෙකක් බිහි විය. එක් අයෙක් නම් නැගෙනහිර යුරෝපයෙන් බිහි වූ බෙන් එලිසර් යෙහුඩා ය. අනෙක් තැනැත්තා ජිනීවාවලින් බිහි වූ තියෝඩර් හර්ෂල් ය.

යෙහුඩා මළ හීබෲ බස ගොඩනගාගෙන නවීන හීබෲ හෝඩිය තැනුවේය. (1868) ඉන්පසු සිය පවුලේ වතාවත් හීබෲ බසින් කරන්නට පටන් ගතතේ ය. එම ආගමට තරයේ ඇදී ගිය අයෙකු වූ ඔහු පසුව පලස්තීනයට පදිංචිය සඳහා ගියේ ය. එහි ඉතිරි වී සිටි යුදෙව්වන් අතර හීබෲ බව ප්‍රචලිත කළේ ය. නැගෙනහිර යුරෝපීයයන්ට ද පලස්තීනයට පැමිණ පදිංචිවන ලෙසට බලපෑමක් කළේ ය. අලියාහ් නමින් (1882-1903) මෙය සිදු විය.

බටහිර යුරෝපයෙන් හර්ෂල් මතුවන්නේ ''ඩ්රේෆස්'' සිද්ධිය නිසා ය. ප්‍රංශ හමුදාවේ සිටි යුදෙව්වෙකු වූ ඩ්රේෆස් ප්‍රංශයේ යුද රහස් පිටට ගෙන දුන් බවට චෝදනා එල්ල වූවෙකි. ඔහුට එරෙහි නඩු විභාගය වාර්තා කිරීමට හර්ෂල් ද ගිය අතර නඩුව මුළුමනින් ම ගොතන ලද්දක් බවත් එහි පදනම යුදෙව් - සෙමටික් විරෝධය බවත් ඔහු වටහා ගත්තේ ය. පසුව ඇත්තට ම ඩ්රේෆස් නිවැරදිකරු බව ඔප්පු විය.

මෙයින් විශේෂයෙන් යුදෙව් ජනයා තුළ ඇති වූ කම්පනය යොදා ගත් හර්ෂල් 1897 දී යුදෙව් සංගමයක් පිහිටුවී ය. එයට සහභාගි වූයේ 197 වැනි සුළු පිරිසකි. නමුත් එයින් සියොන්වාදී ව්‍යාපාරය ඇරඹිණි, සියොන් යනු ඊශ්‍රායලයේ කන්දක් වූ අතර, එහි තේරුම නැවත තම මුල් බිම් ( Land of Israel) වෙත යා යුතු බවයි. සියොන්වාදී ව්‍යාපාරය ඉක්මණින් ම යුදෙව් තාක්ෂණික පන්තිවලටත්, ව්‍යාපාරිකයන් අතරටත් ගලා ගියේ ය. 1906 දී හර්ෂල් මිය යනවිට ලොව පුරා රටවල් 30කට අධික ප්‍රමාණයක සියොන්වාදය පැතිර තිබුණි. එහි එක ම අරමුණ වුණේ විප්‍රවාසය අවසන් කර ඊශ්‍රායලයට නැවත පැමිණීම ය. සිය දහස් ගණන් යුරෝපීයයෝ ඒ අනුව ඊශ්‍රායලය බලා ගියහ.

මේ වනවිට පලස්තීනය අයත් ව තිබුනේ තුර්කි ඔටෝමාන් මුස්ලිම් පාලකයන්ට යි. බ්‍රිතාන්‍යය හා ප්‍රංශය ද පලස්තීන ප්‍රදේශයේ සිය හමුදා බලය ව්‍යාප්ත කර තිබිණි. පළමු ලෝක සංග්‍රාමයේ දී තුර්කිය සටන් කළේ බ්‍රිතාන්‍යයට හා ප්‍රංශයට එරෙහිව යි. මේ නිසා පලස්තීනයේ මුස්ලිම් බලය බිඳීමට බ්‍රිතාන්‍යයත්- ප්‍රංශයත් යුදෙව්වන් යොදාගත්හ. එමගින් යුදෙව්වෝ තව තවත් බලවත් වූහ. යුද්ධය අවසන් වන්නේ තුර්කිය පැරැදී ප්‍රංශයට සිරියාවත්, බ්‍රිතාන්‍යයට පලස්තීනයත් අයත් වීමෙනි.

1917 වන විට සියොන්වාදී ව්‍යාපාරයේ නායකත්වය ආචාර්ය සියා වයිස්මාන් හා නාවුම් සොකොලොව් උසුලති. ලොයිඩ් ජෝර්ජ්ගේ බ්‍රිතාන්‍ය

ආණ්ඩුව යුදෙව් බලපෑම නිසා සිය විදේශ ලේකම් ආතර් බැල්ෆර් එහි යවයි.

එතැන් පටන් පලස්තීනයේ සිදු වූ ක්‍රියාදාමය සෑම ශ්‍රී ලාංකිකයෙක් ම අවබෝධ කරගත යුතු වැදගත් පාඩමකි. තම රට ගැන, තමා ජීවත්වන ප්‍රදේශය ගැන නොතකන කුසීත ජාතියක් සංඛ්‍යාවෙන් කෙතරම් විශාල වුවත් පීඩිත දුගී ජාතියක් බවට පත්වීමට ඉඩ ඇති බව ඒ පාඩමයි. 1917 දී බැල්ෆර් ප්‍රකාශය එළි දකී. එමගින් මෙසේ ප්‍රකාශ කර තිබිණි.

''යුදෙව්වන් විප්‍රවාස කර ඇත. විසුරුවා පාගා දමා ඇත. අප ඔවුනට රැකවරණයත්, ඔවුන්ගේ නිජ බිමත් ලබා දෙන්නේ නම් ඔවුන්ගේ ඓතිහාසික හැකියාවන් පිබිදී ඉතිරී පැතිර යනු ඇත..''

''මහ රජුගේ (බ්‍රිතාන්‍ය) ආණ්ඩුව පලස්තීනය යුදෙව්වන්ගේ නිජබිම ලෙස පිළිගන්නා අතර, එය ලබාදීම වෙනුවෙන් කැප වී සිටී..''

මේ වන විට පලස්තීනයේ අරාබීන් 560,000 ක් ද, යුදෙව්වන් 55,000 ක් ද, විය. එනම් සෑම යුදෙව්වෙකුටම අරාබීන් 10 දෙනෙකු විය.

බැල්ෆර් ප්‍රකාශයෙන් සියොන්වාදය මතවාදී ජයක් ලබයි. එනම් යුදෙව්වන් වෙන ම ජාතියක් බව ද, ඔවුනගේ නිජ බිම පලස්තීනය බව ද, ඔවුන්ට වෙන ම රාජ්‍යයක් පිහිටුවීමේ ස්වයං නිර්ණය අයිතිය ඇති බව ද බ්‍රිතාන්‍යය පිළිගැනීම යි. බැල්ෆර් ප්‍රකාශනයෙන් පසු යුදෙව්වෝ පලස්තීනයේ ඔවුන් බහුතරය වූ ප්‍රදේශවල ස්වයං පාලනයක් අරඹති. එයට බ්‍රිතාන්‍යය ආශිර්වාදය ලැබේ. (මේ තත්ත්වය ලංකාවට මදක් ගැළපෙයි. එය තරමක් ඉන්දු- ලංකා ගිවිසුමෙන් දෙමළ ජනයා වෙන ම ජනවර්ගයක් වශයෙන් පිළිගැනීම හා ඔවුන්ගේ සම්ප්‍රදායික වාස භූමියට (උතුරු හා නැගෙනහිර දෙපලාත) ඒකාබද්ධ පළාත් සභාවක් හා අන්තර් පාලනයක් ලැබීම වැනි සිද්ධියකි - 1987)

බැල්ෆර් ප්‍රකාශයත් සමඟ අරාබි ජාතිකවාදය පැතිරේ. පලස්තීනයේ එයට නායකත්වය දෙන්නේ මුෆ්ටි හජ් අමීන් අල් හුසේන් ය. දුර්වල අරාබි ගෝත්‍රිකාවාදයන් නිසා පුළුල් ජාතිකවාදයක් ඇති නොවේ. බේබදුකමට ඇබ්බැහි වූ පලස්තීනුවෝ තම ඉඩම් සංක්‍රමණික යුදෙව්වන්ට විකුණමින් විවිධ පැතිවලට සංක්‍රමණය වූහ.

1931 දී ජුබොටින්ස්කි හි 17 වැනි සියොන් සමුළුවේ දී ''මහා ඊශ්‍රායලයක්'' (Greater Israel or eretz Israel Hashlema) පිළිබඳ අදහස ඇතිවේ. එමගින් උතුරේ ගෝලාන්වල සිට සිනායි සතර හරහා සූවස් ඇල දක්වා ද, නැගෙනහිරින් ජෝර්දාන් ගඟේ බටහිර හා නැගෙනහිර ඉවුරද

අයත් වූ ජෙරුසලම අග නගරය කොටගත් ඊශ්‍රායල් නම් මහා රාජ්‍යයක් පිළිබඳ සංකල්පය ඉදිරිපත් වේ. මෙනචම් බෙගින් ගේ හේරූට් පක්ෂය මෙහි ප්‍රමුඛ අදහස ගෙන එයි. මුලදී එයට විශාල ප්‍රතිචාරයක් නොවුණ ද පසුව එය ක්‍රමයෙන් ක්‍රියාවට නැංවේ. (මෙය ලංකාද, දකුණු ඉන්දියාව ද ඇතුළත්ව 1930 ගනන්වල ඇරඹුණු ද්‍රවිඩස්ථාන් සංකල්පයට සමාන ය.)

1930 ගණන්වල සිට අරාබි- යුදෙව් ගැටුම් පලස්තීනයේ ඇතිවේ. අරාබීහු විවෘතව ම බ්‍රිතාන්‍යය පාලනය සමඟ ගැටෙති. හිට්ලර් සමඟ ඔවුන් එක් වේ යැයි බ්‍රිතාන්‍යය බිය වේ. (ඉන්දියානු ජාතික ව්‍යාපාරය ගැන ද මෙවැනි බියක් විය.)

1939 දී නෙවිල් චේම්බර්ලේන් නාසි අභියෝගය නිසා පලස්තීනය ගැන ධවල පත්‍රිකාවක් ගෙන එයි. එමගින් අරාබි ජාතිකවාදය සතුටු කිරීමට ද උත්සහ කෙරේ. ඒ වන විට සීමාවක් නැතිව පලස්තීනයට ඇදී ආ යුදෙව් සංක්‍රමණිකයන් වසකට 15000කට සීමා කෙරේ. එහෙත් යුද්ධය සමඟ එය ප්‍රායෝගික ව ක්‍රියාවේ නොයෙදේ.

දෙවන ලෝක සංග්‍රාමය වන විට ලොව පුරා යුදෙව්වන් මිලියන 6 ක් වාසය කරති. පලස්තීනයේ වාසය කරන යුදෙව්වෝ "යිෂුව්" (Yishuv) නමින් හැඳින්වෙති. ඉතාලියෙන් ජර්මනියෙන් ඇතිවූ යුදෙව් විරෝධය නිසා යුදෙව් ධනවතුන් හා විද්වතුන් එක්සත් ජනපදයට පලා යති. සියවස් ගණනක් යුරෝපය තුළ ගොඩ ගැසුණු ධනය හා දැනුම එ. ජනපදයට හිමි වී වසර කිහිපයකින් එය සුපිරි රාජ්‍යයක් වේ. යුදෙව්වෝ එහි සංවිධානාත්මක බලය වෙති. දැඩි ආගමිකවාදී හා වැඩ කරන ජනයා දෙස යුරෝපයේ සිටි යුදෙව්වෝ පලස්තීනයට යති.

දෙවන ලෝක යුද්ධයේ දී යුදෙව්වෝ තීරක වැඩ කොටසක් ෆැසිස්ට් - නාසි පක්ෂයට එරෙහිව කරති. ඔවුහු පලස්තීනයේ දී බ්‍රිතාන්‍යය හමුදා හා එක්ව සටන් කරති. මෙමඟින් නවීන අවි හා සටන් ගැන දැනුම ලබා ගනිති. අරාබීහු බ්‍රිතාන්‍යයට එරෙහිව යති. මේ අතර යුදෙව් විද්වත්තු එ. ජනපදයට පරමාණුක අවිය හා අධිභෞතික විද්‍යාව හඳුන්වා දෙති. යුද්ධය යන අතරතුර 1942 නිව්යෝර්ක් නගරයේ දී බිල්ට්මෝර් වැඩසටහන නමින් පලස්තීනයේ යුදෙව් රාජධානියක් ඇති කිරීම ගැන වැඩ සටහනක් සියොන්වාදීහු ඉදිරිපත් කරති. මෙතැනදී මත දෙකක් ඉදිරිපත් වේ. වයිස්මාන් ඇතුළු එ. ජනපද යුදෙව්වෝ බ්‍රිතාන්‍ය හා සහයෝගයෙන් යුදෙව් රාජ්‍යයක් දිනාගත යුතු යැයි කියති. බෙන් ගුරියන් ඇතුළු පලස්තීන යුදෙව්වෝ (යිෂ්විවරු) අවශ්‍ය නම් බ්‍රිතාන්‍ය සමඟ යුද්ධ කිරීමෙන් හෝ ඊශ්‍රායලයක් බිහිකළ යුතුයැයි



මොෂේ දයාන් - බෙන් ගුරියන්



මොෂේ දයාන් - ගෝල්ඩා මියර්

කියති. බ්‍රිතාන්‍යය හමුදාව තුළ ම යුදෙව් ජාතිකවාදී සන්නද්ධ කණ්ඩායම් බිහි වේ.

මෙනචම් බෙගින්ගේ යුදෙව් පුනර්ජීවන හෙවත් හෙරූට් පක්ෂය බ්‍රිතාන්‍ය සමඟ ගරිල්ලා යුද්ධයකට යා යුතු යැයි සිතා ඒ අනුව ක්‍රියා කරයි. මෙය එට්සල් (ETZEL) නමින් ප්‍රචලිත වේ. ඔවුන් බ්‍රිතාන්‍යය සෙබළු මරා නොදැම්මද පාලම් කඩා බිඳ දැමීම, අරාබීන් වටකිරීම වැනි ප්‍රචණ්ඩ ක්‍රියාවල නියැළෙති. එට්සල් වෙතින් ලෙහී (Lehi) නම් වඩාත් රැඩිකල් කල්ලියක් වෙන්වී ගොස් යිට්සෑක් ශමීර්ගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වේ. ඔවුන් යුදෙව්වන්ගේ''කිබුට්සු'' නම් වූ සාමූහික ගම්මාන යුද ගම්මාන බවට පත් කරති.

නාසි ප්‍රචණ්ඩත්වය සමඟ දස ලක්ෂ ගණන් සංහාරයට පත්වීම නිසා ලෝකය පුරා ම යුදෙව්වන් පිළිබඳ අනුකම්පාවක් ගොඩනැගේ. එමෙන් ම සෝවියට් හා එක්සත් ජනපද යුද පෙරමුණු දෙකේ ම ඔවුහු බලවත් මෙහෙයක් ද කරති.

පලස්තීනයේ ජීවත් වූ අරාබීන්ගේ ඉතා සුළු පිරිසක් හැර සෙස්සෝ තව දුරටත් ග්‍රෝතිකයන් ලෙස ජීවත්වෙති. මේ වන විට තෙල් සම්පත සොයා ගෙන තිබුණු නිසා ඉටහිර ලෝකය මැදපෙරදිග තම හස්තය දැඩි කරයි.

1946 දී සියොන්වාදී ව්‍යාපරය බෙන් ගුරියන්ගේ නායකත්වයට පත්වීමත් සමඟ වෙන ම යුදෙව් රාජ්‍යය පිළිබඳ අදහස ශක්තිමත් වේ. බ්‍රිතාන්‍යයේ බලයට පත්වූ කම්කරු පක්ෂ ආණ්ඩුව (1945) ඉන්දියාව හා පලස්තීන ප්‍රදේශවලට නිදහස දීමට යයි. බෙන් ගුරියන් නව බලවතුන් වූ එ. ජනපදය හා සෝවියට් දේශය ද තමන් දෙසට දිනා ගනී. බ්‍රිතාන්‍ය පලස්තීන ප්‍රශ්නය එක්සත් ජාතීන් ඉදිරියට දමයි. ඔවුහු පලස්තීනය පිළිබඳව විශේෂ කමිටුවක් රටවල් 11 ක මූලිකත්වයෙන් ඇති කරති. 1947 සැප්තැම්බර් 01 දා ඔවුන්ගේ වාර්තාව නිකුත් වේ. සාමාජිකයන් 7 දෙනෙක් පලස්තීනය මුස්ලිම් හා යුදෙව් ලෙසට දෙකට බෙදිය යුතුයැයි නිර්දේශ කරති. සාමාජිකයින් 3 දෙනෙක් මුස්ලිම් - යුදෙව් එක්සත් ෆෙඩරල් රාජ්‍යයක් පලස්තීනයට යෝජනා කරති. එක් අයෙක් (ඕස්ට්‍රේලියාව) නිහඬ වේ.

1947 නොවැම්බර් 29 දා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය පලස්තීනය දෙකට බෙදා යුදෙව් ඊශ්‍රායලයක් හා මුස්ලිම් පලස්තීනයක් බිහි කළ යුතු බවට සම්මත කරයි. මෙයට එ. ජනපදය හා සෝවියට් දේශය යන දෙරට ම එකඟ වේ. අරාබීහු එකඟ නොවෙති.

1948 මැයි 14 දා අවසන් බ්‍රිතාන්‍යය සෙබලාත් පිටව ගිය පසු ටෙල් අවිව් වල කෞතුකාගාරයට රැස් වූ විවිධ යුදෙව් පක්ෂ හා සංවිධාන 61 ක නියෝජිතයෝ ස්වාධීන ඊශ්‍රායලයක් පිහිටුවති. එහි විධායක ඇගමැති ලෙස බෙන් ගුරියන් ද, ජනාධිපති ලෙස වයිස්මාන් ද පත්වෙති. (මුලින් මේ පදවිය එ. ජනපදයට පරමාණු බලය ලබාගැනීමට උපකාරී කළ අයින්ස්ටයින්ට යෝජනා වුවත් ඔහු එය ප්‍රතික්ෂේප කරයි.)

මේ වන විට පලස්තීනයේ යුදෙව්වෝ 650000ක් සිටිති. 8000 ක පමණ සන්නද්ධ හමුදාවක් ඔවුහු වහා ගොඩනගති. ටෙල් අවිව් අගනුවර වේ.

ඊජිප්තු- සිරියානු - ජෝර්දාන අසංවිධානාත්මක හමුදා පලස්තීනයට කඩාවදිති. ඔවුන්ගේ අරමුණ නව ඊශ්‍රායල් රාජ්‍යය විනාශ කිරීමයි. දැවැන්ත වුවත් අසංවිධානාත්මක අරාබි හමුදා කුඩා වුවත් සංවිධානාත්මක ඊශ්‍රායල් හමුදා අතින් පරාජය වේ. ගාසා තීරයේ සිට සිනායි දක්වා කොටස් ඊජිප්තුව ද, ජෝර්දාන් ගඟේ බටහිර ඉවුර ජෝර්දානය ද හිමිකරගෙන පලස්තීනය නම් රට සිතියමෙන් ඉවත් වී නව බලවත් ඊශ්‍රායලයක් බිහි වී යුද්ධය අවසන් වේ. එක්සත් ජාතීන් මැදිහත් වී නව දේශ සීමා ඇඳ දෙති. (නව රාජ්‍යයක් බිහිවීම පිළිබඳ මේ කතාව ලංකාවට ද ඉතා අදාල ය.)

මේ තත්ත්වය තීරණාත්මකව වෙනස් වන්නේ අරාබියේ බලවත් ම රාජ්‍යය වූ ඊජිප්තුවේ හමුදා කුමන්ත්‍රණයකින් බාත් ජාතිකවාදීන් බලයට පැමිණීමත් සමඟ ය. ඒ හා සමඟ පලස්තීනයේ ද මුස්ලිම් සහෝදරත්වය හා මූලධර්මවාදය පණගසයි. ඊජිප්තුවට යටත් වූ එල් අරිෂ් හා ගාසා ප්‍රදේශවල අනාථ පලස්තීනුවන්ගෙන් ''ෆේඩයින්'' ගරිල්ලා ව්‍යාපාරය බිහිවේ. මෙයට ඊජිප්තුවේ නසර් උපකාර කරයි. (1953) ඔහු තව දුරටත් ඉලට් ප්‍රදේශය කොටුකර ඊශ්‍රායලය ඉන්දීය සාගරයට ඒම වළක්වයි. මේනිසා ඊශ්‍රායලය ගාසා ප්‍රදේශවල ''ත්‍රස්තවාදය'' මැඩලීම පිළිබඳව ද, ඉලට්වලින් වරායක් ඇතිකර ගැනීම පිළිබඳව ද ඉලක්කවලට යයි.

ඊශ්‍රායලය වේගයෙන් සංවර්ධනය වේ. ලොව පුරා ධනවත්තු එයට මූල්‍ය උපකාර කරති. මේ මුදල් පොම්පය තනා දෙන්නේ ගෝල්ඩා මෙයර් ය. කිබුට්සු සාමූහික ගම්මාන යුද ගම්මාන බවට පත්කෙරේ. නවීන බලවත් ඔත්තු සේවයක් හා හමුදාවක් ගොඩනැගේ. එහි නායකත්වය මොෂේ දයාන්ට හිමි වේ. යුදෙව් විද්වතුන්ගේ සහයෙන් ලොව නවීනතම කෘෂි හා කාර්මික මධ්‍යස්ථානයක් බවට ඊශ්‍රායලය පත්වේ. උතුරු ඇමෙරිකාව හා ඊශ්‍රායලය යුදෙව් මධ්‍යස්ථාන දෙක බවට පත්වේ.

මේ අතර නසර් අරාබි ජාතිකවාදය ගොඩනගයි. ඔහු සෝවියට් දේශය සමඟ සබඳතා ඇතිකර ගනී. චෙකොස්ලෝවැකියාව සමඟ සහල්- ඇඟලුම් සමඟ අවිආයුධ ගිවිසුමකට එළඹේ. එමඟින් ඊජිප්තු හමුදා නවීකරණය වේ. අස්වාන් වේල්ල තැනීම සඳහා ඔහු එ. ජනපදය, බ්‍රිතාන්‍යය හා ප්‍රංශයෙන් උපකාර ඉල්ලයි. එක්සත් ජනපද ජනාධිපති අයිසන්හවර් 1956 ජුලි 19 දා එය ප්‍රතික්ෂේප කරයි. මෙයින් කෝපයට පත්වන නසර් සෝවියට් දේශය වෙතට නැඹුරු වේ. දැඩි තීරණයක් ගත් නසාර් 1956 ජුලි 26 දා සූවස් ඇල ජනසතු කරයි. එයින් ලැබෙන ආදායමෙන් අස්වාන් වේල්ල නයිල් ගඟ හරහා ඉදිකරන බව කියයි.

1888 දී කොන්ස්තන්තිනෝපලයේ දී ඇති වූ එකඟතාවයක් අනුව සූවස් ඇළ ප්‍රංශ - බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සමාගමකට අයිති කරගෙන තිබිණි. නසාර් හමුදා යවා එකී සමාගමේ දේපොළ අල්ලා ගනී. කෝපයට පත්වන ප්‍රංශය හා බ්‍රිතාන්‍යය ඊජිප්තුවට එරෙහිව යුද වැදීමට යති. එහෙත් එ.ජනපදය එවැනි සෘජු මැදිහත්වීමකට මැලිවේ. ඔවුහු රටවල් 22ක මූලිකත්වයෙන් ලන්ඩනයේ සමුළුවක් කැඳවති. එහිදී සූවස් ඇළ ජාත්‍යන්තර සන්ධානයකින් පාලනය විය යුතු යැයි යෝජනා වේ. එහෙත් සෝවියට් දේශය, ඉන්දුනීසියාව, ඉන්දියාව හා ශ්‍රී ලංකාව (බණ්ඩාරනායක ආණ්ඩුව) කියන්නේ සූවස් ඇල ඊජිප්තුවට අයිති බව ය. එ. ජනපද යෝජනවා සෝවියට් දේශය නිෂේධ බලය යොදා වළක්වයි.

මේ අතර ඊශ්‍රායලය වේගයෙන් ක්‍රියාත්මක වේ. සිමොන් පෙරේස් හා මොෂේ දයාන් ප්‍රංශ හා බ්‍රිතාන්‍ය බලධාරීන් හමු වී රහසිගත යුද සැලැස්මක් තනති. එ. ජනපදයේ ජනාධිපතිවරණය නිසා ඔවුනට මැදිහත්වීමට නොහැකි වන ලෙස ප්‍රහාරය නොවැම්බර් මුලට ගනී. ඒ අනුව 1956 ඔක්තෝබර් 29 දා ඊශ්‍රායලය හදිසි ප්‍රහාරයක් මගින් සිනායි හා සූවස් ඇල ප්‍රදේශ අල්ලා ගනී. සටනට මැදිහත් වන මුවාවෙන් බ්‍රිතාන්‍ය - ප්‍රංශ හමුදා මැදිහත් වී සූවස් ඇල ප්‍රදේශ භාර ගනී.

මොෂේ දයාන්ගේ තියුණු සැලැස්මකට අනුව දින දෙකක් තුළ සිනායි හා සූවස් ප්‍රදේශ අල්ලා ගැණින. ඊජිප්තු හමුදා එල් අරිෂ් හා ගාසා තීරවලින් පළවාහැරි එකී ප්‍රදේශ ඊශ්‍රායලයට ඈඳා ගැනේ. මහා ඊශ්‍රායල් සංකල්පය අනුව සිනායි කතර සිට සූවස් දක්වා ප්‍රදේශ ද අල්ලා ගැනේ. අකුකු බොක්ක (ශාම් අල් ෂෙයික්) අල්ලාගෙන ටිරාන් හරහා ඉන්දීය සාගරයට පිවිසේ. දින කිහිපයක් තුළ ලබාගත් මේ යුද ජයග්‍රහණ ඊළඟ දශක කීපයේ දී දේශපාලන ජයග්‍රහණ බවට පත්කිරීමට ඊශ්‍රායලය උත්සහ කරයි. ඔවුන්ගේ උපාය ඊජිප්තු ප්‍රදේශ

වැඩියෙන් අල්ලාගෙන ''ටිකක් සාමය වෙනුවෙන් ද'' ගොඩක් පාලනය කිරීම ය.

සෝවියට් දේශය මැදිහත් වී ජාත්‍යන්තර හමුදාවකට සුවස් ප්‍රදේශ භාර කෙරේ. (UNEF) බ්‍රිතාන්‍ය හා ප්‍රංශය සුවස් ප්‍රදේශවලින් ඉවත් වේ.

අයිසන්හවර් 1957 දී බලයට නැවත ආ විට අයිසන්හවර් සිද්ධාන්තය එයි. එමගින් පලස්තීනයේ සිට වියට්නාමය දක්වා කොමියුනිස්ට් මැදිහත්වීම්වලට එරෙහිව යුද්ධ ආධාර ලැබේ. ඊශ්‍රායලය සෘජුව ම එ. ජනපදයට එක් වේ. සුවස් යුද්ධය ජය ගැනීමත් සමඟ දස ලක්ෂයක් යුදෙව්වෝ විදේශවලින් ඊශ්‍රායලයට එති. අල්ලාගත් ප්‍රදේශවල නව යුදෙව් ජනාවාස බිහි කෙරේ. වේගවත් ආර්ථික වර්ධනයක් ලබාගනී. ලොව කාර්යක්ෂම ගොවි උපකරණ හා සමූහ ගොවිතැන් ක්‍රම ද, දියමන්තිවල සිට වෛද්‍ය උපකරණ දක්වා කාර්මික නිෂ්පාදන ද ඉහළ නගී.

පලස්තීන ප්‍රදේශවල ක්‍රියාත්මක වන විවිධ සන්නද්ධ හා දේශපාලන කණ්ඩායම් එක් වී පලස්තීන විමුක්ති සංවිධානය ගොඩනගති. ඔවුන්ගේ අරමුණ එය පලස්තීන ආණ්ඩුවක් බවට පත්කර ගැනීමයි. බොහෝ අරාබි රටවල් කර ඇර සිටියත් ඊජිප්තුව නසර් යටතේ සෘජුව ම එයට උපකාර කරයි.

නසාර් රහසේ යුද්ධයට සැරසේ. 1967 මැයි 29 දා නසාර් ඊජිප්තියානු ජාතික මණ්ඩලය අමතමින් කියන්නේ පලස්තීන ජනතාවගේ පූර්ණ අයිතිය ලැබෙන තෙක් ඊශ්‍රායලය නොව එ. ජනපදය ප්‍රමුඛ බටහිර ලෝකයම රැහැනිව ආවත් සටන් වදින බව ය. මේ හා සමඟ නසර් සිරියාව හා ජෝර්දානය ද තම පැත්තට දිනා ගනී.

ඊශ්‍රායලය ද සටනට සැරසේ. මේ වන විට යුදෙව්වන් විවිධ පක්ෂවලට ගොනු වී සිටි නිසා යුදෙව් මූලධර්මවාදී පක්ෂය වන මිස්රාචිය සියළු දේශපාලන කණ්ඩායම්වල ජාතිමාමක ආණ්ඩුවක් ඉල්ලයි. අගමැති එශ්කොල් විපක්ෂයේ තම දේශපාලන විරුද්ධවාදියා වූ මොෂේ දයාන් ජනතා ඉල්ලීම මත ආරක්ෂක ඇමති බවට පත් කරයි. පක්ෂ දේශපාලනය අතහැර යුදෙව්වෝ සටනට සැරසෙති. මොෂේ දයාන් හා සිට්සැක් රබින් සය දින යුද්ධය අරඹති.

යුද්ධය 1967 ජුනි 05 දා උදේ 7.45ට ඊජිප්තුවට එල්ල වූ දැවැන්ත ගුවන් ප්‍රහාරයකින් ඇරැඹේ. පළමු දිනයේදී ම ඊජිප්තුවේ ගුවන්යානා 304 ක් විනාශ වී ඊජිප්තුවට ගුවන් බලය අහිමි වේ. සිරියාවේ ගුවන්යානා 53ක්ද, ජෝර්දානයේ සියළු ගුවන්යානා ද (28) විනාශ වේ. ඊශ්‍රායලයට අහිමි වන්නේ ගුවන් යානා 29ක් හා නියමුවන් 11 ක් පමණ ය.

ඊළඟට ගොඩබිම් ප්‍රහාර ඇරැඹේ. සිනායි ප්‍රදේශ යලිත් සහමුලින් ඊශ්‍රායලය අතට පත්වේ. ඊශ්‍රායල් සෙබළු 225ක් මියයද්දී ඊජිප්තු සෙබළු දසදහසක් මිය යති. යුද ටැංකි 590ක් හා කාලතුවක්කු 309ක් ඊජිප්තුවට එක් දිනකින් අහිමිවේ. ඊශ්‍රායලයේ යුද ප්‍රහාර කෙතෙරම් වේගවත් හා කාර්යක්ෂම ද කීවොත් ඊජිප්තු හමුදා ශක්තිය දින තුනක් ඇතුළත විනාශ වේ.


ඊළඟට ඊශ්‍රායලය ජෝර්දානය දෙසට හැරේ. ඊශ්‍රායෙල් සෙබළු 235ක් මිය ගොස් බටහිර ඉවුර දස ලක්ෂයක් පලස්තීනුවන් ද සමඟ අල්ලා ගනී. මෙය එක් දිනකින් සිදුවේ. ඊළඟ දිනයේ සිරියාවට පහර දේ. දින දෙකක සටනකින් පසු සිරියානු හමුදා පරාජය කර ගෝලාන් කඳුකරය අල්ලා ගනී. මුලින් මෝෂේ දයාන් සිරියාවට පහරදීමට වූ යෝජනාවට අකමැති වී ඇත්තේ රුසියාව මැදිහත් වේයැයි බිය වූ නිසා ය. නමුත් උපකාර ඉල්ලා සිරියානු ජනාධිපති අට්ටසිට නසාර් විසින් යැවූ විදුලි පණිවිඩයක් ඊශ්‍රායල් ඔත්තු සේවා අතට පත් වේ. එයින් කියැවුණේ අපි යුද්ධය පරාදයි. අපට දැන් ඇත්තේ අල්ලාගේ පිහිට පමණයි'' කියා ය. මෙයින් හැඟී ගියේ ඊජිප්තුවට යළි යුද කළ නොහැකි බවය. ඊශ්‍රායල් හමුදා දමස්කසය අල්ලා ගැනීම සඳහා යයි.

දෙවැනි ලෝක යුද්ධයෙන් පසු සෝවියට් ක්‍රෙම්ලිනය හා ඇමෙරිකානු ධවල මන්දිරය අතර ඇති කරගෙන තිබූ හදිසි ඇමතුම් සේවය (Hot line) ප්‍රථම වතාවට ජුනි 10 දා ක්‍රියාත්මක වේ. උදේ 9.48 ට සෝවියට් නායක බ්‍රෙෂ්නව් කියන්නේ සෝවියට් දේශය සිරියාව වෙනුවෙන් යුද්ධයට සෘජු ව මැදිහත් වන බව ය. වහා ම සටන් නතර කරන ලෙස එ. ජනපදයෙන් ඊශ්‍රායලයට නියෝග ලැබේ. ඒ අනුව සවස 6.30 ට සටන් විරාමය ඇතිවේ.

දින පහක යුද්ධයෙන් ඊශ්‍රායෙල් සෙබළු 679 ක් මිය ගොස් 2563 ක් තුවාල ලබති. ඊජිප්තුව, සිරියාව හා ජෝර්දානයේ හමුදා විනාශය දස දහස් ගණනකි. 1931 දී ප්‍රකාශ කළ නෙවම් බෙගින්ගේ මහා ඊශ්‍රායලය 1967 යුද්ධයෙන් බිහිවේ.

නසාර් ඉල්ලා අස්වේ. නමුත් ''ජනතා විරෝධතා'' නිසා සිය ඉල්ලා අස්වීම ඉවත් කරගනී. අරාබීහු සසල වෙති. ඉස්ලාමීය මූලධර්මවාදය පණ ගැසේ. 1968 දි යසර් අර්ෆත් ප.වි.ස. (PLO) නායකත්වයට පත්වේ. ඔහුගේ අල්පාටා ව්‍යාපාරය ඊශ්‍රායලය සමඟ එකඟතා ඇතිකර ගැනීම ප්‍රතික්ෂේප කරයි. පලස්තීන ජනතාවාදී පෙරමුණ (PELP) නවීන ත්‍රස්තවාදය දියත් කරයි. පිළිතුරු ලෙස ඊශ්‍රායලය කිඳාබැස පහරදෙන ප්‍රහාරක කණ්ඩායම් (Deep Penetration) බිහි කරති. සෝවියට් දේශය ද කෝපයට පත්වේ. ඔවුහු සය දින යුද්ධය

# ISRAEL AND THE ADMINITRATED TERRITORIES



හදාරමින් ඊජිප්තුව හා සිරියාව මිසයිලවලින් සන්නද්ධ කරති.

පලස්තීන ත්‍රස්ත ප්‍රහාරවලින් වසර තුනක් තුළ ඊශ්‍රායල්වරු 141 ක් මරා දැමේ. 1970 සැප්තැම්බර් 06 වැනිදා එකවර ගුවන්යානා 05 ක් පැහැර ගනී. එක් යානයක පමණක් කොල්ලකරුවෝ කොටුවෙති. සෙසු යානා පුපුරුවා හැරේ. හුසේන් රජු ජෝර්දානයේ පලස්තීන පුහුණු කඳවුරුවලට පහර දෙයි. පලස්තීනුවන්ට උපකාර කිරීමට සිරියාව හමුදා එවයි. හුසේන්ට උපකාර පිණිස එ. ජනපදය හා ඊශ්‍රායලය එයි. ජෝර්දානය තුළ කළු සැප්තැම්බරය ඇවිළේ. පලස්තීන සන්නද්ධ සංවිධාන ලෙබනනයට පලා යති. එහි ආණ්ඩුවක් තුළ ආණ්ඩුවක් ඇතිවේ. (ඊශ්‍රායලය 1982 දී ලෙබනනය ද ආක්‍රමණය කර පලස්තීන කඳවුරු විනාශ කළේ ය.)

අන්වර් සදාත් සෝවියට් යුද උපදේශකයින් පිට කිරීම නිසා ඊශ්‍රායලය සිතන්නේ ඊජිප්තුවේ තර්ජනය අවසන් වී ඇතැයි කියා ය. 1968 ටෙට් ප්‍රහාර වලින් පසු එක්සත් ජනපදය වියට්නාමයේ පරාජය අරඹයි. නමුත් ඊජිප්තුවේ හා සිරියාවේ අවශ්‍යතාවය ඊශ්‍රායලය තමන්ගෙන් උදුරාගත් බිම් ආපසු ගැනීමයි. මේනිසා සදාත් සියුම් සැලැස්මක් ක්‍රියාවේ යොදවයි. එනම් 1956-67 යුද්වලදී මෙන් සංවිධානය වීමට පෙර පහර දීම ය.

යොම් කිපූර් යනු යුදෙව්වන්ගේ ආගමික වශයෙන් වැදගත් ම දිනය යිත එදින ඔවුහු උපවාසයෙන් කල් ගෙවමින් හීබෲ බයිබලය හදාරති. මුළු ඊශ්‍රායලය ම යුදෙව් ආගමික වතාවත්වල නියැළී සිටියදී 1973 ඔක්තෝබර් 06 යොම්කිපූර් දිනයේ ඊජිප්තුව හා සිරියාව ඊශ්‍රායලයට පහර දෙති. ඊශ්‍රායලයේ ප්‍රති ගුවන් ප්‍රහාර මෙවර අඩපණ වේ. එයට හේතුව සෝවියට් මිසයිල පද්ධතිය යි. ඊශ්‍රායලය මවිත වන්නේ ඊජිප්තුව රහසේ පසුගිය වසර 6 තුළ ගොඩනගා ගෙන ඇති යුද ශක්තිය දුටු විට ය. ඊජිප්තුවට යුද ටැංකි 2200 ක් තිබිණි. එයි 900 ක් සූවස් ඇලෙන් ගොඩ වී ඊශ්‍රායලය යටත්කරගත් සිනායි පෙදෙසට කඩා වදිති. ඒ සමඟ කාලතුවක්කු 2000 ක් පෙරමුණට එයි. සෙබළුන් ලක්ෂයක් ඊජිප්තුවෙහි ද, 45000 ක් සිරියාවෙහිද සටනට එක්වේ. ඊශ්‍රායලයට මුල් වටයේ සටනට යැවිය හැකි වූයේ සෙබළුන් 15000 ක් පමණ යුද ටැංකි 276 ක් පමණ ය. ඉතිහාසයේ මුල්වරට ඊශ්‍රායලය පසු බසී. මෙවර ඊශ්‍රායලයේ ගැළවීමට එන්නේ මොෂේ දයාන්ගේ සෙබල උපක්‍රම හා එක්සත් ජනපදයේ අවි තොගයි. ලක්ෂ ගණන් යුදෙව්වෝ සිය රැකියා අතහැර ස්වේච්ඡා සේනාංක සමඟ එක්වෙති. දින 16 ක සටනකින් පසු ඊජිප්තුව නතර කිරීමට ඊශ්‍රායලයට හැකිවේ. එහෙත් ඔවුන්ගේ සෙබළු 2564 ක් මිය යති. 6923ක් තුවාල ලබති. මේ සටන ගැන මොෂේ දයාන් කීවේ ''... මෙවර ඔවුහු සටන් කළහ. වෙනදා දහස් ගණනින්

යටත්වන ආරාබීහු මෙවර පරාජය පෙනි පෙනී සටන අත්හොහැර ගියහ. එමෙන් ම සහමුලින් විනාශ නොවී පසුබැසීම ක්‍රමවත්ව කළහ. සෝවියට් යුද උපදේශකයින් අපට එරෙහිව ඊජිප්තුව ශක්තිමත්ව ගොඩනංවා ඇතිබව පෙනිනි..'' සදාත් කරන්නේ උපායකි. ඔහු තම ප්‍රදේශවලින් ඇතැම් ඒවා මුදාගෙන ඊජිප්තු ගරුත්වය රැකගෙන ඊළඟට ඊශ්‍රායලය සමඟ ගිවිසුමකට ආවේ ය. (1975 කෑම්ප් - ඩේවිඩ් සම්මුතිය) මේ අනුව යුදෙව් ඊශ්‍රායලය යථාර්ථයක් ලෙස පිළිගත් පළමු රට ඊජිප්තුව විය. මෙයින් ප්‍රකෝපයට පත්වන මුස්ලිම් මූලධර්මවාදය සදාත් ඝාතනය කළ ද ඔහුගෙන් පසු බලයට එන හොස්නි මුබාරක් අද දක්වා ඝාතන තර්ජන මැද ඊශ්‍රායලය සමඟ ගැටුමකින් තොරව සිටී.

ඊශ්‍රායලයට ද එක දිගට යුද වියදම් දැරිය නොහැකි තත්ත්වයක් පවතී. තෙල් සංචිත නිසා ඊශ්‍රායලය එ. ජනපදයේ මැද පෙරදිග තොටුපළ ලෙස ක්‍රියා කරයි. මේ නිසා ඊශ්‍රායල් යුද වියදම්වලින් සාතිශය බහුතරය දරන්නේ එ. ජනපදය යි. උදාහරණයක් ලෙස 2000 වසරේ ඊශ්‍රායෙල් යුද වියදම වූ ඩොලර් බිලියන 19 න් 17.3 ක් ම එ. ජනපදයෙන් ලැබිණි. උපක්‍රමික හේතූන්ට අමතරව එ. ජනපදයේ රාජ්‍ය යන්ත්‍රය තුළ හා ව්‍යාපාරික ප්‍රජාව තුළත්, විද්‍යාඥයින් අතරත් යුදෙව්වන් උසුලන ප්‍රමුඛස්ථානය මේ තත්ත්වයට හේතු වී ඇත. 1974 දී පලස්තීනුවන්ගේ එකම නියෝජිතයා ලෙස ප.වි.ස අරාබි ලෝකය විසින් පිළිගනී. 1973 යුද්ධයෙන් සිදු වූ වැදගත් ම දෙය නම් මුස්ලිම් මූලධර්මවාදය මතු වීම ය. ප.වි.ස. හා යසර් අරෆත් පවා තවමත් පෙනී සිටින්නේ අනාගමික රාජ්‍යයක් වෙනුවෙනි. නමුත් වේගයෙන් ඉස්ලාමීය මූලධර්මවාදය ව්‍යාප්ත වී හමාස් හා හිස්බුල්ලා වැනි මූලධර්මවාදී සංවිධාන බලවත් වීම සිදුවේ. 1979 ඉරාන විප්ලවයෙන් පසු මේ තත්ත්වය පිම්මක් පනී. එමෙන් ම 1973 දී සවුදිය තෙල් සම්බාධක පැනවීම නිසා මැදපෙරදිග තෙල් හා තෙල් සල්ලි පාලනය සඳහා අලුත් උපායකට යන්නට එ. ජනපදයට සිදුවිය.

පසුව ඊශ්‍රායලය ජෝර්දානය සමඟ (1991) ගිවිසුමකට එයි. නෝර්වේ මැදිහත්වීමෙන් 1993 ප.වි.ස. සමඟ ඔස්ලෝ සම්මුතිය ඇති කර ගනී. එමඟින් ගාසා තීරය හා බටහිර ඉවුරේ පලස්තීන ප්‍රාන්ත පාලනයකට ඊශ්‍රායලය එකඟ වේ. එමෙන්ම ඊශ්‍රායලය රටක් ලෙස පිළිගැනීමට පලස්තින සංවිධාන ද එකඟ වෙති. නමුත් මෙය ක්‍රියාත්මක නොවේ. ඊශ්‍රායලය යළි යළිත් ගාසා හා බටහිර ඉවුර අල්ලා ගනී. වෙන ම පලස්තීන රාජ්‍යයක් පිහිටුවා ගැනීමේ උත්සාහය තවමත් සාර්ථක වී නැත.

විසඳුමකට වඩා මූලධර්මවාදීන්ට ලොවපුරා පෙන්විය හැකි ඇමක් බවට පලස්තීනය අද පත්වී ඇත. එනම් ඔසාමාගේ හිඟන තුවාලය යි.

### හතරවැනි පරිච්ඡේදය

# මුස්ලිම් මූලධර්මවාදය හා ආසියාව

## මැලේසියාව

''...... මැලේවරුන්ට විචිකිච්ඡාවක් ඇත. එනම් මැලේවරු බහුතරය වුණත් ඔවුනට ආර්ථික ශක්තියක් නොමැති වීම ය. එයම අද දේශපාලන විචිකිච්ඡාවක් බවට පත් වී ඇත.

''...... අද බොහෝ දෙනෙක් වර්ගවාදී ගැටුම් හා අසමමිතික වර්ගවාදී සංවර්ධනය පිළිබඳ ව කතා කරති. සමහරුන් සිතන්නේ මැලේවරුන්ට විචිකිච්ඡාවක් නැති බවයි. ඔවුන්ට තණ්හා ලෝභයන් නැති බවත් ඔවුන් තමන්ගේ වාම් අල්පේච්ඡ ජීවිත ගැන ආඩම්බර බවත් එයින් කියැවේ....''

''....... 1969 මැයි 13 වාර්ගික කෝලාහල මැලේසියාව වෙනස් කළේ ය. (චීන) ප්‍රහාර ඉදිරියේ බියෙන් පලාගියේ බහුතර මැලේවරුන් ය. නැවත එවැනි බිය ජනක පලා යෑමක් නොවන්නට නම් මැලේ පුණර්ජීවනයක් අත්‍යවශ්‍ය ය.....''

''...... මැලේ විචිකිච්ඡාව නිකම් විසඳෙන්නේ නැත. එයට විප්ලවයක් අවශ්‍ය ය. විප්ලවයක් කී විට ඝාතන, ලේ වැගිරීම් හා අරාජික තත්ත්වය ගැන අපි බිය වෙමු. නමුත් විප්ලවයක් එයට පටහැනි ව නිර්මාණාත්මක

දෙයක් විය හැක. එය වඩා හොඳ ජීවිත, සැලසුම් සහගත සමාජයක්, විනය හා සංවරය ගෙන එන්නක් ද විය හැක. අපට අවශ්‍ය එවැන්නකි.''

''...... එවැනි විප්ලවයකදී විසඳිය යුතු පළමු ප්‍රශ්නය තවමත් අපේ සමාජය බැඳී ඇති වැඩවසම් බන්ධනයයි. කෙතරම් අධ්‍යාපනය හා නවීනත්වය අපේ සමාජයට ගලා ආව ද 'සුල්තාන්' වරු බැඳුණු වැඩවසම් සබඳතා හා ආකල්ප ජන ජීවිතය තුළ කිඳා බැස ඇත. ඒ නිසා ඒවා අහෝසි කිරීම පහසු නැත. අහෝසි කළ යුතු ද නැත. නමුත් නවීනත්වයට බාධාවක් ඇති නොවන ලෙස ඒවා වෙනස් කළ යුතුම ය. මෙය රාජකීයයන් මෙන් ම ජනතාව ද දැනගත යුතු අපේ සමාජයේ විප්ලවකාරි අවශ්‍යතාවයකි......''

''....... අපේ ආගම ඊළඟ සම්ප්‍රදායික බලය ය. කුමන වෙනසක්, කුමන මතවාදයක් (කොමියුනිස්ට්වාදය වැනි) හෝ කුමන සැලසුම් ගත ක්‍රියාවලියක් හෝ මැලේවරුන් ගේ ආගමිකත්වය පැරදවීමට සමත් වන්නේ නැත. එම නිසා ඉස්ලාමය මැලේ දියුණුවේ පදනම කරගත යුතු ය. ඇත්තෙන් ම මලක්කාව රටක්, ශිෂ්ටත්වයක් හා වෙළෙඳ පුරයක් වූයේ ඉස්ලාමය නිසා ය. අපි එතැනින් නොනැවතී ඉස්ලාමය ව්‍යාප්ත කළ යුතු ද වෙමු.

''...... අපේ තුන්වන සම්ප්‍රදායික බලය සම්ප්‍රදායික මැලේ සිරිත් විරිත් (ආදත් - Adat) ය. අපේ දරුවන් මිය ගියත් සිරිත-ආදාතය රැක ගත යුතුයයි සිතන ආකල්පවලින් අපි මිදියි යුතු ය. අපේ මැලේ විප්ලවය ආදාත් ගැන සැලකිය යුතු ය. නමුත් ඒවා මත බැඳිය යුතු නොවේ. අපේ ආදාතයේ එන නරකම අංගයක් නම් විවාහ නීතියයි. නෑනා මස්සිනා අතර පමණක් සිදුවන විවාහ නිසා මැලේවරුන් ජානමය ලෙස පසුගාමීන් ය. ඔවුන් ස්වභාවයෙන් ම ජීවමය ලෙස හා මානසික ලෙස ශක්තිමත් නැත. ස්වභාවයෙන් ම ග්‍රාමීය කුළෑටි කමින් යුතු ය. මැලේවරුන්ට නවීකරණයත්, නාගරිකරණයත් කළ යුතු ය. පාරම්පරික විවාහ සම්ප්‍රදාය අපි විසින් අත් හළ යුතුම ය.

''..... එමෙන් ම මුස්ලිම් ඉඩම් නීතිය මැලේවරුන් ගම්මානවලින් ගළවාගැනීමට බාධාවකි. ඔවුහු තම පිය-පුතු ඉඩමට ඇලී ගැලී සිටිති. මේ නිසා නැවත පදිංචි කිරීම්, නව ජනපද හා පරිවාර නගර ඉදි කිරීමට එය බාධාවකි. අප සිතිය යුත්තේ මුල් බැස ඇති අපේ ගමේ ඉඩම් කට්ටිය ගැන නොවේ. ''මලයාව ම අයිති මැලේවරුන්ට ය''. අපි පමණක් එහි භූමි පුත්‍රයින් වෙමු. මේ නිසා මලයාවේ ඕනෑම තැනක පදිංචි වීමට අයිතිය ඔවුන්ට ඇත ....''

''...... තම සම්ප්‍රදායික ඉඩමෙන් ගැළවී නගරයට ඇදී ගන්නා මැලේ ජනයාට අපි ස්ථිර ආදායමක් සහතික කළ යුතු වෙමු. නැත්නම් ඔවුන් නගර හැර යනු ඇත. .....''

''...... එයින් එක් ක්‍රමය නම් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හිමිකරුවන් හා වැඩකරුවන් බවට මැලේ වරුන් පත්කිරීම ය. දැනට මැලේසියාවේ ලොකු කොන්ත්‍රාත්කරුවන් සියල්ලන්ම පාහේ චීනුන් නැත්නම් යුරෝපියයන් ය. අපි මේ තත්වය රජයේ ශක්තිය යොදා මැලේවරුන්ට වාසිදායක ලෙස වෙනස් කළ යුතු ය....''

''..... තවත් ක්‍රමයක් වන්නේ දැනට ආණ්ඩුවේ රැකියාවල ඇලී ගැලී සිටින උගත් මැලේවරුන් එයින් ගළවාගෙන තරඟකාරී පුද්ගලික අංශයට යොමු කරවීම ය. දැනට ඒ සඳහා ඇති ලොකු ම බාධාව වන්නේ රජයේ සේවකයන්ට ලැබෙන විශ්‍රාම වැටුප ය. තම හැකියා තබා ගෙනත් වයස අවුරුදු 55 න් පසු මැලේවරු වෙනත් රැකියා සඳහා නොයන්නේ ඒ නිසා ය. ඇත්තෙන්ම වැදගත් අත්දැකීම් සහිතව වැඩ කළ හැකි කාලය එළැඹෙන්නේ 55 න් පසුවය. ජීවිත සුරක්ෂිතභාවය හා රැකියා සුරක්ෂිතායට ඇති කරන ගමන් ම ආණ්ඩුවේ හිටපු සේවකයන් ද එයට යාමට සිටින අයද පුද්ගලික අංශයට ඇද ගැනීමට විප්ලවකාරී වෙනසක් සිදුකළ යුතුය. මෙයින් කාර්යක්ෂම, පුහුණු ජනයා මැලේ දියුණුවට සම්බන්ධ කරගත හැකිවේ.....''

''...... අනවශ්‍ය තරම් වෘත්තීය සමිති අයිතීන් නිසා ද මැලේවරු පිරිහී ඇත. කාර්මික නිෂ්පාදන නොනසා කිසිම සේවකයෙකුට එරෙහිව විනය පියවර ගත නොහැකි තත්ත්වයට අපි පත්ව සිටිමු. මේ තත්ත්වය වෙනස් කර තරඟකාරී වැඩ කරන මැලේවරයෙකු අපි බිහිකර ගත යුතු වෙමු.....''

''....... මැලේසියානුවන්ගේ ප්‍රශ්නය වන්නේ තමන්ගේ රට හා බිම අනුන් සමඟ බෙදා ගන්නේ කෙසේද යන්න ඔවුනට නොතේරීම ය. තව අය සිටියා වේ. එහෙත් මැලේසියාව අයිති මැලේවරුන්ටය. විදේශිකයන්ට නොවේ...''

''..... අතීතයේ දී යුරෝපීයන් මෙන්ම චීන්නු ද මැලේවරුන් සැලසුම් සහගත ලෙස ව්‍යාපාරික ක්ෂේත්‍රයෙන් ඉවත් කළෝ ය. මේ නිසා ධනය අහිමි ජාතියක් බිහිවිය. මැලේවරුන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට ඇද ගන්නට

කළ හැකි සියල්ලක්ම කරන්නට රජය ඉදිරිපත් විය යුතු ය.....''

''..... අධ්‍යාපනය විප්ලවයකට හැරවිය යුතු ය. ග්‍රාමීය සිසුන් නවීකරණය කළ යුතු ය. අනාගත පරිවාර පරපුර ගොඩ නගන අපේ පරපුර ඔවුන් ය .....''

මහතීර් බින් මොහොමඩ් - මැලේ විචිකිච්ඡාව -

මලයාසියාව ගිණිකොන ආසියාවේ ඉස්ලාම් ව්‍යාප්තවාදයේ මුල් බිමකි. වෙන ම රටක් හැටියට එයට අනන්‍යතාවයක් ලැබුණේ වසර 600 කට පෙරදී වුවත් එහි දූපත්වල ශිෂ්ටාචාරය බොහෝ පැරණි ය.

මැලේසියාවේ ජනගහනය මිලියන 21.8 කි. (1999) එය මිලියන 27.9 දක්වා (2015) වැඩිවේ යැයි විශ්වාස කෙරේ. එහි ඒක පුද්ගල ආදායම ඩොලර් 8209 කි. (1999-වවව අගය) එය 4.7 % ක වේගයෙන් වැඩි වන අතර ලෝකයේ ඉස්ලාම් අදහන රටවල ලොකු ම වර්ධන වේගය වේ. අන් මුස්ලිම් රටවල සාපේක්ෂ ව ලොකුම තාක්ෂණ පන්තියකින් ද මැලේසියාව පොහොසත් ය. එහි මානව සංවර්ධන දර්ශකය අනුව ලොවේ 56 ස්ථානයට පත් වී ඇත.

මලයාසියා ආණ්ඩුවට අනුව මලක්කාව සොයාගෙන ඇත්තේ 1390 වසරේදී ය. තවත් ඇතැම් අය එය වසර 1376 හා (1400) අතර තබති. නමුත් අවශ්‍යයෙන්ම කිව යුත්තේ වත්මන් මැලේසියාව අයත් ප්‍රදේශ හා දූපත්වල බොහෝ දුර අතීතයක සිට ශිෂ්ටාචාරය තිබුණු නමුත් යුරෝපීයයන් ග්‍රීකයන් ඔබ්බට තම ශිෂ්ටාචාරය ගෙන යෑමට අකමැති ලෙසම මුස්ලිම් මැලේවරු ද තමන්ට කලින් මැලේසියාවේ සිටි බෞද්ධ පුත්‍රයින්ට බිය වීම නිසා සිය ඉතිහාසය වසර 1390 පළමු මුස්ලිම් රජ කුමරුගෙන් ඇරඹුණා සේ සලකති.

ලියා තබා ඇති පුරාවෘතය අනුව සුමාත්‍රානු කුමරකු වන පරමේශ්වර විසින් 'මෙලෙක්කා' නගරය ගොඩ නගන ලදී. ඔහු ඒ නගරය ගොඩ නංවා ඇත්තේ වරක් සිය දඩයම් බල්ලන් සමඟ දඩයමේ යද්දී ගඟක් අසබඩ ස්ථානයක දී මීමින්නන් විසින් ඔහුගේ දඩයම් බල්ලන් බයකර පලවා හැරි විට ය. එවිට ඔහු විවේකීව සිට ඇත්තේ මෙලෙක්කා ගසක් යට ය. බලු-මීමනු සිදුවීමෙන් පසු එය තම ජය භූමිය ලෙස සැලකූ පරමේශ්වර එහි නුවරක් තැනුවේ ය. එය මෙලෙක්කා නුවර වියත (මෙයට සමාන කතා රැසක් මහාවංශයෙන් ද, බෞද්ධ සාහිත්‍යයේ ද ඇත.)

නිසැකව ම පරමේශ්වර සියම් සම්ප්‍රදායට අනුව ගොඩ නැගුණු බෞද්ධයෙක් විය. නමුත් ඔහු පසුව බහු විවාහ අවශ්‍ය වූයෙන් අරාබි වෙළෙඳුන්ගේ මඟ පෙන්වීමෙන් ඉස්ලාමය වැළඳ ගනී. වෙළෙඳ බලපෑම හා රාජත්වය නිසා ඊළඟට මලයාව ඉස්ලාම් රාජ්‍යයක් විය.

ඉස්කන්දර් ෂා රජුගේ සමයේ මලයාව වෙළෙඳ නගරක් ලෙස දියුණු විය. ජාවක ඉන්දියානු, චීන හා අරාබි වෙළෙඳුන්ට එය විවෘත විය. (1424) විශේෂයෙන් චීන වෙළෙඳුන් මහා පරිමානයෙන් ජනවාස වීම නිසා මැලේසියාවේ චීන-මැලේ නොනවතිනු ගැටුම ඇතිවිය.

සුල්තාන් මන්සූර් ෂා (1456-77) යටතේ මලක්කාව වෙළෙඳ පුරයක් ලෙස බොහෝ ප්‍රචලිත විය. එහි ධනය ගැන අසා සිය සම්ප්‍රදායික මුස්ලිම් විරෝධි වෛරය මත පෘතුගීසි සෙනෙවි අල්පොන්සෝ මලයාව අල්ලා ගත්තේය.

පෘතුගීසින් වසර 10ක් මලයාව පාලනය කළේ ය. වර්ෂ 1641 දී ඔවුන් වෙතින් එය උදුරාගත්තේ මුස්ලිම්-කතෝලික දෙකටම එරෙහි වූ ප්‍රොතෙස්තන්ත ඕලන්දය යි. ඔවුහු බතාවිය (දැන් ජකාර්තා) පදනම් කරගෙන ප්‍රදේශ පාලනය කළහ. ප්‍රදේශය වාණිජ වැවිල්ලට හා වෙළෙඳාම වඩාත් ම පුළුල් වූයේ ලන්දේසීන් නිසා ය. ඉන්පසු ඉංග්‍රීසින් ද ප්‍රංශවන්ද මේ ප්‍රදේශ කරා ආ නමුත් රජ පවුල හා ඉස්ලාමය මැලේවරුන් අතර මුල් බැස ගෙන තිබිණි.

බ්‍රිතාන්‍යය විසින් පළමු හා දෙවන ලෝක සංග්‍රාම දෙකේ දී මලයානු මුහුදු සන්ධිය (සිංගප්පූරුව සහිතව) තමන්ගේ වැදගත් නාවික වෙළෙඳ තොට ලෙස සැලකුවෝ ය. යුදමය ලෙස එය ජපානයෙන් රැකගත යුතු ව තිබිණි. ජපාන ආක්‍රමණයට එරෙහි සිදුවූ දීර්ඝ යුද්ධයේ දී බ්‍රිතාන්‍යය මැලේ ජාතිකවාදීන් සමඟ මෙන්ම මලයාව තුළ කොමියුනිස්ට් රාජ්‍යයක් පිහිටුවීම සඳහා දැඩි සටනක් ගෙනගිය කොමියුනිස්වරුන් සමඟ ද එක්ව කටයුතු කළ හ. 1946 දී බ්‍රිතාන්‍යය 'නිදහස්' සැලැස්මක් ගෙන එමින් මලයාව සඳහා පෙඩරල් සන්ධිය රාජ්‍යයක් යෝජනා කළෝ ය. ඒ හා සමඟ මලයාවට පැමිණ චීන, ඉන්දීයානු හා වෙනත් ජාතිකයන්ට පුරවැසි අයිතිය ද ලබාදීමට ද කටයුතු කළෝ ය.

මෙයින් කෝපයට පත්වන මැලේවරු එක්සත් මැලේ ජාතික සන්ධානය (UMNO) පක්ෂයක් ලෙස ගොඩ නගයි. එහි අරමුණු අතර

මැලේසියාව එහි භූමි පුත්‍රයින් වූ මැලේවරුන්ට පමණක් අයිති බවත්, මැලේ පමණක් එකම රාජ්‍ය භාෂාව බවත්, ඉස්ලාමය නීතිය වූ 'ෂරියා' නීතිගත කිරීමට උත්සාහ කළ ද බ්‍රිතාන්‍යය එයට ඉඩ නොදේ.

මලයාව බ්‍රිතාන්‍යයෙන් මුදා ගැනීම සඳහා ජාතික හා ආගමික මූලධර්මවාදීන් බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ක්‍රියාත්මක වෙද්දී චීනුන් මත පදනම් ව කොමියුනිස්වරු මලයාව ජනරජයක් බවට පත්කිරීම සඳහා දැවැන්ත ගරිල්ලා සටනක් ගෙන යති. ඔවුන්ට රතු චීනයේ සහාය ද ලැබේ. බ්‍රිතාන්‍යය SAS බලකාය ලෝක ඉතිහාසයට නව යුද අත්දැකීමක් එක් කරමින් දැවැන්ත කොමියුනිස්ට් ගරිල්ලා ව්‍යාපාරය යුදමය ලෙස පරදවති. මෙහි විශේෂය වන්නේ ජාතිකවාදය සමග අත්වැල් බැඳගත් කොමියුනිස්ට්වාදය ඉන්දු චීනයේත්, චීනයේත්, කොරියාවේත් ජය ලබා සිටිය දී මලයාවේ ලත් පරාජය ය. ගරිල්ලා ව්‍යාපාරයක් ජාතික සටන් පාඨ මත පදනම් වුවත් එය ගරිල්ලා උපක්‍රම වලින් ම පැරදවිය හැකි බව (1951-57) මලයා සටන පෙන්වා දුන්නේ ය.

1957 දී මලයාව නිදහස් රටක් වූ අතර ඉන්පසු එය රජතුමා යටතේ පාලනය කළේ උම්නෝ (UMNO) පක්ෂය හා බැඳුණු ජාතික සන්ධානයයි. ෆෙඩරල් රාජ්‍ය 14 න් 12 ක් පාලනය කරන්නේ ද ඔවුන් ය. මැලේසියාව නිදහස ලබාගත් පසු තුන්කු රහුමාන් කළ එක ප්‍රකාශයක් වූයේ මලයාවේ 45% ක් වන මැලේවරුන් විවිධ දේශපාලන පක්ෂවලට බෙදී ගියහොත් අන්‍ය ජාතීන් එය පාලනය කිරීමට හැකි බැවින් එක් ජාතික පක්ෂයක් පමණක් මැලේවරුන්ට තිබූ යුතු බව ය. ඔහු එය බිහි කළේ ය. එතැනින් නොනැවතී ඔහු චීන හා ඉන්දියානු ජනයාගේ පක්ෂ සමඟ ද අත්වැල් බැඳ ගත්තේ ය. එය මැලේසියාවේ ප්‍රබල එක්සත්කමට හේතු විය.

1961 දී සිංගප්පූරුව මැලේ සන්ධිය රාජ්‍යයෙන් ඉවත් වී චීන පදනම මත වෙන ම ශක්තිමත් රාජ්‍යයක් බවට පත්විය.

සිංගප්පූරුව මෙන්ම මලයාව ද වැදගත් අත්දැකීම් වන්නේ බලවත් පෞරුෂයක් විසින් ඒ දෙරටේ මෙහෙයවීම ය. සිංගප්පූරුව ලී ක්වාන් යටතේ නවීකරණය වූ වෙළෙඳ රාජ්‍යයක් බවට වේගයෙන් පත්වූ අතර ලෝකයේ නාවික, ගුවන්, මූල්‍ය හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් බවට වර්ධනය විය. මැලේසියාව මෙයට එකතු වන්නේ 1981 සිට ය. ඒ මහතීර් මොහොමඩ් මැලේසියාවේ අගමැති වීමෙන් UMNO නායකයා වීමත් සමඟ ය.

මහතීර්ගේ නූතනවාදී අදහස් නිසා ඔහු 1967 දී පක්ෂයෙන් නෙරපන ලදී. 1969 චීන-මැලේ ගැටුම්වලින් පසු ප්‍රකම්පනයට පත්වන මැලේවරුන්ට නව මාවතක් පෙන්වා දෙන්නේ මහතීර් ය. වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වූ නිසා ඔහුට තාක්ෂණ පන්තියේ සහාය ලැබේ. ඔහුගේ මැලේ විචිකිච්ඡාව (Malay Dilemma) නිකුත්වීමෙන් පසු සිංගප්පූරුව දෙස බලමින් මැලේවරු ද ක්‍රියා කරන්නට පටන් ගනිති. 1972 දී ඔහු යළිත් UMNO හා එක්වන අතර මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක, ඇමතිවරයෙක් හා අවසානයේ මැලේසියාවේ අගමැති (1981-ජුලි 16) වේ. ඉන්පසු ඔහු තමාගේ දර්ශනය ක්‍රියාවට නංවයි.

1983 දී ඔහු රාජකීය පවුලේ බලතල සාර්ථක ලෙස සීමා කරයි. ඉන්පසු පුද්ගලීකරණය හා විදේශ ආයෝජන ඉලක්ක කරගත් නවීකරණය ඇරඹේ. පසුව 1997 මූල්‍ය අර්බුදය පෙන්වා දුන්නේ අන්ධයන් ලෙස කළ විවෘත ආර්ථික කරණය ඉතා විනාශකාරී බව යි. එවිට මහාතීර් ජාතික ආර්ථිකය ශක්තිමත් කරනා විකල්ප යෝජනා ගෙනවිත් ආර්ථිකය ශක්තිමත් කරයි.

, මහාතීර් 1987 දී 'පුවත්පත්' පාලනය කරන නීති ගෙනවිත් ඒවා මර්දනය කරයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් දෙදෙනෙකු ඉවත් කෙරේ. 1991 දී ඔහු තිස් අවුරුදු වැඩ පිළිවෙලක් ඉදිරිපත් කරයි. 1993 දී ඔහු තවදුරටත් රාජකීය පවුලේ බලතල කප්පාදු කර විධායක හා ව්‍යවස්ථාදායක බලතල තමා අතට ගනී. මූල්‍ය අර්බුදය සමඟ පුද්ගලික සමාගම් පාලනය කළ ආයතන රජය සතු කරයි. (බාකුන් වේල්ල, මලයාසියා ගුවන් සේවය) මහතීර්ගේ ඉරණම අන්ධ ලෙස විවෘත ආර්ථිකය ගෙන යන්නන්ට හොඳ උදාහරණයකි. ඉන්පසු ඔහු බටහිර විරෝධියෙකු වේ. ඔහුගේ උප අගමැති වූ බටහිර ට ලැදි අන්වර් ඉබ්‍රාහිම් (අන්වර් තරුණ වියේදී ඉස්ලාම් මූලධර්මවාදියෙකු විය) පවා සිර කරයි. එමෙන්ම ඔහුගේ මූල්‍ය උපදේශක ඩයිම් සියනුදීන්ව ද පහ කරයි. කෙසේ හෝ ඔහු මූල්‍ය අරමුදලේ ග්‍රහණයෙන් මිදේ.

මහාතීර් මොහොමඩ් 2003 වසරේදී විශ්‍රාම යෑමට නියමිත ය. සිය සමුගැනීම ප්‍රකාශයට පත් කරමින් කඳුළු සලමින් ඔහු කීවේ වසර 20 ක තම උත්සාහයෙන් මැලේවරුන් නවීකරණය වුවත් තවමත් ඔවුන්ට රටේ ආර්ථිකය හිමිකර ගැනීමට නොහැකි වූ බව යි. එමෙන්ම මැලේසියාව වේගයෙන් ඉස්ලාම් මූලධර්මවාදය යටවෙමින් පවතින බවට ද ඔහු බිය පළ කළේ ය. නූතන ලෝකයේ මුස්ලිම්වරුන් බිහිකළ වඩාත්ම ආනුභාව සම්පන්න බුද්ධිමත් නායකයා නිසැකව ම මහතීර් මොහොමඩ් ය.

මහතීර් මොහොමඩ් විශ්‍රාම යෑමත් සමඟ උම්නෝ ව්‍යාපාරයේ බලය දුර්වල වෙමින් ඇත. චීන හා මැලේවරු අතර දේශපාලන බෙදීම් ද උත්සන්නව ඇත. ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම් මෙන්ම මූලධර්මවාදී කණ්ඩායම් ද ශක්තිමත් වෙමින් පවතී. කෙසේ වෙතත් තවමත් නූතන මුස්ලිම් රාජ්‍යයකට හොඳම උදාහරණය මැලේසියාවයි.

## ඉන්දුනීසියාව

ඉන්දුනීසියාව ජනගහනය අතින් ලෝකයේ විශාලතම මුස්ලිම් රාජ්‍යයයි. එහි ජනගහනය මිලියන 209.3 කි. (1999) එය මිලියන 250 ක් බවට පත්වේ යැයි විශ්වාස කෙරේ. (2015) එහි ඒක් පුද්ගල ආදායම ඩොලර් 1860 කි. (1999 ppp) මානව සංවර්ධන දර්ශකයේ එයට හිමිව ඇත්තේ 102 වැනි ස්ථානය යි. එය දුගී රටක් ලෙස සලකනු ලැබේ.

එහෙත් එහි ඉතිහාසය ඉතා පොහොසත් ය. 'ජාවා මානවයා' නමින් ප්‍රචලිත පැරණි මිනිසා එහි වසර 60,000 කට පෙර වාසය කළ බවට තොරතුරු ඇත. ජාවා සිට පැපුවා නිව්ගිනියා දක්වා එතැනින් වත්මන් ඕස්ට්‍රේලියාව දක්වාත් ඓතිහාසික ජනවර්ගය වූයේ ඔවුන් ය. ඉන්පසු ක්‍රි.ව. 4 වන සියවසේ පමණ වත්මන් මැලේ-ජාවක (මාලයෝ පොලිනිසියන්) මුතුන්මිත්තන්ගෙන් එහි පැමිණි බව විශ්වාස කෙරේ. මේ අනුව මුහුදු බඩ ප්‍රදේශවල මාලයෝ ජනයා ද රට ඇතුළත කඳුකර ප්‍රදේශවල පැරණි ජාවකයෝද වාසය කළෝ ය.

ඉන්දුනීසියානු ප්‍රදේශ මුල් යුගයේදී ම චීනයේත්- ඉන්දියාවේත් සංක්‍රමණික වෙළෙඳ හා ආගමික බලපෑමට යටත් විය. මේ අනුව බුදු දහම ක්‍රි.ව. තුන්වන සියවසේ දී පමණ ඉන්දුනීසියාවට ද පැමිණෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. ථේරවාදය, මහායානය හා යෝගාචරවාදය හා පසුව තන්ත්‍රයානය එහි පැතිරී ගියේ ය. ලෝවේ විශාලතම බෞද්ධ මධ්‍යස්ථානයක් වූ බොරෝ බුදූර් වැනි ස්ථාන ගොඩනැඟිණි. බෞද්ධ ලෝකය සමඟ සබඳතා පැතිරී ගියේ ය.

ප්‍රචලිත අධිරාජ්‍යයන් වූයේ සිරි විජය හා මජාපනිත් වරුන් ය. හින්දු ආගමික බලපෑම ද පැතිරී තිබුණි. නව වැනි සියවසේ දී පමණ සිට අරාබි වෙළෙඳුන්ගේ ඉන්දුනීසියාව ඉස්ලාමය ගෙන ආහ. ශ්‍රෝතික ජන කණ්ඩායම්වල නායකයින්ට සන්තෝසම් දී උතුරු අප්‍රිකාවේ ඉස්ලාමය ව්‍යාප්ත කළ ලෙස ම ජාවා දූපත්වල එය ව්‍යාප්ත විය. 13 වන සියවසේදී



කුඩා ළමුන් සටනට යොමු කරවීම

මාර්කෝ පෝලෝ එහි යන විට පළමු මුස්ලිම් රාජධානිය ගොඩ නැගී තිබිණි. ඉන්පසු බලය මතින් පැතිරී ගියේ ය. මාලයේ ජන කණ්ඩායම බොහෝ දුරට ඉස්ලාමයට හැරවිණි.

1511 සිට පෘතුගීසින්ගේ පැමිණීම සනිටුහන් විය. ඉන්පසු ලන්දේසීන් පැමිණි අතර ඔවුන්ගේ නැගෙනහිර ඉන්දීය වෙළෙඳ සමාගම් විසින් (VOC) ජාවා දූපත්වල නැවුම් වන තීර සිනී හා කෝපි වගාවට හරවන ලදී. කෝපි වලින් 3/4 ක්ම සැපයුණේ එයිනි. ලන්දේසි පාලනය සියවස් තුනක් පැවති අතර රට මැද ජීවත් වූ ජාවක ජන වර්ගය සිය සම්ප්‍රදායික ආගම් අතහැර ක්‍රිස්තියානියට හරවන ලදී. මේ නිසා අද දක්වාම ටිමෝරය, ඉරියන් ජාවා ආදි ප්‍රදේශවල ජාවක ක්‍රිස්තියානින් හා මලයා ඉස්ලාමුන් අතර නොනවතින ගැටුම් හා බෙදුම් වාදයන් ඇතිවිය. ලංකාවට මැලේවරුන් ගෙන එන්නේ ද ලන්දේසීන් ය.

20 වන සියවස එළැඹෙත්දී ජාතිකවාදය නැග එයි. එයට ඉන්දීය මෙන්ම චීන නැගිටීම් ද බලපායි. ජාතිකවාදීන් හා කොමියුනිට්වාදීන් එක් වී ගරිල්ලා යුද්ධයක් ද ලන්දේසි හා පෘතුගීසි ආධිපත්‍යයට එරෙහිව ගෙන යති.

ඉන්දුනීසියාව 1945 සිට ජනරජයක් වී වසරකට පසු නිදහස දිනා ගනී. ඉන්දුනීසියාවේ මේ යුගයේ වැදගත් ම චරිතය වන්නේ සුකර්නෝ ය.

1901 ජුනි 6 දා සුකර්න ජාවක රදලයෙකු හා බාලි මවකට දාව උපදී. දක්ෂ සිසුවෙකු ඔහු තරුණ අවධියේදී ම පාටායි ජාතික සංගමය බිහිකිරීමට දායක වේ. (1929) ඔහු ජාවක, බාලි, ආකනිය හා සුමාත්‍රා ආදි ජනවර්ග එක්සත් කර එක ම ජාතියක් ගොඩනැගීමට වෙර දරයි. එතැනදී ඔහු ඉස්ලාමයට වඩා ජාතිකවාදය පදනම් කරගනී. හිදෙනි ටෝපෝ ගේ ජපන් පැසිස්ට් ආක්‍රමණය පැමිණි විට ලන්දේසීහු ලොකු සටනකින් තොරව යටත් වෙති. 1945 දී සුකර්ණ මොහොමද් හට්ඨා සමඟ එක් වී නිදහස ප්‍රකාශ කරයි. ඔහු මුල සිටම බටහිර විරෝධී ජාතිකවාදියෙකු වේ. මේ වනවිට ලෝකයේ ලොකුම කොමියුනිස්ට් පක්ෂය තිබුණේ ද ඉන්දුනීසියාවේ ය. නේරු, නසර්, ටිටෝ, උ නු, බණ්ඩාරනායක මෙන් සුකර්ණ ද සමාජවාදයට බර ජාතිකවාදියෙක් විය. බටහිර යටත් විජිතවාදයට එරෙහිව ඔහු විවෘතව හඬ නැගුවේ ය.

ජපන් ආක්‍රමණයට එරෙහි ව මිත්‍ර ජාතීන් හා සටන් කර 1945 නොවැම්බර් 10 ලන්දේසින් ඉවත් කිරීමට සුකර්ණ ප්‍රමුඛ ජාතිකවාදීහු සමත් වෙති.

සුකර්ණෝ පක්ෂ 60 කින් සමන්විත ඉන්දුනීසියානු දේශපාලනය, පක්ෂ 11 කට සීමා කළ අතර විධායන බලය හසුරුවන මැතිවරණ ක්‍රමයක් 1959 සිට යොදා ගත්තේය. ඔහු කොමියුනිස්ට් බලපෑමට නතු වෙමින් යන බවට මතය නිසා මහා සංහාරයකින් පසු සුහර්තෝ 1967 දී හමුදා පාලනයක් පිහිටුවයි. කොමියුනිස්ට්වරු දරුණු ලෙස මර්දනය කරයි. ඒ සඳහා ඉස්ලාමය ආවරණයක් ලෙස යොදා ගැනේ. හමුදා පාලනය අඩ වශයෙන් ඉවත් වන්නේ 1998 දී සුහර්තෝ ඉවත් කළ මහජන උද්ඝෝෂණ නිසා ය. ඉන්දුනීසියාව තවමත් ජනතාව පත්කළ ආණ්ඩුවක් තෝරාගෙන ඇත.

1997 ආර්ථික අර්බුදයෙන් වැඩියෙන්ම බැට කන්නේ ඉන්දුනීසියාවයි. 1975 පෘතුගාලයෙන් අැඳා ගන්නා ලද නැගෙනහිර ටිමෝරය ගුස්මාවෝගේ නායකත්වයෙන් ක්‍රිස්තියානි රාජ්‍යයක් බවට පත්වේ. ඉන්පසු අම්බන්, ඉරියන් ජාවා වැනි ජාවක ජනවර්ග අයත් ප්‍රදේශවල ද ක්‍රිස්තියානි බෙදුම්වාදයන් ඇතිවේ. වහීඩ් හෝ පසුව පැමිණි සුකර්නෝගේ දියණිය වූ මෙගාවතිට තබා හමුදාවටත් රට පාලනය අසීරු වී ඇත. මේ තත්ත්වය යටතේ ඉන්දුනීසියාව ක්‍රිස්තියානි හා ඉස්ලාම් ලෙස බෙදී වෙන් වෙන අතරේ, අන්ත මූලධර්මාවදී පක්ෂ ෂරියා නීතිගත කරන ලෙස උද්ඝෝෂණය කරමින් මැතිවරණවලින් පවා ඉදිරියට එමින් සිටිති. ලෝකයේ වැඩිම සාමාජිකත්වයක් සහිත මුස්ලිම් මූලධර්මවාදී පක්ෂය තිබෙන්නේ ඉන්දුනීසියාවේ ය. බාලි බෝම්බ ප්‍රහාරයෙන් පෙනී ගියේ එය දැන් මූලධර්මවාදී ත්‍රස්තවාදයේ ගොදුරු බිමක් වී ඇති ආකාරය යි. ඉස්ලාමීය මූලධර්මවාදයේ අලුත්ම සටන් පාඨය වී ඇත්තේ මැලේසියාව, ඉන්දුනීසියාව, සිංගප්පූරුව හා පිලිපීන දූපත්වලින් ඇතැම් ප්‍රදේශවලින් අැඳෑගත් දැවැන්ත ඉස්ලාමීය ආණ්ඩුවක් පිහිටුවීම ය. මෙය සාර්ථක වුවහොත් එය ලෝකයේ ජනගහනයෙන් මෙන්ම ආර්ථිකයෙන් ද බලවත් ම මුස්ලිම් රාජ්‍යය වනු ඇත.

හිටපු හමුදාපති යුදයානෝ ජනාධිපති වීමෙන් පසු ඉන්දුනීසියාවේ බෙදුම්වාදය පරාජය කරනා ලදී. සුල්තාන්වරු සමඟ ප්‍රාන්ත බලතල බෙදා ගැනීම ද සිදුවිය. තෙල්, ගෑස්, ගල් අඟුරු සම්පත නිසා ඉන්දුනීසියාව අද ආසියාවේ බලශක්ති කේන්ද්‍රය වී ඇත. එය 2020 වනවිට ලොව බලවත්ම ආර්ථිකයන් 10 න් එකක් වනු ඇතැයි අනාවැකි පළවී තිබේ.

''කෝටි සංඛ්‍යාත හින්දූන්ගේ හා මුස්ලිමුන්ගේ ජීවිත වල ඉරණම තීන්දු මූ ප්‍රේම ත්‍රිකෝණය ඇරඹෙන්නේ 1946 දිනයක සිංගප්පූරුවේදී ය. කඩවසම් මවුන්බැටින් සාමිවරයා සිය බිරිඳ වූ එඩ්විනා මවුන්බැටින් සමඟ ඉන්දියාවේ අගමැති ජවහර්ලාල් නේරු එහිදී හමුවිය. පළමු දැක්මෙන් ම නේරු ගේ දීප්තිමත් ඇස් එඩ්විනාගේ හදවත විනිවිද යන්නට සමත් විය. මවුන්ට්බැටන්ට ඒ ඇසුර වැදගත් එකක් විය. එක අතකින් ඉන්දියාවේ විසුරේවරයා වශයෙන් මහා භාරතය, ඉන්දියාව හා පාකිස්ථානය දෙකඩ කරන්නට නියම වූ ඉරණම් කරුවා ලෙස ඔහුට එය වැදගත් විය.

මවුන්ට්බැටන් අපූරු ප්‍රේමවන්තයෙක් විය. ඔහුගේ ඉරණම්කාරිය වුණේ යෝලා ලැටලියර් නම් ප්‍රංශ ජාතික කාන්තාවයි. ඇය පසුව ජනප්‍රිය වූ ගිගී චිත්‍රපටියේ හා නව කථාවේ කථා නායිකාවයි. ඒ ඇසුර වසර හතලිස් ගණනක් පැවතුණේ ය. මවුන්ට්බැටන් එඩ්විනා විවාහ කරගත්ත ද ඔහු යෝලා අතහැරියේ නැත. අනෙත් අතින් සුප්‍රකට එංගලන්ත පිරිමි උසස් පාසල්වල සම්ප්‍රදාය අනුව යමින් මවුන්ට්බැටන් සමලිංගිකයෙකු විය. (වොල්පර්ට් වැන්නවුන්) පෙන්වා දෙන්නේ මවුන්ට්බැටන් හා නේරු අතර ද ආදර සම්බන්ධයක් වූ බව ය. මේ අතර මවුන්ට්බැටන් කඩවසම් අලිජින්නාවද පොළඹවා ගැනීමට උත්සාහ කළ බවට ( කොලින්ස් හා ලැපියේ) චෝදනා කරති. ඉන්දියාව බෙදා වෙන්කිරීමේ සූත්‍රය රාජතාන්ත්‍රිකව මවුන්ට්බැටන් දුටුවේ ගැඹුරු පුද්ගලික සබඳතා හරහා ය. තරුණ සරෝජිනි නායිදූගේ කවි ඇස පවා උමතු කළ ජින්නා මවුන්ට්බැටන්ට පොළොඹවා ගත නොහැකි විය. ජින්නාගේ 'මාන්නය' ඉන්දියාව විනාශ කළ බව මවුන්ට්බැටන්ගේ චෝදනාව විය.

එඩ්විනා හාත්පසින්ම වෙනස් කතක් වූවා ය. ඇය සම්මත අරුතින් 'රූමත්' කතක් නොවූවා ය. නමුත් ඇයගේ දෙනෙත් විදුලියක් විය. එය නේරුගේ හද පසාරු කළේ ය. සාමාන්‍ය බටහිර කතක් මෙන් ම ඉන්දියාවේ අධ්‍යාත්මික ජීවිතය දැන ගන්නට ඇයට තිබුණේ පුදුමාකාර කැමැත්තකි. ඇනී බැසන්ට් එහි පිටු බටහිර ලෝකයට විවෘත කර තිබුණා ය. ගුප්ත ඉන්දීය ආධ්‍යාත්මවාදය ට එඩ්විනා ද ඇදී යන්නී ඇයට ඉන්දීය ගුරු නේරු හමුවේ. උපතින් යුදෙව්වෙකු වූ එඩ්විනා, ඊශ්‍රායලය බිහිවීමත් මුස්ලිමුන් එයට දැක් වූ වෛර සහගත ප්‍රතිවිරෝධයත් ගැන කම්පනයෙන් සිටින්නට ඇත. නාසීන් හා අරාබියේ හෝ ඉන්දියාවේ මුස්ලිමුන් අතර වෙනසක් නැතැයි අපට කියා දෙන්නට තරම් නේරු රාජතාන්ත්‍රික වන්නට ඇත. නේරු හා

ඇය අතර හුවමාරු වූ පෙම් ලිපිවලින් හෙළි වන්නේ ඔවුන් අතර සම්බන්ධය කෙතරම් උණුසුම් ද යන්න ය.

"ඔබ මගෙන් ඉවතට යන බව පෙනෙන විට මට ඇති වන්නේ අපිරිමිත වේදනාවකි. වෙන් වී යාමේ විරහ වේදනා ඔබටත් එසේම ද?"

"...... මම සිම්ලාවේ මතකයන් අතර තවමත් ජීවත් වෙමි. ඔබේ උණුසුම සහිත ඒ දිනයන් ඇත්තට ම කෙතරම් සුන්දර ද පෙම්වත."

පාකිස්ථානයේ හිටපු විදේශ ඇමති එස්. පීර්සාදා හමු වූ නේරුගේ ඉහළම නිලධාරියෙක් වරක් ජින්නා හට දෙන්නට යැයි කියා එඩ්විනා - නේරු පෙම් ලිපි කිහිපයක් ලබා දුන්නේ ය. ජින්නා ඔහුගේ සොහොයුරිය ඒවා කියවූ හ. ඉහළට ඇසෙන්නට හිනාවුණ ජින්නා "සීසර්ගේ බිරිඳ පවා වලපයි". කියා ඒවා ඉවත දැමී ය. බොහෝ කලකට පසු නේරු හා එඩ්විනා දෙදෙනා ම ජීවතුන් අතර නොමැති සමයක (1967) මවුන්ට්බැටන් සාමිවරයා මේ ලිපි ගැන පීර්සාදාගෙන් විමසුවේ ය.

මවුන්ට්බැටන් මහා නේරු අතර පැවති උණුසුම් බැඳීම් ඔහු ඉන්දියාවෙන් පිට වී යාමත් සමඟ කෙළවර විය. දෙදෙනාටම එය කාම සූත්‍රයේ පිටුවකට වඩා වැඩි නොවූ රාජතාන්ත්‍රික සබඳතාවක් විය. නමුත් එඩ්විනාට එය එසේ නොවී ය. ඉන්දීය ගුරුගේ සිරුර හා මනස එක්කළ ප්‍රේමයේ සුවඳ ඇය වෙතින් මියයන තෙක්ම නික්ම නොගියේ ය. ඇය මිය යනවිට (1960) ඇයගේ ඇඳ ඉහත්තාවේ වූයේ සුවඳ කවනු ලැබූ නේරුගේ පෙම් ලිපි ය. ඒවා ඇයගේ රාත්‍රී තනි යහනේ කියවීම් වූයේ ය. ඇය මියගිය විට උතුරු මුහදේ ශීතල ගැඹුරු පතුලේ මිහිදන් වීම ඇයගේ අන්තිම කැමැත්ත විය. එය එසේම සිදු විය. සියළු ම රාජතාන්ත්‍රික නීති බිඳිමින් නේරු ඉන්දීය යුද නැවක් වූ ත්‍රිශූල් යවා ඇය මුතු වැස්සකින් තෙමුවේ ය.

ඉංග්‍රීසින්ට යටවීමට පෙර මහා භාරතය විශාල රටකි. New International නම් ජාත්‍යන්තර සඟරාව වරක් ලෝකයේ 'සැබෑ' සිතියමක් ඉදිරිපත් කළේ ය. එයින් පෙනී ගියේ සැබෑ වර්ග ප්‍රමාණයෙන් අනුව ගත් කළ මහා භාරතය යුරෝපය තරම් විශාල බව ය. 'මර්කේටර්' ආදි ප්‍රක්ෂේපිත ලෝක සිතියම්වල යුරෝපය, රුසියාව, උතුරු ඇමරිකාව ආදි රටවල් පමණට වඩා විශාලව පෙන්වා ඇත්තේ සුදු වර්ගවාදය නිසා බව එකී සඟරාව චෝදනා කළේ ය. මේ අනුව භාරතය භූගෝලීය වශයෙන් ද ජනගහනමය වශයෙන් ද දැවැන්ත රටකි. වසර 1700 දී පවා මිලියන 180 ක් හෙවත්

ලෝක ජනගහනයෙන් 20% ක් සිටියේ ය. එහි විශිෂ්ඨත්වය රැඳී ඇත්තේ සංස්කෘතිය තුළ ය. ලොවේ පහළ වූ සියළුම දර්ශන පාහේ භාරත බිමේ උපත ලබන ලදී. යුදෙව් ආගම හැරුණු විට සෙසු සියළු ආගමික් දර්ශනයන් සඳහා භාරතීය දර්ශනවල බලපෑම ලැබී ඇත. බටහිර බිහි වූ නව විද්‍යාත්මක චින්තනය හා දැනුමට පදනම් වූ දත්ත ලැබුණේ ඉන්දියාවෙනි. එහි සංස්කෘතිය හා විවිධත්වය හා ඒකීයත්වය සම කළ හැකි බිම් කඩක් ලෝකයේ නැත. කොටින්ම භාරතය ලෝකයකි.

භාරතයට මුල් මුස්ලිම් ආක්‍රමණ ඇති වූ ආකාරයත් ඔවුන් බුදු දහම විනාශ කළ අයුරුත් අපි සාකච්ඡා කළෙමු. දිල්ලි සුල්තාන් යුගයෙන් (වසර 1206-1526) පසු මෝගල් යුගය (1526-1707) ආවේ ය. එය අවසන් වන්නේ ඉස්ලාමය දෙසට නැඹුරු වූ ඔරන්සිබ් වෙතිනි. එවිට උත්තර භාරතයේ වෙළෙඳාම, දැනුම හා අවි බලය සහිත ප්‍රභූ බලය වන්නේ මුසුල්මානුවන් ය. ඔරන්සීබ්ගෙන් පසු ශක්තිමත් පාලනයක් ඇති නොවුව ද මෝගල් පරපුර (තවත් පස් දෙනෙකු දක්වා) ඉදිරියට යයි. 1739 දී ඉරානයේ සිට පැමිණි නදිර් ෂා මෝගල් හමුදා පරාජය කර 20,000 කට අධික පිරිසක් සමූල ඝාතනය කර කලකට දිල්ලිය අල්ලා ගනී. ඔහු අනුව යමින් අහමද් ෂා අබ්දාලි ද දිල්ලිය ආක්‍රමණය කළේ ය.

මේ වනවිට භාරතයේ විවිධ ප්‍රදේශවල යුරෝපීය බලපෑම එල්ල වූ බව සැලකිය යුතු ය. පෘතුගීසි, ලන්දේසි ආදි පුරෝගාමී ආක්‍රමණිකයන්ගේ එක් ඉලක්කයක් වුණේ මුස්ලිම් බලය බිඳලීම ය. එය සැලකිය යුතු ලෙස ඉන්දීය සයුරේදී සිදු විය. (ලංකාවට ලොරෙන්සෝද අල්මේදා ගොඩ බසින්නේ ද එවැනි මුස්ලිම් නැව් තවලමකට පහරදීමට යෑමේ ප්‍රතිඵලයක් ලෙසට ය) නමුත් භාරතයට ගොඩබසින වඩාත් ම බලවත් ආක්‍රමණිකයා වන්නේ ඉංග්‍රීසින් ය. මොවුන් සියල්ලෝ කරකැවෙන්නේ දකුණු භාරතීය වෙරළ තීරවල ය.

ලාහෝර් අග නගරය කර ගනිමින් රන්ජිත් සින් විසින් වසර 1799 සි 'සීක' රාජධානිය පිහිටුවීමෙන් වයඹින් ඇති වූ මුස්ලිම් ආක්‍රමණවලට වැටක් ඉදිවිය. ඇතැම් මතයන්ට අනුව සීක දහම බිහිවූයේ බෞද්ධයන් හා හින්දුන්ට රණකාමී ඉස්ලාමයට මුහුණ දිය නොහැකි වූ නිසා ඒ සියළු ආගම්වල රණකාමී සංයෝගයක් ලෙස ය. එය සීක දහම හැදෑරීමේදී පෙනී යන්නෙකි. කෙසේ වෙතත් අද දක්වාම සීකයින් යුද්ධයේදී ද, උගත්කමේදී, වෙළෙඳාමේ දී ඉන්දියාවේ බලවත්ම ජන වර්ගය වෙති. අකාලිදාල් පක්ෂය විසින් සීක බෙදුම්වාදයත් ඇති කිරීමට පන්ජාබයේ කැරලි ගසන්නේ ද මේ අනුවය.

වයඹින් ඉස්ලාම්වාදය සීකයින් විසින් බැහැර කරන විට දකුණින් එය නතර කිරීමට විජයනගර හින්දු රාජධානිය බිහිවේ. භාරතයේ විශේෂත්වය වන්නේ එය කිසිවිටක (ඉංග්‍රීසින් එන තෙක්) හින්දු රජෙකු යටතේ පාලනය නොවූ රටක් වීමය. එය යම් ප්‍රමාණයකට හෝ මහා පරිමාණයෙන් පාලනය කළේ බෞද්ධ අශෝක රජතුමා හා මෝගල් අධිරාජ්‍යය විසිනි. විජය නගර හින්දු ප්‍රබෝධය ගෙන ආවේ ය.

බ්‍රිතාන්‍යය සිය මුල් ම භාරත ආක්‍රමණය සිදුකරද්දීම ප්‍රථම හින්දු මුස්ලිම් සමූහ ගැටුම බෙනාරිස්වලින් (1809) වාර්තා විය. බ්‍රිතාන්‍යය කාබුල් අල්ලා ගත් නමුත් (1839) එය පවත්වා ගැනීම පාඩු සහිත වූ නිසා අතහැර දැම්මෝය. පසුව ඔවුන් සින්ද් ප්‍රදේශයේ බලය තහවුරු කර ගත්තේ ය. කාෂ්මීරයේ සැබෑ ප්‍රශ්නය ඇති කරමින් ඔවුහු සිය මිනිස් හිසක් රුපියල් තුන බැගින් මිලකට ගුලාබ් සින්ට (1846) වික්කේ ය. ලක්නව් අවට තිබූ අවසාන මුස්ලිම් රාජ්‍යයන් ද 1856 දී අල්ලා ගන්නා ලදී.

බ්‍රිතාන්‍ය ඉන්දියාව අපූරු එකක් විය. එහි සෘජු බ්‍රිතාන්‍ය පාලනයට යටත් වූ ප්‍රදේශවලට අමතර ව, බ්‍රිතාන්‍ය බලය පිළිගත් කුමාරවරුන්ගේ පාලනය යටතේ කුඩා රාජ්‍යයන් 562 ක් විය. මොවුන්ගෙන් විශාල පිරිසක් මුස්ලිම්වරුන් වූහ.

1835 දී මැකෝල් යෝධ භාරතය පාලනය කිරීම සඳහා නීති පද්ධතියක් හා අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දෙයි. එමගින් ඉංග්‍රීසියට හිතැති කළු සුද්දන් (Brown Sahib) බිහිකර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. බ්‍රිතාන්‍ය ආක්‍රමණයේ මුල් යුගවලදී මුස්ලිම්වරු ප්‍රචණ්ඩ ලෙස ඉංග්‍රීසි පැමිණීමට විරෝධය පෑ නමුත් පසුව ඔවුන් සමඟ වෙළෙඳාමට එක් වී භාරත ප්‍රභූවාදයේ නවතම 'බ්‍රාහ්මණ' කුලය බවට පත්විය.

1780, 1806 හා 1857 තමන්ගේම හමුදාවල සිටි ඉන්දීය ජනයා ගැසූ කැරලි නිසා බ්‍රිතාන්‍යය තැති ගත්තේ ය.

1857 හමුදා කැරැල්ල පැතිරී යද්දී බෙංගාලියේ දී එයට මුස්ලිම් මානය එක් විය. නැවත මෝගල් අධිරාජයා පිහිටුවීම කැරැල්ලේ මුස්ලිම් අභිලාෂය විය. කැරැල්ල මර්දනය සඳහා දරුණු සංහාරයක් ඉන්පසු දියත් කළේ ය. කාන්පූර් නගරයේ ඇති වූ එවැනි සංහාරයකින් දිවි ගළවා ගත්තේ හත් දෙනෙකු පමණි. ඉන්දියානු කැරලි පාලනය කළ නොහැකි තැනට පත්විය හැකි බව දුර දක්නා සියළු බ්‍රිතාන්‍යයන්ට විශේෂයෙන් ඉන්දියාවේ වැවිලි හා ව්‍යාපාර කරමින් ස්ථිරව පදිංචි ව සිටියවුන්ට පෙනී ගියේ ය.

එයින් එක් අයෙක් වූයේ හියුම් ය. ඉන්දියාවට නිදහස සඳහා වූ ජාතික ව්‍යාපාරයක් ඉන්දීය ජාතික කොන්ග්‍රසය නමින් බිහිකරන්නට හියුම් මූලික විය. මේ ගැන ඔහුගෙන් ප්‍රශ්න කළ විට ඔහු කීවේ කෙදිනක හෝ ඉන්දියාව නිදහස ලබාගන්නා බවත් මේ දැවැන්ත රට පාලනය කිරීමට ඉංග්‍රීසින් පොඩි වැඩි බවත් ය. ඒ නිසා ප්‍රචණ්ඩ පලවා හැරීමකට කලින්, දැවෙන භාරත නිදහස් උන්නතිකාමය අවිහිංසාවාදී ව පිට කිරීම සඳහා තමන් ඉන්දීය ජාතික කොන්ග්‍රසය තනන බව ඔහු සුදු ආණ්ඩුකාරයාට කීවේ ය. හියුම් කීවේ බොයිලේරුව රත්වී පුපුරන්නට පෙර කරාමය හැර වාෂ්ප පිටකළ යුතු බවයි. මෙය පසුව බටහිර අධිරාජ්‍යවාදයේ උපක්‍රමයක් විය. එනම් අවසාන අරුතින් තමන්ට හිතවත් පිරිසක් ලබා තමන්ට එරෙහි අරගලය ද ගෙන යාම ය. (මෙය බටහිර රටවල් හා මූල්‍ය ආයතන අද රාජ්‍ය නොවන සංවිධාන වලින් ද කරවා ගනී. එනම් බොයිලේරුව පිපිරීමට පෙර කරාමය ඇරීම හෝ ගැස්සීම් උකහා ගැනීමට (shock Absorber) තමන්ගේ ම වූ උපකරණ සවිකර ගෙන නඩත්තු කිරීම ය.)

කෙසේ වෙතත් ක්‍රමයෙන් ඉන්දීය ජාතික කොන්ග්‍රසය ඉන්දියානු නිදහස් වාදීන්ට ම හිමිවේ.

ඊජිප්තුවේ ඇති වූ විමුක්ති සටනේ ප්‍රබෝධය නිසා 1906 දී ඩැකාහි නවාබ්ගේ මූලිකත්වයෙන් මුස්ලිම් ලීගය බිහිවේ. බෙංගාලිය නමින් වෙනම මුස්ලිම් ප්‍රාන්තයක් ඉල්ලා කෙරුණු අරගලය ජය ලබමින් ඉංග්‍රීසින් 1905 දී එය ලබාදීම මේ ප්‍රබෝධයේ දේශීය හේතුව විය. රවීන්ද්‍රනාත් තාගෝර්ගේ සිට නවාබ් දක්වා ඉන්දීය නිදහස් සටනේ තොටිල්ල වුණේ බෙංගාලය යි.

භාරතයේ පසුගිය සියවසේ මුස්ලිම් දේශපාලනයේ කේන්ද්‍රීය චරිතය වූයේ අලි ජින්නා ය. ඉන්දියාවට ගාන්ධි යම් සේද පාකිස්ථානයට ජින්නා එසේම ය.

මොහොමඩ් අලි ජින්නා උපදින්නේ 1876 දෙසැම්බර් 25 වන දාය. ඔහුගේ පවුලට ඉරානයේ ෂියා මුස්ලිම් ලේ මෙන් ම සුන්නි ඉස්මයීලි ලේ ද ගැබ් වී තිබිණි. ඔවුන්ගේ පවුල් නාම බොහොමය ක හින්දු නම් ද ගැබ් වී තිබිණි. කොටින් ම හෙතෙම භාරතයේ මූලික මුස්ලිම් දහරාවට පිටස්තරයෙක් විය. පසුව ඔහු හැදුනේ වැඩුණේ ද ඉස්ලාමීය ලෙස නොව බටහිර ආරෙටය. 1896 දී ඔහු තරුණයකු ලෙස එංගලන්තයෙන් පැමිණ කොන්ග්‍රසයට බැඳෙන විට සම්පූර්ණ බටහිර සංස්කෘතියට අයත් වූවෙක් විය. මේ නිසා ඇතැම් මූලධර්මවාදීන් ඔහු හඳුන්වන්නේ හැම් බේකන් කා විස්කි බිව් ඉංග්‍රීසි පන්දමෙක් ලෙසයි. ( හිස්බ් අල් ටහිර් නායක කාලිම්

සිද්දික් වැනි අය)

ජින්නා ඉන්දිය ජාතික කොංග්‍රසයේ කැපී පෙනුන චරිතයක් විය. එයට ඔහුගේ දීප්තිමත් නීතිවේදී හැකියාව ද බල පෑවේ ය. 1906 දී ඔහු එවකට ජාතික කොන්ග්‍රසයේ සභාපති දාදාබායි නාවෝරාජිගේ සහායක ලේකම් වූ අතර කොන්ග්‍රසයේ නායක බාල් ගන්ධාර් තිලක් ඔහු තම නීති උපදේශක ලෙස යොදා ගත්තේ ය.

මුස්ලිම් ලීගයට ද එක්වන ජින්නා 1916 දී එහි සභාපති බවට ලක්නව් සමුළුවේදී තේරී පත්වේ. මුස්ලිම් ලීගය මුලින් කොන්ග්‍රසය සමග එකට සිටිය ද 1916 න් පසු ක්‍රමයෙන් තමන්ගේ මගකට පිවිසේ.

මෙයට පුද්ගලික හේතුවක් ද විය. බී.ජේ. තිලක්ගෙන් පසු ඉන්දීය කොන්ග්‍රසයේ නායකයා බවට ජින්නා පත් වෙනු ඇති බව විශ්වාසයක් විය. ජින්නා ඒ වන විට අනාගමික මත දැරුවෙකු විය. නමුත් මෝහන්දාස් කරම්චාන්ද් ගාන්ධි ගේ පැමිණීමෙන් පසු ක්‍රමයෙන් ඔහු කොන්ග්‍රසයේ ප්‍රමුඛයා බවට පත්විය. මෙය ජින්නා තේරුම් ගත්තේ තමන් මුස්ලිම් නිසා සිදු වූ කැපිල්ලක් ලෙස ය! කෙසේ වෙතත් හින්දු ප්‍රභූවරුන් අතර ලක්නව් සම්මුතියෙන් මුස්ලිම්වරුනට 30% ක අනිවාර්ය නියෝජනයක් දීමට (ප්‍රාන්තවලදී) යෝජනා වීමෙන් ඇති වන්නට ගිය ගැටුම යම් ප්‍රමාණයකට මුලදී ම වැළකිනි.

ජින්නා 1918 දී තම මිතුරෙකුගේ දියණිය වූ රූති විවාහ කර ගනී. ඇය පර්සියානුවෙකි. (මේ සම්ප්‍රදාය මහමත්තුමාගේ සිට එන්නකි.) 1919 දී ඔහුගේ දියණිය දිනා උපත ලබයි. රූති අකාලයේ මිය යන අතර දිනා කිතුනුවකු හා ''ගාන්ධර්ව'' ක්‍රමයට සරණ යයි. මෙයින් ජින්නාගේ පෞද්ගලික ජීවිතය අවුල් වන අතර එතැන් පටන් ඔහුගේ ජීවිතය මෙහෙය වන්නේ ශක්තිමත් චරිතයක් සහිත ඔහුගේ සොයුරිය පාතිමා විසිනි.

ගාන්ධි 1921 පසු ඉන්දීය කොන්ග්‍රසයට අරුත් දෙකක් ගෙනාවේ ය. එකක් නම් එහි මතවාදය ආගමික කිරීම ය. නිදහසින් පසු උදා වන්නේ රාම රාජ්‍යයක් යැයි ගාන්ධි කීවේ ය. දෙවැන්න නම් අරගලයේ විධි ක්‍රමයයි, ඡන්ද ක්‍රමය හෝ සන්නද්ධ මාවත වෙනුවට අවිහිංසාව ක්‍රියා මාර්ගය ලෙස යෝජනා කෙරිණි. ගාන්ධි කීවේ හින්දු ආත්මවාදයත් අවිහිංසාවත් එකට යන බව ය.

මහත්මා ගාන්ධිගේ අවිහිංසාවාදී සටන ගැන හොඳ නරක විවේචන බොහොමයක් ඇත. එහෙත් කවුරුත් පිළිගත යුතු එකක් තිබේ. එනම් බටහිර සම්ප්‍රදාය වූ ඝාතනය හා හිංසාව වෙනුවට ආසියානු සම්ප්‍රදාය වූ පැවැත්ම හා අවිහිංසාව ගාන්ධි කරලියට ගෙන ආ බව ය. ඒ අරුතින් ඔහු බටහිර සම්ප්‍රදායට තියුණු අභියෝගයක් එල්ල කළේ ය. අනෙක් අතින් සත්‍යග්‍රහ, වැඩ වැරීම, උපවාස ආදී ක්‍රියාමාර්ගවලට සියල්ලන්ට සහභාගි විය හැකි ව තිබිණි. මේ නිසා එය අවිගත් සුළුතරයක් හෝ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ අල්පය මත හෝ නොව බහුතර ජනයා මත පදනම් විය. අනිත් අතින් ගාන්ධි එයට කැවූ හින්දු ආත්මවාදය නිසා එය ගැඹුරු අධ්‍යාත්මික අත්දැකීමක් විය. ගාන්ධි සිය ජීවිතයෙන් එයට ආදර්ශය දුන්නේ ය.

ඔහුගේ විවේචන මෙසේ ය. අවිහිංසාවාදය හින්දු දහමේ අංගයක් නොවේ. හින්දුන්ගේ අත්පොත් වූ මහා භාරතය හා රාමායනය යන දෙක ම යුක්ති ගරුක යුද්ධය හා ඝාතනය වෙනුවෙන් ලියැවුණු කෘතීන් වෙයි. අවිහිංසාවාදය ජින දහමේ හා බෞද්ධ දහමේ ක්‍රියාමාර්ගයි. එය තොලොස්තෝයි විසින් ද රුසියාව හඳුන්වාදීමට උත්සාහ කළ මාධ්‍යය යි. මේ නිසා අවිහිංසාව හින්දු දහමට පිටතින් ගෙන ආවක් ලෙස විස්තර කෙරේ. නමුත් ඇතැමුන් කියන්නේ ගාන්ධි අවිහිංසාවාදය ගෙන ආවේ බමුණන් රැකීමට කියා ය. හින්දු කුල ක්‍රමය තරයේ ඇද හූ ගාන්ධි, සන්නද්ධ හෝ චණ්ඩ දේශපාලනයෙන් බහුතර සටන්කාමීන් වූ බ්‍රාහ්මණ නොවන ජනයා විශේෂයෙන් ම පංචම කුලයට අයත් (Dalit) වරු පවා නැගී සිට නායකත්වය අල්ලා ගනු ඇතැයි බිය වූ බව කියවේ. මෙය යම් පමණක සත්‍ය චෝදනාවකි. ලංකාවේ දෙමළ ජනවර්ගවාදී අරගලය ඊනියා අවිහිංසාවාදයෙන් රැදී තිබෙන තාක් එය ඉසිළුවේ වෙල්ලායින් විසිනි. එහෙත් ප්‍රභාකරන්ගේ සන්නද්ධ ව්‍යාපාරයේ න්‍යෂ්ඨිය බවට පත්ව ඇත්තේ වෙල්ලාල නොවන කෝවියර් හා ඩාලිට් කුලවල ජනයා ය. මෙය ඉන්දියාවේ සන්නද්ධ සටනක් ඇති වූවානම් ඇතිවීමට ඉඩ තිබූ තත්ත්වයකි. ඉන්දියාවට ගොස් එහි ජනයා සමඟ කලක් ජීවත්වන ඕනෑම කෙනෙකුට හැඟී යන්නේ ගාන්ධිගේ ජාතික අරගලයෙන් දුගී ජනයාට, ඉඩම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍ය ලැබී නැති බව ය. ලංකාවේ යම් දුරකට සිදු වූ නිදහස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ඉඩම් ප්‍රතිසංස්කරණය ඉන්දියාවේ සිදු වී නැත. මෙයින් ඉන්දියාවේ සැබෑ කුසලතා මතු වීමට බාධාවක් වී ඇත. ගාන්ධිගේ ලිංගික හා පෞරුෂයේ තිබූ ඇතැම් ලකුණු ඉන්දීය ජාතික කොන්ග්‍රසයේ අවිහිංසාවාදයට බලපෑ බවට ද විවේචන එල්ල වී ඇත.

ගාන්ධිගේ කොන්ග්‍රසය ආගමික කිරීමේ ව්‍යාපාරයට එරෙහිව තියුණු ප්‍රතිරෝධයක් එල්ල වී ඇත. ඔහුගේ රාම රාජ්‍යය කොන්ග්‍රසයේ මුස්ලිම්වරුන් ප්‍රශ්න කළේ ය. සෝවියට් දේශයේ බිහිවීම විසින් ප්‍රබෝධයට පත්ව සිටි එම්. එන් රෝයි වැනි කොමියුනිස්ට්වාදීහු ද ඔහුගේ ආගමිකවාදය ප්‍රශ්න කළෝ ය. ඔහුට තියුණුතම අභියෝගය ආවේ නේරු, පටෙල් හා චන්ද්‍රා බෝස්ගේ අනාගාමිකවාදී චින්තනයෙනි. ඉන්පසු කොන්ග්‍රසය තුළ බෙදීම ඇති වුණේ ආගමිකවාදීන් හා අනාගමික වාදීන් අතරය.

මවුලානා හසරත් මොහානි 1921 දී ඉන්දියාවට පූර්ණ නිදහස යන සංකල්පය ඉදිරිපත් කළේ ය. ගාන්ධි මෙයට එරෙහි වූ විට මුස්ලිම්වරුන් අතරින් ගාන්ධි විරෝධයක් ඇතිවිය. එහෙත් මවුලානා අබ්දුල් කලාම් වැන්නවුන් එක රටක් එක කොන්ග්‍රසයක් යන මතයේ දැඩිව සිටි නිසා බෙදීම වැලකිණි.

කොන්ග්‍රසය තුළ හින්දු මූලධර්මවාදය කොන් වුනු දුටු හෙග්වාර් විසින් රාෂ්ඨීය ස්වයං සේවයක් (RSS) පිහිටුවීම (1925) ඉන්දීය දේශපාලනය තීරක ලෙස වෙනස් කළේ ය. කේෂව් බලාරාම් හා මාදව් ගොල්වකාර් විසින් ගෙන එන ලද හින්දි, හින්දු, හින්දුස්ථාන් සටන් පාඨය සීඝ්‍රයෙන් පැතිරී යන්නට විය. ඔවුන්ගේ එක් ප්‍රකාශයක් මෙසේ ය.

''පුරාණ ජාතීන්ගේ අයිතිය අපි කිසි විටක අත්හැර දැමිය යුතු නොවේ. හින්දුස්ථානයේ ජීවත්වන හින්දු නොවන ජනයා හින්දු සංස්කෘතියට ඇතුල්විය යුතු ය. හින්දි බස උගත යුතු ය. හින්දු ආගමට ගරු කළ යුතු ය. හින්දු ජාතිය පිදිය යුතු ය. එසේ නොමැති නම් ඔවුනට මේ රටේ පුරවැසි අයිතීන්වත් ලබා දිය යුතු නොවේ....''

1929 ආර්ය සමාජ් හි ස්වාමි ෂාර්ද්නාන්ද් මුස්ලිම් අන්තවාදියෙකු විසින් ඝාතනය කිරීමෙන් පසු හින්දු-මුස්ලිම් ගැටුම් තීව්‍ර වේ. තමන්ගේ විකල්ප යෝජනා ජනවාර්ගික පදනමින් යුතු යෝජනා ප්‍රතික්ෂේප කරනා අතරේ ම මුස්ලිම්වරුන්ට බර තබන සංශෝධනවලට ද යෑමට ද මේ නිසා නේරුට සිදුවිය.


නේරු මුස්ලිම්වරුන් සැනසීමට යන අතරේ දකුණින් කැරැල්ල ඇතිවිය. හින්දි-හින්දු-හින්දුස්ථානයට එරෙහිව ද්‍රවිඩ-ද්‍රවිඩස්ථානයක් යෝජනා විය. බ්‍රාහ්මණ විරෝධී හින්දු ආගමික විරෝධයක් ද එක් විය. භාරතයේ මුල් ම බෙදුම්වාදය විවෘතව ප්‍රකාශ කළේ දෙමළ ජාතිකයකු වූ ඊ.වී. රාමසාමි නායික්කර් ය. ඔහු දෙමළ කසාගම් බිහි කළේ ය.

භාරතයේ මුල්ම මූලධර්මවාදය පිබිදී වූයේ අලාමා ඉක්බාල් විසිනි. ඉක්බාල්ගේ පියා හින්දු ආගමින් ඉස්ලාමයට හැරුණු අයෙකි. ඒ නිසාම ඉස්ලාම් ප්‍රචාරණයට ක්‍රියාකාරීව මැදිහත් විය. ඉක්බාල් විශිෂ්ඨ කවියෙක් විය. කුරානය පිළිබඳ දැනුම ද උසස් විය. මැවුම්කාර දෙවියන්ගේ සිට ගව මස් කෑම දක්වා ඉස්ලාමයට හින්දූන් හා එකට විසිය නොහැකි බව ඔහුගේ මතය විය. 1930 දී මුස්ලිම් ලීගයේ සම්මේලනයේ අලහාබාද්වලදී පැවැත්වෙන අතර එහි මුළු සාමාජිකත්වය ඒ වන විටත් 1000 කට සීමා විය. ඉක්බාල් මුස්ලිම්වරුන්ට වෙන ම රටක් අවශ්‍ය බව යෝජනා කරද්දී එයට සහභාගි වී සිටියේ 75 දෙනෙකු පමණි.

කේම්බ්‍රිජ් පඬිවරයෙකු වූ අලි චෞද්රි රහමන් විසින් මේ වෙන් වීයාම සිද්ධාන්තකරණය කරයි. ඔහු භාරතය සඳහා රාජ්‍යයන් සමන්විත යෝධ සහසන්ධිය රාජ්‍යයක් යෝජනා කළේ ය. එහි ධජයේ අඩ සඳ හා තරු දහයක් මගින් රාජ්‍යයන් සංකේතවත් කරන ලදී. ඒවානම්, පාකිස්ථාන්, බන්ගිස්තාන්, ඔස්මෙනිස්තාන්, මුයනිස්තාන්, හයිද්‍රිස්තාන්, පර්කුස්තාන්, සිද්දික්තාන්, මැපිලිස්තාන්, සපිස්තාන් හා නසරිස්ථානය ලෙස ය. මෙයින් සපිස්තානය (බටහිර) හා නසරිස්ථානය (නැගෙනහිර) යෝජනා කර තිබුණේ ලංකාවට ය.

රහමන් චෞද්රි ලංකාවේ මුස්ලිම් ජනයා භාරතයේ ම කොටසක් ලෙස සැලකූ අතර ඔවුනට වෙන ම රටක් 1930 දී ම ඉල්ලා සිටියේ ය. චෞද්රිගේ දර්ශනය ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ ද මතයයි.

ඉක්බාල් හා චෞද්රි බෙදී වෙන් වීමට අබ්දුල් කලාම් අසාද්, අබ්දුල් කදීර් කාසුරි, ආදිහු එරෙහි වෙති. ඉක්බාල් එකක් තේරුම් ගනී. එනම් දිල්ලියේ ප්‍රභූවරුන්ට පිළිගත හැකි නායකත්වයක් නොමැති ව වෘත්තියෙන් සන්නාලියෙකු වූ තමනට හා මුස්ලිම් ලීගයට ගමනක් නොමැති බව යි. ඔහුට සිහියට එන්නේ ජින්නා ය. කොන්ග්‍රසයේ නායකත්වයට ගාන්ධි අල්ලා ගැනීම නිසාත්, පවුල තුළ ඇති ආරවුල් නිසාත් 1929 සිට ජින්නා පොළඹවයි. නමුත් භාරතයට යළි පැමිණීමේ තීරණය ගන්නේ පාතිමා ය. 1935 ජින්නා සිය රට එන අතර මුස්ලිම් ලීගයේ නායකයා වෙයි. ඉක්බාල් හා ලීගයේ ඇසුර නිසා ජින්නා වැඩි වැඩියෙන් ඉස්ලාමය දෙසට යයි. 1937 ලක්නව් සමුළුවට 5000 ක් සහභාගි වෙයි. ඒ වසරේම පැවැති මැතිවරණයෙන් මුස්ලිම් ප්‍රාන්ත ආසන 489 කින් ආසන 104 ක් දිනා ගන්නට ද මුස්ලිම් ලීගය සමත් වේ. (කොන්ග්‍රසය ආසන 1585 කින් ආසන 711 ක් දිනා ගනී.) කෙසේ වෙතත් මුස්ලිම් ඡන්දවලින් ඔවුනට ලැබෙන්නේ 4.6 % ක් පමණ ය.





*Map 2* Chaudhry Rahmat Ali's map: The Pak Commonwealth of Nations and their flag, c. 1940

රහමත් අලි චෞද්රිගේ පාකිස්තානු කොන්ෆෙඩරේෂනය



පාතිමා, ජින්නා සහ දීනා




මවුන්ට්බැටන් හා නේරු

ජින්නාගේ පැමිණීමත් සමග මුස්ලිම් ව්‍යාපාරිකයෝ හා ප්‍රභූවරු ලීගය දෙසට හැරෙයි. එය පිම්මේ වර්ධනය වේ. මේ වනවිට ඉක්බාල් මිය ගොස් සිටිය ද චෞද්රිගේ වෙන්වීමේ සූත්‍රය ලීගයේ මතවාදය වේ. දෙවැනි ලෝක සංග්‍රාමය ඇරඹීමත් සමඟ බ්‍රිතාන්‍යයේ ඇද වැටීම සහතික වේ. මේ නිසා මුස්ලිම්වරු වඩාත් ප්‍රාණවත්ව ඉදිරියට එයි. ජින්නා සම්මුතියක් ලෙස හින්දු ඉන්දියාවක් හා මුස්ලිම් ඉන්දියාවක්, ෆෙඩරල් රාජ්‍යයක් පිහිටුවීමට යෝජනා කරයි. එවිට ඔහුට මවුලානා හස්රත් වැන්නවුන්ගේ විරෝධය එල්ල වේ. 1940 ලාහෝර් මුස්ලිම් ලීග සමුළුවේ දි ලක්ෂයක් ජනයාගේ ජය ඝෝෂා මැද්දේ වෙන ම මුස්ලිම් රටක් ඇති කිරීමේ යෝජනාව ජින්නා ඉදිරිපත් කරයි. මුස්ලිම් ලීගය පිම්මකින් වර්ධනය වේ. 1944 දි මුස්ලිම් ලීගයේ සාමාජිකත්වය මිලියන 2 ක්වූ අතර මැතිවරණයේ දි මිලියන 4.5 ක ඡන්දයක් ලබා ගනී. මුස්ලිම් ඡන්දවලින් 75 %ක් ලබා ගන්නේ ද ඔවුන් ය. 1930 දි ඉක්බාල් හා 75 දෙනෙක් අලහාබාදයේ දුටු සිහිනය දැන් දශලක්ෂ ගණනක් දකිති. මධ්‍යම ආණ්ඩුවේ ආසන 102 න් 30 ක් ලීගය සතුවේ. (කොන්ග්‍රසයට 57 කි) මුස්ලිම් ප්‍රාන්ත ආසන 533 න් 460 ක් හිමිකර ගනී. සින්ද් හා බෙංගාලියේ ප්‍රාන්ත ආණ්ඩු බලය ද හිමිකර ගනී.

1942 දි වික්ටෝරියානු රැජිනගේ මුනුබුරු වූ ද ජෝර්ජ් රජුගේ මස්සිනා වූ ද මවුන්ට්බැටන් සාමිවරයා ඒකාබද්ධ හමුදා අණ දෙන්නා වේ. ගාන්ධි බ්‍රිතාන්‍යයට සහාය දෙන අතර චන්ද්‍රාබෝස් බ්‍රිතාන්‍යයට එරෙහිව ජර්මන්-ඉතාලි-ජපන් අක්ෂයට එක්වේ. බෝස්ගේ සන්නද්ධ අරගලය පරදී. යුද්ධ වකවානුවේ කොන්ග්‍රස් නායකයෝ බ්‍රිතාන්‍ය පාලනයට කිට්ටු වෙති. ඉන්දීය සෙබළු ගිණිකොන ආසියාවේත්, උතුරු අප්‍රිකාවේත් බ්‍රිතාන්‍ය වෙනුවෙන් සටන් වදිති.

භාරතය බෙදීමේ සැලැස්මට මුලදි ගාන්ධි එරෙහි වේ. 1944 සැප්. 28 දා ඔහු කීවේ පාකිස්තාන නැමති වදන මට ඇසෙන විට තමන්ට කඩුව මතක් වෙන බව ය. ලේ වැගිරීම අවශ්‍ය නම් එය අවිහිංසාවෙන් ම ගලා එන බව ඔහු කියයි.

සිරිල් රැඩ්කල්ස් භාරතය බෙදීමේ සැලැස්ම සකස් කරයි. බහුතර මුස්ලිම් ප්‍රදේශ පාකිස්තානයට (ශුද්ධ දේශයට) අයත් විය යුතු බව අලි ජින්නා අවධාරණය කරයි. නේරු, ක්‍රිෂ්ණ මෙනන් හා පතෙල්, මවුන්ට්බැටන් සමග ද, මහාරාජාවරුන් සමග ද සීඝ්‍රයෙන් කටයුතු කරමින් 'කුට්ටිය' වැඩි කර ගැනීමට කටයුතු කරයි.

1947 ජුනි හා ජූලිවල පාකිස්තානයට එක්වීම සඳහා ජනමත විචාරණ තැබේ. සින්ද්, බලුකිස්තානය, බෙංගාලිය, කාෂ්මීරය වැනි ප්‍රාන්ත එයට කැමැත්ත පල කරයි. අලි ජින්නා අගෝස්තු 16 සෘජු ක්‍රියාමාර්ගය ගන්නා දිනය ලෙස ප්‍රකාශ කරයි. දශ ලක්ෂයක මළ කඳන් මතින් පාකිස්ථානය බිහිවේ.

1947 ඔක්තෝබර් 24 වන දා කාෂ්මීරයට පාකිස්තානු කල්ලි ඒම ගැන මවුන්ට්බැටන් චෝදනා කරයි. එහි මහාරාජා වූ ෂෙයික් අබ්දුල්ලා ඉන්දියාවේ උපකාර පතයි. නේරු එහි හමුදා යවයි. ප්‍රථම ඉන්දු-පාකිස්තානු ගැටුමින් පසු කාෂ්මීරයේ කොටසක් පාකිස්ථානයට ද ( තුනෙන් එකක් පමණ) අනෙක ඉන්දියාවට ද අයත් වේ. ඉන් පසු දෙරට අතර මේ සම්බන්ධව ගැටුම් ඇතිවේ.

නේරුගේ බලපෑම මත කල්කටාව නැගෙනහිර පාකිස්තානයෙන් (බෙංගාලිය ඉවත් කෙරේ.) අසෑමය ඉන්දියාව එක්වීමට කැමැත්ත පල කළෙන් ඒ සඳහා කොරිඩෝරයක් නැගෙනහිර පාකිස්තානය හරහා ගොඩ නැගේ. එයට හිලව්වට බ්‍රිතාන්‍යයෝ බුරුමයට අයත් වූ චිතගොන් පළාත නැගෙනහිර පාකිස්තානයට ඈඳති. එමගින් බෞද්ධයින් එහි දෙවැනි පන්තියේ පීඩිත පුරවැසියන් පිරිසක් බවට පත් කෙරෙති. චක්මා නිදහස් අරගලය මුස්ලිම් ව්‍යාප්තවාදයට එරෙහිව ඇතිවේ.

භාරතය දෙකඩ කිරීම ගැන මවුන්ට්බැටන්ට සහාය දීම ගැන ගාන්ධිට චෝදනා එල්ල වේ. RSS සමාජිකයෙකු වන ගෝඩ්සේ විසින් ගාන්ධි ඝාතනය කරන්නේ ඒ හේතුව මත ය.

දීර්ඝ කාලීන ව රෝගී ව සිටි ජින්නා නිදහස් පාකිස්ථානයේ අගමැති වීමෙන් පසුව මිය යයි. ඔහුගේ සොයුරිය ඔහුගේ අඩුව පිරිමැසීමට උත්සාය කළත් ඇය අසාර්ථක වේ. මේ නිසා 1958 දී අයුබ්ඛාන් පාකිස්ථානයේ පළමු හමුදා කුමන්ත්‍රණය කරයි. එතැන් පටන් පාකිස්ථානය තුළ යුද හමුදාව බලවත්, ධනවත් තෙදවත් සමාජ පන්තිය ලෙස වැඩී යයි.

පාකිස්ථානයේ මූලික ගැටළුව වන්නේ නැගෙනහිර පාකිස්ථාන ය. එය සැතපුම් දහස් ගණනක් දුරින් පිහිටා තිබුණි. එහි ජනයා කතා කළේ බෙංගාලි බස ය. (පාකිස්ථානයේ උර්දු) එමෙන් ම පොදු පාර්ලිමේන්තුවේ බහුතර බලය ඔවුනට ලැබීමේ අනතුරද තිබිණි. සික් මුජබර් රහමන් දිගටම චෝදනා කළේ තම දේශයේ ජනයාගේ සිරුරේ වර්ණය පෙන්නමින් තමන්

ආර්ථික හා සමාජයීය ලෙස බටහිර පාකිස්ථානය සූරා කන බව ය. මෙහි ඇත්තත් තිබිණි. පාකිස්තානු යුද හමුදාවේ ඉහළ ම නිලධාරීන් 38 දෙදෙනාගේ 'බන්ගිවරු' සිටියේ එක් අයෙකි. ආණ්ඩුවේ ලේකම්වරු 20 දෙනාගෙන් බන්ගින් සිටියේ තිදෙනෙකි. විදේශ මුදල් 67% ක් නිපදවූයේ බන්ගින් වුවත් ඔවුන්ට ලැබුණේ 30 % ක් පමණි. අනෙක් අතින් PAKISTAN යන්නට රහමන් අලි චෞද්රි දුන් තේරුමේ P - පන්ජාබය, A - ඇෆ්ගනිස්ථානය, K - කාශ්මීරය, S - සින්ද්, Tan- බලුකිස්තානය ලෙසයි. එහි 'බන්ගින්' සිටියේ නැත.

මේ නිසා සික් මුජිබර් රමන්ගේ අවාමි ලීගය වෙන් වීමේ නිදහස් සටන අරඹන අතර එහි සන්නද්ධ බලයක් ද ඇතිවේ. පාකිස්තානු හමුදා රය මර්දනය කරති. ඉන්දීය ඔත්තු සේවා කේ.එන්. කාවෝ හා ඉන්දිරා ගාන්ධි බංගලි මෙහෙයුම අරඹති. අන්තිමේදි ඉන්දීය හමුදා මැදිහත් වී පාකිස්තානු හමුදා පරාජය කරති. යටත් වීමේ උළෙලට ඉන්දිරා යවන හමුදා නිලධාරීන් තිදෙනාගෙන් අයෙක් පාර්සි, තවත් අයෙක් සීක්, අනෙකා යුදෙව්වෙකි ! තුන් දෙනාම සම්ප්‍රදායික සුන්නි ඉස්ලාම් විරෝධීන් ය. ඉන්දිරා ඇගේ පළිය ගනී

පසු ව බංගලිදේශය පාලන බලය සඳහා හමුදා කුමන්ත්‍රණ සිදුවේ. ඒවා බොහෝ විට ඉන්දීය විරෝධී වෙයි. (සිය උල් රහමන් හා එර්ෂාද්)

1992 දි බාබරි මුස්ලිම් පල්ලිය බිඳ දැමීමත් ඉන්පසු ඉන්දියාවේ බලපෑම සහිත භාරතීය ජනතා පක්ෂය බලයට ඒමත් සමග පාකිස්ථානයේ හා බංගලිදේශයේ ද මුස්ලිම් අන්තවාදය නැග එයි. විශේෂයෙන් පාකිස්ථානය බින්ලාදන් ගේ කෙළි බිම බවට පත්වේ.

නූතන ඉන්දියාවේ යුද දේශපාලනික මෙන්ම ආර්ථික අනාගතය තීරණය කරනා ''අනෙකා'' පාකිස්ථානයයි. පාකිස්තානු න්‍යෂ්ටික බලය හසු නොවන සීමා වල තම යුද පරිපාලන හා ආර්ථික මධ්‍යස්ථාන ස්ථානගත කරන්නට ඉන්දියාව පෙළඹී ඇත. මෙහි ප්‍රතිඵලව වී ඇත්තේ ඉන්දියාවේ නිදහස් වෙළෙඳ කලාපය හා අගනගරය බවට දකුණු ඉන්දියාව හා බැංගලෝරය පත් වීමයි. පෙරළා පාකිස්ථානය පාලනය තීරණය වන්නේ ද ඉන්දියාව වෙතිනි. මෙය දකුණු ආසියාවේ තීරක ගැටුම ය.

## පස්වැනි පරිච්ඡේදය

# ඊයේ පහසුම දිනය විය

මම නිදන කාමරයට කඩාවදින විට යොවුන් තරුණියක් ඇඳෙහි වැතිරී සිය වේලය තදින් අල්ලාගෙන වියරුවෙන් වැලපෙමින් සිටියාය.

මගේ සගයා ''වෝල්ට්'' ඒ සිරුර අසල සිටගෙන සිටියේය. තවමත් අඳුර රජයූ අතර ඒ සිරුරේ මුහුණ හඳුනාගැනීම අපහසු වී තිබිණි. තවමත් විදුලිය ලැබී තිබුණේ නැත. මගේ යුද ඇඳුම් හෙල්මටයේ වූ 'ලෙඩ්' ආලෝකය දැල්වූයෙමි. ජනෙල් සියල්ල වසා තිබුණ නිසා ද ඉලක්කය ගෙන තිබුණු නිසා ද තියුණු ලෙඩ් ආලෝකය අනතුරක් ගෙන ආවේ නැත.

ඔහුගේ නළලේ සිදුරක් විය. පපුව හරහා ද සිදුරු විය. ඔහු වැතිරී සිටියේ රුහිරු ගංගාවක ය. මම මඳක් ළංවී බැලූයෙමි. 'ටොම්' මට සහය විය.

''මම හිතුන්නේ මේ අපේ කොල්ලා.'' ටොම් මිමුණුවේය. ටොම්ට ''කොල්ලාගේ' නම කීමට තවමත් කල්වැඩිය. අපේ සියළු ක්‍රියා, මිම්හීම් පවා සජීවීව ජනාධිපති බැරැක් ඔබාමා අසාසිටින බව අපි දැන සිටියෙමු. ඒ නිසා අපට කිසිසේත් වැරදිය නොහැක. සී.අයි.ඒ. විසින් අපේ කොල්ලා හෙවත් ''ජෙරනිමෝ'' පිළිබඳ දී තිබූ දත්ත මම එකින් එක විමසන්නට වූයෙමි.

මම ඔහුගේ උස සිතින් මැන්නෙමි. අඩි හයයි අඟල් හතරක් මට දැණිනි. මම ඔහුගේ වයස මැන්නෙමි. මැදිවයසේ නමුත් හොඳින් වැඩුණු සිරුරකි. මම ඔහුගේ සහායකයින් වූ 'කුවෙට්' සහෝදරයන් දෙස බැලුවෙමි. ඔවුන් නම් සී.අයි.ඒ. කිවූ අයම ය.

මම ඔහුගේ මුහුණ බැලුවෙමි. එය විකෘති වී නොතිබිණි. දිගු නහය, කළු රවුළු - පැසුණු කෙස් එහි නොවීය. මම පැසුණු රැවුළු සහිත ජෙරනිමෝගේ ඡායාරූප දැක ඇත්තෙමි. ඔහු කදිමට සිය රවුළු කළු පැහැ ගැන්වූවා විය යුතුය. හේතුව පැහැදිලිය. වැලපෙමින් සිටින්නී කකුලට වෙඩිවැදුණු ඔහුගේ පස්වෙනි තවමත් හිරිමල් යොවුන් බිරිඳය. ඇය 'එමිල් අල් පාවා' වූවා ය.

වෝල්ට් සිය කැමල් බැක් හෝස් එකෙන් ජලය විද ජෙරනිමෝ හෙවත් අපේ කොල්ලාගේ මුහුණ සේදුවේය. මම අසල ඇති පොරවනය ගෙන ඔහුගේ මුහුණේ ඇති ලෙය ජලය සමඟ පිහදා හැරියෙමි.

මම ඔහුගේ මුහුණ ඡායාරූප ගතකිරීමට ගත්තෙමි. එය මහත් ආතතියක් සහිත අපූර්ව අවස්ථාවක් විය. ඇමරිකා එක්සත් ජනපදය දස වසරක් තිස්සේ හඹා ගිය ලොවම බියපත් කළ ඒ මිනිසා මා ඉදිරියේ ප්‍රාණය නිරුද්ධව වැතිර සිටී. ඡායාරූප ඉතා හොඳ තත්ත්වයේ විය යුතුය. කෙදිනක හෝ වේවා ලොව පුරා වැඩිම ප්‍රචාරයක් සහිත ඡායාරූප මේවා විය හැකිව තිබුණු හෙයිනි.

මම සියළු කෝණයන්ගෙන් ඔහුගේ ඡායාරූප ගනිමින් සිටියදී මගේ සගයින් ඔහුගේ කාමරය නිරීක්ෂණය කරමින් සිටියහ. තරුණ කත හා දරුවන් 'විල්' විසින් බැල්කනියට කැඳවා ගෙන යනු ලැබීය. අන් අය කාමරයේ තිබූ පරිගණක, මෙමරි පත්, වීඩියෝපට, ලිපිද්‍රව්‍ය එකතු කරමින් සිටියහ. සී.අයි.ඒ. විසින් සපයන ලද අරාබි පරිවර්තකයා මේවනවිටත් අවදි වී සිටි අසල්වැසියන් හා සම්බන්ධ වෙමින් සිටියහ.

රේඩියෝව මගින් 'මයික්' විමසමින් සිටියේ ඇඳවැටුන 'බ්ලැක්හෝක්' හෙලිකොප්ටරය ගැනය. අප රැගෙන ආ හෙලිකොප්ටර් දෙකින් එකක් බිමට බැස්සවීමට යාමේ දී කඩාවැටිනි. මයික් අණදුන්නේ එය පුපුරුවා හැරීමට ය. එය නිවස පිපිරවීමට දුන් අණක් ලෙස සලකා 'සීල්වරු' අතර කසුකුසුවක් ඇතිවිය.



ඔසාමා බින්ලාදන් - ඝාතනයෙන් පසු

එ. ජනපදයේ නාවික හමුදාවට අනුයුක්තව සීල් කොමාන්ඩෝවරු (යුද්ධ හමුදාවේ නම් ඩෙල්ටා පෝස් බලකාය) නිර්මාණය කර ඇත්තේ මෙවැනි දුෂ්කර මෙහෙයුම් සඳහා ය. එයිනුත් ''සීල් 06'' නම් ඉහළ ම ගණයේ ප්‍රහාරකයින් යොදවා ඇත්තේ ''ජෙරනිමෝ සොයායෑම'' වැනි අතිශය දුෂ්කර මෙහෙයුම් වලටය. ඒවා හුදු මිනිස් ක්‍රියාකාරකම් නොව සියළු අතිනවීන ඉලෙක්ට්‍රොනික උපාංගවලින් ද සමන්විත ඉලෙක්ට්‍රොනික යුද්ධයේ ද (Electronic war) උච්ඡ ස්වරය නැංවූ සේනාංකයකි.

අප මෙතෙක් විනාශ නොවූ බ්ලැක්හෝක් යානය හා CH - 47 යානය අවට සැරිසරමින් සිටියහ. අපට තවත් කාලයක් ඉතුරුව නොතිබිණි.මම වහාම සී.අයි.ඒ. සඳහා අවශ්‍ය ජානමය දේ උකහා ගත්තෙමි. සිරින්ජයක් පුරවා ජෙරනිමෝගේ රුධිරය ද ගත්තෙමු. අපි ඡායාරූපද, රුධිර සාම්පලද, ඩී.එන්.ඒ. සාම්පල ද දෙක බැගින් ගත්තෙමු. ඒ දෙකින් එකක් හෝ ජලාලාබාද් දක්වා යන ගමනේ දී විනාශ වුවහොත් එක් පිටපතක් හෝ සුරැකීම පිණිසය.

දැන් අපි අවසාන පරීක්ෂාව සඳහා සූදානම් වීමු. එනම් වාචික සාක්කියක් ලබාගැනීම ය. ඔහුගේ වැඩිමහළු බිරිඳක් අපගේ ඉලක්කය විය. විල් ඇය වෙතට ළංවී අරාබි බසින් ප්‍රශ්න අසන්නට විය.

''කවුද මේ පුද්ගලයා ?''

''ඔහු ෂෙයික්'' ගැහැණිය කීවාය.

''මොන ෂෙයික් ද?'' විල් සෘජුව ඇයගෙන් ඇසුවේය. ඔහු ජෙරනිමෝ පෙනී සිටි නම් ගණනාවක් ඇයගේ මුහුණට දමා ගැසුවාය. ඇත්ත කතා නොකළ ඇය අන් ගැහැණුන් හා දරුවන් සිටි දෙසට ගියා ය.

විල් ඊළඟට එහි සිටි කුඩා දැරියකගෙන් ඇසුවේ ''කවුද මොහු ? කියා ය. දරුවෝ බොරු කීමට නොදැන සිටියහ.

''ඔහු ඔසාමා බින්ලාදන්'' දැරිවිය පිළිතුරු දුන්නාය.

විල් ඊළඟට හැරුනේ වැඩිහිටි ගැහැණුන් දෙසට ය. එක් ගැහැණියක් තදින් අල්ලාගත් ඔහු ''මාව යකා අවුස්සන්නේ නැතුව කියපන් කවුද මොහු ?'' කියා ඇසුවේය.

''ඔසාමා'' යැයි ඇය ගොත ගසමින් කීවාය.

''මොන ඔසාමා ද ?'' විල් නැවත ගිගුරුවේය.

''ඔසාමා බින්ලාදන්'' ගැහැණිය මිමිණුවාය.

අපේ සිත් සතුටින් පිරී ගියේය. ඡායාරූප, සී.අයි.ඒ. දත්ත, ඔහුගේ බිරියන් දරුවන්ගේ වාචික සාක්කි සියල්ල කියාදුන්නේ අප සොයා ගිය ජෙරනිමෝ නොහොත් අපේ කොල්ලා නොහොත් ෂෙයික් අන් කිසිවෙකු නොව ඔසාමා බින්ලාදන් බව ය.

අප ඔහුගේ සිරුර රැගෙන එළියට එනවිට අපේ සගයා ''ජේ'' සිය සැටලයිට් රේඩියෝව මගින් ඇඩ්මිරල් මැක්රෑවන් ඇමතුවේය. ඔහු තවමත් අප මෙහෙයුම සඳහා ඇබාටාබාද් කරා පැමිණි ජලාලාබාද් නගරයේ සිටියේ ය. අද්මිරාල් මැක්රෑවන් ජනාධිපති බැරැක් ඔබාමා ඇතුළු පිරිස සමඟ සජීවීව සම්බන්ධ වී සිටියේ ය. ජේ අපේ නායකයින් ඇමතුවේය.

''දෙවියන් වහන්සේගේ හා ජාතියේ නාමයෙන්, අපි ජෙරනිමෝ ගත්තෙමු. ඔසාමා බින්ලාදන් මෙහෙයුමේ දී මිය ගියේ ය...''

**No Easy Day - Mark Owen**
*Chapter 16-Geranimo (Page - 239-247)*

නිව්යෝක් ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට පහර දීමෙන් පසු එ. ජනපදයේ පළමු ඉලක්කය වූයේ අල්කයිදාව ය. අල්කයිදා හා සහ බින්ලාදන්ට නවාතැන වී තිබුණේ තලේබාන්වරු පාලනය කළ ඇෆ්ගනිස්ථානය යි. ඇෆ්ගනිස්ථානයට රැකවරණය ලැබී තිබුණේ න්‍යෂ්ටික බලවතෙකු වන පාකිස්ථානය යි. එවකට (2001) පාකිස්ථානය පාලනය කළේ එහි හිටපු හමුදා නායක වූ ෆර්වේස් මුෂාරෆ් ය. මුෂාරෆ් ආමන්ත්‍රණය කළ එ. ජනපදයේ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචඩ් ආමිටේජ් ප්‍රකාශ කර සිටියේ තමන් ඇෆ්ගනිස්ථානයට පහර දෙන බවත් තමන්ගේ ගෝලීය ත්‍රස්ත විරෝධී සටනට සහාය දෙන ලෙසත් ය. දුරකතනයෙන් කෙරුණු එකී සංවාදය (මෙය මුෂාරෆ් විසින් රචිත ස්වයං චරිතාප්‍රදානයේ පළවී ඇත. (In the line of Fire) අවසන් වූයේ තර්ජනයකිනි. එනම් එ. ජනපදයේ පැත්ත නොගත හොත් පාකිස්ථානය ගල්යුගයට යන තෙක් පහර දෙන බව ය. මුෂාරෆ් ජනාධිපතිතුමා තම සෙනෙවියන් සමඟ එ. ජනපදයේ තර්ජනය ගැන සාකච්ඡා කලේ ය. තමනට එ. ජනපදයේ යුද බලයට මේ මොහොතේ මුහුණ දිය නොහැකි බව යුද විශ්ලේෂණ (War Games) කිහිපයකින් පසු අවබෝධ කර ගෙන කපන්න බැරි අත සිඹින්නා සේ එ. ජනපදයේ ත්‍රස්ත විරෝධී සටනට එක් වූයේ ය.

නමුත් එ. ජනපදය පසුව අවබෝධ කර ගත්තේ පාකිස්තානු හමුදාව මතුපිටින් තමනට සහාය වී තමනගේ යුද හා ආර්ථික ආධාර ලබාගන්නා අතරේ තලේබාන් හා අල්කයිදාවට යටින් උපකාර කරන බව ය. ඇෆ්ගනිස්ථාන් යුද්ධය දිනිය නොහැකි තමත් ඉස්ලාමීය වියට්නාමයක් වූයේ ඉරානය හා පාකිස්ථානය මතුපිටින් අල්කයිදාවට විරුද්ධ අතරේ යටින් තමනට වලවල් කපමින් එහි නායකයින් ගලවා ගැනීමට ක්‍රියාකළ නිසා බව එ. ජනපද නිරීක්ෂකයන්ගේ මතය වී ඇත. වරක් මහා මෙහෙයුමට පෙර සිය ඔත්තුකරුවන් සටන් බිමෙන් ඉවත් කර ගැනීමට යැයි කියා පාකිස්තානු ඔත්තුසේවය (ISI) ගුවන් යානයක් පුරවා තලේබාන් හා අල්කයිදා නායකයින් යුද බිමෙන් ගලවා ගත් බවට ද වාර්තා පළ වී තිබිණි.

බින්ලාදන් 'ටෝරාබෝරා' කඳුකරයේ සැඟවී සිටින බව ද පාකිස්ථානයේ විවිධ නගරවල සැඟවී සිටින බවට ද විටින්විට තොරතුරු ලැබුන ද සී.අයි.ඒ. හා ඒ සම්බන්ධ සියළු මෙහෙයුම් අසාර්ථක විය. අවසානයේ සී.අයි.ඒ. හි ගැලවීමට ආවේ අල් ජසීරා රූපවාහිනිය යි.

කටාර් හි සිට ක්‍රියාත්මක අල් ජසීරා රූපවාහිනිය පටන් ගත් මුල් අවධියේ පාඨක අවධානය දිනාගැනීම සඳහා එ. ජනපද විරෝධයක් පෙන් වූ අතර ඉස්ලාමීය මූලධර්මවාදී ව්‍යාපාරයට පක්ෂපාති ස්වරූපයක් පෙන් නුන්නේ ය. එමෙන්ම ඔවුනගේ වෘත්තීය මාධ්‍ය හැසිරවීම සී.එන්.එන්. - බී.බී.සී. සේවා දෙකටම වඩා ඉහළින් තිබිණි. කෙටිකලක් ඇතුලත ඔවුන් අරාබි-මුස්ලිම් ජනයාගේ මනස තනන ආයතනය මෙන්ම ජිහාද්වරුන්ගේද විශ්වාසවන්ත පණිවිඩකරු ද විය.

සී.අයි.ඒ. බින්ලාදන් හඹා යෑම පිණිස යොදා ගන්නේ මේ විශ්වාසවන්ත පණිවිඩකරුමය. පසුගිය කාලයේ (2012) අරාබියේ සිදු වූ ආණ්ඩු පෙරළි ගණනාවකදී ම (අරාබි වසන්තය) බටහිර මානසික මෙහෙයුම අල්ජසීරා සාර්ථක ලෙස දියත් කළේ ය.

බින්ලාදන් ඉලෙක්ට්‍රොනික යුද්ධය හොඳින් දැන සිටියේ ය. ඩ්‍රෝන ප්‍රහාර දුරකතන මාර්ග ඔස්සේ, පරිගණක පද්ධති ඔස්සේ ඇදී එන බව ඔහු දැන සිටියේ ය. එ. ජනපදයේ ඉලෙක්ට්‍රොනික යුද්ධයේ ගැලවීමට ඔහු යොදා ගත්තේ මධ්‍යකාලීන යුගයේ යුද්ධ ක්‍රමවේදයන් ය. එනම් සිය හිතවත්ම පණිවිඩකරුවන් ලවා පණිවිඩ ගෙන යාමය. ඒ අතරේ අතිශය සාමාන්‍ය ලෙස බිරියන් පස් දෙනෙකු විවිධ අවස්ථාවල විවාහ කරගෙන දරුවන් 18 දෙනෙකුගේ පියකු ලෙස ජීවත් වීමය.

විජේවීර, ප්‍රභාකරන්ට මෙන්ම බින්ලාදන්ට මරු කැඳවූයේ සිය පවුලට ඔවුන් තුළ ඇති බැඳීමයි. සිය දහස් ගණන් සිය කාඩර්වරුන්ගේ පවුල් සබඳතා බිඳ දැමූ මේ නායකයෝ සිය පවුල් සබඳතා යුද්ධය මැද ශ්‍රීව කර ගත්හ. ප්‍රභාකරන් හැරුණු විට අනෙක් දෙදෙනාගේම දරුවන් හා බිරින්දෑවරුන් බොහෝ සාමාන්‍ය ජීවිත ගත කළහ.

එ. ජනපදයට බින්ලාදන්ගේ සබඳතා සොයා ගැනීමට මහත් සේ උපකාරී වූයේ 9/11 ප්‍රහාරය මෙහෙය වූ කාලිද් පාකිස්ථානයේදී අත්අඩංගුවට පත්වීම ය. කාලිද්ව වධවදයට ලක්කෙරුණු අතර බින්ලාදන් හිතවතුන් හරහා පණිවුඩ හුවමාරු කර ගන්නා බව සහතික විය. ඔහු විසින් පණිවිඩ ලෝකයට කැසට් මාර්ගයෙන් ලබාදෙන වැදගත් මූලස්ථානයක් වූයේ අල්ජසීරා නාලිකාව ය.

පාකිස්ථානයේ, කටාර්වල හා වෙනත් ස්ථානවල අල්ජසීරා නාලිකාවට යන එන පුද්ගලයින් ඡායාරූප ගත කරමින් ඔවුන් විශ්ලේෂණය

කිරීම සී.අයි.ඒ. විසින් ආරම්භ කරනු ලැබීය. අනිවාර්යයෙන්ම බින්ලාදන්ගේ පණිවිඩකරු ඔවුන් අතර ඇතිබව සී.අයි.ඒ ට සහතික විය. බින්ලාදන්ගේ වීඩියෝ හෝ හඬ පටයක් අල්ජසීරාවෙන් පළ වූ සෑම මොහොතකම පෙරදින එකම පුද්ගලයෙකු ආයතනයට පැමිණි බව සහතික විය.

ඔහු අබාර් අල් කුවෙට් නැමති පාකිස්ථානයේ ජීවත් වන අරාබියෙකු බව හෙළි විය. කුවෙට් ලුහුබැඳීම ඇරඹිණි. දුරකතන සංවාද, ඊ-මේල් පණිවිඩ, කෙටි පණිවිඩ (SMS) ඔහුගේ පිහිටීම (GPS) සියල්ල හඹා යනු ලැබීය. චන්ද්‍රිකා මගින් කුවෙට්ගේ රිදී පැහැති සුසුකි ජීප් රථය අබටාබාද් නගරයේ දූවිලි අතරින් ගමන් කරනු සහතික කරනු ලැබීය. පාකිස්තානු හමුදා ඇකඩමිය පිහිටා තිබූ නිසා ඉලෙක්ට්‍රොනික මෙහෙයුම ඉතා සූක්ෂමව සිදු කරනු ලැබීය. අන්තිමේ දී කටාරි හා ඔහුගේ සොහොයුරු ද පවුල් ද අබටාබාද් නගරයේ තාප්පයකින් වට වූ මහල් නිවාසයක වෙසෙන බව සහතික විය.

කුවෙට් සිය පවුලට අමතරව ආහාරපාන යනාදිය සුපිරි වෙළෙඳ සැල්වලින් මිලදී ගන්නා බව පෙනිනි. එහෙත් නිවසේ කසල ගෙවත්තේම පුළුස්සා දැමූ නිසා කිසිදු තොරතුරත් එළියට ආවේ නැත. (පීරු හි ෂයිනින් පාත් සංවිධානයේ නායකයා හසුවූයේ නිවසේ කසල විශ්ලේෂණය කිරීම නිසාය) එමෙන්ම නිවසට අවශ්‍ය බොහෝ දේ ගෙවත්තේ වගාකර තිබිණි. චන්ද්‍රිකා මගින් නිවසේ රෙදිවැල් ආදිය නිරීක්ෂණයේ දී පෙනී ගියේ 10-12 ක් අතර පිරිසක් නිවසේ වාසය කරන බව ය. උස මැදිවියේ පුද්ගලයෙකු රෙදිවැල්වලට මුවා වී උදෑසන ව්‍යායාමය සඳහා ගෙවත්තේ ඇවිද යන ආකාරය සහතික විය. සී.අයි.ඒ. එතැනින් නතර වූයේ නැත. විවිධ උපක්‍රම මගින් නිවසේ වැසියන් ගණන පිළිබඳ තොරතුරු සොයන්නට වූහ. ව්‍යාජ එන්නත්කරණයක් පවා සංවිධානය කෙරුණේ අවශ්‍ය නම් ජාන සහතිකයක් හෝ ගැනීමය. අවසානයේ නිවසේ ඡායාරූප විශ්ලේෂණයේදී පෙනීගියේ ගෙවත්ත තුළ නිවෙස් දෙකක් ඇති බවය. කුවෙට් හා ඔහුගේ සොහොයුරු ඔවුනගේ පවුල් ද එක් නිවසක වාසය කළ අතර අනෙක් නිවෙස තාප්පයකින් වෙන් වී යාබදව පැවතිණි. ඒ නිවසේ දරුවන් පාසල් නොගිය අතර නිවසට ජලය, විදුලිය, දුරකතන, රූපවාහිනී සබඳතා ද නොවීය (බින්ලාදන්ගේ දෙවැනි බිරිය සියළු බිරින්දෑවරුන්ගේ දරුවනගේ ගුරුවරිය වූවා ය.) සියළු සාධක එකට ගෙන සී.අයි.ඒ. අවසාන වශයෙන් ගණිතමය සසම්භාවී පරීක්ෂණයක් ද (Probability Test) කළෝ ය. 80% ක් සහතික වූයේ නිවසේ බින්ලාදන් ජීවත්වන බවය.

එ. ජනපද බලධාරීන් ලාදන් ගැන සැකහැර දැනගත් පසු එය කිසිසේත් පාකිස්ථානයට දැන ගැනීමට ඉඩනොහැරියේ ලාදන් සැගවී සිටීම පාකිස්තානු හමුදා නගරයකම සිදුවීම මගින් පාකිස්තානු හමුදාවේ ඇතැම් පිරිස්වල සබඳතාවයක් ඇතිබව පැහැදිලි වූ නිසා ය. ගුවන් ප්‍රහාරයක් මගින් මුළු අංගනයම විනාශකිරීමට සැලැසුම් කළ ද එමගින් බින්ලාදන්ගේ මරණය ගැන සහතික නොවීම නිසා අල්කයිදාව තවදුරටත් ක්‍රියාත්මක විය හැකි බව පැහැදිලි කරනු ලැබී ය. අවසානයේ සියළු අනතුර ගෙන සීල් සෙබළුන්ගේ ප්‍රහාරකට ජනාධිපති ඔබාමා අවසර දුන්නේ ය. මෙහෙයුමේ නම වූයේ ජෙරනිමෝය. ජෙරනිමෝ යනු ඉංග්‍රීසි ආධිපත්‍යයට එරෙහිව සටන් කළ ස්වදේශීය ඇමරිකානුවන් විය. බින්ලාදන් ඝාතනය සඳහා කැප වූ සීල් සෙබළුන්ට පසුව ඒ පිළිබඳව විචිකිච්ඡාවක් ඇතිවිය. දේශපාලකයින් තමන්ගේ දාඩිය හා රුධිරු ජනාධිපතිවරණය ජය ගැනීම සඳහා යොදා ගන්නා බව පැහැදිලි විය. 'දිනය පහසු නැත' 'No Easy Day' නමින් ලාදන් ඝාතනය පිළිබඳ සත්‍ය මෙහෙයුම කරලියට එන්නේ එවැනි කළකිරුණු සෙබළෙකු විසිනි.

විකීලික්ස් වෙබ් අඩවියට සී.අයි.ඒ. සංවිධානයේ යුද රහස් ෆයිල් ලක්ෂ ගණනක් ලබාදුන් බ්‍රැඩ්මැනින්ගේ හෘද සාක්කිය ද මෙවැන්නක් විය. ඉරාකයේ ඉලෙක්ට්‍රෝනික යුද්ධය යොදා ගත් මැනින් පරිගණකය හරහා ජූලියන් ඇසන්ජේ හා මිත්‍ර වූ අතර එ. ජනපදයේ තම යුද අපරාධ ගැන ලොවට ප්‍රකාශ කරනා බොරුව හඳුනා ගත්තේය. ලේඩී ගාගාගේ ගීත ඇතුළත් ඩීවීඩී තැටියක් මාර්ගයෙන් සී.අයි.ඒ. යුද රහස් ලක්ෂ ගණනක් ඔහු කඳවුරෙන් එළියට ගෙන ඇසන්ජේ වෙත යැවීය. ඉරාකයේ අගමැති නූර් මලික් ගේ ඊ-මෙල් හැක් කිරීම සඳහා සී.අයි.ඒ. යොදාගත් මැනින්, සී.අයි.ඒ. හි දත්ත ගබඩාව බිඳ තොරතුරු දැනගැනීමේ අයිතිය ලොවට ලබා දුන්නේය. තලේබාන්වරු එ. ජනපදයට එල්ල කළ ප්‍රහාරයට වඩා වැඩි ප්‍රහාරයක් ඉලෙක්ට්‍රොනික ගරිල්ලා ප්‍රහාරයක් මගින් විකිලික්ස් එ. ජනපදයට එල්ල කළේ ය. කාලයක් එ. ජනපදය ද සිය සතුරු රාජ්‍ය හා රාජ්‍ය නායකයින් හෙළි කිරීමට විකිලික්ස් යොදා ගත් අතර එය තොරතුරු දැන ගැනීමේ අයිතිය ලෙස හැඳින්වීය. (Right to Information) නමුත් ඉරාකයේ යුද මෙහෙයුම් ලොග් සටහන් අනුව (War Log) පමණක් නිරායුධ ජනයා 109,838 ක් මරා දැමුනු බව බ්‍රැඩ්මැනින් හෙළි කළ විට ඔහු අත්අඩංගුවට ගනු ලැබීය. ඇසන්ජේ එ. ජනපදයේ සතුරකු ලෙස නම් කරනු ලැබීය.

බින්ලාදන් නිර්මාණය කළේ ද සෝවියට් සංගමයට එරෙහිව එ.

ජනපදයයි (1984-89) පසුව ලාදන් එ. ජනපදයට ද රැහැනි විය. එ. ජනපදය හා ඊශ්‍රායලය අරාබියේ විශේෂයෙන් පලස්තීනයේ ගෙන යන ක්‍රියාදාමය අල්කයිදා ඇතුළු සියළු ඉස්ලාමීය ත්‍රස්තවාදීන්ගේ මානුෂීය මුහුණුවර විය එහි සත්‍යයක්ද ඇත. එ. ජනපදය හා එක්සත් යුරෝපය මුස්ලිම් රටවල සිදුකරනා මානව විනාශකාරී ක්‍රියා නිසා එකී රටවල් ගල්යුගයට ගමන් කරවා ඇත. පෙරලා බටහිර ට එරෙහිව නැගී ඇත්තේ වඩාත් බියකරු ඉස්ලාමීය අන්තවාදයකි. බින්ලාදන් අරාබි ෂෙයික්වරු සියළු දෙනාම තෙල් හා ගෑස් නිසා බලවත් වී පොසිල ඉන්ධන සිය යුද අවිය කරගෙන ඇත. නමුත් ඔවුනගේ සමාජය තවමත් මධ්‍යකාලීන සමාජය යි. කඩුව, කසය, හිජාබ් ඇඳුම, ගල් ගැසීම, ෂරියා නීතිය, ආගමික පොලිසිය, හලාල් ආදී සියල්ල කියාපාන්නේ නවීන සමාජය හා ඉස්ලාමයේ ගැටුමයි.

හදාමාට් යනු වැලිකතරින් මහා කඳුවලින් ගහන වූද යේමනයට අයත් මුත් සවුදියට මායිම් වූද දකුණින් අරාබි මුහුදට මුහුණලා පිහිටියා වූ ද ප්‍රදේශයකි. අද පවා එහි ඇත්තේ මැටියෙන් තනන ලද මධ්‍යකාලීන නිවාසයන් ය. නූතනත්වය තවමත් එයට එබිකම් කරමින් පමණක් ඇත. ජල හිඟය නිසා ගොවිතැන එහි අපහසුය. සියවස් ගණනක සිට එහි කෙරුණේ වෙළඳාමත්, ගොඩනැගිලි ඉදිකිරීමත් ය. මුහුද හරහා චාරිකා කරමින් සිය සෞභාග්‍යය සොයා ගිය මිනිසුන්ගේ බිමක් ලෙස හදාමාට් හැඳින්විය හැකි ය. බෲනයි හා ඕමානයේ සුල්තාන්වරුන්ට ද හදාමාට් හි ලේ නෑකම් තිබීම මෙයට ඇති හොඳ ම සාක්ෂියකි.

හදාමාට් හි නිම්න (වාඩි) වල වැඩියෙන් හිදි අල් රෑබට් නම් ගමක් හමුවේ. මෙය සැතපුම් සියයක් පමණ දිගු ප්‍රදේශයකි. විසිවන සියවසේ බිහි වූ සවුදි අරාබියේ ධනවත් ම මිනිසුන් බොහෝ දෙනෙක්ගේ නිජබිම වීමට තරම් ගම වාසනාවන්ත විය. සවුදියේ විශාලතම බැංකු (NCB) පිහිටු වූ බින් මාපවුස්, තෙල් හා පතල් කැණීම් සඳහා ප්‍රචලිත අල් අමුදීන්, වෙළෙඳාම සඳහා ප්‍රචලිත බැරවුම් හා ඒ සියල්ලන්ට වඩා ධනවත් වූ මොහොමඩ් බින්ලාදන් ද බිහිවුණේ ඒ ගමෙනි.

මොහොමඩ් බින්ලාදන් සිය ඉරණම සොයා ගෙන හදාමාට් හි සිට සවුදි අරාබි ප්‍රදේශවලට සංක්‍රමණය වූයේ සවුදි අරාබිය රාජ්‍යයක් වීමට විළිලන අවදියේ මය. (1930)

මොහොමඩ් මුලින් නතර වුණේ ජෙඩාහි ය. මක්කම වන්දනාවේ යන දස ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන්ගේ පිවිසුම් නගරය වූයේ එයයි. ඒ

දිනවල තෙල් සම්පත පිළිබඳ ව තොරතුරු නොදැන සිටි හෙයින් අල් සාවුද් පවුලේ ප්‍රධාන ආදායම වුණේ හජ් වන්දනාව සඳහා මක්කම හා මදිනාව කරා ඇදී එන වන්දනා කරුවන්ට සේවා සැපයීම ය. මොහොමඩ් බින්ලාදන් තම පළමු රැකියාව ලෙස වන්දනා කරුවන්ගේ බඩු උසුලන්නෙකු විය.

පසු ව මොහොමඩ් බින්ලාදන් ඒ දුෂ්කර දිනවල තමා බඩු ඉසිලීම සඳහා භාවිතා කළ ඔලොගුව සිය දැවැන්ත මාළිගයේ ආලින්දයේ ආඩම්බර ලෙස ප්‍රදර්ශනයට තැබුවෝ ය.

1931 දී සවුදි අරාබිය බිහිවීමත් සමඟ ඉදි කිරීම් ද බහුල විය. බඩු කරගසන්නෙකුගේ සිට පෙදරේරුවකු දක්වා සිය වෘත්තිය මාරු කර ගන්නට බින්ලාදන් සමත් විය. පසුව ඔහු තම 'ගමේකම' අනුව යමින් ඉදිකිරීම් ආයතනයක් සුළුවෙන් ආරම්භ කළේ ය. දෙවන ලෝක මහා සංග්‍රාම අවධියේ සවුදියේ තෙල් සම්පත පිළිබඳව බටහිර ජාතීන්ට ඉව වැටීමත් සමඟ සවුදියේ ඉරණම මෙන්ම බින්ලාදන්ලාගේ ඉරණම ද තීරක ව වෙනස් විය.

තෙල් සල්ලි වලින් ගලා එත්ම සවුදි රජ පවුල මාලිගා තනන්නට වූහ. 1950 ගණන්වල රජ පවුලේ මාළිගා ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු වන්නේ මොහොමඩ් බින්ලාදන් ය. වැඩකල් නොගොස් ඔහු සවුදි රජුගේ මෙන් ම ෆයිසාල් කුමාරයාගේ ද ගජ මිතුරකු බවට පත්විය. මේ ගජමිතුරෝ තෙල් සල්ලි හෙවත් කළු රත්තරන් නිසා ඉක්මණින් ම කුවේරයන් බවට පත් වූහ. 1964 දී සවුද් හා ෆයිසාල් අතර ගැටුමක් ඇතිවූ විට එය ලේ වැගිරීමකින් තොර ව අවසන් කර ෆයිසාල්ට රජකම ලබා දෙන්නට මූලික වූවන් අතර මොහොමඩ් බින්ලාදන් ද විය. ඉන්පසු ඔහු රජයේ ඉදිකිරීම් ඇමති ලෙස පත් කරන්නට යෙදිණි. පසුව ඔහු අති දැවැන්ත බූවල්ලකු මෙන් මුළු සවුදියේ ම ඉදි කිරීම් කොන්ත්‍රාත් කරුවා විය.

'ඔසාමා' යනු යොවුන් සිංහයා යන්න ය. 1957 මාර්තු 10 දා මොහොමඩ් බින් ලාදන් හා ඔහුගේ බිරිඳක වූ සිරියානු ජාතික හමීදාට දාව ඔසාමා බින්ලාදන් උපත ලැබී ය. ඔසාමා හැදී වැඩුණේ මක්කම මදීනාව හා ජෙඩා යන නගරවල මොහොමඩ්ගේ මාළිගාවලය. ඔහුට තම මවගෙන් තවත් සොහොයුරින් දෙදෙනෙක් විය. හමීදා පසුව මොහොමඩ් බින්ලාදන්ගේ අන්තඃපුරයෙන් ඉවත් වී වෙන ම ජීවත් වූවා ය. එහෙත් ඇය කිසි විටක තම කුළුඳුල් පිරිමි දරුවා අමතක නොකළා ය. බින්ලාදන් සොයා ඇමරිකානු ඊ-52 යානා ටෝරාබෝරා කඳුකරය පුපුරවද්දී පවා තම මුණුබුරුගේ විවාහයට සහභාගිවීමට ඇය ඇෆ්ගනිස්ථානයට ගියා ය. ලෙයත් කිරිත්

දෙක ම ජලයට වඩා ඝණ බව ඇය ඔප්පු කළා ය.

ඕස්ට්‍රේලියානු ජාතික ක්‍රිස්තියානි අන්තවාදියකු වූ ජෙරුසෙලමේ අල් අක්සා (Al Aqsa) පල්ලිය ගිනි තැබීමෙන් පසු (1960) එය නැවත ගොඩනගන්නේ මොහොමඩ් බින්ලාදන් ය. ඔහු පසු ව මක්කම හා මදීනාව ද දස ලක්ෂ සංඛ්‍යාත වන්දනාකරුවන්ට උචිත ලෙස සහමුලින් ම ගොඩනැංවීය. ඔසාමා පසු ව කීවේ ඉස්ලාමයේ ශුද්ධස්ථාන තුන ම ගොඩනැගුවේ තම පියා බව යි.

1967 දී මොහොමඩ් බින්ලාදන් ගුවන් අනතුරකින් මිය යයි. ඔහුගේ දේපොළ ඔහුගේ දරු පවුලට ලැබේ. ඔසාමාගේ සොයුරෙකු වන සලීම් මොහොමඩ් සිය විසවෙනි වියේදී ම බින්ලාදන් ව්‍යාපාර අධිරාජ්‍යය බාර ගනී. සලීම් විවාහ වුණේ කැරොලින් කැරේ නම් ඉංග්‍රීසි ප්‍රභූ පවුලක කාන්තාවක් සමඟ ය. ඔහු ඉස්ලාමයට වඩා බටහිර සංස්කෘතියට ලොල් වූ එහි ම ජීවත් වූ අයෙක් විය. පාද් රජුට ඉක්මණින් ම කිට්ටු වූ සලීම් සිය පියා අනුව යමින් රජ පවුලේ ගජ මිතුරු ව්‍යාපාරිකයා බවය පත්විය. ඔහු බින්ලාදන් සමූහ ව්‍යාපාරය බල ශක්ති, කර්මාන්ත හා සන්නිවේදන ක්ෂේත්‍රවලට ද පුළුල් කළේ ය. 1976 දී බින්ලාදන් සමූහ ව්‍යාපාරය ජාත්‍යන්තර කරණය කරමින් එය එක්සත් ජනපදයට ගෙන ගියේ ය. එතැනදී ඔහුගේ නියෝජිතයා වුණේ හූස්ටන්හි ව්‍යාපාරිකයෙකු වූ ජේම්ස් බාත් ය. සලීම් වෙනුවෙන් බාත් හූස්ටන්හි කුඩා ගුවන් තොටක් මිළදී ගත්තේ ය. ජ්‍යෙෂ්ඨ ජෝර්ජ් බුෂ් ඒ දිනවල CIA අධ්‍යක්ෂවරයා විය. කණිෂ්ඨ බුෂ් (වත්මන් ජනාධිපති) ව්‍යාපාර ලොවට ඇතුළු වුණේ තෙල් වෙළදාම් හරහා ය. දෛවයේ සරදමකට මෙන් ජෝර්ජ් ඩබ්. බුෂ්ගේ වෙළෙඳ සාහකයා වන්නේ ජේම්ස් බාත් ය. බුෂ්ට 5 %ක් ද බින්ලාදන්ට 95% ක් කොටස් සහිත බනිජ තෙල් ව්‍යාපාරයක් බාත් ආරම්භ කළේ ය. බුෂ් ලා ලාදන්ලා ඒ අනුව ව්‍යාපාරික මිතුරෝ ය.

1988 දී සලීම් ටෙක්සාස්හි සිදු වූ ගුවන් අනතුරකින් සිය පියා මෙන් ම මිය ගියේ ය. ඉන්පසු තවත් බින්ලාදන් කෙනෙකු වූ බකීර් සවුදි බින්ලාදන් ව්‍යාපාර සමූහයේ (SBG) සභාපති විය.

1990 දී බින්ලාදන් සමූහ ව්‍යාපාරයේ මුළු වත්කම ඩොලර් බිලියන 5 ක් වන්නට ඇතැයි විශ්වාස කෙරේ. (එවකට ලංකාවේ වසරක දළ දේශීය නිෂ්පාදිතය තරම් අගයකි) එහි සේවකයන් 37,000 ක් සිටියහ. කයිරෝ, ඒඩන් ගුවන්තොටුපලවල්, ක්වාලාලම්පූර් නව දේවස්ථානය, රියාද්හි

තට්ටු 30 ක කාර්යාල සංකීර්ණය, ඩොලර් මිලියන 100 ක් වැය වූ සවුදි ගුවන් හමුදා සංකීර්ණය ආදිය ඔවුන්ගේ නිර්මාණයන් ය. දෛවයේ සරදමට මෙන් ඔසාමාට බෝම්බ පහර දීමට එ. ජනපද ගුවන්යානා පිටත්ව ගියේ ද එම ගුවන් තොටිනි. බින්ලාදන්ලා සතුව ඩුබායි, අබුඩාබි හා බහරේන්වල සාප්පු සංකීර්ණ ඇත. ජර්මානු මෝටර් රථ අරාබියට (Porsche, Volkswagon) ඔවුන් ය. මෝටරෝලාහි බිඳවැටුණු චන්ද්‍රිකා දුරකථන පද්ධතියත් වූ ඉරිඩියම් ව්‍යාපෘතියට ද ඔවුහු දායක වූහ. ඔසාමා වයස 17 දී සිරියානු ඥාතිවරියක හා විවාහ විය. ඇය ඔහුගේ බිරියන් සිවු දෙනාගෙන් පළමු වැන්නී ය. ඉන්පසු ඔහු ජෙඩාහි අබ්දුන් අසීස් රාජකීය විශ්ව විද්‍යාලයට ඇතුළු විය. 1981 දී ඔහු එයින් ආර්ථික කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා ගත්තේ ය.

ඔසාමාගේ ජීවිතයේ ද, ඉස්ලාම් මූලධර්මවාදයේ ද අවධි වසර වන්නේ 1979 ය. මුස්ලිම් සාම්ප්‍රදායික දින දර්ශනය අනුව එය නව සියවසක ආරම්භක වසරයි. එනම් වෙනස් වීමේ වසරයි. එය ඒ ලෙසම සිදුවේ. ඉරානයේ ෂා පලවා හැර කුමේනිගේ ෂියා ඉස්ලාම් විප්ලවය මුලින් ම සිදුවිය. ඉන් පසුව ඊජිප්තුව (සදාත්) ඊශ්‍රායලය සමඟ ගිවිසුමකට එන්නේ පාවාදීමක් පිළිබඳව ඉස්ලාමීය අන්තවාදයේ සිත් සසල කරවමිනි. ඊළඟට මූලධර්මවාදී කැරලිකරුවෝ මක්කම දේවස්ථානය අල්ලා ගනී. ඔවුන්ගේ ලෙයින් 'ශුද්ධ භූමිය' සෝදා හැරීමට සවුදි රජ පවුල ක්‍රියා කරයි. කෙසේ නමුත් සවුදියේ ආඩම්බරය එයින් බිඳ වැටේ. වෛරයේ හා පිළිකුලේ ආරම්භය සවුදි විශ්ව විද්‍යාලය තුළ දෝංකාර දේ. අන්තිමට ඓතිහාසික ඇෆගනිස්තානයේ ''දෙවිවරු නැති සාතන්ගේ'' කොමියුනිස්ට්වරු විප්ලවයක් කරති.

මේ සියල්ල විසින් ඔසාමා ඇදී යන්නේ 'මුස්ලිම් සහෝදරත්වය' වෙතට ය. මොහොමඩ් ක්වාටබ් හා අබ්දුල්ලා අසාම් එහි ආධ්‍යාත්මික ගුරුවරුන් වූහ. මොහොමඩ් ක්වාටබ් වූ කලී 1966 සි ඊජිප්තුවේ නසාර් විසින් මූලධර්මවාදියෙකු ලෙස සලකා මරණයට පත්කරන ලද්දා වූ ද ඉස්ලාමය ශුද්ධ යුද්ධය හෙවත් ජිහාදය ගැන අත්පොතක් ලෙස සැලකෙන Sign post හි කතුවරයා වූ ද සයිද් ක්වාටබ් ගේ සොයුරා ය. ආචාර්ය අබ්දුල්ලා අසාම් (1941-89) 1968 දී පලස්තීන විමුක්ති සංවිධානය (PLO) ජෝර්දානයෙන් පිට කළවිට ඊජිප්තුවට ගොස් සිය මූලධර්මවාදය විශ්ව විද්‍යාලවල දේශනා කළ අයෙකි. 1979 දී ඊජිප්තු - ඊශ්‍රායල් සාම ගිවිසුමේ කටුක විවේචකයකු වූ නිසා ඔහු එයින් ද පිටමං කරනු ලැබී ය. එවිට ඔහු සවුදි අබ්දුල් අසීස් විශ්ව විද්‍යාලයට බැඳෙයි. එතැනදී ද සවුදි රජ පවුල

විවේචනය කිරීම නිසා පිට මං වන ඔහු නතර වන්නේ ඇෆ්ගනිස්ථානයේ ය.

1930 දී ස්පාඤ්ඤය ෆැසිස්ට් කතෝලික මූලධර්මවාදියෙකු වූ ෆ්‍රැන්කෝගේ ග්‍රහණයට හසුවීම වැළැක්වීම පිණිස ජාත්‍යන්තර මට්ටමේ බුද්ධිමතුන් හා ලේඛකයින් වූ ජෝර්ජ් ඔවල්, අර්නස්ට් හෙමිංවේ, ජෝන් පැකේස් වැනි අය ස්පාඤ්ඤයට ගියා සේ ලොව පුරා ඉස්ලාමීය බුද්ධිමතුන් ඇෆ්ගනිස්ථානයට යන්නේ ''සෝවියට් සාතන්'' හා යුද වදින්නට ය. අබ්දුල්ලා අසාම් එයින් ඉතා ම වැදගත් පුද්ගලයා ය.

විශ්ව විද්‍යාලයේ දී ආසම්, ක්වාටබ් හා මුස්ලිම් සහෝදරත්වය විසින් පොළොඹවන ලද විසි දෙවන වියේ සිටි තරුණ ඔසාමා ද ඇෆ්ගනිස්ථානයට ගියේ ය.

ඔසාමාට එහිදී බූර්හන්දින් රබානි හා අබ්දුල් රසුල් සයිෆ් හමු වේ. දෙදෙනාම ඔහුට මක්කම වන්දනාවේ දී හමු වූවන් ය. (සාමාන්‍යයෙන් ලොවපුරා මූලධර්මවාදින් සිය සබඳතා වාර්ෂික ව අලුත්කර ගන්නේ හජ් වන්දනා කාලවලදී ය) ඇෆ්ගනිස්ථානයේ මුජාහිදින් ජිහාදය ඔහුට පිවිමාන වන්නේ ඔවුන්ගෙනි. සම්පූර්ණ වෙනත් මිනිසකු ලෙස සවුදියට එන ඔසාමා සිය ඥාතින් හා රජ පවුල ඇෆ්ගන් ජිහාදයට අරමුදල් සැපයීම සඳහා පොළොඹවයි. අරමුදල් එක් රැස් වන්නේ තොග ගණිනිනි. ඉන් පසු සිය සමාගමට අයත් බුල්ඩෝසර්, ට්‍රැක්ටර්, හා ට්‍රක් රථ සිය ගණනක් රැගෙන ඇෆ්ගනිස්ථානයට එයි. බංකර, උමං හා උමං නගර ඉදි කිරීමට ඔහු ඒවා යොදා ගනී. කෙසේ වෙතත් ඇෆ්ගන් මුජාහිඩීන් ප්‍රහාරයේ ජාත්‍යන්තර චින්තකයා වන්නේ ආචාර්ය අබ්දුල්ලා අසාම්ය; ඔහුගේ විශේෂත්වය වන්නේ වචනයෙන්, පෑනෙන් පමණක් නොව ජීවිතයෙන් ද ඔහු ඉස්ලාමීය මූලධර්මවාදයට කැපවීමය.

අසාම් ගින්නෙන් උපන් දරුවෙකි. මෑත දී ඊශ්‍රායල් හමුදා විසින් කුඩා දරුවන් සමඟ විනාශ කළ ජෙනින් නගරය ඔහුගේ උපන් ස්ථානයයි. 1966 දී හෙතෙම දමස්කස් සරසවියෙන් ආගමික කටයුතු සඳහා උපාධියක් ගත් අතර 1967දී ඊශ්‍රායල් ආක්‍රමණයේ දී යුද වැදුණු අයෙකි. 1973 දී ඉස්ලාම් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය ලැබී ය. ජිහාද් චින්තකයින් වූ සයිද් ක්වාටබ්, ඕමර් අබ්දුල් රහුමාන් (අන්ධ ෂෙයික්) සමග ඔහුගේ ලඟ ඇසුරක් විය. ඇෆ්ගන් ජිහාදයේ ජාත්‍යන්තර න්‍යායාචාර්ය බවට ඔහු පත්විය.

ඔහුගේ පළමු වදන් වූයේ ''අපට අද අවශ්‍ය රෆිපල හා ජිහාදය පමණයි''. සාකච්ඡා සම්මන්ත්‍රණ හා සම්මුති අපට අවශ්‍ය නැත.

''රාත්‍රියේ වසර හැටක් අල්ලාට යාඥා කිරීම වඩා අල්ලා වෙනුවෙන් එක් පැයක් සතුරන් සමඟ යුද වැදීම යහපත් ය''.

ඇෆ්ගන් සටන ජය ගන්නා අවධියේ ඔහු කළ ප්‍රකාශය ඉතා ම වැදගත් ය.

''අපේ සටන ඇෆ්ගනිස්ථානයේ ජයග්‍රහණයේ කෙළවර නොවේ. ජිහාදය අපේ ජීවිතවලට වගකීමක් බව තව දුරටත් පවතී. ඉස්ලාමය යළිත් තම නැති වූ බිම් හා අභිමානය ලබාගන්නා තෙක් ජිහාදය නවතින්නේ නැත. අප ඉදිරියේ දැන් අළුත් අභියෝග රැසක් ඇත. පලස්තීනය, ලෙබනනය, එරිත්‍රියාව, යේමනය, අන්දුල්සියාව (දකුණු ස්පාඤ්ඤය) පමණක් නොවේ. පිලිපීනය, බුරුමය, කාශ්මීරය, හා මෝගල් ඉන්දියාවේ ඉස්ලාමීය උරුමය අපි කෙසේ හෝ දිනාගත යුතු වෙමු. එතෙක් නොනැවතී පෙරට! ජිහාද් හා ජිහාද් පමණයි!!''

(මෙහිදී අසාම් ඉතා පැහැදිලි ලෙස මෝගල් ඉන්දියාව ගැන කියයි. රහ්මන් අලි චෞද්රිට අනුව ලංකාවේ මුස්ලිම්වරු මෝගල් ඉන්දියාවේ මුස්ලිම්වරුන්ගෙන් කොටසකි. ඉන්දියානු මුස්ලිම් ලීගය, සපිස්තානය, නසරිස්ථානය නමින් රටවල් දෙකක් පාකිස්ථානය සමඟ ලංකාවෙන් ඉල්ලා තිබිණි. ඇෆ්ගන් ජිහාදයේ නිසැක එල්ලයක් වන්නේ ලංකාව බව සියළු දෙනා සිතා ගත යුතු ය.)


ඔසාමා පුද්ගලික අරමුදල් සවුදි ව්‍යාපාරිකයින්ගෙන් ලබාගෙන ඇෆ්ගනිස්ථානයට යවත් දී සවුදි රජ පවුල සෘජුව ම ආධාර සැපයීමට ඉදිරිපත් වෙති. මේ සඳහා ඉදිරිපත් වන්නේ සවුදි බැංකු දෙකක් වන දාර් අල් මල් ඉස්ලාම් (එය සවුදි රජ පවුලේ මොහොමඩ් ෆයිසාල් විසින් පිහිටුවකි. සවුදි ඔත්තු සේවා ප්‍රධානියා තුර්කි කුමාරාගේ සොයුරෙකි. සවුදිය ලොව පුරා මූලධර්මවාදි සංවිධානවලට - මෙයට ලංකාවේ මුස්ලිම් පක්ෂ ද ඇතුළත් ය. මුදල් යැවීම සඳහා මේ බැංකුව 1981 සිට භාවිතා කරයි.) සහ තවත් බැංකුවක් වූ දාර් අල් බරකා ය. (එය පාද් රජුගේ මස්සිනා ට අයත් වූවකි) බටහිර ක්‍රිස්තියානි මූලධර්මවාදීන් අනුකරණය කරමින් සවුදිය ප්‍රමුඛ අරාබි රටවල් රාජ්‍ය නොවන සංවිධාන විස්සකට අධික ජාලයක් පිහිටුවති. මෙහිදී ප්‍රමුඛ සංවිධාන වූයේ ජාත්‍යන්තර ඉස්ලාමීය සහන සංවිධානයි. IIRO අනෙක්

ඉස්ලාමීය සහන ආයතනයයි. IIRA මේ ආයතන දෙකම අද මෙහෙව වන්නේ ලෝක ඉස්ලාමීය ලීගයේ මුෆ්ති අබ්දුල් අසීස් බිස්නස් විසිනි. අල් ටක්වා නම් බැංකු ජාලය නම් බැංකු ජාලයක් ද පවත්වාගෙන යයි. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර දෙපළාතේ ඉඩම් (සිංහල) මිළදී ගැනීම සඳහා ප්‍රකෝටි ගණනක මුදල් ඉහත ආයතන සඳහා යොදවන බවට ද තොරතුරු ලැබී ඇත. එමෙන් ම ශ්‍රී ලංකාව නව පල්ලි ඉදිකිරීමට ද, පවත්නා පල්ලි නවීකරණයට ද ඉස්ලාමීය තොරතුරු මධ්‍යස්ථාන හා මද්රාෂා මූලධර්ම පාසල් පිහිටුවීමට ද මේ අරමුදල් වැය වේ.

ඇෆ්ගන් යුද්ධයේ දී මුල් යුගයේදී සවුදි ඔත්තු සේවා ප්‍රධානී තුර්කි අල් පයිසල් සවුද් හා මොහොමඩ් සල්මාන් විසින් මසකට ඩොලර් මිලියන 20 බැගින් මුජේහිඩින් කල්ලිවලට ලබා දෙන ලදී. 'රියාල් පොලිටික්' නමින් හැඳින්වූ මේ ව්‍යාපෘතිය සමග ඔසාමා කිට්ටුවෙන් වැඩ කළ අතර ඒ නිසා ම ඔහුට මුජේහිදින්වරුන් අතර මුදල් ඇමතිට සමාන පිළිගැනීමක් මුලදී ලැබිණි. 1984 න් පසු සවුදිය සිය මුදල් පොම්පය තව තවත් තීව්‍ර කළේ ය. ඒ මගින් ඔවුන් තම සවුද් රජ පවුලට මාරක වූ මූලධර්මවාදීන් දහස් ගණනක් බිහි කර ගත්හ. (9/11 සිදුවීමෙන් පසු එ. ජනපදය පුරවැසියන් පිරිසක් තුර්කි අල් පයිසල්ට නඩු පැවරූහ.)

පලස්තීන මාධ්‍යවේදී ජමල් ස්මයිල් කියන්නේ සවුද් ගුවන් සේවය මගින් (ඇෆ්ගනිස්ථානයට නොමිලේ හා 25% ගාස්තු මත මුජේහිදින්වරුන් විදේශවලින් ගෙන යන ලදහ) අඩු තරමින් පන් දහසක් විදේශිකයන් එහි ගෙන ගිය බව ය. එ. ජනපද වාර්තා අනුව එය විසිපන් දහසක් තරම් ප්‍රමාණයකි. කෙසේ වෙතත් සෑම විටම සෝවියට් හමුදා සමඟ 1,75,000 - 2,50,000 අතර මුජේහිදීන් කැරලිකරුවන් සටන් කළහ.

සවුදිය හැරුණු විට ඇෆ්ගන් මුජේහිදින් යුද්ධයේ ලොකු ම තක්කඩිකම හා මුග්ධකම කළේ එ. ජනපදය යි. මුලින් කාටර් හා පසු ව රේගන් කල්පනා කළේ වියට්නාමයේ දී සෝවියට්වරුන් තමන්ට කළ අවමානය සඳහා පළිගැනීමට ඇෆ්ගනිස්ථානය හොඳ තෝතැන්නක් බව ය. ඔවුන් ඒ සඳහා සී. අයි. ඒ. හි මිල් බියර්දින් පත් කළහ. ඔවුහු පාකිස්තාන ඔත්තු සේවය හරහාත් ඇෆ්ගන් යුද්ධයට මුදල් සැපයීය. ඉන්පසු පාකිස්ථාන ISI ඔත්තු සේවය හරහා යුද අවි ලබාදීම ඇරඹිණි. සෝවියට් හමුදාවල ක්‍රියාකාරිත්වය පිළිබඳ ව නිතිපතා චන්ද්‍රිකා ඡායාරූප ලබාදුන් අතර අවසානයේ ස්ටින්ජර් මිසයිල ලබාදෙන ලදී.



අහමද් ෂා මසුද්

1984 දී පෙෂාවර් හිදී (පාකිස්ථානයේ) ඔසාමා ''බෙයිට් අල් අන්සාර්'' හෙවත් සහායකයින්ගේ නිවහන නමින් නිකේතනයක් අරඹයි. එයින් කෙරෙන්නේ විදේශවලින් එන පිරිස් පුහුණුවට හා සටනට යොමු කිරීමයි. මේ වකවානුවේ ම ඔසාමාගේ ගුරු අබ්දුල්ලා අසාම් ''මෙකාටබ් අල් කාදමත්'' හෙවත් සැපයුම් නිවහන නමින් මධ්‍යස්ථානයක් විවෘත කරයි. එයට සවුදි හා එ.ජනපද අරමුදල් ගලා එයි. අවි උපකරණ හා පුද්ගලයන් සම්බන්ධීකරණය එයින් සිදුවේ. පසු ව ඔසාමාත් ඔහු සමඟ එක්වේ.

එක්සත් ජනපදයට වියට්නාමයෙන් පලා ඒමට සිදු වූ ටෙට් ප්‍රහාරමෙන් (1968) සෝවියට් රතු හමුදාවල තීරක සටන සිංහලෙන් ක්‍රියාත්මක (Operation Lion Den) නමින් මුජාහිදීන්වරුන් විසින් සිදු කරයි. (1987) එකවර පාබල, ගුවන් ප්‍රහාර එල්ල වේ. ස්ටින්ජර් මිසයිල මගින් ජාජි සටනේ දී පමණක් සෝවියට් ගුවන්යානා (261) ක් එක් දිනකදී විනාශ වේ. මේ සටනට ඔසාමා හා අසාම් ද සහභාගි වෙයි. මේ සටන්වලදී වැඩිම දක්ෂතාවක් පෙන්වූයේ අහමද් ෂා මසූද් ය. ඔහු දැඩි ඉස්ලාමීය මූලධර්මවාදියකු නොවී ය. පසු ව තලේබාන්ට එරෙහිව උතුරු දිග සන්ධානය දක්ෂ ලෙස මෙහෙයවීය. ඔසාමා විසින් පුවත්පත් වාර්තාකරුවන් ලෙස වෙස් වලාගත් මරාගෙන මැරෙන අල් කයිදා ප්‍රහාරයක් මගින් 2001 සැප්. 29 දා ඔහු ඝාතනය කරන ලදී. එනම් 9/11 ප්‍රහාරයෙන් පසු අනිවාර්යෙන් එන එ. ජනපද යුද ප්‍රහාරයේ දී ශක්තිමත් ඇෆ්ගන් යුද නායකත්වයක් ඇතිවීම වළක්වනු ලැබීය. තලේබාන්වරු පළවා හැරීමෙන් පසු පත්වූයේ දුර්වල නායකයකු වූ කරාසි ය.

ඔසාමා හා අසාම් එක් වී විදේශ සටන්කරුවන්ගේ සේවාවන් වඩාත් හොඳින් ඉටු කිරීම සඳහා ඇෆ්ගනිස්ථාන සේවා කාර්යාංශය (MAK) බිහි කරති. මෙයට ආරම්භක අරමුදලට මුදල් ලබා දී ඇත්තේ (ඩොලර් මිලියන 200ක්) අද ත්‍රස්වාදයට එරෙහිව හඬ නගන එ. ජනපදය හා බ්‍රිතාන්‍යය එක්ව ය.

ඔසාමා හා අසාම් එක් වී ඔවුන්ගේ ''අල් අන්සර්'' නමින් ජාජිවල පිහිටුවති. එහි විදේශකයින් පුහුණු කෙරේ. 1988 වකවානුව සෝවියට් හමුදා පසුබසින ලකුණු පහළ වන විට අදාම් ජිහාදය පිළිබඳ මූලික න්‍යායික දේ නැවත සකස් කරයි. ලෝක ඉස්ලාමීය බහුජාතික සටන් පෙරමුණක් පිළිබඳ අදහස ඔහු විවිධ ජාතීන්ගෙන් සමන්විත මූ අල් අන්සර් කඳවුරේදී ඉදිරිපත් කරයි. 1989 දී සෝවියට් දේශය ඇෆ්ගිනිස්ථානයෙන් බැස යත්ම අසාම් හා ඔසාමා MAK ආයතනය ''අල් කයිදා'' (පදනම) බවට පත් කරති.

ලොව මෑත ඉතිහාසයේ ප්‍රබලතම බහුජාතික නවීන ත්‍රස්ත සංවිධානය බිහි වෙන්නේ එසේ ය. එයට ආරම්භක අරමුදල සපයා ඇත්තේ අද එය හඹා එන එ. ජනපදය හා බ්‍රිතාන්‍යය වීම දෛවයේ සරදමකි.

ඔසාමා - අසාම් සන්ධානයට 1986 දී තවත් ඉතාමත් වැදගත් චරිතයක් එක් වේ. ඔසාමාගේ ගමන් මග ඇතැම් විට ඇෆ්ගනිස්ථානයෙන් කෙළවර වී ඔහු සාමාන්‍ය මිනිසෙකු බවට පත්වීම වළක්වන්නේ ද ඔහු ය. ඔහු ඊජිප්තු වෛද්‍යවරයෙකු වූ අයිමාන් මහමුද් රාබි අල් ස්වාහිරි ය. පසුව ඔසාමාගේ න්‍යායාචාර්ය හා සටන් සගයා බවට පත් වෙන්නේ වෛද්‍ය අල් ස්වාහිරි ය.

අල් සවාහිරි 1951 ජුනි 09 දා ඊජිප්තුවේ අල් ෂාරික්යාහ් වලදී උපත ලැබුවකි. ඔහුගේ පියා වෛද්‍ය වෘත්තිය පිළිබඳ මහාචාර්යවරයෙකි. මව කීර්තිමත් මහාචාර්යවරයෙකු වන අබු අල් වහාද් ගේ දියණියයි. (වහාද් පසුව පාකිස්ථානයේ ඊජිප්තු තානාපති විය) 1974 දී අල් ස්වාහිරි වෛද්‍ය උපාධිය ලබා ගත්තේ ය. ඔහුත් ඔසාමා මෙන්ම මූලධර්මවාදයේ හා මුස්ලිම් සහෝදරත්වයේ අදහස් විශ්ව විද්‍යාලයෙන් ලබා ගත්තේ ය. ඔහු පසුව ඊජිප්තුවේ ප්‍රබලතම ත්‍රස්ත කල්ලි දෙකින් එකක් වන ඉස්ලාම් ජිහාද් කල්ලියට සම්බන්ධ විය. අන්වර් සදාත් ඝාතනයට සැක කෙරී ස්වාහිරි සිරබත් කෑ අතර පසුව ඊජිප්තුවෙන් පිටුවහල් කරන ලදී. (1985). 1986 දී ඔහු ඇෆ්ගන් ජිහාදයට සම්බන්ධ වන්නේ වෛද්‍යවරයෙකු ලෙසයි. ඔහුට එතැනදී ඔසාමා මුණ ගැසේ. ඊජිප්තු ජිහාද් කල්ලි නායක රයිප් අහමද් හා එ. ජනපදයේ ජීවත්වන මූලධර්මවාදී ගුරු උමාර් අබ්දුල් රහමන් (අන්ෂ ෂෙයික්) සමග ඔසාමාට සෘජු සම්බන්ධයක් එතැනින් ඇතිවේ. අල් කයිදා ව්‍යාපාරය උසස් මාෆියා සංවිධානයක තත්ත්වයට පත් කළ හිටපු ඊජිප්තු පොලිස් නිලධාරියෙකු වූ අල් බන්ෂාරි එක් වන්නේ ද ස්වාහිරි නිසා ය.

ආරම්භයේදී අල්කයිදා හි හමුදා නායකයා වන්නේ ද බන්ෂාරි ය. ආයුධ ජාවාරම් (සෝමාලියාව), දියමන්ති ජාවාරම (සියෙරාලියෝන්) හා හෙරෝයින් ජාවාරම ආදිය පිළිබඳ ව ඒකාබද්ධ ජාලයක් අල්කයිදා ට එක් කළේ බන්ෂාරි ය. කෙන්යාවේ හා ටැන්සානියාවේ එ. ජනපද තානාපති කාර්යාලවලට එල්ල කළ ඒකාබද්ධ ප්‍රහාර ඔහු විසින් සැලසුම් කළ අතර අනපේක්ෂිත ලෙස කෙන්යාවේ වික්ටෝරියා විලේ පාරුවක් ගිලීමෙන් ඔහු මිය ගියේ ය. (1996 මැයි 21) අල්කයිදා ත්‍රස්වාදී සංවිධානය වැඩිවිය පැමිණිවූයේ බන්ෂාරි ය. ඉන්පසුව මොහොමඩ් අතීජ් හමුදා නායකයා බවට පත්විය. (2001 නොවැම්බර්වල ගුවන් ප්‍රහාර මගින් ඔහු මිය ගිය බවට එ.

ජනපදය කීවත් සැක සහිත බව යුරෝපා ඔත්තු සේවා ප්‍රකාශ කරති.)

කෙසේ වෙතත් ස්වාහිරිගේ පැමිණීමෙන් පසු අල්කයිදා බලවත් යුද කණ්ඩායම හා රැඩිකල් පිළ බවට ඊජිප්තු කල්ලිය බවට පත්විය. 1989 දී මුලදී කරුණු දෙකක් මත ඔසාමා හා අසාම් අතර මත භේද හට ගනී. එකක් නම් අල් මසාදා මුජෙහිඩීන් කඳවුර අල්කයිදා එකක් බවට පත්කිරීමේ ඔසාමා - ස්වාහිරි අදහසට අසාම් විරුද්ධ වීම ය. ඊජිප්තු ජිහාද් කල්ලි සඳහා අරමුදල් ලබාදීමට අසාම් අකමැති වීම දෙවැනි හේතුවය. එතැනින් නතර නොවන අසාම් ත්‍රස්තවාදය එනම් නිරායුධ මිනිසුන් ඝාතනය, ජිහාදයට එකඟ නැති බවට න්‍යායික විවරණයක් ද ගෙන ආවේ ය.

''කුරානයේ කියා ඇත්තේ අල්ලාගේ අරමුණු වෙනුවෙන් සටන් කරන විට ඔබ සමඟ සතුරුව සටන් කරන්නා සමඟ පමණක් සටන් කළ යුතු බව යි. මහමත්තුමා සිය හදිත්වල පැහැදිලි ව ප්‍රකාශ කර ඇත්තේ කාන්තාවන් දරුවන් නොමරන ලෙස ය. බහු දේවාවාදීන් (මුෂ්රිකීන්) හා දෙවියන් නොඅදහන (කපීර්) අය සමඟ පවා සටන් කරද්දි සටන් නොකරන කාන්තාවන් හා දරුවන් ඉලක්ක කර ගැනීම හෝ සටනට සේවා නොසපයන අය ඉලක්ක කර ගැනීම ඉස්ලාමය විරෙහි වීමකි.....''

අසාම්ගේ මේ ජිහාද් විවරණ ය හා ස්වාහිරි එකඟ නොවී ය. ඉස්ලාමයේ සතුරන් හා එක් වී ජීවත් වන ඔවුන්ගේ දෑත් ශක්තිමත් කරන ලෙස සියල්ලන අහිංසකයන් නොවන බව ස්වාහිරිගේ මතය යි. මෙයට අමතරව ඔසාමා හා ස්වාහිරි විශ්වාස කළේ අසාම්ට වි. ජනපද බලපෑමක් ඇති බවයි. අල්කයිදාව සෝවියට් දේශයට විරෙහි සටනට පමණක් යොදා ගැනීමේ අරමුණක් ඇති බව ය.

1989 දී නොවැම්බර් 24 දා අසාම් සිය පුතුන් දෙදෙනා සමඟ සබා ලයිල් නම් පෙෂාවර් පල්ලියේ යාඥා මෙහෙයට සහභාගි වී මෝටර් රථයට ගොඩ වී එත්දි කිලෝග්‍රෑම් 20 ක අධිබල බෝම්බයක් පුපුරා මිය ගියේ ය. පළිගැනීමට කිසිවකු ඉතුරු නොකර අබ්දුල්ලා අසාම් හා ඔහුගේ පුතුන් දෙදෙනා ඝාතනය කරති.

මුලින් විශ්වාස කෙරුණේ අල්කයිදා නිෂ්ක්‍රීය කිරීම සඳහා පාකිස්ථානු ඔත්තු සේවය මෙය සිදු කළ බවයි. ඔසාමා පිටුවහල් කිරීමට පාකිස්ථානය තීරණය කිරීමෙන්ද එය පෙනි ගියේ ය. නමුත් 1990 දී අල්කයිදා සමාජිකයකු වූ මොහොමඩ් සාදික් ඔඩේ කළ පාපොච්චාරණයක දී සඳහන්

වී ඇත්තේ එය ඔසාමා කළ බවයි.

අසාම් ඝාතනයෙන් පසු අල්කයිදා හි අධ්‍යාත්මික ගුරු වශයෙන් තෝරා ගැනුණේ ඊජිප්තු මූලධර්මවාදියෙකු වන උමාර් අබ්දි අල් රහමන් (අන්ධ ෂෙයික් ය). 1993 ඔහු එ. ජනපදය විසින් අත්අඩංගුවට ගත් අතර ඔහුගේ පුතුන් අහමද් හා මහමුද් අල්කයිදාවට එක්වූහ.

ඇෆ්ගනිස්ථානයේ මුජාහිදීන් මූලධර්මවාදයට උපකාර කළ සියල්ලන්ට ම පාහේ ඉතා ඉක්මනින් ප්‍රති උපකාර ලැබිණි. ඇෆ්ගන් ජිහාද් සඳහා ඩොලර් බිලියන 12 ක් තරම් වැයකළ සවුදි රජ පවුල ඉතිහාසයේ තමන්ට තිබූ තියුණුතම ත්‍රස්ත අභියෝගය හෙවත් ''යකා'' මවා ගත්හ. වාර්තාවන අන්දමට සවුදිය තුළ ප්‍රහාර එල්ල නොවී පවත්වා ගැනීම සඳහා අද දක්වා අල්කයිදාවට විටින් විට පිදේනි දීමට එයට සිදු වී ඇත. මුවාමර් ගඩාපි ත්‍රස්තවාදය මකා දැමීම සඳහා සවුදියට පහර දිය යුතු බව එ. ජනපදයට කීවේ කට කසනවාට නොවේ.

ලොකුම පාඩම ඉගෙන ගත්තේ එ. ජනපදය යි. ඔසාමා සඳහා තමන් අරමුදල් හෝ පුහුණුව ලබා ඇති බව ඔවුන් පුනා පුනා කීවත් අසාම් හා ඔසාමාගේ MAK සංවිධානය බොහෝදුරට නඩත්තු වූයේ ද එ. ජනපද අරමුදල් වලිනි. මේ සඳහා තමන්ට එරෙහි නඩු විභාගයේ දී තුර්කි අල් සවුද් ප්‍රකාශ කළවිට එ. ජනපදය එකී නඩුව යට ගැසුවේ ය. අවි හා පුහුණුව එ. ජනපදයෙන් හා පාකිස්ථානයෙන් ලැබිණි. ඩොලර් ට්‍රිලියන ගණනක් සමග ජීවිත දහස් ගණනක් එ. ජනපදයට එක ත්‍රස්ත ප්‍රහාරයෙන් පමණක් (9/11) අහිමි විය. ඉදිරියේදි ඔවුන් තවත් ඩොලර් හා ලේ වමාරනු ඇත. පාකිස්ථානයට නම් වහා ප්‍රතිඵල ලැබුණේ ය. 1989 නොවැම්බර් 01 දා පාකිස්තානු අගමැති බෙනාසීර් භූතෝ හමුවීමට පැමිණි ඇගේ ජනතා පක්ෂ (ppp) සමාජික මන්ත්‍රීවරුන් සිව්දෙනෙකු සල්ලි පිර වූ සූට්කේස් හතරක් ඇයට පෙන්වූහ. ඒවා කොහේදැයි ඇසූවිට සවුදියෙන් ලැබුණු ඒවා බව ප්‍රකාශ විය. කෝපයට පත් භූතෝ මහත්මිය වහාම පාද් රජුට කතාකළ අතර ඔහුගේ උපදෙස වූයේ ඔසාමා බින්ලාදන් කුමන්ත්‍රණය පිටුපස ඇති බව ය. මේ ගැන පරීක්ෂණයන් කෙරුණු විට පෙනී ගියේ පාකිස්තානු ඔත්තු සේවයේ අධිපති ජෙනරල් හමීඩ් ගල් පවා ඔසාමාගේ කීකරු මුජාහිඩීන් සෙබළෙකු බව ය. පියවරින් පියවර පාකිස්ථානය මූලධර්මවාදය විසින් ගිලගනිමින් තිබිණි.

අල් ස්වාහිරි විසින් ඔසාමා තුළ වෙනස්කම් දෙකක් ඇති කරන

ලදී. එනම් ජිහාද් පිළිබඳ ව නිරායුධ මිනිසුන් ද ඇතුළත් වූ විවරණයකි. එය නිසැකව ම කුරාණයේ තිබුණ ද නැති ද ත්‍රස්තවාදයයි. දෙවැන්න නම් ඔසාමාට සුන්නි නිකායක තත්ත්වයට ඔබ්බෙන් වූ සලාෆිවාදයට ගෙන යෑමට ස්වාභිරි සමත්වීමය. සලාෆිවාදය වහාබ්වාදයට ද සම්බන්ධ වූවත් එය අතර සුන්නි-ෂියා නිකායික භේදවලට ඉහළින් ගිය දැක්මකි. මෙමගින් සුන්නි-ෂියා දෙපිරිසේ ම ජිහාද් සටන්කරුවන් අතර ඉස්ලාමීය සහෝදරත්වය ගොඩනැගීමට ඔසාමාට හැකිවි ය. වරක් ඉන්දීය ආරක්ෂක අංශ අතට පත් වූ අල්කයිදා සමාජිකයෙන් කීවේ ''සලාෆිවරු මුස්ලිම්වරුන්ගේ හොඳම පරම්පරාව බව මහමත්තුමා පවා පිළිගෙන තිබිණි. ජයග්‍රහණය, ගැලවීම හා රැකවරණය ඔවුනත වීය. ඔසාමා වනාහි අපේ යුගයේ සලාෆිය....''

ඔසාමා යළි සවුදියට පැමිණියේ ය. ඒ නමුත් ඔහු තමන් විසින් ගොඩනංවන ලද සටන්කරුවන්ගේ ජාලය අත් හැරියේ නැත. සවුදියේ ඔහු වීරයෙකු විය. සවුදි කුමාර පවුල්වලින් ඔහුට දේශනා සඳහා ආරාධනා ලැබිණි. ඔහුගේ වීඩියෝ හා කැසට් පටි දහස් ගණනක් නිකුත් විය. ඔහුගේ ජනප්‍රිය පාඨයක් වූයේ 1989 දි ම සෝවියට් දේශය ඇද වැටී කැබලිවලට බෙදී ගියේ ඇෆ්ගන් ජිහාදය නිසා බව ය. එක් සුපිරි සාතන් කෙනෙක් අල්ලා විනාශ කලා සේම අනෙක් සාතන් ද විනාශ කළයුතු බව ඔහු කීවේ ය. එනම් එක්සත් ජනපදය යි. සවුදි භූමිවල රැඳී සිටින එ. ජනපද හමුදා ඔහු විවේචනය කළේ ය. ඔහු සවුදි රජ පවුල මුල දී විවේචනය කළේ නැත. නමුත් අනාගමික රාජ්‍යයන් බාත්වාදයේ නමින් පවත්වාගෙන යන ඉරාකයේ සදාම් හා සිරියාවේ අසාද් ඔහුගේ විවේචනයට හසුවිය. 1990 අගෝස්තු 01 වන දා එ. ජනපදයේ දැවැන්ත යුධ ලණුවක් ගිල දැමූ සදාම් කුවේටය ආක්‍රමණය කළේ ය. එවිට ඔසාමා සවුදි රජයට ප්‍රකාශ කළේ සදාම්ට එරෙහි ව යුධ වදින ලෙස ය. සදාම් ජිහාදය සඳහා හෙතෙම නායකත්වය දීමට ඉදිරිපත් විය. නමුත් සවුදිය එ. ජනපද ක්‍රිස්තියානි හමුදා ගෙන්වා ගන්නා විට ඔසාමා කිපුණේ ය. එ. ජනපද නිලධාරියෙක් කීවේ පසු ව කීවේ වසර 10 කට පෙර සවුදියට ලබාදුන් අවි තොග පවා සීල්වත් නොකඩා එහි ගබඩාවල තැන්පත් කර ඇති බැව් දුටු බවකි. සවුදි අරමුදල්වලින් එ. ජනපදය ජයගත් අතර ඔසාමා සවුදි රජ පවුල වතාප් මුස්ලිමුන් (ජහිලියානා) ලෙස විවේචනය කළේ ය. ඒ හා සමගම ඔසාමා නිවාස අඩස්සියට පත් කෙරිණි.

තමන් කොටු වෙමින් තිබෙන බව ඔහු දැන ගත්තේ ය. බෙනාසීර්ට ගෙනා විශ්වාසභංගය පැරදවීම හා ඇය ඝාතනය කිරීමට දෙවරක් ම දැරූ උත්සාහය අසාර්ථක වීම නිසා ඇය සිටිනා තෙක් පාකිස්තානය

ඔහුට තහනම් විය. සෝවියට්වරු ඉවත් වීමත් සමඟ හෙක්මතියාර් හා රබානි ආදීන් අතර ඇති වූ ගැටුම් නිසා ඇෆ්ගන් මූල කඳවුර තව දුරටත් ආරක්ෂා සහිත නොවී ය. එමෙන් ම සවුදි රජ පවුල කෝපයට පත් වී සිටීමත් ඔවුන්ගේ ආරක්ෂාව පාකිස්තානයේ කොමාන්ඩෝ භටයන්ට පෙන්වා රැවටූ ඔසාමා සිය ඊළඟ දඩබිම සොයා සුඩානයට පලා ගියේ ය. අල් කයිදාහි ජමල් අල් පාඩල් කලින් ම එහි ගොස් ඔසාමාට ගොඩ බැසීමට අවශ්‍ය වටපිටාව තැනුවේ ය.

1989 දී අල් තුරාබිගේ අධ්‍යාත්මික නායකත්වයෙන් යුතු ජාතික ඉස්ලාමීය පෙරමුණ (NIF) සූඩානයේ රාජ්‍ය බලය අවියේ බලයෙන් ලබා ගත්තේ ය. එයට එරෙහි බටහිර රටවල් විසින් ක්‍රිස්තියානි ප්‍රතික්‍රියාවක් සූඩාන ජනතා විප්ලවීය හමුදාව (SPLA) මගින් සිදු කරමින් සිටියෝ ය. ඔවුහු දකුණු සුඩාන ප්‍රදේශ පාලනය කළේ ය. අල් තුරාබි සිය හමුදා සඳහා ඔසාමාගෙන් උපකාර ඉල්ලූ අතර ඔසාමා එය නොමසුරු ව එය ලබා දුන්නේ ය. මේ අනුව හමුදා කුමන්ත්‍රණයකින් සුඩානය පාලනය කරමින් සිටිමින් බ්‍රිගේඩියර් ඔමාර් හසන් අහමඩ් අල් බසීර්ගේ හමුදාවන්ට අල්කයිදා විසින් නවීන රේඩියෝ උපකරණ හා රයිෆල ලබාදිනි. සෝබෝන් උගතකු වූ තුරාබි පෙරළා බින්ලාදන්ගේ අල්කයිදා සඳහා සුඩාන පාස්පෝට් 200 ක් ලබා දුන්නේ ය.

ඔසාමා සුඩානයේ ක්‍රියාකළ ආකාරය රටක ක්‍රියාත්මක වන ආකාරය දැනගැනීමට කදිම නිදසුනකි. ඔසාමා එහි ගොස් කිසිඳු දේශනයක්, ත්‍රස්ත පුහුණුවක් ආරම්භ නොකළේ ය. මුලින්ම ඔහු කළේ ව්‍යාපාර ක්ෂේත්‍රයට අත ගැසීමයි. ඔහු වාඩි අල් අකික් නම් නැව් සේවාවක් පටන් ගත්තේ ය. ලාඩින් ඉන්ටර්නැෂනල් නම් වෙළෙඳ සමාගමක් පටන් ගත්තේ ය. අල් හිජ්රා නම් ඉදිකිරීම් සමාගමක් සුඩාන රජය සමඟ හවුලේ පටන් ගත්තේය. අල් කෙමර් නමින් දැවැන්ත ගොවිපළක් පටන් ගත්තේය. එයට අක්කර දශ ලක්ෂයක් අයත් විණි. රටකජු, ඉරිඟු, සෙසමි තෙල් ඒකාධිකාරට ඔහු සතුවිය. අල් ෂැමල් නම් බැංකුවක් පිහිටුවීය. මේ සියල්ල අවසන් වනවිට ඔහු දුගී සුඩානයේ ව්‍යාපාරික දැවැන්තයා වී තිබිණි. ඒ සඳහා ඩොලර් මිලියන 300 ක් ඔහු වැය කර තිබිණි. ඒ සියළු ව්‍යාපාර ලොව පුරා සම්බන්ධීකරණය සඳහා ලන්ඩන්, වියනා, ඩුබායි, හොංකොං, ක්වාලාලම්පූර් ආදී නගරවල කාර්යාල පවත්වාගෙන ගියේ ය. ශ්‍රමිකයන් හැරුණු විට මේ දැවැන්ත බහුජාතික සමාගමේ සියළු විධායක නිලධාරින් වූයේ අල්කයිදා සමාජිකයන් ය.

මෙලෙස 1991 සිට ඔසාමා සුඩානය සිය මූල කඳවුර කර ගනී. ඔහු පාකිස්තානය හා ඇෆ්ගනිස්ථානය අතර හැරියේ නැත. ඔහුගේ හොඳම සංවිධායකයෙකු වූ අබූ සුබයිදා තව දුරටත් පෙෂාවර්හි රැඳී සිටිමින් MAK සංවිධානයට මුවා වී පුහුණු කඳවුරු පවත්වාගෙන ගියේ ය. කුවේටය ජයගත් එ. ජනපද හමුදා ඊළඟට ''සාගතය'' නිමා කිරීම සඳහා සෝමාලියාවට ගොඩ බැස්සේ ය. නිල්ල පිරිගිය ඝර්ම කලාපීය රටක් වූ සෝමාලියාව නියඟයෙන් දාගිය මරණයෙන් කෙතෙක් බවට පත් වුණේ බටහිර ජාතීන් හා ඔවුන් අනුව ගිය බටහිර පාලකයින් නිසා ය. ඒ මරණයේ කෙතේ ඉස්ලාම් මූලධර්මවාදය මොහොමඩ් පාරා අයිඩිඩ් විසින් වපුරමින් තිබිණි. රටේ ඊසාන දිග ප්‍රදේශයේ ඛනිජ තෙල් යහමින් ඇති බවට ලැබුණු වැරදි චන්ද්‍රිකා ස්කෑන් රූපයක් නිසා එ. ජනපදය එහි ගොඩ බැස්සේ ය. එයින් වඩාත්ම කලබල වූයේ අසල සුඩානයේ තම මූල කඳවුර ගොඩ නගමින් සිටි බින්ලාදන් ය. සෝමාලියාවේ එක්සත් ජනපද හමුදාවන්ට පහර දීම සඳහා මොහොමඩ් අතීප් යටතේ ඇෆ්ගන් පුහුණුව ලැබූ අල්කයිදා 055 කොමාන්ඩෝ බලකාය ඔසාමා විසින් යවන ලදී. 1993 ඔක්තොබර් 03 හා 04 එ. ජනපද සෙබළු 18 දෙනෙකු ඝාතනය කෙරුනු අතර බ්ලැක් හෝක් වර්ගයේ හෙලිකොප්ටරයක් බිම දමනු ලැබී ය. කලබලයට පත් බිල් ක්ලින්ටන් සෝමාලියාවෙන් හමුදා කැඳ වූ අතර ඔසාමා කීවේ එක ම එක ප්‍රහාරයකින් එ. ජනපදය බියසුල්ලන් ලෙස පලා ගිය බව ය.

ඔසාමා ඊළඟ පිම්ම පනින්නේ එ. ජනපදයේදීම ය. රම්සි අහමඩ් යුසුප් නැමති අල්කයිදා සාමාජිකයා පුපුරණ ද්‍රව්‍ය කැබ් රියක් නිව්යෝර්ක් ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ රථ ගාලේ පුපුරුවා හැරියේ ය. (1993) එයින් ඔවුන් බලාපොරොත්තු වූ විනාශය සිදු නොවුණි. පාකිස්තානය රම්සි යුසුප් අත් අඩංගුවට ගත් අතර සිද්ධිය පිටුපස ඔසාමාගේ සෙවනැල්ල වැටී තිබුණි. නමුත් CIA හෝ FBI එය තේරුම්ගත්තේ නැත. ඔසාමාගේ ඊළඟ ප්‍රහාරය 1994 දී මැනිලාවලදී එල්ල වේ. ඒ මුස්ලිම් බෙදුම්වාදය එරෙහිව යුද වැදී සිටි පිදෙල් රාමොස් ජනාධිපති ඝාතනයට තැත් කිරීම ය. අල්කයිදා පෙෂාවර්වල සිට මැනිලා දක්වා ව්‍යාප්ත වී තිබිණි. ඊළඟ ප්‍රහාරය එල්ල වන්නේ ද රාජ්‍ය නායකයෙකුට ය. ඒ ඊජිප්තු ජනාධිපති හොස්නි මුබාරක්ට ය. 1995 දී ඉතියෝපියාවේ දී ඔහුගේ රථ පෙරහැරට පහරදී ඔහු ඝාතනය සඳහා අසාර්ථක උත්සාහයක් අල්කයිදා විසින් දරන ලදී.

1990-93 කාලයේ දී ඔසාමා ඉතා වැදගත් පිටු 6000 ක කෘතියක් පළ කළේ ය. ඒ සඳහා ඔහු සුඩානයේ ඔහුගේ කාර්යාල භාවිතා කළේ ය. තවද එය ඔහු නම් කළේ ''ඇෆ්ගන් ජිහාදයේ විශ්ව කෝෂය'' යන නමිනි.

කෘතියක් වුණේ ''යක්ෂයාට එරෙහි ව ජිහාදයේ සටන් උපක්‍රම'' යන්න ය. මෙකී කෘති දෙකකින් ඔහු ඕනෑ ම අයෙකුට පුපුරන ද්‍රව්‍ය, අවි ආයුධ, ඔත්තු බැලීම, ඝාතන කුමන්ත්‍රණ, බෝම්බ ප්‍රහාර ආදිය පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දුන්නේ ය. ඒවායේ සී.ඩී. තැටි (CD) ලොව පුරා බෙදා හැරිණි. 1993 දී මුලදී අල් පඩ්ල් විසින් සූඩානයේ හිලට් කොකෝ ප්‍රදේශයේ රසායනික අවි සඳහා කර්මාන්ත ශාලාවක් ඇරඹූ බවට ද තොරතුරු ඇත. එමෙන්ම බිඳ වැටුණු සෝවියට් දේශයෙන් පලා යන න්‍යෂ්ටික විද්වතුන්ගෙන් න්‍යෂ්ටික තාක්ෂණය ලබා ගැනීමේ උත්සාහයක් ද දැරී ඇත. (ඉන්දියාව, චීනය, පාකිස්ථානය, ඉරානය යන රටවල් සෝවියට් න්‍යෂ්ටික විද්වතුන් යොදවා ගෙන පහසුවෙන් න්‍යෂ්ටික තාක්ෂණය අත්පත් කරගන්නා ලදී.)

1995 දී අල් තුරාබි විසින් ඉස්ලාමීය නායක සමුළුවක් ක්වාර්ටම් නගරයේ දී පවත්වනු ලැබී ය. මෙයට ලොව පුරා ඉස්ලාමීය කැරලිකරුවෝ සහභාගි වූහ. එහිදී සුවිශේෂි දෙයක් විණි. එනම් සම්ප්‍රදායෙන් සුන්නි නිකායට අයත් බින්ලාදන් ඉරානයේ සහාය ලබන ෂියා නිකායට අයත් හිස්බුල්ලා සංවිධානයේ නායක ඉමාද් මුග්නියා හමුවීම ය. 1983 දී බීරූට්වලදී මරාගෙන මැරෙන ප්‍රහාරයක් මගින් එ. ජනපදය ලෙබනන්වලින් ඉවත් කළේ මුග්නියා ය. එයින් එ. ජනපද සෙබළු 241 ක් එකතැන ඝාතනය වූහ.

මේ අතර සවුදි රජ පවුල ඔසාමා ගැන බියෙන් පසු වූහ. වරක් ඔවුන් ඔහුට ඩොලර් මිලියන 400 ක් තරම් දැවැන්ත පගාවක් දී තමන් වෙතට නම්මවා ගැනීමට තැත් කළහ. මේ සඳහා අතර මැදියා වුණේ අන් කවරකු නොව සූඩානයට ඔසාමා ගෙන ගිය ජමල් අල් පඩ්ල්ම ය. අන්තිමේ දී සවුදි රජ පවුල බෝහෝ පමා වී තීරණයකට පැමිණියේ ය. එනම් ඔසාමා ඝාතනය කිරීම ය. ඒ සඳහා වූ කොන්ත්‍රාත්තුව භාර ගත්තේ ද ජමල් අල් පඩ්ල් විසිනි. ඒ සඳමා වූ අසාර්ථක උත්සාහයක් ක්වාර්ටම්වලදී දැරීමෙන් පසු ඔසාමා සවුදි රජ පවුල ගැන වෛරයෙන් උමතු වෙයි. එමෙන්ම දෙවියන් විසින් තෝරා දුන්නේ යයි ඔහු සිතූ ඔහුගේ සටන සගයින් ඩොලර් මිලියන කිහිපයකට පාවාදීම කරන බව ද ඔහු දැන ගනී.

1996 වසර ඇරඹෙන්නේ සූඩාන ආණ්ඩුවට සවුදිය, ඊජිප්තුව, පාකිස්ථානය හා එ. ජනපදයේ පීඩනය ගෙන දෙමිනි. එයට යටත් වන ඔවුහු සූඩානයෙන් පිටවී යන ලෙස ඔසාමාගෙන් ඉල්ලති. 1996 ජූනිවලදී ඔහු සූඩාන මුල කඳවුර අත හරී. ඒ වෙනුවට ඇෆ්ගනිස්ථානයේ බෙයිට් අල් සදාම් (සාමයේ නිවහන) කඳවුර තෝරා ගනී.

මේ අතර ඇෆ්ගනිස්ථානය පාකිස්ථානයට හිසරදයක් වෙයි. බෙනාසීර් භූතෝ ප්‍රසිද්ධියේ චෝදනා කරන්නේ (1994) සෝවියට් හමුදා ඉවත් වීමෙන් පසු එ. ජනපදය විසින් ඇෆ්ගනිස්ථානය අත්හැර දමන ලද බවයි. (මෙය දැන් තලේබාන්වරු ඉවත්වීමෙන් පසු මුෂාරෆ් හා කරාසිගේ හඬද වීම දෛවයෝගයකි.) කලක් පාකිස්ථාන් ඔත්තු සේවයේ කීකරු පූස් පැටියන් ලෙස සිට ඇත්තේ ඇෆ්ගන් යුද අධිපතීන් දැන් සිංහයන් සේ පාකිස්ථානයට එරෙහි ව යති. හෙක්මතියාර් හා මසූද් එහිදි ප්‍රමුඛ වෙති. ඉරානය, ඉන්දියාව පමණක් නොව රුසියාවද ඔවුන්ට උපකාර කරති. තම වයඹ දිග දොරටුව රැක ගැනීම සඳහා මෙහෙයුමක් ඇරඹීමේ සැලසුමක් පාකිස්ථාන අභ්‍යන්තර ඇමති ජෙනරාල් නසිරුල්ලා බාබර් විසින් සකසයි. ඒ අනුව පාකිස්ථාන ඔත්තු සේවය (ISI) 1994 අගෝස්තුවේ සිට නව සන්නද්ධ කල්ලියක් තනති. ඒ සඳහා සටන්කරුවන් බඳවා ගන්නේ පාකිස්ථානයේ පවත්වා ගෙන ගිය ඇෆ්ගන් ඉස්ලාමීය දහම් පාසල් වූ මද්‍රාෂාවලිනි. මද්‍රාෂා භාර ව සිටි මවුලානා පස්ලු රහමන් දහම් පාසල් දරුවන් ඊළඟ ඇෆ්ගන් ජිහාදයට සූදානම් කරති. පාකිස්ථානය අවි සපයයි. තලේබාන්වරු උපත ලබති.

එහි නායකයා වන්නේ 1962 දී උපත ලැබූ මුල්ලා උමාර් ය. ඔහු පාකිස්ථානයේ මද්‍රාෂාවල ඉගෙන ගත්තෙකි. හර්කට් ඊ ඉන්කිලාබ් ඊ ඉස්ලාමි පක්ෂයේ නියෝජ්‍ය නායකයා විය. ( එහි නායකයා නබි මොහොමඩ් වූ අතර එයට CIA හා ISI උපකාර ඉහළින්ම ලැබිණි) සෝවියට්වරුන් හා සටනට යෑමෙන් උමාර්ට තරුණ වියේදීම ඇසක් අහිමි විය.

1996 මැයි වලදි ඇෆ්ගනිස්ථානයේ තීරක චරිත දෙකක් වූ හෙක්මතියාර් හා මසූද් එකට එක් වූහ. මෙය ඉරාන ඔත්තු සේවාවේ රාජතාන්ත්‍රික ක්‍රියාවකි. මෙයින් කුපිත වන පාකිස්ථානය තලේබාන්වරු ලිහා දමති. අකුණු ගසන වේගයෙන් ආක්‍රමණය ඇරඹේ. මුලින්ම ඇද වැටෙන්නේ ස්පිනා පාෂාවල හෙක්මතියාර්ගේ බලකොටුවයි. 1996 සැප්තැම්බර් 29 වන දා වනවිට කාබුල් තිබුණේ තලේබාන් පාලනය යටතේ ය.

තලේබාන් ජයග්‍රහණය පාකිස්ථානයේ පමණක් ක්‍රියාන්විතයක් නොවේ. සවුදිය එයට අරමුදල් සැපයුවේ ය. තුර්කි කුමරු කන්දහාර්වලට ගොස් තලේබාන්වරු හමු වී ඔවුන්ට ඩොලර් මිලියන 200 ක "ඉස්ලාමීය" ආධාරයක් පිරි නැමී ය. ටොයොටා පික් අප්රථ 400 ක් ලබා දේ. එක්සත් ජනපදය නිකම්ම නොසිටියේ ය. මධ්‍ය ආසියාවේ තෙල් හා ගෑස් ඇෆ්ගනිස්තානය හා පාකිස්ථානය හරහා ඉන්දියන් සාගරයට ගෙන ඒමට

Unocal නම් ව්‍යාපෘතියක් ඵ. ජනපදය හා පාකිස්ථානය විසින් සෝවියට් දේශය බිඳ වැටුණු විට සැලසුම් කරන ලදී. පාකිස්ථාන් හිතවාදී පාලනයක් ඇෆ්ගනිස්ථානයේ ආවොත් එයට හිතකරවනු ඇතැයි සිතා තලේබාන් පැමිණීමට මුනිවත රැකීමෙන් නොනැවතී මූල්‍ය උපකාර කිරීමට ද ඵ. ජනපදය ඉදිරිපත් විය. UAE රබි සුල්තාන්ලා ද ඉස්ලාමීය සහෝදරත්වය පෙන්වමින් නොමසුරුව ඩොලර් මිලියන 100 ක් පිරිනැමුවෝ ය. ලොකු ම උපකාරය කරන්නේ අන් කවරකු හෝ නොව ඔසාමා බින්ලාදන් ය.

1996 මැයි මස තලේබාන් මෙහෙයුම අරඹන විට සුඩානය ඔසාමාට ඇෆ්ගනිස්ථානයට පලායෑමට ඉඩ සලසා තිබිණි. ඔහු තම බිරියන් තිදෙනා හා දරුවන් සමඟ ජලජලබාදයට එයි. අල් ස්වාහිරි, මොහොමඩ් අතීප් හා අල් සුබයිදා ඔහුට එක්වෙති. තලේබාන් සුවඳට ඉව අල්ලන ඔසාමා, මුල්ලා උමාර් හමුවේ. අල් කයිදාහි 055 බ්‍රිගේඩයෝ දෙදහසක් - හොඳම සටන්කරුවන් - තලේබාන්වරුන් සමඟ එක්වේ. ඇත්තෙන් ම කාබුල් අල්ලා ගන්නේ ඔවුන් ය. ඔසාමා නොමසුරු ව තලේබාන් මෙහෙයුමට උපකාර කරන අතර එහි නායකත්වය සමඟ ආත්මීය සබඳතා ගොඩනගා ගනී. ඔසාමා සිය සිව්වෙනි බිරිඳ ලෙස පාවා ගන්නේ තලේබාන් නායකත්වයේ නැගණියකි.

පකිස්ථානය, සවුදි අරාබිය හා යූ.ඒ.ඊ (U.A.E) ඇෆ්ගනිස්ථානයේ නියම පාලකයින් ලෙස තලේබාන්වරුන් තෝරා ගනිති. ඉරානය, රුසියාව, ඉන්දියාව, උස්බකිස්තානය හා තජිකිස්ථානය නියම රජය ලෙස උතුරුදිග සන්ධානය පිළිගනිති. ඇෆ්ගනිස්ථානය දේශපාලන අරුතින් දෙකඩ වේ.

තලේබාන්වරු වහා ම ඉස්ලාමීය ෂරියාව නීතිගත කරති. ඒ අනුව රූපවාහිනී හා සිනමාව තහනම් වෙයි. කාන්තාවන්ට රැකියා අහෝසි වේ. ඉස්ලාමීය දඬුවම් ක්‍රම යෙදවේ.

ඔවුන්ගේ ලෝක දැක්ම ද අති සරල ය. ඔවුන්ට ලෝක තුනක් විය. දර් අල් කෆීර් හෙවත් යක්ෂයන්ගේ ලෝකය. මෙයට ඉන්දියාව, රුසියාව හා මුස්ලිම් නෝවන රටවල් ඇතුළු විය. දාර් අල් මුනපිකින් හෙවත් විකෘති මුස්ලිම් රටවල්. මෙයට ඉරානය, ඉරාකය, තුර්කිය ආදිය අයත් විය. දාර් අල් ඉස්ලාම් හෙවත් සැබෑ මුස්ලිම් රටවල්. මෙයට සවුදි අරාබිය, පකිස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය අයත් විය.!

ඔසාමා විසින් 1994 දී දකුණු යේමනයේ මාක්ස්වාදී ආණ්ඩුව පරාජය

කිරීම සඳහා අබ්දුල් මජිඩ් සින්දානිගේ නායකත්වයෙන් සටන් කළේය. ජනාධිපති සාලි යටතේ රට ඒකාබද්ධ කෙරුණු අතර ඒ මෙහෙයුමට ඔසාමා අරමුදල් ද, සෙබළු ද සැපයීය. ඔහු තනිව දුරටත් සර්බියාවෙන් නිදහස් වීම සඳහා බොස්නියාවට ද අරමුදල් හා සෙබළු යැවීය. නමුත් ඒ රටවල් දෙකෙන් එකක්වත් සුඩානයෙන් පසු ඔහුගේ මූල කඳවුර කරගන්නට ඔහු අපොහොසත් විය.

මේ නිසා ඔහු තම මුළු වැර යොදා තලේබාන් නායකත්වය දිනා ගත්තේ ය. යළිත් එ.ජනපදයේ මෝඩ රාජතාන්ත්‍රිකයින් පැරදිණි. මේ නිසා UNOCAL අමතක කරන්නට එවුනට සිදුවිය. 1997 දී මැඩිලින් ඕල් බ්‍රයිට් තලේබාන් පාලනය විවේචනය කළ අතර, තලේබාන්වරුන් කිවේ ක්ලින්ටන් පිටුපස සිටින යුදෙව් ගැහැනියට (ඕල්බ්‍රයිට්) හා මිනිසාට (විලියම් කොහේන්) තමන් නතර කළ නොහැකි බව ය.

1997 වසර පුරා ඔසාමා හොඳින් ස්ථානගත විය. ලොව පුරා නවීනතම ජාලයක් ඇතිකර ගත්තේ ය. 1998 පෙබරවාරි 23 දා ඔහු ලෝක ඉස්ලාමීය ජිහාදය අඩංගු නියෝගය (පට්වා) නිකුත් කළේ ය. මෙයට ඊජිප්තුව වෙනුවෙන් අල් ස්වාහිරි මීර් හමාසා ද, බංගලාදේශය වෙනුවෙන් පස්ලුල් රහමන් හා ඇල්ජීරියාව වෙනුවෙන් ජී.අයි.ඒ ද අත්සන් තැබූහ. එහිදී ඔහු කෙළින් ම එ. ජනපදයට, ඊශ්‍රායලයට හා පොදුවේ යුදෙව් - ක්‍රිස්තියානි ලෝකයට එරෙහිව ඉස්ලාමීය යුද්ධය ප්‍රකාශ කළේ ය. සිය යුද මතයෙන් අන්ධ වී සිටි එක්සත් ජනපදය මෙය අමතක කර දැම්මේ ය. නමුත් ඔසාමා එය ජීවමානව ක්‍රියාවේ යෙදවීය.

1998 අගෝස්තු 7 දා කෙන්යාවේ නයිරෝබි නුවර හා ටැන්සානියාවේ ඩා එස් සලාම් නුවර එ. ජනපද තානාපති කාර්යාලවලට උදේ 10.30 ට හා 10.39 ට මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල විය. සවුදියට එ. ජනපද හමුදා පැමිණීමේ අටවන වසර එදිනට යෙදී තිබිණි. එය ලේ වලින් සමරනු ලැබීය. ඔසාමා කීවේ,

''අල්ලාට ස්තුති වේවා, ප්‍රහාරය විශිෂ්ඨයි. අති සාර්ථකයි. එය ඔවුනට අත්‍යවශයයි. අපි දශක ගණනක් ලෙබනනයේ හා පලස්තීනයේ වගුරන ලේ හා විඳින බිය සැක දැන් ඔවුනුත් විඳපුවාවේ.. එයයි දේව කැමැත්ත...''



නයිරෝබි බෝම්බ ප්‍රහාරය



USS Cole ට එල්ල කළ ප්‍රහාරය

කෝපයට පත්වන ජනාධිපති බිල් ක්ලින්ටන් ඔසාමාගේ කඳවුරු යැයි සැක කෙරෙන ස්ථානවලට එක්සත් ජනපද යුද නැවක් වූ USS COLE ලවා මිසයිල ප්‍රහාර එල්ල කරයි. තලේබාන් පාලනය ඉවත් කිරීමට හෝ ඔවුන් තදින් විවේචනය නොකිරීමට එ. ජනපදය ප්‍රවේශම් වේ. ඔසාමාගේ ප්‍රතික්‍රියාව ද කල් නොයවා ලැබේ. යේමනයේ ඒඩන් අසල තෙල් පුරවා ගනිමින් සිටියදී ඩිංගි බෝට්ටුවක පුපුරන ද්‍රව්‍ය රැගෙන මරාගෙන මැරෙන මුහුදු අල්කයිදා බලකායේ සෙබලෙක් USS COLE ට පහර දී ගිල්වා දමයි. (2000 ඔක්. 12) සෙබළු 17 දෙනෙක් ද මිය යති. ඔසාමාගේ සහසු සැමරුම එයයි !

USS COLE ට එල්ල කළ ප්‍රහාරය හා මුහුදු කොටි ශ්‍රී ලංකා නාවික හමුදාවේ අභීත නැවට එල්ල කළ ප්‍රහාරය අතර පුදුමාකාර සමානකමක් තිබිණි. එමෙන් ම ට්‍රක් රථවල පුපුරන ද්‍රව්‍ය දමාගෙන තානාපති කාර්යාලවලට එල්ල කළ ප්‍රහාර කොටින්ගේ මහ බැංකු ප්‍රහාරය හා ලෝක වෙළඳ මධ්‍යස්ථාන ප්‍රහාරයට හරියට ම සමාන විය. අල්කයිදා හා හිස්බුල්ලා - හමාස් සඳහා කොටි සංවිධානය මරාගෙන මැරෙන තාක්ෂණය ලබා දෙන බවට මෙයින් සැකයක් ඇති විය. එහෙත් බටහිර ක්‍රිස්තියානි මූලධර්මවාදය කොටි සංවිධානය තම සටන් සගයෙකු ලෙස - තලේබාන්වරු මෙන් ම - තෝරුම්ගෙන ඇති නිසා ඒ පිළිබඳව සොයා බලන්නට ගියේ නැත.

එ. ජනපදය 1996 පළකළ වාර්තාවකට අනුව අඩු ම තරමින් ඉස්ලාමීය සුභසාධන ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන 50ක්වත් අල්කයිදා හා සෙසු ත්‍රස්ත කල්ලිවලට ලොව පුරා උපකාර කරති. එවැනි එක් ආයතනයක අධ්‍යක්ෂක ලෙස පකිස්තානු ජනාධිපති මුෂාරෆ් ද සිටි බව එය වාර්තා කර ඇත. මෙයට අමතරව නෝර්වේ හා ස්විඩනයේ පවා අල්කයිදා සිය ව්‍යාපාර කරගෙන යන බව වාර්තා වේ.

## අල් කයිදා සංවිධාන රටාව

අල්කයිදා සංවිධාන රටාව මෙසේ සකසාගෙන ඇත.

### මූල්‍ය ජාලයඃ-

තමන්ගේ ම වූ විවිධ ව්‍යාපාර ලොව පුරා පවත්වා ගනී. එයට අමතර ව මත්ද්‍රව්‍ය, අවි ආයුධ හා කළු සල්ලි ජාවාරමේ යෙදේ. ක්‍රෙඩිට් කාඩ් ජාවාරම ඔවුන්ගේ මූලික ම අංශයකි. ධනවත් මුස්ලිම් රටවල සල්ලි

බැංකු හරහාත් සුභසාධන හා රාජ්‍ය නොවන සංවිධාන හරහාත් ඇද ගනිති. ඕනෑම රටක මුලින් ම අල්කයිදා ස්ථාපිත කරගන්නේ මුදල් ජාලය යි. එය බහුජාතික සමාගමක් වැනි ය.

**සන්නිවේදන ජාලය:**

පරිගණක, විදුලි තැපෑල, චන්ද්‍රිකා දුරකතන, ආගමික සමුළු හා මක්කම වන්දනාව ආදිය තුළින් එකිනෙකට වෙනස් සන්නිවේදන ජාලයක් පවත්වා ගනු ලැබේ. ඉන්දියානු ඔත්තු සේවය (RAW) එ. ජනපදයට ඔසාමාගේ චන්ද්‍රිකා දුරකථන අංකය ලබාදුන් නමුත්, එයට වසර එක හමාරක් සවන්දීමෙන් පවා කිසිදු සලකුණක් ලබා ගැනීමට ඔවුනට නොහැකි වීමෙන් ම ඔසාමා මොනතරම් උපක්‍රමශීලී ද යන්න ප්‍රකට වේ.

**සංවිධාන ජාලය:-**

බොහෝ දුරට මද්රාශා පාසැල්, ආගමික විශ්ව විද්‍යාල, ඉස්ලාමීය දේශපාලන පක්ෂ හා සුභසාධන සංවිධාන තුළට ඇතුළු වී ඒවා ක්‍රමයෙන් තම ග්‍රහණයට ගැනීම ඔවුන්ගේ උපාය යි.

**ප්‍රහාරය:-**

එකිනෙකට වෙනස් කණ්ඩායම් කිහිපයක් හරහා එක විට ප්‍රහාර කීපයක් සැලසුම් කිරීමත් ඒවා තදින් ම දැනෙන වර්ගයේ වීමත් විශේෂිත ය. ප්‍රතික්‍රියාව නොසලකා ඕනෑම ක්‍රියාවක් කිරීම අල්කයිදා විධික්‍රමය ය.

1988 පෙබරවාරි 23 දා ලෝක ඉස්ලාමීය පෙරමුණ ඉදිරියේ ඔසාමා කළ ප්‍රකාශය අනුව,

''අල්ලා විසින් අරාබියානු මහද්වීපය නිර්මාණය කළදායින් පසු එයට සිදු වූ විශාලතම අවමානය කළේ ක්‍රිස්තියානි ආක්‍රමණය විසිනි. පරපෝෂිතයින් මෙන් ඔවුහු අපේ ශුද්ධ භූමිවල පැතිරී යමින් ඒවා කෙලසමින් සිටිති. අල්ලා අපට ලබාදුන් සම්පත් හා ධනය කොල්ලකති. ඒවායේ පාලකයින් පාලනය කරති. ජනතාව බියවද්දති. ඉරාකයේත්, පලස්තීනයේත් සිදුවන්නේ මෙය යි. සවුදියේ ශුද්ධ භූමිවල සිදුවන්නේ මෙය යි. මේ සියල්ලෙන් අප තේරුම් ගත යුතුව ඇත්තේ එක් දෙයකි. එනම් ඇමරිකා එක්සත් ජනපදය අල්ලාට, මහමත්තුමාට හා ඉස්ලාම් අදහන ජනතාවට එරෙහිව යුද වැදී ඇති බවයි. මේ නිසා ලොව පුරා මුස්ලිම්වරුන්ට අපි මෙසේ නියෝග කරමු.

''ඇමරිකා එක්සත් ජනපදයට එරෙහිව සටන් වදිනු. ඔවුන් දුටු තැන මරා දමනු. ඔවුන් හමුදා භටයින් හෝ සිවිල් වැසියන් හෝ වේවා ! වෙනසක් නැත. මරා දමනු ! අල්ලාහ්ගේ නාමයෙන් මා ඉල්ලා සිටින්නේ ඇමරිකානුවන් සාතන් හා යක්ෂයින් නිසා ඔවුන්ගේ දේපොළ විනාශ කරනු. ඔවුන් මරාදමනු.!..''

## අල්කයිදා ජාලය

### ඇල්ජීරියාව:

ඊජිප්තු ජාතිකයින් හැරුණුවිට අල්කයිදාවේ ලොකු ම සාමාජිකත්වය තිබෙන්නේ ඇල්ජීරියාවේ ය. ඇල්ජීරියාවේ ක්‍රියාත්මක FIS (ඉස්ලාමීය ගැළවීමේ පෙරමුණ) හා GIA (ඉස්ලාමීය සන්නද්ධ සන්ධානය) එයින් මූලික ය. මෙයින් GIA සන්ධානය සන්නද්ධ ක්‍රියාවන් සඳහා ම කාමේරිඩියන් කේබේන් හා අබඩෙල්හාස් ලයාදා විසින් 1993 දී පිහිටුවන ලදී. ඒ හමුදාව මැතිවරණ නතර කර ඉස්ලාමීය ගැළවීමේ පෙරමුණට බලය ලබා නොදීම නිසා ය. ඔවුහු ප්‍රංශයේ ද සිය ජාලය පවත්වා ගනිති. සන්නද්ධ අරගලයේ උපායයන් පිළිබඳ ප්‍රශ්න නිසා පසුව GSPC නම් සන්නද්ධ කල්ලියක්ද තැණිනි. GIA බිහිවූ දා සිට අල්කයිදා එයට මූල්‍ය හා සන්නද්ධ උපකාර සැපයීය. නමුත් කාන්තාවන් සමූහ වශයෙන් දූෂණය හා සමූහ ඝාතනය පිළිබඳ ව GIA කුරානයට කියවීමක් ලබා දුන්නේ ය. ඒ මෙසේ ය.

''.. කාන්තාවන් තබා ගැනීම යනු ආක්‍රමණිකයාගේ දේපොළ තබාගැනීමම ය. කුරානය කියන්නේ සතුරන්ගේ දේපොළ අතරට කාන්තාවන් හා දරුවන් ද වැටෙනා බව යි. ඒ නිසා ජයග්‍රහණයෙන් පසු ඔවුන් අයත් වන්නේ ජයග්‍රාහකයාට ය. ආක්‍රමණිකයා මරණයට පත් වූ වහා ම විවාහය ද අවසන් වේ. දේපොළ ජයග්‍රාහකයාට කුරානයෙන් හිමිකර දෙන්නේ යම්සේ ද, කාන්තාවන් ද එසේය. ඔවුන්ගේ කැමැත්ත අකමැත්ත කුමක් වුවත් ඔවුන්ගේ සිරුරු අයත් වන්නේ ජයග්‍රාහකාට ය. මේ නිසා එවැනි කාන්තා සිරුර හා එක්වීමෙන් සිදුවන්නේ දූෂණයක් නොව තාවකාලික විවාහයකි..'' (සාබි - මේ සඳහා සෙබළුන්ට මහමත්තුමා අවසර දී ඇත..'' මේ අනුව අල්කයිදා ස්වාහිරි හා ඔසාමා නිරායුධ පිරිස් සමූහ ඝාතනයට ආගමික රැකවරණයක් ලබාදුන්නා සේ ස්ත්‍රී දූෂණයට හා ළමා වහල් සේවයට ආගමික කියවීමක් කේබේන් හා ලයදා ලබා දිනි. 1996 සිට GIA හා අල්කයිදා දුරස්වන්න්ට වූ අතර ඔවුහු පසුව GSPC ට ආධාර කරන්නට වූහ.

GIA ට ඉතා ම වැදගත් චරිතයක් වූයේ ප්‍රංශ ජාතික ලයනල් ඩියුමොන්ට් ය. ඔහු ක්‍රිස්තියානිය අත හැර ඉස්ලාමය වැළඳගත් ප්‍රංශ යුද සෙබළෙකි. ඔහු GIA ට මුලින් උපකාර කළ අතර, පසුව තමන්ගේ ම වූ ත්‍රස්ත කල්ලියක් - GR (Group Roubaix) ගොඩනැගීය. බොස්නියාව වෙන්කර ගැනීම සඳහා වූ සටනට ගිය ඔහු ටක්ෆිර් අල් හිජ්රා කල්ලිය හා එක් විය. එතැනදී ඔහුට අල්කයිදා හමු වූ අතර පැරිස් උමං දුම්රිය මාර්ගයේ ප්‍රහාරමක් කළේ ය. යුරෝපය තුළ බොස්නියාව නමින් ඉස්ලාම් රාජ්‍යයක් බිහිවීම මූලධර්මවාදය ලත් ලොකු ම ජයග්‍රහණයක් විය.

**යේමනය:**

ඊජිප්තුව හා ඇල්ජීරියාව හැරුණු කොට අල්කයිදාහි විශාලතම කණ්ඩායම යේමනයට අයත්ය. ඒඩන්වල ක්‍රියාත්මක වූ ඉස්ලාමීය හමුදාව (IAA) සමඟ අලකයිදා කිට්ටු සබඳතා ගොඩනංවා ගත්තේ ය. 1992 දෙසැම්බරයේ දී ඔවුහු සාර්ථක ලෙස යේමනයේ මොවෙන් පික් හෝටලයේ ලැගුම්ගෙන සිටි එ. ජනපද සෙබළුන්ට ප්‍රහාරයක් එල්ල කළහ. ඉන්පසු එ. ජනපද යුද නැවක් වූ USS The Suilivans පුපුරුවා හැරීම සඳහා 2000 ජනවාරි 5 දා මරාගෙන මැරෙන උත්සාහයක් දැරූහ. එය අසාර්ථක විය. අල්කයිදාහි යේමනයේ නියෝජිතයා වූයේ මොහොමඩ් අලියා අල් හාදා ය. ඔහුගේ පුතුන් දෙදෙනා ම අල්කයිදා වෙනුවෙන් දිවි පිදූහ. 1996-98 කාලයේ දී ඔසාමා තම Computer - M චන්ද්‍රිකා දුරකතනයෙන් ඇමතුම් 11000 ක් අල්හාදාට ලබාදීමෙන් ම ඔවුනතර සබැඳියාව හෙළිවේ. මේවාය සවන්දීමෙන් පවා CIA ට යේමනයේ ප්‍රහාර නතර කළ නොහැකි විය.

යේමනය එක්සත් කිරීමෙන් පසු ද අපූරු රටකි. එහි ආණ්ඩුවට යටවී සිටින්නේ ජනගහණයෙන් 35% ක් පමණි. සෙස්සෝ යුද අධිපතීන් යටතේ පාලනය වෙති. 1994 දි මිලියන 18ක ජනතාව අතර මිලියන 65ක් ස්වයංක්‍රීය අවි තිබුණු බව වාර්තා වී තිබේ.

අබේයාන් මිටියාවතේ අල්කයිදා කඳවුරු ඇත. කලක් තම මුල කඳවුර යේමනයට ගෙනඒමට ඔසාමා සිතගෙන සිටියත් අබූ හම්යාගේ සංවිධානයේ දැවැන්ත අවි තොගයක් හසුවීමෙන් පසු එකී සැපසුම අත්හැරිණි. යේමනය, බොස්නියාව හා තලේබාන් ඇෆ්ගනිස්ථානය මෙන් ම ඔසාමාගේ අරමුදල් හා සෙබළුන්ගේ ජීවිත පූජාවෙන් නිර්මාණය කළ රටකි.

එ. ජනපද ඔත්තු සේවාවන් සිතන්නේ ඔසාමා යේමනයේ සැඟවී ඇති බව ය. ඔහුගේ එක් බිරිඳක් එහි දී දුටු බවට සාක්කි ලැබීමෙන් පසු CIA යේමන ආණ්ඩුවේ උපකාර පතා ඇත. පසුව අල්කයිදා නායකයෙකු ඝාතනය කෙරිණි.

**ලිබියාව:**

ඔසාමා බින්ලාදන්ට මරණ වරෙන්තු නිකුත් කළ එක ම මුස්ලිම් රට ලිබියාව යි. 1994 මාර්තු 4 දා ජර්මානු ඔත්තු සේවයට අයත් ජර්මානුවන් දෙදෙනෙකු ලිබියාව තුළ ක්‍රියාත්මක ඉස්ලාමීය සටන් කණ්ඩායම (LIFG) විසින් ඝාතනය කෙරිණි. එය අල්කයිදාවේ හස්තය යි. ගඩාපි මේ සඳහා ඔසාමාට වරෙන්තු නිකුත් කළ අතර ඔසාමා ලිබියානු නායකයා මරා දැමීම සඳහා උත්සාහයක් ද දැරුවේය. ගඩාපිගේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් වන්නේ ඔසාමා නතර කිරීම සඳහා සවුදියට බෝම්බ දැමිය යුතු බවය. ගඩාපි පසුව ප්‍රකාශ කළේ අල්කයිදා පිළිබඳ තොරතුරු තමන් එ. ජනපදය හා බ්‍රිතාන්‍යයට ලබා දුන් බවයි!

**සවුදිය:**

සවුදිය තුළ අල්කයිදා තවමත් එල්ලකර ඇත්තේ ප්‍රහාර කීපයක් පමණි. එ. ජනපද සෙබළුන් 19 දෙනෙකු මරා දමා සිය ගණනකට තුවාල සිදුකළ 1995 ජුනි 25 ප්‍රහාරය ඉන් කැපී පෙනේ. 1996 දෙසැම්බර් මස කාර් බෝම්බයක් මගින් සවුදියේ ආරක්ෂක මූලස්ථානයට ද ප්‍රහාරයක් එල්ල විය. අල්කයිදාට සවුදිය වැදගත් වන්නේ අරමුදල් සඳහා ය. දිනකට අල්කයිදා පමණක් සවුදියෙන් ඩොලර් මිලියන 1.6 ක් ඇදගන්නා බවට තක්සේරු කර ඇත. ඔසාමාගේ නැගණිය හා විවාහ වූ ජමාල් කලීපා මේ අරමුදල් පරිපාලනය කරන අතර ඒ සඳහා IIRO, ISCAG, IWWWM ආදී විවිධ ආවරණ සංවිධාන යොදා ගනී. ලොව පුරා මුස්ලිම් රටවල පල්ලි තැනීමට, මද්රාෂා පාසැල් තැනීමට හා සුභසාධනය සඳහා වැඩියෙන් ම අරමුදල් සපයන්නේ සවුදිය යි. ලංකාවේ ද එය එසේ ය. මේ අනුව ගඩාපි නිවැරදි ලෙස ප්‍රකාශ කර ඇති ආකාරයට ඉස්ලාමීය ත්‍රස්තවාදයේ ''රියාල්'' මූලය තිබෙන්නේ සවුදි අරාබියේ ය.

**ඉරානය:**

ඉරානය ෂියා මුස්ලිමුන්ගේ රට වන අතර, එය ඍජුව ම ලෙබනනයේ හිස්බුල්ලා කණ්ඩායමට උපකාර කරයි. 1993 පෙබරවාරියේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල කළ අසාර්ථක ප්‍රහාරයෙන් පසු ඔසාමා තාක්ෂණය සොයා ඉරානයට පිය මැනීය. ඔහු හා හිස්බුල්ලා නායක මුග්නියා අතර ඇති වූ සම්බන්ධයෙන් හා කොට් සංවිධානය සමඟ ඇති කරගත්

සම්බන්ධයෙන් පසු ඔසාමා දියුණු ත්‍රස්තවාදී තාක්ෂණය ලබා ගත්තේය. ලෝකයේ අද තාක්ෂණයෙන් ඉදිරියෙන් ම සිටින ඉස්ලාමීය ත්‍රස්ත කල්ලි දෙක හිස්බුල්ලා හා අල්කයිදා ය. GIA හා හමාස් ඊළඟට සිටිති.

ඔසාමා ළඟට එ. ජනපදයට දරුණු දෙස රිදවීම් කළ ත්‍රස්ත නායකයා මුග්නියා ය. ඔහු මුලින් ම සෙබෙලකු ලෙස හිස්බුල්ලා සංවිධානයට එක්විය. පසුව එහි ආගමික නායක ෂෙයික් පාදල්ලාහ්ගේ ආරක්ෂකයා බවට පත්වී පසුව හමුදා ප්‍රධානියා විය. 1982 බීරූට් ප්‍රහාරය (සෙබළු 241 මිය ගියහ.) නිසා මුග්නියා ඉතිහාස ගතවිය. එකවර ප්‍රහාර ගණනාවක් කිරීමෙන් එ. ජනපදය පිස්සු වැට්ටවිය හැකි බවත් දරුණු එක් පහරකින් ඔවුන් සහමුලින් මානසිකව ඇදවැටෙන බවත් ඔසාමාට පෙන්නා දුන්නේ මුග්නියා ය. මුග්නියා ලෙබනනයේ CIA ඔත්තු සේවා ප්‍රධානියා වූ රොබට් ඇර්මිස්, විලියම් බරක්ලේ ඇතුළු සියළු ඔතතු කරුණුවන් අතුගා දැම්මේය. FBI වාර්තාවකට අනුව ඉරානය මුග්නියා හරහා පමණක් පසුගිය දශක දෙක තුළ එ. ජනපද හා ඊශ්‍රායල් ජීවිත 1500 ක් විනාශ කර ඇත.

ඔසාමා හා මුග්නියා අතර ඇති වූ සබඳතාවය පෙන්නා දුන්නේ ජනවාර්ගික හා නිකායික මුස්ලිම්වාදය, විශ්වීය ඉස්ලාම් මූලධර්මවාදයක් බවට පත්වීමෙන් ලොව පුරා මුස්ලිම් ත්‍රස්ත සංවිධාන හා බලවේග අතර පරස්පරයන් තුරන් කරමින් පවතින බවය. ඉරානය එහිදී වැදගත් මෙහෙයක් ඉටු කළේය. ඉරාකයෙන් පසු එ. ජනපදයේ ඉලක්කය බවට ඉරානය පත්වී සිටින්නේ නිකම් ම නොවේ.

**ඉරාකය:**

ඉරාකය ආගමික මූලධර්මවාදී රටක් නොවූවත් ඉස්ලාමය රාජ්‍ය ආගම කරගත් රටකි. සදාම්ගේ විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන අංගය බටහිර ලෝකය එරෙහි බලවේග සඳහා රාජ්‍ය තාන්ත්‍රික පහසුකම්, පුපුරණ ද්‍රව්‍ය, මුදල් ආදිය නොමසුරුව ලබාදීමය. තායිලන්තය, පිලිපීනය හා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ දේශපාලන පක්ෂවලට මේ ලෙස ඉරාකය උපකාර කර ඇත. චෙක් රටේදී ඔසාමාගේ නියෝජිතයන් ඉරාක බලධාරීන් හමු වූ බවට චෝදනා තිබුණේ ද චෙක් රට ඒවා ප්‍රතික්ෂේප කර ඇත. ඔසාමා කීපවිටක් සදාම් ට සුහදත්වයේ හස්තය දිගු කළද ඔහු එය

ප්‍රතික්ෂේප කළේය. එ. ජනපදයේ දරුණු ප්‍රතික්‍රියාවකට එය හේතුවක් වේයැයි බියෙන් විය යුතුය. නැතිවන්නට දෙයක් නැති විට සදාම් පවා ඔසාමා සමඟ එක්වීමට ඉඩක් නැතුවා නොවේ.

අප්‍රිකාව:

අප්‍රිකානු අග (සෝමාලියා, එරිත්‍රියා, කෙන්යා, ඉතියෝපියා) අල්කයිදා ඉලක්ක ප්‍රදේශයකි. තරමක තෙල් සම්පතත්, කර්මාන්ත හා කෘෂි ශක්තියත් රතු මුහුදට ප්‍රවේශ මාර්ගයක් වීමත් මේ හේතුවයි.

එරිත්‍රියාවේ ඉස්ලාමීය විමුක්ති පෙරමුණ සමඟ ඔසාමා සබඳකම් ඇතිකරගන්නේ ඔවුන් ඉතියෝපියාවේ කොමියුනිස්ට් ආණ්ඩුව සමඟ සටන් කරමින් සිටින විට ය. ඔසාමා ඔවුන් ගේ නායක ෂෙයික් අර්තාට ඩොලර් ලක්ෂයක් වරයක් ලබා දී ඇත. ඉන්පසු අල්කයිදා කෙලින් ම එරිත්‍රියානු ප්‍රහාරවලට සම්බන්ධ විය. එරිත්‍රියානු මුජෙහිඩීන් ප්‍රහාර 1993-95 කාලය අතර උත්සන්න කෙරිණි. අවසානයේ ඉතියෝපියාව පරාජය වුණේ 1996 ජුලි 8 දා අඩිස් අබාබා වලට ද එරිත්‍රියානු හමුදා ඇතුළුවීමෙනි.

එරිත්‍රියාව මුලින් සටන් කළේ ඉතියෝපියාවෙන් වෙන් වීමට වුවත්, ඒ සඳහා ඉතියෝපියාව සහමුලින් පරාජය කිරීමට ඔවුනට සිදු වූ බව දෙමළ බෙදුම්වාදයට හසුව සිටින ශ්‍රී ලංකාවේ සියළු දෙනා ද සිතාගත යුතු ය. එමෙන් ම එරිත්‍රියානු මුස්ලිම් බෙදුම්වාදයේ ජයග්‍රහණ ඉදිරියේ එ. ජනපදය හා බටහිර රටවල් කළේ ඒ කලාපයේ ක්‍රිස්තියානි සන්නද්ධ කල්ලිවලට උපකාර කිරීම ය. අප්‍රිකාවේ ඇත්ත යුද්ධය මුස්ලිම් - ක්‍රිස්තියානි යුද්ධයකි. එය ඔසාමා- බුෂ් යුද්ධයේ ම තවත් පෙරමුණකි. එමෙන් ම එරිත්‍රියාව වෙන් කර වෙන ම රාජ්‍යයක් බිහි කරවීමට අල්කයිදා උපකාරවලට හැකිවීමෙන් පෙනී යන්නේ ද ඉස්ලාම් ව්‍යාප්තවාදයේ බලය ය.

ආසියාව:

සාමාන්‍යයෙන් නූතනවාදී ජාත්‍යන්තර ත්‍රස්ත ක්‍රියාවන් වල ආරම්භය ලෙස සැලකෙන්නේ 1968 සිට පලස්තීන (PELF) සංවිධාන විසින් සිදුකළ පුද්ගල පැහැර ගැනීම්, ඝාතන හා ගුවන් යානා පැහැර ගැනීම් ආදිය යි. කප්පම් සඳහා හා දේශපාලන ඉල්ලීම් සඳහා මේවා සිදුකෙරිණි. ධනවත් රටවල් ලෙස සැලකුණු ජර්මනියේ මතු වූ බාඩාමයින්හෆ් ව්‍යාපාරය හා ජපානයේ රතු හමුදාව ආදිය ද අයත්වන්නේ එකී ගණයට ය. ජනවාර්ගික බෙදුම්වාදය හා මාක්ස්වාදය පදනම්කරගත් ත්‍රස්ත ව්‍යාපාර ඉන්පසු සුලභව දැකගන්නට ලැබිණ. නමුත් ඉස්ලාමය ත්‍රස්තවාදය බිහි වූ විට ඒ සියලු

ව්‍යාපාර අහිබවා ගිය අතර, ඔවුන්ගේ ඉලක්කය බවට බටහිර ලෝකය පත්විය. මුලදී ඉස්ලාමීය ත්‍රස්තවාදයේ මූල කඳවුර වූයේ ලෙබනනය යි. 1996 න් පසු එය ඇෆ්ගනිස්ථානය වීමත් සමඟ ලෝක ඉස්ලාමීය ත්‍රස්ත්‍රවාදයේ මධ්‍යස්ථානය ආසියාව කරා ආවේය.

කෙටිකාලීන යුද-දේශපාලන ඉලක්ක සඳහා දිගුකාලීන ජාතික හා ජාත්‍යන්තර ආරක්ෂාව බිලි දීම CIA, FBI, MI 6, ISI හා RAW සංවිධානවල ප්‍රතිපත්තිය වීම මේ තත්ත්වය දරුණු කළේය.

අල්කයිදාහි සාමාජිකයන්ගෙන් 1/5 ක් ආසියානුවෝ ය. බොහොමයක් මධ්‍ය ආසියාව, චීනය, දකුණු ආසියාව හා ගිනිකොණ ආසියාවේ ප්‍රදේශ වලින් ඇෆ්ගන් ජිහාදය සඳහා පැමිණි අයය. ඊළඟට ඔවුන් තම රටවලට අන්තවාදය පතුරුවා හැරියෝ ය.

**මධ්‍ය ආසියාව:**

සෝවියට් සමූහ ආණ්ඩුවට අයත්ව තිබූ උස්බෙකිස්ථානය, කසකස්ථානය, කිර්ගිස්ථානය, තජිකිස්ථානය, තර්මෙනිස්තානය ආදී රටවල 1989 සෝවියට් බිඳ වැටීමෙන් පසු ආගමික මූලධර්මවාදය මතු විය. මෙය වසර 70 ක අනාගමික මාක්සාවාදී සංස්කෘතියේ හිස් බව මොනවට පැහැදිලි කළේ ය.

මධ්‍ය ආසියාව (හා චීනය) පුරා පැතිර ඇති තජික් ජනවර්ගය තුළ මුලදී ම ඉස්ලාමීය මූලධර්මවාදය පැතිරේ. මෙයට හේතුව ඇෆ්ගනිස්ථානයේ මුජෙහිදීන්වරුන් අතර සිටි හොඳ ම සටන්කරුවන් තජික්වරුන් වීම ය. ඉස්ලාමීය පුනර්ජීවන පක්ෂය (IRP) 1990 ජුනිවල දී අරඹන ලදී. ඊළඟට තවුබා (නොපසුබසින) EIL (ඉස්ලාමයේ සටන්කරුවෝ) හා Adolat (සාධාරණය) ආදී මූලධර්මවාදී සන්නද්ධ සංවිධාන ඇති විය. ෆරගහානා නිම්නය මේ ඉස්ලාම් පිබිදීමේ පදනම් ප්‍රදේශය බවට පත් විය. විශේෂයෙන් මද්‍රාෂා ආගමික පාසැල් ඇතිවීම ඉස්ලාමීය ප්‍රචණ්ඩත්වයට තරුණයින් සපයන කෝව බවට සුපුරුදු ලෙස පත් විය.

1991 දී උස්බෙකිස්තානය සෝවියට් දේශයෙන් හා කොමියුනිස්ට් ආධිපත්‍යයෙන් මිදී ස්වාධීන රාජ්‍යයක් විය. එය මුලදී අනාගමික විය. අයි.ආර්.පී. (IRP) විසින් පල්ලියක් ඉදිකිරීම සඳහා උද්ඝෝෂණයක් ගෙන යන ලදී. එය ක්‍රමයෙන් ප්‍රචණ්ඩත්වයට හැරුණේ ආණ්ඩුවේ මූලස්ථාන සන්නද්ධ පිරිස් විසින් අල්ලා ගන්නා ලදී.

මෙහි ඓතිහාසික සරදම නම් එයට නායකත්වය දෙන්නේ සෝවියට් හමුදාව සමඟ ගුවන් ප්‍රහාරක සෙබලෙකු ලෙස මුජෙහිඩින්වරුන් සමඟ යුද්ධයට ගිය විසි දෙහැවිරිදි ජුමා නමන්ගානි විසින් වීම ය. නමන්ගානි හා එක්වන ක්‍රියාධරයන් යන තාහීර් යුල්දාෂ් හා අබ්දුල් අහඩ් සන්නද්ධ ඇඩොල්ට් ව්‍යාපාරය තනති. සුපුරුදු පරිදි ඔවුනට අරමුදල් සපයන්නේ සවුදි රජ පවුලයි. ඔවුන් ඒ අරමුදල් වලින් පල්ලි, මද්‍රාසා හා රයිපල ලබාගනිති. ඉන් පසු ඇරඹෙන්නේ උස්බෙකිස්තානය ඉස්ලාමීය ෂරියාවට නතු කිරීමේ සන්නද්ධ අරගලය යි. ජනාධිපති ඉස්ලාම් කරිමොව් 1992 දී එය මර්ධනය කරයි.

නමන්ගානි කෙලින් ම ත්‍රස්තවාදයට යයි. ජපාන භූ විද්‍යාඥයින් පිරිසක් පැහැර ගන්නා ඔහු ජාත්‍යන්තර අවධානය තමා වෙත යොමු කරගන්නා අතර ම ඩොලර් මිලියන 2 ක කප්පමක් ලබාගනී. පසු ව ඔහු සන්නද්ධ කැරලිකරුවන් 600 ක් පමණ අල්කයිදාවට එක්වේ. එහි ප්‍රබල චරිතයක් බවට 1999 සිට පත්වේ. 2002 එ. ජනපද ගුවන් ප්‍රහාරවලින් නමන්ගානි මියගිය බවට සැක කෙරේ. කෙසේ වෙතත් උස්බෙකිස්තානය ඉස්ලාමීය කිරීමේ අරගලය ඉදිරියට ම යයි.

1989 න් පසු තජිකිස්තානයේ ද කොමියුනිස්ට් පක්ෂයේ බලය බිඳ දැමීම සඳහා සටනක් ඇතිවේ. සෝවියට් දේශයෙන් නිදහස ලැබූවද බොහෝ රටවල පාලක පන්තිය බවට (රුසියාවේ නම් ධනපති - සූරාකන පන්තිය බවට  ම) පත් වූයේ කොමියුනිස්ට් පක්ෂයේ නිලධාරින්ම ය. තජික් ඉස්ලාමීය ව්‍යාපාරය (IMT) ඇතිවේ. එය සිවිල් යුද්ධයක් බවට තජිකිස්ථානය පත්කරයි. මෙයට නායකත්වය දෙන්නේ මොහොමඩ් රස්ටව් ය. රස්ටව් 1970 සිට කොමියුනිස්ට් පාලනය යටතේ ම රහසිගතව ඉස්ලාමීය ව්‍යාපාරය ගෙන ගිය අයෙකි. පසු ව රස්ටව් සියළු ඉස්ලාමීය කල්ලි එක්කර එක්සත් තජික් විපක්ෂය බිහි කෙරේ. මුජෙහිදීන් සටනේ විශිෂ්ඨ සෙනෙවියෙකු වූ අහමද් ෂා මසූද් ඇෆ්ගනිස්ථානයේ සිට (UTO) සඳහා සහය පළකරයි. නමුත් 1997 දී තලේබාන් ප්‍රහාර නිසා මසූද්ට තාවකාලිකව රුසියානු සහාය අවශ්‍ය වේ. එවිට ඔවුහු හිටපු කොමියුනිස්ට්වරුන් සමඟ සහයෝගිතා ආණ්ඩුවක් ගොඩනගති. (1997) ඉස්ලාමය රාජ්‍ය ආගම බවට පත්වේ. නමුත් ෂරියා මූලධර්ම අනුගමනය කරන ලෙස ඉල්ලමින් අන්තවාදය දිගට ම ක්‍රියාත්මක වේ. ඔවුනට 1997 න් පසු අල්කයිදා සහාය ලැබේ.

රුසියාවට අයත් ප්‍රාන්තයක් ලෙස පැවතුණු චෙච්නියාවේ ඇතිවූ ඉස්ලාමීය කැරැල්ල ද මධ්‍ය ආසියාවට බලපෑමක් කළේ ය. කඳුකර රාජ්‍යයක්

ලෙස කාලයක් තම අනන්‍යතාව රැගෙන ගිය චෙච්නියාව අවසන් වශයෙන් යටපත්කර ඇදාගත්තේ ස්ටාලින්ගේ පාලනයේ දී ය. 1989 සිට ඔවුන් වෙන්වීම සඳහා අරගලයක් කළ අතර, එය ජයග්‍රාහීව අවසන් කර වෙන ම රාජ්‍යයක් බවට පත්විය. මෙය 1991 දී දුදායෙව් යටතේ සිදුවිය. මෙයට අල්කයිදා හා සවුදිය මූල්‍ය වශයෙන් උපකාර කරන ලදී. පරාජිත රුසියන් හමුදා යළිත් 1994 දී ප්‍රහාර ඇරඹූ අතර, 1996 දී දුදායෙව් මරා දමන ලදී. මේ හා සමඟ ම ඩාජිස්තාන් හා උර්ගිස් ආදී රුසියානු ප්‍රාන්තවල ද බෙදුම්වාදයක් ඇති විය. 1997 න් පසු මේ බෙදුම්වාදයන් හා සටන් කිරීමට අල්කයිදා සටන්කරුවෝ එහි ගියහ. වරෙක ඔවුන් සියලුදෙනා එක්වී බොස්නියාවේ දී සර්බි (ස්ලාව්) වරුන්ට එරෙහිව සටන් කළහ. මේ නිසා රුසියාව කලබල විය. විශේෂයෙන් අල්කයිදා සහායයෙන් මොස්කව්හි සිදුවූ දැවැන්ත පිපිරීම්වලින් පසු රුසියාව චෙච්නියාවේ ස්වාධීනත්වය අවලංගු කළ අතර, චෙච්නියාව, ඩාජිස්ථානය හා උරගිස්වල නව ප්‍රහාර වටයක් අරඹා දරුණු ලෙස ඉස්ලාමීය මූලධර්මවාදය යටපත් කරන ලදී. තලේබාන් හා අල්කයිදා ඇෆ්ගනිස්ථානය ඇදවැටීමත් සමඟ චෙච්නියානු බෙදුම්වාදය පාලනය කිරීමට හා එහි නායකත්වය විනාශ කිරීමට රුසියාව සමත් විය. නමුත් අල්කයිදා චෙච්නියාවේ ජීවමාන බව මොස්කව් ප්‍රාණඇපකරු සිද්ධිය හා ග්‍රොස්නි මරාගෙන මැරෙන ප්‍රහාරය (2002 දෙසැ.) පෙන්නුම් කළේ ය.

**චීනයඃ**

ඇෆ්ගනිස්ථානයේ වැඩ වරද්දා ගත් අනෙක් මහ බලවතා චීනය යි. චීනය තුළ භාවිතාවන භාෂා අතර ෂින්ජියෑන් පළාතේ බහුල ව භාවිතා වන තජික් බස ද එකකි. වයඹ දිග මේ කඳුකර පළාත කාශ්මීරය, ඇෆ්ගනිස්ථානය හා රුසියාවේ මුස්ලිම් ප්‍රදේශවලට යාව පිහිටා තිබේ. චීනය ඒකීය රටක් වන අතර, පරිපාලනය ප්‍රාන්තවලට විමධ්‍යගත කර ඇත.

සෝවියට් දේශය සමඟ තිබූ පරස්පරය නිසා චීන ඔත්තු සේවාවන් ද තම ෂින්ජියැන් පළාතේ විසූ උරගිස් මුස්ලිම්වරුන් ඇෆ්ගන් ජිහාදයට යැව්වේ ය. පකිස්තානය ඔත්තු සේවාව හා චීන ඔත්තු සේවාවන් එහිදී එකට ක්‍රියා කළ බව කියැවේ. ඇෆ්ගන් මුජෙහිඩීන් සටන 1989 අවසන් වූ වහා ම තමන් ම ප්‍රගුණ කළ මුජෙහිදීන්වරුන්ගේ කොමියුනිස්ට් විරෝධී කැරැල්ල චීනයට ආවේ ය.

පැරණි සේද මාවත හරහා පැමිණි මොන්ගෝලියානු ආක්‍රමණිකයින් නිසා ශක්තිමත් මුස්ලිම් ප්‍රදේශ චීනයේ ඇති විය. එයට පෙර ඒවා බෞද්ධ

ප්‍රදේශයන් ය. කෙසේ වෙතත් පසුව මේවා මොංගෝලියාවේ බෞද්ධ පුනර්ජීවනයක් ඇති වී සැලකිය යුතු ලෙස ඉස්ලාම් ව්‍යාප්තවාදය පාලනය කරන ලදී. ඉස්ලාම් ව්‍යාප්තවාදය සමඟ තීරකව සටන්කළ එක ම බෞද්ධ ජනතාව මොංගෝලියානු බෞද්ධයින් ය.

කොමියුනිස්ට්වාදය යටතේ ෂින්ජියැන් පළාතේ උයිග්රිස් ඉස්ලාමය ද යටපත් කෙරිණි. සංස්කෘතික විප්ලවය එහි උච්චතම අවස්ථාව විය. ඒ හා සමඟම ඉස්ලාම් බෙදුම්වාදය ද ආවේ ය. ඔවුහු උස්රිස්තාන් නමින් වෙන ම රටක් ඉල්ලා සටන් කරන්නට වූහ. රහසිගත පල්ලි හා මද්රාසා සෑම තැනම බිහි විය. යළිත් මේවාට අරමුදල් ගලා ආවේ සවුදිය හා UAE රටවලිනි. ඇෆ්ගන් ජිහාදයට සම්බන්ධ වූ මුජෙහිදීන් සටන්කරුවන් යළි සිය ගම්බිම්වලට පැමිණීමත් සමඟ මේ තත්ත්වය උත්සන්න විය. 1990 දී ''බරින්'' නැගිටීම සිදුවිය. එහිදී උද්ඝෝෂකයින් විවෘතව ම චීනයට එරෙහි ''ජිහාද්'' ප්‍රකාශ කළෝ ය. චීනය එය දරුණු ලෙස මර්ධනය කළේ ය. ඉන්පසු අල්කයිදා එහි ගියේ ය. ත්‍රස්තවාදී ප්‍රහාර ඇරඹිණි. 1992 දී ෂින් ජියැන් අගනුවර වූ උරුම්කි හි බස් රථයක බෝම්බයක් පුපුරා ගියේ ය. 1993 දී රජයේ ගොඩනැගිල්ලක් පුපුරුවා හරිනු ලැබී ය. 1997 දී කෙළින් ම අල්කයිදා චීන හමුදා සමඟ ගැටුණහ. ඉන්පසු මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල විය. 2002 ජනවාරියේදී ද එවැනි ප්‍රහාරයක් එල්ල විය.

සාමාන්‍යයෙන් චීනය පිළිබඳ තොරතුරු පිටස්තර ලෝකයට ලැබෙන්නේ අඩුවෙනි. නමුත් එහි වෙරළබඩ ප්‍රාන්ත බටහිරකරණයට විවෘතවීම සමඟ චීනයේ අභ්‍යන්තර ගැටුම් යම් පමණකට වාර්තා වී ඇත. විවෘත ආර්ථිකය නිසා රාජ්‍ය ආයතන ඇදවැටීම, ගොවීන් අසරණවීම, ෂැංහයිවලින් ඈත පළාත් දුගී දුප්පත් වීම හා වෙරළබඩ ප්‍රදේශවලට සිදුවන සංක්‍රමණිකයන් නිසා චීනය අවුල් වී ඇත. ඔවුන් විසින් තිබ්බතයේ සිදු කළ ආක්‍රමණයත්, තිබ්බත බෞද්ධ රාජ්‍යය ඈඳාගැනීමත් නිසා මුලින් ප්‍රශ්න මතුවිය. දැන් කොමියුනිස්ට් සංස්කෘතිය බිඳවැටෙමින් කොන්ෆියුසියානු හා බෞද්ධ සම්ප්‍රදාය ගම්මානවල හිස ඔසවති. නගරවල ක්‍රිස්තියානි මූලධර්මවාදය ක්‍රියාත්මක ය. උගිරිස්තානයක් සඳහා වූ අල්කයිදා සටන දෙස බැලිය යුත්තේ ද මේ තත්ත්වය තුළ ය.

**ගිනිකොණ ආසියාව:**

''දව්ලා ඉස්ලාමියා'' හෙවත් ශුද්ධ ඉස්ලාමීය රාජ්‍යයක් සිංගප්පූරුව අග නගරය කරගෙන මැලේසියාව, ඉන්දුනීසියාව හා තායිලන්තය, බුරුමය හා පිලිපීනයේ මුස්ලිම් කොටස් එක්කරගෙන බිහිකිරීම අල්කයිදා අරමුණයි.

මේ ප්‍රදේශවල ජනගහණය මිලියන 250කි. (1999) ආර්ථික ශක්තිය ඩොලර් බිලියන 306 කි. (1999) භාණ්ඩ මිලදී ගැනීමේ ශක්තිය (ppp) අනුව බලනවිට ඩොලර් බිලියන 760 කි! මේ අරුතින් එවැනි රටක් බිහිකර ගත හැකි නම්, එය ජනගහණයෙන් පමණක් නොව ආර්ථික බලයෙන් ද ලොවේ බලවත්ම මුස්ලිම් රාජ්‍යය වනු ඇත. එපමණක් නොව එහි ඇති චීන සංස්කෘතික ලකුණු නිසා උතුරු අප්‍රිකාව මැදපෙරදිග හෝ මධ්‍ය ආසියාවේ මෙන් නොව එය අනිවාර්යයෙන් ම බටහිරට යුද, ආර්ථිකමය හා තාක්ෂණමය ලෙස මුහුණ දිය හැකි රාජ්‍යයක් වනු ඇත. මේ අනුව ඔසාමාගේ ඊළඟ පදනම් භූමිය වනවා ඇත්තේ ඉන්දුනීසියා දූපත් පද්ධතිය ය. එමෙන් ම නාවික, ගුවන් හා වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස එය දියුණු වේ නම් එහි වැදගත්කම තවත් තීව්‍ර වේ. එමෙන් ම චීනය, එ. ජනපදය, ඉන්දියාව හා ඕස්ට්‍රේලියාව ද මේ කලාපය දෙස සිය මැදිහත්වීම් සිදුකරමින් ඇති නිසා අනාගතයේ තියුණු ගැටුම් ඇතිවිය හැකි කලාපයකි.

ගිනිකොණ ආසියාවෙහි ද ඇෆ්ගන් මුජෙහිඩීන් ව්‍යාපාරයට සම්බන්ධ සටන්කරුවන් වූහ. එය සිය ගණනකි. ඔවුන් අතුරින් දක්ෂතම පුද්ගලයෙකු වූයේ අල්කයිදා වෙනුවෙන් වැදගත් මෙහෙයක් කළ රම්සි අහමද් යුසුප් ය.

යුසුප් පුපුරන ද්‍රව්‍ය විශේෂඥයෙකු විය. ආරම්භක යුගයේ දී අල්කයිදාවේ බෝම්බ තාක්ෂණය තැනුණේ ඔහු අතිනි. ඔහු වරක් ජපානයට අයත් ගුවන්යානා හතරක් පුපුරවාලීමට උත්සහ කලේ ය. ඉන්පසු එ. ජනපදයට අයත් ගුවන්යානා 11ක් පැහැර ගැනීමට තැත් කළේ ය. පිලිපීනයේ දී එ. ජනපද ජනාධිපති ඉබිල් ක්ලින්ටන් හා පාප්තුමා ඝාතනය කිරීමට ද ඔහුගේ සැලසුමක් විය. එමෙන් ම ඔහු පිටුපස පිලිපීන ආරක්ෂක අංශ එත් දී ඔහු පිලිපීනයෙන් පලා යන්නේ කොටි සංවිධානයේ උපකාරයෙනි. රම්සි යුසුප් අවසානයේ 1993 ලෝක වෙළඳ මධ්‍යස්ථාන පිපිරීමට සම්බන්ධ වී අත්අඩංගුවට පත්විය.

මලයාසියාවේ බලවත්ම මූලධර්මවාදී සංවිධානය ජෙමා ඉස්ලාමීය සංවිධානය ය. (JI) එහි නායකයා රිදුවන් ඉසමදින් ය. එයට සන්නද්ධ මුහුණුවරක් දුන්නේ අබ්දුල්ලා සන්ග්කාර් ය. සන්ග්කාර් 1990 මුලදී ඔසාමා හමුවීමත් සමඟ ඔහු හා අල්කයිදා එක්විය. සන්ග්කාර් ය අනුව ඇදහිල්ලේ ශක්තිය, සහෝදරත්වයේ ශක්තිය, යුද ශක්තිය මත දව්ලා ඉස්ලාමියා හෙවත් ශුද්ධ ඉස්ලාමීය රාජ්‍යය ගිණිකොණ ආසියාවේ පිහිටුවිය යුතු ය. 1999 දී සන්ග්කාර් මිය යන විට ඔහු කලාපය තුළ රැඩිකල් ඉස්ලාමීය


පදනමක් දමා තිබිණි.

පිලිපීනයට කලකට ඉහත බෞද්ධ රටක් වන අතර, අරාබි වෙළඳුන් විසින් එය ඉස්ලාමයට හරවන ලදී. ඉන් පසු පෘතුගීසීන් විසින් ඒ රට කතෝලික කරන ලදී. ඉන්පසු ඉස්ලාම් - කිතුනු ගැටුම් ඇරඹිණි. පිලිපීනයේ දූපත් කීපයක බහුතරය මුස්ලිම් මෝරෝවරුන් ය. මේ නිසා මෝරෝ විමුක්ති පෙරමුණ (MILF) බිහි වූ අතර, එයට අරාබි රටවල් සහාය ලැබිණි. පිලිපීනයේ කොමියුනිස්ට් හමුදාව හා නව ජනතා හමුදාව (NPA) ක්‍රිස්තියානි NGO විසින් දියකිරීමෙන් පසු පිලිපීන රාජ්‍ය විරෝධී බලය බවට MILF පත්විය. වත්මනේ එය මෙහෙයවන්නේ හෂීම් සලමට් ය. පිලිපීනයේ අල්කයිදා සතු ව ව්‍යාපාර ගණනාවක් විය. කලීෆා සමූහ ව්‍යාපාරය, පීමේඩ් වෙළඳ හා විදේශ රැකියා සේවය ආදිය මෙයින් කැපී පෙනේ. ක්‍රිස්තියානි NGO ජාලය තරම්ම පිලිපීනයේ මුස්ලිම් NGO ජාලය ද ශක්තිමත් ය. සලමට් BBC ට ප්‍රකාශයක් කරමින් කීවේ තමන්ට අරාබියෙන් පමණක් නොව ඔසාමාගෙන් ද අරමුදල් ලැබෙන බවත් ඒවා වැය වන්නේ නව පල්ලි ඉදිකිරීමට හා මද්‍රාෂා පවත්වා ගැනීමට බවත් ය.

පිලිපීනයේ කුඩා කල්ලියක් වන්නේ අබ්දූර් ජැක් ජන් ජාලිනි විසින් බිහිකළ ASG අබුසායික් සංවිධානය යි. ඔවුන් ඍජුවම අල්කයිදාවට සම්බන්ධ ය. ඇෆ්ගනිස්ථානයට හමුදා යවන අතර විශේෂ එ. ජනපද බලකායක් පිලිපීනයට යවනු ලැබුවේ අබු සායිප්වරුන් ද මර්දනය කිරීමට ය. ASG වරුන්ට දරුණු මර්ධනයක් එල්ල වූ නමුත් ඔවුන් විනාශ කිරීමට එ. ජනපදයට හැකි වූයේ නැත.

මලයාසියාවේ දී 1994 ජුනිවල හම්බිලි කොන්සෝජයා වෙළඳ සමාගම පිහිටුවීම කලාපයේ අල්කයිදා ව්‍යාප්තියේ ආරම්භය විය. ඉන්පසු එය මලයාසියානු මුජෙහිදීන් කණ්ඩායම (KMM) සමග එක්විය. KMM සඳහා පදනම දැම්මේ සයිවොව් ඉස්මයිල් නැමැති ඇෆ්ගන් මුජෙහිදීන් සටනට සහභාගි වූවෙකි. (1995 ඔක්.) වත්මනේ එය ඉන්දුනීසියාව දක්වා ව්‍යාප්ත වී ඇති අතර එය මෙහෙයවන්නා අසීස් නික්මැට් ය. තවදුරටත් තරුණ ඉස්ලාමීය ව්‍යාප්තිය (ABIM) ඉස්ලාමීය සමගිය (APU) ඉස්ලාමීය පෙරමුණ (IFM) ඉන්දියන් මුස්ලිම් කොන්ග්‍රස් (KIMM) ඉස්ලාමීය පක්ෂය (PAS) ආදිය ක්‍රියාත්මක ය. මේ සියළු සංවිධාන අල්කයිදා විසින් විනිවිද ගොස් ඇත.

මහතීර් මොහොමඩ් යටතේ 1981 සිට මැලේසියානු මුස්ලිම් ප්‍රජාව



ගුස්මාවෝ



බාලි බෝම්බ ප්‍රහාරය සහ අබුබකර්

නවීකරණය වූ අතර බටහිර රටවල් හැරුණු විට නවීනතම ඉස්ලාම් මූලධර්මවාදීන් සිටින්නේ ද මැලේසියාවේ ය. මෙයින් බලවත් ම කණ්ඩායම වන්නේ කුම්පුලාන් මිල්ටන් මලයාසියා (KMM) ය.

සිංගප්පූරුවේ ක්‍රියාත්මක වන බලවත් ම සංවිධානය වන්නේ ජෙමයියා ඉස්ලාමියා ය. සිංගප්පූරු ඔත්තු සේවාව මේ පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය කරගෙන වේගවත් ව ක්‍රියා කිරීම නිසා බොහෝ ඉස්ලාමීය ප්‍රහාර වළකා ගැනීමට හැකියාව ලැබිණි. සිංගප්පූරුවේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය මුස්ලිම් මූලධර්මවාදය මැඩලීම පිළිබඳ කදිම ආදර්ශයක් සපයා ඇත. සිංගප්පූරුව කෙසේ හෝ තම යටතට ගැනීම අල්කයිදා උපක්‍රමය යි. ඒ සඳහා ඔවුන් සිංගප්පූරු ආර්ථිකය (නාවික, ගුවන්, මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස) බිඳ දැමීමට අධිෂ්ඨාන කරගෙන ඇත.

ඉන්දුනීසියාව ඉස්ලාමීය මූලධර්මවාදයේ තොටිල්ල යි. එය ලෝකයේ විශාලතම මුස්ලිම් රාජ්‍යයයි. ඉන්දුනීසියාවේ 1971 දක්වා ඔහු පල්ලිවල දේශකයෙකු විය. ඉන් පසු ඔහු මද්රාෂා මුවාවෙන් ඉස්ලාමීය ශිෂ්‍ය නිවාස ක්‍රමයක් ඇති කළේය. 1975-78 කාලය තුළ සුහර්තෝ ඔහු මර්ධනය කළේ ය. 1985 දී සන්ග්කාර් ඔසාමා හමුවීමත් සමඟ ඉන්දුනීසියා මැලේසියා කලාපයේ මූලධර්මවාදය වේගවත් විය. ඉන්දුනීසියාවේ ජෙමා ඉස්ලාමීය (JI) ව්‍යාපාරය මෙහෙයවන්නේ අබු බේකර් බෂීර් ය. 1990 සිට ඔසාමා විසින් සන්ග්කාර් වේගයෙන් සන්නද්ධ දේශපාලනයට ඇද දමනු ලැබූ අතර මැල්සියාවට මෙන් ම ඉන්දුනීසියාවට ද එය පැතිර ගියේ ය. ඉන්දුනීසියාවේ ඇති වූ දරුණු ආර්ථික අර්බුදය (1996-99) සුහර්තෝ පළවාහැරීම හා ටිමෝරය නමින් කිතුනු රාජ්‍යයක් බිහිවීම (1999) හා ක්‍රිස්තියානි හමුදා ඕස්ට්‍රේලියාව සමඟ ගොඩ බැසීම යන කරුණු මත ඉන්දුනීසියාව වේගයෙන් මූලධර්මවාදයට නතුවෙමින් ඇත. දැනටමත් ඉන්දුනීසියානු මුජෙහිදීන් කවුන්සිලයක් පිහිටුවා ඇත. MILF විසින් ඉන්දුනීසියාව සඳහා ඉන්දුනීසියානු විමුක්ති පෙරමුණ (IILF) පිහිටුවා ඇති අතර එයට පිලිපීනයේ පුහුණුව ලැබේ.

දැනට හැටකට වැඩි ඉස්ලාමීය සටන් කල්ලි ඉන්දුනීසියාවේ ඇත. 2000 මැතිවරණයේ දී උප ජනාධිපති හම්සා හස්ගේ ppp පක්ෂය 11% ක් ද, ජස්ටිස් පක්ෂය 1.4% ක් ද, ඡන්ද ගත්තේ ය. වඩාත් වැදගත් වන්නේ අවුලෙන් අවුලට යන ඉන්දුනීසියාවට ෂරියා නීතිය ගෙන ඒම විසඳුමක් ලෙස 62% ක් කල්පනා කිරීමය. ප්‍රධාන සන්නද්ධ කල්ලි අතර ලස්කාර් ජන්දුල්ලා, ඉක්බානුල් මුස්ලිමුන් ඉන්දුනීසියා, පෙරසාන් මුජෙහිදීන් ඉන්දුනීසියා හා ලස්කාර් ජිහාද්

(LJ) ඇත. මෙයින් ප්‍රබලතම ප්‍රහාර එල්ල කරන්නේ ලස්කාර් ජිහාද් ය.

එහි නායක ජෆාර් උමාර් තාලිබ් පාකිස්තානයේ ලාහෝර් හි මද්රාශාවක අධ්‍යාපනය ලැබුවෙකි. පසුව ඔහු ඇෆ්ගනිස්ථානයේ යුද පුහුණුව ලැබුවේය. ඔහුගේ පදනම් භූමිය මුලුක්කු වන අතර ඒ ප්‍රදේශයේ ෂරියා නීතිය පදනම් කරගත් ආණ්ඩුවක් පිහිටුවීම ඔහුගේ අරමුණ ය. ටිමෝරය බිහිවීමෙන් පසු අම්බන්, ඇක් හා ජාවා දිස්ත්‍රික්කවල සිදු වූ ක්‍රිස්තියානි විරෝධී ප්‍රහාරවලට ඔහු සම්බන්ධ බව කියැවේ. අනෙක් අතට ක්‍රිස්තියානි ව්‍යාප්තවාදය ගුස්මාවාගේ ටිමෝරයෙන් නතර නොවී ඉරියන් ජාවාහි ද ක්‍රිස්තියානි බෙදුම්වාදයක් ඇතිකර ඇත. බාලි දිවයිනේ සිදු වූ පිපිරීමෙන් (2002) පසු හින්දු - මුස්ලිම් ගැටුම් ද ඇතිවීමේ ලකුණු පහළව ඇත. බාලි හින්දුන් හා පීජි හින්දුන් අතර සබඳතා ඇතිවීමට ද එයට ඉන්දියාව මැදිහත්වීමට ද මේ නිසා ඉඩකඩක් සැකසී ඇත.

අරාජික වෙමින් වැඩි වැඩියෙන් ඉස්ලාම් මූලධර්මවාදයට ඇදෙමින් පවතින ඉන්දුනීසියාවේ සුපුරුදු පරිදි නිහඬව සිටින්නේ බෞද්ධ ජනතාව පමණි. දච්ලා ඉස්ලාමියා ව්‍යාපාරයේ වැදගත් කොටසක් වන්නේ දකුණු තායිලන්තයේ පටානි එක්සත් විමුක්ති සංවිධානයෙහි (PULO) ක්‍රියාකාරිත්වය ය. බෞද්ධ තායිලන්තය බෙදීම සඳහා ද එහි වෙන ම මුස්ලිම් රාජ්‍යයක් බිහිකිරීම සඳහා ඔවුහු සටන් වැද සිටිති.

මෙය බුරුමයට ද අදාල ය. බුරුමයේ රොහාන්ගියා ප්‍රදේශයේ වෙන ම මුස්ලිම් රාජ්‍යයක් ඇති කිරීම සඳහා ව්‍යාපාරයක් පවතී. බුරුමයේ හා තායිලන්තයේ පවතින ඉස්ලාම් මූලධර්මවාදය පණගහන්නේ ක්‍රිස්තියානි මූලධර්මවාදය තුළිනි. බුරුමය හා තායිලන්තය යන දෙරට තුළ ම පවතින කේරන් ජන කණ්ඩායම ක්‍රිස්තියානියට හරවනු ලැබූහ. දැන් ඔවුහු කේරන් නම් ක්‍රිස්තියානි රාජ්‍යයක් සඳහා සටන් වදිති. කේරන්වරු වෙන ම ජන වර්ගයක් නිසා එහි ජනවාර්ගිකත්වයක් ද ඇත. ටිමෝරයේ ක්‍රිස්තියානි රාජ්‍යයක් පිහිටුවීමත් (1999) එය එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිගැනීමත් (2002) නිසා කේරන්වරු වඩාත් නිර්භීත ව බුරුම - තායි හමුදා සමඟ සටන් වදිති. මේ ප්‍රදේශ මත්ද්‍රව්‍ය ජාවාරමට ද සම්බන්ධ නිසා හා

ත්‍රස්තවාදීන්ගේ ජාත්‍යන්තර තිප්පොලක් (LTTE යද ඇතුළුව) බවට පත්ව ඇති නිසා අනාගතයේ බුරුම - තායි දෙරට ම තමන්ගේ නොසැලකිල්ල හා දූෂිත නිලධාරීන්ගේ ත්‍රස්ත ගනුදෙනු වලට වන්දි ගෙවීමට සිදුවෙනු ඇත.

## ඉන්දියාව හා පකිස්තානය

1999 සිදු වූ කුමන්ත්‍රණයකින් පසු පර්වේස් මුෂාරෆ් පකිස්තානයේ මහා මැතිවරණය කැඳවීය. ඒ සඳහා නීති ගණනාවක් ගෙන එන ලදී. එකක්වූයේ උසස් අධ්‍යාපන උපාධියක් නොමැතිව මැතිවරණ ව්‍යාපාරයේ දී හමුදා ආණ්ඩුව විසින් ප්‍රචාරකයින්ට බොහෝ බාධා කළ හැකි විය. එහෙත් මේ සියල්ලෙන් ගැළවුණේ එක්සත් ක්‍රියාකාරී සංගමය (මුට්ටාහිදා මජ්ලිස් ඉ අමාල් - MMA) නමින් හැඳින්වුණු මුස්ලිම් මූලධර්මවාදීන්ගේ සන්ධානය ය. ඔවුන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් කළේ ආගමික සරසවිවල උපාධිධාරීන් ය. අලි ජින්නාගේ කාලයේ සිට පකිස්තාන ඔත්තු සේවයේත් හමුදාවේත් රෝපණය කරන ලද ඉස්ලාම් මූලධර්මවාදය නිසා MMA ප්‍රචාරණයට එතරම් බාධාවක් සිදුවුණේ ද නැත. ඔවුන්ගේ ප්‍රචාරය මුළුමනින් ම ගෙන යන ලද්දේ එ.ජනපදයට හා මුෂාරෆ්ට එරෙහිව ඔසාමා - ඔමාර් ඇතුළු අල්කයිදා - තලේබාන් සන්ධානය වෙනුවෙනි. ඔවුනතර සිටියේ 1997 මැතිවරණයේ දී ජය ලැබූ මන්ත්‍රීන් දෙදෙනෙකු පමණි. තව දුරටත් කියන්නේ නම් මුෂාරෆ් ඔවුන්ගේ කාර්යාල සීල්තබා අති විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබිණි. (2001 දෙසැම්බර් -- 2002 පෙබරවාරි අතර අන්තවාදී කාර්යාල 624 ක් වසා දමා 2010 ක් අන්තවාදීන් අත්අඩංගුවට නු ලැබීය.) මේ සියළු තත්ත්ව යටතේ මැතිවරණය ඉස්ලාමීය විප්ලවයක් බවට පත්විය. ආසන 312කින් 51 ක් ඉස්ලාමීය මූලධර්මවාදීන්ට ලැබිණි. අනිවාර්යයෙන් ම මැතිවරණ ව්‍යාපාරයකට අරමුදල් ගලා එන්නට ඇත්තේ අල්කයිදා හා අල්ටක්වා ව්‍යාපාර ජාලවලිනි. හමුදා පාලනය නොවූවා නම් බංගලිදේශයේ මෙන් ඉස්ලාම් මූලධර්මවාදය පාර්ලිමේන්තුවේ බලය අල්ලා ගැනීමට වුව ඉඩ තිබිණි. පකිස්තානය තවත් නිකම් රටක් නොව න්‍යෂ්ටික බලය සහිත රටකි. ඒ රටේ පාලනය ඔසාමා - ඔමාර් සන්ධානයට ලැබීමේ ප්‍රතිඵල සිතාගත නොහැක.

ලොව පුරා ඉස්ලාමීය ත්‍රස්තවාදයට පසුගිය දශක දෙක තුළ අරමුදල් සැපයූ දායකයා සවුදි අරාබිය නම් එයට පුද්ගලයින් බඳවා දුන් තිඹිරිගෙය පාකිස්තානය යි. පකිස්තානය පුරා පවත්නා විවිධ මද්රාෂා ආගමික පාසල් හා අරාබි විශ්වවිද්‍යාල ඉස්ලාම් මූලධර්මවාදයේ තිඹිරි ගෙවල් බවට පත්වී තිබේ. ඉන්දීය නිදහස් අරගලයේ දී අලිගාර්

විශ්වවිද්‍යාලය කළ මෙහෙයට වඩා මෙහෙයක් එයින් සිදුවේ. උදහරණයක් ලෙස පකිස්තානයේ බයිනූරි නගරයේ සුනින් දියෝබන්දි ඉස්ලාම් පාසල තුළින් ඉහළ පෙළේ සියළු ම තලේබාන් නායකයින් ඉගෙනගෙන ඇත. මේ ලෙස ඉන්දියාව, බංගලිය, මැලේසියාව, ලංකාව පමණක් නොව මැදපෙරදිග හා උතුරු අප්‍රිකාවේ මූලධර්මවාදීන් සපයන කෝව ඇත්තේ ද පකිස්තානයේ ය. අනෙක් අතින් ඇෆ්ගන්- පකිස්තාන් ආගමික ගුරුන් ලොව පුරා රටවල මද්රාෂා හා ආගමික පාසල්වල ඉගැන්වීම සඳහා ගොස් ඇත. ලංකාවට ද ඔවුහු පැමිණ සිටිති. මේ නිසා ත්‍රස්තවාදීන්ට තමනට අවශ්‍ය පිරිස් බඳවා ගැනීම සඳහා කළ යුතු වන්නේ මේ පාසල්වලට ගොස් සටන්කාමීන් තෝරා ගැනීම ය. වෝල් ස්ට්‍රීට් ජර්නල් සඟරාවේ මාධ්‍යවේදී ඩැනියෙල් පර්ල් පැහැරගෙන ගොස් මරා දැමීමට සම්බන්ධ වූ අහමද් ෂෙයික් මෙයට කදිම උදාහරණයකි. ඔහු බ්‍රිතාන්‍යයේ සිට පකිස්තානයේ ආගමික පාසලක ඉගෙනීම සඳහා පැමිණියෙක් විය. ඔහු අත්අඩංගුවට පත්වීමෙන් පසු ඉන්දීය බලධාරීන්ට ලබා දී ඇති කටඋත්තරයේ මෙලෙස සඳහන් ය.

''මම දියෝබන්ද්, අලිගාර්, හේපූර් හා ලූ දියානා ආදී විද්‍යස්ථානවලට ගොස් ජිහාද් පිළිබඳ ව මුස්ලිම් හැඟීම් සෝදිසි කළෙමි. තවදුරටත් මම විවිධ පල්ලිවලට හා මද්රාෂා වලට ගියෙමි. මද්රාෂා පාසල්වලට ගිය මට හැඟුණේ අනාගත ජිහාදය සඳහා ඔවුන් හොඳින් දැනුවත් වී ඇති බව ය...''

පකිස්තානය තුළ දේශපාලන පෙරමුණුවලට අමතරව සන්නද්ධ සංවිධාන ගණනාවක් ඇත. එක් බලවත් සුන්නි සන්නද්ධ කල්ලියක් නම් මහමත්තුමාගේ හමුදාව නමින් හඳුන්වන SeSP ය. තවත් එකක් නම් ලෂ්කාර් ඊ ජගාන්ග්වි ය. (LeJ) මොවුන් ක්‍රිස්තියානියට මෙන් ම ෂියා මුස්ලිමුන්ට ද පහර දෙති. ෂියාවරු ද සිපාර් මහමුද් (SeM) නමින් සන්නද්ධ සංවිධානයක් තනා ගෙන ඇත.

පකිස්තානයට වැඩියෙන් ම බලපාන්නේ කාශ්මීරය යි. ඇතැම් කාශ්මීර කල්ලි බිහිවූයේ ඉන්දියාවෙන් මෙන් ම පකිස්තානයෙන් ද නිදහස ලබාගැනීම සඳහා ය. නමුත් ඉන්දීය හමුදා මර්ධනය ඉදිරියේ ඔවුන් පකිස්තානයට කාශ්මීරය ඈදන්නේ එතැනින් නොනැවතී අල්කයිදාවට දොර විවර කරන්නත් සූදානමිනි. සන්නද්ධ කාශ්මීර කල්ලි කීපයක් ඇත. හර්කාට් අල් මුජෙහිදින් (HuM) , ජායිශ් ඊ මහමුද් (JeM) , ලෂ්කාර් ඊ ටොයිබා (LeT) , හිස්බ් අල් මුජෙහිදීන් (HezB) ආදිය ප්‍රධාන ය. මේවා බොහොමයක් ක්‍රියාත්මක වන්නේ පකිස්තානයේ ය.

ජේ.ඊ.එම්. (JeM) සංවිධායකයෙකු වූ මවුලානා මසූද් අසාර් නිදහස් කරගැනීමේ අරමුණින් 1999 දෙසැම්බර් 24 දා ඉන්දියානු ගුවන් බසයක් ඔහුගේ සොයුරු ඊබ්‍රාහම් අසාර් විසින් පැහැරගන්නා ලදී. ගුවන් මගියෙකු වූ රැපිල් කාටියාල් මරා දැමීමෙන් බියට පත් වූ මගින් රැගෙන එය පකිස්තානය, ඩුබායි, කාබුල් හරහා කන්දහාර්හි තලේබාන් තොටුපලකට ගොඩබාන ලදී. මුලදී පෙනුණේ තලේබාන්වරු එයට අකමැති ආකාරයක් ය. අසාර් හා තිස්පස්දෙනෙකු සමඟ ඩොලර් මිලියන 200 ක් ලබා දීම හැර වජ්පායි ඇතුළු ඉන්දීය බලධාරීන්ට කළ හැකි දෙයක් නොවීය. ගුවන් මගීන් 155 දෙනා ම නිදහස් කරන ලද අතර, පසුව ඉන්දීය බලධාරීන් තේරුම් ගත්තේ එය JeM අල්කයිදා හා තලේබාන්වරුන් විසින් හොඳින් සැලසුම් කරන ලද නාටකයක් බවය. පිහි පෙන්නා ගුවන් යානා පැහැර ගැනීමේ කලාව එතැනින් ඇති විය.

පසුව අත්අඩංගුවට පත් වූ JeM ත්‍රස්තවාදියෙකු වූ මොහොමඩ් අෂ්රෆ්ගේ පාපොච්චාරණයට අනුව පකිස්තානු (PIA) ,ඉන්දියානු (IA) හෝ ශ්‍රී ලන්කන් (UL) ගුවන් යානාවන් පැහැරගෙන ඒවා ඉන්දීය පාර්ලිමේන්තුවට හෝ ඉන්දීය සාරගයේ එ.ජනපද යුද නැව්වලට මරාගෙන මැරෙන ලෙස පහරදීමට අල්කයිදා සැලැස්මක් තිබූ බව පෙනී ගියේය. ශ්‍රී ලංකාවේ බලධාරීන් මේ සම්බන්ධයෙන් නිසි අවධානයක් තවමත් යොමුකර නැත.

කෙසේ වෙතත් 2001 දෙසැම්බර් 13 දා මරාගෙන මැරෙන ත්‍රස්තයින් පස් දෙනෙක් ඉන්දීය පාර්ලිමේන්තුවට පහර දීමට සමත් වූහ. (මෙය JeM හෝ LeT වැඩක් ලෙස සැලකේ.)

1998 තානාපති කාර්යාල ප්‍රහාරවලින් පසු ඔසාමා ඉලක්ක කරගත් මිසයිල ප්‍රහාර එ. ජනපදය විසින් එල්ල කිරීමෙන් පසු (සුඩානයට හා ඇෆ්ගනිස්ථානයට) ඔහු පකිස්තානයේ වීරයෙකු විය. ඔසාමා විවෘතව ම කීවේ තම අරමුණ ''නිසාම් ඊ මුස්තාපා'' හෙවත් අල්ලාගේ පාලනය දකුණු ආසියාවට ගෙන ඒම බව ය. තලේබාන් ප්‍රකාශයක දැක්වුණේ ''අපි රුසියාව කැබලිකර දැමුවෙමු. දැන් අපි ඉන්දියාව බිඳ වැටෙනු දකින්නෙමු. අනාගතයේ ජිහාද් ගිනි දළුවලින් ඇමෙරිකාව දැවෙනු ඇත.'' කියා ය.

1999 දී උතුරු දිග සන්ධානයෙන් බාමියන් ප්‍රදේශ මුදාගැනීමෙන් පසු අල්කයිදා හා තලේබාන්වරු ඇෆ්ගනිස්ථානයේ 90% ක් ''අල්ලා'' ගැනීමට සමත් වූහ. කුරානයට අනුව ඔවුන් බාමියන් පිළිම පුපුරුවා හැරි අතර,

එහි එක් අරමුණක් වුණේ ලෝක මාධ්‍ය අවධානය යි. ඉන්පසු ඔසාමා සිය 55 බ්‍රිගේඩයට අයත් කොමොන්ඩෝවරුන් 200 ක් කාශ්මීරයේ කාගිල්වලට යැවීය. මෙය මුෂ්රෆ් හමුදාපතිගේ ආශිර්වාදය ඇතිව එහෙත් අගමැති ෂරිෆ් නොදැන කළ ක්‍රියාවක් විය. කාගිල් සටන ඇවිළ ගිය අතර ඉන්දියාව හා පකිස්තානය යුද්ධයකට සූදානම් විය. යුද්ධය වැලකුණද පකිස්තානය හමුදා පාලනයකට ගොදුරු විය. (කොට් සංවිධානය තලේබාන් අත්දැකීම අනුව නොනවතින රැල්ල III කළේ ඉන්දු - පකිස්තානු යුද්ධයක් ඇතිවී කලාපය අස්ථාවර වන අතරේ යාපනය අල්ලා ගැනීමේ අදිටනකි.)

අල්කයිදා බංගලිදේශයේ ද ක්‍රියාත්මක වේ. එහි මූලික සංවිධානය හර්කාට් අල් ජිහාද් අල් ඉස්ලාම් (HUJI) ය. එහි නායකයා අබ්දුල් සලාම් මොහොමඩ් වන අතර, ඔහු ඔසාමා සමඟ 1998 ලෝක ඉස්ලාමීය පෙරමුණේ කට්ටාවට අත්සන් තැබුවේ ය. 2002 බංගලිදේශ මැතිවරණයේ දී මධ්‍යස්ථ ආවාමි ලීගය පරදවා ඉන්දීය විරෝධී මූලධර්මවාදීන් ද සිටින සන්ධානයට විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබීමට ඔවුහු ක්‍රියාකලෝ ය. බිල් ක්ලින්ටන්ගේ බංගලි සංචාරයේ දී ඔහු ඝාතනය කිරීමටත් අල්කයිදා කුමන්ත්‍රණය කළේ ය.

අන්තිමේදී ජෝර්ජ් බුෂ් ගුවන් ප්‍රහාර ඇරඹීය. 2001 නොවැම්බර් මස දැවැන්ත ප්‍රහාරයක් එල්ල විය. එ. ජනපදය ආඩම්බරයෙන් කීවේ අල්කයිදාහි ඉහළ ම නායකයින් 25 දෙනාගෙන් 16 දෙනෙක් ද, තලේබාන් ඉහළ ම නායකයින් 27 දෙනාගෙන් 21 දෙනෙක් ද මිය ගිය බවය. පකිස්තාන ජනාධිපති මුෂාරෆ් පවා කීවේ ඔසාමා බින්ලාදන්, අල් ස්වාහිරි, මොහොමඩ් අතීජ්, අල් සුබයිදා ආදී සියල්ලන් මිය ගිය බව ය.

අන්තිමේ දී වැරදීමකින් පකිස්තාන හා එ. ජනපද බලධාරීන් පෙෂාවර් නගරයේ දී 2002 මාර්තු 28 දා අබු සුබයිදා ඇත්ත්ට ම අත්අඩංගුවට ගත් විට පෙනීගියේ ඔසාමා එ. ජනපදයේ අධි තාක්ෂණික ඇස් වසා ගැළැවී ගොස් ඇති බව ය.

ඔසාමා 9/11 සිදුවීමෙන් පසුව ද ඇෆ්ගනිස්තානයේ රැඳී සිටියේ ය. ඔහු අවසන් වරට ප්‍රසිද්ධියේ මාධ්‍ය හා ජනතාව ඇමතූයේ 2001 නොවැම්බර් 10 දා කන්දහාර් වලදී ය. ඔහු එතැනින් ජලාලාබාද් කරා ගියේ ය. නොවැම්බර් 29 දා ඔහු ජලාලාබාද්වල සිට ඇත. ඉන්පසු පර්ච්වලට පැමිණ ඇත. එය පකිස්තානු සීමාවේ තිබූ ගෝත්‍රික ගමකි. දෙසැම්බර් 09වැනිදා එ. ජනපද ඔත්තු සේවාවල අධිතාක්ෂණික උපකරණවලට ටෝරාබෝරාහි සිය සෙබළුන්

දිරිගන්වන බින්ලාදන්ගේ හඬ ඇසේ. ටෝරාබෝරා කඳුකර ගල් ගුහා හා උමං පද්ධතියට දැවැන්ත ප්‍රහාරයක් එල්ල වේ. අල්කයිදාහි සිරවී සිටි පිරිස් එ. ජනපද හමුදාවලය භාරවෙති. නමුත් ඔසාමා හෝ අල් ස්වාහිරි හෝ එහි නැත! පසුව ඔවුන් හෙළිකරගත්තේ ඔසාමාගේ පටිගත කරන ලද කටහඬ ට්‍රාන්ස්මිටරවලට කවා තිබුණු බවයි. ඔසමා වෙනුවෙන් ම විශේෂයෙන් නිර්මාණය කරන ලද ස්මාර්ට් බෝම්බ, විකිරණ ඡායාරූපවල ඉලක්කවලට අතහැර ඇත්තේ ඒ පටිගත කරන ලද කටහඬ ඔස්සේ ය. ඒවන විට ඔසාමා සිය අසුපිටින් තවත් 28 දෙනෙකු සමඟ පකිස්තානයේ පරාචිනර් ප්‍රදේශයට පැමිණ සිටියේ ය. ඉන්පසු ඔවුන් තලේබාන් මඟපෙන්වන්නෙකු සමඟ වරක් පකිස්තානයට ද, වරක් ඇෆ්ගනිස්ථානයට ද අයත් ප්‍රදේශවලට එමින් සිග්සැග් ගමනක යෙදෙමින් ශාහිකොට්හි කඳුකර ගල්ගුහා ප්‍රදේශයට පැමිණියහ. මේ මුළු දින කිහිපය තුළ ම ඔසාමා තනිව ම සිය අසු පැදවූයේ ය. ඔහුගේ ප්‍රියතම විනෝදාංශය වූයේ අසුන් පිට යෑම ය. ශිහිකොට්හි දී ඔහුට තලේබාන් සෙබළුන් හමුවේ. පකිස්තානයේ මායිදාන් ප්‍රදේශය බලා යෑමට ප්‍රථම ඔවුන් අමතන ඔහු මෙසේ කියයි. ''එකිනෙකාට අවංකවන්න. නායකයාට හා අණදෙන්නාට කීකරු වන්න. දිරිය කිසිවිටෙක බිඳ දමා නොගන්න. තුවාල ලැබූ සොයුරන් රැකගන්න. සියල්ලට ඉහළින් දෙවියන් විශ්වාස කරන්න. නිසැකව ම දෙවියන් අන්තිම දිනයේ දී ඔබට ප්‍රශංසා ගෙන එනු ඇත..''

## අල්කයිදා හා එල්.ටී.ටී.ඊ සබඳතා

ශ්‍රී ලංකා අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ජපානයේ සිදු කළ සංචාරකදී (2002 දෙසැම්බර්) මාධ්‍යවේදියෙක් ඔහුගෙන් අපූරු ප්‍රශ්නයක් ඇසුවේ ය. එනම් ඔසාමා බින්ලාදන්ගේ අල්කයිදාව හා එල්.ටී.ටී.ඊ ය අතර කුමන ආකාරයක හෝ සබඳතා ඇත් ද කියා යා. ඒ වන විට කොටි සංවිධානය සමඟ පෙමින් වෙළී සිටි අගමැති රනිල් ගත්කටට ම කීවේ එවැනි සබඳතාවක් ගැන තමන් නොදන්නා බව ය.! නමුත් එ. ජනපදය, ඉන්දියාව හා බ්‍රිතාන්‍යයේ ඔත්තු සේවාවන් ඒවනවිටත් සොයාගෙන තිබුණේ අල්කයිදා හා එල්.ටී.ටී.ඊ ය අතර උපක්‍රමික සබඳතාවක් පැවතුණ බව ය. දෙපිරිසේ දේශපාලන ඉලක්ක වෙනස්වුවත්, ඇතැම් විට එකිනෙකට පටහැනි වුවත් (ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අයිතිය පිළිබඳ ව) ඔවුනොවුන් අතර මනා සබඳතාවයක් තිබුණ බව ඔප්පු වී ඇත. මෙය ශ්‍රී ලාංකිකයෙකු හා ජාත්‍යන්තර ත්‍රස්තවාදය පිළිබඳ විශේෂඥයෙකු වන ආචාර්ය රොහාන් ගුණරත්න විසින් ද මනාව එළිදරව් කර ඇති තත්ත්වය

කි. ඒ අනුව පහත සඳහන් සාක්කි කොටි - ඔවු සන්ධානය පිළිබඳව ඔප්පු වී ඇත.

01. කොටි සංවිධානය 1990 දී පිලිපීනය තුළ සංවිධානයක් ඇති කළේය. එහි අරමුණ වූයේ අවි මිලදී ගැනීමත්, කැනඩාවට නීති විරෝධී ලෙස පුද්ගලයින් රැගෙන යාමත් ය. කැනඩාවෙන් එ.ජනපදයට නීති විරෝධී සංක්‍රමණිකයන් රැගෙන ගිය ප්‍රධාන ම කණ්ඩායම ද එල්.ටී.ටී.ඊ ය. මේ සියළු ක්‍රියා මෙහෙයවූයේ සුරේන්ද්‍රන් පොන්නයියා විසිනි. ඔහු මැනිලාවලදී මෝරෝ ඉස්ලාමීය විමුක්ති පෙරමුන (MILF) සහ අබුසායිප් කණ්ඩායම සමඟ සබඳතා ඇතිකර ගත්තේ ය. අල්කයිදාවට ද සබඳතා තිබුණේ හරියට ම ඔවුන් සමඟය. එහි ජාලය ඒ වකවානුවේ (1991-93) මෙහෙය වූයේ රම්සි අහමඩ් යූසුප් විසිනි. 1993 නිව්යෝර්ක් ලොක් වෙළඳ මධ්‍යස්ථානයට ප්‍රහාරයක් එල්ල කිරීමෙන් පසු රම්සි පලා ආවේ පිලිපීනයට ය. ඉන්පසු ඔහු 1994 දී ඔප්ලාන් බොජින්කා හෙවත් එ. ජනපදයට අයත් ගුවන්යානා 11 ක් පැසිපික් සාගරයට ඉහළින් පුපුරුවා හැරීමට සැලසුම් කළේය. එ. ජනපද ජනාධිපති බිල් ක්ලින්ටන්, ජුවාම් පාවුළු පාප්තුමා වැනි ලෝක නායකයින් පිලිපීනයේ දී ඝාතනයට සැපසුම් කළේ ය. එ.ජනපද ඔත්තු සේවා ඔහු හඹා එන විට ඔහුට රැකවරණය ලැබුණේත්, ඔහු පසුව පලාගියේත් කොටි සංවිධානයේ සරණින් බව පසුව ඔහු ම පාපොච්චාරණය කර ඇත. පිලිපීනය තුළ ක්‍රියාත්මක වූ අල්කයිදා ජාලයට අවශ්‍ය ව්‍යාජ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් ලබාදී ඇත්තේ කොටි සංවිධානය යි.

02. 1990 දශකය තුළ ඇෆ්ගනිස්ථානයේ අල්කයිදා කඳවුරුවල සටන පුහුණුව ලැබූවන් අතර මුස්ලිම් ආසියාතිකයන්ට අමතරව දෙමළ කොටි සාමාජිකයන් ද සිට ඇත. අඩු ම තරමින් 10-15 අතර කොටි සාමාජිකයන් පිරිසක් ඇෆ්ගනිස්තානයේ ශිනුවාරි කඳවුරේ බර අවි පුහුණුව ලබා ඇත. මෙකී පුහුණුව පිළිබඳ ව ඇෆ්ගනිස්තානයේ කටයුතු කළ බ්‍රිතාන්‍යය විශේෂඥයින් ද පකිස්තාන ඔත්තු සේවය ද, ඉන්දියානු ආරක්‍ෂක අංශ අතට යටත් වූ කාශ්මීර කැරලිකරුවෙක් ද වෙන වෙන ම වාර්තා තබා ඇත. මෙකී පුහුණු සැසි සඳහා සහභාගිවූවෙක් ලෙස වී. මනෝහරන් හඳුනාගෙන ඇත. ඔහු දැන් පැරිසියේ සිටී. ඔහු 1985 මාර්තු 25 දා ඉතාලියේ දී මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් දඬුවම් ලැබූවෙකි. (මත්ද්‍රව්‍ය

ප්‍රවාහනය කොටින්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන අතර ප්‍රසිද්ධියේ ඔවුන් එය විවේචනය කිරීමට වග බලා ගනිති.)

03. මෙයට අමතරව කොටි සංවිධානය මොරෝ ගරිල්ලන්ට (පිලිපීනය) හා අල් උම්මා කල්ලිය (තමිල්නාඩුව) සඳහා පුහුණුවීම් හා පුපුරණ ද්‍රව්‍ය තාක්ෂණය ලබා දී ඇත. මේ සඳහා ගෙවීම් කරඇත්තේ අල්කයිදාව යි.

04. කොටින් සතු ශක්තිමත් නාවික ජාලය යොදාගෙන අල්කයිදා සඳහා ද අවි ප්‍රවාහණය කර තිබේ. අල්කයිදාවට අනුබද්ධ හරාකටුල් අන්සාර් කල්ලිය විසින් කරච්චියේ සිට පිලිපීනය දක්වා අවි ප්‍රවාහනය කොටි නාවික ජාලය මගින් සිදු කර තිබේ. අවි ලබාගෙන ඇත්තේ අබුසායිෆ් කල්ලිය ය. තවත් අවස්ථාවක කරච්චියේ සිට තුර්කිය දක්වා අවි තොග කොටි නාවික ජාලය විසින් රැගෙන ගොස් ඇත. ඒවා ලබා දී ඇත්තේ වෙව්නියාවේ අල් අන්සාර් කල්ලියට ය.

05. අල්කයිදාවේ මරාගෙන මැරෙන ත්‍රස්තවාදී තාක්ෂණය වර්ධනය කිරීම සඳහා ද කොටි සංවිධානය උපකාරී වී ඇත. ප්‍රායෝගිකව ක්‍රියාවේ නොයෙදුවත් කොටි 1990 ගණන්වල සිට ප්‍රංශය, ඕස්ට්‍රේලියාව ආදී රටවලින් සැහැල්ලු ගුවන්යානා මිලදී ගනිමින් මරාගෙන මැරෙන ගුවන් ප්‍රහාර සැලසුම් කලෝ ය. 2001 ජුලි කටුනායක ප්‍රහාරයට පැමිණි කොටි ත්‍රස්තයින් 21 දෙනා අතර ගුවන් නියමු පුහුණුව ලැබූ ත්‍රස්තයින් දෙදෙනෙක් ද වූහ. ඔවුන්ගේ ඉලක්කය වුණේ ගුවන් යානා දෙකක් පැහැරගෙන ගොස් ජනාධිපති මන්දිරයට පහර දීමට ය. කාලයක් තිස්සේ කොටින් සතුව තිබූ මේ මරාගෙන මැරෙන ගුවන් ප්‍රහාර පිළිබඳ සංකල්පය අති දක්ෂ ලෙස අල්කයිදා විසින් නිව්යෝර්ක් ප්‍රහාරවලදී යොදා ගන්නා ලදී.

කොටි සංවිධානය විසින් 1991 මැයි මසදී ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් ''අභීත නැව'' මරාගෙන මැරෙන ''ඩිංගි බෝට්ටු'' ප්‍රහාරයකින් ගිල්ලවා දමන ලදී. එයට හරියට ම සමාන ආකාරයකට අල්කයිදාව විසින් ඒඩන්හිදී Usscole විනාශ කරන ලදී. පසු ව මුහුදු කොටි නායක සූසෙයි BBC සේවයට ප්‍රකාශ කර තිබුණේ (2002 දෙසැම්බර්) තමන්ගේ ප්‍රහාරක උපක්‍රම අල්කයිදාව විසින් ''කොපි කරන'' බව ය. නමුත් විදේශ විශේෂඥයින්ගේ මතය නම් මිසයිල

හා රොකට් වැනි බර අවි සඳහා කොටින්ට ඇෆ්ගනිස්තානයේ දී පුහුණුව දීමට සමගාමීව අල්කයිදා සාමාජිකයින්ට මුලතිව් හා වාකරේහි මුහුදු කොටි කඳවුරුවල පුහුණුව ලැබී ඇති බව ය. පලස්තීනය තුළ ක්‍රියාත්මක වූ මරාගෙන මැරෙන ප්‍රහාර රැල්ල සඳහා තාක්ෂණික නවීනත්වය කොටින්ගෙන් ලබා ගැනුණු බවට සැක කෙරේ.

06. ධර්මලිංගම් ෂන්මුගන් කුමාරන් නොහොත් කුමාරන් පත්මනාදන් (KP) හෙවත් කොටින්ගේ විදේශ අවි මිලදී ගැනීම හා සබඳතා ජාලයේ ප්‍රධානියා 2001 මැයි මස ඇෆ්ගනිස්තානයට ගොස් ඇත. එහිදී ඔහු භාවිතා කර ඇති ව්‍යාජ නාමය වෙන්කට් රාමන්ය. මෙය අල්කයිදා-එල්.ටී.ටී.ඊ සබඳතා පිළිබඳව වැදගත් සාක්කිය කි.

මේ තොරතුරු සියල්ල ම හා මෙයටත් වඩා තොරතුරු ප්‍රමාණයක් කොටි - ඔටු ත්‍රස්තවාදී සබඳතා ගැන එ. ජනපදය සතු බව පැහැදිලි ය. මේ නිසා 9/11 සිදුවීමෙන් පසු කැනඩාව, ඕස්ට්‍රේලියාව ආදී රටවල් කොටි තහනම් කරන ලද අතර, එක්සත් යුරෝපය ඒ සඳහා සූදානමින් සිටියේ ය.කොටින්ගේ විදේශ මුදල් බිලියන 4ක් මෙමගින් ඇහිරී ගිය බව The London Economist (20.07.2002) වාර්තා කළේ ය. කොටි ඊනියා සාම සාකච්ඡා සඳහා පැමිණීමට එයත් තීරක හේතුවක් වූ බව පැහැදිලි ය. අනෙක් අතින් එ. ජනපදය සිය යක්ෂ අක්ෂයට (Axis of Evils) කොටි සංවිධානය ඇතුළත් කර නැත. කොටි සම්බන්ධයෙන් ඉතා ම මුදු ප්‍රතිපත්තියක් එ. ජනපදය ගෙන යයි. ඒ ඇයි?

මෙයට ඉඟියක් ගඩාපිගෙන් ලැබී ඇත. 1980 ගණන්වල එ. ජනපදයේ මූලික යක්ෂයා වූයේ ඉරාකය, ඉරානය, උ. කොරියාව හෝ ඔසාමා නොව ලිබියාව හා ගඩාපිය. දැන් ගඩාපි පිළිබඳව මෙන් ම ඔසාමා සැඟවී ඇතැයි විශ්වාස කරන යේමනය සම්බන්ධයෙන් ද එ. ජනපදය අනුගමනය කරන්නේ ඉතා ම මුදු පිළිවෙතකි. ඒ ඇයි? එයට පිළිතුර ගඩාපි ම දී ඇත. (2003.01.20 News week) එනම්, අල්කයිදා වැනසීම සඳහා අවශ්‍ය ඔත්තු ගඩාපි විසින් එ. ජනපදයට හා බ්‍රිතාන්‍යයට ලබා දී ඇත. යේමනයට අයත් අවි නැවක් ඉන්දියානු සාගරයේ දී අතට ම හසුවීත් (2002 දෙසැ.) එය එ. ජනපදය විසින් මුදාහැරියේ යේමනය ද ඔසාමා පිළිබඳ ඔත්තු ලබා දීම නිසා ය. ඉතින් කොටි සංවිධානයත් තම පැරණි සටන් සගයා පාවා දෙමින් සිටී ද? විශේෂයෙන් මැලේසියාව හා පිලිපීනයේ අල්කයිදා ජාලයෙන්

හෙළිදරව් කිරීමට කොටි සංවිධානයේ තොරතුරු ද ඉවහල් වී ඇති බව ඇතැම් විශේෂඥයින්ගේ මතය යි. කොටි සංවිධානය විවෘතව ම එ. ජනපදයට අභියෝග කරද්දිත් එ. ජනපදය ගඩාෆි මෙන් ම ප්‍රභාකරන් පිළිබඳව ද මුදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ ඒ නිසා ද?

### හයවන පරිච්ඡේදය

## ලංකාවේ මුසුල්මාණුවෝ

1976 ජුනි 14 දා ලාංකික දෙමළ සමාජයට තීරණාත්මක් දවසක් විය. එදිනි දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ සම්මේලනය වඩුක්කොඩෙහි පවත්වන ලදී. වඩුක්කොඩේ සම්මුතිය නමින් ප්‍රචලිත ස්වෛරී ස්වාධීන සමාජවාදී දෙමළ ඊළාම් රාජ්‍යයක් පිහිටුවීම සඳහා වූ යෝජනාව සම්මත වූයේ එදා ය. (නමුත් දෙමළ බෙදුම්වාදයට එයට වඩා දිගු ඉතිහාසයක් තිබිණි.) යාපනයේ විශ්ව විද්‍යාලයේ උන්මාදනීය සටන් පාඨවලින් අලංකාර වුණු වඩුක්කොඩේ සම්මුතිය ඉන්පසු ජීවිත 60,000 ක් බිළිගත් යුද ගැටුමක් විය.

2003 ජනවාරි 29 දා ඇතැම් විට ලාංකීය මුස්ලිම් සමාජයේ එවැනි ම ඉරණම් දවස විය හැකි ය. ඔලුවිල් සම්මුතිය දහස් ගණනක් මුස්ලිම්වරු "අල්ලාහු අක්බාර්" කියත් දී බිහිවුණේ එදා ය. එයට නායකත්වය දෙන්නේ ඉස්ලාම් මූලධර්මවාදයේ ගිනිසිළුව බවට පත් ව ඇති අග්නිදිග විශ්ව විද්‍යාලය ය. එමගින් මුස්ලිම්වරු ලංකාවේ වෙන ම ජාතියක් බවත් ඔවුන්ට ඓතිහාසික නිජබිමක් ඇති බවත්, එහි ඔවුන්ට වෙනම ස්වයං පාලනයක් අවශ්‍ය බවත් ප්‍රකාශ කරනු ලැබී ය. මෙය කෙළවර වන්නේ ජීවිත කීයක අවසානයෙන් ද?

අපි දැන් බොහෝ කලක සිට ගොඩනගන මුස්ලිම් මූලධර්මවාදයේ ඓතිහාසික විවරණය කුමක් දැයි සොයා බලමු.

''ඉතිහාසයට පෙර (මහමත්තුමාට පෙර කාලය) යුගයේ සිට අරාබිවරු අප ලංකාව සමඟ සබඳතා පැවැත් වූහ. ලාබෙට මිලදී ගත හැකි භාණ්ඩ හා ආදී පීතෘ වූ ආදම් (අලෙයි) තුමාගේ පිය සටහන පතිත වී ඇති කන්ද (ශ්‍රී පාදය) ආදිය අරාබිවරුන්ගේ අවධානය ලංකාව වෙත ඇද ගැනීමට හේතු වී ඇත. (ඒ යුගයේදීම - 6 වන සියවසට පෙර යුගය) බේරුවල, පුත්තලම වැනි වෙරළබඩ ප්‍රදේශවල නැගෙනහිර ලංකාවේ ද අරාබිවරු පදිංචි වූහ. එවකට පැවති දෙමළ-සිංහල ''කුඩා රාජ්‍යවල'' පාලකයෝ ද මොවුන්ගේ පැමිණීමට සහ ජීවත්වීමට සහයෝගය දුන්හ. තම සතුරන්ගෙන් (සිංහල) නිතර පැමිණි කරදරවලින් ස්ථිර ආරක්ෂාව සලස්වා ගැනීම දෙමළ ජනතාව ව්‍යාපාරික අරමුණින් පැමිණි අරාබිවරුන්ගේ සහාය උපයෝග කර ගත්හ. මෙයට තිලිණ වශයෙන් තරුණ කාන්තාවන් ඔවුන්ට සරණ පාවා දුන්හ. මේ අනුව මුස්ලිම් පරම්පරාව (මවු පාර්ශව) ඇති වූ බව මට්ටක්කළප්පු මාන්මියම් වැනි ග්‍රන්ථවලින් දැනගත හැකි වන්නේ ය....''

''සයින්ද මරුදූ මුස්ලිම් දේවස්ථානයේ පෞරාණිකත්වයට සාධකයක් වශයෙන් ක්‍රි.ව. 1691 පෙබරවාරි 5 වන දින ලියවුණු තඹ තහඩුවක් ඇත. මුස්ලිම් ජනපද ඒ වන විටත් එහි තිබුණ බව මෙයින් තහවුරු වේ. ඒ සමඟම සද්ධාතිස්ස රජුගේ කාලයේ ද මෙම ජනපද තිබුණ බවට සාධක ඇත....''

(නැගෙනහිර මුස්ලිම් ජනපද හා ව්‍යාප්තිය - මන්සූර් ඒ. කාදර් - අම්පාර මුස්ලිම් උරුමය පිට 21-24)

'' ශ්‍රී ලංකාවේ ජල හා ගොඩබිම් සම්පත් ඇතුළුව ආර්ථික පහසුකම් සමඟ ව්‍යාප්ත වූ බිම් පෙදෙසක් අයත්කර ගනිමින් අනන්‍යතාවයක් සහිත ජනතාවක් වශයෙන් අම්පාර මුස්ලිම්වරු ජීවත් වෙති. කෙතරම් ප්‍රශ්න ඇති වුව ද මෙම ජනතාව තම හැකියාවෙන් හා ස්වෝත්සාහයෙන් වැඩි ජනගහනයකින් සමන්විත වේ. කුමන පරිසරයක වුව ද තමාට අයිති බිම් අහිමිවීමට අකමැති මේ ''භූමිපුත්‍රයින්'' මුස්ලිම් සමාජ විනය තේරුම් ගෙන කල් ගෙවන නිසා ඉන්දියානු ජාතිවාදියෙකු වන රහුමාන් අලි චෞද්රි නැමැත්තා ''මෙම ජනතාව ඉන්දීය මුස්ලිම් සමාජයේ එක් අංගයක් ලෙස සැලකිය යුතු යැයි'' ප්‍රකාශ කර ඇත.

''අම්පාර දිස්ත්‍රික්කයේ (මුස්ලිම්වරු) දෙමළ හා සිංහල ජනතාව ඇලී හෝ යාකර එකතු කර නොහැකි පරිදි මෑත කාලයේ මායිම් කරනු

ලැබේ. උතුරට මරදමුනේ, දකුණට පොතුවිල්, බස්නාහිරට අම්පාර නගරය හා නැගෙනහිරට මුහුද සහිත මේ කලාපය අග්ගිදිග මුස්ලිම් ලෙස නම් කරනු ලැබේ.''

''පානම, තිරුක්කෝවිල්, කෝමාරි, කාරයිතිවු, කල්ලාරු, කල්මුනේ, මඩකලපුව වැනි වරාය පිළිබඳව අරාබිවරු දැන සිටියහ. මෙම වරාය පිළිබඳ ව තොරතුරු තොලමිට ලබාදෙන ලද්දේ අරාබිවරුන් විසින් ය. අරාබි මුතුන්මිත්තන් නැගෙනහිර වරායවල් සමග පැවැත් වූ පෞරාණික සබඳතාවය මෙයින් පැහැදිලි වේ.....''

''මඩකලපුව වෙරළබඩ ප්‍රදේශ සියල්ල ම පාලනය කළ බව කිව හැකි කිසි ම රජෙක් (සිංහල) සිටියේ නැත. වන්නියාර්වරු පවා එක්තරා බලයකට (සිංහල රාජ්‍යයේ ) යටත්ව බදු ගෙවාගෙන ආවෝ ය. එහෙත් මඩකලපුවේ දෙමළ කතාකරන ජනයා (එවැන් කිසි බලයකට යට නොවී) පුරාණයේ සිටම එහි පදිංචි ව සිටියෝ ය. මඩකලපුවේ සෞන්දර්ය හා ආකර්ෂණය දකුණු මදුරෙයි මුක්කුවර්වරුන්ගේ සිත ඇද ගත්තේ ය.''

''කවරෙකු කුමක් කීවත් 13 වැනි 14 වැනි ශතවර්ෂවල මුස්ලිම්වරුන් ගොවියන් වශයෙන් පදිංචිව ජීවත් වූ බවට 'නාඩු කාඩුප් පට්රු' ශිලා ලේඛන සාක්ෂිය''.

''මහනුවර රජු විසින් මුස්ලිම්වරුන් පදිංචි කිරීම නිසා නැගෙනහිර මුස්ලිම් ඉතිහාසය ආරම්භ වන්නේ'' යනුවෙන් සඳහන් කිරීම සැබෑ ඉතිහාසය වසන් කිරීමකි .....

(මුස්ලිම් ඓතිහාසික පරම්පරාව - එම්. එල්. ඒ. කාදර් - අම්පාර මුස්ලිම් උරුමය පිටු -1-4-8-11-13)

ඉහත ප්‍රකාශයන් උපුටා ගත්තේ 1997 දී අඩ්ඩාලනයේ පැවැත් වූ ජාතික මිලාද් නබි උළෙල නිමිත්තෙන් පළ කරන ලද අම්පාර මුස්ලිම් නම් ග්‍රන්ථයෙනි. මෙය ආණ්ඩුවේ අරමුදල් වලින් මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් එවකට ඇමති වූ ඒ. එච්. එම්. අෂ්රෆ් මහතාගේ නියෝගයෙන් පළ කරන ලද්දකි. පසු ව රටේ සෙසු දිස්ත්‍රික්කවල මුස්ලිම් උරුමය පිළිබඳව ද පොත් නිකුත් කරන ලදී.

මේ කෘතීන් මගින් පැහැදිලි කිරීමට ඔවුන් උත්සාහ ගන්නේ ලංකාවේ මුස්ලිම් ඉතිහාසය ක්‍රි.පූ. යුගයට (2 වැනි සියවස- සද්ධාතිස්ස) යන බව ය. එයට ද බොහෝ පෙර කලක සිට අරාබි මුතුන් මිත්තන් ලංකාව සමඟ වෙළෙඳ සබඳතා පැවැත් වූ බව ය. ශ්‍රී පාදය ඔවුන්ගේ ශුද්ධ වන්දනා ස්ථානයක් බව ය.

දෙමළ ජනවර්ගවාදය ද පටන් ගත්තේ සයිමන් කාසිචෙට්ටි - සී රාසනායගම් හා පූජක ඥානප්‍රගාසර් විසින් සිදුකළ විකෘති හා අසත්‍ය ඉතිහාස වාර්තා වලිනි. පසු ව ඒවා කරුණු ලෙස සාවද්‍ය බව පෙනී ගිය ද ඒ මත ගොඩනැගුණු දෙමළ ඊළාම් අරගලය නතර වූයේ නැත. මේ නිසා මුස්ලිම් කොන්ග්‍රසයේ මූලධර්මවාදී න්‍යායාචාර්යවරුන් අද ඉතිහාසය පිළිබඳ ව වපුරන අසත්‍යය මත දැනටමත් මුස්ලිම් තරුණ සිත්වල බොහෝ සේ සටහන් වී ඇත. අෂ්රෆ් විසින් අරඹන ලද අග්ගිදිග විශ්ව විද්‍යාලයේ ඉස්ලාමීය සහෝදරත්වයේ ලිපි ලේඛන පිහිටුවා ඇති මුස්ලිම් කෞතුකාගාරය හා ක්‍රියා මාර්ගයෙන් ද රට පුරා ඇති ඉස්ලාමීය ජාත්‍යන්තර (අරාබි) විශ්ව විද්‍යාල, පාසල් හා මද්රාෂා ආගමික මූලධර්මවාදී පාසල් වල ''ලංකා ඉතිහාසය'' පිළිබඳ විෂය නිර්දේශ දෙස බැලීමේදී පෙනී යන්නේ ද ලංකාවේ මුස්ලිම් ඉතිහාසය පිළිබඳ බොහෝ දීර්ඝ කතාවක් දැන් ගොඩ නගා අවසන් වී ඇති බව ය.

### ඇත්තෙන්ම ලංකාවේ මුස්ලිම් ඉතිහාසය කුමක් ද?

ලංකාවේ භූගෝලීය පිහිටීමේ වූ විශිෂ්ඨත්වය නිසා එහි ඉතිහාසයේ මුල් යුගයේ සිටම වෙළෙඳ කණ්ඩායම්වලට විවෘත විය. ජම්බකෝළ පටුන (යාපනය) මාන්තොට (මන්නාරම), ගෝකණ්ණ (ත්‍රිකුණාමලය) හා පුලියන්දූව (මඩකලපුව) වැනි වෙළෙඳ මධ්‍යස්ථානවලින් සමහරකි. චීනයේ සිට මැදපෙරදිගටත් යුරෝපයටත් තිබූ සේද මාවතේ මුතු ඇටය ලෙස ලංකාව පැවතුණ නිසා විවිධ වෙළෙන්දෝ මෙන්ම ආක්‍රමණිකයෝ මෙහි ආ ගිය හ. එයට එක් හේතුවක් වූයේ වසරේ විවිධ මෝසම්වල පැවති වෙළෙඳ සුළං හා සාගර ජල දහරා විසින් නැව් ස්වභාවිකවම රැගෙන යාම ය. වසර දෙදහසට පෙර රුවන්වැලිසෑයේ කොත නිරාවරණයේ දී ඈත පෙරදිග මෙන්ම අරාබි, බෞද්ධ රාජ්‍යවලින් බොහෝ දෙනා පැමිණිය හ. එවකට මුස්ලිම් ආගම බිහි වී නොතිබූ නිසා (මහමත් උපත ක්‍රි.ව. 570 දී සිදු වූ අතර ඉස්ලාමයේ උපත ක්‍රි.ව. 622 ලෙස සලකනු ලැබේ.) ඒ පැමිණි අරාබීන් වත්මන් මුස්ලිම්වරුන්ගේ මුතුන් මිත්තන් ලෙස සැලකිය නොහැක. ඔවුන් බොහෝවිට බෞද්ධයන් විය හැකි ය. අනෙක් අතින් ඔවුන් මෙහි ස්ථිර පදිංචිය ඇති කර ගත්බවට කිසිදු සාක්ෂියක් නැත.

ඉන්දියාවේ මුස්ලිම් ව්‍යාප්තියට මග පෑදුණේ අරාබීන් නිසා නොවන බව කලින් පරිච්ඡේදයක පැහැදිලි කර දී ඇත. එය සිදු කළේ මෝගල්වරුන් වන අතර එයිනුත් විශේෂයෙන් හින්දු-බෞද්ධ විරෝධයක සිට ඔරන්සීබ් යුගයේදී ය. අනෙක් අතින් දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය - චෝල හා පසු ව ඇති වූ විජයනගරය සමග ආවාහ විවාහ කර ගැනීමට තරම් මිත්‍රත්වයක් මුස්ලිම්වරුන්ට නොවී ය. පාණ්ඩයන් හා චෝලයන් සියවස් ගණනක් දකුණු ඉන්දියාවේ ආධිපත්‍ය සඳහා සටන් කළ අතර වරෙක පාණ්ඩයන් ද වරෙක චෝලයන් ද මේ ආධිපත්‍ය දැරූ හ. එහි ජයග්‍රාහකයා තේරීම සඳහා සිංහල රජතුමා ඉටුකළ කාර්යය තීරණාත්මක විය. මේ නිසා යාපනය තම දකුණු ආරක්ෂක කලාපය ලෙස අවසානයේ ජයග්‍රාහකයා වූ පාණ්ඩ්‍යයෝ තීරණය කළෝ ය. මේ නිසා ආර්ය චක්‍රවර්ති ප්‍රාදේශීය පාලනය යාපනයේ ඇතිවිය. එය පවා පසුව හයවැනි පරාක්‍රමබාහු - සපුමල් කුමරු සහයෝගයෙන් බිඳ දමනු ලැබීය. 19 වන සියවස තෙක් මඩකලපුවේ වේවා නැගෙනහිර කිසි ප්‍රදේශයක ස්ථිර දෙමළ ජනපද පැවති බව මුලාවකි. අනෙක් අතින් මෝගල් ව්‍යාප්තිය නිසා පාණ්ඩ්‍යයින් මෙන්ම පසුව ඇති වූ විජයනගර රාජධානිය ද සිටියේ මුසල්මානුවන් ආක්‍රමණියන් ය යන මතයේය. අන්තිමේදී මලික් කෆූර් විසින් විජයනගර් පරාජය කරන විට මුස්ලිම්වරුන්ට එරෙහිව විජය නගරයට පෘතුගීසින්ගෙන් පවා උපකාර ලැබෙමින් පැවතිණි. මේ නිසා ද්‍රවිඩ භාෂාවන් කතා කළ දකුණු ඉන්දීය ජනයා හා මුස්ලිම්වරුන් අතර මිත්‍රශීලී සබඳතාවයක් නොවීය. දකුණු ඉන්දිය මුක්කුවර් ආදි විවිධ ගෝත්‍ර පසුව ඉස්ලාමය වැළඳගත් ඒවා ය.

කෙසේ වෙතත් පෘතුගීසින් ලංකාවට පැමිණෙන 16 වැනි සියවසේ මුල් භාගයේ දි ලංකාව තුළ මුස්ලිම් වෙළෙඳුන් සිටිය හ. ඔවුන් ජාවා, සුමාත්‍රා හෝ ඉන්දියාවෙන් ද, සුළුතරයක් අග්නිදිග ආසියා ප්‍රදේශවලින් ද පැමිණි අය වූහ. එහි අරාබි මූලයන් ඇත්නම් ඇත්තේ ආගමික ප්‍රචාරයේ නියැලුණු අයගේ පමණි.

ලොරෙන්සෝද අල්මේදා ගෝවෙන් පිටත් වන්නේ අරාබියෙන් වැටී තිබූ නාවික මාර්ග ඔස්සේ මාලදිවයින හරහා අග්නිදිග ආසියාවට ගමන් ගත් මුස්ලිම් වෙළෙන්ඳන්ට පහර දීමේ සිත ඇතිව ය. ඔහුගේ අදිටන නිසැකවම ස්පාඤ්ඤයේ හා පෘතුගාලයේ මුස්ලිම්වරුන් සමූල ඝාතනය කළ කිතුනු වෛරයේ අදිටන ය. සිය මුස්ලිම් විරෝධි ප්‍රහාරය ජයගත්ත ද හෙම්බත් වන ඔහු ක්‍රි.ව. 1505 නොවැම්බර් 15 දා ලංකාවට ගොඩ බසී. ඔහු කෝට්ටේ රජු මුණ ගැසෙන විට එහි මුස්ලිම් වෙළෙන්දන් සිටි බව වාර්තා වී ඇත. කෝට්ටේ සිංහල රජු සමඟ මුස්ලිම් වෙළෙඳුන් හොඳ

ඇසුරක් පවත්වාගෙන ගිය බවට ද වාර්තා ඇත.

පෘතුගීසිහු ද උපක්‍රමයක් ලෙස සිය ආක්‍රමණික වේශය යටපත් කරගෙන වෙළෙඳාම පෙරදැරි කර ගත් හ. ඒ අනුව ඔවුන්ට කොළඹ වෙළෙඳ ගබඩාවකට ඉඩ කඩ ලැබිණි. ( ගෙරි හම් කඩ වපසරිය) මෙයින් පෘතුගීසින් හා මුස්ලිම්වරුන් අතර වෙළෙඳ තරඟය ඇති වූ නිසා ඒ සමඟම ඔවුනතර ආගමික වෛරය වැඩි දියුණු විය. මේ නිසා 1507 දී පෘතුගීසි වෙළෙඳ ගබඩා ඉවත් කෙරිණි. මෙය මුස්ලිම් ගතු කීමක් නිසා සිංහල රජු කළ ක්‍රියාවක් බව පෘතුගීසි මතය විය. එමර්සන් ටෙන්ට් ප්‍රකාශ කර ඇත්තේ ''ඒ යුගය (16 සියවස මුල) මුස්ලිම්වරු මුහුදු බලය අල්ලාගෙන ලංකාව තුළ වෙළෙඳ බලය තහවුරු කර ගැනීමට මාන බලමින් සිටි යුගය විය. ඒ යුගයේ දී පෘතුගීසින් නොආවා නම් ලංකාවත් (මලයාව හා ඉන්දුනීසියාව මෙන්) මුස්ලිම් වීමට බොහෝ විට ඉඩ තිබිණි''. මේ ප්‍රකාශයේ ඓතිහාසික අනුමානය කෙසේ වෙතත් එයින් හැඟී යන්නේ මුස්ලිම් වෙළෙඳාම ස්ථිර වශයෙන් ඇරඹෙන්නේ 15 වන සියවස අග හා 16 වැනි සියවස මුල බව ය. මෙය මලික් කෆුර්ගේ දකුණු ඉන්දීය ආක්‍රමණයට සමගාමී කාලයකි. මේ නිසා මුස්ලිම් වෙළෙඳ සබඳතා ලංකාවට දැනෙන සුළු තත්ත්වයට එන්නේ 15 වන සියවස අගදී බව නිගමනය කළ හැක. එයට පෙර මුස්ලිම් ඉතිහාසය ගැන කථා කරන කතා ආගමික මූලධර්මවාදීන්ගේ ප්‍රබන්ධයන් ය.

ප්‍රථම පෘතුගීසි මුස්ලිම් ගැටුම ඇති වන්නේ 1517 දීය. පෘතුගීසි සෙනෙවි අල්බර්ගේරියා මුස්ලිම් වෙළෙඳ වෙළඳ ගබඩාවකට පහර දීමෙන් එය සිදුවිය. මෙයට මැදිහත් වන කෝට්ටේ රජු (ධර්ම පරාක්‍රමබාහු) පෘතුගීසින් හා ගැටේ. එය සිංහල පෘතුගීසි ගැටුමක් බවට හැරේ. මෙයට පෘතුගීසින් කියන්නේ මුස්ලිම් ගතු කීම නිසා සිංහල රජු තමනට එරෙහි වූ බව ය. මුස්ලිම් ඉතිහාසවේදීන් කියන්නේ තමන් සිංහල රජුට පක්ෂ වීම නිසා පෘතුගීසි වෛරයට ලක් වූ බවයි.

මේ කාලයේ ඇති ලිඛිත සාක්ෂි පෙන්වා දෙන්නේ පෘතුගීසි යටත් ප්‍රදේශවල ජීවත් වූ මුස්ලිම් විදේශිකයින්ට පමණක සීමා වූ 'ඌලියම්' නම් බද්ද ගෙවූ බවයි. එයින් ද පෙනී යන්නේ ස්ථිර දේශීය මුස්ලිම් ජනවාස වෙරළ තීරයේ හෝ නොවූ බව ය.

කෙසේ වෙතත් සිය සම්ප්‍රදායික කතෝලික වෙළෙඳ සතුරන් වූ යුරෝපීය පෘතුගීසින් ට එරෙහිව මුස්ලිම්වරු උපක්‍රමයක් ලෙස සිංහල රජුන්ගේ පැත්ත ගත් බව පැහැදිලි ය. 1519 දී ඔවුහු සැමෝරියන් යටතේ පෘතුගීසි විරෝධී සටන්වලදී විජයබාහු රජුට සහාය ලබා දුන්හ.

පසුව විජයබාහු මුස්ලිම්වරු හා කිපේ. ''විජයබා කොල්ලයෙන්'' පසු මුස්ලිම්වරුන් මායාදුන්නේට එක් වෙති. පසු ව මායාදුන්නේ ද ඔවුන් හා ගැටේ.

පෘතුගීසින් 1526 දි තම ප්‍රදේශවලින් මුස්ලිම්වරුන් පිටුවහල් කිරීමේ නියෝගයක් කරති. එය 1529 හා 1597 වසරවල නැවත නැවතත් අලුත් කරනු ලැබේ. තාන්ජෝරායේ මුස්ලිම් කුමාරයෙකු ලෙස හඳුන්වා ගත් අයෙක් කෝට්ටේ ධර්මපාල රජුට මුළා කිරීමට යෑමේ ප්‍රතිඵලයක් ලෙස රජුගේ උදහසට පොදුවේ ඔවුහු ලක්වෙති. සුපුරුදු ලෙස ඔවුන් වෙනත් රජකු වෙත යන්නේ සීතාවක රාජසිංහ හමුවෙති. මුක්කුවාවරු ලෙස හඳුන්වන මොවුන් දකුණු ඉන්දීය ගෝත්‍රයකි. ඔවුන් පසුව ඉස්ලාම් ඇදහිල්ලට එක් වූ පිරිසකි. කල්පිටිය, පුත්තලම ප්‍රදේශය තුළ ඔවුන් ජනාවාස වන්නේ සීතාවක රාජසිංහ නිසා ය. මුක්කුවාර් වරු ඉස්ලාම් වීමට බල පෑ ප්‍රධාන හේතුවක් නම් මුස්ලිම් වෙළෙන්දෝ ඔවුන්ගේ කාන්තාවන් විවාහ කර ගැනීම ය. ආවාහ-විවාහයෙන් ඉස්ලාම්කරණය දකුණු ඉන්දියාවේ පමණක් නොව ජාවා හා සුමාත්‍රා වල ද, උතුරු අප්‍රිකාවේ ද යොදනු ලැබූ ආගමික උපක්‍රමයකි.

පෘතුගීසිහු 1628 දි වත්මන් මඩකලපු ප්‍රදේශ තුළ බලකොටුවක් තනති. එය ඒ දිනවල සඳහන් කරනු ලැබුයේ පුලියන්දූව නමිනි. මඩකලපුව යන සිංහල නම දෙමළකරණය වී මට්ටෙයි කලප්පුවන්නේ පෘතුගීසි යුගයේ ය.

ඉතා ම තීරණාත්මක ලෙස මුස්ලිම් විරෝධී ව ක්‍රියා කරන්නේ කොන්ස්ටන්ටයින් ද සා ය. 1626 දී ඔහු සහමුලින් ම මුස්ලිම්වරුන් පෘතුගීසි බලප්‍රදේශ වලින් පළවා හරී. හෙතෙම දැඩි ජේසුයිට් මූලධර්මවාදියෙකු වූයේ ගෝකණ්ණ විහාරය (ත්‍රිමලයේ) සහමුලින් විනාශ කළේ ය. පළවා හරින ලද ඇතැම් මුස්ලිම්වරු දකුණු ඉන්දියාවට ද, මාලදිවයිනට ද යති. මාලදිවයිනේ වාසය කළ සිංහලයින් (එය 1957 දක්වා ම සිංහලේ රාජධානියේ කොදෙව්වක් ලෙස සැළකිණ.) තීරණාත්මකව සහමුලින්ම ඉස්ලාම්කරණය වන්නේ එලෙස මහා පරිමාණයෙන් එක්වර පැමිණි මුස්ලිම් සංක්‍රමණිකයන් නිසා බව විශ්වාස කෙරේ. අදටත් මාලේ බස දිවෙහි සිංහලට හුරු වූවකි.

ක්වෙරෝස් පියතුමාට අනුව ද සා පිටමං කළ හාර දහසක් පමණ වූ මුස්ලිම් පිරිසක් කන්ද උඩරට සෙනරත් රජු හමුවීමෙන් පසු ඔහු ඔවුන් තම රාජධානියේ නැගෙනහිර හා අග්නිදිග ප්‍රදේශවල පදිංචි කරවයි. මඩකලපුව සිට පොතුවිල් දක්වා මුහුදුබඩ තීරයේ මුස්ලිම් ජනපද මේ නිසා

ඇතිවේ. මොවුන් ඊමට පෙර මඩකලපුවේ පැතිරී ගිය මුස්ලිම් ජනාවාස පිළිබඳ කතාව සාක්ෂ්‍ය වලින් තොර ප්‍රබන්ධයකි. නමුත් මඩකලපුව හා අවට වෙරළ තීරය පැරණි තොටුපළක් වූ නිසා මුස්ලිම් වෙළඳුන් එහි සිටීමට බොහෝ දුරට ඉඩ තිබිණි. පසුව තවත් පිරිස් එරාවූර් හා ත්‍රිමලයේ ද පදිංචියට ගියහ.

1656 මැයි 6 දා ලන්දේසීන් කොළඹ අල්ලා ගන්නා විට එහි එකදු මුස්ලිම් පවුලක් හෝ නොවී ය. 1658 දී ඔවුන් පෘතුගීසීන් වෙතින් යාපනය ද අල්ලා ගත්හ.

ලන්දේසීන් සිය රටේ නිදහස සඳහා (ඕලන්දය - හොලන්ඩ්) සටන්කළේ කතෝලික ස්පාඤ්ඤයට එරෙහිව ය. ඔවුන්ගේ නිල ආගම වූයේ ද පාප්තුමාට එරෙහිව නැගී සිටි රෙපරමාදු ක්‍රිස්තියානිය යි. මේ නිසා ලංකාවේ දී ඔවුන්ගේ ළඟ ම සතුරා වන්නේ බෞද්ධයන් හෝ ඉස්ලාම්වරුන් නොව කතෝලිකයන් ය. 1659 දී ලන්දේසීන් කතෝලික ආගම තහනම් කරති.එවිට කතෝලිකයන්ට සරණවන්නේ සිංහල පන්සල් හා කන්ද උඩරට රජ වූ දෙවැනි විමලධර්මසූරිය රජතුමා ය. ඉස්ලාම්වෑ අග්නිදිගට යැවූවා සේ කරුණාවෙන් කටයුතු කරන සිංහල බෞද්ධ රජු කතෝලිකයන් මාතලේ වහකෝට්ටේ යවයි. ජෝසප්වාස් පියතුමා විසින් රහසිගතව කතෝලික ආගම ව්‍යාප්ත කරන්නේ එය පදනමක් කරගෙන ය.

ලන්දේසි ආගමනයත් සමඟ කොළඹට යළිත් මුස්ලිම්වරු එති. 1662 වන විට යළි පැමිණි මුස්ලිම් පවුල් සිය ගණනක් කොළඹ සිටි බව වාර්තා වේ. මේ සංක්‍රමණ නිසා සුපුරුදු කුරුස යුද්ධය ඇරඹේ. මේ නිසා ලන්දේසීහු ද මුස්ලිම්වරුනට නීති පනවති. මෙහි ප්‍රධාන අංගයක් වන්නේ ලන්දේසි බලප්‍රදේශවල පල්ලි තැනීම හා ඉඩම් මිලදී ගැනීම තහනම් වීම යි. මෙයින් මුස්ලිම්වරු සංචාරක වෙළඳ බලවේගයක් බවට පත් වෙති.

ඊළඟ කාලය තුළ මුස්ලිම්වරු රට මැද ප්‍රදේශ මල්වාන, තිහාරිය, මාවනැල්ල, මහනුවර ආදී ප්‍රදේශවලට ව්‍යාප්ත වෙති. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසීන් සමඟ ගිවිසුමකට රාජසිංහ - ජ්ලැක් (1766) එන අතර, එමගින් නැගෙනහිර වෙරළ තීරය ලන්දේසි පාලනයකට නතුවේ. උතුරේ දුම්කොළ වගාවට ගෙන ආ දකුණු ඉන්දියානු දෙමළ ජනයා ඊසාන හා නැගෙනහිර වෙරළ තීරයේ පදිංචි කිරීම අරඹන්නේ ලන්දේසීන් ය. කීර්ති ශ්‍රී රාජසිංහ කන්ද උඩරට මුස්ලිම් ව්‍යාප්තියෙන් වකිතයට පත්වන්නේ ඔවුන්ගෙන් බදු අය කිරීම අරඹයි. (1746) පසු ව ඔවුනට එරෙහි ව වෙනත්

විවිධ නීති පනවයි. ලංකාවට මැලේ හා ජාවක ජනයා ගෙන ඒම ආරම්භ වන්නේ ද ලන්දේසි යුගයේදී ය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් නායක්කර් එනම් උපතින් සිංහල නොවන රාජ්‍යත්වය ඇරඹේ. ඔවුන් සිංහලත්වය වැළඳ ගත්ත ද ඇතැම් හින්දු සංස්කෘතික අංග තීරණාත්මකව සිංහල සමාජයට මුසු වේ. සංඝමිත්තා තෙරණියගේ කාලයේ සිට පැවති ශ්‍රමය හා රැකියා බෙදීම පිළිබඳව ශිල්ප ක්‍රමය ක්‍රමයෙන් කුල ක්‍රමය බවට පරිවර්තනය වේ. මෙයින් ඇති වන හීන කුල හැඟීම බුද්ධාගමට ද බලපෑ නිසා කොන්වන ජනයා වෙරළබඩ ක්‍රිස්තියානියටත් කඳුකරයේ ඉස්ලාමයටත් ඇදී යති. මෙය ඉන්දියාවේදී නම් (කුලහීනත්වය) ඉස්ලාම් ව්‍යාප්තියේ බලවත් ම පදනම විය. එහෙත් ලංකාවේදී එය සිදුවූයේ අල්ප ලෙස ය. වෙළඟගෙහේනේ කිරිඑතනා, කරීම් ඛාන් සමඟ විවාහ වී පස්සර විසූ බවත්, ඔවුන්ගේ දරුවාගේ නම මැණිකේ එතනා බවත් ඌවේ ආදායම් පාලකව සිටි ඉංග්‍රීසි ජාතික කාලි මහතා ප්‍රකාශ කරයි. මුස්ලිම් වෙළඳුන් හීන කුලවල සිංහල කාන්තාවන් විවාහ කරගැනීම සිදු වූ අතර, අද ද එය සිදුවේ. ජාතිය සිංහල හෝ දෙමළ වූ ආගම ඉස්ලාම් වූ 57,000 ක් (2012) ලංකාවේ වාසය කරති.

වසර 1796 පෙබරවාරි 15 දා ලන්දේසි ප්‍රදේශ ඉංග්‍රීසින්ට යටත් විය. මේ සඳහා මුස්ලිම් වෙළඳ ප්‍රජාවේ උපකාර කළ එළියේ ඉංග්‍රීසින්ට ලැබේ. ඉංග්‍රීසිහු මුස්ලිම්වරුන්ට සහනශීලී වන්නේ අනාගත සිංහල රාජධානිය යටත් කරගැනීමේ උපක්‍රමයක් ලෙස ය. මුස්ලිම්වරු ජන සමාජයක් ලෙස ම සිංහල රාජ්‍යත්වයට එරෙහි ව කටයුතු කිරීම අරඹති.

මුස්ලිම් දේශමාමකත්වය මුල සිට ම තිබුණේ සැක මුසුව ය. උදාහරණයක් ලෙස ඔවුන් පෘතුගීසි සංහාරයෙන් ගලවාගත් සෙනරත් රජු පෘතුගීසීන් සමඟ සටනට යෑමට ඔවුනට ආරාධනා කළ විට 4000කට අධික පිරිසෙන් සටන සඳහා පැමිණියේ 1500ක පමණ පිරිසක් බව නිකපිටියේ බණ්ඩාර සෙනරත් රජුට යැවූ වාර්තාවකින් පෙනේ. මේ අනුව මුස්ලිම්වරු අවසාන වශයෙන් බැලූයේ කළගුණ සැළකීම නොව තම ජන කණ්ඩායමේ පැවැත්ම ය. ඉංග්‍රීසීන් පැමිණි දා සිට ම ඔවුනට උඩරට තොරතුරු ලැබුණු ප්‍රධාන මාර්ගය වූයේ මුස්ලිම් වෙළඳුන් ය. මේ නිසා පුත්තලමේ සිට පැමිණි මුස්ලිම් වෙළඳ කණ්ඩායමක් සිරකිරීමේ සිද්ධිය පදනම් කරගෙන ඉංග්‍රීසීන් සිංහල රාජ්‍යත්වයට එරෙහි ව පළමු යුද්ධය 1802 දී කළහ. ඉංග්‍රීසීන් අන්ත පරාජයකට ලක් වූ ඒ සටනේ දී ඔවුන්ගේ

287 දෙනෙකු මිය ගියහ. ඔවුන් සමඟ ජාවක, මැලේ හා මුස්ලිම් සේනාංකයක් ද විය.

මුස්ලිම් වෙළඳ ඔත්තු සේවාවන් ඉතා ම කාර්යක්‍ෂම ලෙස යොදා ගන්නේ 1805 දී ප්‍රධාන භාෂා පරිවර්තකයා වූ ජෝන් ඩොයිලි විසිනි. 1814 දී තවත් මුස්ලිම් ඔත්තු සේවා ප්‍රශ්නයක් මුල්කරගෙන සිංහල - ඉංග්‍රීසි ගැටුම් ඇතිවේ. මෙවර යුද්ධ ගැටුමකට වඩා සිංහල බෙදීම හා රාජ්‍යතාන්ත්‍රික උපායන් යොදන නිසා සිංහල ප්‍රභූන් රජු ඉවත්කර ඉංග්‍රීසීන් හා ගිවිසුමකට එති. (1815 මාර්තු 02)

ඒ හා සමඟ ම ඉදිරියට එන මුස්ලිම්වරු මහනුවර හා තවත් ප්‍රදේශවල ඉංග්‍රීසි ජයග්‍රහණය සැමරීමට ගොස් සිංහලයින් හා ගැටුම් ඇතිකර ගනිති. ප්‍රථම වතාවට සිංහල ප්‍රදේශයකට නායකයෙකු ලෙස මුස්ලිම් හාජි නෙයින මරික්කාර් පත්කරන ඉංග්‍රීසීහු වෙල්ලස්සේ සිංහල අභිමානය අවුළුවති. ඌව - වෙල්ලස්ස කැරැල්ල තවත් නොයෙක් හේතූන් සමඟ මේ නිසා ද ඇති වූවකි. කැරැල්ල මර්ධනය සඳහා මුලින් ම යැවෙන්නේ නෙයින මරික්කාර් ය. ඔහු හා මුස්ලිම් සෙබළු ද අවශේෂයෝ ද සිංහල කැරලිකරුවන්ගෙන් මැරුම් කති. දෙවනුව ඉංග්‍රීසි දිසාපති විල්සන් තෙමේ ම සටනට යන අතර ඔහු ද මැරුම් කයි. ඉන් පසු ඒ සඳහා යන කැප්පෙටිපොළ නිලමේ සිංහලයන්ගේ පැත්ත ගැනීම නිසා කැරැල්ල ඉංග්‍රීසීන් බියගන්වමින් ව්‍යාප්ත වේ.

මේ ගැන මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ එම්.එස්.එම්. අනීස් මහතා මෙසේ ලියා ඇත.

''මඩකලපුවට ආසන්න වෙල්ලස්සේ පදිංචි ව සිටි මුස්ලිම්වරු තමන් පාලනය කිරීම සඳහා මුස්ලිම් පාලකයෙකු පත්කරන ලෙස බ්‍රිතාන්‍යයන්ගෙන් ඉල්ලා සිටි අතර එය ඉටු වුණි. සිංහලයින්ගේ කඩාකප්පල්කාරී කැරැල්ල (1817-18) මර්ධනය කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධතා (ඔත්තු සේවා හා තොරතුරු) මෙන් ම ගමනාගමන පහසුකම් සැපයුවේ ද මුස්ලිම්වරුන් ය...'' අග්නිදිග මුස්ලිම්වරු පිබිදුණේ වෙල්ලස්ස කැරැල්ල (සිංහලයින් පරාජය වීම) නිසා ය. මුස්ලිම්වරුන්ගේ දක්‍ෂතාවය, වගකීම හා විනය දුටු ඉංග්‍රීසීන් ඔවුන් උසස් තත්ත්වයකට පත්කළහ. (අම්පාර මුස්ලිම් උරුමය - පිට 15, 16, 17)

සිංහල විමුක්ති අරගලය පරාජය කිරීමෙන් පසු ඉංග්‍රීසීන් නැවත සිංහල නැගිටීමක් හෝ සිංහලත්වයක් ඇතිවීම වැළැක්වීම සඳහා විවිධ පියවර ගත්හ. 1831 දී ඇතිකරන ලද නව පළාත් බෙදීම තුළින 'උඩරට රාජධානිය දේශපාලන ලෙස බිඳ දමන ලදී. යුදමය වශයෙන් ඔවුන් දුෂ්කර තත්ත්වයට පත්වූ නුවරඑළිය, බදුල්ල, මහනුවර හා මාතලේ සිංහලයින් පණ මෙන් රැකි පරිසර පද්ධති හා ජල රක්ෂිත විනාශ කර වතු වැවිල්ල අරඹන ලදී. ඒ සඳහා විජාතික දෙමළ කම්කරුවන් ගෙන එන ලදී. නුවර කලාවියේ පැරණි සිංහල රාජධානිය තවදුරටත් විනාශ කිරීම සඳහා ඇතැම් වැව් විනාශ කරන ලද අතර, තවත් ඇතැම් වැව් දුම්කොළ වගාවෙන් පොහොසත් වූ දෙමළ ව්‍යාපාරිකයින්ට විකුණන ලදී. 1848 දී ටොරින්ටන් හා 1856 දී වෝඩ් ආණ්ඩුකාරයින් විසින් දුම්කොළ හා කෝපි වගාවේ අතිරික්ත කම්කරුවන් වන්නියේ හා නැගෙනහිර පදිංචි කරන ලදී.

අයර්ලන්තය අල්ලාගත් අවස්ථාවේදී අයිරිෂ්වරුන් කම්මැලියන් ලෙස හංවඩු ගැසූ හැරින්ටන් සාමි ආදායම් ඉපයීම පිණිස 'කඩිසර' විජාතික යුදෙව්වන් යොදා ගැනීමට යෝජනා කළ බව මැක්පියර්සන් සටහන් කර ඇත. හැරින්ටන් න්‍යාය අනුව යමින් සිංහල වෙළඳ ආර්ථිකය දුර්වල කිරීම සඳහා ඉංග්‍රීසීන් මූලය වෙළඳපොල හා තොග වෙළඳාම චෙට්ටියාර්වරුන්ට ද සිල්ලර වෙළඳාම මුස්ලිම්වරුන්ට ද පැවරූහ. ලංකාවේ මුස්ලිම් මූලධර්මවාදියෙකු වන එම්.එස්.එම්. අනිස් නිවැරදිව ප්‍රකාශ කරන ලෙස නැගෙනහිර මුස්ලිම් උදානය ඇරඹුවේ ඉංග්‍රීසීන් ය.

1817 ජූනි 02 දා ඉංග්‍රීසි ආණ්ඩුව කොළඹ හා අවට පදිංචිවීමට මුස්ලිම්වරුන්ට නීතිමය ලෙස ඉඩකඩ ලබාදෙන ලදී. එය 1815 ගිවිසුම උල්ලංඝනය කිරීමක් විය. 1821 ජනවාරි 14 දා ඉංග්‍රීසීන් තවත් නියෝගයක් මගින් මුස්ලිම්වරුන් ලංකාවේ පුරවැසියන් ලෙස නම්කර ඔවුනට දේපොල අයිතිකර ගැනීමේ අයිතිය ලබා දෙන ලදී. මේ මගින් සිංහල පූජනීය ස්ථානවලට අයත්ව තිබූ පොදු දේපොල රැසක් මුස්ලිම් වෙළඳුන් හිමිකර ගන්නා ලදී. මෙයට නැඟුණු සිංහල විරෝධය තරමක කැරලිකාරීත්වයකට ගමන් කළ නිසා නැවත එය සංශෝධනය කළ ඉංග්‍රීසිහු වසර 99කට පසු ඒවා යළිත් වෙහෙර විහාරස්ථාන වලට ම අයත්වන ලෙස නීතියක් 1832 මැයි 05 දා නිකුත් කර ඇත. එය මේ වනතෙක් ක්‍රියාත්මක වී නැත.

1848 සිංහල විමුක්ති අරගලය ද පරාජය වීමෙන් පසු ඉංග්‍රීසීන් තවදුරටත් හැරින්ටන් න්‍යාය යොදාගත්හ. 1857 ජූලි 27 වැනි දින සිට අක්කරය පනම් තුන සිට පහ දක්වා වූ මිල ගණන්වලට පැරණි සිංහල

ඉඩම් ඉංග්‍රීසින් විසින් මුස්ලිම් - දෙමළ නව ජනාවාසකරුවන්ට විකුණන ලදී. මෙය 1861 දී ජේ.ඩබ්. බර්ට් විසින් නැගෙනහිර පළාතේ උපරිම ලෙස ක්‍රියාවේ නංවන ලදී. නව සංක්‍රමණිකයන්, පැරණි පවුල්වල අලුත් පරම්පරාවල දස දහස් ගණනක් මේ මගින් සිංහල දේපොල අල්ලා ගනිමින් ස්ථිර පදිංචිකරුවන් බවට පත්වූහ. (මේ ගැන ඓතිහාසික විස්තරයක් සඳහා කියවන්න නැගෙනහිර සිංහල උරුමය - චම්පික රණවක - 2002 දෙසැ.)

## මූලධර්මවාදය පැමිණීම

ලංකාවේ ඉස්ලාම් අධ්‍යාපනය ගැන ලිපියක් ලියන මර්සූර් ඒ මෙළු මෙසේ ලියයි.

''ලාංකික මුස්ලිම්වරුන්ගේ ඉස්ලාම් අධ්‍යාපනය ක්‍රි.ව. 7 සිට 16 දක්වා කාලය තුළ අදියර හතරකින් ක්‍රියාත්මක වී තිබේ. ඒ ඔස්තාද්වරු, සූපිවරු, මවුලානාවරු, හා යුනානි වෛද්‍යවරු ආදී ලෙස යි. වෙළඳාම හා ආදම්ගේ සිරි පතුල (ශ්‍රී පාදය) නැරඹීමට ලංකවට පැමිණි අයගෙන් මුලදී ම ඉස්ලාම් අධ්‍යාපනය ව්‍යාප්ත විය. දෙවැනි කලීපා උමර්ගේ යුගයේ (ක්‍රි.ව. 634-44) සිට ම ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත කිරීමට ඔස්තාද් (උගන්වන්නා) වරු මෙහි පැමිණිය හ. උමයියාවරුන්ගේ වකවානුවේ වර්ධනය වූ සූපි දහම ලංකාවේ ද පැතිරී ගියේ ය. ධර්ම දේශනා සඳහා පැමිණි සාත්තුවරුන්ගේ සොහොන් තවමත් පවතී. තව ද උමයියාවරුන්ගේ යුගයේ ද මර්වාන් දුෂ්ඨයා නිසා මහමත් නබිතුමාගේ පරම්පරාවලට තර්ජනයක් එල්ල වූ විට ඔවුහු (මවුලානාවරුන්) ලංකාවට ද සංක්‍රමණය වූහ. පසු ව යුනානි වෛද්‍ය ක්‍රමය හරහා ද ධර්මය ප්‍රචාරය විය.....''

(අම්පාර මුස්ලිම් උරුමය සිට 87-89)

ඉහත මතවාද මගින් උත්සාහ කරන්නේ මහමත්තුමාගේ කාලයේදී ම වාගේ ලංකාවට ද ඉස්ලාමය පැමිණි බව ඔප්පු කිරීමට ය. එය එතැනින් නොනැවතී සූපී සාත්තුවරුන්ගේ සොහොන් ගැන කථා කරමින් එය අඛණ්ඩව ගලා ගිය බව පෙන්නීමට උත්සාහ දරා ඇත. පෙරදිග ඉස්ලාමයේ ව්‍යාප්තියත්, කාලවකවානු අප විසින් කලින් සඳහන් කර ඇති අතර කිසි ම පුරාවිද්‍යාත්මක හෝ කාලවකවානු පදනමක් නැතුව සිදු කරන මෙවැනි ප්‍රකාශ ගැන විවේචන ඉදිරිපත් කළ යුතු නැත. ඒවා මූලධර්මවාදී ප්‍රබන්ධයන් ය.

නිසැකව ම ධර්ම ප්‍රචාරයේ යෙදුණු පිරිස් වෙළෙන්දන් සමග ලංකාවට ද පැමිණෙන්නට ඇත. නමුත් 15 වැනි සියවස වන තෙක් එවන්නක් පිළිබඳ කිසිම පදනමක් ඇති සාක්ෂියක් තවමත් ලැබී නැත. ඔස්තාද්වරුන් ලෙස හැඳින්වූයේ ධර්ම ප්‍රචාරකයන් ම නොව පොලු හා සටන් සරඹ විශේෂඥයන් පිරිසක් බව ඉන්දියාවේ මුස්ලිම් ඉතිහාසය හදාරන විට පෙනී යයි. සූෆිවාදය පැතිරීම ආරම්භ වන්නේ මොංගෝලියානු ප්‍රහාර සමඟ ය. එය දකුණු ආසියාවට එන්නේ අක්බාර් මෝගල් යුගයේ ය. දකුණු ඉන්දියාවේදී තංගල් නමින් හැඳින් වූ මවුලානාවරු පල්ලිවල ඉස්ලාමීය ගුරුවරුන් ලෙස ජීවත් වූ බවට ද පැහැදිලි වාර්තා ඇත. එහෙත් ඔවුන් ඒ කාලයේ ලංකාවේ සිට බවට එවැනි සාක්ෂි නැත. යුනානි වෙදකම ආගමික ප්‍රචාරයේ දී සූෆිවරුන් (මොහිදීන් කාදර් ජිලනි) විසින් අනුගමනය කළ උපක්‍රමයකි. මෙයට අමතරව දකුණු ඉන්දියාවෙන් ආලිම් හෙවත් උගතුන් ද මෙහි පැමිණ කුරානය පැහැදිලි කළෝ ය. මේ නිසා 7 වන සියවසේ සිට ලංකාවේ ඉස්ලාම් අධ්‍යාපනය තිබුණු බව ප්‍රකාශ කිරීම ක්‍රි.ව. 1691 ලියැවුණු තඹ තහඩුවකින් ක්‍රි.පූ. 2 වන සියවසේ සද්ධාතිස්ස යුගයේ ලංකාවේ අරාබි ජනවාස තිබුණා යයි උපකල්පනය කිරීම වැනි (කියවන්න මන්සූර් ඒ කාදර් - අම්පාර මුස්ලිම් උරුමය - පිට 24) ආගමික අන්ධකම නිසා එන නිගමනයකි. සාධාරණ අරුතින් බලයි නම් 16 වැනි සියවසේ සිට ඉස්ලාම් ධර්ම ප්‍රචාරණය තිබෙන්නට ඇති බවත් එය ස්ථාවරව ව්‍යාප්ත වන්නේ 19 වැනි සියවසේ සිට බවත් නිගමනය කළ හැක.

නූතන ඉස්ලාමීය මූලධර්මවාදය පදනම දැමුයේ ඊජිප්තු මූලධර්මවාදියෙකු වූ ඔරාබි පාෂා විසිනි. එය දේශීයව ප්‍රචාරණය කරනු ලැබුවේ සිද්දි ලෙබ්බේ විසිනි. 1899 දී කින්නියාවේ දී මද්රසතුල් සෙයිදියා නම් ආගමික මූලධර්මවාදිය උගන්වන පාසල ඇති කිරීමත් සමඟ නූතන මූලධර්මවාදය ඇරඹේ.

ධනයෙන් ද, ජන සංඛ්‍යාවෙන් ද ආගමික මූලධර්ම වාදයෙන් ද නැගෙන්නා වූ මුස්ලිම්වරු ඊළඟට දේශපාලන ආධිපත්‍යයට අත තැබූහ. ඒ අනුව ව්‍යවස්ථාදායක සභාවේ වෙන ම මුස්ලිම් නියෝජනයක් ඔවුන් විසින් ඉල්ලා සිටින ලදී. (1888) මෙයට එරෙහි වූයේ ලාංකීය මුස්ලිම් ජනතාව විසින් දෙමළ කතා කරන ජනතාවගේ ම කොටසක් ලෙස අර්ථ දැක්වූයේ දෙමළ ජනවාර්ගිකයෙකු වූ පොන්නම්බලම් රාමනාදන් ය. නමුත් ඉස්ලාම් දේශපාලන ඉල්ලීමට උපක්‍රමයක් ලෙස ඉඩදීමට ඉංග්‍රීසිහු ක්‍රියා කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාවේ උපත ලද නැව් හිමියෙකු වූ මර්හූම් අබ්දුල් රහමන් ඒ සඳහා පත් කරන ලදී. (1889)

මොහොට්ටිවත්තේ ගුණානන්ද, හික්කඩුවේ සුමංගල හිමිවරුන් ද ධර්මපාල තුමා හා වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා ආදීන්ගේ මග පෙන්වීමෙන් ද සිංහල බෞද්ධ පුනර්ජීවනය ඇරඹිණි. එය කෙළින් ම නොවුවත් ඉංග්‍රීසි හා කිතුනු රාජ්‍ය ආධිපත්‍යය ප්‍රශ්න කළේ ය. මේ කාලයේ දීම ඉස්ලාම් පුනර්ජීවනයත්, හින්දු පුනර්ජීවයත්, (සිද්දි ලෙබ්බේ හා නාවලර් ) සිදු වූ නමුත් ඒවා ඉංග්‍රීසි ආධිපත්‍යය ප්‍රශ්න කළේ ම නැත. පෙරළා ඔවුන්ගේ ව්‍යාප්තිය ද බලපෑවේ බෞද්ධයින්ට ය.

මෙය පුපුරා යෑමක් 1915 දී සිදුවිය. ගම්පොල පෙරහැරකට තම පල්ලිය ඉදිරිපිටින් යෑමට මුස්ලිම්වරුන් ඉඩ නොදීම නිසා ඇති වූ නොසන්සුන්තාව, අධිකරණයට යෑමෙන් පසු ගැටුමක් බවට පත්විය. එය යොදා ගනිමින් සිංහල ජාතිමාමකයන් දරුණු ලෙස ඉංග්‍රීසින් විසින් මර්දනය කිරීම නිසා එය සිංහල-මුස්ලිම් ගැටුමකට වඩා සිංහල විමුක්ති නැගිටීමක තත්ත්වයට පත්විය. මෙයින් මුස්ලිම්වරුන් උගත් වැදගත් පාඩම වූයේ බහුතර සිංහලයන් ප්‍රකෝප කර ගැනීම ඔවුන්ට ඉතාම අහිතකර බව ය. පෙරළා තම නිදහස් සටනට මුස්ලිම්වරුන් සම්බන්ධකර ගැනීමෙන් සිංහල ප්‍රභූ නායකයින් වැළැකීමට ද මෙය හේතුවක් විය.

දෙමළ ජනවර්ගවාදී දේශපාලනයේ නැගීම 1910 සිට සිදුවිය. පළමු ව්‍යවස්ථාදායක නියෝජිතයා ලෙස මාක්ස් ප්‍රනාන්දු (සිංහල) පරදවා පොන්නම්බලම් රාමනාදන් ජය ගැනීමෙන් මෙය සිදුවිය. ඉන්පසු ලංකා ජාතික සංගමයේ සභාපතිධුරයට පත් වූයේ ද පොන්නම්බලම් අරුණාචලම් ය. පොන්නම්බලම් දෙබෑයන් පෙන්නාදීමට උත්සාහ කළේ ලංකාවේ දෙමළ ජනයා ලංකාවේ මහ ජාතිය බවත් රටේ පාලනය ඔවුනට ලැබිය යුතු බවත් ය. දෙමළ ජනවර්ගවාදයේ මේ මහා ජාතිවාදී යුගය (1910-1931) තුළ මුස්ලිම් ජනයා ඔවුන් විසින් සලකන ලද්දේ සිංහලයන් මෙන් ම සුළු ජාතයක් ලෙස ය. මෙය ලංකාවේ දෙමළ කතා කරන ජනයාට මුස්ලිම්වරන් ද අයත් ය යන ඔවුන්ගේ මුල් ස්ථාවරයෙන් මිදීමක් විය. 1921 සී පළාත්බදව ද එක් නියෝජිතයා බැගින් තෝරාගැනීමට ගියවිට නැගෙනහිර නියෝජිතයා දෙමළ විය යුතු ද මුස්ලිම් විය යුතු ද යන්න පිළිබඳ ව ගැටුම් ආවේ ය.

මේ වකවානුවේ සිංහල, දෙමළ දේශපාලන මෙන් ම මුස්ලිම් දේශපාලනය ද ප්‍රභූ පවුල් දේශපාලනයක් විය. ඔවුන්ගේ එක ම දේශපාලන සුදුසුකම වූයේ ඉංග්‍රීසින්ට බැල මෙහෙවර කරමින් ස්වදේශ ජනයා පීඩාවට පත් කිරීම ය. සිංහලයන් අතර බණ්ඩාරනායක, සේනානායක, ජයවර්ධන පවුල් මතු වූ ලෙසම නැගෙනහිර මුස්ලිම් දේශපාලනය මතු වූයේ කාරියප්පර්

ප්‍රමුල හරහා ය. ඉංග්‍රීසි උගත් තාක්ෂණික සමාජය තුළ මැලේ ජනතාව හා ටී.බී. ජයා බලවත් විය. මුවර්-මැලේ භේදය ද පැවතිණි.

මුල් ම මුස්ලිම් දේශපාලනය මතු වන්නේ සර්වජන ඡන්දය ලබාදීමට ඩොනමෝර් කොමිසම පැමිණීමේ වාර්තා සමඟ ය. 1926 මුල් ම මුස්ලිම් සංවිධාන බිහිවන අතර පසු ව ඔවුන් තම අනන්‍යතාව පෙන්වමින් ඩොනමෝර් කොමිසම ඉදිරියේ සාක්කි දුන් හ. එකී සාක්කිවල විශේෂත්වය වූයේ තමන් ද සිංහල, දෙමළ මෙන්ම ඓතිහාසික වූත් අනන්‍යවූත් ජාතියක් බව අවධාරණය කිරීම ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් ෂරියා විවාහ නීතිය 1929 දී හඳුන්වා දුන් අතර එය 1937 සිට ක්‍රියාත්මක විය. එමෙන්ම කාන්තාවන්ට ඡන්ද අයිතිය ලබාදීමට ද ඔවුහු (1926) එරෙහි වූහ.

1931 රාජ්‍ය මන්ත්‍රණ සභා සර්වජන ඡන්දය යාපනයේ දෙමළ සංවිධාන විසින් වර්ජනය කළ ද නැගෙනහිර දෙමළ ජනයා අතර දේශපාලන ඒකාග්‍රතාවයක් පැවතුණේ නැත. ඒ වෙනුවට 1835 සිටම තමන් වෙන ම ජන කණ්ඩායමක් බව පෙන්වීමට නැගෙනහිර දෙමළ ජනයා උත්සාහ කළ හ. මුස්ලිම් ජනයා සම්බන්ධයෙන් ද එසේ විය. නැගෙනහිර හා කොළඹ ප්‍රධාන මුස්ලිම් බලකේන්ද්‍ර විය.

මැතිවරණයේ දි තම්බිමුත්තු (දෙමළ) පරදවා මාකන්මාකර් මඩකලපුව ආසනය (ඡන්ද 2637 කින්) ජය ගත්තේ ය. නමුත් කොළඹ සඳහා තරඟ කළ ටී.බී. ජයා, ඒ.ඊ. ගුණසිංහ විසින් (ඡන්ද 5203) කින් පරාජය කරන ලදී.

1931 න් පසු දෙමළ ජනවර්ගවාදයේ දෙවන යුගය ජී. ජී. පොන්නම්බලම් විසින් අරඹයි. එහි තේරුම වූයේ ශ්‍රී ලංකා රාජ්‍යයේ සම දේශපාලන බලය (ඡන්ද සංඛ්‍යාව කුමක් වුවත්) දෙමළ ජනයා විසින් ලබා ගැනීම ය. බ්‍රිතාන්‍යය අධිරාජ්‍යයේ යුගය අවසන් වන බව පෙනී යත්ම නිදහස් ලංකාවේ රාජ්‍ය බලය සිංහලයන්ට ලැබීම වැළැක්වීමේ ව්‍යාපාරයකට පොන්නනම්බලම් ඇදී ගිය අතර ඔහු ඒ සඳහා මුස්ලිම් ප්‍රභූ නායකත්වයේ සහාය පැතී ය. ඉංග්‍රීසි උගත් සමාජය නියෝජනය කළ (මැලේ) ටී.බී. ජයා එයට එකඟ විය. නමුත් මාකන්මාකර් හා එම්.එම් ඊබ්‍රාහිම් (පසුව රසීක් පරීද්) එය එකඟ නොවූහ.... '' සිංහලයන් මේ රට පාලනය කරනවාට අපි එරෙහි නොවමු'' යනුවෙන් මාකන්මාකර් කළ ප්‍රකාශය එහි පදනම විය. බර්ගර්වරුන් ද එකී පොදු ප්‍රවාහයට එක් වෙති.

මාකන්මාකර්, රසීක් ෆරීද්, කලීල් ආදීන්ගේ (පසුව ටී. බී. ජයා ද) මේ සමඟි ක්‍රියාවලිය නිසා මුස්ලිම් බෙදුම්වාදයක් මතු නොවේ. ඉන්දියාවේ මුස්ලිම් බෙදුම්වාදය 1931 සිට වර්ධනය වූ නමුත්, රහමත් අලි චෞද්රි ලංකාවේ මුස්ලිම් ජනයා ඉන්දියානු මුස්ලිම් ජනයාගේ කොටසක් ලෙස සලකා ඔවුනට වෙනම රාජ්‍යයක් (සපිස්තාන්- බටහිර හා නසරිස්තාන්-නැගෙනහිර) යෝජනා කර තිබූ නමුදු පාකිස්ථානය බිහි වූ විට පවා ලංකාවේ මුස්ලිම් බෙදුම්වාදයක් ඇති වූයේ නැත. එයට මූලික හේතුව වූයේ අවංකවම හෝ උපක්‍රමයක් ලෙස හෝ සිංහල ප්‍රවාහයට එක්වීමට මුස්ලිම් ප්‍රභූ නායකත්වය තීරණය කිරීම ය.

මේ පිළිබඳව කදිම විවරණයක් කරන සෞම්‍යමූර්ති තොන්ඩමන් මහතා මුස්ලිම් නායකයින්ගේ එකී සාමකාමී ක්‍රියාවලිය විසින් ලාංකීය මුස්ලිම් ජනයා ආර්ථික හා සමාජයීය අතින් දෙමළ ජනයා පරදවන තරම් තැනකට ගෙන ගිය බව සිය ජීවිත කතාවේදී (TEA AND POLITICS) ප්‍රකාශ කර ඇත.

ලංකාවේ ඇති වූ දෙමළ බෙදුම්වාදයට හා ලේ වැගිරීමට ප්‍රධාන වග උත්තරකරු වූ එස්. ජේ. වී. චෙල්වනායගම් විසින් මුස්ලිම් ජනයා ද අවුල් කරන ලදී. 1952 මැතිවරණය පරාජයෙන් පසු චෙල්වනායගම් වැඩි වශයෙන් සිය අවධානය නැගෙනහිරට යොමු කළේ ය. දෙමළ කතා කරන ජනයා යන පදනමින් සිය වෙනම රාජ්‍ය සංකල්පයට මුස්ලිම්වරුන්ගෙන් ඇතැමෙක් ද දිනා ගත්තේ ය. මේ දෙමළ බෙදුම්වාදය කල්මුණේ හා මුස්ලිම් ප්‍රදේශවලට ගෙන ආ පළමු තැනැත්තා වූයේ එම්. එස්. හමීඩ් ය. දෙමළ රාජ්‍ය පක්ෂයේ සත්‍යග්‍රහවලට මුස්ලිම් ජනයා ඇද දැමීම හා සිංහල ගැමියනට හිරිහැර කිරීමට ඔවුන් ද එක් විය. රටේ සෙසු ප්‍රදේශවල මුස්ලිම් ජනයා ජාතික පක්ෂ සමඟ සිටිය හ. 1956 මැතිවරණයේ දී වෙනම දෙමළ කතාකරන රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටි දෙමළ රාජ්‍ය පක්ෂයෙන් ඉදිරිපත් වූ කාරියප්පර් හා ඔහුගේ බෑනා වූ මුස්තාපා ජය ගත්හ. තවත් නැගෙනහිර මුස්ලිම් නායකයෙකු වූ බදුඋද්දින් මහමුද් ශ්‍රීලනිපය සමඟ එක්වීම කැපී පෙනුණේ ය. පසුව කාරියප්පර් හා මුස්තාපා දෙමළ රාජ්‍ය පක්ෂය අතහැර මහජන එක්සත් පෙරමුණට එක් වී ඇමතිවරු වූහ. 1960 දී කාරියප්පර් සමස්ත ලංකා ඉස්ලාමීය එක්සත් පෙරමුණ (සූර්යයා ලකුණින්) ගොඩ නැගී ය.

ලංකාවට බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබෙන වකවානුව හා ඉන් පසුව වූ දශකයේ දී මුස්ලිම්වරුන් අතර ඇති වූ ප්‍රධාන සංවාදයක් වූයේ තම

අනන්‍යතාවය පිළිබඳව ය. රසීක් පරීද්ගේ අදහස වූයේ ඔවුන් පැවත එන්නේ අරාබි යෝනක ආර්ය පරපුරුවලින් බව ය. සියාරාම් නමින් හැඳින් වූ අරාබියෙන් පැමිණි ආගමික නායකයන්ගේ සොහොන් කොත් එහිදී ප්‍රධාන පුරාවිද්‍යාත්මක සාධකය විය. නමුත් එම්. එස්. හමීඩ් ආදීන් තමන්ගේ මූලයන් දකුණු ඉන්දියාවට සම්බන්ධ කළෝ ය. (අනාර්ය-ද්‍රවිඩ) මේ අනුව තම දේශපාලනය ආර්ය සිංහල (ප්‍රධාන වශයෙන් එක්සත් ජාතික පක්ෂය අනාර්ය ද්‍රවිඩ දෙමළ රාජ්‍ය පක්ෂය) ලෙස බෙදා ගත් හ. මේ යෝනක අරාබි මතය නිසා කොළඹ සිටි ඉන්දියානු හා මැලේ මුස්ලිම්වරු කෙළින් ම එක්සත් ජාතික පක්ෂයට එක් වූහ. මේ අනුව රසීක් හා පරීද් මුස්ලිම් අනන්‍යතාවයේ ඉතිහාසයට කළ විවරණය නිසා මුස්ලිම් දේශපාලනයේ දී බෙදුම හැගෙනහිර ඇතිවිය. රටේ සෙසු ප්‍රදේශවලට එය බලපෑවේ නැත .

බදුඋද්දීන් මහමුද් ඉස්ලාමීය සමාජවාදි පෙරමුණ බිහිකළ අතර ඔහු වැඩි වශයෙන් නසර්ගේ බාත් සමාජවාදයෙන් කුළුගැන්වී සිටියේ ය. ඔහුට ශ්‍රීලනිපයේ සහාය ද ලැබිණි. ජාත්‍යන්තර වශයෙන් ද ශ්‍රීලනිපය, නසර් හා බාත්වාදය සමග සිටියේ ය. ඊජිප්තුවේ මුස්ලිම් සහෝදරත්වය නසර්ට එරෙහිව ඉස්ලාමීය මූලධර්මවාදය ගෙන ආවා සේම එම්. එම්. මහමුද් මාක්ස් විරෝධී මූලධර්මවාදි ඉස්ලාමීය පෙරමුණ පිහිටු විය. බදි ''ඉන්සාත්'' නම් සඟරාව මගින් ලංකාවේ බාත් සමාජවාදය සොයත්දී මහමුද් 'ජිහාද්' නමින් සඟරාවක් පළ කරමින් ඉස්ලාමීය මූලධර්මවාදය පැතිර වූයේ ය. අවසානාවකට මේ 'ජිහාද්' මූලධර්මවාදයට උපකාර කළේ එක්සත් ජාතික පක්ෂය යි. මේ මූලධර්මවාදය කෙතරම් ශක්තිමත් වී ද යත්1970 මැතිවරණයේ දි රටපුරා වාමාංශික සමාජවාදි රැල්ල ජය ගනිද්දී පොතුවිල්, නින්දවූර් ජය ගැනීමට එජාපයේ මුස්ලිම් මූලධර්මවාදය සමත් විය.

බදි අධ්‍යාපන ඇමති වීමෙන් පසු සිංහල ඉතිහාසය විෂය නිර්දේශයෙන් ඉවත් කළ ද ඉස්ලාම් අධ්‍යාපනය බිහිකිරීමට විශේෂ මෙහෙයක් කළේ ය. උගත් මුස්ලිම් සමාජ කණ්ඩායමක් කොළඹින් පිටත (විශේෂයෙන් අම්පාර, මඩකලපුව, ත්‍රිමලය හා මහනුවර) ඇති වීමට එය බලපෑවේ ය. පසුව ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයට එක් වන්නේ මේ පිරිස් ය. අනෙක් අතින් නොබැඳි ව්‍යාපාරය හරහා ලංකාව රැඩිකල් අරාබි ලෝකයට සම්බන්ධ වීමෙන් පසු ලංකාවේ මුස්ලිම්වරුන්ට විදේශාධාර ලැබෙන අතර අපේ තේවලට හා ගෘහ ශ්‍රමිකයන්ට මැද පෙරදිග වෙළෙඳ පොලක් ලැබේ. 1976 නොබැඳි සමුළුවට ලංකාවට පැමිණි මුවාමර් ගඩාෆි විසින් ප්‍රකාශ කළ ''මගේ මුනුබුරන්ගේ යුගයේ දි ලංකාව මුස්ලිම් රටක් වේවායැයි'' පැතුම ඔවුන්ගේ සටන් පාඨය විය. මෙයට අමතර ව සම්ප්‍රදායික

මුස්ලිම් රටවල් වූ සවුදියෙන් ආධාර ගලා ඒමට පටන් ගත් අතර පාකිස්ථානය හා මැලේසියාවේ මුස්ලිම් මූලධර්මවාදී ව්‍යාපාරවල බලපෑම ද ලංකාවට දැනිණ.

1976 දී දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ වඩුක්කොඩෙයි සමුළුව පවත්වා දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ වී ස්වාධීන 'සමාජවාදී' දෙමළ ඊළාම් රාජ්‍යයක් පිහිටුවීමට හිමිස ගනිද්දී සමාන්තර ක්‍රියාවලියක් නැගෙනහිර මුස්ලිම් දේශපාලනයේ ද ඇතිවේ. බදිගේ සමාජවාදී ව්‍යාපෘතිය ආගමික මූලධර්මවාදයට යටවෙමින් පලීල් ඒ මජිද් හා සම්සුදීන් එක් වී මුස්ලිම් එක්සත් පෙරමුණ බිහි කරති. (1976) එහි තවත් ක්‍රියාකාරිකයන් දෙදෙනෙකු වූයේ පලීල් මජිද් හා තරුණ එම්. එච්. එම් අෂ්රෆ් ය. ඔවුන් සියළු දෙනා 1977 ජූලි මහා මැතිවරණයේ දී දෙමළ එක්සත් විමුක්ති පෙරමුණට එක් වී මුතූර්, සමන්තුරේ හා පුත්තලමට තරඟ කර පරාජය වෙති. මේ මැතිවරණයේ දී එම්. එච්. එම්. අෂ්රෆ් කළ ප්‍රසිද්ධ ප්‍රකාශයක් වූයේ දෙමළ ඊළම ලබාගැනීම අමිර්තලිංගම් අත් හරින්නේ නම් එතැන සිට තමන් සටන් වදින බවය. දෙමළ ඊළමේ පුත්තලම සීමාව ද, පානම් සීමාව ද රකින්නේ මුස්ලිම්වරුන් බව ඔවුන්ගේ සටන් පාඨය විය. කෙසේ වෙතත් සිංහල විරෝධී මුස්ලිම් අන්තවාදය පරාජය වී එක්සත් ජාතික පක්ෂය තුළ තරඟ කළ මුස්ලිම්වරු ජය ලැබූහ. දෙ.එ.වි.පෙ. සමග සිටි නැගෙනහිර දෙමළ නායකයින් වූ දේවනායගම් හා රාජ දොරෙයිගේ ද ජයග්‍රහණවලින් ස්ථාපිත වූයේ ද නැගෙනහිර තවමත් දෙමළ ඊළමට බොහෝ දුර බව ය.

පලීල් ඒ මජිද් හා සම්සුදීන් පසු ව මු.එ. පෙරමුණ අත්හැර ශ්‍රීලනිපය හා එක් වූහ. නමුත් විශේෂත්වය වූයේ අෂ්රෆ් තව දුරටත් දෙ.එ.වි.පෙ. සමඟ රැඳී සිටීමය. එපමණක් නොවේ. දෙමළ සන්නද්ධ අරගලය ඇරඹුණු මුල් යුගවලදී මුස්ලිම් තරුණයින් එය හා ඒකාබද්ධ වීමට නැගෙනහිර සිංහල විරෝධී අෂ්රෆ් සාධකය බලපෑවේ ය.

ඉස්ලාම් මූලධර්මවාදය ඊළඟට වර්ධනය වන්නේ එ.ජා.ප. මුස්ලිම් නායකයින් හරහා ය. එම්. එච්. මොහොමඩ්, බකීර මාකර්,මන්සූර් හමීඩ්, අබ්දුල් මජීද් ආදීන් හරහා පල්ලි ගොඩනැගීමත්, ක්‍රමානුකූල ස්වෙච්ඡා සංවිධාන ජාලයක් ඇති කිරීමත් සිදු කරන ලදී. මේ තත්ත්වය මදක් අපහසුකාරී වන්නේ 1984 සි ඊශ්‍රායල් යුද උපදේශකයින්ගේ සහාය ලබා ගැනීමට ජයවර්ධන හා ඇතුලත්මුදලි ක්‍රියා කිරීම සමඟ ය. කොටි සංවිධානය සමඟ එක් වී සිටි මූලධර්මාවාදීහු ද, පොදුවේ මුස්ලිම් සියල්ල පාහේ ද එයට එරෙහි වූහ.

ක්‍රමයෙන් කොටි සංවිධානය ඉන්දීය ග්‍රහණයෙන් ස්වාධීන වීමත් සමඟ පලස්තීන හා රැඩිකල් ඉස්ලාම් බලවේග සමග තිබූ ඔවුන්ගේ පෙකිණිවැල කැපී ගියේ ය. නැගෙනහිර වෙරළේ ආධිපත්‍යය සඳහා තමනට වැලිඹය සිංහලයින්ගෙන් තරම් ම තර්ජනයක් මුතූර්, කින්නියා, මඩකලපුව, කල්මුණේ, නින්දවූර්, අඩ්ඩවලානේ, පොතුවිල් මුස්ලිම් ජනපද වලින් සිදුවන බව දුටු ප්‍රභාකරන් මුස්ලිම් විරෝධී ප්‍රහාර ඇරඹී ය. මෙයට තවත් හේතුවක් වූයේ මුස්ලිම් රැඩිකල් කොටස් තම සංවිධානය සමඟ සිටින්නේ අනාගතයේ වෙන් වී යන තෙක් සටන් පුහුණුව ලබා ගැනීම සඳහා බවට ප්‍රභාකරන් තුළ වූ සැකය ය.

මේ නිසා අෆ්රෆ්ගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය බිහි විය. මැලේවරු නියෝජනය කරමින් ජ්‍යෂ්ඨයෙකු වූ ඔස්මාන් එහි සිටි අතර රැඩිකල් මූලධර්මවාදීන් බොහොමයක් ද ඔවුනට එක් වූහ. නමුත් දේශපාලන බලය අතින් ඔවුන් සිටියේ තවමත් බොහෝ දුරිනි. නැගෙනහිර මුස්ලිම්වරු පමණක් නොව රට පුරා ම මුස්ලිම් වෙළෙඳ ප්‍රජාව එ.ජා.ප. සමඟ සිටියහ.

නමුත් 1987 ඉන්දු ලංකා ගිවිසුම ඇතිවීමත් එය තුළ මුස්ලිම් නියෝජනයත් නොවීම නිසා විශේෂයෙන් නැගෙනහිර මුස්ලිම් චකිතයක් ඇතිවිය. ඊළඟට ඉන්දීය හමුදා විසින් ද ඔවුනට ලැබුණේ සිංහලයින්ට තරමට ම අප්‍රසන්න අත්දැකීම් ය. මෙයින් සැලකිය යුතු ලෙස නැගෙනහිර එ.ජා.ප. මුස්ලිම් බලය පිරිහිණි. මුස්ලිම් කොන්ග්‍රසයේ මතුවීම මකියාවෙල්ලි දේශපාලකයෙකු වන ජයවර්ධන ජනාධිපතිට ද දැනුණේය. ඔහු ඒ සඳහා අනුගමනය කළ එක් උපක්‍රමයක් වූයේ සිය අධිකරණ ඇමති ලවා මුස්ලිම් ජනයාට ෂරියා නීති හඳුන්වා දීමට ඉඩ සැලසීමයි.

මුස්ලිම් ඇඳුම (පර්දාව හා හිස්වැසුම) මෙන් ම පැරණි භූමිපුත්‍ර නීතිය ද (තේසවලාමේ නීතිය ද මුස්ලිම් ඉඩම් නීතියේ ම දිගුවකි) මේ අනුව නීති ගතවන ලදී. මෙයින් මුස්ලිම් ජාතිකයෙකුගේ දේපොළ අන්‍ය ජාතිකයන් වීම වැළැක්විණි.

ජයවර්ධන කල්පනා කළේ එමගින් මුස්ලිම් මූලධර්මවාදය තමන්ට ම තබා ගත හැකි බව යි. නමුත් එයින් සිදුවූයේ ඉස්ලාම් මූලධර්මවාදය නව වටයකින් බලවත් වීමය.

1988 පළාත් සභා ඡන්දය තීරක අවස්ථාව විය. ලෝකයට එහි ප්‍රජාතාන්ත්‍රිකතාව අවධාරණය කිරීම සඳහා ඉන්දීය ඔත්තු සේවා අෂ්රෆ්ගේ සහාය පැතී ය. පසුව ඔස්මාන් අබ්දුල් රසූල් දෙදෙනා ම චෝදනා කළේ ඉන්දියාව ශ්‍රී.මු.කො. ට ඉන්දීය රුපියල් ලක්ෂ 50 ක් හා ආරක්ෂාව ලබාදුන් බව ය. අනිවාර්යයෙන්ම පාකිස්ථානු ඔත්තු සේවා (ISI) හා සවුදි අරමුදල් ද අෂ්රෆ්ට ලැබුණු බව චෝදනා තිබේ. ශ්‍රී.මු.කො. පළාත් සභාවේ ආසන 17 ක් ජයගත් අතර සේගු ඉසදීන් විපක්ෂ නායක ලෙස EPRLF පළාත් සභාවට එක්විය. මෙය එක්සත් ජාතික පක්ෂයේ නැගෙනහිර මුස්ලිම් පදනම දෙදරවාලූ අතර ශ්‍රී.මු.කො. වැඩිවිය පැමිණීමක් විය. හිටි අඩියේ අෂ්රෆ් ජාතික නායකයකු ලෙස මතුවිය. සවුදි අරාබිය පවා තම අවධානය ඔහු වෙත යොමු කළේ ය. 1988 ජනාධිපතිවරණයේ දී සිරිමා බණ්ඩාරනායක නැගෙනහිරට වෙනම මුස්ලිම් කලාපයක් සිය ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශ කර තිබියදීත් (අද මොනවා කීවත් ජවිපෙ හා මව්පෙ එයට එකඟව සිටියහ. ජවිපෙ ඡන්දව වර්ජනය කළේ වෙනත් හේතු මත ය. මව්පෙ ජනාධිපතිවරණයේ දී මැතිණියට සහාය දැක්වී ය). වෙනත් හේතු මත අෂ්රෆ් ප්‍රේමදාස මහතාට සහාය දැක්වී ය. ප්‍රේමදාස මහතාගේ තියුණු ජයග්‍රහණය නිසා අෂ්රෆ් තවත් බලවත් විය. ප්‍රේමදාස මහතා ද නැගෙනහිර යූ.එන්.පී. නායකයන් (මන්සූර්) වැනි අෂ්රෆ් වෙනුවෙන් බිලි දුන්නේ ය. 1989 මහා මැතිවරණයෙන් ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය ආසන 4ක් දිනා ගත්තේ ය. අෂ්රෆ් ආණ්ඩුවට එක් නොවූ නමුත් ප්‍රේමදාසගේ ආණ්ඩුවෙන් කිසි ම මුස්ලිම් යූ.එන්.පී. නායකයෙකුට ලබාගත නොහැකි වූ ප්‍රයෝජන ලබා ගත්තේ ය.

ප්‍රේමදාස යුගය (1989-93) මුස්ලිම් මූලධර්මවාදයේ සාරවත් යුගය විය. දේශපාලන වශයෙන් අස්ථාවර වී බටහිර රටවල ප්‍රහාරයට ලක් වූ ප්‍රේමදාස මුස්ලිම් මූලධර්මවාදයට ඇදී ගියේ ය. ඔහු ඊශ්‍රායලය පිටමන් කළේ ය. ඉරානයෙන් ත්‍රස්තවාදය මැඩීමේ යුද උපක්‍රම ලබා ගත්තේය. ජ.වි.පෙ. කැරැල්ල නිසා 1989 දී ඔහු මූල්‍ය වශයෙන් අසරණ වූ විට ඔහුගේ සරණට ආයේ ඉස්ලාම් බැංකු ය. ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා රාජ්‍යයේ මුදල් හා වාණිජ වෙළෙඳ පොළ මුස්ලිම් මූලධර්මාවදය හසුකර ගත්තේ ය. ඒ හා සමඟම ප්‍රේමදාසගේ ඉන්දීය විරෝධය නිසා පාකිස්ථානය ඔහුට ළංවිය. ප්‍රතිඵලය වූයේ පාකිස්ථානයේ මූලධර්මවාදි පාසල්වලට ලංකාවේ මුස්ලිම් තරුණයින් යැවීමට මගක් පෑදීම ය. ඉන්දියාව නිසා වැඩිවිය පැමිණි මුස්ලිම් මූලධර්මවාදය ප්‍රේමදාස යුගයේදී දඟකාර යෞවනය ලබා ගත්තේ ය. ඉරානය හා පාකිස්තානය ප්‍රේමදාසට ළංවෙත්දී ප්‍රභාකරන් සිය මුස්ලිම් විරෝධි යුද ප්‍රහාරය උච්ච කළේ ය.

1990 අගෝස්තු 03 වන දා සිදු වූ කාතන්කුඩි ඉස්ලාම් බැතිමතුන්
(103 ක්) ඝාතනය කොටි සංවිධානය හා මුස්ලිම් සන්නද්ධ කණ්ඩායම් අතර
ගැටුම තීව්‍ර කළේ ය. ප්‍රේමදාස සමග මධුසමය අවසන් වී පොලිස් නිලධාරීන්
678 ක් ඝාතනය වී තිබූ අතර (1991 ජූනි 11) නැගෙනහිර ආධිපත්‍ය සඳහා
ප්‍රභාකරන් මුස්ලිම් සංහාරවලට ගිවිස තිබුණි. අගෝස්තු හා සැප්තැම්බර්
වල සිදු වූ සංහාරවලින් පන්සිය හැටක් (560)ක් මුස්ලිම්වරු ඝාතනය
කරනු ලැබූහ. මෙයට උතුරු නැගෙනහිර පළාත් සභාවේ මුස්ලිම්
කොන්ග්‍රසයේ මන්ත්‍රීවරුද ඇතුළත් වී සිටිය හ. ඊළඟට දෙමළ නාසිවාදය
ඔක්තෝබර් 11 වන දා යාපනයෙන් මුස්ලිම්වරුන් 20,000 ක් පමණ ද
මන්නාරමෙන් මුස්ලිම්වරුන් 20,000 ක් පමණ ද පළවා හරිනු ලැබී ය.
මෙයින් උතුරු පළාත ශුද්ධ දෙමළ භූමියක් බවට පත්විය. මොවුන්ගෙන්
බොහොමයක් පුත්තලම හා කොළඹ දිස්ත්‍රික්කවලට සංක්‍රමණ වී ඇතිබව
2001 ජූනි ජන සංඛ්‍යා පෙන්වා දුන්නේ ය. උතුරේ මුස්ලිම් දේපල කොටි
හිතවතුන් අල්ලාගත් අතර පලා ආ මුස්ලිම්වරු පුත්තලම, කල්පිටිය හා
කොළඹ සිංහල දේපොළ අල්ලා ගත් හ.

මුස්ලිම්වරුන්ගේ මේ බේදවාචකය නිසා සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරාකය, ඉරානය, ලිබියාව වැනි රටවල්වල ද පාකිස්ථානය ද දැවැන්ත මූලයාධාර ප්‍රමාණයක් රාජ්‍ය නොවන සංවිධාන හරහා ලංකාවට එව්වෝ ය. පාකිස්ථානය හා ඉරානය සන්නන්ධ පුහුණුව සඳහා ඉදිරිපත් වූ අතර ප්‍රේමදාස ආණ්ඩුවේ නියෝග මත මුස්ලිම් තරුණයින් දහස් ගණනක් සඳහා ග්‍රාමාරක්ෂක පුහුණුවට අමතරව සන්නද්ධ පුහුණුව ලබා දෙන ලදී. මෙයින් බොහෝ දෙනෙක් ශ්‍රී ලංකා හමුදාවලින් වෙන් වී වෙනම ක්‍රියා කරන්නට වූහ. මේ ලෙස කොටි සංවිධානය හා EPRLF ආදි වෙනත් සංවිධාන වලින් ද, ශ්‍රී ලංකා හමුදා අංශවලින් ද ලත් පුහුණුව නිසා සන්නද්ධ සටන සඳහා පුහුණුව ලත් පිරිසක් මුස්ලිම් ප්‍රජාව තුළ ඇති විය. මෙයට පාකිස්ථාන හා ඇෆ්ගන් ආගමික ප්‍රචාරකයින් නිසා විශේෂ මතවාදි ශක්තියක් ද ලැබිණි. විවධ අංශ ඔස්සේ වීසා ලබාගෙන ආගමික ගුරුවරුන් ලෙස ලංකාවේ සේවය කරන පාකිස්තානු හා ඇෆ්ගන් ජාතිකයින් ගණන 700 කට ආසන්න බව වාර්තා වේ. මැලේසියාවේ හා ඉන්දුනීසියාවේ සමාකාමී මුස්ලිම් සමාජයන් ප්‍රචණ්ඩත්වය කරා ගෙන ගියේ ද මේ විදේශීය ආගමික ගුරුන් විසින් බව අමතක නොකළ යුතු ය.

එමෙන්ම 1990 න් පසු දෙමළ භාෂා ප්‍රවීනත්වය නිසාත්, කැපවීම නිසාත් දෙමළ නාසිවාදයට එරෙහි සටනේ දී මුස්ලිම් ආරක්ෂක අංශ සමාජිකයන් සිදු කළ විශේෂ දේශමාමක කාර්යභාරය ද සිංහලයින් විසින්

සඳා අනුස්මරණය කළ යුතු බව ද මතක තබා ගත යුතු ය. මේජර් මුතාලිප්, කැප්ටන් නිලාම් පොලිස් පරීක්ෂක ආබිදීන් ආදීන් එවැනි රණවිරුවෝ ය. වසර 2009 දී යුද්ධය අවසන් විට නිලධාරීන් 9 ක් ද සෙසු නිල 82 ක් ද ලෙස 93 දෙනෙක් මුස්ලිම් සෙබළු දිවි දී තිබූ හ.

මෙලෙස ප්‍රේමදාස යටතේ මුස්ලිම් මූලධර්මවාදය පිම්මේ වැඩුණු අතර ලංකාවේ දෙමළ මෙන් ම මුස්ලිම් අන්තවාදයේ වර්ධනයට සැලකිය යුතු ලෙස 1977-94 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වගකිව යුතු බව කිව යුතු ය.

ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය 1994 මැතිවරණයේ දී පාර්ලිමේන්තු ආසන 7 ක් දිනා ගත්තේ ය. එකී ජයග්‍රහණය පිටුපසු දේශීය මෙන් ම විදේශීය අරමුදල් මෙන් ම බලවේගයන්ද ක්‍රියාත්මක විය. රැල්ලට ඉව ඇල්ලූ අෂ්රෆ්, චන්ද්‍රිකා සමඟ එක්විය. මුස්ලිම් මූලධර්මවාදයේ ''විවාහක මධුසමය'' එතැනින් ඇරඹේ. අෂ්රෆ් දේශපාලන බලය ද ඇමතිකමේ බලය ද යොදා ගනිමින් දීර්ඝ කාලීන සැලැස්මකට ගියේ ය. එය වරාය අධිකාරිය මුස්ලිම්වරුන් 12,000 කින් පිරවීමට වඩා එහා ගිය දෙයකි. එනම් නසරිස්තානයට හා සපිස්තානයට අවශ්‍ය යටිතල පදනම ගොඩනැගීම ය.

වරායක් පිහිටුවීමට කිසිඳු සුදුසු කමක් නැති ඔළුවිල් හි ජාත්‍යන්තර වරායක් ඉදිකිරීමට පියවර ගැනිණි. ඔහුගේ ඊළඟ ඉලක්කය වූයේ ගුවන් තොටකි. තනිකරම මුස්ලිම්වරුන් සඳහා නවීන විශ්ව විද්‍යාලයක් අග්නිදිග විශ්ව විද්‍යාලය නමින් පිහිටුවනු ලැබී ය. මෙය බදුඋද්දීන් ඇති කළ (1970-77) මුස්ලිම් අධ්‍යාපන ප්‍රබෝධය තවත් පිම්මකින් පෙරට ගෙන යෑමකි. තුර්කිය වැනි මුස්ලිම් රටවල් පවා සිය අධ්‍යාපන ආයතනවල තහනම් කර ඇති පර්දාව හා මුස්ලිම් තොප්පිය විශ්ව විද්‍යාලවල අනිවාර්ය කෙරුණි. ගැසට් නිවේදනයක් මගින් මුස්ලිම් තොප්පිය හා පර්දාව අනිවාර්ය කළේ (1990) ප්‍රේමදාස ජනපති ය. ඊළඟට ශ්‍රී ලංකාවේ කොළඹ වරාය, රේගුව හා ගුවන්තොට පාලනය කිරීම සඳහා සූක්ෂ්ම වැඩ පිළිවෙලක් යොදනු ලැබී ය. අඩු ම තරමින් ලංකාවේ ක්‍රියාත්මක බැංකු 26 න් 6 ක් මුස්ලිම් අරමුදලින් පැවත එන ඒවා ය. පවතින පල්ලි පුනරුජ්ථාපනය හා නව පල්ලි ඇති කිරීම සඳහා රුපියල් බිලියන 6.6 ක් සවුදියෙන් ලැබුණු බව ද වාර්තා විය. (2002 නොවැම්බර්) රටපුරා මද්රාෂා මූලධර්මවාදී පාසල් 700 ක් ඇති කෙරිණි. කල්පිටිය හරහා සිදු කරන මත්කුඩු ජාවාරම ( ලංකාවේ ප්‍රධාන මත්කුඩු ආනයනකරුවන් 21 දෙනාගෙන් 17 දෙනෙකු මුස්ලිම් වීම අහම්බයක් නොවේ. ඔවුන් බැඳී ඇත්තේ ඇෆ්ගන් හා මැලේසියානු

මාෆියා කල්ලි සමගය) හා වෙනත් හොර බඩු ජාවාරම සමඟ කොළඹ පාතාල ලෝකය හා කළු ආර්ථිකය පාලනය කරන්නා වූ බවට ද මුස්ලිම් මූලධර්මවාදය පත්විය. මෙහිදී ඔවුනට තරඟයක් ඇත්තේ දෙමළ ජාතිවාදයෙන් පමණි. එමෙන් ම ලංකාව පුරා විසිරී ඇති විදේශ රැකියා ඒජන්සි බොහොමයක පාලනය හිමි ව ඇත්තේ මූලධර්මවාදීන්ට ය. (පිලිපීන සැබෑ අයිතිකරුවා බින්ලාදන් බවය) මෙලෙස අෂ්රෆ් ගේ සේවල් කිරීමේ බලය යටතේ ඔහු ලංකාවේ විශාලතම පක්ෂ කාර්යාලය (දාරුස්සලම්) හා ලංකාවේ උසම ගොඩනැගිල්ල (අනාගතයේ ඉදිකිරීමට යන ඉස්ලාම් තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල) පමණක් නොව ලංකා දේශපාලනයේ සංවිධානාත්මක බලයක් බවට මුස්ලිම් සමාජය පරිවර්තනය කරනු ලැබී ය. පසු ව හෙළිදරව් වූයේ අෂ්රෆ්ට සවුදි අරමුදල්වලින් කෝටි සිය ගණනක් ලැබුණු බවත් ඒවා, මීනා ඉන්ටර්නැෂනල් නම් ව්‍යාජ සමාගමක් හරහා ආයෝජනය කළ බවත් ය. එකී මූල්‍ය ජාලය සවුදියේ මූලධර්මවාදය උගත් හපීස් අහමඩ් නසීර් මෙහෙය වූ බවට වාර්තා පළ වී ඇත. අෂ්රෆ්ගේ අකල් මරණය නොවන්නට 2012 ලංකාවේ රාජ්‍ය බලය අල්ලා ගැනීමේ සැලැස්ම ඔහුගේ ජාතික සමගි පෙරමුණට තිබිණි. (හපීස් නසීර් අද මුස්ලිම් කොන්ග්‍රසයේ නියෝජ්‍ය නායකයා වන අතර ජමියතුල්ලා උලේමා සංවිධානය පාර්ලිමේන්තු පනතකින් නීතිගත කළේ ද අෂ්රොෆ් විසිනි.

මහමත්තුමාගේ මරණයෙන් පසු ඊළඟ නායකයා කවුරුන් ද, යන්නට තරඟයක් ඇති වූවාසේම අෂ්රෆ්ගේ බිරිඳ ෆේරියල් අෂ්රෆ් හා පුතුනුවන්, හිස්බුල්ලා හා හකීම් අතර තරඟයත් ඇතිවිය. එයින් හකීම් මුල් වටයෙන් ජයගත් අතර පාර්ලිමේන්තු ආසන 12 ක් යූ.එන්.පී. යේ ද සහායෙන් ලබා ගත්තේ ය. ෆේරියල් හා හිස්බුල්ලාගේ කණ්ඩායම ද ඇතුළත්ව එය 15 කි. (1989 දී 4ක් මුස්ලිම් කොන්ග්‍රස් නියෝජනය 1994 දී 7 ක් ද 2000 දී 11 ක් ද 2001 දී ඒකාබද්ධ 15 ක් ද විය. මුළු පාර්ලිමේන්තුවේ මුස්ලිම් නියෝජනය 24 කි.)

අෂ්රෆ්ගේ මරණින් පසු මුස්ලිම් දේශපාලනය වැඩිහිටියන්ගෙන් නව තරුණ පරපුරට ලැබෙනු ඇත. හකීම්ගේ හා අතාවුල්ලාගේ ගැටුම නොව ඇත්ත ගැටුම මතු වනවා ඇත්තේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හා ජිහාද් සන්නද්ධ සටන තුළ ය. රනිල් වික්‍රමසිංහ විසින් ප්‍රභාකරන්ට උතුරු නැගෙනහිර පාවාදීමේ බියකරු ප්‍රතිඵලයක් වන්නේ ඔසාමා බින්ලාදන් නැගෙනහිරට ගොඩබැසීම ය. සීඝ්‍ර ජනගහණ වර්ධනයෙන්, තරුණ තෙරපුමෙන් (Youth Bulge) ලෝකයේ වැඩෙන මූලධර්මවාදයෙන්, නව

අධ්‍යාපන පෙරළියෙන්, ගැටුම්කාරී දෙමළ නාසිවාදී තෙරපුමෙන්, දුර්වල නිවට නිවාලු යූ.එන්.පී. පොදු පෙරමුණු දේශපාලනයෙන්, තෙල් සල්ලිවල දෝංකාරයෙන් ආදී සියල්ලෙන් පෙනී යන්නේ ලංකාවේ මුස්ලිම් මූලධර්මවාදය ද පිපිරෙන්නට නියමිත ගිනි කන්දක් බව ය. ජාතික රහස් ඔත්තු සේවය වාර්තා කළේ (2002 නොවැ.) එකිනෙකා සමඟ තරඟ මුස්ලිම් සන්නද්ධ කල්ලි හතරක් ඇති බවත් (මුජෙහිදීන්, ඔසාමා, ජෙට් හා ඨිම්) ඔවුන් ජාත්‍යන්තර ත්‍රස්තවාදයට සම්බන්ධ බවත් ය. ඔළුවිල් ප්‍රකාශය හුදු සටන් පාඨයක් නොවේ. එය ඉන්දුනීසියාව මෙන්ම ලංකාව ද ගිනි තබනවා ඇත්තේ ය. දැනටමත් විදේශ මූලධර්ම ගුරුවරු මෙහෙයවන ආගමික අන්තවාදී කල්ලි 4 ක් තාවහිද් - වහාබ්වාදය, ජමාතේ ඉස්ලාම්, තරිකා, තබ්ලික් ජමාත් ලෙස ක්‍රියාත්මක වී ඇත. ඔවුන් අතර ගැටුම් ඝාතන දක්වා දිග් ගැසී ඇත.

## මුස්ලිම් දේශයක් සඳහා වූ ඔළුවිල් ප්‍රකාශය

දිනය වර්ෂ 2003 ජනවාරි 29 වනදා අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් බහුතර ප්‍රදේශයන් කොළ පැහැති ඉස්ලාමීය ධජ පතාකවලින් වැසී තිබිණි. උදේ 9.00 ට පාලමුණේ හා අට්ටපලම් වලින් පෙලපාලි දෙකක් ඇරැඹිණි. උදේ 10.30 වන විට එකී පෙළපාලි දෙක ඔළුවිල් හි අග්නිදිග විශ්ව විද්‍යාල භූමියට පැමිණ තිබිණි.''අල්ලාහු අක්බර්'' ඉස්ලාමීය ආගමික රණ ගීය (දෙවියන් ශ්‍රේෂ්ඨයි!) පැතිර යත් දී ඔළුවිල් ප්‍රකාශය එළිදක්වනු ලැබී ය. එය මෙසේ විය.

01. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු සෑම ආකාරයකින් ම අංග සම්පූර්ණ වූ වෙනම ජාතියකි.

02. ශ්‍රීලංකාවේ උතුරු නැගෙනහිර දෙපළාත මුස්ලිම්වරුන්ගේ ඓතිහාසික නිජබිම වේ.

03. ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර වාසය කරන මුස්ලිම් ජාතියට වෙනම රාජ්‍යයක්, එනම් මුස්ලිම් තේසම් සඳහා වූ ස්වයං නිර්ණය පිළිබඳ අයිතිය ඇත.

04. උතුරු නැගෙනහිර දෙපළාතේ සියළු බහුතර මුස්ලිම් ප්‍රදේශ (ඒවා භූමියෙන් එකට යාවී නොතිබුණ ද) එක් කර මුස්ලිම් තේසම් හෙවත් වෙන ම මුස්ලිම් රාජ්‍ය පාලනයක් ඇති විය යුතු ය.

05. උතුරු හා නැගෙනහිරින් පිටත වෙසෙන මුස්ලිම්වරුන් ද මේ වෙනම ජාතියට අයත්වන අතර ඔවුන්ගේ ආර්ථික - සමාජයීය - සංස්කෘතිමය හා දේශපාලන අයිතීන් හා අභිලාෂයන් සහමුලින් ම ආරක්ෂාවිය යුතු ය.

1974 ජුනි 14 වන දා වැනිදා වඩුක්කොඩ්ඩෙට රැස් වූ දෙමළ එක්සත් පෙරමුණේ නායකයෝ මෙවැනිම ප්‍රකාශයක් කරමින් ''තමිල් තේසම'' හෙවත් දෙමළ ඊළමයක් සඳහා වූ වඩුක්කොඩේ ප්‍රකාශය ඉදිරිපත් කළ හ. දශක ගණනාවක් ගලා ගියේ වඩුක්කොඩේ ප්‍රකාශයේ රුහිරු වන්දි ය. ඔලුවිල් ප්‍රකාශයේ රුහිරු වන්දිය කොපමණක් ද යන්න ඉතිහාසය විසින් තීරණය කරනු ඇත.

## ලංකාවේ ඉස්ලාමීය මූලධර්මවාදී අධ්‍යාපනය

ඉස්ලාමීය මූලධර්මවාදය විවිධ හේතූන් නිසා වැඩේ. වැඩෙන ජනගහණය, අධික ජන ඝනත්වය, තරුණ ප්‍රතිශතය, ආර්ථික සමාජයීය හා දේශපාලනික බලය එයින් ඇතැම් හේතූන් ය. මේ සියල්ල පිපිරීමක් බවට පත් කරන්නේ ඉස්ලාමීය මූලධර්මවාදී අධ්‍යාපනය ය.

පසුගිය දශකය තුළ ඉස්ලාමීය අධ්‍යාපනය රැඩිකල් ලෙස වර්ධනය විය. මෙය ආකාර කිහිපයකට සිදුවේ.

1. මක්තාබ් (කුරානීය පාසල්)
2. මද්රාෂා (අරාබිය විද්‍යාල)
3. ඉස්ලාමීය පෙර පාසල්
4. මුස්ලිම් පාසල්
5. මුස්ලිම් ගුරු විද්‍යාල
6. මුස්ලිම් විශ්ව විද්‍යාල

**මක්තාබ් :-**

රජයේ සංඛ්‍යා ලේඛන අනුව 1929 දි මක්තාබ් කුරානීය පාසල් 181 ක් ලංකාවේ පැවතිණි. එයට සිසුන් 5000 ක් පමණ සම්බන්ධ වී සිටියහ. නමුත් 1997 වන විට රජයේ ලියාපදිංචි මක්තාබ් කුරානීය පාසල් ප්‍රමාණය

පමණක් 1087 කි. මෙය 300 කට පමණ රජයේ මූල්‍ය ආධාර ලැබේ.

මක්තාබ් කුරානිය පාසල්වල දියුණු අවධිය අහදියා පාසල් ය. 1997 වන විට එවැනි පාසල් 166 ක් ලංකාවේ පැවතිණි. මේවාට රජයේ ආධාරවලට අමතර ව සවුදිය, කුවේටය, ඉරානය හා පාකිස්ථානය මූල්‍ය ආධාර හා වෙනත් සේවාවන් ලැබේ.

**මද්රාෂා:-**

වර්ෂ 1900 දී අරාබි බසින් ක්‍රියාත්මක වූ මද්රාෂා මූලධර්ම විද්‍යාලයක් වූයේ හතරක් පමණි.

1. මක්කියා අරාබි විද්‍යාලය - ගාල්ල (1870)
2. මද්රාෂාතුල් බාරි අරාබි විද්‍යාලය - වැලිගම (1892)
3. අල් බහජතුල් ඉබාහාමියා අරාබි විද්‍යාලය - ගාල්ල (1892)
4. සහදියා අරාබි විද්‍යාලය - කින්නියා - ත්‍රි'මලය (1899) පමණි.

ලංකාවේ දකුණු ප්‍රදේශයෙන් මුල් ම ඉස්ලාමීය මූලධර්මවාදී අධ්‍යාපනය බිහි වූ බව පෙනේ. ඉන්පසු එය නැගෙනහිරටත් පසුව රට පුරාමත් ව්‍යාප්ත විය. 1948 වන විට තවත් විද්‍යාල 4 ක් එයට එකතු විය.

5. අල් මින්නතුල් පසියා අරාබි විද්‍යාලය - මාතර (1915)
6. මයිතුල් අරාබි විද්‍යාලය - දර්ගා නගරය (1918)
7. අල් මද්රාෂාතුල් කසිමියා අරාබි විද්‍යාලය - පුත්තලම (1925)
8. ගපූරියා අරාබි විද්‍යාලය - මහරගම (1931)

මෙකී මූලධර්ම විද්‍යාලයන් සියල්ලම විදේශ ආධාර නිසා දැවැන්ත නවීන විද්‍යාලයක් බවට පත් ව ඇත. ඇෆ්ගන්, පාකිස්තානු, බංගලාදේශ ගුරුවරුන් පවා මෙහි ඉගැන්වීම කරති.

වසර 2000 වනවිට මද්රාෂා විද්‍යාල 86 ක් ඇති වී තිබිණි. එයින් 29 ක් නැගෙනහිර පළාතේ ද, 13 ක් දකුණු පළාතේ ද, 17 ක් වයඹ පළාතේ ද, 08 ක් මධ්‍යම පළාතේ ද විය. කුඩා පරිමාණයේ මද්රාෂා පාසල් 700 ක් 2003-2010 අතර ඇති කිරීම සඳහා සවුදි අරාබිය අරමුදල් සපයා දීමට පොරොන්දු වී ඇත.

මූලධර්මවාදයේ පිම්ම සනිටුවහන් වූයේ ශුද්ධ මුස්ලිම් විශ්ව විද්‍යාලයක් අෂ්රෆ් විසින් 1995 දී පිහිටුවීමත් සමග ය. එයට ගලා ආ විදේශ ආධාර නිසා රජයේ සෙසු ප්‍රදේශවල ඇති කළ අනෙකුත් විශ්ව විද්‍යාල (සබරගමු, රජරට, ඌව, වයඹ ආදි) පණ අදිත් දී එය සීඝ්‍රයෙන් නවීන විශ්ව විද්‍යාලයක් බවට පත්විය. ඉන්දීය නිදහස් සටන් වෙනුවෙන් අලිගාර් මුස්ලිම් විශ්ව විද්‍යාලය කළ දේට වැඩි යමක් අග්නිදිග ඔළුවිල් විශ්ව විද්‍යාලය විසින් මුස්ලිම් දේශයක් වෙනුවෙන් ඉටු කරන බව 2003 ජනවාරි 29 දා අග්නිදිග විශ්ව විද්‍යාල භූමියේ දී ඔළුවිල් ප්‍රකාශය එළි දැක් වූ අවස්ථාවේ කථිකයන් ප්‍රකාශ කළ බව කියැවේ. එයින් ම එය අද මුස්ලිම් මූලධර්මවාදයේ තොටිල්ල බව පැහැදිලි වේ.

### හත්වන පරිච්ඡේදය

# කුරුස යුද්ධය

1993 පෙබරවාරි 13 වන දා රියාද්හි පළ වන සවුදි ගැසට් පුවත්පත මෙසේ කීවේ ය. ''...... පාප්තුමා හා ඔහුගේ මාධ්‍ය සගයින්ට අවශ්‍ය ව ඇත්තේ ලොවපුරා නීතියක් නැති අරාජිකත්වයක් ඇති කිරීම ය. එමගින් ජාතීන්ගේ ආර්ථික ශක්තිය බිම්බත් කිරීම ය. දැන් සූඩානයේ සිදු වී ඇත්තේ එයයි. ක්‍රිස්තියානි (බෙදුම්වාදි කැරැල්ලක්) අවනීතියක් විසින් සූඩානය ආර්ථික හා සමාජයීය ලෙස බිමට වට්ටවා ඇත. ඉන් පාප්තුමා එයට ''සාමය ගෙන දීම'' සඳහා එහි යයි. එහි තේරුම මුස්ලිමුන් ක්‍රිස්තියානිකරණය කිරීම ය. පල්ලිය දැන්වත් අවනීතිය රජ කරවීම, අරාජිකත්වය ඇති කිරීම, ආර්ථිකයන් බිම්බත් කිරීම රටවල බෙදුම්වාදයන් ඇති කිරීම මගින් අසරණ බවට පත්ජනයා ක්‍රිස්තියානියට හැරවීමෙන් වැළකිය යුතු ය.......''

සවුදි පුවත්පත් දෙවන ජුවාම් පාවුළු පාප්තුමාට එසේ චෝදනා කරද්දි එතුමා අල් තුරාබි සමග සූඩානයේ ක්වාර්ටුම් නගරයේ සාකච්ඡාවක නියැළී සිටියහ. උන්වහන්සේගේ සූඩාන චාරිකාවේ දි අරමුණ වුණෝ දකුණු සූඩානයේ වාසය කරන (එවකට) ලක්ෂ හැත්තෑවක් වූ ක්‍රිස්තියානි ජනයා ඉස්ලාම් මූලධර්මවාදි ප්‍රහාරයන්ගෙන් ගලවා ගැනීම ය. ඒ වන විටත් කිතුනුවෝ සූඩාන ජනතා විමුක්ති හමුදාව යටතේ සූඩානය බෙදීම සඳහා සටන් කරමින් සිටියහ.

පුදුමය නම් පාප්තුමා හා තුරාබි අතර ක්‍රිස්තියානි - ඉස්ලාම් සාකච්ඡා පැවැත්වෙද්දී එය පිටුපසින් සිටින්නේ ඔසමා බින් ලාදන් වීමය! ඔසමා ඒ දිනවල එ. ජනපදයට එරෙහි ව සෝමාලියානු යුද මෙහෙයුම් කරමින් සිටියේ ය. ඔහුට එරෙහිව කුරුස යුද්ධය මෙහෙයවීම වතිකානුවේ ''ඕපස්දෙයි'' හෙවත් ''දේවකාරිය'' (Gods Work) ට පැවැරී තිබිණි.

ලෝකයේ බොහෝවිට මාධ්‍ය මගින් කතා කරන්නේ ඉස්ලාමීය මූලධර්මවාදය පිළිබඳ පමණ කි. නමුත් සත්‍යය නම් ඉස්ලාමීය මූලධර්මවාදය මෙන් එළිපිට සිදු නොවුණත් ක්‍රිස්තියානි මූලධර්මවාදය ඉස්ලාමය බිහි වූ දා සිටම එය සමග සටන්කර ඇති බව ය. වත්මනේ ඊනියා ත්‍රස්ත විරෝධී ලෝක ව්‍යාපාරයේදීත් යටින් හූයක් ලෙස දිව යන්නේ ක්‍රිස්තියානි මූලධර්මවාදයයි.

විශේෂයෙන් පසුගිය දශ වර්ෂය තුළ ලොවේ ඇති වූ බොහෝ කැළඹිලිවල පදනම වූ කලී ක්‍රිස්තියානි - ඉස්ලාම් ශිෂ්ටාචාර ගැටුමයි. එයට හසුවීමෙන් කිතුනු ඉස්ලාම් අහිංසකයෝ ද, ඒ දෙකටම අයත් නොවූ බැවින් බෞද්ධ හින්දු ආදි වෙනත් ආගමිකයෝ ද බොහෝ ලේ හලා ඇත. ක්‍රිස්තියානි මූලධර්මවාදයේ මේ ක්‍රියාවන් පිළිබඳ ව වෙනම කෘතියක් ලිවිය යුතු මුත් ඒ පිළිබඳ ව මද හැඳින්වීමක් පමණක් කරන්නේ ඉස්ලාම් මූලධර්මවාදය හුදු ක්‍රියාවක් පමණක් නොව ප්‍රතික්‍රියාවක් ද පෙන්වීම සඳහා ය .

ප්‍රකෝටිපති බැංකු කරුවෙකු වූ රොබාර්ටෝ කැල්වි මෙසේ ලියයි. ''මා විසින් විශ්වාසවන්තයින් ලෙස සැලකූ සියල්ලන් විසින් අත්හැර දමන ලද පාවා දෙන අයෙක් බවට මා දැන් පත්ව ඇත. මට මතක් වෙන්නේ ශාන්ත පීතර දෙව් මැදුරේ (වතිකානුව) නියෝජිතයින් විසින් මා හට බාර දුන් ව්‍යාපෘති මා කොතරම් සැලකිල්ලෙන් කළා ද යන්න ය. මම ලතින් ඇමරිකාවේ කිතුනු ආණ්ඩුවලට අවි ලබා දුන්නෙමි. ඒ අර දෙවියන්ට එරෙහි කොමියුනිස්ට් සාතන්ලා අවසන් කිරීම සඳහා ය. ඒ සමූහ ඝාතන අවිවලට පින් සිදුවන්නට වතිකානුවට අද පේරු, ආර්ජන්ටිනා, කොලොම්බියා හා නිකරගුවාවේ ''දේව ආණ්ඩු'' ගැන පුරසාරම් දෙඩිය හැක.

''මට දැන් වෙහෙසයි'' ඇත්තෙන්ම වෙහෙසයි. තවත් නම් මෙය දරා සිටින්නට නොහැකියි. වතිකානුව දැන්වත් මගේ මුදල් ආපසු දිය යුතු ය. මෙම ඩොලර් මිලියන 1000 ක් (බිලියන1 ක්) වතිකානුවට සහයෝගය පිණිස දුන්නෙමි. දකුණු ඇමරිකාවේ රටවල් පහක වතිකානු හිතවත් ආණ්ඩු හා රාජ්‍ය නොවන ව්‍යාපාර සඳහා මම තවත් මිලියන සිය ගණනක් දුන්නෙමි. මගේ හදවත හා හිත සන්සුන් කර ගැනීමට මගේ මුදල් මට ආපසු දෙන්න. කැසරෝලිට්, සිල්වෙස්ට්‍රිනිට් මැකින්කස්, මෙන්නනි මට සැනසීමේ ඉන්න දෙන්න!

රොබාර්ටෝ කැල්විට ඉක්මණින්ම සදාකාලික සැනසීම ලැබිණි. ඔහුගේ ගිලී ගිය මළ සිරුර ලන්ඩනයේ තේම්ස් නදියෙන් හමුවිය. ආරම්භයේදී එය සිය දිවි නසා ගැනීමක් ලෙස හැඳින්විණි. මන්ද කැල්විගේ සාක්කුවල බරැති  ගල් අසුරා තිබූ නිසා ය. නමුත් කැල්වි පවුල කළ පුද්ගලික රහස් පරීක්ෂණයකින් හෙළි වුණේ කැල්වි ඝාතනය කරන ලද බවයි. සාක්කුවල ගල් පුරවා දියේ ගිල්ලවීම මුදල් වංචාකාරයන්ට කාලයක සිට දුන් දඬුවමකි. එය සිදු කර තිබුණේ ඕප්ස්දෙයි විසිනි.

අල්කයිදා මෙන්ම ඕප්ස්දෙයි ද ජාත්‍යන්තර බහුජාතික ආයතනයකි. වරෙක එය රෝමානු කතෝලික පල්ලිය තුළම ක්‍රියාත්මක වන ආයතනයකි. තවත් එය සම්ප්‍රදායික කතෝලික කම රැකගන්නා අධ්‍යාත්මික ව්‍යාපාරය කි. තවත් විටෙක එය පල්ලියට අරමුදල් ඉපයීම හා ආයෝජනය සඳහා වූ බහුජාතික බැංකු ජාලයකි. තවත් විටෙක එය වතිකානුවට සම්බන්ධ ස්වේච්ඡා හා රාජ්‍ය නොවන සංවිධානවලට අරමුදල් සපයන සුභසාධන සංගමයකි. තවත් විටෙක එය රාජ්‍යයන් වල (ස්පාඤ්ඤය, ප්‍රංශය හා ඉතාලිය විශේෂයි)




පාප් වහන්සේගේ සුඩාන චාරිකාව

රාජ්‍ය නායකත්වය හා ඇමති මණ්ඩලය තෝරා ගන්නා හා මෙහෙයවන්නා ය. තවත් විටෙක එය පාප්තුමා තෝරන්නා මෙන්ම වතිකානුවේ ආරක්ෂකයා ය. තවත් විටෙක එය ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ට ලොව පුරා අවි සපයන්නා ය. ත්‍රස්තවාදය හා බෙදුම්වාදය පෝෂණය කරන්නා ය.

ඕප්ස්දෙයි හෙවත් දේවකාරිය බිහි කළේ 1902 දී මෙලොව එළිය දුටු ජෝසේ මරියා එස්ක්‍රුැවිය විසිනි. ස්පාඤ්ඤය එවකට 13 වැනි අල්පොන්සෝ රජු යටතේ විය. ස්පාඤ්ඤය වනාහි තාරික්ගේ යුගයේ සිට ම සමූල ඝාතනය මගින් ඉස්ලාමය වනසා කතෝලිකරණය ජය ලැබූ භූමිය යි. ක්‍රි.ව. 732 දී දී චාර්ල්ස්, මාර්ටෙල් පොයිටියර්ස් හිදී මුස්ලිම් හමුදා පරාජය නොකරන්නට මුළු යුරෝපයට ඉස්ලාම් වීමට බොහෝ විට ඉඩ තිබිණි. තවමත් ඉස්ලාම් මූලධර්මවාදීන් යුරෝපය දාර් අල් ඉස්ලාම් හෙවත් ඉස්ලාමයේ භූමිය ලෙස සලකති. මේ නිසා යුරෝපය කෙසේ වෙතත් එයින් බැට කෑ ස්පාඤ්ඤය හැමවිටම කතෝලික පල්ලියේ සටන් බිමවිය. මුල්වරට යුරෝපයෙන් ඔබ්බට කඩුව හා බයිබලය ගෙන ගියේ ද ස්පාඤ්ඤය හා පෘතුගාලයයි. ඉස්ලාමයට සවුදි අරාබිය කෙසේ වෙත් ද කතෝලික මූලධර්මවාදීන්ට රෝමය හෝ ඉතාලියටත් වඩා වැදගත් රට වන්නේ ස්පාඤ්ඤයයි. ජෝසෝ මරියා උපත ලබන්නේත් පසුව පූජකවරයා ලබාගැනීම සඳහා දේව ධර්ම විද්‍යාලයට ඇතුළත් වන්නේත් එවැනි ස්පාඤ්ඤ සභාවක ය.

මේ දිනවල ස්පාඤ්ඤය මොරොක්කෝවේ නිදහස් සටන මර්ධනය කිරීමට සටන් කරන කාලයයි. අබ්දි අල් කරීම් ගේ මොරොක්කෝ ගරිල්ලා හමුදා සමඟ සටනින් මතු වන්නේ ප්‍රැන්කෝ නම් යුද සෙනෙවියා ය. මේ අතර පළමු ලෝක සංග්‍රාමයෙන් පසු යුරෝපයේ ඇතිවන ''විප්ලවීය අසහනය'' ස්පාඤ්ඤයට ගලා එයි. රුසියානු විප්ලවය (1917) හා ඉතාලියේ පැසිස්ට් විප්ලවය (1923) එයට තදින් බලපායි. සමාජවාදී අදහස් දැරුවත් රජතුමා පළවා හැර ජනරජයක් පිහිටුවීමට උත්සාහ කරන අතර රාජාණ්ඩුවාදීන් වැඩි වැඩියෙන් හමුදා නායකත්වයේ සරණ පතති. මොරොක්කෝ කැරැල්ලට අමතරව ස්පාඤ්ඤය තුළ බෙදුම්වාදයන් (බාස්ක් - ETA) ඇති වේ. ලෝක ආර්ථික අර්බුදයට ද එය හසුවේ. අන්තිමේදී ස්පාඤ්ඤයට හමුදා පාලනයන් පැමිණේ. (1923) නමුත් එය අර්බුදයට ගොස් ස්පාඤ්ඤය ජනරජයක් කිරීමේ සටන සමාජවාදීහු අරඹති. ඔවුහු රටින් කොටසක් අල්ලා ගනිති. මෙයට එරෙහිව සම්ප්‍රදායික පල්ලිය ද හමුදාව ද පැන්කෝ පසුපස සිටගනී. අන්තිමේදී ස්පාඤ්ඤ සිවිල් යුද්ධයෙන් ප්‍රැන්කෝ ජයග්‍රාහකයා වන්නේ බෙනිටෝ මුසොලිනි හා ඇඩොල්ෆ් හිට්ලර්ගේ සහායෙනි. මුල් යුගයේද පාප්තුමා පැසිස්ට් ඉතාලිය හා නාසි ජර්මනිය

සමග සිටි බව රහසක් නොවේ.

ජොසේ මරියා එස්ක්‍රැව්යා පූජකවරයා 1925 දී ලබා ගනී. එතැන් සිට ඔහු වෙන ගමනක් අරඹයි. ඔහුගේ ම වචනවලින් කිවහොත් ඔහුගේ කාර්යය වන්නේ ''මුළු ලොවම ජේසුගේ අණ යටතට ගැනීමයි''. 1929 දී ඔහු නිල වශයෙන් ඕප්ස්දෙයි (Opus Dei) පිහිටුවයි. සිවිල් යුද්ධයේ දී ඔහුගේ පූර්ණ සහාය ජයග්‍රාහි ප්‍රැන්කෝට ලැබෙන අතර එමගින් රාජ්‍ය අනුග්‍රහය ලබා ගනී. ස්පාඤ්ඤයේ ධනවතුන්, හමුදා නිලධාරීන් හා පූජකයින් ආදී ප්‍රභූවරුන් විනිවිද යන්නට ඔහු සමත් වේ. එහෙයින් ඔහු තම රහසිගත සංවිධාන රටාව හා ඇදහිල්ල වතිකානුවට ගෙන යයි. වැඩිකල් නොගොස් වතිකානුව මෙහෙයවන්නා බවට ඕප්ස්දෙයි පත්වේ. මතුපිටින් පෙනී ගියේ එස්ක්‍රැව්යා දිව්‍යමය ප්‍රේමය කතෝලික සභාවට ගෙන ආ බවක් ය. නමුත් ඕප්ස්දෙයි විචාරකයින් කියන්නේ එහි පදනම ප්‍රේමය හා කරුණාව නොව 'බිය' බවයි. පූජක පෙල්ස්මන් ඕප්ස්දෙයි වෙතින් ඉවත්වීමෙන් පසු ප්‍රකාශ කළේ ''දේවකාරිය හෙවත් ඕප්ස්දෙයි තමන්ගේ සාමාජිකයන්ගේ බැඳීම පවත්වා ගන්නේ ප්‍රේමය මත හෝ, දැඩි සංවිධාන විනය මත හෝ නොවේ. බිය පදනම් කරගෙන ය. භීතිය-ප්‍රේමය, මුදල් හෝ භක්තියට වඩා හොඳින් සංවිධානයන් පාලනය කරයි.

ඕප්ස්දෙයි බිහිවන්නේ හා පැතිරී යන්නේ රාජාණ්ඩු හා පූජක විරෝධී ජනරජවාදීන්ගේ භීතිය තුළ ය. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු එය කොමියුනිස්ට් භීතිය විය. ඉන්පසු දැන් එය ඉස්ලාම් මූලධර්මවාදයේ භීතිය බවට පත්ව ඇත.

ඕප්ස්දෙයි නිතර පවසන්නේ රෝමානු අධිරාජ්‍යය ඇද වැටෙන බව එහි සිටි ජනයා නොදැන සිටියා සේ වත්මන් වතිකානු අධිරාජ්‍යය බිඳ වැටෙන බව ශ්‍රාවකයෝ නොදන්නා බව ය. ඒ නිසා උවදුරුවලින් කලින්ම රැක ගැනීම දේවකාරිය යි.

අන් බොහෝ කතෝලික අධ්‍යාත්මික ව්‍යාපාර මෙන් නොව ඕප්ස්දෙයි විවෘතව ම ''කුරුස යුද්ධය'' තම ව්‍යාප්තවාදයේ අංගයක් ලෙස ගනියි.

විශ්වීය ප්‍රේමය ගැන නව ගිවිසුමේ ජේසුතුමා කළ අවධාරණය නිසා 'යුද්ධය' පිළිබඳ ව ම ''කුරුස යුද්ධය'' පිළිබඳව විචිකිච්ඡාවක් ආරම්භයේ සිට ම ක්‍රිස්තියානියේ තිබිණි. කොන්ටන්ටයින් විසින් 4 වන සියවසේදී ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම කළ විට සෙසු ඇදහීම් 400

කට අධික ප්‍රමාණයක් විනාශ කරල ලදී. මෙය හිතෝපි ඔගස්ටයින් (354-430) විසින් යම් දුරකට සාධාරණීකරණය කරන ලදී. ඔහු මෙසේ ලියා ඇත.

''අත්‍යවශ්‍ය වූ විට යුද කළ යුතු වෙමු. ඒ දෙවියන් වෙනුවෙන් කළ යුතු අතර සාමය ළඟා කර ගැනීම එහි අවශ්‍යතාවය විය යුතු ය.....'' (453-Their Kingdom Come-Robert Hutchison) එයට වසර අටසීයකට පසු මධ්‍යකාලීන යුගයේදී තෝමස් අක්වයිනාස් තුමා දෙවියන් සිටින බවට සබුද්ධික තර්ක පහක් ගෙන ආවා සේ යුද්ධය සඳහා ''සාධාරණ යුද්ධය'' (Just War) නම් සංකල්පයක් හඳුන්වා දුන්නේ ය. ඒ අනුව.

1. යුද්ධය රාජ්‍යයක් හෝ නිල ආයතනයක් මගින් සිදු කළ යුතු ය.

2. එහි අරමුණ සාධාරණ විය යුතුය.

3. නරක පරදවා 'හොඳ' මතු කරලීම ප්‍රතිඵලය විය යුතු ය.

මේ මගින් ඉස්ලාමයට එරෙහි ව කළ කුරුස යුද්ධයත් වෙනත් යුද ක්‍රියාත් සඳහා සෛද්ධාන්තික පදනමක් ලැබිණි. ඒ මගින් ඉස්ලාමීය ජිහාද් වෙනුවට ක්‍රිස්ත්‍රියානි ''සාධාරණ යුද්ධය'' විකල්පය විය. 1994 දී පාප්තුමා සාධාරණ යුද්ධයක් සඳහා වූ අවශ්‍යතා රීතිගත කරන ලදී.

1. ආක්‍රමණිකයා විසින් සිදුකර ඇති විනාශය ජාතියක හෝ ජන කණ්ඩායමක අවසානය ගෙන දෙන බවට හැඟී ගියවිට
2. ආක්‍රමණය වැළැක්වීම සඳහා යොදා ගත් සියළු අන් මාර්ගයන් ඵල විරහිත බව පෙනී ගිය විට
3. ජයග්‍රහණය ලැබිය හැකි බව පෙනී ගියවිට
4. යුද්ධ බලය විසින් ජනනය කරන ප්‍රතික්‍රියාවන් හා අපරාධ ආක්‍රමණය නිසා ඇති වී තිබෙන විනාශයන් ඉක්ම නොය න ලෙස

ජාතියකට, ජනවර්ගකට හෝ ජන කණ්ඩායමකට සාධාරණ යුද්ධය කිතුනු දැක්ම තුළ කළ හැකි ය.

මේ නව රීති අත්හදා බලන ලද්දේ කෝවීශ්‍රියාව හා පසු ව ටිමෝරය තුළ ය.

පසුගිය සියවස තුළ අමානුෂික ම සමූහ ඝාතන සිදුවුණේ රුවන්ඩාවේ ය. බොහෝ මාධ්‍ය විසින් වසන් කළ ද රුවන්ඩාවේ හා බුරුන්ඩිය ඇතුළු අවට රටවල් වෙළාගත් හුටු - ටුට්සි ගැටුමේ ඇතුලාන්තය වුණේ ඉස්ලාම්-ක්‍රිස්තියානි ගැටුම ය. සති කිහිපයක් තුළ අඩු තරමින් දශ ලක්ෂයක් අසරණයන් ඝාතනය කරනු ලැබී ය.

සිවිල් යුද්ධයට පෙර (1994) රුවන්ඩාව බොහෝ දුරට ක්‍රිස්තියානිකරණය කරන ලද රටකි. අන් බොහෝ අප්‍රිකානු රටවල්මෙන් රුවන්ඩාව ද ගෝත්‍රික සීමා පිළිබඳ ව නොසලකා බිහි කරන ලද රටකි. රටෙන් 80 % ක් ශාරීරික වශයෙන් කුඩා හුටු ගෝත්‍රිකයන් වූ අතර 20 % ක් ශාරීරක වශයෙන් උසැති ටුට්සින් විය. නමුත් ඉස්ලාමයේ බලපෑම මත ම යුරෝපීයයන්ට ඒ රටෙන් 90 % ක් පැරණි ගෝත්‍රික ආගම්වලින් ක්‍රිස්තියානීන් බවට පත්කළ හැකි ව තිබිණි. නමුත් රටේ පාලනය හා ආගමික සංස්ථාවල බලය ටුට්සින් විසින් උසුලන ලදී. රුවන්ඩාවේ කතෝලික පූජකයන්ගෙන් අඩකටත් වඩා සුළු ජාතික සුළු ජාතික ටුට්සින් වූයේ අහම්බෙන් නොවේ. අප්‍රිකානු බිෂොප් සමුළුව 1994 මාර්තු 21 දා වතිකානුව මුළු දෙත්දී කාදිනල් ප්‍රැන්සිස් අරින්ස් (අප්‍රිකානු ගෝත්‍රික ආගමක් අතහැර කතෝලික වූවෙකි.) විශ්වයේ පල්ලිය හා අප්‍රිකානු පල්ලිය අතර සහසබඳතා ගොඩනැංවීම ගැන කථා කරමින් සිටියේ ය. ඒ මොහොතේ ඕප්ස්දෙයි රුවන්ඩාවේ 'ටුට්සි විප්ලවයක්' සැලසුම් කරමින් සිටියෝ ය. රුවන්ඩාවේ හුටු ජනාධිපති ජුවනෙල් හබයිරිමානා ඝාතනය කළ ටුට්සින් රටේ පාලන බලය අල්ලා ගත්තේ ය. හුටු විරෝධය පැන නැගුණු අතර වතිකානුව සිටියේ ටුට්සින් සමඟ ය. එක් දිනකදී පමණක් අසරණ පවුල් ලක්ෂ දෙකක් ඝාතනය කර ගංගාවන්ට දමන ලදී. ඊළඟ මොහොතේ හුටු මක්කම වෙත හැරුනහ. සුපුරුදු පරිදි සවුදි අරමුදල් ද, අල්කයිදා පුහුණුකරුවෝ ද එහි ගිය හ. කලක් මාක්ස්වාදියෙකු වූ කොංගෝවේ ලෝරන්ස් කබීලා මෙවර ඕසාමාගේ හා අරාබි තෙල් මිතුරන්ගේ සටන් සගයා විය. ඔවුන් හුටුන්ට ඉගැන්වූයේ එක දෙයකි. එනම් ඔවුන් මෙතෙක් ඇද හූ මරියතුමිය ටුට්සි කාන්තාවක් බව ය! (ඕප්ස්දෙයි අප්‍රිකාවේ හා ආසියාවේ පවතින මාතෘ දේව ඇදහිල්ල උකහා ගැනීම සඳහා මරියතුමිය ඇදහිල්ල යොදා ගනිති. මෙය කොරියාවේත්, ඉන්දියාවේත්, අප්‍රිකාවේත් එක ලෙස වාර්තා විය.) එකෙනෙහිම කැරැල්ල කතෝලික විරෝධී විය. අල්ලාහු අක්බාර් හඬ ගිගුම් දෙන්නට විය. කිගාලිහි ආච්බිෂොප්වරයා ඇතුළු පූජකවරු 103 ක් ද, කන්‍යා සොහොයුරින් 65 ක් ද ඝාතනය කෙරිණි. කන්‍යා මරියතුමියගේ පිළිම



රොබර්ටෝ කැල්වි හා ඝාතනය කළ ඔහුගේ සිරුර



ඕප්ස්දෙයි - ආරම්භකයා ජෝශප් මරියා එස්ක්‍රැවියා



අප්‍රිකාවේ ඉස්ලාම් - කිතුණු ගැටුමට ගොදුරු වූවන්

වෙඩි උණ්ඩවලින් නහවා තිබිණි. නමුත් ඕප්ස්දෙයි අවිතොග විසින් සමූහ සංහාරයක් කර ටුට්සි දේශප්‍රේමී ජනතා පෙරමුණ සිවිල් යුද්ධය ජයගත්ත ද රුවන්ඩාව හා කොංගෝව ඉස්ලාම් හා ක්‍රිස්ත්‍රියානි ලෙස බෙදී වෙන් වී තිබිණි. මෙය පසුව සුඩානයේ ද සිදුවිය. සුඩානය උතුරු හා දකුණ ලෙස බෙදී ගියේ ඉස්ලාමීය හා ක්‍රිස්තියානි ලෙස ය.

අප්‍රිකාව ක්‍රිස්තියානි-ඉස්ලාම්, කුරුස ජිහාදයට ගොදුරු වී විනාශ වී ගිය ලෝකයේ පැරණිතම ශිෂ්ටාචාරයකි. අප්‍රිකාව යුරෝපීය බලයන්ට සහමුලින් යටත් ව තිබූ 1900 දි එහි ජනගහණය මිලියන 106.9 ක් විය. එයින් මිලියන 62.8 ක් ම (59%) ඇදහුවේ ඓතිහාසික ගෝත්‍ර ආගම් ය. උතුරු අප්‍රිකාවේ ව්‍යාප්තව තිබූ ඉස්ලාමය නිසා මිලියන 34.5 ක් (32%) ඇදහුවෝ ය. ක්‍රිස්තියානිය ඇදහුවේ මිලියන 9.9 (9%) කි. නමුත් විසිවන සියවස තුළ ගෙනගිය දැවැන්ත ආගමික ව්‍යාප්තවාදය නිසා 1985 දි අප්‍රිකාවේ ක්‍රිස්තියානි ජනගහණය මිලියන 236.2 (46%) ක් විය. ඉස්ලාම් ජනගහනය මිලියන 215.8 (42%) ක් විය. ගෝත්‍රික ආගම් 12 %ක් දක්වා ඇද වැටිණි. වසර 2000 වනවිට ක්‍රිස්තියානි ජනගහනය 48 % ක් දක්වා වැඩි වී තිබිණි.

මෙයින් පෙනී ගියේ යුරෝපීයන් අප්‍රිකාවේ රන්, මිනිරන්, තඹ, ඇලුමිනියම් හා සාරවත් ඉඩම් පමණක් නොව සිය දහස් ගණනක් ගෝත්‍රික ආගම් විනාශ කළ ආකාරයයි. දකුණු අප්‍රිකාව ඇතුළු අප්‍රිකානු රටවල් බොහොමයක ''නිදහස'' ලැබුණේ ඔවුන්ගේ සම්ප්‍රදායික සංස්කෘතින් විනාශ කරගෙන ඩෙස්මන් ටුටු, නෙල්සන් මැන්ඩෙලා වැනි යුරෝපීයකරණය වූ නායකයින් ස්ථාවර වීමෙන් පසුව ය.

## පෝලන්තයේ රතු බලය බිඳලීම

1980 දි ලෙච් වැලෙසා පෝලන්තයේත් එමෙන් ම ලෝක ජනමාධ්‍ය තුළත් වීරයෙකු විය. නමුත් වසර 2000 වනවිට ඔහු පෝලන්ත දේශපාලනයේ අවලංගු කාසියක් විය. වැලේසා වූ කලී කොමියුනිස්ට්වාදය බිඳලීම සඳහා ඕප්ස්දෙයි විසින් පෝලන්ත ජාතික ජුවාම් පාවුළු පාප්තුමාගේ ආශිර්වාදයෙන් පුම්බනු ලැබූ මාධ්‍ය බෝනික්කෙකි.

70 දශකය අවසන් වෙද්දි කොමියුන්ස්ට් පෝලන්තය බටහිර ණය උගුලේ වැටී තිබිණි. මුළු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 14 ක් ඉක්මවා තිබුණු අතර බටහිර ලෝකය පෝලන්තයේ ආර්ථික ගෙළ සිරකරගෙන

සිටියෝ ය. අන්තිමේදී භාණ්ඩවල මිල එක රැයකින් 40% කින් ඉහළ ගියේ ය. සහයෝගිතා ව්‍යාපාරය වැලේසාගේ නායකත්වයෙන් ඉල්ලීම් 21 ක් මුල්කරගෙන පෙරට ආවෝ ය. ඕප්ස්දෙයි වෙනුවෙන් පෝලන්තය අස්ථාවර කිරීම කාදිනල් වයිසයින්ස්කිට පැවරී තිබිණි. පසු ව වැලේසියා කී පරිදි පාප්තුමාගේ තේරී පත්වීම හා පල්ලිය නොසිටියා නම් කිසිවක් සිදුවන්නේ නැත. 1981 ජනවාරියේ වැලේසා පාප්තුමා හමුවිය. ඕප්ස්දෙයි ඉන්පසු ව පෝලන්තයේ සමස්ත මහා වැඩ වර්ජනය ඇරඹිය. කෝපයට පත් සෝවියට් දේශය, බ්‍රෙෂ්නව් පෝලන්තය ආක්‍රමණය කිරීමට තීරණය කළේ ය. පාප්තුමා බියට පත් වූ අතර වහාම බ්‍රෙෂ්නව් අමතා කතා කරමින් කියා සිටියේ වැඩ වර්ජනය නතර කළ හැකි බවත් ආක්‍රමණය නතර කරන ලෙසත් ය. බ්‍රෙෂ්නව් එකඟ විය. වැලේසියා තනිව ම වැඩ වර්ජනය අත්හැරීමේ තීන්දුව ගත්තේ ය.

ඕප්ස්දෙයි එවිට එ. ජනපදය දෙසට හැරුණේය. ඒ වන විටත් ඔවුහු වැලේසාට අවශ්‍ය අරමුදල් යුනයිටඩ් ට්‍රේඩින් සමාගම හරහා යවමින් සිටියහ. එහෙත් ඔවුනට සල්ලි මෙන් ආයුධ පොම්පයක් ලැබිණි. ඒ කතෝලිකයකු වූ රේගන්ගේ සි.අයි.ඒ. අධ්‍යක්ෂ විලියම් කැසී හමුවීමෙනි. කැසී, වර්නන්, වෝල්ටර්ස් හා ඇලෙක්සැන්ඩර් හේග් සමඟ පැමිණි පාප්තුමා හමු වූහ. ඒ දිනවල එ. ජනපදයේ තීන්දු ගත්තේ ඔවුන් තිදෙනා ය. ප්‍රතිඵලය වූයේ 1982 ජුනි 02 දා රේගන් පාප්තුමා මුණ ගැසීම ය. පෝලන්තය පෙරළා දැමීමේ ඕප්ස්දෙයි විප්ලවයට පූර්ණ සහාය එ. ජනපදයෙන් ලැබිණි.

රොබාර්ටෝ කැල්විට අනුව ඊළඟ වසර කීපය තුළ ඕප්ස්දෙයි විසින් වැලේසාට ලබාදුන් මුදල ඩොලර් මිලියන 1000 කි. පෝලන්තයේ කොමියුනිස්ට් ආධිපත්‍යය බිඳ දැමිණි. පෝලන්තයේ ලෙහෙන්නට පටන් ගත් කොමියුනිස්ට් අධිරාජ්‍යය 1989 වසර තුළ සෝවියට් දේශය ද ලිහා දැම්මේ ය.

කැසී හා ඕප්ස්දෙයි එක් වූයේ පෝලන්තය සඳහා පමණක් නොවේ. 1960 ගණන්වල සිට ලතින් ඇමරිකාවේ වෙළාගෙන පැතිරෙන විමුක්ති දේව ධර්මය පැරදවීම එහි තවත් අංගයක් විය. පල්ලිය දුගියන් සඳහා ය යන සටන් පාඨය යටතේ කතෝලික දැක්ම කොමියුනිස්ට්වරුන් හා මුසු විය. නිකරගුවාව, ගෝතමාලාව, පීරූ, ආජන්ටිනාව, බොලිවියාව, බ්‍රසීලය, එල් සැල්වදෝරය තබා මෙක්සිකෝව පවා මෙයිනි දෙදරුම් කෑවේ ය. ''ඔස්කා රොමයිරෝ'' නම් ජනප්‍රිය විමුක්ති දේවධාර්මිකයා ඝාතනයෙන් පසු මෙය පිම්මක් පැන්නේ ය. විමුක්ති දේවධර්මය පරාජය කිරීම අත්හදා

බලන ලද සංකල්පයකි රැඩිකල් අදහස් සහිත NGO ව්‍යාපෘතිය ය. එය ලතින් ඇමරිකාවේ, පෝලන්තයේ පමණක් නොව පිලිපීනයේ සාර්ථක විය. පිලිපීනයේ ද කොමියුනිස්ට් නව ජනතා හමුදාව (NPA) මුළුමනින් ම උකහා ගැනීමට එයට හැකිවිය.

## ක්‍රෝඒෂියාව බිහිකිරීම

ක්‍රෝඒෂියාවේ කුඩා ගම්මානයක් වූ මෙජගෝරියෝ මරියතුමිය නිසා ප්‍රචලිත වූවකි. ඒ එහි සිටි දැරිවියන් පිරිසකට මරියතුමියගේ පණිවිඩයක් ලැබීම නිසා ය. එය මෙසේ විය. ''සාතන්ට ඔබව යටපත් කිරීමට ඔබ ඉඩදී ඇත''.

මාෂල් ටිටෝ යුගෝස්ලෝවියාව තැනුයේ ග්‍රීක ඕර්තෝඩොක්ස් සර්බියාව, ඉස්ලාම් බොස්නියාව, කතෝලික ක්‍රෝඒෂියාව මූලික වශයෙන් එක්කර ය. නමුත් ටිටෝගේ මරණින් පසු මැද මාවතේ ගිය යුගොස්ලෝවියාව ලෙහී යන්නට විය. සර්බිවරු සිය යුද බලය යොදා බොස්නියා හා ක්‍රෝෂිකා ප්‍රාන්ත ඇඳ බැඳ තබා ගන්නා ලදී. කෙසේ වෙතත් ක්‍රෝෂිකාව සිය නිදහස ප්‍රකාශ කළ අතර එහි ස්වාධිනත්වය පිළිගත් පළමු රට බවට වතිකානුව පත්විය. සර්බියානු පුවත්පතක් වූ "Politika" ප්‍රකාශ කළේ වතිකානුව යුගොස්ලෝවියාව බෙදීමට තැත් කරන බව ය. යුදමය වශයෙන් බලවත් සර්බි හමුදා විසින් ක්‍රෝඒෂියාව අල්ලා ගන්නා ලදී. සටන ඇරඹෙත්ම ක්‍රෝරඒෂියාව සතු වූයේ දුබල මිග් යානා දෙකක් හා යල් පැන ගිය යුද ටැංකි කිහිපයක් පමණි. නමුත් 1993 සැප්තැම්බරයේ හිටි අඩියේ තත්ත්වය වෙනස් විය. මිග්යානා 21 ක් චෙක් රටෙන් මිළදී ගැනිණි. T-55 වර්ගයේ යුද ටැංකි 200 ක්, සෙබළු ගෙන යන සන්නද්ධ ට්‍රක්රථ 400 ක්, කාලතුවක්කු 150 ක්, බහුවිධ රොකට් 35 ක්, හෙලිකොප්ටර් 45 ක් ඔවුනට ලැබිණි. ඒ සහමුලින්ම මුදල් සැපූයේ ඕප්ස්දෙයි විසිනි. ලබාදුන් මුදල ඩොලර් මිලියන 2000 කි.

ඊළඟට ඕප්ස්දෙයි එ. ජනපදයට හැරිණි. බිෂොප් අල්වාරෝ පොර්ට්ලෝ පීටර්බර්ග් කරා ගියේ ය. ඔහුගේ එහි නියාමකයා වූයේ ජෝන් ප්‍රීය. ඔවුන් දෙදෙනා එක් වී ක්‍රෝඒෂියාවේ ඇතිවීමට යන නිදහස් වතිකානු රාජ්‍යය ගැන එ. ජනපදයේ ඉහළ කතෝලිකයන්ට කතා කළහ. ඔවුනතර සිටියෙකු වූයේ ක්ලින්ටන්ගේ FBI අධ්‍යක්ෂ ලුයිස් ජේ ප්‍රී ය. ක්ලින්ටන් පාලනය ඕප්ස්දෙයි වෙනුවෙන් යුතුකම් දෙකක් කළේ ය. එකක් නම් ක්‍රෝට් සන්නද්ධ හමුදාවල පුහුණුව ලබා දීම ය. අනෙක සර්බියාවට නේටෝ

ප්‍රහාරයක් එල්ල කිරීම ය. දින කිහිපයක් ඇතුළත සර්බියාවේ ප්‍රහාරක ශක්තිය මෙල්ල කරනු ලැබී ය. ඕප්ස්දෙයි හමුදා යුරෝපය තුළ තවත් මූලධර්මවාදී රාජ්‍යයක් ක්‍රොඒෂියාව නමින් බිහි කළ හ.

ඕප්ස්දෙයි ක්‍රොඒෂියාව බිහි කරද්දී අල්කයිදා මුස්ලිම් බොස්නියාවට ගොඩවූහ. යුරෝපයේ තවත් මුස්ලිම් රාජ්‍යයක් සවුදි අරමුදල්වලින් හා අල්කයිදාවේ 055 බ්‍රිගේඩයේ ජීවිත පූජාවලින් බිහිවිය.

යුගෝස්ලෝවියාව බෙදා වෙන් කළේ ඕප්ස්දෙයි හා අල්කයිදා ය.

## නැගෙනහිර ටිමෝරය

ලතින් ඇමරිකාවේ සහ මුලින්මත්, අප්‍රිකාව හරි මැදිනුත් බෙදා වෙන්කර ගැනීමට ක්‍රිස්තියානි මූලධර්මවාදය සමත් විය. ඒ තැන්වලදී ඔවුන් අනුගමනය කළ පියවර ගණනක් විය.

මුලින් ම අදාල රටේ තමන්ට බලපෑම් කළ හැකි බෙදුම්වාදී ව්‍යාපාරයක් හෝ ජන වාර්ගික ව්‍යාපාරයකට උපකාර කිරීම ය. මෙය යුද උපකාර වල සිට ප්‍රචාරක යුද්ධයක් දක්වා විවිධ මට්ටම්වලින් සිදු කෙරේ.

ඊළඟට අදාල රටේ ආර්ථිකය බිඳ දැමීම හා දේශපාලන අස්ථාවරත්වය ඇති කිරීම ය. අරාජික තත්ත්වය ඇති වූ විට එය දඩමීමා කරගෙන ආගමික ව්‍යාප්තිය සිදු කරනු ලැබේ.

ඊළඟ පිම්ම වනුයේ රටේ ආර්ථික - යුද මර්මස්ථාන අත්පත්කර ගැනීම හෝ නැගිටිය නොහැකි ලෙස දුර්වල කිරීමයි. ජාත්‍යන්තර මැදිහත් වීම හා බෙදා වෙන්කිරීම ඊළඟට සිදුවේ. මේ සඳහා ජනප්‍රිය ව්‍යපාර හෝ ජනප්‍රිය නායකයින් යොදා ගැනේ.

ඉන්දුනීසියාව නොදැන සිටියාට ඕප්ස්දෙයි පිලිපීනය හා දකුණු කොරියාව තම ආසියානු මූලස්ථානය ලෙස තෝරාගෙන තිබුණේ 1980 ගණන් වලදී මය. සීතල යුද්ධය අවසන් වී සෝවියට් දේශය ඇද වැටීමත් සමග ආසියාව ඕප්ස්දෙයි දඩබිමක් විය. ඉන්දුනීසියාවේ සුහර්තෝ එළවීමෙන් පමණක් නොවේ. ඕප්ස්දෙයිගේ ඉලක්කය වූ බලවත් ඉන්දුනීසියානු හමුදාව බල විරහිත කිරීමෙන් ද පසුව ය. ඊළඟට ජෝර්ජ් සෝරෝස් ඇතුළු ආයෝජකයෝ ආසියානු රටවලින් හිටි අඩියේ ආයෝජන ඇද ගැනීම නිසා ආසියානු මූල්‍ය අර්බුදය ඇතිවේ. (1996-7) ඊළඟට ගුස්මාවෝගේ ටිමෝර

විමුක්ති ව්‍යාපාරය පිම්මක් පනී. ඉන්දුනීසියාව අරාජික වේ. මුස්ලිම් ක්‍රිස්තියානි ගැටුම්වලින් රට ලේ විලක් වේ. ජීවිත රැක ගැනීම සඳහා ඕස්ට්‍රේලියාව මූලිකත්වයෙන් විදේශ හමුදාවක් නැගෙනහිර ටිමෝරයට ගොඩබසී. නැගෙනහිර ටිමෝරය නිදහස් රටක් වේ. (1999)

ටිමෝරය ආදර්ශය ලෙස ගෙන දැන් තවත් බෙදුම්වාද ගණනාවක් ඇති වී ඇත. ඉන්දුනීසියාවේ ඉරියන්ජාවා ගෝත්‍රිකයෝ කිතුනු වෙන්වීමකට දැන් සටන් කරති. බුරුමයේ හා තායිලන්තයේ කේරන්වරු කිතුනු කේරන් දේශයකට සටන් වදිති. මේ සියල්ල පසුපස ඕප්ස්දෙයි සිටිති. අද ඉන්දුනීසියාවේ නම් මුහුණුට මුහුණ සටන් වදින්නේ අල්කයිදා හා ඕප්ස්දෙයි ය.

## එක්සත් ජනපදයේ ක්‍රිස්තියානි මූලධර්මවාදය

ප්‍රැට්ක් මැක්සෝලිට තවමත් ඒ බියකරු දිනය අමතක නැත. ඒ 1986 දී ජූලි මස හිරු නැගුණු සවසකි. ඒ වන විට ඔහු දොලොස් හැවිරිදි දරුවෙකි. ඔහු සිටියේ පුදුමාකාර අසරණකමකිනි. ඒ ඔහුගේ පියා ඒ වන විට සිය දිවි හානි කරගෙන සිටි නිසා ය. ඔහු එළියේ සිය පාපන්දුව සමග සිටිය දී මව ඔහුට නිවස තුළට එන ලෙස හඬ නගා ඇමතුවාය. ඔහු සිය නිවසේ ආලින්දයට ගොඩ වූ විට දුටුවේ බොස්ටන්හි කතෝලික පිය නමක් වූ පූජක ජෝන් ජේග්හන් එහි සිටිනා බව ය. තම මියගිය පියාගේ ආත්මය වෙනුවෙන් ඔහු දෙවියන්ට යාඥා කරමින් සිටින දසුන මැක්සෝලි සසල කළේ ය. කාරුණික පියතුමා ඔයුව තම රථයෙන් 'එළියට'ගෙන ගියේ ය. රසවත් අයිස්ක්‍රීම් එකකින් මැක්සෝලිට සංග්‍රහ කළ පියතුමා දරුවා එය රසවිඳිත්දී සිය මෝටර් රථය පදවන්නට විය. ඒ අතර ඔහුගේ කට හඬ අවදි විය. ''මට ඉතා ම කනගාටුයි පුතා සිදු වූ දෙයට. ඇත්තෙන් ම ඔබ දැන් පියෙකුගේ ආදරයත්, පිරිමි ආදරයත් අවශ්‍යයයි.... මම ඔබට ඇත්තෙන් ම.....'' මැක්සෝලිට පියතුමාගේ කාරුණික වදන් ඇසෙද්දී ඔහුට වැටහුණේ තම කලවා පියතුමා විසින් පිරිමදින බව යි. එය එතැනින් නැවතුණේ නැත. මැක්සෝලි බියෙන් ආතුරව සිටිද්දී පියතුමා තමන්ගේ කාම ආශාවන් තෘප්තිමත් කර ගත්තේ ය. එතැන් සිට මැක්සෝලිට අවුරුදු 27 ක් වනතෙක් ජෝන් ජේග්හන්ගේ ගොදුරක් විය. පසු ව මැක්සෝලි සිය කතාව බොස්ටන් අධිකරණයේ දී හෙළිදරව් කළේ ය. අඩු ම තරමින් කුඩා දරුවන් 130 දෙනෙකු පල්ලියේදී හා සිය මෝටර් රථය තුළ දී ජේග්හන්ගේ ගොදුරු බවට පත් වූ බව එයින් හෙළිදරව් විය. ඇත්තෙන් ම මැක්සෝලි විසින් විවෘත කළේ පැන්ඩෝරාගේ පෙට්ටි ය. එ. ජනපදය පුරා පූජකයින් අතින්

ද කන්‍යා සොහොයුරියන් අතින් ද සමලිංගික හා ලිංගික අපචාරයන්ට හසු වූ දහ දහස් ගණන් පල්ලි ඉදිරියට ආහ. පාප්තුමාගෙන් ඔවුන් ඉල්ලුවේ එක දෙයකි. එනම් ජේසුතුමා නැවත ලබාදෙන ලෙසයි. අසල්වැසියාගේ ප්‍රේමය ලිංගික අපචාරයක් නොකරන ලෙස ය. පූජක ජෝන් ලෙනිගන් අතින් වයස දහතුනේ දී අනාථ වූ මාරි ග්‍රාන්ට් කීවේ ''ඔබව ඔබේ අධ්‍යාත්ම පියවරු අතින් කෙළෙසෙයි නම් අපරාධය දස ගුණයකින් වැඩියි'' කියා ය. දැනට තිස්නව වියේ පසුවන ඇයගේ කඳුළු වියැකී නැත.

ඇමෙරිකානු පල්ලියේ තම පියවරුන් සහ කන්‍යා සොයුරියන්ගේ අපචාර පිළිබඳ ව පාප්තුමා කලබලයට පත් වුයේ එ. ජනපද මාධ්‍ය ජාලය ඒවා මහා පරිමාණයෙන් ප්‍රචලිත කරන්නට පටන් ගත් විට ය. ලෝකයේ සන්නිවේදන ආධිපත්‍ය හිමි රට වූ එ. ජනපදය එල්ල කළ ප්‍රහාරය රෝමානු කතෝලික පල්ලියට දරා ගත නොහැකි විය. ඕප්ස්දෙයි මෙය සැලකුවේ එ. ජනපදයේ මාධ්‍ය ජාලය හිමි යුදෙව් හා කතෝලික විරෝධී කිතුනු ආගමික කල්ලි විසින් තමන්ට එරෙහිව  කරන ප්‍රචාරක යුද්ධයක් ලෙස ය.

නමුත් මිෂෙල් ෆුකෝ බොහෝ කලකට පෙර පෙන්වා දුන්නේ යුරෝපයේ වීදි ගණිකාව ක්‍රිස්තියානි සුචරිතවාදයේ ප්‍රතිඵලයක් වන්නාසේ ම පිරිමි හා කාන්තා සමලිංගිකවාදය පල්ලියේ අල්තාරය පිටුපසු කොටු කරන ලද නිරෝගී පිරිමින් හා ගැහැනුන්ගේ ස්වාභාවික දේවකාරියක් බව ය. මිෂෙල් ෆුකෝ පවා සමලිංගිකයෙකු වූ අතර ඒඩ්ස් රෝගය හරිහැටි හඳුනා ගැනීමටවත් පෙර එය විසින් බිලිගත් විශිෂ්ඨ පශ්චාත් නූතනවාදී දාර්ශනිකයෙක් විය.

එක්සත් ජනපදය ආගමික අතින් මූලධර්මවාදයේ තෝතැන්නකි. ඉස්ලාම් මූලධර්මවාදය සඳහා සවුදි අරාබිය ප්‍රමුඛ අරාබි ලෝකය මුදල්, ප්‍රචාරනය හා සෙබළුන් ලබා දෙන්නේ කෙසේ ද ක්‍රිස්තියානි මූලධර්මවාදය ප්‍රචාරය වන්නේ එ. ජනපදයේ හමුදා ප්‍රචාරක ජාලය හා හමුදා බලය විසිනි. නමුත් එය සවුදි අරාබිය මෙන් විවෘතව සිදු නොකරයි. එය සිදුවන්නේ අතිශය සූක්ෂ්ම ආකාරයට ය. නමුත් ඇතැම්විට කට බොරු කිව්වත් දිව බොරු නොකියන සේ අන්‍යාගමික වෛරය දෝරේ ගලා පිය ව යයි. 9/11 ප්‍රහාරවලින් පසු ඔසාමා පමණක් නොව මහමත්තුමා පවා ත්‍රස්තවාදියෙකු බව ප්‍රකාශ කළ, ක්‍රිස්තියානා මූලධර්මවාදීන් ගණන දෙතුන් දෙනෙකු නොවේ. ඒ අතර ජෝර්ජ් බුෂ්ගේ පුද්ගලික පූජක තැන ද සිටියේ ය.

එක්සත් ජනපදයෙන් 24.5 % ක් රෝමානු කතෝලික වන අතර ඔවුන් එහි විශාලතම ජන කණ්ඩායම ය. ඔවුන් අතුරින් 29 %ක් ම ස්පාඤ්ඤ

ලෙස සහිත හිස්පැනික්වරුන් ය. සුදු ජාතිකයන් ගණන 64% කි. කළුජාතිකයන් හා ආසියාතිකයන් 3 % බැගින් සිටිති. නමුත් එ. ජනපදය කතෝලිකවාදය සිටින්නේ පසු බසිමිනි. 1960 වසරේදී ලක්ෂ එක හමාරක් කතෝලිකකරණය වූ නමුත් 2001 දී එය 80,000 කගේ තත්ත්වයට පත් ව ඇත. පූජකවරය සඳහා සෙමනේරිවල අධ්‍යාපනය ලබන පිරිස 1965 දී 1965 දී 40,000 ක් පමණ වූ අතර 2001 දී එය 5000 ක් පමණ ය. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ රෝමානු කතෝලික නොවූ ක්‍රිස්තියානි නිකායන්ගේ බලපෑමයි.

මෙයින් ඉදිරියෙන් ම සිටින්නේ බැප්ටිස්ට්වරුන් ය. ජනගහනයෙන් 16.3 % කි. දකුණේ දේශපාලනය වශයෙන් වඩාත් ප්‍රතිගාමී ප්‍රාන්තවල බලය උසුලන්නේ ඔවුන් ය. ජෝර්ජ් බුෂ්ගේ උරුමය ද එයයි. මෙතොදිස්ත පිරිස 6.8 %කි. ලූතරියානු පිරිස 4.6 %කි. ප්‍රෙස්බිටීරියන් පිරිස 2.7 %කි. පෙන්තකොස්ත පිරිස 2.1 % කි. එපිස්කොපිලියන් පිරිස 1.7 % කි. මෝර්මන් පිරිස 1.3 % කි. ක්‍රිස්තු පල්ලියේ පිරිස 1.2 % කි. මේ සංඛ්‍යාත්මක වශයෙන් කුඩා ආගමික නිකායන්ගෙන් වඩාත් ක්‍රියාකාරී ලෙස මූලධර්මවාදය ව්‍යාප්ත කරන්නේ පෙන්තකොස්ත පල්ලියයි. ක්‍රිස්තියානු මූලධර්මවාදයේ නවීන ප්‍රචාරක උපක්‍රම හා යුද උපක්‍රම බොහොමයක් ඔවුන් විසින් සැලසුම් කෙරේ.

## කිතුනු නිකායික බෙදීම්

ජේසුස් වහන්සේගෙන් පසු කිතුනු දැක්ම දකුණු යුරෝපයේ ප්‍රචලිත වූයේ රහසිගතව ය. එය ප්‍රචලිත කිරීම සඳහා වඩාත් ම කැපවූයේ ග්‍රීක දේව කතාවල එන විවිධ චරිත (සියුස් පිතෘ දෙවි, ඇතීනා දෙවගන, හර්මීස් දිවැසිවරයා, ප්‍රොමිතියස්, ශුද්ධ ආත්මය) හා සංකල්ප එයට මුසුවිය. පසු ව සරතුෂ්වාදය ද, ග්‍රීක දාර්ශනික වාදයන් ද ඉන්දියානු, තිබ්බත ආදී දර්ශයන්ගේ බලපෑම ද ඇතිවිය. 4 වැනි සියවස කොන්ස්ටයින් විසින් ක්‍රිස්තියානිය රාජ්‍ය ආගම බවට පත්කර එයට පටහැනි ව තිබූ ඇදැහිලි විනාශ කරන ලදී. (එය ගණනින් 400 ක් විය. මෙවැනි ම ඇදහිලි ගණනක් අප්‍රිකාවේ හා ඇමරිකාවේ දී විනාශ කරනු ලැබී ය.) ඉන්පසු ක්‍රිස්තියානිය උතුරු හා නැගෙනහිර යුරෝපය පුරා ද ව්‍යාප්ත විය. පළමු කිතුනු බෙදීම ඇතිවුණේ රෝමය හා බයිසැන්ටියම් අධිරාජ්‍ය අතර ඇති වූ දේශපාලන අරගලය නිසා ය. ඉන්පසු රෝමානු කතෝලික හා ග්‍රීක ඕර්තෝඩොක්ස් ලෙස ප්‍රධාන නිකායන් දෙකක් ඇතිවිය. දාර්ශනික ප්‍රශ්න නිසා මතු වූ විවිධ කියවීම් හා නිකායන් එක්කෝ යටපත් කරන ලදී. නැත්නම් මේ ප්‍රධාන

නිකායයන්ට එකතු කර ගන්නා ලදී.

යුරෝපය ලෝකයට විවෘත වීමත් සමඟම සමඟ 16 වන සියවස මුලදී යුරෝපය තුළ බරපතල වෙනස්කම් ඇතිවිය. නූතනවාදයේ හිඹිරිගෙය ඒ සමයේ දී යුරෝපයේ ජනිත විය. රෝමානු කතෝලික පල්ලිය හා පාප්තුමාගේ ආගමික අධිකාරිය ප්‍රශ්න කළ මාටින් ලූතර් (1483-1546) හා කැල්වින් (1509-69) සුවින්ග්ලි ආදීන් නිසා නව නිකායන් දෙකක් බිහි විය. ලූතර් නිසා ප්‍රොතෙස්තන්ත්‍රවාදය බිහි විය. කැල්වින් හා සුවින්ග්ලි ආදීන් නිසා රෙපරමාදුව බිහිවිය. කතෝලික පල්ලිය පවා පුනර්ජීවනයට ලක්විය.

ප්‍රොතෙස්තන්ත්‍රවාදය පසු ව එංගලන්තයේ දී ඇන්ග්ලිකන් නිකාය බවටත් මෙතෝදිස්ත පසු ව පෙන්තකොස්ත නිකායන් බවට පත්විය.

රෙපරමාදුව පසුව බැප්ටිස්ට්, පියුරිටන්, ප්‍රෙස්බයිටරියනිම් කොන්ග්‍රිගේෂනවාදය, ක්‍රිස්තුගේ පල්ලිය ආදිය බවටත් පත්විය. මේ නව කිතුනු නිකායන් බොහොමයක් එක්සත් ජනපදයේ බටහිර හා දකුණු මුහුදු තීරය තුළ ව්‍යාප්ත විය.

## බැප්ටිස්ට්වරු

බෞතීස්මය (ශුද්ධ ස්නානය) පිළිබඳ ජෝන්දි බැප්ටිස්ට් විසින් කළ නව කියවීමක් මෙහි මූලාරම්භය ලෙස සැලකේ. ශුද්ධ ස්නානය යුදෙව්වන්ගේ ද ක්‍රිස්තුට පළමුව සිට පැමිණි චාරිත්‍රයකි. පුනර්ජීවන යුගයේදී කිසිත් නොතේරෙන ළමා වියේදී නොව වැඩිහිටි වූ පසු අවබෝධය තුළින් මෙය ලබා ගත යුතු බවත් කිතුනුකම එතැනින් ඇරඹෙන බවටත් මතයක් පලවිය. ජෝන් ස්මයිත් මෙය එංගලන්තය තුළ ව්‍යාප්ත කිරීමෙන් නූතන බැප්ටිස්ට්වරු ඇතිවිය. 1740 න් පසු හා 1800 න් පසු පරිච්ඡේද දෙකකදී බැප්ටිස්ට්වරු එ. ජනපදයේ වැඩී ගියහ. වහල්භාවය අහෝසි කිරීමේ අරභයා දකුණේ ප්‍රාන්ත කළ සිවිල් යුද්ධයේදී කළු ජාතිකයන් රැසක් බැප්ටිස්ට්වරු වූහ. පසුව සුදු වර්ගවාදය බැප්ටිස්ට් පල්ලිය තුළ බලවත් වීම නිසා කල්ලන් ප්‍රොතෙස්ත්‍රන්තවාදයට ඇදී ගිය හ. එ. ජනපදය තුළ බලවත්ම මූලධර්මවාදී කල්ලිය බැප්ටිස්ට්වරු වන අතර විශේෂයෙන් රිපබ්ලිකන් පක්ෂය තුළ ක්‍රියාකාරී කල්ලියක් ලෙස හැසිරෙති.

## මෙතෝදිස්ත

ජෝන් වෙස්ලි (1703-91) නිසා එංගලන්තයේ ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානියෙන් මතු වූවකි. වෙස්ලි, ලින්කන් කොලිජියේ (ඔක්ස්පර්ඩ්) ඉගෙන ගන්නා සමයේ බයිබල අධ්‍යයන කවයකට බැඳුණු අතර එහි නාමය වූයේ ද මෙතෝදිස්ත ය. ඔහු විසින් ඇමරිකානු කොලනිවල (1735-37) දී මෙතොදිස්තවාදය හඳුන්වා දෙනු ලැබී ය. වෙස්ලි හට 1738 මැයි 24 වන දින දේව බලයක් ලැබුණු බව ප්‍රකාශ වේ. ඔහු ඉන්පසු දේව ප්‍රකාශකයකු (Circuit Preacher) බවට පත්විය. එය පසුව මෙතෝදිස්ත සම්ප්‍රදායක් බවට පත්විය. 1784 දී වෙස්ලි තම නිකායේ පූජකවරය ලබා දිනි. 1794 සිට වෙස්ලි තම නිකායේ වෙන් වී ගියේ ය. නව ගිවිසුම පිළිබඳ වත්, දිව්‍යසීතාවය පිළිබඳවත් වෙස්ලි ලබාදුන් කියවීම මෙතෝදිස්ත දාර්ශනිකව පදනම විය.

උතුරු ඇමරිකාවේ මෙය ශක්තිමත් ව වැඩී ගියේ 1784 දී බැල්ටිමෝරයේ පැවැති ආගමික ක්‍රියාකාරින්ගේ සමුළුවක් සමඟ ය. මෙයින් පසු වෙස්ලි හඳුන්වා සමුළු හරහා සංවිධානය විනය පැවැත්වීමේ මාධ්‍යය ජනප්‍රිය විධි ක්‍රමයක් විය. ඒ මගින් ආගමික විනය සඳහා ඉහළ සිට පහළට සහභාගි වීම සිදුවිය.

## පෙන්තකොස්ත

ජෝන් වෙස්ලිට ලැබුණු සාත්තුවර ආශිර්වාදයට නිසි ඇගැයීමක් ලබාදීම පෙන්තකොස්ත දිනයේ දී සිදු කිරීමෙන් පෙන්තකොස්තවාදයට පදනම වැටිණි. 1901 ජනවාරි 01 දා ඇග්නස් ඔස්මාන් දිවැගින් කතා කිරීම (Glossolawa) දේව භාස්කමක් හා ශුද්ධ ආත්මයේ කියවීමක් ලෙස සැලකීම පෙන්තකොස්තවාදයේ ඒ. ජනපද ආරම්භ ලෙස සැලකේ. කොන්ස්තන්වල බීතල් බයිබල් සමාගමට ගෙන ගිය චාල්ස් පොක්ස් පර්හාම් (1873-1929) මෙහි පදනම දැමී ය. ඇග්නස් සිසුවෙකු විය. කළු ජාතික දේශනාකරුවෙකු වූ විලියම් ජේ. සේමුවර් නිසා මෙයට කළු ජාතිකයින් වේගයෙන් ඇදී එන්නට විය. එමී. සෙම්පල් මැක්පියර්සන් නිසා කාන්තාවන් තුළ ද ව්‍යාප්ත විය. කාන්තා පූජකත්වය ලැබිණි. ශුද්ධ වූ ත්‍රිත්වයෙන් යේසුස් වහන්සේ ප්‍රමුඛ කර ගැනීම හෝ මැවුම්කරු, ශුද්ධ ආත්මය, මරියතුමිය ප්‍රමුඛ කර ගැනීම මත විවිධ නිකායන් ද පසු ඇතිවිය. 1913 දී සියළු කුඩා කණ්ඩායම් එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් ලෙස (දේව සමුළුව) එක් විය. එයින් 'ජේසු පමණයි' ප්‍රවනතාවයට පහරක් එල්ල විය. කෙසේ වෙතත් සාමූහික ඇදහීම පුද්ගලික

මට්ටමට ගෙන ඒමට ද, සුදු නොවන ජනයා හා කාන්තාවන් අතර ව්‍යාප්තියට ද පෙන්තකොස්ත ව්‍යාපාරය තරම් බලපෑමක් කළ වෙනත් මූලධර්මවාදයක් නැත.

1920 ගණන්වල නව පෙන්තකොස්තවාදය බිහිවිය. මෙය දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු පිම්මක් පැන්නේ ය. එයට හේතුව ගුවන්විදුලිය හා රූපවාහිනිය ආගමික ප්‍රචාරය සඳහා යොදාගත් 'ටෙලිවැන්ජලිස්ට්' ව්‍යාපාරය නිසා ය. ජිම් හා ටැමී බෙකර්, ජිමී ස්වැගර් හා පැට් රොබට්සන් මෙයට මූලික වූහ.

පසු ව ටැමී බේකර් මුදල් වංචා සඳහා අත්අඩංගුවට පත්විය. ජිම් බේකර් හා ස්වැගට් කාම අපරාධවලට සම්බන්ධ වීම නිසා එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්ගෙන් ඉවත් කෙරිණි. පැට් රොබට්සන් බැප්ටිස්ට් ප්‍රවාහයට එක් වී රිපබ්ලිකන් පක්ෂයේ මූලධර්මවාදය ශක්තිමත් කළේ ය. 1988 ජනාධිපති අපේක්ෂක ලෙස ඔහුව මූලධර්මවාදීන් විසින් ඉදිරිපත් කරන ලදී. ඔහු පරාජයට පත් වුව ද සී.බී.එන්. (CBN) ප්‍රවෘත්ති ජාලය හා විශ්ව විද්‍යාල තුළ (වර්ජිනියා, දකුණු කැරොලිනා) දැවැන්ත මූලධර්මවාදී ජාලයක් ගොඩනැගීය. එයින් සියුම් ආගමික ප්‍රචාරයත්, දුගී රටවල දක්ෂ සිසුන් ඇදගෙන පසු ව තම මුල් රටවල මූලධර්මවාදීන් ලෙස රෝපණය කිරීමත් සිදු කෙරිණි.

බටහිර ලෝකයේ පල්ලි යාම හා ඉරිදා සාමූහික ඇදහීම දුර්වල වීම මත ගෙදර සිට රූපවාහිනියෙන් හා පුද්ගලික ව ආගම් අදහන තත්ත්වයට පත්වීම පෙන්තකොස්තවාදයේ ව්‍යාප්තිය විය. (ඉරිදා පල්ලි යෑම කැනඩාවේ 1946 දී 67% සිට 1985 32 % දක්වා ද, බ්‍රිතාන්‍යයේ 1939 දී 69 % සිට 1985 දී 24 % ක් දක්වා ද අඩුවිය.) 1980 දී එ. ජනපදයේ පෙන්තකොස්ත ජනයා මිලියන 6.7 ක් වූ අතර 2000 දී එය මිලියන 11 දක්වා වැඩිවිය. 1900 දී ලතින් ඇමරිකාවේ පෙන්තකොස්තවරුන් සිටියේ 50,000 ක් පමණි. 1980 දී මිලියන 20 දක්වා වැඩි වී ගියේ ය. විශේෂයෙන් කතෝලික පල්ලියට අයත්ව සිටියවුන් විමුක්ති දේවධර්මයට ( හා ආශ්‍රිත සමාජවාදයට) ඇදී යෑම වැළැක්වීම සඳහා එ. ජනපදයේ මූලධර්මවාදීන් දැවැන්ත ආගමික මෙහෙයුමක් සිදු කරන ලදී. රාජ්‍ය නොවන සංවිධාන, හාස්කම් හා සුව කිරීමේ මෙහෙයන්, කුඩා කණ්ඩායම් වල ඇදහීම සහිත මේ නව ක්‍රියාවලිය නිසා විමුක්ති දේවධර්මය පමණක් නොව සම්ප්‍රදායික කතෝලික පල්ලිය ද බිඳ වැටිණි. බ්‍රසීලයේ පමණක් මිලියන 6 ක් ජනයා 1960-80 අතර එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් විසින් ඇද ගන්නා ලදී. ආගමික මූලධර්මවාදය එසේ ව්‍යාප්ත

වන අතර චිලී, ආර්ජන්ටිනා, බ්‍රසීලය, නිකරගුවා, එල් සැල්වදෝර්, බොලිවියා වැනි රටවල අන්ත දක්ෂිණාංශික ජුන්ටා පාලනයන් ලවා දැවැන්ත මර්දනයක් දියත් කරන ලදී. මර්දනයද මර්දනදනයේ විලාපයට සහනයක් ලෙස දේව සුවකිරීම ද යන දෙකම එ. ජනපදයේ මධ්‍යම ඔත්තු සේවයෙන් ලැබිණි. 1960 දී පෙන්තකොස්ත ව්‍යාප්තිය සඳහා 62,000 ක් මිෂනාරීන් සිටි අතර 1980 දී එය 2,50,000 ක් තරම් වැඩිවිය. (මෙයින් 50 % ක් උතුරු ඇමරිකානුවෝය.) මෙය 2000 දී ලක්ෂ 5ක් තරම් වූ පිරිසක් වන අතර බහුතරය ආසියානුවන් ය.

## වෙනත් මූලධර්මවාදීන්

ස්කොට්ලන්තයේ ඇති වූ ප්‍රොතෙස්තන්ත ප්‍රවනතාවයක් ලෙස ප්‍රෙස්බිටීරියන් වාදය ඇතිවේ. පල්ලියේ රට පාලනය උදෙසා නියෝජිතවාදය ඉදිරිපත් විය. 1644 ලෝන්ග් දිවයිනෙන් එ. ජනපදයට ඇතුළු විය. එය පසු ව බලවත් මූලධර්මවාදයක් විය.

මොර්මොන් (හෝ LDS) වාදය -1820 දී ජෝසප් ස්මිත්ට වසර 14 දී නිව්යෝර්ක් හිදී දිවැසි බලය ලැබීමෙන් මෙය ඇති වේ. ක්‍රි.ව. 400 දී මියගිය මොර්මන්ගේ පුතු මොරෝනි ස්මිත්ට ආවේශ වීම නිසා මෙහි ආරම්භයයි. ඊජිප්තු රන්පත් මා ශිලා ලේඛන පදනම් කරගෙන නව කෘතියක් 1830 දී නිකුත් වේ. මුලින් සියළු නිකායන් දුරු කිරීමට පැමිණියත් පසු ව සියළු නවකාලීන සාන්තුවරයන්ගේ නිකාය බවට ම පත්වේ.

ජේසුතුමා පවා යුදෙව්වන් යන පදනමෙන් මැක්සිමන් බෙන් ක්ලාසන් (1970 ගණන්වල) මැවුම්කරුගේ පල්ලිය බිහිකරයි. සෙමටික් ජනයා එයට ආකර්ශණය වේ. එ. ජනපදයේ බලගතු යුදෙව් බලවේගය එයට ද උපකාරී කරයි. දැඩි ඉස්ලාමීය විරෝධී තත්ත්වයකට කිතුනුකම ගෙන ගියේ ය.

ජේසුතුමාගේ පල්ලිය රිචඩ් ජී. බට්ලර් හා කූ කැලැක්ස් ක්ලෑන් (K.K.K.) නායක වෙස්ලි ස්විප්ට් විසින් බිහි කරන ලදී. ඔවුන්ගේ මුල් ඉලක්කය වුණේ යුදෙව් බලපෑමෙන් එ. ජනපද රාජ්‍ය යන්ත්‍රය මුදා ගැනීමයි. එය පසුව සුදු (ආර්ය) වර්ගවාදයේ සන්නද්ධ කල්ලියක් බවට පත්විය. ආර්ය ජාතීන් පිළිබඳව වූ අවධාරණය නිසා 1970 ගණන්වල සීඝ්‍ර ව්‍යාප්තියක් ලැබුවේ ය. පසු ව බැස ගොස් 2001--09-11 ප්‍රහාරවලින් පසු යළි බලවත් විය.

ආසියාව පුරා පැතිර තිබුණේ බුද්ධාගම ය. ආසියාවේ බුද්ධාගම ව්‍යාප්තිය නතර වූයේ ඉස්ලාම්කරණය හා කොමියුනිස්ට්වාදයට බෞද්ධ රටවල් ගොදුරු වීමෙනි. කොමියුනිස්ට්වාදය බිඳ වැටීමෙන් පසු ආසියානු රටවල් සීඝ්‍රයෙන් ක්‍රිස්තියානිකරණයට ලක්විය.

ආ-ලෝ- පෙන් සිරියානු නෙස්තූරියන් පූජක තැන විසින් චීනයට ක්‍රිස්තියානිය ගෙන ගියේ ය. එය ඉතා දක්ෂ ලෙස බෞද්ධ හා කොන්ෆියුසියස් දර්ශනය මිශ්‍ර කර නෙස්තූරියානු කිතුනුවාදය ගොඩ නගයි. වසර 845 දී චීන අධිරාජ්‍යයේ තහනමට ලක්වන තුරු කැරලිකාර ලෙස ව්‍යාප්ත වේ. පසුව 13 වන සියවසේදී කැරලිකාර ලෙස මතු වේ. චීන කොමියුනිස්ට් විප්ලවයට එහි මහා පා ගමනේදී පැරණි නෙස්තූරියානු සටන් ක්‍රම උපයෝගී වූ බවට මතයක් ඇත.

ජේසුයිට්වරු රෝමානු කතෝලික වාදය වසර 1670 දී චීනයට යති. ඒ වන විට ලෝකයේ කාර්මික අතින් දියුණුම රට චීනයයි. චීනයේ නිර්මාණ හා දැනුම යුරෝපයට ගෙන යන්නේ ජේසුයිට්වරුන් ය. නූතනවාදයට අවශ්‍ය තාක්ෂණ පදනම දැමුයේ චීනුන් බව ජෝස්ප් නිඩ්හැම් ඉතා හොඳින් පෙන්වා දී තිබේ. රොබට් මොරිසන් 1807 දී ප්‍රොතෙස්තන්ත දහම හඳුන්වා තිබේ. අබිං යුද්ධයෙන් (1840-42) අධිරාජ්‍යවාදීහු චීනයට ක්‍රමානුකූලව ගොඩබසිති. වෙරළ තීරය නවීකරණය කරති. ක්‍රිස්තියානිය පතුරුවා හරිති. මේ නිසා චීනයේ නවීකාරක බලවේගය බවට කිතුනුවන් පත්වේ. සුන්යත් සෙන් හොඳ ම උදාහරණය ය. කොමියුනිස්ට් විප්ලවය (1949) හා විශේෂයෙන් සංස්කෘතික විප්ලවය (1969) නිසා හොංකොං හා තායිවානය ක්‍රිස්තියානියේ ගොදුරුබිම් බවට පත්වේ. ඇමරිකානු නව පල්ලි චීනයට හා එහි සංක්‍රමණික පිරිස් තුළට කා වැදෙති. (චීනයේ ආර්ථිකයට සමාන ආර්ථිකයක් තායිවානය- හොංකොං හා විදේශික චීනුන්ට ඇත.) මේ නිසා බලවත් ආර්ථික බලයක් ගොඩ නැගේ.

වර්තමානයේ ක්‍රිස්තියානි ව්‍යාප්තවාදය බරපතල ලෙස ගෙන යන්නේ කොරියාව යි. රෝමානු කතෝලිකවාදය චීනයෙන් ආවේ ය. නමුත් ප්‍රංශයේ බලපෑම මත ද (පිටර් හර්මෝට් පසුව වවු වෙන් චූ) කතෝලික ආගම ව්‍යාප්ත විය.

ප්‍රෙස්බිටීරියන්වරු 1880 සිට ප්‍රොතෙස්තන්තුවාදය ගෙන ආහ. ඉන්පසු මෙතෝදිස්තවාදය ආවේ ය. ජපානයේ ව්‍යාප්තවාදය ඉදිරියේ දැඩි ජපන් විරෝධී පෙරමුණක් වූයේ කොරියානු කිතුනුවෝ ය. විශේෂයෙන් දුගී වැඩ කරන ජනයා එයට ඇදී ආහ. පළමු හා දෙවන ලෝක සංග්‍රාමවලදී ජපන් ආක්‍රමණය නිසා පල්ලිය දුර්වල වුව ද දෙවන ලෝක යුද්ධයෙන් පසු කොරියාව දෙකඩ වීමත් (1953) එ. ජනපදය ගොඩබැසීමත් නිසා අධික වේගයෙන් ව්‍යාප්ත විය. විශේෂයෙන් තරඟකාරී ආර්ථික රටාව ට බුදු දහම නොගැලපේය යන මතය කොරියානුවන් විශාල ප්‍රමාණයක් නව ආර්ථිකය යටතේ කිතුනුවන් වූහ. කොරියාවේ පෙන්තකොස්ත බලපෑමට යටත් වූවන් ගෙන් 2/3 ක් කාන්තාවෝ ය. කොරියානු මූලධර්මවාදය ඉන්පසු ජපානයටත්, නැගෙනහිර ආසියාවටත් ව්‍යාප්ත විය. කොරියාවේ ක්‍රිස්තියානා ව්‍යාප්තවාදයට මූලිකම හේතුව වූයේ සීඝ්‍ර නාගරීකරණය ය. වසර 30 ක් ඇතුළත දැවැන්ත එ. ජනපද ආයෝජන නිසා 18 % ක් වූ නාගරික ජනගහනය 82 % ක් විය.

## කිතුනු කුරුස යුද්ධය

ඔසාමාගේ ප්‍රහාරවලින් පසු රුසියානු නායක ව්ලැදිමීර් පුටින් හා එ. ජනපද ජනාධිපති බුෂ් අතර ඇති පළමු හමුවේදී ම බුෂ් පුටින්ගෙන් ඇසුවේ එක ප්‍රශ්නයකි. එනම් ඔබ දෙවියන් අදහනවාද ? යන්න ය. හිටපු කොමියුනිස්ට් කේ.බී.ජී. රහස් ඔත්තු සේවාවේ ප්‍රධානියා වු පුටින් මුවග සිනහවක් දල්වා ප්‍රකාශ කර ඇත්තේ ඔව්! යන්න ය. බුෂ් සිය යුද සැලසුම් ගැන කතා කර ඇත්තේ ඉන් පසුව ය.

ජෝර්ජ් බුෂ් ජිමී කාටර්ගෙන් පසු එ. ජනපදයේ බලයට පත් වූ ආගමික මූලධර්මවාදි ජනාධිපතිවරායා ය. ඔහු සිය කාර්යාලයේ පවා දෙවියන් අදහයි. එමෙන් ම ඔහුගේ හිතමිතුරු මූලධර්මවාදින් කිහිප දෙනෙක් ඉස්ලාම් විරෝධී ප්‍රචාරයන් හි මුලටම සිටිති. පෙඩරල් අරමුදල් පෙන්තකොස්ත, බැප්ටිස්ට්, බොර්න් අගේන්, ක්‍රිස්තියානි ආදියට මුදා හරින්නට මුලින් ම කටයුතු කළේ ද බුෂ් ය. ක්‍රිස්තියානියේ අද ඉලක්කය සුදු නොවන ජනයා හා ආසියාවයි.

1900 දී පොදුවේ ක්‍රිස්තියානිය තුළ සුද්දන් 81 % ක් සුදු නොවන ජනයා 19 % ක් ද සිටියෝ ය. වසරක් සියයක් ඇතුළත 2000 දී සුද්දන් 39.9 ක් ද සුදු නොවන ජනයා 60.1 % කි. මෙයින් එහි ව්‍යාප්තිය පෙනේ.

මේ අනුව ඔසාමා බින්ලාදන් හා ත්‍රස්තවාදය පිළිබඳ ව කතා කළ ද එයට පහර දීම පිළිබඳ ව එ. ජනපදයේ මතවාදය තීරණය කරන්නේ ක්‍රිස්තියානි මූලධර්මවාදයයි. ලෝකයේ ත්‍රස්තවාදීන් නම් කර ගනිද්දීත් ඔවුන්ගේ මිනුම් දඬු සකසන්නේ දේශපාලන මෙන්ම ආගමික පදනම සැලකිල්ලට ගනිමින් ය. එහිදී එ. ජනපදයේ ආගමික මූලධර්මාවාදය වඩාත් සැඟවුණු නමුත් ඔසාමාට වඩා බොහෝ බලවත් ව්‍යාපෘතියකි.

ඒ අතර රෝමානු කතෝලික පල්ලිය හා ක්‍රිස්තියානි මූලධර්මවාදීන් අතර සීතල යුද්ධයක් පවතී. එ. ජනපදය හා ප්‍රංශය අතර ඇතිවන දේශපාලන ගැටුම්වල පදනමක් ලෙස ද එය ක්‍රියා කරයි. විශේෂයෙන් සදාම්ගේ බාත් සමාජවාදයට එරෙහි සටනේදී රෝමානු කතෝලිකයන් හා හා ග්‍රීක ඕර්තොඩොක්ස්වරු එක් වී ප්‍රොතෙස්තන්ත්‍ර හා බැප්ටිස්ට් බලවේගවලට එරෙහි ව විවිධ යටිකූට්ටු වැඩ කරති. එක්සත් යුරෝපය තුළ ද මේ ගැටුම දක්නට හැකි ය.

## අපේ අනාගතය

1981 දී ජුනි ජන සංඛ්‍යා ලේඛන අනුව ලංකාවේ ඉස්ලාම් ආගම අදහන 11,34,556 ක් සිටියෝ ය. 2001 ජුනි ජන සංඛ්‍යා ලේඛන අනුව ලංකාවේ ඉස්ලාම් ආගම අදහන්නන් ප්‍රමාණය 16,49,001 කි. (උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ජනසංගණන කටයුතු කොටි සංවිධානව අඩාල කළ නිසා මෙය අසම්පූර්ණ ය) ශ්‍රී ලංකා යෝනක 15,71,812 ක් ද මැලේවරු 47967 ක් ද සිටිති. කොටින්ම මුස්ලිම්වරු සිටින්නේ 16,19,779 කි. මේ අනුව මුස්ලිම් නොවූ ඉස්ලාම් අදහන්නන් ගණන 29,222 කි. මොවුන්ගේ සැලකිය යුතු පිරිසක් මැද පෙරදිග රැකියාවන් හා විවාහයන් නිසා ඉස්ලාමය වැළඳගත් සිංහලයන් ය.

වසර 2012 ජන සංගණන ප්‍රතිඵල අනුව 1981 දී 10,979,568 ක් වූ ලංකාවේ සිංහල ජනගහනය 15,173,820 ක් හෙවත් 38% ක වර්ධනයක් ලබා තිබේ. සමස්තයක් ලෙස ගත්කළ පසුගිය දශකයේ (2001-2011) එකී වාර්ෂික වර්ධන වේගය 0.5 % ක් තරම් සුළු අගයක් බවට පත්ව ඇත. වසර 1981 දී 1,886,864 ක් වූ ශ්‍රී ලංකා දෙමළ ජනගහනය 2012 වසරේදී 2,220,427 හෙවත් 17% ක වර්ධනයක් පෙන්වා ඇත. 1983 න් පසු දෙමළ ජනයා ලක්ෂ 6 ක් පමණ විදේශ ගත වීමත්, ඉන්දියානු සම්භවය සහිත දෙමළ ජනයා තමන් ශ්‍රී ලාංකික දෙමළ ලෙස ප්‍රකාශ කිරීමත් නිසා ශ්‍රී ලංකා දෙමළ ජනගහන වර්ධනය ගැන නිසි අදහසක් ගත නොහැක. ඉන්දියානු

දෙමළ ජනගහනය 1981 දී 818,666 ක් වූ අතර 2012 දී 842,323 හෙවත් 2.8 ක වර්ධනයක් පෙන්වා ඇත. 1981-1984 කාලයේ පුරි සැලැස්මට අනුව ඉන්දියාවට යෑමත් තමන් ඉන්දියානුවන් නොවන බව ප්‍රකාශ කිරීමත් නිසා එකී තත්ත්වය උදා වන්නට ඇත.

ජනගහන වර්ධනයේ ලොකුම විප්ලවය වී ඇත්තේ මුස්ලිම් ජනගහනයේ ය. 1981 දී 1,038,927 ක් වූ මුස්ලිම් ජනගහනය 2012 දී 1,869,820 ක් හෙවත් 79.9 % කින් වර්ධනය වී ඇත. මෙහි ඇති තවත් සුවිශේෂී අංගය වන්නේ ලංකාවේ ඉස්ලාම් අදහන ජනගහනය 2012 දී 1,967,228 ක්වීම ය. එනම් මුස්ලිම් නොවන එහෙත් ඉස්ලාම් දහම අදහන ජනයා 97,408 ක් සිටිනා බව ය. ඔවුනගෙන් ඇතමෙක් (ස්ථිර වීසා සහිත) මාලදිවයින් ජාතිකයන් ද විය හැක. ශ්‍රී ලංකාවට වාර්ෂිකව තුන් ලක්ෂයක් පමණ වූ මාලදිවයින් ජාතිකයන්ගේ 50,000 ක් පමණ සංචාරක වීසා ලබාගෙන පැමිණෙන අතර ඔවුනගේ 20,000 ක් පමණ ස්ථිර වීසා ලබාගෙන ඇති බව වාර්තා වේ. මැලේවරු 40,189 ක් සිටිනා බව වාර්තා වී ඇති නිසා ඉස්ලාම් අදහන සිංහල හා දෙමළ, මැලේ ජනයා 57,219 ක් සිටිනා බව තහවුරු වේ. මැදපෙරදිග රැකියා හරහා විවාහ හරහා අති විශාල පිරිසක් ඉස්ලාම් දහම වැළඳ ගන්නා බව පෙනී යයි.

විශේෂයෙන් සඳහන් කළ යුත්තේ 1971 දී කොළඹ උප දිසාපති කොට්ඨාශය තුළ සිංහල ජනගහනය 50.6 % ක් වූ අතර එය 2012 දී 24 % දක්වා අඩු වී ඇති බව ය. 1971 දී 19 %ක් වූ මුස්ලිම් ජනගහනය 40 % ක් වැඩි වී ඇති බව ය. ඊනියා කළු ජූලිය ගැන කතා කළ ද 1971 දී 23 %ක් වූ දෙමළ ජනගහනය 2012 දී 33 % ක් දක්වා වැඩි වී ඇති බව ය.

පොදුවේ ගත්කළ ශ්‍රී ලංකාවේ සිංහල ජනගහනය වසර 140 කට වරක් දෙගුණ වන අතර (0.5 % ක වාර්ෂික වර්ධනය) මුස්ලිම් ජනගහනය සෑම වසර 30 කට වරක් (2.3 % ක් වාර්ෂික වර්ධනය) දෙගුණ වන බව පසුගිය වසර 60 ක ජනගහන තොරතුරුවලින් පෙනී යයි. මේ අනුව ශ්‍රී ලංකාව බහුතර මුස්ලිම් රටක් වීම 2100-2130 අතර කාලයේදී නියත වශයෙන් ම සිදුවනු ඇත.

මුස්ලිම් ජනගහනයේ ඊළඟ වැදගත් සාධකය තරුණ ප්‍රතිශතය ය. සිංහලයන් 16 % තරම් පවතින විට මුස්ලිම්වරුන් සඳහා 27 % ක් තරම් විශාල අගයකි. මෙයින් කරුණු දෙකක් ගම්‍ය වේ. සිංහලයන් සංඛ්‍යාවෙන් විශාල වුවත් ඔවුන්ගේ තරුණ ජනගහනය කුඩා නිසා අනාගතයේ ඔවුන්ගේ

ජනගහණ වර්ධනය තවත් අඩුවේ. අනෙක් අතට මුස්ලිම්වරුන්ගේ ජනගහනය තවත් වැඩිවීමට තරුණ ප්‍රතිශතය බලපායි. සාමාන්‍යයෙන් ලංකාවේ මෙන්ම ලෝකයේම සිද්ධාන්තයක් වන්නේ තරුණ ප්‍රතිශතය වැඩිනම් (20 %) තරුණ කැරලි ඇතිවීමට ඉඩකඩ අධික බවය. (1971 දී සිංහල තරුණ ප්‍රතිශතය 23% ක්ද, 1983 දී දෙමළ තරුණ ප්‍රතිශතය 24% ක්ද, විය) අනෙක් අතින් අන් රටවල සාපේක්ෂව ලංකාවේ මුස්ලිම් ජනයා සීඝ්‍රයෙන් උසස් අධ්‍යාපනය ලබමින් සිටිති. මෙය ද තරුණ නැගිටීමකට අත්‍යවශ්‍ය සාධකයක් බවට උතුරත් දකුණත් එක ලෙස ඔප්පු කර ඇත. මේ අනුව ජන ව්‍යාප්තිය අනුව මුස්ලිම් තරුණ නැගිටීමක පසුබිම දැන් ඇති වී තිබේ. මෙය අග්නිදිග විශ්ව විද්‍යාලයෙන් ඔප්පු වෙමින් ඇත.

අනෙක් අතින් ලංකාවේ කාන්තාවන් ගණන පිරිමින්ට වඩා 5,98,921 කින් වැඩි ය. මොවුන් බහුතරය සිංහල කාන්තාවන් ය. සිංහලයන් අතර බහු විවාහ ක්‍රමයක් නොවන නිසා මේ කාන්තාවන් ට අනිවාර්යෙන්ම විවාහවීමට සිදු වන්නේ එක්කෝ විදේශිකයන් සමඟ ය. නැත්නම් මුස්ලිම්වරු සමඟ ය. අතීතයේ සිට ලංකාවේ ඉස්ලාම් ව්‍යාප්තිය ආවාහ විවාහ මගින් සිදුවිය. දැන් ද මැදපෙරදිග රැකියා නිසා සැලකිය යුතු කාන්තාවන් පිරිසක් ඉස්ලාම් වී තිබේ.

ඉස්ලාමයේ ඊළඟ ක්‍රියාවලිය වන්නේ ඔවුන්ගේ ආගමික සංවිධානයි. තම ඇඳුම් පැළඳුම්වල සිට ඇවතුම් පැවතුම් සියල්ල සඳහා ඉස්ලාම් දහම ප්‍රදර්ශනය කිරීම 1986 සිට පල්ලිය විසින් අනිවාර්ය කිරීමේ ප්‍රතිඵලයකි. ලංකාවේ වඩාත් සංවිධානාත්මක ආගමික කණ්ඩායම් දෙක ඉස්ලාම්වාදය හා මූලධර්මවාදී ක්‍රිස්තියානින් ය.

ඊළඟ වැදගත් කාරණය වන්නේ අරමුදල් ය. ලංකාවේ ඉස්ලාම් ව්‍යාප්තියට, ඉස්ලාම් සුභසාධනයට, පල්ලි හා මද්රාෂා සඳහා ද ප්‍රකෝටි ගණනක ධනයක් සවුදි ප්‍රමුඛ අරාබි රටවල් ද මැලේසියාව හා ඉන්දුනීසියාව ආදී රටවල් ද ලබා දෙති. ජාතික රහස් ඔත්තු සේවය ලබාදුන් වාර්තාවක සඳහන් වන්නේ සන්නද්ධ කල්ලි හතරක් සඳහා විදේශ අරමුදල් යෙදවී ඇති බවයි. එපමණක් නොව පාකිස්ථානය, ඉරානය හා ඉන්දුනීසියානු දූපත් මේ ත්‍රස්ත කල්ලිවලට පුහුණුව ලබාදුන් බවට එයින් කියවේ. ඉස්ලාමීය පිරිස් සන්නද්ධ පුහුණුව මුලින්ම ලබා ගත්තේ කොටි සංවිධානයෙනි. ඒ වකවානුවේ (1984-86) ඔවුන් දකුණු ඉන්දියාවේ පුහුණුව ලබා ඇත. ඉන්පසු ලංකා ආණ්ඩුව ද මුස්ලිම් සන්නද්ධ බලයක් ඇති කළේ ය. (1987-90) එපමණක් නොව ඉරානයේ හා පාකිස්ථානයේ ආධාරය ද ඒ සඳහා ලබා

ගත්තේ ය. මේ සියල්ල විසින් ඇති කරනු ලැබූ ඉස්ලාමීය මූලධර්මවාදී කල්ලි තවමත් පවතින්නේ ප්‍රාථමික මට්ටමක ය. නමුත් නැගෙනහිර ඇතිවෙමින් පවතින සිදුවීම නිසා ඕනෑම අවස්ථාවක ඉන්දුනීසියාව මෙන් ලංකාව ද එක වරම පුපුරා යා හැකි ය. කොටින් ම වත්මන් ආණ්ඩුව ඔසාමාට නැගෙනහිර ලංකාවට ගොඩබැසීමට අවශ්‍ය වටපිටාව සකසමින් ඇත.

ක්‍රිස්තියානි රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් මෙන්ම ඉස්ලාම් රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් ද ඇත. ලංකාවේ එවැනි සංවිධාන 22 ක් දැනට ක්‍රියාත්මක වේ. සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරාකය, ඉරානය, මැලේසියාව ආදිය මේවා අරමුදල් සපයති. ඒ අතර රටතුළ ආර්ථික ජාලය (නීත්‍යානුකූල හා නීතිවිරෝධී දෙආකාරයෙන්ම) හැසිරවීම ද සංවිධානාත්මක ව සිදුවේ. ලංකාවේ මත්කුඩු ජාවාරම (ඇෆ්ගන්) සිට දැව වෙළෙඳාම (මැලේසියාව) දක්වා ඔවුන් පාලනයට යටත් වෙමින් ඇත.

ලංකාවේ ඉස්ලාම් මූලධර්මාවාදය වැඩිවීමට ක්‍රිස්තියානි මූලධර්මවාදය වගකිව යුතු ය. 1975-90 කාලයේ තුළ ක්‍රිස්තියානි මූලධර්මවාදය හැසිරුනේ වාමාංශික හැඩරුවක් සහිත රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් තුළ ය. 1990-94 කාලය තුළ ඔවුහු දේශපාලන කරලියේ බලවත් වූහ. තමන්ගේ ම වූ ඕප්ස්දෙයි වර්ගයේ ව්‍යාපාරික ජාලයකින් ද බැංකු හා රක්ෂණ ව්‍යාපාරය ද, විශේෂයෙන් ජනමාධ්‍යයෙන්ද ආක්‍රමණය කරන ලදී. ලංකාවේ ඇතැම් පුවත්පත්, ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා එක්කෝ ක්‍රිස්තියානි මූලධර්මාවදී අරමුදල් වලින් ගෙන යයි. නැත්නම් ඒවායේ මාධ්‍යවේදීන් ඔවුන්ට නතු කරගෙන ඇත. 1994 න් පසු ඔවුහු කෙළින් ම දේශපාලනයටත් ආගම ව්‍යාප්ත කිරීමටත් පටන් ගත්හ. සුව කිරීමේ මෙහෙයන්ගේ සිට ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත දක්වා මෙය ව්‍යාප්ත විය. එක් හැදෑරීමකට අනුව 1994-2000 කාලය තුළ සමාගම් පනත තුළ ලියාපදිංචි වූ සෑම සමාගම් පහකින් එකක් ම ක්‍රිස්තියානි මූලධර්මාවාදීන්ට අයත් ය.

2001 මැතිවරණයේ දී ක්‍රිස්තියානි මූලධර්මවාදය රටේ රාජ්‍ය බලය අල්ලා ගත්තේ ය. රටේ ඉහළ ම පෙළේ ඇමතිවරු, ව්‍යාපාරිකයෝ ද, ජනමාධ්‍යවේදීහු ද, හමුදා පොලිසි හා රාජ්‍ය පාලකයෝද ඕප්ස්දෙයි, එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්, බෝර්න් අගෙන් ක්‍රිස්තියානි මූලධර්මවාදීන් ය. බොහෝ බෞද්ධයින් දුගී බොදුනුවන් ක්‍රිස්තියානිකරණය ගැන කතා කරති. නමුත් රටේ ඉහළ ම ක්ෂේත්‍රවල මැති ඇමතින් හා නිලධාරීන් ද, ආර්ථික හා

සමාජයීය බලවතුන් ද ඉහළම බෞද්ධ පැවිදි නායකයින් ද, ගිහි නායකයින් ලෙස පෙනී සිටින්නන්ද ක්‍රිස්තියානි මූලධර්මවාදයේ ඔඩොක්කුවේ බව ඕනෑකමින් අමතක කරති.

රජය තුළ ක්‍රිස්තියානි මූලධර්මවාදයට සටන් දෙන්නේ මුස්ලිම් මූලධර්මවාදයයි. මෙය අනිවාර්යයෙන්ම අනාගතයේ තවත් ඝෘද්ධ-කුරුස යුද්ධයක් වනු ඇත. අප්‍රිකාවේ ගෝත්‍රික ජනයා එයට හසු වී විනාශ වූ ලෙස සිංහලයින් ද මේ තෙරපීමට හසුවී ඇත.

අනෙක් අතින් මේ රටේ සාතිශය බහුතරයක් මුස්ලිම්වරු සිංහලයන් සමඟ බොහෝ සුහදව කටයුතු කර ඇත. බෞද්ධ ගීත පවා ගායනා කළේ මොහිදීන් බෙග් වැනි මුස්ලිම් ගායකයෝ ය. සිංහලයන් ආගම්වාදයෙන් තොර ව මුස්ලිම්වරුන් පාර්ලිමේන්තුවට යවා ඇත. කිතුණුවන්ගේද තත්ත්වය ද එයයි. විශේෂයෙන් කතෝලික සිංහල ජනතාවගේ කොටසකි.

සිංහල බස ද, සාහිත්‍යය ද, ඔප නංවන්නට සැලකිය යුතු දායකත්වයක් ඔවුන්ගෙන් ලැබී ඇත. මෙහි ප්‍රශ්නය ඇත්තේ අන්තවාදී සුළුතරය අත ය. ඒ අන්තවාදී සුළුතරය බලවත් වන්නේ බෞද්ධයින්ගේ අසංවිධානාත්මකමත් සිංහලත්වය පිළිබඳ හැඟීමක් නැතිකමත් නිසා ය. ඉස්ලාම් මූලධර්මවාදය මෙන් ම ක්‍රිස්තියානි මූලධර්මවාදය ද පවතින යථාර්ථයකි. නමුත් ඒ දෙකෙහි ම ව්‍යාප්තියට පාර කපන්නේ සිංහලත්වය මරාගත් පිරිස බව ද අමතක නොකළ යුතු ය.

ඊළඟ දශකය තුළ ලංකාවේ ඉරණම තීන්දු වන්නේ සිංහලයන් තම සිංහලත්වය මත කෙසේ ක්‍රියා කරයි ද යන්න මත ය. අන්තිමට මහත්මා ගාන්ධි කළ ප්‍රකාශයක් ම ගැලපෙන සේ ලියා තබමි.

ලාංකිකයෙකුගේ මරණය අපට ඉවසිය හැකි දුකකි.
නමුත් ලංකාවේ මරණය අපට ඉවසිය නොහැකි දුකකි.

## -සංඛ්‍යා ලේඛන-

01. ලෝකයේ භාෂා භාවිතය (ප්‍රතිශතයක් ලෙස)

| වසර භාෂාව | 1958 | 1970 | 1980 | 1992 |
|---|---|---|---|---|
| අරාබි | 2.7 | 2.9 | 3.3 | 3.5 |
| බෙන්ගාලි | 2.7 | 2.9 | 3.2 | 3.2 |
| ස්පාඤ්ඤ | 5.0 | 5.2 | 5.5 | 6.1 |
| හින්දි | 5.2 | 5.3 | 5.3 | 6.4 |
| ඉංග්‍රීසි | 9.8 | 9.1 | 8.7 | 7.6 |
| චීන (මාන්දරින්) | 15.6 | 16.6 | 15.8 | 15.2 |

02. ලෝකයේ භූමි ප්‍රදේශ පාලනය හා ආගමික ශිෂ්ටාචාර (ප්‍රතිශතයන්)

| වසර | බටහිර ක්‍රිස්තියානි | අප්‍රිකානු | ඕර්තඩොක්ස් ක්‍රිස්තියානි | ඉස්ලාම් |
|---|---|---|---|---|
| 1900 | 38.7 | 0.3 | 16.6 | 6.8 |
| 1920 | 48.5 | 0.8 | 19.5 | 3.5 |
| 1971 | 24.4 | 8.8 | 19.7 | 17.5 |
| 1993 | 24.2 | 10.8 | 19.9 | 21.1 |

| වසර | හින්දු | ලතින් ඇමරිකානු | චීන | ජපන් |
|---|---|---|---|---|
| 1900 | 0.1 | 14.7 | 8.2 | 0.3 |
| 1920 | 0.1 | 15.4 | 7.5 | 0.5 |
| 1971 | 2.5 | 14.9 | 7.5 | 0.3 |
| 1993 | 2.4 | 14.9 | 7.5 | 0.3 |

03. ලෝක ජනගහනය හා ආගමික ශිෂ්ටාචාර පාලනය (ප්‍රතිශතයන්)

| වසර | බටහිර ක්‍රිස්තියානි | ඕර්තඩොක්ස් ක්‍රිස්තියානි | ලතින් ඇමරිකානු | අප්‍රිකානු |
|---|---|---|---|---|
| 1900 | 44.3 | 8.5 | 3.2 | 0.4 |
| 1920 | 48.1 | 13.9 | 4.6 | 0.7 |
| 1990 | 14.7 | 6.5 | 6.5 | 8.2 |
| 2110 | 11.5 | 5.4 | 5.4 | 11.7 |

| වසර | ඉස්ලාම් | හින්දු | චීන | ජපන් |
|---|---|---|---|---|
| 1900 | 4.2 | 0.3 | 19.3 | 3.5 |
| 1920 | 2.4 | 0.3 | 17.3 | 4.1 |
| 1990 | 13.4 | 16.3 | 24.3 | 2.3 |
| 2010 | 17.9 | 17.1 | 22.3 | 1.8 |

04. ලෝක දළ දේශීය නිෂ්පාදනය හා ආගමික ශිෂ්ටාචාර (ප්‍රතිශතයන්)

| වසර | බටහිර ක්‍රිස්තියානි | ඕර්තඩොක්ස් ක්‍රිස්තියානි | ලතින් ඇමරිකානු | අප්‍රිකානු |
|---|---|---|---|---|
| 1950 | 64.1 | 16.0 | 5.6 | 0.2 |
| 1970 | 53.4 | 17.4 | 6.2 | 1.7 |
| 1992 | 48.9 | 5.2 | 8.3 | 2.1 |
| **වසර** | **ඉස්ලාම්** | **හින්දු** | **චීන** | **ජපන්** |
| 1950 | 2.9 | 3.8 | 3.3 | 3.1 |
| 1970 | 3.0 | 3.0 | 4.8 | 7.8 |
| 1992 | 3.5 | 3.5 | 10.0 | 8.0 |

05. හමුදා පිරිස් බලය හා ආගමික ශිෂ්ටාචාර (ප්‍රතිශතයන්)

| වසර | බටහිර ක්‍රිස්තියානි | ඕර්තඩොක්ස් ක්‍රිස්තියානි | ලතින් ඇමරිකානු | අප්‍රිකානු |
|---|---|---|---|---|
| 1900 | 43.7 | 16.6 | 9.4 | 1.6 |
| 1970 | 26.8 | 25.1 | 4.0 | 2.1 |
| 1992 | 21.1 | 14.3 | 6.3 | 3.4 |
| **වසර** | **ඉස්ලාම්** | **හින්දු** | **චීන** | **ජපන්** |
| 1900 | 16.7 | 0.4 | 10.0 | 1.8 |
| 1970 | 10.4 | 6.6 | 24.7 | 0.3 |
| 1992 | 20.0 | 4.8 | 25.7 | 1.0 |

## ආශ්‍රිත ග්‍රන්ථ

01. ජයසේන දහනායක - සිංහලේ පිළිල - නොපළ කෘතියකි
02. අම්පාර මුස්ලිම්වරුන්ගේ උරුමය - ඒ. එම්. එච්. අනිස් -1997
03. The meaning of the Glorious Quran - M.M. Pickthall - 1996
04. Dictionary of Religion - Jonathan Z. Smith - 1995
05. Their Kingdom come - Robert Hutchison - 1998
06. Reflections on Asia - Mahathir mohamad - 2001
07. Malay dilemma - Mahathir mohamad - 2001
08. The Holy Quran and the Sciences of Nature - Mchdi Golshani - 1986
09. Inside Al Queda - Rohan Gunerathna - 2002
10. Holy war Inc - Peter Bergen - 2002
11. The Arabs - Peter Mansfield - 1978
12. The Clash of Civilization - Samuel p. Huntington - 1996
13. Paladin Monuments and Ideas - Dilip Hiro - 1988
14. Story of my life - Moshe Dayan - 1972
15. Israel at fifty - Moshe Raviv - 1999



මලාලා යුසෆ්සායි 1997 ජුලි 12 දා පකිස්තානයේ ස්වාට් දිස්ත්‍රික්කයේ කයිබර් පක්තුන්ක්වා ප්‍රාන්තයේ මින්ගෝරා නගරයේ උපත ලැබීය. වසර 2009 ජනවාරියේ එකලොස් හැවිරිදි මලාලා අන්තර්ජාලයේ බ්ලොග් අඩවියක් ආරම්භ කළේ ස්වාට් ප්‍රදේශයේ දැරිවියන්ගේ ඉරණම ලොවටම කියන්නටය. ඒ වනවිටත් තලේබාන්වරු ස්වාට් ප්‍රදේශයේ සිය අණසක පැතිර වූ නිසා ඇයට මේ සඳහා අන්වර්ථ නමක් යොදා ගන්නට සිදුවිය. කුරානයට අනුව හරාම් (අයුතු දේ) ලෙස ප්‍රකාශ කරමින් මූලධර්මවාදීහු ඒ වනවිටත් ස්වාට් ප්‍රදේශයේ සිනමාව රූපවාහිනිය ගිනිබත් කරන්නට, රැවුල කපනා බාබර්වරු ඝාතනය කරන්නට, හිසේ සිට දෙපතුල දක්වා කාන්තාවන් කළු ඵර්දාවෙන් වසා දමන්නට, කාන්තාවන් අධ්‍යාපනය ලැබීමෙන් හා රැකියා කිරීමෙන් වළකාලන්නට ක්‍රියා කරමින් සිටියහ.

මලාලා දියණිය නැගී සිටියේ සිය ගම ගල් යුගයට ගෙන යන මේ හලාල් කරණයට එරෙහිවය.

වසර 2012 ඔක්තෝම්බර් 09 වැනිදා පාසල ඇරී සිය මිතුරියන් හා ගුරුවරියන් සමග ආපසු එන මලාලාගේ පාසල් බස් රියට මූලධර්මවාදීහු දෙදෙනෙක් ගොඩවූහ. ඔවුන් ඉස්ලාම් දහමට අනුව සෙවූයේ කාන්තාවනට හරාම් දෑ උගන්වන මලාලාය. සියල්ලන් ඉදිරියේ ඇයගේ හිසට වෙඩි දෙකක් තබනු ලැබීය.

මුළු පකිස්තානය මෙන්ම මුළු ලොවම මෙයින් කම්පා විය. මලාලා දිවි ගලවා ගත්තේ මහා බ්‍රිතාන්‍යයට පළා යෑමෙනි. ඇය දුන් පණිවුඩය ශ්‍රී ලංකාවේ අපට ද විශේෂයෙන් මුස්ලිම් කාන්තාවනටද වැදගත්ය.

ශ්‍රී ලංකාවේ තවත් ස්වාට් වාලියක් හෝ ඇෆ්ගනිස්තානයක් කරන්නට ඉඩ නොදීම අප සැමගේ වගකීමකි. මලාලා අපට ලබා දෙන පාඩම එයයි.

පාඨලී චම්පික රණවක

මිල රු. 450/-